

# හදිසි අනතුර

සහ තවත්
ෂර්ලොක් හෝම්ස්
කථා

- දියමන්ති මාලය
- හාපර් මිනීමැරුම
- තෝන්ටන්හි ධාවන තරඟය
- බකිංහැම්ෂයර් අ...
- හදිසි අනතුර
- ...ව

Sarasavi Bookshop
HADISI ANATHURA
7-2013 Rs. 375.00

මිල රු. 375/-

ISBN 978-955-1262-26-6

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන



ෂර්ලොක් හෝම්ස්ගේ
රහස්ගත ලිපිගොනු 11

පරිවර්තනය චන්දන මෙන්ඩිස්

# හදිසි අනතුර

සහ තවත් ෂර්ලොක් හෝම්ස් කථා

## චන්දන මෙන්ඩිස්ගේ නිර්මාණ හා පරිවර්තන

නවකතා - නිශ්චල චංචල දේපළ — All That Glitters

විද්‍යා ප්‍රබන්ධ - ජුරාසික් දඩයම

කෙටි කතා - චීන යෙහෙළිය, නාඳුනන්නිය

යොවුන් නවකථා - අබිරහස් දූපතේ නිධානය, නිල් දියමන්ති අභිරහස

පරිවර්තන (ෂර්ලොක් හෝම්ස් කථා)

බැස්කවිල් රුදුරු බල්ලා
සිව් රහස් සලකුණ
බිහිසුණු නිම්නය
මළගිය ඇත්තෝ සාක්ෂි දෙති
ලේ සලකුණ
අන්තරාය අඩවියක
මහ රෑ ආ මාරයා
ඉන්ද්‍රනීල මාණික්‍යය
දියමන්ති ඔටුන්න
ලෝහිත පරීක්ෂණය
ඔබෙන් සමුගනිමි
ෂර්ලොක් හෝම්ස් ආපසු එයි
පුද්ගලිකයි රහසිගතයි
ඩ්‍රැකියුලාට එරෙහිව ෂර්ලොක් හෝම්ස්
භයානක මිනිසා
කළු ව්‍යාඝ්‍රයා
රතුවත හැඳි කත
ප්‍රදීපාගාරයේ වික්‍රමය
අබිරහස් දොස්තර
ගින්දර සමග සෙල්ලම්
සමුදුරේ සටන
භීෂණයක්
රුසියානු ඔත්තුකාරයා
මර උගුල
ඊජිප්තු ශාපය
හදිසි අනතුර

පරිවර්තන (අනෙක්)

සැඟවුණු ලොවේ සවාරියක්
ඇලන් ක්වාටමේන්ගේ වීරචාරිකාව
වියරු විද්‍යාඥයා
යකාගේ නවාතැන
හරිම පුදුමයි!
සිහිනයක රැඳී රහසක්
චාලි සහ අරුම පුදුම චොකලට් කම්හල
මෝරා
රහස් පරීක්ෂකයා අතුරුදන්
ගැටකපන පුංචා
ගිනිකන්දක් හරහා.......ලෝකය වටේ අසූ දවසකින්
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා - (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2008)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා II - සොඳුරු සිතුවම් - (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2009)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා III - සඳ දියේ පාවී ගියා - (රාජ්‍ය සම්මාන නිර්දේශිත - 2010)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා IV - මුතු ඇටය - (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2011)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා V - කෝකිල මැදුර - (රාජ්‍ය සම්මාන නිර්දේශිත - 2012)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා VI - වීණා වාදකයා - (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2013)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා VII - මායාකාරී



# හදිසි අනතුර

සහ

## තවත් ෂර්ලොක් හෝම්ස් කථා

සම්පූර්ණ
අසංක්ෂිප්ත පරිවර්තනය

**චන්දන මෙන්ඩිස්**

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන

මෙම පොතේ ඇතුළත් වන්නේ පහත සඳහන් කථාවල පරිවර්තනය.

1. The Mystery of the Diamond Necklace
2. The Harper Murder case
3. The Adventure of the Missing Athlete
4. A Mystery of Buckinghamshire
5. The Adventure of Vittoria the Circus Belle
6. The Adventure of the Expert Chef



# පටුන


1. දියමන්ති මාලය 9
2. හාපර් මිනීමැරුම 45
3. තෝන්ටන්හි ධාවන තරඟය 92
4. බකිංහැම්ෂයර් අභිරහස 124
5. හදිසි අනතුර 176
6. සූපවේදියාගේ ගැටලුව 205





# දියමන්ති මාලය

එක් අඳුරු වැසි සහිත දිනයක මගේ රෝගියෙකු බැලීමට ගොස් මම ආපසු නිවස බලා යමින් සිටියෙමි. මා ගමන් කළ කෙටි මග වැටී තිබුණේ බේකර් වීදිය හරහාය. බොහෝ දිනකින් මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා දැකීමට නොහැකි වූ බැව් මට සිහිවූයේ එවිටය. එදිනට කළ යුතු හදිසි කටයුත්තක් ද නොතිබුණෙන් බේකර් වීදියේ 221 B හි අපේ නිවහනට ද ගොඩවී මගේ මිත්‍රයා හමුවී යාමට සිතුවෙමි. මා දොරට තට්ටු කළ විට මට ලැබුණේ ඉක්මන් ප්‍රතිචාරයකි.

"ආයුබෝවන් හඩ්සන් මහත්මිය. මගේ මිත්‍රයා අද ගෙදර ඉන්නවද?"

"ඔය ඉන්නෙ" ඇගේ පිළිතුරේ තිබුණේ එතරම් ප්‍රියමනාප හඬක් නොවේ. "දැන් දවස් ගණනක ඉඳලා මොනවද රසායනික පර්යේෂණ වගයක් කරනවා. ඒවල විෂදුම මේ පහළ තට්ටුවටත් එනවා. අපට හුස්ම ගන්න බෑ. ඒ අතරෙ හිටි ගමන් වෙඩි පුපුරනවා වගේ මහා පුපුරන ශබ්ද ඇහෙනවා. අනේ මං දන්නෙ නෑ මේව කොහෙන් කෙළවර වේවිද කියල. විශ්වාස කරන්න වොට්සන් මහත්තයා. අලුතෙන් වැඩට ගත්තු වැඩකාර කෙල්ල මගෙන් අහනවා, උඩ තට්ටුවෙ කුලියට ඉන්නෙ බෝම්බ හදන්න පුරුදු වෙන එක්කෙනෙක්ද කියලා!"

හඩ්සන් මහත්මිය ඇගේ පුපුරුදු අඳෝනාව ඉදිරිපත් කරද්දී මගේ වැහි කබාය ගළවා අතට ගෙන මම උඩු මහලට නැගීමට සූදානම් වූයෙමි.

"මේ රසායනික පරීක්ෂණ වලින් ඔබට ඇතිවෙන හිරිහැරය ගැන මං හෝම්ස්ට මතක් කරන්නම්" මා ඇයට කීවේ ඇගේ සිත සැනසීම පිණිසය. මගේ මිත්‍රයා හමුවූ සැණින් මේ පොරොන්දුව මට අමතක වෙන බැව් මම දැන සිටියෙමි.

රසායනික ද්‍රව්‍යවලින් නිකුත් වූ විෂ සහිත වායුවල කර්කශ ගන්ධය, මට උඩුමහලට නැගෙද්දීම දැනෙන්නට විය. මගේ

මිත්‍රයාගේ කටයුතුවලට බාධා නොකළ යුතු නිසා, විසිත්ත කාමරයේ දොරට තට්ටු නොකොටම මම එහි ඇතුළුවූයෙමි.

නිල් පැහැති ද්‍රාවණයක් සහිත වීදුරු ප්ලාස්කුවක් ගින්නෙන් රත් කරමින් සිටි හෝම්ස්, ඒ දෙසට දැඩි අවධානයක් යොමු කරගෙන සිටියේය. හිඳගන්නා මෙන් මට සංඥා කළ ඔහු සූදානම් වූයේ, බීකරයක තිබූ කිරිපාට ප්‍රතිකාරකයක්, බුබුළු දමමින් තිබූ ප්ලාස්කුවට එකතු කිරීමටයි. මම නිහඬව බලා සිටියෙමි.

ඔහුගේ පර්යේෂණය සාර්ථක වූ බවට සලකුණු එක් සැණෙකින් මම හෝම්ස්ගේ මුහුණේ දුටුවෙමි. කුලිරියක් කැඳවීමට මෙන් කටින් "විසිල්" හඬක් නැංවූ ඔහු, දැල්වෙමින් තිබූ බන්සන් දාහකය නිවා දමා මා ඉදිරිපිටින් හිඳ ගත්තේය.

"ඔබ දන්නවාද වොට්සන්. මිනිසාට ප්‍රයෝජනවත් කාබනික රසායන ද්‍රව්‍ය අති විශාල ප්‍රමාණයක් තිබෙනවා. හයිඩ්‍රොකාබන් වල හයිඩ්‍රජන් පරමාණු වලට හැලජන් පරමාණු ආදේශ කිරීම මගින් ඒවා පහසුවෙන් නිෂ්පාදනය කරන්න පුළුවනි." ඔහු කීවේ තම බ්‍රයර් පයිප්පයට දුම්කොළ පුරවමිනි. "ඒ ගැන අත්හදා බැලීම් කරන්න කිසිම රසායන විද්‍යාඥයෙකු උනන්දු නොවෙන පාටයි"

"මේ දවස්වල ඔබ පරීක්ෂණ කරන්නෙ ඒ ගැනද?"

"ඇත්තෙන්ම ඔව්. ඇන්ටිමනි පෙන්ටක්ලෝරයිඩ් තුළට ඇසිටලීන් යැවීමෙන්, ටෙට්‍රාක්ලෝරො ඊතේන් නම් ඉතාම ප්‍රයෝජනවත් ද්‍රාවකය හදාගන්න පුළුවන් බව ඔබ දන්නවා ඇති. ඒක බොහොම විෂ සහිත කෘමි නාශකයක් නේ. නමුත් ඒක මිල්ක් ඔෆ් ලයිම් සමග උණු කිරීමෙන් ට්‍රයික්ලෝරො එතිලීන් හදාගන්න පුළුවනි."

"මොකක්ද ඒකෙ වැදගත් කම?"

"ට්‍රයික්ලෝරො එතිලීන්වල විෂ සහිත බව හුඟක් අඩුයි. ඒ විතරක් නෙමෙයි. ඒක තවත් විවිධ රසායන ද්‍රව්‍ය ගණනාවකට පහසුවෙන් පරිවර්තනය කරන්න පුළුවනි. ඇසිටලීන් වෙනුවට බියුටලීන්, ප්‍රොපිලීන් යොදා ගැනීමෙන් කළ හැකි විස්කම්වලත් කෙළවරක් නෑ. ශල්‍යකර්ම වලදී රෝගීන් නිර්වින්දනය කරන්න පුළුවන් අලුත් වායුවක්, මං කියූ රසායන ද්‍රව්‍ය වලින් පහසුවෙන් හදාගන්න හැකි බව, මට හොඳටම විශ්වාසයි. ඒකට මට වෙලාවක් නැතුව මිසක්......"





"මගේ මේ පැමිණීමෙනුත් ඔබේ මේ පර්යේෂණවලට බාධා වෙනවා නේද හෝම්ස්?"

"කොහොමටවත් නෑ මිත්‍රයා" ඔහු කීවේ ගිනිඋදුන් පඩිය මත තිබූ ඔරලෝසුවේ වෙලාව පරීක්ෂා කරමිනි.

"අද හවස පහට මා හමුවෙන්න එන බව කියලා කෙනෙක් වෙලාවක් වෙන් කරගෙනයි තියෙන්නේ. ඒ හින්දා මගේ මේ පර්යේෂණය මං කොහොමටත් නවත්වන්නයි හිටියේ. පහට තවත් මිනිත්තු විස්සක් තිබෙනවා නේ. හඩ්සන් මහත්මිය ඊට කලින් තේ එව්වොත්, තේ කෝප්පයක් බීලම අපේ වැඩ කටයුතු පටන්ගන්න පුළුවනි."

ඔහුගේ ඒ කියමන අසන්නට ලැබී ඊට ප්‍රතිචාර දැක්වූ විලසින් සේවිකාවක් අප වෙත තේ ගෙන ආවාය.

"වොට්සන් දන්නවාද? මේ තරුණ නෝනාගෙ නම රූත් ඩිකන්ස්. මං ඇහුව අර සුප්‍රසිද්ධ චාල්ස් ඩිකන්ස්ගේ දුවක්ද කියලා........"

ඊට මහ හඬින් සිනාවූ තරුණ සේවිකාව තේ බඳුන් සහිත බන්දේසිය මේසය මත තබා පැන දිවුවාය.

"හුඟක් දවසකින් මට රහස් පරීක්ෂණ කටයුත්තක් ලැබී තිබුණේ නැහැ" හෝම්ස් කීවේ ඇඳුම් මාරුකරගෙන පැමිණ තේ කෝප්පය අතට ගනිමිනි. "ඒකයි මගේ රසායන විද්‍යා පර්යේෂණ වල යෙදෙන්න මට කාලය ලැබුණේ"

"අද කවුද ඔබ හමුවෙන්න එන්නේ?"

"අද හවස පහට මා හමුවෙන්න එන බව කියා තිබුණේ ෆෙයාඩේල් හොබ්ස් නම් මහත්මයෙක්"

"ඔබ කලින් හඳුනන කෙනෙක්ද?"

"එහෙම නමක් තිබෙන කෙනෙක් මීට කලින් මට හමුවෙලා තියෙනවා" හෝම්ස් කීය. "ඔහු එංගලන්ත සභාවේ දේවගැතිතුමෙක්. ඔහු නම් දිගු කලක් හැමර්ස්මිත් ප්‍රදේශයේ දෙව් මැඳුරක් භාරව සිටියා. ඉන්පසු එතුමා ක්‍රොයිඩන් වලට ගියා. එතුමා ධනවත් පවුලක කාන්තාවක සමග විවාහ වූ බව මට පසුව අහන්න ලැබුණා. ඔවුනට විවාහ වීමට අවසර තිබෙන නිසා, ඒකෙ ගැටලුවක් ඇතිවුණා කියල මං හිතන්නේ නෑ. එහෙම නැත්නම් දෙව්මැඳුරේ කටයුතු සම්බන්ධයෙන් ඔහුට මොකක් හරි ගැටලුවක්

ඇතිවෙලාද? කුලීරියක් ආවා වොට්සන්. මං හිතන්නේ ඒ හොබ්ස් මහත්මයා විය යුතුයි. අපි බලමු වොට්සන්........"

එක් නැනැත්තෙකු උඩු මහලට එන ශබ්දය අපට අසන්නට ලැබිණ. ඔහු කවුරු වුවත් පියගැට පෙළ නැග්ගේ ඉතාමත් සෙමින් ඉතා අපහසුවෙන් බැව් අපි තේරුම් ගත්තෙමු. මිනිත්තු දහයක් පමණ ගතකොට ඔහු උඩු මහලට පැමිණ තිබුණේ, සැරයටියක ආධාරයද ලබාගෙන බැව් අපි දුටුවෙමු.

"සිදුවුණු පමාව ගැන මට සමාවෙන්න මහත්වරුනි" දේවගැති ඇඳුමෙන් සැරසී සිටි එතුමා කීවේ හිස්වැස්ම ඉවත් කරමිනි.

"මේ මගේ මිත්‍රයා මෙන්ම සහායකයා දොස්තර වොට්සන්. මං දන්නෙ නෑ ඔබට ඔහු හමුවෙලා තියෙනවද කියල?" හෝම්ස් කීවේ අසුන් ගන්නා මෙන් දේවගැතිතුමාට සංඥා කරමිනි.

"මොකද මං දන්නෙ නැත්තෙ?" එතුමා කීවේ අව්‍යාජ සිනාවක් පා මට හිස නමා ආචාර කරමිනි. "හෝම්ස් මහත්මයාගේ වික්‍රමාන්විත පරීක්ෂණ මහජනයාට වාර්තා කරන්නෙ දොස්තර ජෝන් වොට්සන් බව ප්‍රසිද්ධ කරුණක්. මං ලන්ඩනයේ පදිංචිව උන්නු ඒ කාලෙ මගේ සෙම්ප්‍රතිශ්‍යා - උණ තත්ත්වයකටත් ඔබතුමා ප්‍රතිකාර කළා."

"හොබ්ස් මහත්මයා. ඔබ ඒ දවස්වල බොහොම ක්‍රියාශීලී කඩිසර නිරෝගී කෙනෙක් බව මට මතකයි" හෝම්ස් කීය. "ඔබ කොහොමද මේ විදියට සැරයටියක් පාවිච්චි කරන තත්ත්වයට වැටුණේ?"

"මේක මනුෂ්‍ය ශරීරයේ හැටිනේ මහත්මයා" දේවගැතිතුමා කීය. "හැමර්ස්මිත් වලදි විවාහ වෙලා මං ක්‍රොයිඩන්වලට මාරුවෙලා ගියා. එහේදි වැඩ කටයුතු අධික වුණා. කෙටි කාලයක් ඇතුළත විශාල වැඩ කොටසක් කරද්දී මං ආඝාතයකට ලක්වුණා. දැන් බොහොම දුරට සනීපයි. නමට දේවගැති තනතුර දැරුවාට මං දැන් විශ්‍රාමිකයි මහත්මයා. ඒ වුණත් අපෙන් ඉටුවිය යුතු යුතුකම් තවමත් තිබෙනවානේ. දැන් මං වෙහෙසෙන්නේ ඒ වැඩ කටයුතුවලට"

"ඉස්සරවෙලා තේ ටිකක් බීලා ඉඳිමු" කී හෝම්ස් තේ කෝප්පයක් සමග අතිකුත් ඇ අඩංගු බන්දේසිය, දේවගැතිතුමා සිටි තැනට ගෙන ආවේය. කතාබහ ඇරඹුණේ තේ පානය අවසන් කළ පසුවය.





"හෝම්ස් මහත්මයා. ඔබතුමා හමුවෙන්න මං තීරණය කළේ කාරණා දෙකක් නිසා. ඒවා මං පිළිවෙළින් ඔබට කියන්නම්. ඔබතුමා අහල ඇති සර් මයිකල් හැලිඩේ ගැන? ඔව්. චීන අධිරාජ්‍යයට බ්‍රිතාන්‍යයෙන් යවා සිටින තානාපති නිලධරයා ඔහුයි. ඔහු මගේ පාසල් මිත්‍රයෙක්. ඉගෙන ගන්නා කාලයේ ඇතිවුණු හිතවත්කම අප අතර දිගටම තිබුණා. ඔහුගේ පියා සර් වින්ස්ටන් හැලිඩේ කාලයක් යටත් විජිත භාර මහ ලේකම් ධුරය දැරූ බව ඔබට මතක ඇති. ඉහළම ප්‍රභූ පෙළපතක කෙනෙකු වුණත් මයිකල් හරිම නිහතමානි කෙනෙක්. මං ආගමට නැඹුරු වෙලා ආගම වෙනුවෙන් ජීවිතය කැප කරන්න තීරණය කළා. ඒ වුණත් අපේ මිත්‍රත්වයේ වෙනසක් වුණේ නැහැ."

මීළඟට කිවයුතු දේ කල්පනා කරන්නාක් මෙන් හොබ්ස් මහතා නිහඬ වෙද්දී, මම ඔහු දෙසට නෙත් යොමු කළෙමි. අවුරුදු හැටක් පමණ වයස් වූ ඔහුට තිබුණේ සිහින් උස සිරුරකි. බොහෝ දුරට තට්ටය පෑදී තිබූ හිසේ ඉතිරිව තිබූ කෙස් ගස්ද සියල්ල සුදුවී තිබිණ. මගෙන් ප්‍රතිකාර ගෙන තිබුණා යයි පැවසුවද, ඔහු මීට කලින් දැක තිබූ බවක් වත් සිහි කිරීමට මට හැකියාවක් නොවීය.

"මීට අවුරුදු කිහිපයකට පෙර සර් මයිකල් ගේ බිරිඳ ඊඩිත් හැලිඩේ ආර්යාව, හදිසි හෘදයාබාධයකින් චීනයේදීම මියගියා. සර් මයිකල්ට ඉන්නෙ එකම දරුවෙක් පමණයි. ඒ දියණියක්. ඇය වයස අවුරුදු විසි එකක් පමණ වන තැනැත්තියක්. ඇය උසස් අධ්‍යාපනය සඳහා එංගලන්තයට පැමිණ කෙටි කාලයක් ලන්ඩනයේ සිටියා. නැවත වරක් ඇය පීකිං බලා නැවෙන් ගියෙත් තනිවම.

ඉගෙනීම හෝ වැඩ රාජකාරි කිසිවක් නැතිව ඇය චීනයේ කාලය ගත කරන අතරේ, නොගැළපෙන ප්‍රේම සම්බන්ධයකට පැටලිලාලු. සර් මයිකල් ඒ බව මට ලියා දැන්නුවා. චීන භාෂාව ඉගෙනීම සඳහා එහි ගිහින් සිටින ඉංග්‍රීසි ජාතික තරුණයෙකු සමගලු, ඇය පෙම් සබඳතාව ඇති කරගෙන තිබෙන්නේ. සර් මයිකල් හැලිඩේල එංගලන්තයේ ප්‍රභූ පරපුරක අය බව ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැනේ. ඉන්දියානු මහා කැරල්ල මැඩ පවත්වන්න ඛාන්පූර් වෙත යැවූ සේනාංකයේ සේනාධිනායකවරයා වූ සර් නෙවිල් හැලිඩේ තමයි මයිකල්ගේ වැඩිමහල් සොහොයුරා. පහුගිය අවුරුදු හාරසියයකට වැඩි

කාලයක්, ඔවුන් එංගලන්තයේ රජවරුන් වෙනුවෙන් සටන් කළ, ප්‍රභූ පරපුරේ අය.

ඉවෝන් හැලිඩේ මෙනෙවිය සම්බන්ධයක් ඇති කරගෙන තියෙන්නේ බොනිෆස් කැමරන් නම් තරුණයෙකු සමගලු. කැමරන්ල කියන්නේ යන එන මං නැතුව ඉඳලා, ස්කොට්ලන්තයෙන් එංගලන්තයට සංක්‍රමණය වුණු සුළු ව්‍යාපාරිකයො. ඔවුන් කට්ට කෙරාටික තක්කඩීන් බව අපට අමුතුවෙන් කියන්න උවමනා නැහැ. ඔවුන් ආගම පැත්තෙන් වත් අපට ගැළපෙන්නේ නෑ. ඉතින් එහෙම පවුලක තරුණයෙකු සමග ඉවෝන් පෙම් සබඳතාවක් ඇතිකර ගැනීම සර් මයිකල්ට ලොකු ප්‍රශ්නයක් වුණා. ඒ නිසා හොර රහසේම ඇයව එංගලන්තයට එවන්න ඔහු තීරණය කළා. දැන් ඇය මෙහි පැමිණිලා මගේ භාරයේයි ඉන්නෙ."

"හොබ්ස් මහත්මයා. එතකොට ඔබගේ ප්‍රශ්නය ඇතිවෙලා තියෙන්නෙ කුමක් සම්බන්ධයෙන්ද?"

"මං මේ ඒ ගැන ඔබට කියන්නයි හැදුවේ. පහුගිය සති දෙක තුනක කාලයක් හැලිඩේලගෙ ප්‍රශ්නය ගැන සිත යොදවලයි මං හිටියේ. ඒ ගැන හිතේ කැලඹීමෙන් ඉන්න අතරෙදි, මට වෙනත් ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදුවුණා" කී හොබ්ස් මහතා තම කබා සාක්කුවෙන් සුදු පැහැති ලොකු ලියුම් කවරයක් එළියට ගත්තේය. එය විවෘත කළ ඔහු ඉවතට ගත්තේ ලොකු සුදු කඩදාසියකි. ඔහු එය හෝම්ස් අතට දුන්නේය. ඔහු එය දිග හරිද්දී මම ඒ දෙසට නෙත් යොමු කළෙමි. කඩදාසියේ ඇඳ තිබූ එක් රූප සටහනක් හැරෙන්නට වෙනත් කිසිවක් එහි නොවීය. එම චිත්‍රය වූයේ තීන්තෙන් ඇඳ තිබූ කඩුවකි. උල් තලයක් සහ රැළි සහිත මිටක් තිබූ එය අඟල් හයක් පමණ දිගු චිත්‍රයක් විය. අපි පුදුමයෙන් ඒ දෙස බලා සිටියෙමු.

"හෝම්ස් මහත්මයා. මගේ ගෙදරට ඕක තැපෑලෙන් ලැබුණේ දවස් නවයකට කලින්" හොබ්ස් මහතා කීය. "ඊළඟට ඊයේ මට තවත් ඔය වගේම ලියුමක් ලැබුණා" කී ඔහු කබායේ ඇතුළු සාක්කුවකින් තවත් සුදු ලියුම් කවරයක් ගත්තේය. එය අතට ගත් හෝම්ස් එහි තිබූ කඩදාසිය ඉවතට ගත්තේ එක් ක්ෂණයකිනි. එහිද අකුරු ලියා නොතිබිණි. එහි ඇඳ තිබුණේ කඩු දෙකක චිත්‍රයකි.

පළමුවෙන්ම ලියුම් කවර දෙක එකට ළංකළ හෝම්ස් ඒවා වෙත තම අවධානය යොමු කළේය. කාචය ආධාරයෙන් කවරවල





ලිපිනය සහිත පැත්ත හා පිටුපස පැත්ත පරීක්ෂා කොට ඒවායේ ඇතුළත ද උනන්දුවෙන් බැලීය.

එකම ආයතනයක නිෂ්පාදනය කර තිබූ ලියුම් කවර දෙකේම පිටත ලියා තිබූ අත් අකුරු එක සමාන විය. ඒවා පාසල් ළමුන් අත් අකුරු පුහුණුවට ලියන ආකාරයේ, "කොපි-පොත්" අත් අකුරු බැව් මගේ මිත්‍රයා කීය. එබැවින් ඒවා ලියූ පුද්ගලයා ගැන යම් නිශ්චිත තීරණයකට එළඹීමට අපහසු බැව්ද ඔහු කීය. තවද මේවායේ දක්නට ලැබූ ලිපිනය වූයේ ෆොයාඩේල් හොබ්ස් මහතාගේ ලන්ඩනයේ ලිපිනයයි.

"ලිපිය මුලින්ම තැපැල් කරල තියෙන්නේ අයර්ලන්තයේ කෝක් නගරයෙන්. ඊට පසු එහි ලන්ඩන් තැපැල් මුද්‍රාවත් තිබෙනවා. ලියුම් දෙකම ඒ විදියයි" හෝම්ස් කීය. "කවර දෙකේම ලිපින ලියා තිබෙන්නේ එකම පුද්ගලයකු විසින්. නමුත් කඩදාසි දෙකේ චිත්‍ර ඇඳ තිබෙන්නේ වෙනස් පුද්ගලයින් බව කිව හැකියි. ඒ මොකද පළමුවැනි චිත්‍රය ඇඳි තැනැත්තා, චිත්‍ර ඇඳීමේ දක්ෂකම් අඩු කෙනෙක්. ඔහු චිත්‍රයේ සමහර කොටස් දෙවනුව සම්පූර්ණ කර තිබෙනවා. නමුත් දෙවැනි කඩු දෙකේ චිත්‍රය මඳක් රළුවට වුණත් එක් වරම ඇඳ තිබෙනවා."

හොබ්ස් මහතා අතිශය කැලඹීමට පත්ව සිටි බැව් ඔහුගේ මුහුණෙන්ම පෙනිණ.

"හෝම්ස් මහත්මයා. මේක එවල තියෙන්නේ අයර්ලන්තයේ මිනීමරු රහස් සංවිධානයකින් විය හැකියි කියා ඔබට හිතෙන්නේ නැද්ද? ආගම්වල ගැටුම් නිසා එදා ඉඳලම අයර්ලන්තකාරයින් ඉන්නේ අප සමග අමනාපයෙන් නේ. එංගලන්ත සභාවේ දේවගැතිවරයෙකු වන මාවම ඔවුන් තෝරගෙන තිබෙන්නේ ඒ නිසා වෙන්න ඇති. මේ මොන අපරාධයක්ද මහත්මයා. ඇයි ඔවුන් මාවම ඉලක්ක කරගෙන ඉන්නේ? මම කවදාවත් ඔවුනටවත් වෙනත් ආගමකටවත් විරුද්ධව කටයුතු කළ අයෙක් නෙමෙයි. එහෙමත් නැත්නම් ඔවුන් මේක එවිය යුතු පුද්ගලයා ගැන සිදුවූ වැරැදීමක් නිසාද මා අතට ලැබුණේ?"

"හොබ්ස් මහත්මයා." හෝම්ස් කීය. "ඔබ ඒ ගැන කිසිවක් හිතන්න එපා. ඒක දින කිහිපයකට අමතක කර දමන්න. ඔය ලියුම් කවර දෙක සහ චිත්‍ර දෙක මා තබා ගන්නවා. ඒ ගැන වැඩිදුර සෙවීම මං කරන්නම්. ලියුම් වලට කෝක් නගරයේ මුද්‍රාව වදින්නට

ඇත්තේ, හිතාමතාම කළ සැලසුමක් නිසාවෙන්නත් පුළුවනි. නමුත් එතැන යටි අරමුණ වෙන්නට ඇත්තේ කුමක්ද කියා මට දැනට හිතාගන්න අමාරුයි. අපි ඒක දෙවනුව විමසා බලමු.

මා හමුවීමට ආවේ කාරණා දෙකක් නිසා බව ඔබ මුලින් සඳහන් කළා. මේ ලියුම්වල ප්‍රශ්නය ඇරුණාම, ඔබ කියන දෙවැනි කාරණය මොකක්ද?"

"ඒකත් ඉතාම වැදගත් කාරණයක් හෝම්ස් මහත්මයා. තමන්ගේ දුව එංගලන්තයට, ඒ කියන්නේ මගේ භාරයට එවන බව සර් මයිකල් ලියුමකින් මට දැන්වූ බව මං ඔබට කිව්වා. එහි එක් ඡේදයක විශේෂයෙන් මේ කාරණය සඳහන් කර තිබුණා. ඒ තමයි ඉවෝන් මෙනෙවිය එංගලන්තයට එද්දී ඇය ඇගේ දියමන්ති මාලයක් රැගෙන එන බව. මේක ඇයට ඇගේ මවගෙන් උරුම වුණු වටිනා දියමන්ති මාලයක්ලු. තමන්ගේ දුව තම ආභරණ හෝ මුදල් පරෙස්සම් කර ගැනීමට සැලකිල්ලක් නොදක්වන, ඊට අදක්ෂ තැනැත්තියක බව සර් මයිකල් කියා තිබුණා. ඒ නිසා ඇය එංගලන්තයට ආ ඉක්මනින් මාලය මගේ නමට බැංකුවක තිබෙන සුරක්ෂිතාගාරයක තැබුවොත්, තමන් ඉතා කෘතඥ වෙන බව ඔහු ලියා තිබුණා.

ඇය එංගලන්තයට පැමිණි පසු මං මේ ගැන තුන් හතර වතාවක් හැලිඩේ මෙනෙවියට මතක් කළා. නමුත් මගේ කීම ඇය කිසි ගණනකට ගත්තේ නැහැ. තමන්ගේ පියා මෙම කාරණය විශේෂයෙන් සඳහන් කර තිබුණු බවත් මං ඇයට කිව්වා. නමුත් ඇය එයටද සැලකීමක් කළේ නැහැ. ඊට පස්සේ තමයි ඒ ගැන කටයුතු කිරීම මගේ බිරිඳ භාරගත්තේ. හෝම්ස් මහත්මයා. මේ කාරණය මං ඔබට කිව්වාට කමක් නැහැ. මගේ බිරිඳ මං වගේ නෙමෙයි. ඇය අනික් අයට නීතිරීති දමන ඒවා ගැන තදින් සලකන කෙනෙක්. ගෙදර කටයුතු හැම දෙයක්ම කෙරෙන්නේ ඇයට ඕන පිළිවෙළට මිස මට ඕන පිළිවෙළට නෙමෙයි. මේවාට සණ්ඩු සරුවල් කරගත්තොත්, ඒවා දිගින් දිගටම යන බව මගේ මොළයට අවබෝධ වෙනවා. ඒ නිසා ඇයට ජය ගැනීමට ඉඩහැර මං නිහඬ වෙනවා.

අපේ ගෙදර දියමන්ති මාලයක් තබා ගැනීම බොහොම බරපතළ කාරණාවක් බව මගේ බිරිඳ හැලිඩේ මෙනෙවියට කෙළින්ම කිව්වා.





"ඔකෙ වගකීම අපට නම් භාරගන්න බැහැ. මේ මොහොතෙම ඔබේ දියමන්ති මාලය මෙහේට අරගෙන එන්න. ඒක බැංකුවේ සුරක්ෂිතාගාරයට ගෙනිහින් තබන්න අපි කටයුතු කරනවා"

මගේ බිරිඳ මේ විදියට තදින් කියන කොට හැලිඩේ මෙනෙවිය ඒකට කන්දීගෙන නිශ්ශබ්දව හිටියා. ඊළඟට ඇය තමන්ගේ කාමරයට ගියේ එය අරගෙන එන බව කියමින්. මඳ වේලාවකින් ඇය ආපහු අප සිටි විසිත්ත කාමරයට ආවා.

"මගේ දියමන්ති මාලය අතුරුදන් වෙලා. මං ඒක තියල තිබුණේ ඔබ මට දීල තියෙන අල්මාරියේ. මගේ අනික් ආභරණ ඒ ඇමූ පෙට්ටි සමග ඒ විදියටම තියෙනවා. නමුත් දියමන්ති මාලයට වෙච්ච දෙයක් නැහැ. ඒකට මොකක් වුණාද කියා මට හිතාගන්නවත් බැහැ."

"ඒක වෙන්න බැරි දෙයක් නේ" කිව් මගේ බිරිඳ වහාම හැලිඩේ මෙනෙවියගේ කාමරයට ගියා. ඒ ඇගේ පෞද්ගලික සේවිකාවත් සමග. අල්මාරියේ තිබූ අනික් ආභරණ ඒ විදියටම තිබුණා. දියමන්ති මාලය තැබීමට යොදා ගත් පෙට්ටිය එලෙසම තිබුණත් මාලය තිබුණේ නැහැ. ඔවුන් ඒ කාමරයේ සෑම අස්සක් මුල්ලක් නෑරම හොයා බැලුවා. නමුත් මේ කියන මාලය නම් හමුවුණේ නැහැ."

"හැලිඩේ මෙනෙවිය ඔබේ නිවසට එද්දී ඇගේ පෞද්ගලික සේවිකාවත් කැඳවාගෙනද ආවේ?"

"නැහැ. ඇගේ පෞද්ගලික සේවිකාව වුණේ, ඇය කුඩා කාලයේ සිට රැක බලාගත් වයස් ගත චීන ගැහැනියක්ලු. හැලිඩේ මෙනෙවිය එද්දී මේ චීන ගැහැනියත් එංගලන්තයට ඒම සඳහා පීකිං වලින් පිටත් වී ඇවිත් තිබෙනවා. නමුත් නැවෙන් එන අතරේ මේ චීන සේවිකාව, බරපතළ ලෙස "සමුද්‍රුරු ආබාධයට" ගොදුරු වෙලා තියෙනවා. තමන් මේ ආබාධයෙන් මියයාවි යයි මේ අසරණ ගැහැනිය බියවී සිටියාලු. තමන්ගේ මිනිය විදේශ රටක වළ දමන එකට චීන ජාතිකයන් දක්වන භය ගැන ඔබ අසා ඇති. ඉතින් ඇයට උවමනා වුණාලු ආපසු යන්න.

මේ නිසා ඔවුන් පැමිණි "රැන්ගූන්" නෞකාව කොළඹ වරායේ නැංගුරම් ඇමූ වෙලාවේ චීන සේවිකාව නැවෙන් බස්සලා තියෙනවා. ඔවුන් පැමිණි "රැන්ගූන්" නැව පී ඇන්ඩ් ඕ නැව් සමාගමට අයත් යාත්‍රාවක්. මීළඟට එන චීනය බලා යාත්‍රා කරන නැවකින් සේවිකාව ආපසු යැවීම සඳහා ඇය බාර දුන්නාලු, කොළඹ

වරායේ පී ඇන්ඩ් ඕ නියෝජිතයාට. ගමනේ ඉතිරි කොටස සඳහා සේවිකාවක් හොයාගන්නත් හැලිඩේ මෙනෙවියට හැකිවුණාලු. ඒ අඩු මුදලට තුන්වැනි පංතියේ ගමන් කළ මගී කාන්තාවක්"

"පීකිං ඉඳන් ආ දීර්ඝ ගමනට මුල ඉඳලම හැලිඩේ මෙනෙවිය සමග පැමිණ සිටියේ චීන කාන්තාව විතරද?"

"නැහැ. ගමනේ දුෂ්කරම හරිය පීකිං සිට හොංකොං දක්වා ගමනලු. ඒකට ඇගේ මිතුරියන් රාශියක් හැලිඩේ මෙනෙවිය සමග ඇවිත් තියෙනවා. ඇය තම සේවිකාව සමග "රැන්ගූන්" නැවට නැගල තියෙන්නේ හොංකොං වලදී"

"ඔබට ඇය හමුවුණේ කොහේදිද?"

"මගේ සූදානම තිබුණේ නැව ලන්ඩන් වරායට ආවාම ඇය හමුවෙන්නයි" හොබ්ස් මහතා කීය. "මං ඒ බව ඇයට ලියුමකින් දන්වා තිබුණා. නමුත් හැලිඩේ මෙනෙවිය ප්ලිමත් වරායේදී නැවෙන් බැසීමට තීරණය කළාලු. තමන් දුම්රියෙන් ප්ලිමත් සිට වෝටලූ දක්වා එන බව ඇය මට විදුලි පුවතකින් දන්වා එව්වා. තමා හමුවීමට කැමති නම් වෝටලූ දුම්රියපොළට එන මෙන් ඇය කියා තිබුණා"

"මට පෙනෙන්නේ ඇය තමන්ට ඕන පිළිවෙළට කටයුතු කරන තරුණියක වගෙයි. ඇය හැදුණේ, වැඩුණේ ඉගෙන ගත්තේ චීනයේමද?"

"ඔව් මහත්මයා. ඇයට ඉගැන්වීමට පෞද්ගලික ගුරු මහත්මීන් මුල සිටම යොදවා තිබුණාලු. ප්‍රංශ සහ ඇමරිකානු ගුරු මහත්මීන් කිහිප දෙනෙකුම ඒ කටයුත්තේ යෙදුණාලු. ඇය උසස් අධ්‍යාපනය සඳහා එංගලන්තයට පැමිණ කෙටි කාලයකින් ආපසු ගිය බවත් මං ඔබට කිව්වා. ඇය සර් මයිකල්ගේ එකම දරුවා නේ. ඇය කුඩා කාලයේම මව මියගියත්, දියණිය එංගලන්තයට එවන්න ඔහුගේ කැමැත්තක් තිබුණේ නෑ."

"ඔබත් සර් මයිකල් හැලිඩේත් සමීප මිතුරන් බව ඔබ කිව්වා. දියණියගේ අනාගතය සම්බන්ධයෙන් ඔහුගේ බලාපොරොත්තු මොනවාද?"

"ඔහු තමන්ගේ රැකියාවෙන් විශ්‍රාම ගැනීමට දැනටමත් අයදුම් කරලලු. චීනයේ රැකියාවට ඔහු ගියේ මීට අවුරුදු විස්සකට කලින්. තව මාස කිහිපයකින් ආපසු ඒමට හැකිවේවි කියලයි ඔහු කියන්නේ"





"එතකොට මේ කැමරන් තරුණයා සමග සම්බන්ධයට සර් මයිකල් තදින්ම විරුද්ධ බවයි ඔබ කිව්වේ?"

"ඔව් හෝම්ස් මහත්මයා. ඔහු යන්තම් අවුරුදු විසි එකක් වුණු තරුණයෙක්. කැමරන්වරුන් ලන්ඩනයේ සුළු වෙළෙඳ ව්‍යාපාර අරඹා තිබෙන බව ඇත්තයි. නමුත් ඒවාත් මහා පරිමාණයේ සාර්ථක ව්‍යාපාර නෙමෙයි. මේ තරුණයා කිසිම අංශයකින් ඉහළට ඉගෙන ගන්න සමත් වෙලා නැහැ. චීන භාෂාව ඉගෙන ගත්තොත් ඔහුට රේගුවේ රැකියාවක් ගන්න හැකිවේවි කියා ඔහුගේ පියා සිතනවාලු. මේ තරුණයාට විවාහයක් කරගන්න, තමන්ගේ කියා මුදලක් උපයාගන්න, තව අවුරුදු දහයක් දොළහක් යාවිලු. අනික් අතට ඉවෝන් හැලිඩේ මෙනෙවිය කියන්නේ විශාල ධනස්කන්ධයකට හිමිකම් කියන තැනැත්තියක්. ඇගේ නිසි වයස සම්පූර්ණ වෙද්දී තමන්ගේ මවගේ මුදලයත් ඇයට උරුම වෙනවා. ඉතින් එංගලන්තයේ උසස් තනතුරක් හොබවන කෙනෙකුට තම දියණිය විවාහ කර දීමට, සර් මයිකල්ගේ ඇති කැමැත්ත අපට තේරුම් ගන්න පුළුවනි."

"එංගලන්තයට එන ගමනට හැලිඩේ මෙනෙවිය බොහොම අකමැති වෙන්න ඇති කියලයි මට හිතෙන්නේ?" හෝම්ස් විමසීය.

"එහෙම වෙන්න ඇති. එහේ ඉන්න මිතුරු මිතුරියන් හැම දෙනෙකුම අත්හැර දමා හදිසියේ එහෙම එන්න සිදුවුණාම, ඒකෙ පුදුමයක් නෑ. අනික මෙහේ ඉන්න හැම දෙනෙකුම ඇයට නාඳුනන්නන්. ඇය හරිම නිශ්ශබ්දයි. ඒ වගේම ලැජ්ජාශීලියි. කිසි කෙනෙකු සමග කතා බහකට එන්නෙ නෑ. කිසි කෙනෙකු හමුවීමට කැමති නෑ. කොහේවත් යන්නෙ නෑ. චීනයේදී සර් මයිකල් සමග මිත්‍ර සම්බන්ධතා තිබුණු දෙතුන් දෙනෙක්, පහුගිය දවසක ඇය දකින්න ආවා. ඒ වෙලාවේ ඇයට හිස කැක්කුමක් සෑදී ඇය වහාම ඇඳට ගියා. බලාගෙන ගියාම ඇය හිතවත් කම්න් ආශ්‍රය කරන්නේ මගේ බෑනා පීටර් විතරයි."

"ඔබේ ගෙදර දැනට පදිංචිව සිටින අය කවුද කියලා මට කියන්න"

"සාමාන්‍යයෙන් අපේ ගෙදර පදිංචිකරුවන් වෙන්නේ මා, මගේ බිරිඳ, මගේ බිරිඳගේ පෞද්ගලික සේවිකාව; ඇය දැනට

හැලිඩේ මෙනෙවියගේ සේවිකාව හැටියටත් රාජකාරි කරනවා. ඊට අමතරව ප්‍රධාන ගෘහ සේවකයා, කෝකියා සහ ගෘහ සේවිකාව. දැන් මේකට අමතරව එකතු වෙන්නේ ඉවෝන් හැලිඩේ මෙනෙවිය සහ මගේ බෑනා පීටර්. ඉන්දියාවේ බ්‍රිතාන්‍ය යුද හමුදාවේ සේවය කරන ඔහු, මේ දිනවල නිවාඩු පිට තමන්ගේ රෙජිමේන්තුව සමග එංගලන්තයට ඇවිත්."

"දැන් මට ඔබෙන් විමසන්න තියෙනවා අර මාලය ගැන කරුණු කිහිපයක්" හෝම්ස් කීවේ තම සටහන් පොත අතට ගනිමිනි.

"හොබ්ස් මහත්මයා. ඔබට හිතෙන්නේ මේ දියමන්ති මාලය නැතිවීමත්, කඩුවල චිත්‍ර තැපෑලෙන් ලැබීමත් අතරේ සම්බන්ධයක් තියෙනවා කියලද?"

"ඉස්සර වෙලා ඔය කාරණය මගේ මොළයට ඒ තරම් කල්පනා වුණේ නෑ" හොබ්ස් මහතා කීය. "නමුත් හොඳට කල්පනා කරල බැලුවාමයි ඒක මට තේරෙන්නෙ. එක දවසක් මාලය නැතිවීම ගැන මං මගේ බිරිඳටත් ගෙදර සේවකයන්ටත් තදින්ම දොස් කිව්වා. මං කිව්වා මේක සෙවීම මං පොලීසියට භාරදිය යුතුයි කියලා. සර් මයිකල් මේ මාලය ගැන ඔහුගේ ලියුමේ විශේෂයෙන් සඳහන් කර තිබුණා. එහෙම තියෙද්දිත් මගේ වහල යට මෙහෙම දෙයක් සිදුවුණාම? මං කිව්වා මේක හරි ලැජ්ජාවට කරුණක්. සර් මයිකල් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමට, මං මේක පොලීසියට භාරදිය යුතුමයි කිව්වා. ඔන්න එදාට පහුවදා තමයි එක කඩුවක චිත්‍රය සහිත පළමුවැනි ලියුම මට ලැබුණේ."

"එතකොට මේ ආකාරයට පොලීසිය කැඳවීමට ඔබේ බිරිඳ එකඟ වුණේ නැද්ද?"

"නැහැ මහත්මයා. ඇය සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. හැලිඩේ මෙනෙවිය කිව්වෙත් මේ ප්‍රශ්නය ඉදිරියට ගෙන යන්න උවමනා නැහැ කියලයි. මගේ බිරිඳ එය අනුමත කළා"

"දැනට ඔබේ ගෙදරට ඇවිත් ඉන්න පීටර් නම් ඔබේ නෑදෑයා කාගේ කවුද? මං අදහස් කරන්නේ ඔහු වෙත ඔබේ තිබෙන ඥාතිත්වය කුමක්ද?"

"ඔහු මගේ බිරිඳගේ අයියාගේ පුතා. මේ මාලය නැතිවුණු එක ගැන ඔබට කියන්න මං මෙහේ නොඑන්නත් ඉඩ තිබුණා මහත්මයා. නමුත් හදිසියේම මගේ බිරිඳට ඈත පළාතක ගමනක් යෙදුණා.





ඇයගේ වැඩිමහල් සොයුරිය අසනීප වෙලා. ඒ අවකාශයෙනුයි මට එන්න ලැබුණේ."

"මේක පොලීසියට දැනුම් දීම ගැන ඔබේ බිරිඳ විරුද්ධ වුණේ ඇයි?"

"ඒකට ඇය කාරණා සීයක් විතර නොනවත්වාම දොඩවන්න ඇති. නමුත් ඒ ඔක්කොම මට දැන් මතක නෑ. හැලිඩේ මෙනෙවියගේ තර්කයක් වුණේ, මේක පොලීසියට දැනුම් දුන්නාම තමන්ට පොලිස් උසාවියට යන්න සිදුවේවි; එංගලන්තයේ පොලීසි සහ උසාවි තමාට නුපුරුදුයි කියන කරුණ. අනෙක ඇය කිව්වේ ඔය විදියේ කලබලයක් ඇති කරන්න තරම් වටිනාකමක් මේ මාලයට නොමැති බවයි."

"මාලයේ වටිනාකම ගැන ඇගයීමක් කරල තිබුණද?"

"ඒක මට කිව්වෙත් ඇයමයි. එහි දියමන්ති වල වටිනාකම පවුම් දෙදහසක් බව චීනයේදි කියා තිබෙනවා. ලන්ඩනයේදී ඒ වටිනාකම දෙගුණයකින් ඉහළ යනවා මිස අඩුවේවි කියා මං හිතන්නේ නැහැ."

"ඇයට ඒකෙ අගයක් නැහැ?"

"නැහැ මහත්මයා. ඇයට ඒක උරුම වී තිබෙන්නේ ඇගේ මියගිය මවගෙන්. දෙමව්පියන් ගෙන් තමන්ට ලැබෙන දේවල කිසිම වටිනාකමක් සමහර ළමයින්ට නැහැනේ"

"මේ ගැන පොලීසි නොයා යුතු බවට ඔබේ බිරිඳ ඉදිරිපත් කළ එක් හේතුවක් වත් ඔබට මතකද?"

හොබ්ස් මහතා පිළිතුරු දුන්නේ මඳ වේලාවක් කල්පනා කිරීමෙන් පසුවය.

"දැන් හැදෙන ගැහැනු ළමයි ඔවුන්ගේ ආභරණ ගැන බොහොම නොසැලකිලිමත් බව මගේ බිරිඳ කිව්වා. මේ දියමන්ති මාලය සමහරවිට නැතිවෙන්න ඇත්තේ පීකිං වලදී විය හැකියි; ඇය ඒක කොහොමටවත් එංගලන්තයට නොගෙනාව වෙන්නත් පුළුවනි කියා ඇය කිව්වා."

"හොබ්ස් මහත්මයා" හෝම්ස් කීය. "මීළඟට මං කැමතියි ඔබේ නිවස පරීක්ෂා කර බලන්න. එහි කාමරවල පිහිටීම, විශේෂයෙන්ම හැලිඩේ මෙනෙවියගේ කාමරය ආදිය මං පරීක්ෂා කළ යුතුයි. අනෙක් කාරණය තමා, මං කැමතියි මේ හැම දෙනෙකුම

හමුවෙන්නත්. ඒක මං ඉක්මනින්ම කළ යුතුයි. ඒ සඳහා ඔබේ නිවසට කවදද අපට එන්න පුළුවන් වෙන්නේ?"

"මගේ බිරිඳ සිකුරාදා ආපසු ඒමට නියමිතයි. එතකොට අපට තව දින හතරක් තියෙනවා. ඊට පෙර හැම දෙයක්ම කළ යුතුයි. නැත්නම් මට කනක් ඇහිල ඉන්න ලැබෙන්නේ නැහැ. හෝම්ස් මහත්මයා ඔබ දන්නවානේ සමහර උද්ධච්ඡ ගැහැනුන්ගේ හැටි?"

"මේ කටයුත්තට අපි දෙන්නා හෙට නොවෙයි අනිද්දා, ඒ කියන්නේ බදාදා උදේ ආවොත් කොහොමද?" හෝම්ස් විමසුවේය. "තවත් කාරණයක් මං ඔබට කිව යුතුයි. අපි එන්නේ නිවාස අලුත්වැඩියා කරන සමාගමක සේවකයන් දෙදෙනෙකු වගේ. නිවසේ යළිත් වරක් තීන්ත ගෑමටත්, කැඩී බිඳී ගිය තැන් අලුත්වැඩියා කිරීමටත් ඔබ අපෙන් ඉල්ලීමක් කරලා; අපි ඇවිත් ඒ සඳහා නිවස පරීක්ෂා කර බලනවා. එහෙම කියන එක හොඳයි නේද?"

"ඒක ඉතාම හොඳයි මහත්මයා. කොහොම වුණත් ඔබේ පරීක්ෂාවන් මගේ බිරිඳ ආපසු එන්න කලින් කළොත් ඉතාමත් හොඳයි. ඔබ බදාදා උදේ දහයට ඒවි කියා මං බලාපොරොත්තු වෙනවා" කී අමුත්තා අපෙන් සමු ගත්තේය.

"වොට්සන් මට තියෙනවා සොයා බැලීම් කිහිපයක්ම කරන්න. ඒකට හෙට දවසම ගතවේවි. ඔබට හැකි වේවිද බදාදා මෙහේට එන්න? අපි යන්නෙ නිවාස අලුත්වැඩියා කරන්නන් හැටියටනේ. ඒ නිසා ඒකට දෙදෙනෙක් වත් ගියොත් හොඳයි"

බදාදා උදෑසන දහය වෙද්දී අපි බර්ක්ලි චතුරශ්‍රය දෙසට පා නැගුවෙමු. ෆෙයාඩේල් හොබ්ස් මහතාට විවාහයත් සමග හිමි වී තිබූ මෙම නිවස, ප්‍රමාණයෙන් විශාල, පැරණි එකක් විය. එහි අලුත්වැඩියාවක් මෑතකදී සිදුවී නොතිබිණි.

හොබ්ස් මහතා ඉදිරිපස දොරටුව අසලට වී අප එනතුරු බලා සිටියේය.

"ඔබ ආවෙ හොඳ වෙලාවට" ඔහු කීය. "මගේ බිරිඳ අද හැන්දෑවෙ එන බව කියලා මට විදුලි පුවතක් එවා තිබුණා"

අප දෙදෙනාම හැඳ පැළඳගෙන සිටියේ සමාගම් සේවකයන් විලසිනි. සාක්කුවල තිබූ සටහන් පොත් හා පැන්සල් අතින් ගෙන අපි බිත්ති පරීක්ෂා කිරීම ඇරඹුවෙමු. විසිත්ත කාමරයේ සිට කෑම කන කාමරය දෙසට යද්දී, දෙදෙනෙකු කාමරයක් තුළ කතාබහ





කරන ශබ්දයක් අපට අසන්නට ලැබිණි. ඒ තරුණයෙකුගේ හා තරුණියකගේ කටහඬය.

"කාඩ් කුට්ටම ආයෙ සැරයක් කපන්න" තරුණයා කියනු ඇසිණ. "හරියට හරි. මේ බලන්න ඉවෝන්. මේ සැරෙත් ගිය සැරේ වගේමයි. ඔන්න බලන්න හාරත රැජින. ඇයව පිරිවරාගෙන ඉන්නෙ ඩයමන්ඩ් කොළ (රුවිත) ගොඩක්. මේ බලන්න ඇය හාරත බුරුවාට පස්ස හැරවූ හැටි. ඔබට හිමිවන වාසනාව වළක්වන්න කාටවත් බෑ. බලන්න ඩයමන්ඩ්ස් රජු හාරත රැජිනට ළංවෙලා ඇය දිහාම බලාගෙන ඉන්න ලස්සන. දැන් තුන්වැනි සැරේටත් හාරත රැජින ළගට එන්නෙ නැතුව හාරත බුරුවා මඟ ඇරලා ගියා. කාඩ් කුට්ටමෙන් ලබාදෙන තීරණය ඔබට වැටහෙන්නෙ නැද්ද? ඔබට හරිහැටි වචනයක් නොදී මඟ ඇරල ගිය මිනිහට......."

"ෂ්!" ඇය කියනු ඇසිණ. "මට ඇහුණා විසිත්ත කාමරය පැත්තෙන් අඩි ශබ්දයක්. සැකයක් නෑ කවුරු හරි මේ පැත්තට එනවා."

ඔවුන්ගේ දොරට තට්ටු කළ හොබ්ස් මහතා කාමරයට ඇතුළු වූයේ ඉන්පසුවය. අපි ද ඔහු පසුපස ගියෙමු. ටීපෝවක් දෙපැත්තේ අසුන්ගෙන කාඩ් ක්‍රීඩාවේ යෙදී සිටි තරුණ යුවළ අප දැක පුදුමයට පත් වූහ.

"පීටර්. මං කල්පනා කළා ගේ අලුත්වැඩියා කරන්න. මේ මහත්වරු ආවේ ඒකට ඇස්තමේන්තුවක් ලබාදෙන්න."

"නැන්දා එනතුරු ඉඳල, ඇයගෙන් අහලම ඔය වැඩ පටන් ගත්තොත් නේද හොඳ?" පීටර් පිළිතුරු දුන්නේය. "ගේ නම් එච්චර අපිරිසිදු වෙලත් නෑ"

"මේක කවදා හරි කරන්න සිදුවෙන හුගක් වියදම් යන වැඩක්" හොබ්ස් මහතා කීය.

අපි දෙදෙනා සාක්කුවලින් සටහන් පොත් හා පැන්සල් එළියට ගත්තෙමු. මීළඟට හෝම්ස් අතේ තිබූ ටේප් පටියෙන් බිත්ති මැනීමට පටන් ගත්තේය. මම ඊට සහය වීමි.

"මාම ගෙ කැමැත්තක්" පීටර් කීය. "අපි මෙතැන ඉන්න උවමනා නැහැ. අපි යනවා බිලියඩ් කාමරයට."

ඔවුහු එතැනින් පිටවී ගියහ. ඔවුන්ගේ කතාබහ සහ සිනාහඬ මැකී යනතුරු සිටි හෝම්ස් ගෙහිමියා ඇමතුවේය.

"මහත්මයා. මීළගට මං කැමතියි හැලිඩේ මෙනෙවියගේ කාමරය පරීක්ෂා කර බලන්න. ඊට කලින් ඇයගේ හා ඔබේ බිරිඳගේ පෞද්ගලික සේවිකාව ලෙස කටයුතු කරන තැනැත්තිය කැඳවන්න. මං ඇය සමග නිවස පරීක්ෂා කර බලන්නම්"

ගෙහිමියාගේ කැඳවීම අනුව පැමිණි සේවිකාව, මැදිවිය ඉක්ම වූ තැනැත්තියක වූවාය. ගෙදර ස්වාමි දුව නොමැති මොහොතක පැමිණ ගේ ඇතුලේ අප කළ සෝදිසියට, ඇය කැමැති නොවූ බැව් මම තේරුම් ගතිමි.

මුලින්ම අවධානයට ලක්වූයේ සේවක සේවිකාවන්ගේ නිදන කාමර තිබූ ඉහළම තට්ටුවයි. ඉන්පසු අපි පහළ තට්ටුවට බැස ආවෙමු. නිවසේ ප්‍රධාන නිදන කාමර පිහිටා තිබුණේ මෙම දෙවැනි තට්ටුවේය.

"හැලිඩේ මෙනෙවියගේ කාමරය මෙන්න මේක" සේවිකාව කියුවේ එක් වසා තිබූ දොරක් සම්පූර්ණයෙන්ම විවෘත කරමිනි. අපි එහි ඇතුළු වූයෙමු. නිවසේ අනෙක් තැන්වලද දැකිය හැකි ආකාරයට පෞරාණික ගෘහභාණ්ඩ වලින් සමන්විත වූ එය විශාල කාමරයක් විය. රෝස පැහැති ජනෙල් රෙදි, දොර රෙදි සහ ගෙත්තම් කරන ලද තිරරෙදි වලින් එය විශිෂ්ට ලෙස සරසා තිබුණේ, සිටුවරියකගේ පෞද්ගලික කාමරයක් සිහි ගන්වමිනි. හෝම්ස් පසුව මට පැවසූ පරිදි ඔහුගේ සිත යොමුවූ වැදගත්ම කරුණ වූයේ, කාමරයේ තිබූ ක්‍රමානුකූල හෙවත් බඩු භාණ්ඩ අලංකාර පිළිවෙළකට සකසා තිබූ ආකාරයයි. ඇය හැඳ තිබූ ඇඳුම් එක් තැනක නමා තිබූ අතර, පාවහන්ද කාමරයේ කෙළවරක නිසි පිළිවෙළට තබා තිබිණි. හෝම්ස් ඒ වෙලාවේ තම අදහස් ප්‍රකාශ කළේ සේවිකාවගෙන් යම් අදහස් ලබාගන්නා අරමුණෙන් විය යුතුය.

"මේ කාමරයේ තීන්ත ගාන්න සෑහෙන්න ලොකු මුදලක් වියදම් කරන්න වෙච්" හෝම්ස් කීය. "අනෙක් කාමරවල ප්‍රමාණයම නිසා මේක මතින්න උවමනා නැහැ. ඒක නෙමෙයි නෝනා. මේ තරම් අලංකාර ලෙස, මේ තරම් පිළිවෙළකට, කාමරය තබා ගන්නා තරුණ නෝනා කෙනෙකුගේ කාමරයක් මං කවදාවත් දැකල නැහැ. ඔබ මේ කටයුත්තට සෑහෙන්න මහන්සි වෙනවා ඇති?"

"හැලිඩේ මෙනෙවියගේ සේවිකාව විදියට කටයුතු කරන්න කියලා මට නියම කරල තියෙනවා තමයි" සේවිකාව කීවාය.





"නමුත් ඇත්තම කියනවා නම් මට කරන්න කිසිම දෙයක් ඇය ඉතිරි කරන්නේ නෑ. සේවිකාවකගේ උදව් ඇයට කොහොමටවත් උවමනා වෙන්නෙ නෑ"

"ඔබ කියන්නෙ ඇය හැමදෙයක්ම තනියෙන්ම කරගන්නවා කියලද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා" සේවිකාව කීවාය. "මේ විදියට තමන්ගේ වැඩ තමන්ම කරගන්නා, කාමරය නිසි පිළිවෙළට තබාගන්නා කෙනෙකු ළඟ, මං කවදාවත් වැඩකරල නෑ. ඇයට ඇඳුම් අඳින්න කවදාවත් මගේ උදව් අවශ්‍ය නෑ. මං උදව් වෙන්න එනවට ඇය කැමතිත් නෑ"

ඇයගේ එම කථාවට උනන්දුවෙන් සවන්දුන් හෝම්ස් තවත් කාමර කිහිපයකට ඇතුළු වී ඒවාටද දෙනෙත් යොමු කළේය. ඒ සමගම සියලුම කාමරවල පිහිටීම, ඒවාට ඇතුළුවීමට බරාඳ පිහිටි ආකාරය, පියගැට පෙළවල් පිහිටි තැන් ආදී ගෙදර සම්පූර්ණ සැලැස්මක් ද ඔහු ඇඳගත්තේය.

අන්තිමේදී අපි යළිත් වරක් විසිත්ත කාමරය වෙත ගියෙමු. ෆොයාඩේල් හොබ්ස් දේවගැතිතුමා අපමණ කැලඹීමකට පත් ආකාරයකින් එහි ඉහළ පහළ සක්මන් කරමින් සිටි ආකාරය අපි දුටුවෙමු.

"හෝම්ස් මහත්මයා. ඔබේ වැඩ කටයුතු ඉවරද?"

"ඔව්. ඉවරයි. ඇයි මොකක්ද දැන් ඇතිවී තිබෙන ප්‍රශ්නේ?"

"මගේ බිරිඳගෙන් මට විදුලි පුවතක් ලැබුණා මීට මිනිත්තු දහයකට පෙර" ඔහු කීවේ තමා අතේ තිබූ විදුලි පුවත අප දෙසට දිගු කරමිනි. "තව පැය භාගයක් යන්න කලින් වෝටලූ දුම්රිය පොළට ළඟාවෙන දුම්රියෙන් ඇය ආපසු එනවාලු. දැන් මොකද අපි කරන්නේ? නැතිවූ මාලය ගැන සොයා බැලීමකට ඇය සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණු බව මං ඔබට කිව්වා. මොකක්ද මං ඇයට දෙන උත්තරේ? දුම්රිය එන්න තව මිනිත්තු විස්සකට වැඩිය නෑ. ඇය කිසි කෙනෙකුට හිස නොනමන, "ඔන්න කිව්වොත් කිව්වා!" ගැහැනියක බව මං ඔබට කියා ඇති"

"ඔබේ හිත කලබල කරගන්න එපා හොබ්ස් මහත්මයා" හෝම්ස් කීවේ ඔහු සන්සුන් කරන ආකාරයෙනි. "පරීක්ෂණයේ ඉතිරි හරිය කරන්න අපි මෙහේ රැඳී ඉන්න අවශ්‍ය නෑ. ඒ ටික මට පුළුවනි බේකර් වීදියේ මගේ නිවසේ ඉඳගෙන කරන්න."

"ඔබ කැමැති හැටියක් මහත්මයා. ඒ වුණත් ඔබ මේ ගෙදරට ඇවිත් තවමත් පැයක් ගතවුණේ නෑ. නැතිවුණු මාලය ගැනත් අර කඩුවල චිත්‍ර ඇඳලා මට එවන තර්ජනාත්මක ලිපි ගැනත් හැම දෙයක්ම හොයාගෙන අවසන්ද?"

"මගේ වැඩ කටයුතු තවමත් සියයට සීයක් සම්පූර්ණ නෑ." හෝම්ස් කීය. "ඒ හින්දා මගෙන් ප්‍රශ්න රාශියක් අහන්න එපා. ඒ වෙනුවට මං කැමතියි ප්‍රශ්න කිහිපයක් ඔබගෙන් අහන්න. ඔබට පුළුවන් නේද ඒවට පිළිතුරු දෙන්න. මට මෙන්න මේ කාරණාව මුලින්ම කියන්න. හැලිඩේ මෙනෙවිය ඔබේ ගෙදර පදිංචියට ආවට පස්සේ, ඇය කාට හරි ලියුම් යැව්වද? ඇයට කාගෙන් හරි ලියුම් ලැබුණද? මට ඒක කියන්න"

"ඇත්තෙන්ම ඔව් හෝම්ස් මහත්මයා. ඒ හැම දෙයක්ම දන්නා තරමින් මං ඔබට කියන්නම්.

ඇගේ ලියුම් ගනුදෙනු ගැන දැඩි අවධානයක් යොමු කරන්න කියලා සර් මයිකල් මට තදින්ම කියා තිබුණා. ඒ මොකද කැමරන් තරුණයා සමග ඇය රහසේ මොනවා හරි අදහස් හුවමාරු කරගන්නවා නම් ඒවා නවත්වන අරමුණෙන්. නියපොත්තෙන් කඩන්න තිබෙන දල්ල ඒ අවස්ථාවේදී වෙන් කළාම පහසුයි නේ පසුව පොරොවෙන් කැපීමට ඉතිරි නොකර.

කොහොම නමුත් මේ දක්වාත් ඇය එහෙම උත්සාහයක් දැරූ බවට සලකුණු, මට නම් දකින්න ලැබුණේ නෑ. ඇය හරිම විවෘතයි; හරිම අවංකයි. ඇයගේ නමට අපේ නිවසට ලැබුණු ලියුම් හැම එකක්ම මට හෝ මගේ බිරිඳට පෙන්නලා, අපට කියවා බලන්න දුන්නා. ඒ ලියුම් හැම එකක්ම වගේ සර් මයිකල් දන්නා හඳුනන අය ලියූ ඒවා. ඉවෝන් හැලිඩේ මෙනෙවිය දැන් ලන්ඩනයට පැමිණ සිටින නිසා, ඇය හමුවී කතාබහ කරන්න ඔවුන් කැමැත්ත දක්වා තිබුණා.

ඇගේ ලියුම් ලිවීම ගැන කියනවා නම් මට කියන්න තියෙන්නේ එක දෙයයි. ඒ තමයි ලියුම් ලිවීමට ඇය හරිම කම්මැලි බව. ඇයට ලැබුණු ලියුම්වලින් එකම එක ලියුමකටවත් හැලිඩේ මෙනෙවිය තවමත් පිළිතුරු ලියල නෑ. මගේ බිරිඳ ඒ ගැන සහතික වෙනවා. ඇය අපේ ගෙදරට පා තැබූ දවසේ ඉඳලා ඇගේ අතේ පෑනක් හෝ පැන්සලක් තිබෙනවා අපට දකින්න ලැබිලා නැහැ.





ඒ වගේමයි අපි හිතමු ඇය කාටත් හොර රහසේ ලියුමක් ලිව්වා කියල. නමුත් ඇය කොහොමද ඒක තැපැල් කරන්නේ? ඒ මොකද ඇය ගෙදරින් එළියට බැහැලා කොහේවත් යාමේ පුරුද්දක් නැහැ. සේවිකාවක මගින් ලියුමක් තැපැල් කරවනවා නම් ඒකටත් ඉන්නේ එක්කෙනයි. ඒ මගේ බිරිඳගේ පෞද්ගලික සේවිකාව - අර ඔබට හමුවුණු තැනැත්තිය. අපට හොර රහසේ ඇය කිසිවක් කරන්නේ නෑ. ඒ ගැන මට විශ්වාසයි. සර් මයිකල් මට කියා තිබූ කාරණාව ගැන මං මේ සේවිකාවට කල් තබා දැනුම් දීලයි තියෙන්නේ. අනිත් කාරණය; මේ සේවිකාව බාහිර තරුණියකගේ ප්‍රේම සම්බන්ධයකට රහසින් උදව් දෙන තාලේ කෙනෙකු නොවෙයි."

"ඔබ කියන දේ ඇත්ත වෙන්න ඇති" හෝම්ස් කීය. "මෙන්න මේ කාරණය මට තවදුරටත් පැහැදිලි කරන්න හොබ්ස් මහත්මයා. මේ කඩුවල චිත්‍ර ඔබට තැපෑලෙන් ආව නේ. ඒ ආවේ උදෑසන පළමුවැනි තැපෑලෙන්ද?"

"ඔව්"

"තේ මේසයේදී ඒවා ඔබ අතට ලැබෙද්දී, හැලිඩේ මෙනෙවියත් ඒ මේසයේ හිටියද?"

"ඔව් මහත්මයා. ඇය හරියට වෙලාවට වැඩ කරන කෙනෙක්. ආහාර ගැනීමට නියමිත වෙලාවට මේසයට එන්නේ එක මිනිත්තුවක් වත් ප්‍රමාද නොවී"

"ලියුම් විවෘත කළාම එහි අඩංගු දේ ගැන ඔබ මේසයේ සිටින අනික් අයට කියනවාද?"

"ලියුම්වල අඩංගු කරුණු පෞද්ගලික ඒවා නම්, මං ඒවා කාටවත් කියන්නේ නෑ. නමුත් කඩුවල චිත්‍ර සහිත ලියුම්වල කවර විවෘත කළාම මට කෑගැහුණා. දෙවාරයේම කෑ ගැහුණා. එහෙම වුණාම මේසයේ ඉන්නා අනික් අය ඒ ගැන උනන්දු වෙන එක පුදුමයක් නෙමෙයි. ඒ අසාමාන්‍ය දේ මේසයේ හිඳගෙන ඉන්නා කාගේත් අතින් අතට යනවා. හැලිඩේ මෙනෙවියත් ඒව දැකලා කම්පාවුණා. මගේ රහසිගත සතුරා කවුරු විය හැකිද යන කාරණය ගැන ඇය කතාබස් කළා."

"බොහොම හොඳයි හොබ්ස් මහත්මයා. දැන් ඔබට වෝටලූ දුම්රියපොළට යාමට වෙලාව හරි නේද? මට කීමට තිබෙන අනික් කාරණා මං දුම්රිය පොළේදී කියන්නම්"

"හෝම්ස් මහත්තයා. ඔබ කුලීරියක යන්න උවමනා නෑ. මං දුම්රිය පොළට යන්නේ අපේ අශ්ව කරත්තයේ. ඒ අතරේ ඔබටත් පුළුවනි මා සමග එන්න. ඔබට උවමනා නම් ඔබ බේකර් වීදියේ නිවසට ගෙනිහිං දාන්න කියා මං රියැදුරාට කියන්නම්......."

"ඔබට ස්තුතියි. මං එන්නම් ඔබත් සමග දුම්රියපොළට. නමුත් මං ඇතුළට එන්නේ නෑ"

හොබ්ස් මහතා සමග ඔහුගේ අශ්ව කරත්තයෙන් අපි දුම්රියපොළ දක්වා ගියෙමු. එයට ඇතුළුවන තැන අපි රියෙන් බැස්සෙමු. එවිට රියැදුරා එය රථගාල වෙත ගෙන ගියේය.

"හොබ්ස් මහත්මයා. මට අවසාන වශයෙන් ඔබට කියන්න තියෙන්නේ මෙන්න මේ කාරණයයි" හෝම්ස් කීවේ දේවගැතිතුමාගේ අතින් අල්ලාගෙන ඔහු බංකුවක් වෙත කැඳවාගෙන යමිනි.

"මහත්මයා. මට තියෙනවා ඔබට එක්තරා කාරණයක් දැනුම් දෙන්න; ඒ වගේම විශේෂ ඉල්ලීමක් කරන්න" හෝම්ස් කීය.

"ඔබ එහෙම කියනකොටත් මට බය හිතෙනවා හෝම්ස් මහත්මයා. නමුත් ඔබ මට කියන්නේ යම් කටයුත්තක් කරන්න කියලද?"

"ඔව්."

"ඒ මොන හේතුවක් නිසාද?"

"ඔබේ ගැටලු දෙක ලිහාදීමේ අරමුණෙන්"

"එහෙම නම් මං එය ඔබ කියන හැටියටම කරන්නම්. එය අකුරටම පිළිපදින්නම්"

"බොහොම ස්තුතියි. ඔබට අර කඩුවල චිත්‍ර ලැබුණු ලියුම් කවර වල පෙනුම ඔබ දැන් දන්නවා. යම් විදියකින් ඔබට ඒ ආකාරයේම ලියුම් කවරයක, එවැනි ලියුමක් ලැබුණොත්, ඔබ මොකද කරන්නේ? යම් විදියකින් ඒක ඇතුළේ චිත්‍රයක් තිබුණොත්? කඩු දෙකක් නෙමෙයි, කඩු තුනක් තිබෙන........?"

"........ දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! මහත්මයා මං ආගමානුකූලව ජීවත්වෙන, දෙවියන් වහන්සේට භක්තිමත් කෙනෙක්. මොන අපරාධයක් නිසාද මට එහෙම දඬුවමක් ලැබෙන්නේ......? එහෙම චිත්‍රයක් ආවොත් ඒ කියන්නේ එය මගේ අවසානය කියලද?"





හෝම්ස් තම දකුණු අත නළලේ තබාගෙන හිස දෙපසට සෙලෙව්වේය. ඒ කැලඹීමට පත් හොබ්ස් මහතා තමාට කන් නොදෙන ආකාරය දුටු විටයි.

"හොබ්ස් මහත්මයා. කලබල නොවී කරුණාකර මං කියන දේ අහගන්න."

"හරි හරි. මං අහගෙනයි ඉන්නේ"

"ඔබට හෙට හෝ අනිද්දා යම් විදියකින් එවැනි කවරයක් ලැබුණොත්....... ඔබ දන්නවා; ඒක අර සුදු පාට ලොකු කවරය. ඔබ කළ යුත්තේ මොකක්ද? ඔබ ඒක අතට අරගෙන විවෘත කළ යුත්තේ, කලින් කවර විවෘත කළ ආකාරයටමයි. ඊළඟට ඇතුළත ඇති චිත්‍රය අතට අරගෙන ඒක බලලා, කෑගැසීමක් කරලා, ඔබ එය අතින් අත යවනවා. හරියට කලින් කළා වගේ. ඔබේ බිරිඳට, ඔබේ බෑනාට, හැලිඩේ මෙනෙවියට ඒක බලාගන්න හැකි විදියට යවනවා. ඔබට පුළුවන්ද මං කියූ ආකාරයට ඒ දේ කරන බවට මට පොරොන්දු වෙන්න?"

"අපොයි ඔව්! ඇත්තෙන්ම ඔව්! ඔබට පොරොන්දු නොවුණත් එවැනි ලියුමක් ලැබුණොත්, හැමදෙයක්ම සිදුවෙන්නෙ ඒ පිළිවෙළට තමයි. නමුත් හෝම්ස් මහත්මයා. ඔබ කියූ දෙයින් මගේ මොළය හොඳටම අවුල් වෙනවා. ඔබට බැරිද මේක මට තවත් ටිකක් තේරුම් කරල දෙන්න? මං කැමතියි......."

වෝටලූ දුම්රියපොළට ළඟාවූ දුම්රියක් ගැන ප්‍රකාශය ශබ්ද විකාශන යන්ත්‍රයෙන් අපට අසන්නට ලැබිණ.

"......... හොබ්ස් මහත්මයා. අන්න ඔබේ බිරිඳ පැමිණෙන දුම්රිය මෙහි ළඟාවුණා. දැන් ඉතින් අපට විස්තර කතා කරන්න වෙලාවක් නෑ. හෙට දවල් දොළහට බේකර් වීදියේ මගේ නිවසට එන්න. ඔබට මං හැමදෙයක්ම තේරුම් කරල දෙන්නම්. මතක තියාගන්න. හෙට දවල් දොළහට"

එසේ කියූ හෝම්ස් වහා එතැනින් පිටව ආවේ මගේ අතකින්ද අල්ලා ගෙනය.

"වොට්සන්. ඔබටත් හැකිවේවිද හෙට දවල් දොළහට අපේ නිවහනට එන්න? මං හැමදෙයක්ම පැහැදිලි කරල දෙන්නම්"

එසේ කී මගේ මිත්‍රයා සමුගත්තේ ඔහුගෙන් කිසිවක් විමසීමට මටද ඉඩ නොතබමිනි.

*    *    *

රෝගීන්ගේ කටයුතු වෙනදාට කලින් අවසන් කොට මම දහවල් ආහාරයද කල්තබා ගත්තෙමි. අනතුරුව හරියටම දහවල් දොළහ නාද වෙද්දී බේකර් වීදියේ අපේ නිවහන වෙත ළඟාවීමට මට හැකිවිය. කුලීරියකින් එතැනට පැමිණි ෆෙයාඩේල් හොබ්ස් මහතා සීනුව නාද කළේ මා එහි ළඟාවන විටමය.

"මං වගේ හරිම අවාසනාවන්ත මිනිහෙක් තවත් මේ ලෝකෙ ඉන්නවද?" ඔහු ප්‍රකාශ කළේ හෝම්ස් පෙන්වූ අසුනේ හිඳගනිමිනි. "කඩු තුනක චිත්‍රය ඇති ලියමන මට අද උදේම ලැබුණා. ඔබ කල්තියා ඒ ගැන මට ඇනුම් දීල තිබුණු නිසා ඒක මට දරුණු පහරක් වුණේ නෑ.

නමුත් ඒකට හරියන්න මට එල්ල වුණේ නැද්ද බරපතළ මරු පහරක්. අද උදේ තේ පානය අවසන් කළ වහාම හැලිඩේ මෙනෙවිය ගෙදරින් එළියට ඇවිදගෙන ගිහින්! ඇය ගිහින් තියෙන්නේ තට්ට තනියම. සේවිකාවන් කිසි කෙනෙකුට ඇය සමග යන්න අඬ ගහලත් නෑ. ඇය කොහේ ගියාද කියල ඔවුන් දන්නෙත් නෑ. මේ ගෑනු ළමයා මීට කලින් කිසිම දවසක අපේ ගෙදරින් එළියට තනියෙන් නම් ගිහින් නෑ.

වැඩේ කියන්නෙ හෝම්ස් මහත්තයා, සේවිකාවො දෙන්නෙකුයි ප්‍රධාන ගෘහ සේවකයයි දුටුවලු ඇය එළියට බැස්ස හැටි. උන් ඔහේ නිකං බලාගෙන ඉඳල. ඒ ගැන මට හරි මගේ බිරිඳට හරි ඇනුම් දෙන්න ඕන කියල එයාලට හිතුණෙ නැහැලු. එයාල හිතාගෙන ඉඳල තියෙන්නෙ මේ ගැන හැලිඩේ මෙනෙවිය අපට කල් ඇතුව දන්වලා, අපෙන් අවසර අරගෙනයි ගියේ කියල"

"ඔය ගැන හිත කලබල කරගන්න එපා හොබ්ස් මහත්මයා" හෝම්ස් කීය. "ඔබේ හිත සන්සුන් කරගන්න. මේ මොහොතේ ඇය ඉන්නේ කොහේද කියල ඔබට කියන්නත් මට බැරි කමක් නෑ."

"මොනවා! ඔබ ඒකත් දන්නවද? මොකක්ද හෝම්ස් මහත්තයා මෙතැන කෙරෙන සෙල්ලම? මේක ඔබත් දැනුවත්ව කෙරෙන එකක් කියලා මං හිතන්නෙ නෑ. හෝම්ස් මහත්මයා. දෙවියන්ගෙ නාමෙන් මට කියන්න. මේ වෙලාවේ ඇය ඉන්නෙ කොහේද?"

"කලබල වෙලා මොළේ අවුල් කරගන්න එපා කියල මං ඔබට කිව්වනේ. වොට්සන්. මේ මහත්මයාට බොන්න සීතල





වතුර වීදුරුවක් දෙන්න...... අන්න හරි. ඔබේ ගෙදරට ආ තරුණ කාන්තාවගේ සැබෑ නම ඉවෝන් හැලිඩේ නෙමෙයි!"

"මොනවා හැලිඩේ මෙනෙවිය නෙමෙයි? එහෙනම් ඇය කවුද?"

"ඇගේ ඇත්ත නම අගතා ඕබ්‍රයන්. මේ වෙලාවේ ඇය ඉන්නේ ලැංහැම් හෝටලයේ පෞද්ගලික කාමරයක් අරගෙන."

"මොනවා පෞද්ගලික කාමරයක් අරගෙන? ඒ මොන පිස්සුවක් හැදිලද? මොකක්ද මගේ ගෙදර තියන අඩුපාඩුව? මොකක්? ඇගේ නම ඕබ්‍රයන්? එහෙම වුණේ කොහොමද?"

"හොබ්ස් මහත්මයා. මං ඔය හැමදෙයක්ම ඔබට තේරුම් කරල දෙන්නම්. ටිකක් ඉවසීමෙන් මං කියන දේ අහගෙන ඉන්න. මේක ටිකක් පැටලිලි සහිත කතාවක්; ටිකක් නෙමෙයි හුඟක් පැටලිලි සහිත කතාවක්. නමුත් ටිකක් වෙලා ගතවෙද්දී ඔබට හැකිවේවි තේරුම් ගන්න.

ඔබේ මිත්‍රයාගේ දියණිය කියල ඔබ හිතාගෙන හිටි, ඔබේ ගෙදරට ඇවිත් රැඳී සිටි තරුණියගේ නම, මං දැන් කිව්වා වගේ අගතා ඕබ්‍රයන්. ඇයව ඔබේ ගෙදරට එව්වෙ කවුද දන්නවද? ඒක කළේ ඔබේ හිතවත් මිත්‍රයාගේ දියණිය-සැබෑ ඉවෝන් හැලිඩේ මෙනෙවිය විසින්. ඇය තමයි තමන් වෙනුවෙන් පෙනී ඉඳල රඟපෑමක් කරන්න කියලා, ඕබ්‍රයන් මෙනෙවිය ඔබේ ගෙදරට එව්වෙ.

ඔබට මතක ඇති ඇගේ චීන සේවිකාව සමුදුරු ආබාධයකට ලක්වෙලා, කොළඹ වරායෙදි නැවෙන් බස්සවලා, වෙනත් නැවකින් චීනයට ආපසු යැවූ කතාව. චීන සේවිකාව ඇත්ත වශයෙන්ම සමුදුරු ආබාධයෙන් රෝගී වුණාද කියන කරුණ මං හරියටම දන්නේ නැහැ. සමහරවිට ඇයට අසනීපයක් නොතිබුණත් තමන්ගේ පහසුව සඳහා මේක ඔවුන් කළ ප්‍රයෝගයක් වෙන්නත් පුළුවනි. කවුද මේ ඔවුන්? ඒ තමයි හැලිඩේ මෙනෙවිය සහ ඇගේ පෙම්වතා බොනිෆස් කැමරන්. ඔවුන් මේ හැම දෙයක්ම සැලසුම් කරන්න ඇත්තේ පීකිං නගරයෙන් පිටත්වීමට පෙර, බොහොම කල් ඇතුව."

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" හොබ්ස් මහතාට කෑගැසිණ. "මේක මහ භයානක තත්ත්වයක් නේ. ඔය වගේ වංචනික තක්කඩි

වැඩවලට හවුල්වෙන්න පුළුවන්ද, වැදගත් පවුල්වල ගැහැනු ළමයින්ට? අහන්න දෙයක් නෑ. අර කැමරන් තක්කඩියා මේ අසරණ කෙල්ලව රවටාගන්න ඇති. හෝම්ස් මහත්තයා. ඔබ කොහොමද මේව දැනගත්තෙ? මට සම්පූර්ණ කතාවම කියන්න"

"ඔව්. මං ඔබට සම්පූර්ණ කතාව මුලින් කියන්නම්. ඒව දැනගත්තෙ කොහොමද කියන එක ඊට පස්සෙ පැහැදිලි කරන්නම්.

මගේ නිරීක්ෂණවලින් මට පෙනී යන දෙයක් තමයි; හැලිඩේ මෙනෙවිය සැලසුම් කරගත්තා, ඇය පීකිං වලින් පිටත්වෙන දිනයේ සිට දින දහයක් ඇතුළත, කැමරන්ටත් පීකිං වලින් පිටත් වෙන්න. ඊළඟට ඇය එංගලන්තයට එන නැව් මාර්ගයේම ඔහුත් ඇවිත් ප්ලිමත් වරායේදී ගොඩ බහින්න. එතැනදී තමන් රැඳී ඉන්නේ කොහේද කියලා, ඇය ඔහුට ලියුම් කැල්ලක් යවනවා.

ඉතින් දැන් පෙනෙන විදියට හොංකොං වරායේදී "රැන්ගුන්" නැවට නැඟුණු වෙලාවෙ ඉඳල, හැලිඩේ මෙනෙවිය ලොකු ජවයකින් ක්‍රියාත්මක වෙලා තියෙනවා. තමන්ගේ සැලැස්මට ඇතිවන බාධා හැම එකක්ම තේරුම් අරගෙන, ඒවා ජයගන්න ඇය ක්‍රියා කරල තියෙනවා. ඒ කටයුතුත් හිතූ විදියටම සාර්ථක වෙලා.

ඒකෙ පළමුවැනි පියවර තමා ඔබට මං කලින් කියූ චීන සේවිකාව ආපසු යැවීම. ඇයට මුදලක් ගෙවා හෝ නැතුව ඒක පහසුවෙන් සාර්ථක වුණා. තමන් ළඟ තිබූ මුදලින් චීන සේවිකාවට හොංකොං දක්වා යන ගමනට නැවේ කාමරයක් වෙන්කර ගැනීම එච්චර අපහසු වෙන්න නෑ.

මේකෙ දෙවැනි පියවර තමයි හැලිඩේ මෙනෙවිය හැටියට එංගලන්තයේදී රඟපාන්න, තරුණ කාන්තාවක සොයා ගැනීම. "රැන්ගුන්" නැව අලුත් මගීන් රැසකට ප්‍රවාහන පහසුව සැලසීම සඳහා, අමතර දින හයක් කොළඹ වරායේ නවත්වා තිබුණු බවත් මට දැනගන්න ලැබුණා. ඊට හේතුවුණේ පී ඇන්ඩ් ඕ සමාගමට අයත් ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් සිට බටහිරට යාත්‍රා කළ, "එස්මෙරෙල්ඩා" නම් නෞකාවේ සෙනගට ගමන් පහසුව සලස්වන්න සිදුවීම. ඕස්ට්‍රේලියාවේ සිට එංගලන්තය බලා මගීන් ප්‍රවාහණය කළ ඒ නැවේ, යම්කිසි අත්‍යවශ්‍ය හදිසි අලුත්වැඩියා





කටයුත්තක් තිබුණලු. ඉතින් පී ඇන්ඩ් ඕ සමාගම තීරණය කරාලු මේකෙ ඉඳපු සෙනග හැකි තරමක් "රැන්ගුන්" නැවේ එංගලන්තයට යවන්න. ඔය මගීන් අතර ඉඳල තියෙනවා අම්ම කෙනෙක් සහ දුවක් - ඕබ්‍රයන් මහත්මිය සහ අගතා ඕබ්‍රයන් මෙනෙවිය. උපතින් අයර්ලන්ත ජාතිකයන් වුණු ඔවුන් දිගු කලක් ඕස්ට්‍රේලියාවේ සිටියා වුණත්, නැවේ තුන්වැනි පංතියේ මගීන් ලෙසයි ගමන් කළේ. ඒ ඇයි කියන කරුණ මට හොයාගන්න බැරිවුණා. කොහොම හරි තමන්ගේ භූමිකාව එංගලන්තයේදී රඟපාන්න ඕබ්‍රයන් මෙනෙවිය කැමැති කරගන්න හැලිඩේ මෙනෙවියට හැකිවුණා.

මෙ තරුණිය ඔබගේ නිවසෙදි ඇයට රඟපාන්න තිබුණු කොටස, මොන තරම් දක්ෂ ලෙස රඟපෑවාද කියන කරුණ ඔබ හොඳින් දන්නවා. සර් මයිකල් හැලිඩේගේ චීනයේ සිටි මිත්‍රයන් ඇය හමුවීමට උත්සාහ කරද්දී, ඇය දක්ෂ ලෙස ඔවුන් මඟ හැරියා. ඒ මොකද එවැනි කතා බහක් දිග්ගැස්සුණොත්, අනන්‍යතාවය ගැන ප්‍රශ්න ඇතිවීමට ඉඩ තිබුණු නිසා. ඒ වගේමයි ඇය ලියුම් ලිවීමෙනුත් වැළකී සිටියා."

"හෝම්ස් මහත්මයා ඔබ කියන හැම දෙයක්ම ඇත්ත බව මට විශ්වාසයි" හොබ්ස් මහතා කීවේ තම අසුනෙන් නැගී සිටිමිනි. "අපි මෙතනට වෙලා ඕව කතා කරකර ඉන්නෙ මොකටද? අපි වහාම යමු ඒ තරුණිය ඉන්න හෝටලයට....... කොහේ කියලද කිව්වෙ? ආ ලැංහැම් හෝටලය නේද? හැලිඩේ මෙනෙවිය ගැන තොරතුරු ඇයගෙන් අහගමු. හැලිඩේ මෙනෙවිය මේ මොහොතේ අර ඉලන්දාරියත් එක්ක පැනල යනවා වෙන්නත් පුළුවනි. එහෙමත් නැත්නම් මේ කෙල්ල ලැංහැම් හෝටලයෙන් පැනලා ගියොත්?"

"මං හිතන්නෙ නෑ ඇය ඒ විදියට යාවි කියල" හෝම්ස් කීය. "ඇය මීට පැය දෙකකට විතර කලින් ඇගේ මවට විදුලි පුවතක් යැව්වා. ඒ "ඕබ්‍රයන් මහත්මිය, අංක 14 නිදහස් උද්‍යානය, කෝක්" යන ලිපිනයට. තමන්ගේ මවගෙන් ඒකට පිළිතුරක් ලැබෙන තුරු ඕබ්‍රයන් මෙනෙවිය නොඉවසිල්ලෙන් බලාගෙන ඉන්නවා"

"අනේ දෙවියනේ! ඔබ දන්න දේවල්........ ඔබ කොහොමද මහත්මයා මේ තරම් කාරණා දැන ගත්තෙ?"

"ඒවට නොයෙක් සූක්ෂම ක්‍රම තියෙනවා හොබ්ස් මහත්මයා. තරුණ කාන්තාවගේ ගමන් බිමන් හා කරන කියන දේ ගැන

සෝදිසියෙන් ඉන්න, මං කොලු ගැටයෙකු යෙදෙව්වා. ඔහු තමයි ඇය ගැන සමහර තොරතුරු මට ලබා දුන්නෙ. නමුත් සමහර තොරතුරු ලබා ගැනීම හුගක් අමාරු වුණා. අර කඩුවල චිත්‍ර නම් ඔබේ මොළය හුගක් අවුල් කළා නේද? ඒවා මට නම් ලොකු පිහිටක් වුණු බව මා කිවයුතුයි. මා නිවැරදි මාර්ගයට වැටුණේ ඒ චිත්‍රවලින්"

"ආ....... හ්!" හොබ්ස් මහතා දිග හුස්මක් ඉහළට ඇද ගත්තේය. "ඊට පස්සෙ අපි වැටුණේ කඩුවල චිත්‍රවලට. ඒ ගැනවත් මගේ හිතට සහනයක් සලස්වන්න ඔබට හැකි වේවි කියල මං විශ්වාස කරනවා"

"මං හිතන්නේ ඔව්. ඒක තෙමෙයි හොබ්ස් මහත්මයා" හෝම්ස් කීය. "ඔබට අද උදේ ලැබුණ නේද කඩු තුනේ චිත්‍රය? ඒක ඔබට තැපැල් කරල එව්වේ මමයි කියල කිව්වොත්, ඔබේ මොළේ තවත් අවුල් වේවිද?"

"මොනවා? ඒක එව්වෙ ඔබද? ඒක වෙන්න බෑ!"

"ඒක එව්වේ මං තමයි. නමුත් ඒ යම්කිසි අරමුණක් ඇතිව. මං ඒ ගැන ඔබට කියන්නම්. මේ චිත්‍ර ගැන ගැඹුරට කල්පනා කළාම මට එක් විශේෂ කරුණක් තේරුම් ගැනීමට හැකිවුණා. ඒ තමයි මේවා ත්‍රස්තවාදී කල්ලියක හෝ මිනීමරු අන්තවාදීන්ගේ අනතුරු ඇඟවීමක් නොවන බව. ඔවුන් මොකටද එහෙම දෙයක් ඔබට එවන්නේ? ඊළඟට ඒ චිත්‍ර ටිකක් අධ්‍යයනය කළාම පෙනෙනවා මේවා ආදි කාලයේ ලාංඡනවලට යොදා ඇති සම්ප්‍රදායික චිත්‍රවල තිබෙන කඩුවලට සමාන බව.

මං වහාම ගියා බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට. ඒ කාලයේ එංගලන්තය ආක්‍රමණය කිරීමට උතුරෙන් ආ සෙබළුන් මෙවැනි කඩු භාවිත කරල තිබුණා. ඒ නිසාම ඔවුන්ගේ ධජ පතාක වලත් ලාංඡනය හැටියට, මේ කඩුව යොදාගෙනයි තිබුණේ. ඒවා විශේෂයෙන්ම දක්නට ලැබුණේ අයර්ලන්තයේ සිට මේ පළාත් ආක්‍රමණය කළ පළමුවැනි එඩ්වඩ්ගේ හමුදාවල සහ පසුව ඔහුට එකතු වූ හෙන්රි ද ඇන්වර්ස්ගේ හමුදාවල. මේවාට සම්බන්ධ අපට හුරුපුරුදු නමක් ඒ ඉතිහාස වාර්තාවල සඳහන්ව තිබුණා. ඒ තමයි ආක්‍රමණිකයන්ගේ සෙබළුන් හැටියට ක්‍රියාකළ කැමරන් නම් දැරූ පවුල්. එතකොට මට පහසුවුණා කාරණා හුගක් තේරුම් ගන්න.





මෙන්න අයර්ලන්තයේ කෝක් නගරයෙන් ඔබේ ගෙදරට ලියුම් දෙකක් එවලා. නමුත් ඒ මොන අරමුණකින්ද කියා හිතාගන්න අමාරුයි. එතකොට අපට අන්තිමට හිතන්න වෙන්නේ මෙහෙම දෙයක්. මේ කඩු සහිත ලියුම්වලින් එවන්නේ පණිවුඩයක් වෙන්න පුළුවනි. ඒ කාටද? ඔබේ ගෙදර ඉන්න කාට හරි. ඒ ඔබේ ගෙදර නවාතැන් ගැනීමට අලුතෙන් ආ තරුණිය මිස වෙන කවුරු විය හැකිද?

මහත්මයා. කෞතුකාගාරයෙන් මං ගියේ පී ඇන්ඩ් ඕ නෞකා සමාගමේ, නැව් ගමනාගමනය ගැන දැනගන්න, ඔවුන්ගේ ප්‍රධාන කාර්යාලයට. "රැන්ගුන්" නැවෙන් හොංකොං සිට ජ්ලිමත් දක්වා ආ මගී ලැයිස්තුව මට ලැබුණා. ඊළඟට ඉතා වැදගත් කරුණක් මට දැනගන්න හැකිවුණේ ඔවුන්ගෙන්. ඒ තමයි ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් සිට බටහිරට යාත්‍රා කළ "එස්මෙරල්ඩා" නැව ගැන තොරතුරු. මේ නැව ඩර්බන් හරහා එංගලන්තයට එන්නයි පිටත්වෙලා තියෙන්නේ. නමුත් ඔවුන්ගේ තිබුණු බරපතළ කාර්මික දෝෂයක් නිසා, නැව ඉන්දියන් සාගරය හරහා ඩර්බන් වෙත ගෙනියන්න කපිතාන් කැමැති වෙලා නෑ. මං කලින් කියූ විදියට ඒ මගීන් ගෙන් කොටසක් "රැන්ගුන්" නැවට නග්ගවලා. ඒ මගී නම් ලැයිස්තුව ඉතා දිග එකක්. ඒකෙ තුන්වැනි පංතියේ ආව දෙදෙනෙකු වෙත මගේ අවධානය යොමුවුණා. ඒ තමයි ඕබ්‍රයන් මහත්මිය සහ අගතා ඕබ්‍රයන් මෙනෙවිය.

සූර්යයා පෘථිවි නිරක්ෂය පසුකර යන මේ විෂුවය කාලේ, බිස්කේ බොක්ක හරහා යන්න බොහෝ දෙනෙකු කැමති නෑ. නමුත් ජ්ලිමත් වරායේදී "රැන්ගුන්" නැවෙන් ගොඩ බැස්ස අය කවුද කියල මං හොයලා බැලුවා. හැලිඩේ මෙනෙවියගෙ නම ඒ ලේඛනයේ තිබුණා. ඊට අමතරව ඕස්ට්‍රේලියාවේ සිට ආ, නමුත් කොළඹදී නැවට නැගුණු දෙදෙනෙකුත් සිටියා. ඒ තමයි ඕබ්‍රයන් මහත්මිය සහ ඕබ්‍රයන් මෙනෙවිය. ඔවුන් නමින් අයිරිෂ් ජාතිකයන් වීමත් ජ්ලිමත් හිදී ගොඩ බැහීමෙනුත්, මගේ හිතට ආවේ එක් කාරණයක්. ඒ තමයි ඔවුන්ගේ ගමනාන්තය අයර්ලන්තයේ කෝක් විය හැකි බව.

ඊළඟට මං එතැන ලිපිකරුවාට කිව්වා "රැන්ගුන්" නැවට පස්සේ හොංකොං සිට ආ නැවේ මගීන්ගේ නාම ලේඛනය

මට පෙන්වන්න කියලා. ඒකෙ තිබුණා අපේ මිත්‍රයාගේ නම........ ඩොමිනික් බොනිෆස් කැමරන්."

"හැබෑට? ලැජ්ජාවක් නැති හොර තක්කඩියා! කිසි බයක් සැකක් නැතුව තමන්ගේ නමින්ම පෙනී හිටිය හැටි!"

"මේ හදිසියේම පීකිං වලින් පිටත් වී ඒම ගැන ඔහුටත් පුළුවනි මොකක් හරි නිදහසට කරුණක් කියන්න. ඔහු කියාවි තමන්ගේ මව හෝ පියා බරපතළ ලෙස අසනීප වෙලා කියල. තමන්ගේ දුව එංගලන්තය බලා පිටත්වුණු ඉක්මනින්ම මේ තරුණයා එංගලන්තයට ආ එකට සර් මයිකල් කැමැති වෙන්න නෑ. ඒක නවත්වන්න ඔහුට ක්‍රමයකුත් නෑ. බොහොම වෙලාවට ඔහුගේ ඊළඟ ලියුමේ මේ ගැන ඔබට ලියා එවාවි. හැලිඩේ මෙනෙවිය, ඕබ්‍රයන් මව සහ දියණිය වගේම කැමරන් තරුණයාත් ගොඩ බැස්සේ ජ්ලිමත් වරායෙන්.

හොබ්ස් මහත්මයා. මගේ හිතේ ලොකු සැකයක් ඇතිවුණේ එදා අපි ඔබේ නිවස පරීක්ෂා කළ වෙලාවෙදි. අපි ගියානේ හැලිඩේ මෙනෙවිය යයි කියූ තැනැත්තියගේ කාමරයට. තමන්ට පෞද්ගලික සේවිකාවක් ඉන්නා සිටුවරියක්, තම ඇඳුම් පැළඳුම් හා රූපලාවණ්‍ය උපකරණ පාවිච්චියෙන් පසු දමන්නේ, කිසිදු සැලකිල්ලකින් නෙමෙයි. ඒ මොකද ඒවා පිළිවෙළකට තැබීමට වෙනත් කෙනෙකු ඉන්නා නිසා. නමුත් ජීවිත කාලයක් ඒ රැකියාව කර හැමදාමත් ඒවා නිසි පිළිවෙළකට තැබූ තැනැත්තියක්, අර දේවල් තබන්නේ කොහොමද? ඒක අර සිටුවරිය තබන පිළිවෙළට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්. ඒ නිසා හැලිඩේ මෙනෙවියගේ යයි කියූ කාමරය දුටුවාම මං හරි පුදුමයකට පත්වුණා. හොබ්ස් මහත්මියගේ සේවිකාව කියූ දේත් අප පුදුමයට පත් කළා. ඇය කිව්වේ කාමරය මේ අන්දමින් නිසි පිළිවෙළකට සැකසීම, තමන් කරන දෙයක් නොවෙන බව. මේ හේතුව නිසා මේ ගෙදරට ඇවිත් ඉන්නේ සැබෑ හැලිඩේ මෙනෙවිය නෙමෙයිද කියන සැකය මගේ හිතේ ඇතිවුණා.

ඊළඟට මට මෙහෙම දෙයක් කල්පනා වුණා. සැබෑ හැලිඩේ මෙනෙවිය, ඕබ්‍රයන් මෙනෙවිය සමග තමන්ගේ භූමිකාවන් හුවමාරු කරගෙන, රඟපෑමක යෙදී ඉන්නවා කියල හිතමු. එතකොට සැබෑ හැලිඩේ මෙනෙවිය ඉන්නේ කොහේද? බොහොම දුරට





කෝක්වල, ඕබ්‍රයන් මහත්මිය සමග විය හැකියි. බොරු හැලිඩේ මෙනෙවිය හෙවත් අගතා ඕබ්‍රයන් ලන්ඩනයේ හොබ්ස් නිවසේ. පණිවුඩ හුවමාරු කර ගැනීමට ඔවුන් දෙදෙනා යොදාගෙන සිටින ක්‍රමය මොකක්ද? අගතා ඕබ්‍රයන්, කොහොමද දැනගන්නේ තමන්ට රඟපෑමට තිබුණු කටයුත්ත දැන් අවසන්; දැන් තමන්ට කෝක්හි අම්මාගේ නිවසට යා හැකියි කියන කරුණ? ඒ සඳහා ඔවුන් යොදා ගත්තේ කඩුවක චිත්‍රයක් තැපැලෙන් යැවීමේ ක්‍රමය. ඒක සුවිශේෂ එකක් බව අප පිළිගත යුතුයි.

මං හිතන හැටියට ඔබට එක කඩුවක් සහිත චිත්‍රය ආවේ ඕබ්‍රයන් මව සහ හැලිඩේ මෙනෙවිය කරදරයක් නැතිව, කෝක්වල ඕබ්‍රයන් නිවසට ළඟාවූ බව දැන්වීමට"

"එතකොට කඩු දෙකක් සහිත චිත්‍රය?"

"නිශ්චිතව කීමට නොහැකි වුණත් මං විශ්වාස කරන්නේ මෙහෙමයි. කැමරන් තරුණයා ජ්ලිමත් වරායෙන් ගොඩ බැස්සාම ඔහු කෝක්හි ඕබ්‍රයන් නිවසට විදුලි පුවතක් යවලා, ඒ බව දැනුම් දෙන්න ඇති. එතකොට තමා ඕබ්‍රයන් මහත්මිය සහ හැලිඩේ මෙනෙවිය ඔබේ නිවස වෙත චිත්‍රය සහිත දෙවැනි ලිපිය එව්වේ.

මේ නාට්‍යයේ ඊළඟ ජවනිකාව විය හැක්කේ කුමක්ද කියලා මම කල්පනා කළා. එය නිසැකවම ඉවෝන් හැලිඩේ සහ බොනිෆස් කැමරන්ගේ විවාහය විය යුතුයි. එය සිදුකරන තුරු තමා හැම දෙයක්ම රහසිගතව තබාගන්නවා ඇත්තේ. එතකොට මේ විවාහය ගැන අගතා ඕබ්‍රයන් මෙනෙවියට දැනුම් දෙන්නේ කොහොමද? හොබ්ස් නිවසේ ඇය නොඉවසිල්ලෙන් බලාගෙන ඉන්නේ, මේ වංචනික රඟපෑමෙන් මිදිලා තමන්ගේ මව ළඟට යන්න. ඔවුන් ඒ බව අගතාට දන්වා එවන්නේ, කඩු තුනක චිත්‍රයක් මගින් වීමට ඉඩ ඇතිය කියලා මට හිතුණා. ඒ සිතිවිල්ල ආව ගමන් වහාම ක්‍රියාත්මක වීමට මං තීරණය කළා.

අර චිත්‍රවල දැක්වෙන ආකාරයේ කඩු තුනක චිත්‍රයක් ඇඳලා මං ඊයේ තැපැලට දැම්මා. ඒ විතරක් නෙමෙයි; බේකර් වීදියේ රහස් පරීක්ෂක කොලු රංචුවේ විගින්ස් කොලුවා මං රැඳෙව්වා හොබ්ස් මහත්මයාගේ නිවස ළඟ. ලියුම් ලැබීම සිදුවුණු ඉක්මනින් නිවසෙන් පිටවී යාමට ඉඩ ඇති තරුණියක ගැන විමසිල්ලෙන් ඉඳීමට මං ඔහුට උපදෙස් දුන්නා. උදේ නවය හමාර වෙද්දී ඔහු

මට විදුලිපුවතක් එව්වා. ඒ මා කියූ තරුණිය නිවසෙන් පිටවී ලැංහැම් හෝටලයට ගිය බවත්, ඇගෙන් ලැබුණු උපදෙස් අනුව හෝටල් සේවකයෙකු විදුලි පුවතක් යැවූ බවත්.

තැපැල් කන්තෝරුවේ විදුලි පුවත් අංශයට සවන් යොමු කරගෙන සිටි මගේ සේවකයාට, තවත් දෙයක් හොයාගන්න හැකිවුණා. ඒ ඇයගේ විදුලි පුවත යැව්වේ කාටද කියන කරුණ. එය යවා තිබුණේ "ඕබ්‍රයන් මහත්මිය, නිදහස් උද්‍යානය. කෝක්" මේ ලිපිනය දැනගත් ගමන් මං කළ දේ ඔබට අනුමාන කළ හැකිද?

මං ඕබ්‍රයන් මහත්මියට විදුලි පුවතක් යැව්වා ඇගේ දුව යවන විදියට. ඒකෙ මං කියා යැව්වේ,

"මා වෙත එවන පණිවුඩ ලැංහැම් හෝටලයේ ලිපිනයට යවන්න එපා. "221 බී බේකර් වීදිය" ලිපිනයට එවන්න.

අගතා"

යනුවෙන්. ඒකට ලැබුණු පිළිතුර කියවන්න හොබ්ස් මහත්මයා කැමති වේවි. විදුලි පුවත විවෘත කළ හොබ්ස් මහතා එය හඬ නගා කියෙව්වේය.

"මෙහෙම කළේ ඇයි දැයි තේරුම් ගත නොහැක. මඟුල සිදුවුණේ අද උදේ. කතා කරගත් විදියට එවන සංඥාව හෙට උදේ ලැබේවි. රාත්‍රිය ගත කිරීම සඳහා ආපසු බර්ක්ලි චතුරශ්‍රයට යන්න.

අම්මා"

"මඟුල අද උදේ සිද්ධවෙලාද?" හොබ්ස් මහතාට කියැවුණේ කම්පාවට පත් හඬකිනි. "අනේ මගේ අසරණ මිත්‍රයා. සැකයක් නෑ. මේකෙන් ඔහු දැඩි කම්පාවකට පත්වේවි"

"ඒ ගැන අපටත් කණගාටුයි" හෝම්ස් කීය. "ඕබ්‍රයන් මහත්මිය එවූ විදුලි පුවතට මං මෙහෙම පිළිතුරක් යැව්වා.

"මනාල යුවළ අද ඉන්නේ කොහේද? මෙහේට එන්නේ කවදාදැයි දන්වන්න.

අගතා"

එයට ලැබුණා මේ පිළිතුර.

"හෙට ඊ. ඔවුන් ජ්ලිමත් වෙත ළඟාවෙනවා. කලින් කතාකරගත් විදියට ලැංහැම් හෝටලයට එන්නේ අනිද්දා.

අම්මා"





"ඉතින් හොබ්ස් මහත්මයා" හෝම්ස් කීය. "ඔබ කැමති ඇති ඔබේ මිත්‍ර සර් මයිකල් හැලිඩේගේ දියණිය සහ ඇගේ මනාලයා හමුවෙන්න. ඔබට කරන්න තියෙන්නේ ජ්ලිමත් සිට ලන්ඩනයට එන දුම්රිය ගැන සෝදිසියෙන් ඉඳීම පමණයි"

"හෝම්ස් මහත්මයා!" යයි අමතමින් මේ අවස්ථාවේ කලබලයෙන් උඩු මහලට දිව ආවේ අපේ ගෙහිමි කාන්තාව හඩසන් මහත්මියයි.

"ඕබ්‍රයන් කියන නම තියන තරුණ කාන්තාවක් ඇවිත් ඉන්නවා" හඩසන් මහත්මිය කීවාය. "ඇය කියනවා ඇය ආවේ කැමරන් මහත්මයා සහ ඔහුගේ මනාලිය දකින්නලු. එහෙම ජෝඩුවක් මෙහේ නෑ කියල මං කිව්වා. ඒක පිළිගන්නෙ නැතුව ඇය බලාගෙන ඉන්නවා"

"ෂා! ෂා! හඩසන් මහත්මිය. ඇය උඩු මහලට එවන්න. මට බැරිඋණා ඔබට කල් ඇතුව කියන්න. මේ නෝනට එන්න කියලා විදුලි පුවතක් යැව්වේ මම"

"ඕබ්‍රයන් මෙනෙවියට?" කියූ හොබ්ස් මහතා තම අසුනෙන් නැගිට්ටේය.

"ඔව්. ඇවිත් නව යුවළ පිළිගන්න කියලා විදුලි පුවතක් යැව්වේ, ඔබ මෙහේ එන්න මඳ වේලාවකට කලින්."

"මේ කිසි දෙයක් මට නම් තේරුම් ගන්න අමාරුයි. මේක මහ පැටළිලි ගොඩක්." කී හොබ්ස් මහතා යළිත් වරක් හාන්සි පුටුව මතට ඇද වැටුණේය.

අගතා ඕබ්‍රයන් මෙනෙවිය අපේ විසිත්ත කාමරය තුළට පිවිසෙන්නට ඇත්තේ, ප්‍රීතියෙන් ඔද වැඩුණු නව යුවළ දැකීමේ එකම අපේක්ෂාවෙන් විය යුතුය. එහෙත් ඒ වෙනුවට ඇයට දකින්නට ලැබුණේ කවුරුන්ද? ඔහුට වචනයකින් හෝ දැනුම් දීමක් නොකොට, තමන් රහසේම පැන ආ තම භාරකාරයාය. ඔහු දුටුවිට, ඇයට කුමක් සිතෙන්නට ඇතිද. දෙනෙත් විශාල කරගෙන ඇය අප තිදෙනා දෙස බලා සිටියේ ගල්වූ පිළිමයක් විලසිනි. එක් වචනයක් හෝ කථාකර ගැනීමට ඇයට හැකියාවක් නොවීය.

"ඕබ්‍රයන් මෙනෙවිය. කරුණාකර ඇතුළට ඇවිත් මෙහෙන් වාඩිවෙන්න" හෝම්ස් ඇරයුම් කළේ කාරුණික අයුරෙනි. මිනිත්තුවක් පමණ ඒ අයුරින්ම සිටි ඇය අන්තිමේදී හෝම්ස්ගේ ඉල්ලීමට කීකරු වූවාය.

තමාට බීමට වතුර වීදුරුවක් දෙන මෙන් ඇය අපෙන් ඉල්ලා සිටියාය. මම ඒ ඉල්ලීම වහාම ඉටු කළෙමි. තවමත් කෝපයෙන් සිටි ෆෙයාඩේල් හොබ්ස් මහතාගේ මුහුණේ නම්, සමාවක සේයාවක් වත් නොවීය. හෝම්ස් අන්තිමේදී කතාව ඇරඹුවේය.

"හොබ්ස් මහත්මයාත් මමත් ඔබට මෙහේ එන්න කියල දැනුම් දුන්නේ, අපට දැනගන්න උවමනා කාරණා කිහිපයක් තිබෙන නිසයි. ඒ ඔක්කොටම කලින් මේ කාරණාවත් මං කියන්න ඕන. හැලිඩේ මෙනෙවිය, කැමරන් මහතා සහ ඔබ තුන්දෙනා එකතු වී රඟදැක්වූ නාටකයේ නැත්නම් කුමන්ත්‍රණයේ, හැම දෙයක්ම දැන් එළිවෙලයි තියෙන්නේ. මේ මහත්මයා මේකට නීතිමය පියවර ගත්තොත්, ඔබ හැම දෙනෙකුම ලොකු අමාරුවක වැටෙනවා. දේවගැතිතුමා කාරුණික කෙනෙක්. ඉතින් මේ ගැන ලිහිල්ව කටයුතු කිරීමක් ඔබ බලාපොරොත්තු වෙනවා නම්, කරන්න තියෙන්නේ සම්පූර්ණ සත්‍යය හෙළි කිරීමයි"

තරුණිය ඉකි ගසමින් හඬා වැලපීමට පටන් ගත්තාය. "මේක මුල ඉඳන් අන්තිම වෙනතුරු හැලිඩේ මෙනෙවියගේ වැරැද්ද. ඇය තමයි අපව මේකට පටලවා ගත්තෙ. මගේ අම්මා මේකට කොහොමටවත් කැමති වුණේ නෑ. මං කැමති වුණෙත් නෑ. නමුත් මේ වෙනුවෙන් ලොකු මුදලක් අපට ගෙවන්න ඇය පොරොන්දු වුණා. අපි මේ කාලයේ බොහොම අගහිඟකම් වලට මුහුණ දීල ඉන්න අය. මේකට කැමති වෙන්න අපට සිද්දුවුණේ, ඒ නැතිබැරිකම් නිසයි මහත්වරුනි."

"මේ වංචාවට ඔබට පවුම් සිය ගණනින් ලැබුණා එහෙනම්?" හොබ්ස් මහතා කීවේ ඇය දෙස ඔරවා බලමිනි.

"ඕබ්‍රයන් මෙනෙවිය මේ අහන්න" හෝම්ස් කීය. "කාරණා හුඟක් අපි දැනටමත් දන්නවා. අපි නොදන්නා කාරණා ස්වල්පයක් මීළඟට ඔබට කියන්න පුළුවනි. නමුත් හැමදේටම කලින් අප දැනගත යුතු වැදගත් කාරණයක් තියෙනවා. හැලිඩේ මෙනෙවියගේ දියමන්ති මාලයට ඔබ තුන්දෙනා එකතුවෙලා මොකද කළේ? දැන් ඒක තියෙන්නේ කාගෙ ළඟද?"

මේ අවස්ථාවේ තරුණියගේ හඬා වැලපීම වඩාත් උග්‍ර විය.

"ඔය මාලය ගැන නම් මගේ කිසිම සම්බන්ධයක් නෑ. ඒක කවදාවත් මා ළඟ තිබුණෙත් නෑ. ඔය කියන මාලයක් මං මගේ





ඇහින් දැකලත් නෑ" ඇය ඉකි ගැසුවාය. "ඒකෙ විස්තරේ මට අහන්න ලැබුණේ ඔවුන් එක්ක සම්බන්ධ වුණාට පස්සේ. ඒ දෙදෙනා අතර ප්‍රේම සම්බන්ධය ගැන ඇගේ පියා දැනගත්තාම තමන් එංගලන්තයට එවාවි කියල හැලිඩේ මෙනෙවියට හිතුණලු. ඉතින් ඇය ඒ මාලය හොර රහසේම, කැමරන් මහත්මයා අතට දීල තියෙනවා. ඒ ඇය පීකිං වලින් පිටත්වෙන්නත් සති දෙක තුනකට කලින්ලු. ඔහු තමන්ගේ මිත්‍රයන්ගේ මාර්ගයෙන් මාලය හොංකොංවල දියමන්ති වෙළඳුන් වෙත යවල තියෙනවා. ඒකට එයාලට පවුම් දෙදාහක මුදලක් ලැබුණලු. මට ඒ බව කිව්වේ හැලිඩේ මෙනෙවිය. ඇය කිව්වේ ඒ විකිණීම කළේ හොංකොංහි ගෝල්ඩ්ස්ටයින් සමාගමට බව"

"ඔව්. ගෝල්ඩ්ස්ටයින් සමාගමේ ශාඛාවක් හොංකොංවල තියෙනවා." හෝම්ස් කීය.

"ඒ මුදල් වලින් කොටසක් තමන්ගේ වියදම් සඳහා කියල කැමරන් මහත්මයා තියාගත්තලු. අනෙක් කොටස හැලිඩේ මෙනෙවියට දුන්නලු ඇයගේ වියදම් සඳහා."

"......... ඔව් ඔව්. මේ වංචනික වැඩවලට ඔහේල වගේ අය පටළවා ගන්න, සෑහෙන මුදලක් උවමනා වෙන බව ඇය දැනගෙන ඉන්න ඇති නේ. කීයක්ද ඔහේලට ගෙවනවා කිව්වේ?" තවමත් කෝපයෙන් සිටි හොබ්ස් මහතා අසද්දී හෝම්ස් එම කථාවට බාධා කළේය.

"ඒ ගණන් අපට උවමනා නැහැ ඕබ්‍රයන් මෙනෙවිය" හෝම්ස් කාරුණික ස්වරයෙන් කීවේ තවමත් හැඬූ කඳුළෙන් සිටි තරුණියටයි. "ඔබත් ඔබේ මවත් මේකට පටළැවුණේ කොහොමද කියන්න"

"මෙහෙම කරුණාවන්ත වීම ගැන මං ඔබට ණයගැතියි මහත්මයා" ඇය කීවාය. "මං හැම දෙයක්ම කියන්නම්. මගේ පියාත් මවත් මා රැගෙන ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වෙද්දී මගේ වයස අවුරුදු හතරයි. මගේ පියා ශල්‍ය වෛද්‍යවරයෙක්. ඕස්ට්‍රේලියාවට යන්න කලින් ඔහු කෝක් නගරයේ හමුදා රෝහලක සේවය කළා. මෙල්බර්න් වෙත ගියාට පසු ඔහුට වෛද්‍ය විද්‍යාලයක කථිකාචාර්ය තනතුරක් ලැබුණා. ඒ අතරේ ශික්ෂණ රෝහලකත් සේවය කළා. ඒ කාලයේ අපට මුදලින් අඩුපාඩුවක් තිබුණේ නෑ. මා

රැක බලාගත්තා මිස රැකියාවක් කරන්න මගේ මවට උවමනාවක් තිබුණෙත් නෑ.

නමුත් අවාසනාව අප වෙත ආවේ බලාපොරොත්තු නොවූ අයුරින්. ඉතාම නිරෝගී පුද්ගලයෙකු වුණු මගේ පියා එක්වරම හදිසි හෘදයාබාධයකින් මියගියා. මගේ මවටත් මටත් යන එන මං නැතිවුණා. මේ වෙනකොට මගේ වයස දහ අටයි. මා විවාහ කරගන්න කැමැත්තෙන් ආව-ගිය තරුණයෙකු හිටියා. ඔහුත් අප අත්හැර ගියා. අන්තිමේදී ජීවත්වීම සඳහා රැකියාවලට යාමට අපට සිදුවුණා. අම්මාත් මමත් දෙදෙනාම ගියේ ගෘහසේවිකා රැකියාවලට. ප්‍රභූ පවුල්වල ධනවත් නෝනාවරුන්ගේ පෞද්ගලික සේවිකා තනතුරටයි අප ගියේ. ලොකු වැටුපක් නොලැබුණත් යන්තමින් ජීවත්වීමට එය ප්‍රමාණවත් වුණා.

මේ අතරෙදි තමයි මගේ අම්මා බරපතළ පෙණහලු රෝගයකට ගොදුරු වුණේ. ඇගේ ප්‍රතිකාර සඳහා අප ඉතිරි කරගෙන තිබූ සම්පූර්ණ මුදලම වියදම් වුණා. ඇයට ශල්‍යකර්මයකුත් අනිවාර්යයෙන්ම කළයුතු බව වෛද්‍යවරු කිව්වා. එතකොටයි අප තීරණය කළේ ආපසු අයර්ලන්තයට එන්න. කෝක් නගරයේ තිබුණු, අම්මාට ඇගේ දෙමව්පියන්ගෙන් උරුම වී තිබූ ඉඩකඩම් විකුණා මුදලක් ලබාගත හැකි බව ඇය කියා සිටියා.

මගී නැවක ආවත්, මගේ අම්මා රෝගී තත්ත්වයේ සිටියත්, සුඛෝපභෝගී පංතියේ කාමරවල එන්න අපට හැකියාවක් තිබුණේ නෑ. ඒ නිසයි පහසුකම් ඉතාම අඩු තුන්වැනි පංතියේ මගීන් ලෙස ආවේ. අප මුලින් ආ නැවේ අලුත්වැඩියාවක් නිසා කොළඹදී වෙනත් නැවකට නගින්න සිදුවුණු බව ඔබට අහන්න ලැබෙන්න ඇති. හැලිඩේ මෙනෙවිය අපට මුණ ගැහුණේ එවිටයි.

හොංකොං වලින් නැව් නැගපු දා ඉඳලම, ඇය මා වැනි කෙනෙක් හොයමින් ඉඳල තියෙන්නේ. සති දෙකක හෝ තුනක කාලයක් තමා වෙනුවෙන් රඟපෑමක යෙදෙන්න කැමති ද කියලා ඇය ඇහුවා. ඒකට තමන් මුදලක් ගෙවන බවත් ඇය කිව්වා. මගේ අම්මා නම් ඒකට කැමති වුණේම නැහැ. මගේ හිතේ තිබුණෙත් චකිතයක්. හැලිඩේ මෙනෙවිය හරි දක්ෂ තැනැත්තියක්. ඇයගෙන් මට ගැළවීමක් තිබුණෙම නැහැ. තමන් ඒ වෙනුවෙන් ගෙවන මුදල ඇය අන්තිමේදී කිව්වා. ඒක විශාල මුදලක්. එයින් බාගයක් තිබුණා





නම්, අම්මාගේ ශල්‍යකර්මය අපට ඔස්ට්‍රේලියාවේදීම කරගන්න තිබුණා. මං ඒ දේට අකමැති වුණොත්, තමන් අනිවාර්යයෙන්ම වෙනත් තරුණියක යොදාගන්නා බව හැලිඩේ මෙනෙවිය දිගින් දිගටම කිව්වා. අයර්ලන්තය දුප්පත් රටක්. අපට එහේදි මුහුණ දෙන්න, වෙන අභියෝග ගැනත් හිතලා, මං අන්තිමේදී හැලිඩේ මෙනෙවියගේ යෝජනාවට කැමැති වුණා. අපට ගෙවිය යුතු මුදලින් අඩක් ඇය ඒ වෙලාවෙම ගෙව්වා. මං ඒ මුදල අම්මා අතට දුන්නා. ඒ මට යම්කිසි ප්‍රශ්නයකට මුහුණ දීමට සිදුවුණත්, අම්මා අයර්ලන්තයට ගිය වහාම ශල්‍යකර්මය කරගත යුතු බව කියමින්.

මහත්වරුනි, එතැන් සිට හැමදෙයක්ම ඔබ දන්නවා ඇති කියලයි මං හිතන්නේ. එදා කඩු තුන සහිත චිත්‍රය හොබ්ස් මහත්මයා අතට නොඑන්න, මං තවමත් බර්ක්ලි චතුරශ්‍රයේ නිවසේ. මොකක් හරි පටලැවිල්ලක් නිසා ඒක නියමිත දිනයට කලින් තැපැල් කර ඇති බවයි මට පෙනෙන්නේ" ඇය කථාව අවසන් කළාය.

"ඕබ්‍රයන් මෙනෙවිය" හෝම්ස් කීය. "ඒ පටලැවිල්ල මොකක්ද කියලා ඔබට යථා කාලයේදී තේරුම් ගැනීමට හැකිවේවි. මෙන්න ඔබේ මව මෙහේ ලිපිනයට එවා තිබූ විදුලි පුවත් සියල්ල. කැමරන් යුවළ යම් වැරදීමකින් මෙහේට ආවත්, මං ඔවුන් ලැංහැම් හෝටලයටම එවන්නම්. ඔබට කරන්න තියෙන්නේ ඔවුන් එනතුරු තවදුරටත් එහේ රැඳී ඉන්න එකයි. හැලිඩේ මෙනෙවිය නැහැ කැමරන් මහත්මිය, ඔබට පොරොන්දු වූ ඉතිරි මුදල සම්පූර්ණයෙන්ම ගෙවාවි කියා මං විශ්වාස කරනවා. එහෙම වුණොත් ඔබේ මවගේ ශල්‍යකර්මය ඇතුළු අනෙක් බලාපොරොත්තු ඉටුකරගැනීමට හැකිවේවි.

හොඳයි. දැන් ඔබ මේ ගෙදරින් පිටවී යන්න හැදුවොත්, ඔබව අල්ලා පොලීසියට භාරදෙන්න කවුරුවත් නෑ"

එසේ කියා කාරුණික සිනාවක් පෑ හෝම්ස් විසිත්ත කාමරයේ දොර විවෘත කර එය අල්ලාගෙන සිටියේය. තමාට නිරුපද්‍රිතව එතැනින් පිටවී යාමට හැකි බව තේරුම් ගත් ඕබ්‍රයන් මෙනෙවිය අප හැමදෙනාටම හිසනමා ආචාර කොට නිවසෙන් පිටවී ගියාය.

මිනිත්තු කිහිපයක් තම අසුනටම වී නිහඬව කල්පනා කරමින් සිටි හොබ්ස් මහතා අන්තිමේදී අසුනෙන් නැගිට්ටේය.

"මේ ගැන මං වහාම මගේ මිත්‍රයා සර් මයිකල්ට දැනුම් දෙනවා. කිසි සැකයක් නෑ. ඔහු බලවත් කම්පාවකට පත්වේවි."

"හොබ්ස් මහත්මයා" හෝම්ස් කීය. "ඔබේ මනස පමණක් නෙමෙයි; ගෙදර පරිසරයත් ලොකු අවුල් ජාලයකට පත් කළ ඕබ්‍රයන් මෙනෙවියට අපි දෙන්නා සමාව දුන්නා. දැන් මොනවද ඔබට ඒ ගැන හිතෙන්නෙ?"

"ඔබ ක්‍රියා කළ හැටි ඉතාම විශිෂ්ටයි හෝම්ස් මහත්මයා." දේවගැතිතුමා කිවේ හෝම්ස්ගේ දකුණු අත තම දැතින්ම ගෙන සොලවමිනි. "වැරදීම මනුෂ්‍ය ගතියක් නේ. ඒකට සමාව දීම දේව ගතියක්"

අපට හිස නමා ආචාර කොට පිටවී යෑමට සූදානම් වූ ඔහු පියවර දෙකක් ඉදිරියට තබා එතැනම නැවතුණේය. අනතුරුව ආපසු හැරී අප ඇමතුවේය.

"ඒක නෙමෙයි හෝම්ස් මහත්මයා. මට මේක දැනුයි කල්පනා වෙන්නේ. සිටුවරියක කසාද බැඳගෙන ධනවතෙකු වෙන්න බලාගෙන හිටි මගේ බෑනා, බෙල්ලෙන්ම හිර නොවී බේරුණේ, අනූනවයෙන් නේද!"



# හාපර් මිනීමැරුම

1898 දී රටවාසීන් මවිතයට පත්කළ හාපර් මිනීමැරුම පිළිබඳව බොහෝ දෙනෙකුට තවමත් මතක ඇතුවා නිසැකය. මේ අභිරහස විසඳනු ලැබුවේ මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා විසින් බව ප්‍රසිද්ධ කරුණකි. එහෙත් ඔහු එය සිදුකළේ කෙසේද යන්න බොහෝ දෙනෙක් තවමත් නොදනිති. ඒ පිළිබඳ කථාව ලොවට හෙළි නොකරන්නේ කුමක් නිසාදැයි මගේ පාඨකයෝ විටින් විට විමසා එවති.

එකල එම කථාව හෙළි නොකිරීමට හේතුව මෙසේය. මෙයට අදාළ එක් පාර්ශ්වයක් විවාහ ගිවිසගෙන ඇති බැවි අප වෙත දන්වා තිබිණි. යටපත් වී තිබූ කරුණු සහ නම් ගම් යළි යළිත් හෙළිදරව් කිරීමෙන්, ඔවුනට අගතියක් වීමට ඉඩ ඇති බැවි ඔවුහු දැන්වූහ. ඒ අනුව මෙම කථාව ඔබ වෙත ගෙන ඒම කල් දමන මෙන් හෝම්ස් මගෙන් ඉල්ලා සිටියේය.

1898 වසරේ එක් උදෑසනක, අපි උදෑසන ආහාරයෙන් පසු සුපුරුදු ලෙස පුවත්පත් කියවමින් කාලය ගත කළෙමු. වැඩි කතාබහකට යොමු නොවූ හෝම්ස් තම "ස්ක්‍රැප්" පොතට ප්‍රවෘත්ති එකතු කිරීම සඳහා, පරණ පුවත්පත් පෙරළමින් සිටියේය. ඒ අතරම ඔහු තම සූචියක් ද පරීක්ෂාවට ලක් කළේය.

"වොට්සන්. මේ පරීක්ෂණ වල සටහන් ඔබ පාඨකයා වෙත ඉදිරිපත් කළා කියල මට විශ්වාසයි. F අකුර යටතේ තමයි ඒවට අදාළ මේ නම් සඳහන් වෙලා තියෙන්නේ. නමුත් ඒවා ඔබේ මතකයේ තියෙනවද කියන එක මට සැකයි"

"මොනවද හෝම්ස් ඔබ කියන ඒ නම්?"

"බ්‍රියට්‍රිස් ෆෝල්ඩර් ආර්යාව ඔබට මතකද?"

"හෝම්ස් ඔබ ඔය කියන්නේ, ෂොස්කෝම්බ් පළහිලව්වේ අපට හමුවුණු, සර් රොබට් නෝබටන්ගේ සොහොයුරිය ගැන නේ. ඩාබිහි අශ්වරේස් අවසන් වන තුරු ඇයගේ මරණය......."

"...... අන්න හරි. එතකොට ෆෙයාබර්න්? ඇලෙක් ෆෙයාබර්න් ඔබට මතකද?"

"ඔව්. මේරි බ්‍රවුනර්ට ඇගේ සැමියාගෙන් ප්‍රහාරයක් එල්ල වුණේ ඇය ෆෙයාබර්න් සමඟ ඇති කරගත් පෙම් සබඳතාව නිසා නේ. ඕක අපි පාඨකයාට ඉදිරිපත් කළේ "තැපැලෙන් ආ තෑග්ග" කතාවෙදි නේද?"

"ඒකත් හරි." හෝම්ස් කීය. "ඔබේ මතකය බොහොම හොඳයි නේ. එතකොට....... ෆෝලියෝට්....... සර් ජෝජ් ෆෝලියෝට් අපට හමුවුණු අවස්ථාව මතකද?"

"ඔහොම ඉන්න ටිකක්....... ෆෝලියෝට්....... මට හොඳට මතකයි ෆෝලියෝට් නම. නමුත් ඒ කොහේදිද? හරි හරි. මට නම් ඔහුව හමුවුණේ නෑ. ඔබ ගිහින් තිබුණා ඔහුව හමුවෙන්න ඔක්ස්ෂොට් ටවර්ස් මන්දිරයට. විස්ටේරියා මන්දිරයේ අභිරහස් කතාවෙදි, ඇලෝසියස් ගාසියාගෙ එක් අසල්වාසියෙකු වුණේ සර් ජෝජ් ෆෝලියෝට් නේද?"

"මගේ හිතවත් මිත්‍රයා. ඔබේ මතකය නම් අති විශිෂ්ටයි. මතක තබාගැනීමේ ශක්තිය අතින් ඔබ දෙවැනි වෙන්නේ මෙරිඩිව්ට විතරයි"

"අන්න හොඳයි හෝම්ස්. ඔබ ආවා හොඳ තැනකට. ඔබ ඔය මෙරිඩිව් ගැනත්, ඔහුගේ මතක තබා ගැනීමේ සුවිශේෂ හැකියාව ගැනත්, මීට පෙර මට කියා තිබෙනවා. ඒත් ඔහු ඔබට හමුවුණු සිදුවීම මොකක්ද කියලා මට කවදාවත් කියල නෑ. මං බොහොම කැමතියි ඔබ මේ වෙලාවේ මෙරිඩිව් ගැන මට කියනවා නම්. ඒ මොකද මේ වෙලාවේ අප යායුතු ගමනකුත් නෑ. අපේ කතාබහට බාධාකරන්න අනුග්‍රාහකයෙකුත් නෑ........"

ඒ වචන මගේ මුවෙන් පිටවූවා පමණි. වේගයෙන් පැමිණි අශ්වකරත්තයක් අපේ නිවස ඉදිරිපිට නවත්වන හඬ අපට ඇසිණ. ඒ දෙසට තම සවන් යොමු කළ හෝම්ස් ගේ නළල එක් මොහොතකට රැළි වැටිණි. ඒ ඔහුගේ දෙනෙත් මඳක් ඉහළට යොමු වී, කල්පනාකාරී බවක් මුහුණෙන් පැවසෙද්දීය.

"මට හරි කනගාටුයි වොට්සන්" ඔහු කීවේ සතුටු සිනාවක් මුවගට නැගෙද්දීය. "අපට අනුග්‍රාහකයෙක් තමයි මේ එන්නෙ. මෙරිඩිව් ගැන කතන්දරය ඔබට කියන්න අදත් ඉඩක් ලැබෙන්නෙ නෑ"

පළමුව අපට අසන්නට ලැබුණේ අශ්ව කරත්තය පිටත්ව යන හඬ සහ අප නිවහනේ සීනුව නාද කරන ශබ්දයයි. අනතුරුව හඩ්සන් මහත්මිය දොර විවෘත කොට අමුත්තා පිළිගත් අයුරුත්





මොහොතකින් ඔහු පියගැට පෙළේ ඉහළට එන ශබ්දයත් අපට අසන්නට ලැබිණ.

තම අත තිබූ මැළියම් බෝතලය, 'ස්ක්‍රැප්' පොත හා පුවත්පත් ඉවතට දැමූ හෝම්ස්, අමුත්තා පිළිගැනීම මට භාරකොට තම කාමරයට වැදුණේය. ඒ ඔහුගේ පරණ පිටකබාය අලුත් පිටකබායකට මාරු කරගැනීමට බව මම තේරුම් ගතිමි. මිනිත්තුවක් ගතවීමට පෙර අමුත්තා උඩුමහලට පැමිණියේය. ඒ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ අපේ හිතමිත්‍ර බ්‍රැඩ්ස්ට්‍රීට් බැව් මම හඳුනාගතිමි.

"සුභ උදෑසනක් වොට්සන් මහත්මයා. ඔබේ ගෙවල් හිමිකාරිය නම් කිව්වේ හෝම්ස් මහත්මයා ගෙදර ඉන්නා බවයි?" බ්‍රැඩ්ස්ට්‍රීට් විමසුවේය.

"ඇයි බ්‍රැඩ්ස්ට්‍රීට් ඔබ හිතුවේ ඔබ එනකොට මං හැංගුණා කියලද?" මගේ මිත්‍රයා විමසුවේ මහ හඬින් සිනාවෙමිනි. තම කාමරයේ සිට එළියට පැමිණි ඔහු අමුත්තාට අතට අතදී, ගිනිඋදුන අසල පුටුවෙන් හිඳගන්නා මෙන් අමුත්තාට සංඥා කළේය.

"ඒක තමයි. මං පුදුමයට පත්වුණා. ඒ මොකද අපි අරගෙන එන ගැටලු විසඳීම, ඔබ හැමවිටම ඉතා කැමැත්තෙන් භාරගන්නා නිසා." අමුත්තා කීවේ පුටුවේ හිඳගනිමිනි. "මේක මුලින්ම භාරවුණේ මගේ ජ්‍යෙෂ්ඨ ලෙස්ට්‍රේඩ් මහත්මයාට. නමුත් ඔහු කිව්වා "මෙතැන කිසිම අබිරහසක් නැහැ; මේක ඉතාම පැහැදිලිව පෙනෙන මිනීමැරුමක්" කියල. හෝම්ස් මහත්මයා විසඳන තාලේ ඉතා සංකීර්ණ පැටළුණු ගැටලු විසඳන්නයි ලෙස්ට්‍රේඩ් කැමති. ඒ නිසා ඉතා සරල ගැටලු ඔහු කනිෂ්ඨයන්ට භාරදෙනවා. ඔහු මොනවා කිව්වත්, මේක ඉතා සරල එකක් කියලා මට නම් හිතෙන්නේ නෑ. ඒ නිසයි ඔබ හමුවීමට මං තීරණය කළේ"

"බොහොම හොඳයි. මොහොතක් ඉන්න මං මගේ පයිප්පය දල්වා ගන්නා තුරු. මගේ හිතමිත්‍ර දොස්තර වොට්සන් නම්, මගේ මේ දුම්බීමට විරුද්ධයි." කී හෝම්ස් මා වෙත සිනාවක් පා ඔහුට සුපුරුදු හාන්සි පුටුවේ හිඳ ගත්තේය. අනතුරුව පිගන් මැටි පයිප්පය දල්වාගෙන දෙනෙත් අඩවන් කරගත්තේය. ඒ පොලිස් පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් වෙත සම්පූර්ණ අවධානය යොමු කිරීමේ සූදානමෙනි.

"මහත්වරුනි. මේ සිදුවීම ගැන හැම පුවත්පතකම මුල් පිටුවේ පළවුණා. නමුත් අපරාධය දිහා අප බලන පිළිවෙළ දැනගන්නත්

ඔබ හැමවිටම කැමති බව මං දන්නවා. ඒ නිසා කාරණා හැම එකක්ම මම මුල ඉඳලම කියන්නම්.

මෙම සිදුවීම වුණු ස්ථානය තමයි ග්‍රීන්වුඩ් දුම්රියපොළ ආසන්නයේ නිවසක්. ඒක මෑතකදී ඉදිකළ ප්‍රමාණයෙන් කුඩා නිවසක්. මෙහි පදිංචිකරුවන් හිටියේ තුන්දෙනෙක් පමණයි. ඒ තුන්දෙනාම කාන්තාවන්. නිවසේ ප්‍රධානියා නැත්නම් හිමිකාරිය වුණේ එලිසබත් හාපර් මෙනෙවිය. ඇය අවුරුදු හැත්තෑවක වයස්ගත කාන්තාවක්. අවිවාහක ඇය තරුණ කාලයේ, වංශවතුන්ගේ මන්දිරවල සේවිකාවක ලෙස සේවය කළ තැනැත්තියක්. මීළඟට මෙහි සිටියා ඇයගේ ඥාති දියණිය මේරි හාපර් මෙනෙවිය. ඇය රූමත් තරුණියක්. නිවසේ පදිංචිව සිටි තුන්වැන්නිය තමයි එහි සේවිකාව වුණු ඩෝරා ඕ වොරන්. ඇය මැදිවියේ ගැහැනියක්. ගෙදර ඉතා පිරිසිදුව, අලංකාරව තබා ගැනීමට එලිසබත් හාපර්ගේ දැඩි උවමනාවක් තිබුණා. ඒකට උදව් කළේ ඩෝරා නම් සේවිකාව.

වයස්ගත එලිසබත් හාපර් සෑහෙන තරම් වත්පොහොසත්කම් ඇති තැනැත්තියක ලෙස, අසල්වාසීන් අතර මතයක් තිබුණා. කෙසේ වෙතත් ඇය ඔවුන් සමග ඒ තරම් ළඟ ආශ්‍රයකට ගිය කෙනෙකු නොවෙයි. අසල්වාසීන්ගේ තේ පැන් සංග්‍රහ, උපන් දින උත්සව, නත්තල් සාදවලටත් හාපර් මෙනෙවියවත් ගෙදර අනෙක් අයවත් සහභාගි වුණේ නෑ. ඇය දෙව්මැඳුරට පවා ගියේ ඉතාමත් කලාතුරකින් බවයි අහන්න ලැබුණේ. මේ කරුණ නිසාම හාපර් නිවසේ වැසියන් ගැන ඒ තරම් තොරතුරක් තිබුණේ නැහැ.

තරුණ ඥාති දියණිය වයස අවුරුදු විසි අටක හෝ නිහක පමණ තැනැත්තියක්. ඇය මේ ගෙදර පදිංචියට ඇවිත් තියෙන්නේ මෑතකදී. ඇය කලකට පෙර ලන්ඩනයේ වේදිකා නාට්‍යවල සුළු චරිත රඟපෑ නිළියක බවටත් සමහරු කිව්වා. මේරි හාපර් මෙනෙවිය නාට්‍ය අධ්‍යක්ෂ කවරයෙකුගේ පෙම්වතියකව සිටි බවටත්, සමහරුන් ප්‍රකාශ කරනවා. එම පුද්ගලයාගේ බිරිඳ එයට මැදිහත්වීම නිසා මේරි හාපර් නාට්‍ය කණ්ඩායමෙන් ඉවත් කෙරුණු බවත්, ඇය ග්‍රීන්වුඩ්හි තම නැන්දා සමඟ පදිංචියට ආවේ ඉන්පසුව බවටත් තවත් ඕපාදූප තිබුණා.

ඒ කොහොම වුණත් වයස්ගත එලිසබත් හාපර් තද රෙගුලාසිකාරියක් බව ඇත්තක්. තරුණ මේරිට එහි ජීවත්වීමට සිදුවුණේ නැන්දාගේ දැඩි නීතිරීති යටතේ. අලුත් මෝස්තරවල විවිධ විලාසිතාවල ඇඳුම් ඇඳීමට, මේරිගේ ලොකු කැමැත්තක්





තිබුණා. ප්‍රභූ සමාජයේ ධනවත් කාන්තාවන් පැළඳූ ප්‍රංශ හිස්වැසුම් වලටත්, මේරිගේ ලොකු ආශාවක් තිබුණා. නමුත් එලිසබත් හාපර් නම් ඒවාට මුදල් නාස්තිකරන්න කැමැතිවුණේ නැහැලු. තරුණ මේරිට අඳින්න සිදුවුණේ බොහොම චාම් ඇඳුම්. ඒ වගේම ඇගේ හිස්වැසුම් හා පාවහන් පවා, පරණ මෝස්තරවල ඒවා බව අසල්වැසියන් පැවසුවා. ඇයගේ අතට ලැබෙන මුදල ප්‍රමාණවත් නොවීම නිසා මේ ලේලිය තම නැන්දා සමග ඉඳහිට බහින් බස් වූ බවටත් සාක්ෂි තියෙනවා.

ඒ කොහොම වුණත් ඔක්තෝබර් මාසයේ ඒ බදාදා වන තුරු, ග්‍රීන්වුඩ්හි මෙම කුඩා නිවස ඉතා සාමාන්‍ය එකක්ව තිබුණා.

හාපර් නිවසේ සේවිකාව ඩෝරා ඕ'වොරන් බව මං ඔබට කිව්වා. ඇය අයිරිෂ් සම්භවයක් ඇති උගත්කමින් අඩු තැනැත්තියක්. ඇගේ එක කුසේ උපන් සොයුරියක්, ලූටොන් නගරයේ පිහිටි නිවසක සේවිකාවක ලෙස සේවය කළා. සොහොයුරිය දින කිහිපයක් තිස්සේ අසනීපෙන් බව ඩෝරාට දැනගන්න ලැබී තිබුණා. ඉතින් මේ කියන බදාදා තම සොහොයුරිය බැලීමට ලූටොන් වෙත යෑමට ඩෝරා තීරණය කළා. බදාදා එහි ගොස්, රාත්‍රිය එහි ගත කොට, බ්‍රහස්පතින්දා උදේ ලූටොන්වලින් ආපසු ඒමට පිටත් වෙන්නයි ඩෝරා බලාපොරොත්තු වුණේ.

තරුණ මේරි මෙනෙවිය හැමදාමත් ගෙදරට වෙලා සිටි කෙනෙකු නෙමෙයි. කලා ක්ෂේත්‍රයේ හඳුනන අය සිටි නිසා ඇය විටින් විට ඔවුන් දැකීමට, ලන්ඩනයට ගිහිං ඒම සිරිතක්. මේ කියන බදාදා දවසේ ලන්ඩනයට යන්න මේරි මෙනෙවියටත් උවමනා වුණා. එදා ඇය අපර භාගයේ ලන්ඩනයට යන්න තීරණය කළා. ඒ ගිහින් ඇය ග්‍රීන්වුඩ් වෙත ආපහු එන්න බලාපොරොත්තු වුණේ, රාත්‍රියේ ග්‍රීන්වුඩ් වෙත ළඟාවෙන අන්තිම කෝච්චියේ. ඒක ග්‍රීන්වුඩ් දුම්රියපොළට ළඟාවීමට නියමිත රෑ එකට මිනිත්තු කිහිපයක් තිබියදී. හරියටම කියනවා නම් මධ්‍යම රාත්‍රී දොළහ පසුවී මිනිත්තු පනස්පහට. දුම්රියපොළේ සිට ඇගේ නිවසට ඒමට ගතවෙන්නේ මිනිත්තු පහක හෝ හයක කාලයක්.

මේ පාරේ පදිංචිකරුවන් ගැඹුරු නින්දකින් එදා රෑ අවදිවුණේ පාන්දර එකයි පහට පමණ. ඒ ගැහැනියක් නැගූ මර ළතෝනියක හඬෙන්. ඊළඟට මොහොතකින් තම නැන්දාගේ නිවසෙන් එළියට දුවගෙන ආ මේරි, ළඟම තිබූ ගෙදරක දොරට තඩිබෑවේ පිස්සුවෙන් වගේ. ඇගේ මරළතෝනි එතකොටත් නැවතී තිබුණේ නැහැ.

ග්‍රීන්වුඩ් කියන්නේ බොහොම සාමකාමී නිසංසල පෙදෙසක්. මධ්‍යම රාත්‍රියේ මේ විදියට බිහිසුණු විලාප හඬක් ඇසුණාම එයින් ඇතිවෙන ප්‍රතිඵලය මොකක්ද කියලා ඔබට හිතාගන්න පුළුවන් ඇති. සමහරු ජනෙල් විවෘත කරල බැලුවා. තවත් කිහිපදෙනෙකුම ඉක්මනින් තම ගෙවල්වලින් එළියට බැහැලා හාපර් නිවස වෙත දිව ගියා. මීළඟට ඒ ගැන ආරංචිය පැතිරිලා ගියේ ලැව්ගින්නක් වගේ. මහ රෑ ගෙදර ආව මේරි හාපර් මෙනෙවියට දකින්න ලැබී තිබුණේ මොකක්ද? තමන්ගේ වයස්ගත නැන්දා - එලිසබත් හාපර් විසිත්ත කාමරයේ මරා දමා ඇති අන්දම.

මේ ගෙදරට පළමුවෙන්ම ඇතුළුවෙන්න තරම් ධෛර්යයක් තිබුණේ ජේම්ස් බැක්ස්ටර් මහත්මයාට පමණයි. ඔහු තමයි මේ ගමේ උපතැපැල් කාර්යාලයේ තැපැල් ස්ථානාධිපති. මේරි මෙනෙවිය ඔහු පසුපස ආපසු ගෙට ආවේ නෑ. ඇය සිහි විකල් වෙලා වගේ කෑ ගසමින් හිටියේ, තම නැන්දා මරාදමා ඇති බව කියමින්. මේරි දිගින් දිගටම විලාප නැඟුවා. බැක්ස්ටර්ටත් පසුව එහි පැමිණි අනෙක් පිරිමින්ටත් දකින්න ලැබුණේ භයානක දර්ශනයක්. එය දැකීමෙන් ලාබාල තරුණියකගේ සිහිවිකල් වීමේ පුදුමයක් නෑ.

විසිත්ත කාමරයේ එක් කෙළවරක තිබුණා, තරමක් ලොකු ලියන මේසයක්. එහි ලාච්චු සියල්ල හැරදමා තිබුණු අතර, එහි කඩදාසි හැමතැනකම විසුරුවා දමා තිබුණා. එලිසබත් හාපර් මෙනෙවියගේ සිරුරේ උඩකොටස මේසය මතත් අනෙක් කොටස අර්ධ වශයෙන් පුටුව හා පොළොව මතත්, රැඳී තිබුණා. ඇය මුහුණ යටට සිටිනසේ මුනිං අතට සිටියේ දෑත් දෙපැත්තට විහිදුවා ගෙන. ඝාතනයට යොදාගත් පිහිය සිරුරේවත්, නිවසේ වත් පෙනෙන මානයක තිබුණේ නෑ. නමුත් මේ අවාසනාවන්ත කාන්තාව ඝාතනය කර ඇති බව තේරුම් ගැනීමට දෙපාරක් බලන්න කාටත් උවමනා වුණේ නෑ.

පාපැදියක් තිබූ එක් අසල්වැසියෙක් වහාම පොලිස් ස්ථානය වෙත පිටත් වී ගියා. පොලිස් භටයන් දෙදෙනෙකු වහාම එතැනට ආවා. හඬමින් සිටි තවත් කාන්තාවන් හා උස් හඬින් කථාකරමින් සිටි අසල්වාසීන් එළියට දමලා, පොලිස් භටයන් තමන්ගේ රාජකාරි ඇරඹුවා. මේ බිහිසුණු සිදුවීම ගැන මේරි මෙනෙවියගෙන් තොරතුරු විමසුවේ ඊටත් පසුවයි. අඩ සිහියෙන් මෙන් දොඩවමින් සිටි ඇය මුලින් කාරණා කීවේ පිළිවෙළකට නෙවෙයි. නමුත් ඇයට





කාරුණිකව කථාකරලා, පැහැදිලි කට උත්තරයක් ගන්න සාජන්ට් ග්‍රැහැම්ට හැකිවුණා.

"ලන්ඩනයේ එක්තරා රංගශාලාවක අද දින තිබුණා නාට්‍ය සංදර්ශනයක්. එය නැරඹීමට යන්න මට ආරාධනයක් ලැබුණා. ඒක ලැබිලා හුඟක් දවස්. මුලදී නැන්දා ඒකට මට අවසර දුන්නේ නෑ. නමුත් පස්සේ මං දිගින් දිගටම ඇයට කරදර කරද්දී ඇය ඊට අවසර දුන්නා. ඒ නිසා දහවල් දොළහයි තිස්පහේ දුම්රියෙන් ලන්ඩනය බලායන්න මං සූදානම් වෙමිනුයි හිටියේ. ඒ අතරේ අපේ සේවිකාව ඩෝරා ඇගේ සොයුරිය බලන්න ලූටොන් යන්න තීරණය කරලා.

ඒ හදිසියේ කළ තීරණයක්. ඉතින් මං කොහොමද මගේ ගමන එක්වරම අවලංගු කරන්නේ. එහෙම කරලා මට ඇරයුම් කළ තැනැත්තාගේ බලාපොරොත්තු කඩකරන්නත්, සිත වේදනාවට පත්කරන්නත් මගේ කැමැත්තක් තිබුණේ නෑ. ඩෝරා යන බව දැනගෙනත් මාත් ලන්ඩනයට යන්න තීරණය කිරීම ගැන, නැන්දා අන්තිම මොහොතේ මට දොස් කිව්වා. ඒ ගැන අපි දෙන්නා අතරේ වචන හුවමාරුවකුත් ඇතිවුණා. කොහොම වුණත් මං යන්න ගත් තීරණය වෙනස් කළේ නෑ. නැන්දා රෑ වෙද්දී නින්දට ගියත්, ඇය අවදි නොකොට මට දොර ඇරගෙන ගෙට ඇතුළුවෙන්න හැකි විදියට, ඉස්සරහ දොරේ අමතර යතුර මං අරගත්තා. මං අවසාන දුම්රියෙන් ආපහු ආවා. දුම්රියපොළේ සිට මං කෙළින්ම ගෙදරට ඇවිදගෙන ගියා. යතුරෙන් දොර ඇරගෙන මං පිවිසුණේ විසිත්ත කාමරයට. එහි පහන දල්වා තිබුණා. ඉතින් මට දකින්න ලැබුණේ........"

මේරිට එතැනින් එහාට කිසිදෙයක් හරි හැටි කියාගන්න බැරිවුණා. තමා විලාප නගමින් ගෙදරින් එළියට දිව ගිය බව පමණයි ඇයට මතක තිබුණේ. සාජන්ට් ග්‍රැහැම් තවත් ප්‍රශ්න අසමින් ඇයට හිරිහැර කළේ නැහැ. මේරිට එදා රාත්‍රියට නවාතැන්දීම අසල්වැසි කාන්තාවක් භාරගත්තා. ඉහළ නිලධරයන්ට එතැන භාරදෙන තුරු එම ස්ථානය මුරකිරීම පොලිස් භටයන් දෙදෙනා ඉටුකළා"

* * *

"මිනීමැරුම ගැන සොයාගත්තේ පාන්දර එකට නිසා, ඊළඟ දවසේ උදෑසන පුවත්පත්වල මේ ගැන තොරතුරු පළවුණේ නෑ. මරණ පරීක්ෂණ විභාගය පැවැත්වීමට නියමිතව තිබුණේ

බ්‍රහස්පතින්දා උදයේ. ග්‍රීන්වුඩ් පොලීසියේ සාජන්ට් ග්‍රැහැම්ට මේකෙ පැටලිලි සහිත බවක් ඉවෙන් වාගේ වැටහුණා. ඒ නිසා රහස් පරීක්ෂකයකුගේ පැමිණීම තමා අපේක්ෂා කරන බව, ඔහු ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට දැන්නුවා. ඒ අනුව තමයි මාව එහි යැවුණේ. මේ වගේ නිහඬ ගම්බද තැනක මෙවැනි බිහිසුණු මිනීමැරුමක් වුණාම, ඒකෙන් කාගේත් සිත් කැලඹීමට පත්වීම පුදුමයක් නෙමෙයි. මං එහි ගියාම තත්ත්වය එය බව මට දකින්න ලැබුණා. කාගේත් කතාබහේ එකම මාතෘකාව වුණේ මේ අපරාධය. එය සිදුකළ අපරාධකරුවා කවුද?

මිනිත්තු පහක් ගතවෙද්දී එම ප්‍රශ්නයට පිළිතුර කාගේත් දෙතොල්වලින් රැව්පිළිරැව් දුන්නා.

"අපරාධය කළේ මැරුම් කෑ ගැහැනියගේ ඥාති දියණිය මේරි හාපර් මෙනෙවිය!"

"දෙවියනේ!" මට කියැවුණා. "මගේ හිතේ ඇතිවුණු සැකයත් ඒකයි. මේක නම් බොහොම සිත් ඇදගන්නා සුලු පරීක්ෂණයක් වේවි"

පොලිස් පරීක්ෂක තම අත්බෑගයෙන් ඡායාරූප කිහිපයක් අතට ගෙන, මොහොතක් ඒවා පරීක්ෂාකර බැලීය. ඔහු කථාව යළි ඇරඹුවේ ඉන් අනතුරුවයි.

"මරණ පරීක්ෂණ විභාගය පැවැත්වුණේ ග්‍රීන්වුඩ් පොලීසියේ. ඒ සවස දෙකට. පොලිස් කාන්තාවන් දෙදෙනෙකුගේ ආරක්ෂාව යටතේ මේරි හාපර් මෙනෙවිය සිටි හැටි මට දකින්න ලැබුණා. තමන්ට පදිංචියට නිවසක් හා ජීවත්වීමට මුදල් ලබාදුන්, අවුරුදු හැත්තෑවක තම නැන්දනිය මරාදැමීමයි ඇයට විරුද්ධව තිබූ චෝදනාව. මේ ඉන්නේ ඇය........" මෙසේ කී බ්‍රැඩ්ස්ට්‍රීට් ඡායාරූප මගේ මිත්‍රයා අතට දුන්නේය.

"ඇය උසින් වැඩි සිහින් සිරුරක් ඇති ඉතා රූමත් තරුණියක්. එදා මරණ පරීක්ෂණ විභාගය පැවැත්වෙන වෙලාවෙ ඇයගේ පෙනුම නම් මේ වගේ නෙමෙයි. ඇය එදා සිටියේ දැඩි කම්පාවකට පත්වෙලා. ඇගේ මුහුණ අළු පාට වෙලා. ඇගේ ප්‍රමාණයෙන් ලොකු දෙනෙත්වලින් කියැවුණේ භීතිය, කම්පාව. ඇගේ දෑත් තිබුණේ වෙවුලමින් බව මම දුටුවා.

ඇයට එරෙහිව මහජන මතයක් ගොඩ නැගෙමින් තිබුණු බව මට මුල ඉඳලම පැහැදිලි වුණා. මා වටේට හිඳගෙන සිටි අය කියූ දේවල්, මට කනින් කොණින් ඇහුණා. මේරි හාපර් මෙනෙවියගේ





රූමත් පෙනුම නිසාවත්, ඇයට රංගන ක්ෂේත්‍රයේ ලැබී තිබුණු කීර්තිය නිසාවත්, ඇයට සමාවක් දෙන්න ග්‍රීන්වුඩ් ගම්වැසියන්ගේ සූදානමක් තිබුණේ නෑ.

පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ වෛද්‍යවරයාගේ සාක්ෂිය ඉතාම කෙටියි. ඒ වගේම එය පැහැදිලි සරල එකක් වුණා. එලිසබත් හාපර් නෝනා මරාදමා තිබුණේ පිටුපසින් සිට කළ පිහි ඇනුමකින්. ඉතාමත් තියුණු ආයුධයක් ඇගේ පිට ප්‍රදේශයට ඇතුළු වී ඇගේ වම් පෙණහැල්ල පසා කරගෙන ගිහින් තිබුණා. මෙය සිදු කරද්දී ඇය ඉඳලා තියෙන්නේ ලියන මේසය ඉදිරිපිට පුටුවේ හිඳගෙන. තමාට ප්‍රහාරයක් එල්ලවෙන බව ඇය දැනගෙන ඉඳලා නෑ. ඊළඟ තත්පර කිහිපය ඇතුළත ඇගේ මරණය සිදුවෙලා.

මේ ගැන මරණ පරීක්ෂකවරයා තදින්ම වෛද්‍යවරයාගෙන් විමසුවා.

"ඔබ කියන්නේ පිහි ඇනුමට ලක්වුණාට පස්සේ, හාපර් මෙනෙවියට එහා මෙහා වෙන්න හැකියාවක් තිබුණේ නැහැ කියලද? උදාහරණයක් වශයෙන් ඇය පුටුවෙන් නැගිටලා.......?"

"ඇය පුටුවෙන් නැගිටින්න උත්සාහ නොකළ බව මට නිශ්චිතවම කියන්න පුළුවනි. ඇය පුටුවේම මඳක් එහා මෙහා වුණා වෙන්න ඉඩ තියෙනවා"

"හොඳයි. පුටුවෙන් නැගිටින්න ඇය, උත්සාහ කළේ නැහැ කියමු. නමුත් සීනුව මේසය උඩ තිබුණේ ඇගේ අතේ දුරින්. එය නාද කිරීමට ඇය උත්සාහ කළේ නැද්ද? පෑන, තීන්ත හා කඩදාසි තිබුණෙත් ඇගේ අතේ දුරින්. ඇය වචනයක් හෝ දෙකක් ලියන්න උත්සාහ කළේ නැද්ද?" මරණ පරීක්ෂකයා විමසුවා.

"දැඩි වේදනාවකින් සිටි ඇය ඔබ කියූ යමක් කරාද නැද්ද කියා නිශ්චිතව කියන්න අමාරුයි." වෛද්‍යවරයා කිව්වා. "ඇගේ අත ළඟම තීන්ත, පෑන හා කඩදාසි හෝ සීනුවක් තිබුණා නම්, ඇය එහෙම කළා වෙන්නත් පුළුවනි. කොහොම වුණත් පිහි ඇනුමෙන් පසු ඇය ජීවත්ව සිටි කාලය මිනිත්තුවකට වැඩිවෙන්න බැහැ කියන එකයි මගේ නිගමනය"

ඊළඟට සාක්කි දුන්නේ සාජන්ට් ග්‍රැහැම්. කලින් මං ඔබට කියූ දේ තමා ඔහු මුලින් කිව්වේ. මේරි මෙනෙවිය මුලින් කියූ දේ පසුවත් ඒ අයුරින්ම කියූ බව ඔහු පැවසුවා. ඇය නාට්‍යයක් නැරඹීම සඳහා ලන්ඩනය වෙත පිටවී ගොස් තිබෙන්නේ, ඇගේ නැන්දා තනියෙන් ගෙදර සිටියදී. ඇය ආපසු ගෙදර එද්දී රාත්‍රි

එක පසුවී මිනිත්තු කිහිපයලු ගතවුණේ. දොර ඇරගෙන විසිත්ත කාමරයට පිවිසුණු ඇයට, එක්වරම දකින්න ලැබුණේ, තම ලියන මේසය මතට හිස හා පපුව පහත් කරගෙන නැන්දා මියගොස් සිටි හැටි.

එදා සවස ඇය ලන්ඩනය බලා පිටත්වී ගිය බව පහසුවෙන් ඔප්පු කළ හැකිවුණා. ග්‍රීන්වුඩ් දුම්රිය ස්ථානාධිපති මෙන්ම එහි පෝටර්වරයා දැක තිබුණා ඇය ලන්ඩන් දුම්රියේ ගිය බව. නමුත් ඇය ආපසු ආව වෙලාව ගැන? ඒ ගැන දිව්රා කියන්න පුළුවන් කිසිකෙනෙකු හිටියේ නෑ. ඒකට හේතුව ලන්ඩනයෙන් රෑ දොළහමාරට එන අන්තිම දුම්රියේ විශාල සෙනගක් එනවා. ඒ හැමදෙනෙක්ම වාගේ නාට්‍ය නරඹලා ගෙදර යන අය. එදා රාත්‍රිය තද මීදුමක් තිබුණු අන්ධකාර එකක්. ඒ නිසා රාත්‍රි එකේ දුම්රියෙන් ඇය ග්‍රීන්වුඩ් වෙත ආවාද කියා ඇසින් දුටු කිසිවෙකු සිටියේ නෑ.

මෙතැනදි තවත් කාරණයක් ගැන මරණ පරීක්ෂකවරයාගේත් පොලීසියේත් අවධානය යොමුවුණා. තමන් නාට්‍ය නැරඹීමට ගියේ කවුරුන් සමගද; තමන් ආපසු ඒමට දුම්රියට නගිද්දී ඔහු හෝ ඇය හෝ ඔවුන් දුටුවාද කියා, මරණ පරීක්ෂකවරයා මේරිගෙන් විමසුවා. එයට පිළිතුරු දීම ඇය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. එම පුද්ගලයා හෝ පුද්ගලයන් නම් නොකිරීම ඇගේ පැත්තෙන් පාඩුවක්. ඒ මොකද ඔය කියූ වෙලාවටයි ඇය ලන්ඩනයෙන් පිටවුණේ කියන කාරණය තහවුරු කරන්න, ඇයට තිබූ සාක්ෂියත් එයින් නැතිවුණා.

මේ පරීක්ෂණය පැවැත්වෙද්දී මං අසුන්ගෙන සිටියේ, ඇය සිටි තැනට කිට්ටුවෙන්ම, ඇය ඉදිරියෙන් වගේ. ඇගේ මුහුණේ පළ වුණු හැඟීම්වලට දැඩි අවධානයක් යොමුකරගෙනයි මං සිටියේ. ඇගේ දෑත් දිගින් දිගටම වෙව්ළුවා. අළු පැහැයට හැරී තිබුණු මුහුණ විටෙක සුදුමැලි වුණේ මළමිනියක් වගේ. මඳ වේලාවකින් එය ඉවත්ව ගියත් යළිත් ලැබුණේ අළු පැහැයක්. ඇගේ දෙනෙත් විශාල වී තිබුණේ දිගින් දිගටම හෘද සාක්ෂියෙන් එල්ල වෙන චෝදනාවක් නිසාදෝයි මට සැක සිතුණා. එසේත් නැත්නම් ඒ ඇය හෙළි නොකළ මොකක් හරි බියකරු රහසක් නිසාද? මේ භයානක අපරාධයට ඇය හවුල් නොවුණත්, ඇය ඒ ගැන කල්තියා දැන සිටියාද?

හෝම්ස් මහත්මයා. මෙතැනදී අපට පැහැදිලිවම පෙනෙන එක් කාරණයක් තිබෙනවා. ඒ තමයි මේ ඝාතනය කිසිම අරමුණක් නැති





එකක් බව. මං එහෙම කියන්නේ ඇයි? මියගිය එලිසබත් හාපර් මෙනෙවිය ඉතුරු කරගත් විශාල මුදලක් තිබූ ධනවත් තැනැත්තියක් නෙමෙයි. තම නැන්දා තමන්ට ජීවත්වීමට නිවසකුත්, සුළු වශයෙන් හෝ මුදලුත් ලබාදෙද්දී, ඇයි මේරි මෙනෙවිය නැන්දාව මරා දමන්නේ? මෙතැනදී මං මගේ අවධානය යොමුකළේ පසුව සාක්ෂි දුන්, මියගිය එලිසබත් මෙනෙවියගේ සේවිකාව වුණු ඩෝරා ඕ' වොරන් වෙත.

ඇය සැරසී හිටියේ තදකළු පැහැති ඇඳුමකින්. අයර්ලන්තයේ පුරාණ චාරිත්‍රවල විධියට ඇය කළු පැහැති ආවරණයකින් හිස්මුදුන වසාගෙන සිටියා. මඳක් තරබාරු ඇයගේ මුහුණේ මා දුටුවේ කහ පැහැති ඉටිවලින් සෑදූ පිළිමයක හැඩරුව. ඇය කථා කරද්දී තිබුණේ කිසි කෙනෙකුව මායිම් නොකරන, අනුකම්පා නොකරන සැර පරුෂ ස්වභාවයක්.

මේරි මෙනෙවිය ඩෝරා සාක්කි දුන් ආකාරය දෙස ඇසිපිය නොහෙළා බලා සිටියා. ඇලකට හසුවුණු කුරුල්ලෙකු එම දැල ක්‍රමයෙන් තද වෙද්දී භීතියෙන් බලන අයුරින් තමයි, මේරි මෙනෙවිය ඩෝරා දෙස බලා සිටියේ. මරණ පරීක්ෂක හා ඩෝරා අතර ඇතිවුණු සංවාදය මං ඔබට කියන්නම්.

"බදාදා ඔබ මේ නිවසෙන් බැහැර ගියේ ඇයි කියල අපට කියන්න"

"ලූටොන් හි සිටින මගේ නංගීගෙන් මට බදාදා උදේම ලියුමක් ලැබුණා. ඇය දින කිහිපයක ඉඳන් අසනීපෙන් හිටියේ. නමුත් මට ඇය බලන්න යන්න අවස්ථාවක් ලැබුණෙ නෑ. නමුත් මෙදා ලියුමෙන් නංගි කියා තිබුණේ, කොහොම හරි පුළුවන් තරම් ඉක්මනින් ඇය දකින්න එන ලෙස. ඉතින් මම කොහොමද ඒ ගමන තවත් පමාකරන්නේ? උයපු කෑම ගෙදර තිබුණා. එදාම ලූටොන් ගිහිං ඊළඟ දවසේ එනම් බ්‍රහස්පතින්දා ආපහු එන්නයි මට උවමනා වුණේ. ඒකට මට නිවාඩුවක් දෙන්න පුළුවන්ද කියලා මම මගේ ස්වාමිදූවගෙන් විමසුවා. ඇය කිව්වා ඒකට කමක් නැහැ කියලා. තමාටත් මේරි මෙනෙවියටත් ගෙදර වැඩ කටයුතු එක දවසකට බලා ගැනීම ප්‍රශ්නයක් නැහැ කියලයි එලිසබෙත් නෝනා කිව්වේ."

"මේරි මෙනෙවියත් එදාම ලන්ඩන් යන බවක් ඒ වෙලාවේ ඔබේ ස්වාමිදූව කිව්වේ නැද්ද?"

"නැහැ" ඩෝරා කිව්වේ තරහෙන් වගේ. "ඇය මොකුත් කිව්වේ නැහැ. නමුත් උදේ තේ මේසය වෙලාවෙ ඇය මේරි මෙනෙවිය ඇමතුවේ මා ඉදිරිපිටදීමයි. "මේරි. ඩෝරාට අද ලූටොන් යන්න සිද්ධ වෙලා. එයාට ආපහු එන්න වෙන්නෙ හෙට. ඒ වෙනතුරු අපි දෙන්නට ගෙදර ඉන්න වෙන්නෙ තනියම"

"මේරි මෙනෙවිය ඒකට මොනවද කිව්වේ?"

"ඒකට කමක් නෑ නැන්දෙ" ඒ වෙලාවෙ ඇය කිව්වේ එපමණයි.

"එතකොට මේරි මෙනෙවිය ලන්ඩන් බලා යන බවත්, වයස්ගත හාපර් මෙනෙවියට ගෙදර ඉන්න වෙන්නෙ තනියම බවටත් කතාබහක් මතුවුණේ නැද්ද?"

"නැහැ"

"මේරි මෙනෙවියත් එදාම ලන්ඩන් යන එකට එලිසබෙත් නෝනා අකමැති වෙලා, ඒකට දෙදෙනා අතර බහින් බස්වීමක් ඇතිවුණාලු. ඔබ ඒක දන්නෙ නෑ?"

"නැහැ මහත්මයා" ඩෝරා කීවා.

"දෙදෙනාට එකඟතාවයකට එන්න බැරිව, එලිසබෙත් නෝනා ලේලිට දොස් පැවරූ කතාවත් ඔබ දන්නෙ නෑ?"

"මෙහෙමයි මහත්මයා. ඔය කාරණාව ගැන මොන කතාබහක් ඇතිවුණාද කියල මම දන්නේ නෑ. ඒ වුණාට දෙදෙනාට එකඟතාවයකට එන්න බැරිවුණා අවස්ථා බොහොමයි. ඒ නිසා ඇතිවුණු බහින් බස්වීම් බොහොමයි. ඒ බව මට කියන්න පුළුවනි." ඩෝරා පැවසුවේ මේරි වෙත තියුණු බැල්මක් හෙළමින්.

"ඒ මොනවා ගැනද?"

"ප්‍රධාන වශයෙන්ම මුදල් සම්බන්ධයෙන්" ඩෝරා කීවා. "නොයෙක් නොයෙක් අලුත් මෝස්තරයේ ඇඳුම් විලාසිතාවලට මේරි හරි කැමතියි. නමුත් ඒ විකාරවලට මුදල් අප්‍රමාණ ලෙස යොදන්න, එලිසබෙත් නෝනාට පුළුවන් කමක් තිබුණෙ නෑ. කැමබීමයි නවාතැනුයි දෙන එකම මදැයි. එලිසබෙත් නෝනාට ලොකු ආදායමක් ලැබෙන විදියක් තිබුණෙ නෑ. ඇයට මාස්පතා සුළු දීමනාවක් විතරයි ලැබුණේ. ඒක ලැබුණේ ප්‍රභූ පරපුරක වංශාධිපතියෙකු සමග විවාහ වුණු ප්‍රභුවරියකගෙන්. නමුත් ඒක විශාල මුදලක් නෙමෙයි. මං හිතන්නේ මුළු සතියකටම ලැබුණේ ඒක පවුමයි. එලිසබත් නෝනා උනන්දු වුණා නම් ඒ මුදල තවත් හුගක් වැඩිකරගන්න තිබුණා"





"ඔහෝ! ඒ කොහොම ද?" මරණ පරීක්ෂක විමසුවා.

"ඔබට කියන්න මහත්මයා; ඒ ප්‍රභුවරිය විවාහයට කලින් නාට්‍ය ක්ෂේත්‍රයේ නළඟනක්. ඇය තමයි මේරි මෙනෙවියටත් නාට්‍යවල සුළු චරිත රඟපෑමට අවස්ථාව ලබා දුන්නේ. මේ ප්‍රභුවරිය ඉතාම කුඩා කාලයේ ඉඳල ඇයව රැක බලාගෙන තියෙන්නේ එලිසබත් නෝනා විසින්. ඉතින් තම හිතවත් සේවිකාවට කෘතඥ දැක්වීමක් ලෙසටයි, අර ප්‍රභුවරිය සතිපතා පොඩි දීමනාවක් දුන්නේ. නමුත් එලිසබත් නෝනාට උවමනාව තිබුණා නම් ඒ මුදල හුගක් වැඩිකරගන්න තිබුණා........"

"ඒ කොහොමද?"

"මහත්තයල දන්නවානේ ඔය රංගන ක්ෂේත්‍රයේ උන්නු සමහර නිළියන්ගේ කල්කිරියාව ගැන? ඒව ඒ තරම් යහපත් කියල අපට කියන්න බැහැනෙ. ඔය කියන ප්‍රභුවරියත් මේරි මෙනෙවියත් දෙන්නාම නාට්‍යවල රඟපෑවෙ එකට, එක කාලෙ. ඔබට කියන්න මහත්මයා, ඒ කාලෙ මේ තරුණ අය ගතකළ ජීවිතය ගැන කිව්වොත්......."

"...... ඔය ඇති ඩෝරා" මරණ පරීක්ෂක ඒ කථාවට බාධා කළා. "එලිසබත් නෝනාට ප්‍රභුවරියකගෙන් ලැබුණු දීමනාව ගැන විතරක් අපට කියන්න"

"ඒ ගැන තමයි මං මේ කියන්න හැදුවෙ" ඩෝරා කිව්වා. "අපේ එලිසබත් නෝනා දිගු කාලයක් සේවය කරල තිබුණෙ අර ප්‍රභුවරිය ළඟ නේ. ඉතින් ඇය ගැන රහසිගත කාරණා කීපයකුත්, එලිසබත් නෝනා දැනගෙන හිටියා. ප්‍රභුවරිය ඒ කාලෙ කාටදෝ ලියූ ලියුම් වගයකුත් අපේ නෝනා ළඟ තිබුණා"

"ඩෝරා කොහොමද ඒක දන්නෙ?"

"අපෝ! එලිසබත් නෝනා ඒ ගැන මා එක්ක කීපසැරයක්ම කියල තියෙනවා. තමන් ළඟ තියෙන මේ ලියුම් අර ප්‍රභුවරියගෙ ස්වාමිපුරුෂයා හරි ඔහුගේ නෑදෑයින් හරි දුටුවොත්! ඒකට නම් ප්‍රභුවරිය කොහොමටවත් කැමති වෙන එකක් නැහැ කියලයි එලිසබත් නෝනා කිව්වෙ. ඒ නිසා ඒවා හුගක් වටිනවා කියලයි ඇය මා එක්ක කිව්වෙ.

මේ ලියුම් ගැන මේරි මෙනෙවියට දැනගන්න ලැබුණා. ඇය ඒවා ඉල්ලලා එලිසබත් නෝනට හරියට කරදර කළා. මේරි මෙනෙවිය කිව්වෙ තමන්ට ඒ ලියුම් කීපයක් හරි දෙනවා නම්, ඒව පෙන්වලා, ප්‍රභුවරියගෙන් පවුම් සිය ගණනක් ඉල්ලා ගන්න

පුළුවන් කියලයි. එතකොට තමන්ට උවමනා කරන ඇඳුම් පැළඳුම් ගන්න මුදල් ඉල්ලලා, නැන්දාට නිතර නිතර කරදර කරන්නත් උවමනා නැහැ කියල, ඇය වැඩිදුරටත් කිව්වා. මං දන්නවා ඒ ලියුම් ඔක්කොම තිබුණේ ලියන මේසයේ අල්මාරි කැල්ලෙ යතුරුදමලා. එලිසබත් නෝනා ඒ යතුරු නම් කොහේ හරි හංගලයි තිබුණේ. මේරි මෙනෙවියට ඒවා හොයාගන්න පුළුවන් වුණා කියල මං හිතන්නෙ නෑ"

"එතකොට මේ මරණයට හේතුවෙන්න ඇත්තෙ ඒක කියල ඔබ වගකීමෙන් කියනවද? සමහරවිට මේ ගැන සාක්ෂි දෙන්න ඔබට උසාවියට යන්නත් සිදුවේවි"

"කොහේ යන්න සිදුවුණත් කමක් නෑ. ඇත්ත ඒකයි" ඩෝරා කිව්වා. "මේව කවුරු අහගෙන හිටියත් ලියාගත්තත්, මං ඒ කාරණය නම් කියන්න ඕනමයි. මේ තරම් කෲර ගැහැනු ළමයෙකු ගැන ඔබට හිතන්නවත් පුළුවන්ද? තමන්ගේ දෙමව්පියන් මැරිලා යන එන මං නැතුව අනාථ වුණු වෙලාවෙ, එලිසබත් නෝනා තමයි ලේලිට පිහිට වුණේ. ඊළඟට ඇයට කන්න බොන්න දුන්නේ එලිසබත් නෝනා නේද?"

තමන්ගේ සාක්ෂිය දීලා අවසන් කළ ඩෝරා පැත්තකින් ඉඳගත්තා. ඒ වයින් කරලා තිබුණු යාන්ත්‍රික බෝනික්කකු එහි වයින් ඉවරවෙන තුරු ශබ්ද නගලා, අන්තිමේදී වයින් ඉවරවුණාම නිහඬ වෙනවා වගේ. මේ වෙනකොට මේරි මෙනෙවිය පණපිටින් හිටියාට වඩා, මරණාසන්න තත්ත්වයක හිටි බවයි මට නම් පෙනුණේ. ඇයට වතුර මිශ්‍ර බ්‍රැන්ඩි වීදුරුවක් ලබාදෙන්න කියලා, මං අපේ පොලිස් භටයෙකුට රහසෙන් කිව්වා. ඇය ක්ලාන්ත වෙලා බිම ඇද වැටුණෙ නැත්තෙ ඒ නිසයි.

ඩෝරා ඕ' චොරන් කියූ කතන්දරය ඇත්ත එකක් වෙන්න ඇති. ඒ ගැන කාගෙවත් හිත්වල සැකයක් ඇතිවුණා කියල මං හිතන්නෙ නෑ. මේරි මෙනෙවියගේ මුහුණ බැලීමෙන්ම ඒ කථාවේ ඇත්ත නැත්ත ඕනෑම කෙනෙකුට තහවුරු වුණා.

මීළඟට සාක්ෂි දෙන්න තිබුණේ මට. හෝම්ස් මහත්මයා ඔබතුමා හැමදාමත් මට කියාදීල තිබෙන විධියට, මං ඒ මළසිරුර තිබුණු තැන තියුණු පරීක්ෂාවකට ලක් කළ බව කිවයුතුයි......."

"ඔබ එතැන පරීක්ෂා කළේ කොයි වෙලාවෙද බ්‍රැඩ්ස්ට්‍රීට්?" හෝම්ස් විමසුවේ පොලිස් නිලධරයාගේ කථාවට බාධාකරමිනි.

"හෝම්ස් මහත්මයා. මං ඒ කාරණය ඔබට කිව්වෙ නැහැ නේද?





අපරාධය සිදුවුණේ බදාදා රාත්‍රියේ. එය සොයා ගනු ලැබුවේ එදා රාත්‍රි එකට පමණ. ග්‍රීන්වුඩ් පොලීසියෙන් ස්කොට්ලන්ඩ්යාඩ් එකට විදුලි පුවතක් එවල තිබුණනෙ. ඒ අනුව මං ග්‍රීන්වුඩ් බලා යන්න පිටත්වුණේ ඒ පැත්තට යන පළමුවැනි දුම්රියෙන්; ඒ කියන්නෙ පාන්දර හතරට.

මට කලින් එහි ගිහින් හිටි ප්‍රාදේශීය වෛද්‍යවරයා මළ සිරුර ස්පර්ශ කරල තිබුණා. ඒ ඇගේ මරණය සහතික කරන්න. ඒ ඇරෙන්න කිසිකෙනෙක් මළසිරුරට අත තියලාවත් තිබුණෙ නෑ. මළසිරුර එහා මෙහා කිරීම සහ ඒ අවට දේවල් අතපත ගෑම අපේ පරීක්ෂණවලට බාධාවක් බව, දැන් ප්‍රාදේශීය පොලීසිවල අය දන්නවා. ඒක හොඳට ගියා."

"ඒ මොකද?"

"හෝම්ස් මහත්තයා. මං හිතන්නෙ නෑ ඔබට හිතාගන්න හැකිවේවි කියලා, මට සොයාගැනීමට ලැබුණු පළමුවැනි දේ මොකක්ද කියන එක?"

"මට හිතාගන්න අමාරුයි"

"මට දකින්න ලැබුණු පළමුවැනි දේ තමයි, හරියටම ඇගේ දකුණු අතට යටවී තිබුණු මේ කඩදාසි කැබැල්ල. මට කලින් සාජන්ට් ග්‍රැහැමුත් එය දැක තිබුණා. ඔහු එය මට පෙන්වා දුන්නා. ඇගේ දකුණු අතේ තිබුණා පෑනක්. ඒ ළඟින්ම තිබුණා තීන්ත බෝතලයක්. මං මොහොතකින් මෙය ඔබ අතට දෙන්නම්. මං මෙය මරණ පරීක්ෂකවරයාට ඉදිරිපත් කළා"

"ඔහු මොනවද කළේ?" හෝම්ස් විමසීය.

"ජූරියේ මහත්වරුනි" ඔහු එතැන රැස්ව සිටි ජූරියේ මහත්වරුන් ඇමතුවා. "පොලිස් පරීක්ෂකවරයාට හමුවුණු මියගිය තැනැත්තියගේ අතට යටවී තිබූ ලියුම් කැබැල්ලේ සඳහන් වන්නේ මෙයයි. ඒ අවාසනාවන්ත කාන්තාවට තමා මරාදැමූ තැනැත්තියගේ නම ලියා ලිපිය අවසන් කරන්න ඉඩලැබුණේ නැහැ. එය ලියද්දීම ඇය මියගියා."

මරණ පරීක්ෂකවරයා එහෙම කියන කොටම අහන්න ලැබුණේ යටිගිරියෙන් කළ කෑගැසීමක්. ඒ හිසකෙස් අවුල්වුණු මේරි මෙනෙවියගෙන්. ඇයගෙන් දකින්න ලැබුණේ වියරු වැටුණු පෙනුමක්. ඇය සිහිවිසඟ වෙලා කපා හෙළූ ගසක් වගේ බිම ඇද වැටුණා."

එම කථාන්තරයට නිහඬව කන්දීගෙන සිටි හෝම්ස්, ඔහු අතට ලැබුණු කඩදාසි කැබැල්ල දිග හැරියේය. මම ඔහුගේ උරහිසට ඉහළින් ඒ දෙසට නෙත් යොමු කළෙමි. තරමක් නොපැහැදිලි අකුරෙන් එහි ලියා තිබුණේ මෙවැන්නකි.

"I am dying. My murderess is My niece Mary......."

"මං මැරේවි. මා මරා දැම්මේ මගේ ලේලිය මේරි........"

එය කියවූ හෝම්ස් ලියුම් කැබැල්ල තමා අතේ තබාගෙනම මඳවේලාවක් කල්පනා කළේය. ඔහුට බාධා නොකොට මම ද නිහඬව බලා සිටියෙමි. අන්තිමේදී නිහඬතාවය බිඳින ලද්දේ බ්රැඩ්ස්ට්රීට් විසිනි.

"හෝම්ස් මහත්මයා. මං දන්නවා ඔබට මේ ගැන තවදුරටත් කල්පනා කරන්න උවමනා ඇති. දැන් ගිහිල්ලා මං පසුව එන්නද?"

හාන්සි පුටුවට වී දෙනෙත් පියාගෙන සිටි හෝම්ස් පිබිදුණේ එවිටයි.

"ඔව්. ඔබ ගියාට කමක් නෑ. නමුත් මේ ලියුම් කැබැල්ල තවදුරටත් පරීක්ෂා කිරීම සඳහා මට දීල යන්න පුළුවන්ද? මං දන්නවා මේක ඔබට උසාවියට අත්‍යවශ්‍යයෙන්ම ඉදිරිපත් කිරීමට සිදුවෙන නඩු භාණ්ඩයක්. අද හවස හතරවෙද්දී මං මෙය ස්කොට්ලන්ඩ්යාඩ් වෙත ගෙනැවිත් ඔබට භාරදෙන්නම්?"

"ඔව්. ඔබ එහෙම අදම අරගෙන එනවා නම්, මට පුළුවනි ඒක මෙහේ තියලා යන්න."

එය භාරගත් බවට ලිපියක් ලියා අත්සන් කළ හෝම්ස් එම ලිපිය බ්රැඩ්ස්ට්රීට් අතට භාරදුන්නේය. ඔහු අපෙන් සමුගත්තේ තවත් තොරතුරු රැගෙන දින දෙකකින් පැමිණෙන බව පවසමිනි.

"වොට්සන්. ඔබ දැන් බැහැරක යාමට බලාපොරොත්තු වෙනවාද?" හෝම්ස් විමසුවේය.

"මා කළ යුතු අත්‍යවශ්‍ය වැඩක් නම් නැහැ. නමුත් ඔබට මොකක් හරි අවශ්‍යතාවයක් තියෙනවා නම් මට පුළුවනි........"

"වොට්සන්. කරුණාකර බ්රැඩ්ලිලාට කියන්න මට දුම්කොළ අවුන්ස හතරක් එවන්න කියලා. ඔවුන් දන්නවා මට උවමනා කරන වර්ගය මොකක්ද කියලා"

මගේ මිත්‍රයාගේ අවශ්‍යතාවය මම හඳුනාගතිමි. විටෙක ඔහු මගෙන් මෙවැනි ඉල්ලීමක් කරන්නේ නිදහසේ කල්පනා කිරීමට





ඇවැසි වූ විටය. මා පුවත්පත්වල පිටු පෙරළන ශබ්දයෙන් හෝ කැස්සක හඬින් පවා, ඔහුගේ කල්පනාව බිඳී ගියේය. තවත් විටෙක මා එක් වරම ප්‍රශ්නයක් ඔහු වෙත ඉදිරිපත් කරන්නේ, ඔහු ගැඹුරු කල්පනාවක වැටී සිටින බව අමතක වීමෙනි.

වෛද්‍ය පුස්තකාලය වෙත ආපසු භාරදීමට තිබූ වෛද්‍ය සඟරා කිහිපයක් ද මගේ හිස්වැස්ම ද රැගෙන මම නිවසෙන් පිටවූයෙමි. මා පිටවී යන මොහොතේ වත් මගේ මිත්‍රයා හිස ඔසවා බැලුවේ නැත. බ්රැඩ්ස්ට්රීට් ගෙන ආ ලියුම් කැබැල්ල වෙත ඔහු ඇසිපිය නොහෙළා බලා සිටියේය.

බේකර් වීදිය දිගේ මඳ දුරක් ඉදිරියට ඇවිද ආ මම බ්රැඩ්ලිගේ සාප්පුවට පිවිසී, මගේ මිත්‍රයා වෙත දුම්කොළ අවුන්ස හතරක් යවන මෙන් පවසා, ඊට මුදල් ගෙව්වෙමි. ඉන්පසු මම වෛද්‍ය පුස්තකාලය බලා පිටත්වී ගියෙමි. මා පුස්තකාලයට පිවිසෙන්නට සූදානම් වෙද්දීම එයින් පිටවූයේ මගේ පැරණි මිත්‍රයෙකි. ඒ දොස්තර නෙවිල් මර්ෆිය. අපි සාන්ත බාතොලමිව් රෝහලේ කාලයක් එකට සේවය කළෙමු. විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයෙකු වූ ඔහු ඇඩි, ඕනෑකමකින් වෛද්‍ය වෘත්තියේ යෙදුණේය.

"හලෝ වොට්සන්. කොහොමද සැපසනීප? ඔබ හමුවුණේ බොහොම කාලෙකට පස්සෙ"

"ඒක ඇත්තයි මර්ෆි. ඉතින් කොහොමද තොරතුරු. මං එච්චර උනන්දුවකින් පුස්තකාලයට එන කෙනෙක් නෙමෙයිනෙ. ඒ හින්ද වෙන්නැති කාලෙකින් ඔබව හමු නොවුණේ"

"මං දන්නවා වොට්සන්. ඔබ දැන් ඔබේ මිත්‍රයා ෂර්ලොක් හෝම්ස් එක්ක එකතුවෙලා රහස් පරීක්ෂකයෙක් වෙලා නේ. වෛද්‍ය වෘත්තිය අමතක කරලම දැම්මද?"

"එහෙමමත් නෑ." මම කීවෙමි. "ඔබ තරම් ක්‍රියාශීලී විධියට ශල්‍ය වෛද්‍ය ක්ෂේත්‍රයේ වැඩකටයුතුවල යෙදෙන්නේ නෑ. නමුත් ජීවත්වීමට ආදායමක් උවමනා නිසා වෙදකමත් කරනවා. මගේ ශල්‍යාගාරයක් නෑ. වයස්ගත රෝගීන් කීපදෙනෙකුගේ නිවාසවලට ගිහින් ඔවුනට ප්‍රතිකාර ලබාදෙනවා"

"හරි පිපාසයි. යමු මොනවා හරි බොන්න. ඔබ ඔය සඟරා ටික ආපහු දීලා එනතුරු මම ඉන්නම්"

ඉන්පසු මම මගේ මිත්‍ර මර්ෆි සමග පිකැඩලියේ අවන්හලකට ගියෙමි. පිපාසය සංසිඳවා ගනිමින් අප යෙදුණු සුහද කතාබහට

දෙපැයක පමණ කාලයක් ගතවිය. අන්තිමේදී මා නිවහන බලා ආපසු යනවිට මධ්‍යාහ්නය ද පසු වී තිබිණ.

මා විසිත්ත කාමරයට පිවිසෙන විට හෝම්ස් තවමත් ඔහුගේ සුපුරුදු අසුනේ වැතිර සිටියේය. මුළු නිවසම ඔහුගේ පයිප්පයේ දුමෙන් පිරී තිබිණ. මම බේකර් වීදිය දෙසට තිබූ ජනේලයක් විවෘත කළෙමි. මගේ මිත්‍රයා තම ධ්‍යානයෙන් අවදි වූයේ එවිටයි.

"ආ වොට්සන් මගේ හිතවත් මිත්‍රයා. ඔබ ආවද?"

"ඔව්. මගේ පරණ හිතවතෙක් හමුවුණා. ඒකෙන් හිතුවාට වඩා කාලය ගතවුණා. කොහොමද ඔබ අර ගැටලුව විසඳුවද?"

"ඔබ අහන්නේ මගේ රසායන විද්‍යා පරීක්ෂණය ගැනද?"

"නැහැ නැහැ. මං ඇහුවේ බ්රැඩ්ස්ට්‍රීට් අද උදේ අපට අරගෙන ආව ගැටලුව ගැන"

"වොට්සන් ඔබට කවුද කිව්වේ එතැන ගැටලුවක් තියෙනවා කියල?"

"මෙහෙමයි හෝම්ස්. ඔබ බ්රැඩ්ලිලාගේ පයිප්ප දුම්කොළ අවුන්ස හතරක් ගෙන්වා ගත්ත එකෙන්ම, ඒක තේරුම් ගන්න මට පුළුවනි"

"ඔබ නම් හැබෑ දක්ෂයෙක් වොට්සන්. ඒ කාරණය මට සම්පූර්ණයෙන්ම අමතක වුණා."

"ඒ කියන්නේ එතන ගැටලුවක් තියෙනවා?"

"ගැටලුවක් තියෙනවා වෙන්නත් පුළුවනි. නමුත් මේ වෙලාවේ නම් එතැන තියෙන්නේ නොපැහැදිලි බවක්."

"ඉතින් මොකක් කරන්නද ඔබ තීරණය කළේ?"

"දහවල් කෑමෙන් පස්සෙ අපි යමු ග්‍රීන්වුඩ් වලට" හෝම්ස් කීය. "අපට දවල් කෑම ඉක්මනට උවමනා බව මං හඩ්සන් මහත්මියට කිව්වා. අපි දුම්රියපොළට යන්න කලින්, මේ ලියුම් කැල්ලේ ඡායාරූපයක් ගත යුතුයි. ඊට පස්සේ ස්කොට්ලන්ඩ්යාඩ් වෙත ගිහින්, ලියුම් කැල්ල බ්රැඩ්ස්ට්‍රීට්ට ආපසු භාරදෙන්න ඕන"

එම කටයුතු නිමකිරීමෙන් පසු අපි දුම්රියෙන් ග්‍රීන්වුඩ් බලා පිටත් වී ගියෙමු. දුම්රිය මැදිරිය තුළදීද හෝම්ස් කථා කළේ වචන ස්වල්පයක් පමණි. ඔහු දිගින් දිගටම කල්පනාවට වැටී සිටියේය.

"ඔබේ මේ ගමනේ අරමුණ මොකක්ද හෝම්ස්?" මා විමසුවේ ඔහුගේ නිහඬ බව තව තවත් ඉවසීමට නොහැකි වූ තැනය.

"මට සමාවෙන්න වොට්සන්. මේ ගමනේ අරමුණු ගැන කිසිම දෙයක් ඔබට දැනුම් දෙන්න බැරිවුණු බව මට අමතක වුණා.





මේකෙදි මගේ අරමුණු දෙකක් හෝ තුනක් තියෙනවා. එකක් දැනට පොලිස් භාරයේ පසුවන මේරි හාපර් මෙනෙවිය හමුවීම. අනෙක් එක අපරාධය සිදුවුණු ස්ථානය පරීක්ෂා කර බැලීම. තවත් එකක් මේ සිද්ධියට සම්බන්ධ අය හමුවෙලා කරුණු විමසීම"

ග්‍රීන්වුඩ් දුම්රියපොළ ඉතා කුඩා දුම්රිය ස්ථානයක් විය. තමා කවුරුන්ද යන්න හඳුන්වා දුන් හෝම්ස් මුලින්ම තම ප්‍රශ්න ඉදිරිපත් කළේ දුම්රිය ස්ථානාධිපතිවරයා වෙතය.

"මහත්මයා. ඔය කාරණය ගැන පොලිසියේ මහත්වරුත් මගෙන් ප්‍රශ්න කළා" ජෝන්ස් නම් වූ ඔහු කීය. "මං මේ දුම්රියපොළේ සේවයට ඇවිත් අවුරුදු විස්සකට වැඩියි. ඔය වගේ භයානක සිදුවීමක් මේ පළාතේ, මතක ඇති කාලෙක සිදුවෙලා නෑ. මමත් මේ පළාතෙම උපන් මෙහේම හැදුණු වැඩුණු කෙනෙක්. ඔය හාපර්ලා පස්සෙ කාලෙක මෙහේ පදිංචියට ආ අයනේ. එලිසබත් නෝනාත්, මේරි මෙනෙවියත්, ඩෝරාත් තුන්දෙනාම මං අඳුනනවා. මේරි මෙනෙවිය ඇරෙන්න අනික් දෙන්නා නම්, අපට දකින්න ලැබෙන්නෙත් බොහොම කලාතුරකින්. ඒ මොකද එයාල ගෙවල් ඇතුළටම වෙලා ඉන්න අය නේ. මේරි මෙනෙවිය නම් සතියකට දෙවරක් තුන්වරක් ලන්ඩන් දුම්රියේ ගමන් කරනවා. බොහොම වෙලාවට ඇය යන්නේ හවස් වරුවේ. ඒ ගිහින් රෑට එන අන්තිම දුම්රියේ එනවා. ඉඳහිට උදේ නවයයි කාලෙ දුම්රියෙන් ඇය යනවා.

මේ කියන දවසෙද? එදා ඇය දවල් දොළහයි තිස්පහේ දුම්රියේ පිටත්ව ගිය බව මට හොඳට මතකයි. ඒ මොකද ඇය දුම්රිය පොළට එදා ආවේ හුඟක් කල් ඇතුව. ඊළඟට වේදිකාවේ ඉහළ පහළ ඇවිදිමින් හිටියා. වෙනදාට වේදිකාවේ කෙළවර පුවත්පත් විකුණන වෙළෙන්දා එදා ආවේ නෑ. ඇය රේල්පාරෙන් එහා පැත්තට ගිහිං, එහි තිබෙන කුඩා වෙළෙඳ සලෙන් පුවත්පතක් අරගෙන ආවා. ඊළඟට ඇය රේල්පාර හරහා ඇවිදගෙන ඇවිත්, ඉතාම අපහසුවෙන් වේදිකාවට නැඟුණු ආකාරය මං බලාගෙන හිටියේ. අලුත් මෝස්තරයේ අඩි උස සපත්තුත් දමාගෙන ඇය වේදිකාවට නැඟුණේ ඒකෙ උසම තැනකින්. තව ටිකෙන් ඇය රේල්පාරට ඇද වැටෙනවා. ඊළඟට ඇය කාන්තා විවේකාගාරයට වෙලා දුම්රිය එනතුරු පුවත්පත කියෙව්වා.

ඊළඟට ඇ ආපසු ආව වෙලාවද? ඒ ගැන නම් මට මොකුත් කියන්න බැහැ මහත්තයා. ඇය ආපසු ආව බවක් මං දුටුවෙම නැහැ.

ඇය කියන්නේ, ඊ එකට විතර මෙහේට ළඟාවෙන කෝච්චියේ ආව කියලනේ. ඒක හුඟක් සෙනඟ අරගෙන එන එකක්. ඔවුන් විශාල ගණනක් මෙහේදි දුම්රියෙන් බැහැලා යනවා. ඒ අතර ඇය සිටියාද නැද්ද කියන එක මට හරියටම කියන්න බෑ. ඇය ඒ අතර හිටියාද කියල මගේ පෝටර් දැකල තිබුණෙත් නෑ"

අපි ඔහුට ස්තුතිකොට එතැනින් පිටත්ව් ආවෙමු.

"වොට්සන්. අපි මීළඟට අපරාධය සිදුවුණු හාපර් නිවසට යමු."

දුම්රියපොළේ සිට සැතපුම් කාලක දුරක් ගමන් කළ පසු "සනි කොටේජ්" නම් වූ එම නිවස වෙත ළඟාවීමට අපිට හැකිවිය. ගෙදර සේවිකාව වූ ඩෝරා ඕ වොරන්, අසල්වැසි නිවසක තාවකාලික ලැගුම් ගෙන සිටින බැව් අපට දැනගන්නට ලැබිණ. එහි රැඳී සිටි පොලිස් භටයෝ දෙදෙනෙක් තවමත් නිවස මුර කළහ.

ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ බ්‍රැඩ්ස්ට්‍රීට් දුන් හඳුන්වාදීමේ ලිපිය හෝම්ස් එතැන සිටි පොලිස් භටයෙකු වෙත භාරදුන්නේය.

"ආ ඔබද ෂර්ලොක් හෝම්ස් මහත්තයා?" පොලිස් නිලධරයා විමසුවේය. "ඔබට හැකි උදව්වක් කරන්න කියා අපට ලන්ඩනයෙන් උපදෙස් ලැබුණා. ග්‍රැහැම් සාජන්ට් මහත්මයා ආවේ ඒ සඳහා. නිවස ඇතුළට යන්න මහත්වරුනි. ඔහු ඉන්නේ ඔබ එන තුරු මග බලාගෙන"

අක්කර කාලක පමණ තැනිතලා බිමක් මැද ඉදිකර තිබූ "සනී කොටේජ්" නිවස, ප්‍රමාණයෙන් කුඩා එකක් විය. එය වටා ඉඩම මල් වවා අලංකාරව තබාගත් තැනක් බැව් බැලූ බැල්මටම පෙනිණ. අපේ පියවර හඬ අසන්නට ලැබී දෝ, නිවස තුළ හිඳගෙන සිටි පොලිස් නිලධරයා එළියට පැමිණියේය.

"ආයුබෝවන් හෝම්ස් මහත්මයා. මම සාජන්ට් ග්‍රැහැම්. ඔබ මෙහි පැමිණීම ගැන මං ඔබට බෙහෙවින් කෘතඥ වෙනවා. මෙතැන සංකීර්ණ ගැටලුවක් නැති බව ඇත්තයි. ඒ වුණත් අපට නොපෙනී ගිය යමක් ඇත්නම්, ඒක හරි හොයල දෙන්නට ඔබට පුළුවන් නම් ඒක ලොකු දෙයක්. ඔබේ දක්ෂකම් ගැන අපි අහල තියෙනවා. ඒ නැතත් ඔබට සම්පූර්ණ සහයෝගය දෙන්න කියලා බ්‍රැඩ්ස්ට්‍රීට් මහත්මයා විදුලි පුවතක් එවා තිබුණා. මොනවද ඔබට පරීක්ෂා කරන්න උවමනා?"

"ප්‍රධාන වශයෙන් නම් මට පරීක්ෂා කරන්න උවමනා, අපරාධය සිදුවුණු කාමරය සහ පොදුවේ මෙම නිවස.





"හොඳයි මහත්මයා." ග්‍රැහැම් කීය. "මං අහල තියෙනවා ඔබ අනුන්ගේ බාධාකිරීම් වලින් මිදී, පරීක්ෂණ කටයුතු තනිවම සිද්දකරන්න කැමතියි කියල." එසේ කී ඔහු දොර විවෘත කොට අපට විසිත්ත කාමරය තුළට යාමට ඉඩ සැලසීය.

"මං එළියෙන් ඉන්නම් මහත්මයා. ඔබට මාව උවමනා නම් කතාකරන්න" එසේ කී ඔහු එළියට ගියේ ඉදිරි දොර වසා දමමිනි.

"අපේ පරීක්ෂණ විධි ගැන හොඳ වැටහීමක් තියෙන තරුණයෙක්" හෝම්ස් කීවේ තම කබා සාක්කුවෙන් උත්තල කාචය එළියට ගනිමිනි.

"එලිසබත් හාපර්ගේ ලියන මේසය මේක වෙන්නැති" මගේ මිත්‍රයා තමාටම කියාගත්තේය. "එක පැත්තක ලාච්චු තුනක්. අනික් පැත්තේ යතුරු දැමිය හැකි අල්මාරියක්. දැනට එය විවෘතව තියෙනවා. නමුත් අපි පළමුව බලන්න ඕන මේසයේ මතුපිට ගැන"

කථාව නැවැත්වූ ඔහු කාචය අතට ගෙන මේසය මතුපිට සෑම තැනක්ම පරීක්ෂාවට ලක් කළේය. තම බලාපොරොත්තු කඩවූ බවට ශබ්ද කිහිපවරක්ම ඔහුගේ මුවෙන් නිකුත් විය. "මේසෙ සෝදා දමලා" ඔහු මා අමතමින් කීය. "එක අතකින් දොස් කියන්නත් බෑ. මේක උඩ කැටිගැසුණු ලේ හුඟක් තියෙන්න ඇති. එදාම එන්න මට ඉඩක් සැලසුණා නම්........ අමතර මොනවා හරි හොයාගන්න තිබුණා."

අනතුරුව ඔහු මේස ලාච්චු සහ අල්මාරි කොටස ද පරීක්ෂණයට ලක් කළේය. ලාච්චුවක තිබූ ලොකු පොත් කිහිපයක් පමණක් ඔහු පරෙස්සමින් එළියට ගෙන මේසය මත තැබුවේය.

"මේක ගෙදර වියදම් ගැන සටහන් තබා ගත් පොතක්." හෝම්ස් කීය. "මේ තියෙන්නේ එක් එක් දිනයේ ඇය කෑම ද්‍රව්‍ය මිලට ගැනීමට වියදම් කළ මුදල්. බලන්න වොට්සන් ඇය කොයිතරම් ක්‍රමානුකූලව, හැමදාමත් හැමදෙයක්ම ලියා තිබෙනවද කියල.

| | | | |
|---|---|---|---|
| | තක්කාලි රාත්තල් 1 | ........... | පැන්ස 3 යි |
| ඔක් 14 වැනිදා | ලීක්ස් අවුන්ස 4 | ........... | පැන්ස 2 යි |
| | හරක් මස් රා. 1 | ........... | සිලිං 2 1/2 යි |
| | කෝපි රා. 1/2 | ........... | සිලිං 1 යි |

ඊළඟටත් ඇය ලියා තිබෙනවා ඊළඟ දවස සඳහා. ඇගේ අත්අකුරු නම් ඉතා අලංකාරයි කියල මට කියන්න බෑ." එසේ කියූ හෝම්ස් ටේප් පටිය සාක්කුවෙන් ගෙන පොතේ ප්‍රමාණය ද, අකුරු පේළිවල දිග පළල ද මැන, තම පොතේ සටහන් කරගත්තේය.

"ඒ පළමුවැනි පොත. තවත් පොතක තියෙනවා ඇය තම ලේලියට දුන් මුදල් ගැන සටහනක්" කියූ හෝම්ස් දෙවැනි පොත ද තම පරීක්ෂාවට ලක් කළේය.

"විලාසිතා ප්‍රිය කරන ගෑනු ළමයෙකුට, මේ මුදල් ප්‍රමාණවලින් එච්චර දෙයක් කරන්න හැකි වෙන්න නෑ." මෙසේ කියූ හෝම්ස් යමක් සොයන්නාක් මෙන් එම පොතේ පිටු අවසාන වන තෙක් හොඳින් පරීක්ෂා කරමින් දිගටම පෙරළාගෙන ගියේය. ඒ අතර යම් යම් කරුණු සටහන් කරගන්නා ආකාරය මම දුටුවෙමි. තුන්වැනි සහ හතරවැනි පොත්ද පෙරළා බැලූ ඔහුට සෙවූ යමක් හමු නොවුණි. බලාපොරොත්තු කඩවූ ශබ්දයක් ඔහුගේ මුවෙන් පිටවිය. හෝම්ස් දෙවැනි ලාච්චුව විවෘත කළත් එහි තිබුණේ, නොයෙක් ප්‍රමාණවල ලියුම් කවර හත අටක්, මුද්දර සහ ලියුම් ලිවීමට ගන්නා ක්‍රීම් වෝව් කඩදාසි දුසිමක මිටියක් පමණි. ඔහු එය අතට ගෙන ගණන් කළේය.

"මෙතැන එක කඩදාසියක් අඩුයි වගේ. ඇය ඒකෙන් කාටහරි ලියුමක් ලියුවා වෙන්නත් පුළුවනි. නමුත් අපි තවත් ටිකක් බලමු"

හෝම්ස් තුන්වැනි එනම් පහතින්ම වූ ලාච්චුවද විවෘත කළේය. දක්නට ලැබුණු දෙයින් ඔහුගේ මුවින් සිවුරුහන් හඬක් නිකුත්විය.

"ඔහෝ! මේ තියෙනනේ මං හෙව්ව දේ" කී මගේ මිත්‍රයා ලාච්චුව තුළින් එළියට ගත්තේ කලින් සඳහන් කළ මිටියෙන් අඩුවී තිබූ, ක්‍රීම් වෝව් වර්ගයේ කඩදාසියයි. එය බොහෝ දුරට පොඩිවී තිබූ අතර එක් කෙළවරකින් කැබැල්ලක් ඉරී ගොස් තිබිණ.

හෝම්ස් එම කඩදාසිය අතට ගත්තේ එහි එක් කෙළවරකින් පමණක් අල්ලා ගනිමිනි. මුලින් තම කාචය මගින් එය දැඩි සෝදිසියකට ලක් කළ ඔහු, එය ආලෝකයට අල්ලා දිය සලකුණු පරීක්ෂා කළේය. අනතුරුව කඩදාසිය අනෙක් පැත්ත හරවා එහි රූල් නොමැති පැත්තද පරීක්ෂා කළේය.

ඉන්පසු හෝම්ස් තම අවධානය යොමු කළේ, මේසයේ එක් කෙළවරකට වන්නට තිබූ තීන්ත කුප්පිය සහ කටු පෑන වෙතය. තම සටහන් පොත සාක්කුවෙන් ගත් ඔහු තීන්ත සහ කටු පෑන





යොදාගෙන, සටහන් පොතේ කුරුටු ගෑම් කිහිපයක් කළ අයුරු මම දුටුවෙමි.

"වොට්සන් එළියට ගිහින් සාජන්ට් ග්‍රැහැම් කැඳවාගෙන එන්න"

ඉස්තෝප්පුවේ හාන්සි පුටුවක වැතිර සිටි පොලිස් නිලධරයාට තදින්ම නින්ද ගොස් තිබිණි. ඔහුගේ අතින් අල්ලා සොලවා මම ඔහු අවදි කළෙමි.

"සමාවෙන්න වොට්සන් මහත්මයා. ඊයෙ රෑත් මිනීමැරුමක් පරීක්ෂා කරන්න ගිහිං මට නින්දක් නෑ. ඒ හින්දා මේකෙ වැතිරුණු ගමන් මට නින්ද ගියා. ඇයි හෝම්ස් මහත්තය මට එන්න කිව්වද?"

"ඔබට කරදර කරන්න සිදුවීම ගැන මට කනගාටුයි සාජන්ට්" හෝම්ස් කීවේ දෙනෙත් පිසදාමින් නිවස තුළට ආ නිලධරයාටයි.

"මෙතැන තිබෙන දේවල් කිහිපයක් වැඩිදුර පරීක්ෂාව සඳහා ලන්ඩනයට ගෙන යන්න මට උවමනා වෙලා තියෙනවා. ඒ තමයි එලිසබත් හාපර් මහත්මිය ගෙදර වියදම් ආදිය ලියාගත් සටහන් පොත් දෙකක්, ඇගේ ලියුම් ලියන කඩදාසි වල ඉරීගිය එක් කොළයක් සහ ඇය සතුව තිබූ පෑන්ස භාගයේ සහ පෑන්ස එකේ මුද්දර විස්සක් පමණ. ඒවා අස්ථානගතවීම වැළැක්වීමට, ඇය සෑම මුද්දරයක්ම එක් කෙළවරකින්, මේ තීන්ත පොවන කඩදාසියට අලවා තිබෙනවා. මුද්දර ටික ඒ විදියටම ගෙනයන එක මටත් පහසුයි. දැන් මං මේ සියල්ල ඇය සතුව තිබූ පාවිච්චි කළ ලොකු ලියුම් කවරයකට දමනවා. මේ හැමදෙයක්ම දින තුනකින් ඔබට ආපසු ලබාදෙන්න මට හැකිවේවි.

මේ විසිත්ත කාමරයේ මට කරන්න තිබූ පරීක්ෂාව එපමණයි. දැන් මං කැමතියි මේරි හාපර් මෙනෙවියගේ සහ අනෙක් දෙදෙනාගේ කාමර පරීක්ෂා කර බලන්න."

මේරි හාපර් මෙනෙවියගේ හා ඇගේ නැන්දාගේ ඇඳුම් අල්මාරි විවෘත කොට ඒවායේ ලාච්චු තුළට එක් බැල්මක් යොමු කළත්, ඒවා දැඩි පරීක්ෂාවකට ලක්කිරීමකට හෝම්ස්ට උවමනා වූයේ නැත. ඩෝරා ඕ වොරන් සේවිකාවට වෙන්වූ කුඩා කාමරය තුළ ඇගේ ඇඳුම් ඇමූ ට්‍රන්ක පෙට්ටියක් සහ පෞද්ගලික දේ තබා තිබූ රාක්කයක් විය. එම කාමරයට පිවිසුණත් ඔහු ඉක්මනින් ආපසු ආවේ තමාට ඒවා පරීක්ෂා කර බැලීමට අවශ්‍ය නොවන බව කියමිනි.

"තවත් ප්‍රමාද නොවී අපි යන්න ඕන මේරි හාපර් මෙනෙවිය හමුවෙන්න" හෝම්ස් කීවේ සාජන්ට් ග්‍රැහැම්ටය. "ඒ කතාබහ පැයකින් දෙකකින් අවසන් කරගත්තොත් හොඳයි. හවස හයයි හතළිස්තුනට ලන්ඩනය බලායන ශීඝ්‍රගාමී දුම්රියක් තියෙන බව ස්ථානාධිපතිවරයා මා සමග කිව්වා."

කුලීරියක් කැඳවාගෙන අපි ග්‍රීන්වුඩ් පොලිස් ස්ථානය වෙත පිටත්වී ගියෙමු.

"හාපර් මෙනෙවිය" හෝම්ස් කීවේ රිමාන්ඩ් භාරයේ සිටි තරුණිය අමතමිනි. "මං පෞද්ගලික රහස් පරීක්ෂකයෙක්. මං පෙනී ඉන්නේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය වෙනුවෙන් නොවෙයි. සත්‍යය කුමක්ද කියලා හෙළිකර දෙන එකයි මගේ වගකීම. කොහොම නමුත්.......; මං මුලින්ම දැනගන්න කැමතියි ඔබට නීතිඥයෙකුගේ සහාය ලැබිල තියෙනවාද කියලා?"

"ඔව් මහත්මයා" ඇය කීවාය. "මං මුහුණ දී සිටින අනතුරුදායක තත්ත්වය ගැන ඔහු මට තේරුම් කරල දුන්නා. අනික් අයගේ ආත්ම ගෞරවය ගැන හිතලා මං නොකියූ, හෙළි නොකළ දේවල්, දැන් ඉතින් හෙළිකළ යුතුයි කියලයි ඔහු කියන්නේ. ඒවා සඟවා ගෙන සිටීමෙන් මට වෙන්නේ අයහපතක් මිස යහපතක් නෙමෙයි. ඒ හින්දා මට කියන්න තියෙන හැම දෙයක්ම, මං ඔබට කියන්නම්. ඔබට අහන්න ප්‍රශ්න තියෙනවා නම් ඕනෑ එකක් අහන්න. මං දන්න තරමින් ඒවාට පිළිතුරු දෙන්නම්"

"ඔබ එවැනි තීරණයකට ආව එක සතුටට කරුණක්." හෝම්ස් කීය. "මෙම කථාව ඔබට කැමැති තැනකින් පටන් අරගෙන කියන්න. මට ප්‍රශ්න තියෙනවා නම් මං සුදුසු අවස්ථාව ආවාම ඒවා ඉදිරිපත් කරන්නම්."

සිහින් උස සිරුරක් තිබූ මේරි හාපර් ගේ මුහුණ අතිශයින්ම රූමත් එකක් බැව් මම දුටුවෙමි. එහෙත් මේ වේලාවේ නම් ඇය වෙතින් දිස්වූයේ විඩාපත් දුක්මුසු පෙනුමකි. හරිහැටි නින්දක් නොලැබීම නිසා ඇගේ දෙනෙත්වල තිබූයේ, මලානික මෙන්ම වේදනාත්මක බවකි. ඇය කථා කළේ ඉතා අපහසුවෙන් බැව් මම තේරුම් ගතිමි.

"මා සමග විවාහ වීමට පොරොන්දු වී ඉන්න මහත්මයා කවුද කියන එක, මං ඔබට හෙළි කරන්නෙ නෑ" ඇය කීවාය. "එය දැනගැනීමෙන් ඔබ කාටවත් ප්‍රයෝජනයක් නෑ. මං එය හෙළි නොකරන්නේ ඇයි කියන එක තේරුම් ගන්න ඔබට පුළුවන්





ඇති. මගේ අවාසනාව නිසා යම් විදියකින් මට මරණ දඬුවම හෝ සිරදඬුවමක් ලැබෙන්න පුළුවනි. එහෙම වුණොත් මගේ පෙම්වතාගේ නමට කැළලක් ඇතිවීම වළක්වන්නයි මං එය හෙළි නොකරන්නේ.

ලන්ඩනයේ ක්‍රවුන් නෘත්‍යශාලාවේ පැවැත්වුණු සංගීත ප්‍රසංගයක් නරඹන්න, ඔහු මට ඇරයුම් කරලා හුඟක් දවස්. ඒකට නියමිත දිනය හා වේලාව වුණේ මේ කියන බදාදා සවස පහට. මම මේ ගැන මගේ නැන්දාට කියලා අවසර ලබාගත්තේ දින ගණනකට කලින්. මං ඊට යන්නේ කවුරුන් සමගද කියන කරුණ ඇයට කිව්වේ නෑ. මං බලාපොරොත්තු වුණේ දිවා ආහාරය ඔහු සමග ගන්නයි. ඒ නිසා මං කල්තබා ග්‍රීන්වුඩ් වලින් පිටත් වී ගියා. ඊට කලින් මං දුම්රියපොළේදී "ඊව්නිං ටෙලිග්‍රාෆ්" නම් සවස පුවත්පත මිලදී ගත්තා. ඔබ දන්නවා මෙම පත්‍රය කලා ලෝකයේ ප්‍රවෘත්ති විස්තර සහිතව වාර්තා කරන එකක් බව. මං හිතුවේ අප යාමට නියමිතව තිබූ බෙව්ඇස්ඇානි ගේ සංගීත ප්‍රසංගය ගැන තොරතුරු පත්‍රයේ තියේවි කියලයි. ඒ ගැන එතරම් විශේෂ තොරතුරක් තිබුණේ නැහැ. නමුත් මගේ අවධානය යොමුවූ තවත් පුවතක් එහි පළවී තිබුණා.

ඒ තමයි මා දන්නා හඳුනන තැනැත්තියක ගැන පුවතක්. බ්ලැක්පූල්හි "ෆර්න්බුෂ්" නිවසේ නිවාඩුවක් ගතකිරීමට ගිය සර් රේමන්ඩ් බ්ලැක්වෙල් සහ ඔහුගේ බිරිඳ - බ්ලැක්වෙල් ආර්යාව ආපසු ලන්ඩනයේ තමන්ගේ නිවසට පැමිණි බව. ඒ බ්ලූම්ස්බෙරි හි බාක්ලේ පෙදෙසේ "සිල්වට්‍රී" නිවසට. මේ බ්ලැක්වෙල් ආර්යාව තමා, මගේ නැන්දාට කුඩා දීමනාවක් ලබා දුන් ප්‍රභුවරිය. වේදිකාවේ අප දෙදෙනා එකට රඟපෑවා. එකල ඇය විවාහ වෙලා නෑ. ඒ කාලයේ ඇගේ නම සූසාන් මොන්රෝ බව ඔබ දන්නවා ඇති. අපි ඇයව හැඳින්වූයේ සූසී කියලයි. කොහොම නමුත් ඇය ගැන සිතන්න මට අවකාශයක් ලැබුණෙ නෑ. ඒ වෙලාවෙ මා යායුතු දුම්රිය, දුම්රියපොළට ළඟාවුණා"

කතාව මොහොතකට නැවැත්වූ මේරි මෙනෙවිය අසල තිබූ ඩිකැන්ටරයකින් වීදුරුවකට වතුර වත්කොට එය පානය කළාය. ඇය කථාව යළි ඇරඹුවේ මිනිත්තු දෙක තුනකට පසුවය.

"අප දෙදෙනා හමුවීමට යොදාගත් තැනට මං නියමිත වෙලාවට ගියා. එම වෙලාව පහුවෙලා පැයකට කිට්ටු කාලයක් මං බලාගෙන හිටියා. නමුත් ඔහු ආවේ නැහැ. කුසගින්න ඉවසීමට නොහැකි තැන

මම අසල අවන්හලකට ගිහින්, දවල් ආහාරයත් ගත්තා. අන්තිමේ දී ඔහු එවූ පණිවුඩකරුවෙක් ලියුම් කැල්ලක් රැගෙන එහි ආවා. මගේ හිතවතා හදිසියේම බෝවෙන රෝගයකට ගොදුරුවී සිටින නිසා, ඔහු නොපැමිණෙන බව දන්වා තිබුණා. අඟහරුවාදා ඔහු ලියූ ලිපියක් බදාදා උදේ මා වෙත ලැබුණා. ඔහු දින දෙකක් අධික උණෙන් පෙළුණු බවත් දැන් සුවය ලබමින් සිටින නිසා, බදාදාට මා හමුවීමට බලාපොරොත්තු වෙන බවත් එහි සඳහන් කර තිබුණා. දැන් ඉතින් මට, ඉතිරිව තිබූ එකම විකල්පය ආපසු ගෙදර යාමයි. පැය ගණනක් රස්තියාදු වී කලකිරීමට පත්ව සිටි මට, ආපහු ගෙදර යාමට හිතුණෙ නෑ. කාලයකින් හමුනොවුණු මිතුරියක හමුවිය හැකි නම් කොයිතරම් අපූරුද කියා මට හිතුණා. කාව හමුවෙන්නද යන්නේ කියා හිත හිත ඉන්න කොට, එක්වරම මට මතක් වුණේ සුසී මොන්රෝ. ඒ කියන්නේ බ්ලැක්වෙල් ආර්යාව. කල්තබා කිසිම දැනුම් දීමක් නොකරයි මට යන්නට සිදුවෙන්නේ. ඒ නිසා රාත්‍රී ආහාරය අවන්හලකින් ගෙන මිතුරිය හමුවීමට යාම වඩා සුදුසුයි කියලයි මට හිතුණේ.

මං කුලීරියකින් බ්ලූම්ස්බරියට ගියා. ග්‍රේට් ඕමොන්ඩ් වීදියේ අවන්හලකින් මං රාත්‍රී ආහාරය ගන්නා විට රෑ හත වුණෙත් නෑ. ඊළඟට බාක්ලේ පෙදෙසේ සිල්වට්‍රී මන්දිරයට ගියා. ආර්යාව නිවසේ සිටින බවත් රාත්‍රී ආහාරය ගනිමින් සිටින බවත් සේවිකාව කිව්වා. ඒ අනුව මගේ මිතුරිය එනතුරු සෑහෙන වෙලාවක් මට බලාගෙන ඉන්න සිදුවුණා.

ඇය විසිත්ත කාමරයට එද්දි රෑ අටටත් කිට්ටුයි. ඇය ඉතා සුහදව මාව පිළිගත්තා. ඊළඟට ඉස්සර කාලේ දේවල් සහ අපේ මිතුරු මිතුරියන් ගැන නොයෙක් දේ කතාබහ කළා. මගේ බලාපොරොත්තුව තිබුණේ, හුඟක් රෑ වෙන්න කලින් එහෙන් පිටවෙලා එන්නයි. ඒ කියන්නේ සෙන්ට් පැන්ක්‍රාස් දුම්රිය පොළෙන් රෑ එකොළහට දුම්රියක් තියෙනවා. මං බලාපොරොත්තු වුණේ ඒක අල්ලාගන්නයි.

නමුත් දිගින් දිගටම ඇය මා එක්ක කථා කළා. අප හමුවුණේ හුඟක් දවසකින් නිසා කතාකරන්නත් බොහෝ දේවල් තිබුණා. කොහොම හරි මං කලින් සඳහන් කළ රෑ එකොළහේ දුම්රියත් මට වැරදුණා. ඇයගේ "සිල්වට්‍රී" නිවසෙන් මං පිටවෙලා එද්දී වෙලාව එකොළහට පහයි. ඉතින් මං දුම්රියපොළට එද්දී දුම්රිය ගිහින්. ඊළඟට තිබුණේ රෑ දොළහයි විස්සට සෙන්ට් පැන්ක්‍රාස් වෙත





ළඟාවෙන දුම්රිය. ඒක එනතුරු මට සෑහෙන වෙලාවක් බලාගෙන ඉන්න සිදුවුණා. මං ඇයගේ ගෙදරින් පිටවුණු වෙලාව ගැන සුසී මා වෙනුවෙන් සාක්ෂි දේවි. ඒ ගැන මට සැකයක් නෑ"

"හාපර් මෙනෙවිය" හෝම්ස් කීය. "ග්‍රීන්වුඩ් දුම්රියපොළේ සිට ඔබේ නිවසට යාර හාරසියයක පමණ දුරක් තිබෙනවා. මේ පාර දෙපැත්තේ ඉඳහිට තැන් තැන්වල ගෙවල් තිබෙන බව ඇත්තයි. නමුත් ඒවා තියෙන්නේ පාර අයිනෙම නෙමෙයි; මඳක් ඇතුළට වෙන්න. මේ පාරේ ගෑස් ලාම්පු තියෙන්නේ යාර පනහෙන් පනහට පමණයි. ඒ කියන්නේ සඳ එළිය නොමැති රාත්‍රීවලදි මේ පාර සෑහෙන තරම් අන්ධකාරයි. නමුත් ඔබ කිසිම බයක් සැකක් නැතුව මහරෑ එකට, මේ පාරේ තනියම යනව එනවා?"

"ඔව් මහත්මයා. සතියකට වරක් හෝ දෙවරක් මං ලන්ඩනයේ සිට එන්නේ රාත්‍රී එකට, ළඟාවෙන අන්තිම දුම්රියේ. ඒක විශේෂයෙන්ම තියෙන්නේ, නාට්‍ය හා සංගීත ප්‍රසංග නරඹා ගෙවල්වලට යන අයට."

"හොඳයි. බදාදා ඔබ නිවස වෙත එද්දි මගදී ඔබට කවුද හමුවුණේ?"

"කිසිකෙනෙකු හමුවුණේ නෑ"

"රාත්‍රී මුර සංචාරයේ යෙදෙන පොලිස් භටයෙක් වත්?"

"ඒත් නෑ මහත්මයා. සමහරදාට එවැනි පොලිස් භටයන් හමුවෙන බව ඇත්තයි. නමුත් මේ කියන දවසේ රෑ කිසිකෙනෙකු හමුවුණේ නෑ"

"ඔබේ පවුල සමග අමනාප කවුරු හරි ඉන්නවද? ඒ කියන්නේ විශේෂයෙන්ම ඔබේ නැන්දා සමග අමනාප අය?"

"එහෙම කෙනෙකු ගැන මට හිතාගන්න අමාරුයි. නැන්දා කිසිකෙනෙකු සමග ආශ්‍රයට ගියේ නෑ. ඒ නිසා සමීප යහළුවනුත් නෑ. සතුරනුත් නෑ."

"ආහාර ද්‍රව්‍ය අලෙවිකිරීමට ගෙදරට ආ වෙළෙන්දෙකු හෝ, නිවසේ අලුත්වැඩියා කටයුත්තකට ආ කාර්මිකයෙකු සමග, කවදාවත් ප්‍රශ්න ඇතිවුණාද?"

"වෙළෙන්දෙකු සමග නම් කවදාවත් ප්‍රශ්නයක් ඇතිවුණේ නැහැ. ඒක මට විශ්වාසයි. ඔබ ඇහූ නිසයි මේ කරුණ මට මතක් වුණේ. අපේ නිවසේ එක් පැත්තක තීන්ත ගෑමට ආ පින්තාරු කරුවෙකු සමග නම්, වරක් ප්‍රශ්නයක් ඇතිවුණා. ඒ මාස පහකට හෝ හයකට කලින් විය යුතුයි"

"මොකක්ද ඒ ප්‍රශ්නය? කොහොමද ඒක විසඳුණේ...... අවසන් වුණේ?"

"මෙහෙමයි. ඔහු තීන්ත ගෑවේ කොන්ත්‍රාත් ක්‍රමයට. එක බිත්තියක් ගාන්න දින තුනක් ගතවෙන බව කියලා බිත්ති හතර ගාන්න පවුම් භාගයක් ඉල්ලුවා. ඒක ලොකු මුදලක්. නමුත් තීන්ත උකුවට ගෑවොත් කාලයක් පවතින නිසා මං නැන්දාව ඒකට කැමති කරගත්තේ බොහෝම අමාරුවෙන්. නමුත් පින්තාරු කරු මොකද කළේ. දින දොළහක් ගතවෙනවා කියූ වැඩේ දින පහකින් අවසන් කළා. ඔහු එහෙම කළේ තීන්තවලට ජලය විශාල ප්‍රමාණයක් කලවම් කිරීමෙන්. වැඩේ සිදුවුණේ ඉතාම බාල විදියට. පවුම් බාගයක් ගෙවීම නැන්දා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. ඒ පින්තාරු කරු බොහොම දරුණු මිනිහෙක්. තමන්ට පොරොන්දු වුණු මුදල නොගෙව්වොත්, මතක හිටින දඬුවමක් දෙන බවට ඔහු තර්ජනය කළා. අන්තිමේදී සිලිං හතක් ගෙවා යන්තම් මං ඔහුව පිටත්කර හැරියා. නමුත් ඔහු පිටවී ගියේ කෝපයෙන් දිවරමින්"

"අවශ්‍ය වුණොත් සොයා බලන්න, ඔහුගේ නම් ගම් ආදිය ඔබ ළඟ සටහන් කර තියෙනවාද?"

"නැහැ මහත්මයා"

"හාපර් මෙනෙවිය. මට අවසන් වශයෙන් ඇසිය යුතු තවත් එක ප්‍රශ්නයක් තිබෙනවා. ඔබ සමග පෞද්ගලිකව දැඩි අමනාපයක් ඇතිකරගත්, ඔබ සමග තදබල වෛරයකින් පසුවෙන කෙනෙකු ඉන්නවද? හොඳට කාලය අරගෙන කල්පනා කරල බලලා මට පිළිතුරු දෙන්න"

දිග සුසුමක් හෙළූ ඇය, මඳ වේලාවක් නිහඬව කල්පනා කළාය. දෙනෙත් බිමට යොමුකරගෙන, වම් අත්ලේ ඇඟිලිවලින් මුව වසාගෙන, විටෙක නළල රැළිකරමින් ඇය කල්පනා කළාය. එක්වරම පිළිතුරක් නොදී ඇය ඒ ප්‍රශ්නයට නිවැරදිම පිළිතුර දීමට උත්සාහ කළ බැව් මම තේරුම් ගතිමි. මීළඟට ඇය වටපිට බැලුවේ, ඇයගේ ප්‍රකාශය ඇහෙන මානයේ කිසිවෙකු සිටීදැයි සැක හැර දැන ගැනීමට මෙනි. අප ඇය සමග සාකච්ඡා කළ ආකාරය බලා සිටීමට යොදා තිබුණේ වැඩිහිටි පොලිස් කාන්තාවක පමණි. සැරපරුෂ ස්වභාවයක් හෝ සැකයක් නොතිබූ ඇය, පහසු පුටුවක හිඳගෙන සිටියේ පුවත්පතක් කියවමිනි.





"හෝම්ස් මහත්මයා" හාපර් මෙනෙවිය කීවේ තමා වෙතට ළංවෙන මෙන් හෝම්ස්ට සංඥා කොට, තියුණු බව අඩුකළ හඬකිනි.

"අවුරුදු දහයක් ආපස්සට කල්පනා කළත් මා සමග තදින් අමනාප අය ඉන්නේ දෙන්නයි. එක්කෙනෙක් හියු රොබින්සන්. මං නාට්‍යවල රඟපෑමට ආව කාලයේ අප දෙදෙනා අතර ප්‍රේම සම්බන්ධතාවක් ඇතිවුණා. ඒක අවුරුද්දකට වැඩි කාලයක් පැවතුණා. ඔහු ඉතා අවංක එහෙත් ඉතා සැරපරුෂ කෙනෙක්. තවත් අවුරුද්දකින් පමණ විවාහ වෙන්නයි අපේ බලාපොරොත්තුව තිබුණේ. නමුත් සුළුදේට පවා කෝපාවිෂ්ට වෙන ඔහුගේ ස්වභාවය නිසා, ටිකෙන් ටික ඔහු ගැන කලකිරෙමිනුයි මං හිටියේ. ඔහු සමග විවාහ වෙන එක ගැන මගේ හිතේ චකිතයක් තිබුණා.

ඒ අතරෙදි තමයි මට ලෙස්ටර් බ්‍රවුන් හමුවුණේ. ඔබ අහල ඇති ඔහු ගැන. සුප්‍රසිද්ධ නාට්‍ය නිෂ්පාදකයකු වන ඔහු ගැන කවුද අහල නැත්තෙ. ඔහුගේ නාට්‍යයක රඟපාන්න ඔහු මට ඇරයුම් කළා. මං ඒක සතුටින් භාරගත්තා. ඔහු දරුවන් තුන්දෙනෙකු ඉන්න විවාහකයෙක්. වයස අවුරුදු හතළිහයි. නමුත් මගේ සිත ඔහු වෙත ඇදී ගියා. ලෙස්ටර් කියන්නේ පුදුමාකාර ලෙස කාරුණික, ඒ වගේම නිහතමානි කෙනෙක්. ඔහුගේ හිතත් මා වෙත ඇදුණේ කොහොමටවත් මා නොහිතූ අයුරින්. මේක ඉක්මනින්ම තේරුම් ගත්තේ මගේ පෙම්වතාව සිටි හියු. ඔහු කෝපාවිෂ්ට වෙලා මට මරන තර්ජන කළා. නමුත් මං ඒක ගණන් ගත්තේ නැහැ. හියු මට පහර දුන්නා. එයින් වුණේ මං තව තවත් ඔහුගෙන් ඈත්වීම පමණයි. අන්තිමට ඔහු මගෙන් වෙන්වුණේ, මාව මරාගෙන තමනුත් මැරෙන බවට තර්ජනය කරමින්.

ඊට අමතරව ඔහු අපේ සම්බන්ධය ගැන ලෙස්ටර්ගේ බිරිඳ ඇඩෙලාටත් කේලාම් කිව්වා. හියු අතිශයෝක්තියෙන් කියූ දේ නිසා ඇඩෙලා වියරු වැටුණා. ඇය බ්‍රසීල සම්භවය ඇති ගැහැනියක්. ඔවුන් මොනතරම් දරුණු හිත්පිත් නැති අයද කියන එක ඔබ දන්නවා ඇති. ඇය මා හමුවෙන්න ආවේ, අපි ලෙස්ටර්ගේ නාට්‍යයක පුහුණුවීම් කරන අතරේ. අනෙක් හැම දෙනෙකුම ඉදිරිපිට ඇය මට කිව්වේ කුමක්ද කියා ඔබට හිතන්න පුළුවන්ද?

"මේරි. ලෙස්ටර් එක්ක උඹේ තියෙන සම්බන්ධය වහාම නවත්තපං! මීට පස්සෙ උඹ ලන්ඩනයට එන්න එපා. උඹ මරන එක මරනවාමයි. ඒක සහතිකයි!" ඇය ගිගිරුවේ කෝපයෙන්

වෙවුළමින්. මීට පෙරත් ඇගේ සතුරෙකු ඇඩෙලා කුලී මිනීමරුවන් ලවා දරුණු ප්‍රහාරයකට ලක්කළ බව ලෙස්ටර් මට රහසින් කිව්වා. ඉතින් මගේ ජීවිතය ගැන හිතලා මම නාට්‍ය ලෝකයෙන් ඉවත්වුණා. මේ ලෝකේ මට ඉන්න පරම හතුරන් දෙන්නා කවුද කියන එක දැන් ඔබට හිතාගන්න පුළුවන් ඇති මහත්මයා" කී මේරි තම කථාව අවසන් කළාය.

"වොට්සන්. මේක අපි හිතුවාට වඩා සංකීර්ණ ගැටලුවක් වෙන බවයි පෙනෙන්නේ" හෝම්ස් කීවේ ඇයගෙන් සමුගෙන අප දෙදෙනා ආපසු දුම්රියපොළ වෙත එන අතරතුර දීය. "මං හිතුවාට වඩා වෙනත් පැත්තකට මේක ගමන් කරන බවයි පෙනෙන්නේ"

එතරම් සෙනගක් නොසිටි ලන්ඩන් බලා යන දුම්රියක් අපට ඉක්මනින් ලැබිණි. කිසිදු කතාබහක් නොකළ මගේ මිත්‍රයා දිගින් දිගටම ගැඹුරු කල්පනාවකට වැටී සිටියේය. ඔහු යළිත් මා අමතා යමක් කීවේ දුම්රියපොළෙන් බැස බේකර් වීදියට එන අතරේදීය.

"වොට්සන්. ඔබට මොනවද හිතෙන්නෙ? ඔබ හිතන්නේ මේක මේරිගෙන් පළිගැනීමට කවුරු හරි කළ මිනීමැරුමක් කියලද?"

"මට නම් මොකුත් හිතාගන්න අමාරුයි"

* * *

පසුවදා උදේ මා අවදිවන විටත් මගේ මිත්‍රයා නිවසේ නොසිටියේය. ඔහු එනතුරු බලා නොසිට තනිවම උදේ ආහාරය ගන්නා මෙන් ලියුම් කැබැල්ලක් මේසය මත තිබිණ. උදේ තේ පානය අවසන් කොට මම පුවත්පත් කියවමින් සිටියෙමි. හෝම්ස් ආපසු පැමිණෙන විට දහවල් එකොළහ පසුවී තිබිණි.

"කොහොමද හෝම්ස්, ඔබ ගිය වැඩ කටයුතු සාර්ථක වුණාද?" මම විමසුවෙමි.

"සම්පූර්ණයෙන්ම සාර්ථක වුණා කියන්න අමාරුයි. මං ගියා එක්තරා තැනැත්තියක හමුවෙන්න. නමුත් ඇය ගෙදර හිටියේ නෑ"

"ඔබ යන්න ඇත්තේ බ්ලැක්වෙල් ආර්යාව හමුවෙන්න වෙන්න ඇති?"

"හරියට හරි වොට්සන්. ඔබේ නිගමනය නිවැරදියි. මං පණිවුඩයක් තබා ආවා. එය ඇය අතට ලැබුණා නම්....... මේ එන්නේ ඇය විය යුතුයි........"





මෙසේ කියූ හෝම්ස් මා කැඳවූයේ ඉදිරිපස ජනේලය ළඟටය. එය විවෘත වන්නේ බේකර් වීදිය දෙසටයි. අප නිවස ඉදිරිපිට නවත්වා තිබුණේ සුඛෝපභෝගී මාදිලියේ අශ්ව කරත්තයකි. ඒ ලන්ඩනයේ ඉහළම ප්‍රභූවරුන් තම ගමන් බිමන් සඳහා යොදා ගන්නා වර්ගයේ රථයකි. එහි බ්ලැක්වෙල් පවුලේ ලාංඡනය පින්තාරු කර තිබූ අයුරු ඈත සිටම දැකගත හැකිවිය.

"වොට්සන්. මං ඇඳුම් මාරු කරගෙන ඉක්මනට එන්නම්. එතෙක් ඇය පිළිඅරගෙන ටිකක් කතා බහ කරන්න" මට උපදෙස් දුන් හෝම්ස් වහාම තම කාමරයට වැදුණේය.

දෙදෙනෙකු උඩුමහලට පැමිණෙන ශබ්දය පියගැට පෙළ දෙසින් ඇසිණ. මඳ වේලාවකින් අපේ දොරට තට්ටු කොට පළමුවෙන් ඇතුළු වූයේ හඩසන් මහත්මියයි. බ්ලැක්වෙල් ආර්යාව ඇය පසුපසින් පැමිණියාය. ඇය අසුන්ගත් පසු හඩසන් මහත්මිය පිටවී ගියාය.

"ආර්යාවෙනි. හෝම්ස් මහත්මයා ඉක්මනට ඒවි. ඔහු ගෙදර ආවෙත් මේ දැන් මොහොතකට කලින්"

"ඔව්. මට හිතාගන්න පුළුවනි. ඔහු මා හමුවෙන්න ඇවිත් හුගක් වෙලා බලාගෙන ඉඳල තිබුණා" ඇය කීවාය.

"බ්ලැක්වෙල් ආර්යාව හෙවත් සූසාන් මොන්රෝගේ ඡායාරූප මා පුවත්පත් මගින් මීට පෙර දැක තිබුණි. එහෙත් ඇය ඡායාරූපවල දුටුවාටත් වඩා සැබැවින්ම රූමත් තැනැත්තියක් බැව් එවෙලේ දුටුවෙමි. කෙසේ වෙතත් ඇගේ මුහුණේ දක්නට ලැබුණේ අසාමාන්‍ය සුදුමැලි බවකි. ඇයගේ කටහඬේද වෙව්ළන ස්වභාවයක් ඇතැයි මට සිතිණි.

"මට සමාවෙන්න ආර්යාවෙනි." හෝම්ස් කීවේ විසිත්ත කාමරයට පිවිසෙමිනි.

"ඔබ එද්දී ගෙදර නොසිටීම ගැන මමයි ඔබෙන් සමාව ඉල්ලන්න ඕන" ඇය කීවේ ඇගේ රන්වන් පැහැති කෙස්වැටිය මතින් ඇඟිලි යවමිනි. "මං දන්නවා ඔබ එන්න ඇත්තෙ, මේ හාපර් මිනීමැරුම ගැන මං දන්න දේ විමසන්න වෙන්න ඇති. සමහරවිට හෙට අනිද්දා මට උසාවිය ඉදිරියෙත් මේ කාරණා කියන්න සිදුවේවි"

"ඔබ මේරිව හඳුනන්නේ බොහොම කාලයක ඉඳලා වෙන්න ඇති?" හෝම්ස් විමසීය.

"මෙහෙමයි. මම මොනම ආකාරයකින්වත් ඇය හඳුනාගෙන හිටියේ නැහැ. නමුත් මේ මියගිය තැනැත්තිය එනම් එලිසබත් හාපර්, මං කුඩා කාලයේ ඉඳලම හඳුනනවා. ඇය තමයි මාව බලාගත්තු සේවිකාව. ඇගේ දුප්පත්කම සලකලා මං ඇයට දීමනාවක් කළා. මේරි කියන්නේ එලිසබත්ගේ අයියා කෙනෙකුගේ දියණියක්. දෙමාපියන්ගේ අකල් මරණය නිසා ඇය එලිසබත්ගේ භාරයට පත්වුණා. එලිසබත් ජීවත්වුණෙත් අමාරුවෙන්. ඉතින් ඇය මගෙන් ඉල්ලා හිටියා ඇගේ ලේලිය මේරිට නාට්‍ය ක්ෂේත්‍රයේ සුළු රැකියාවක් හැකිනම් ලබාදෙන ලෙස. මට දුක හිතුණේ එලිසබත් ගැනයි. ඉතින් මං නාට්‍ය නිෂ්පාදක වරුන් කිහිප දෙනෙකුට කථා කළා. මගේ බලවත් ඉල්ලීම නිසාමයි ඔවුන් කැමති වුණේ, මේරිට සුළු චරිත රඟපාන්න අවස්ථාව දෙන්න. නමුත් ඇය එතැනදී මාව ලොකු අපහසුතාවයකට පත් කළා. ඔබට ආරංචි ඇති ඇය ලෙස්ටර් බ්‍රවුන් සමග ඇති කරගත් සම්බන්ධය ගැන. ඒකෙන් දොස් අහන්න වුණේ මටයි."

"ඔහුගේ බිරිඳ ඇඬෙලා, මේරිට මරන තර්ජන කළා කියන්නේ ඇත්තද?"

"ඔව්. මටත් ඒ වගේ කතාවක් අහන්න ලැබුණා. ඒත් ඒ අවුරුදු තුන හතරකට කලින් නේ. මේරි ඒ කාලෙම නාට්‍ය ක්ෂේත්‍රයෙන් ඉවත්වුණා. මේ අවුරුදු තුන හතරටම මට ඇය හමුවුණේ නැහැ."

"පහුගිය බදාදා ඇය ඔබ හමුවීමට ඔබේ නිවසට ආවා?"

"ඔව්"

"ඔබට ඇය හමුවුණේ රාත්‍රී අටට විතර?"

"ඔව්. ඇය ආවේ වෙන මොකකටවත් නෙමෙයි. මට තර්ජනය කරලා, මාව ප්‍රාණ ඇපකාරයෙකු කරගෙන මුදල් පැහැරගන්න"

"බ්ලැක්වෙල් ආර්යාවෙනි. ඔබ කී කරුණ මට ඒ තරම් පැහැදිලි නෑ. ඔබට පුළුවන්ද ඒක මට තේරුම් කර දෙන්න?"

"හෝම්ස් මහත්මයා. ඇය කිව්වා ඇය ළඟ තියෙනවාලු මං කාට හරි ලියූ ලියුම් වගයක්. ඒවා මගේ සැමියාට හෝ ඔහුගේ ඥාතීන්ට කියවීමට ලැබුණොත්, මට මහා ලැජ්ජාවක්ලු සිදුවෙන්නේ. මට මේ ලෝකෙට මුහුණ දෙන්න බැරිවේවි කිව්වා. ඉතින් ඇය කිව්වා මං පවුම් පන්සීයක් ගෙවනවා නම්, මේ ලියුම් මා අතට ගෙනත් දෙන්නම් කියලා. මේක මහ පිස්සු කතාවක් මහත්මයා. ඔය කියන විදියේ ලියුම් ගැන මං කිසිම දෙයක් දන්නේ නෑ. මගේ





ජීවිතේටම මං එහෙම ලියුමක් ලියලත් නෑ. ඒ බව මං ඇයට කිව්වේ බොහොම කාරුණිකව. එතකොට ඇය මොකක්ද කළේ? ඇය ඉල්ලූ මුදල ගෙවන්න බැරි නම්, මේ ලියුම් මගේ සැමියා වෙත ගෙනිහිං දෙනවා කිව්වා. මං ඒ වෙලාවේ එක මෝඩ කමක් කළා. මං ඇයට කිව්වා ඒ ලියුම් මගේ සැමියාට නොදී, මා අතට ගෙනැත් දෙන්න කියලා. මගේ කටින් එහෙම දෙයක් කියවුණේ ඇයි කියලා මම ම දන්නෙ නෑ."

"ඒකට ඇය දුන් පිළිතුර මොකක්ද?"

"එතකොට ඇය කිව්වා මේ කියන ලියුම් තියෙන්නේ ඇගේ නැන්දා ළඟ බවත්, ඒවා ඉල්ලාගෙන ඉක්මනින්ම මා හමුවෙන්න එන බවත්"

"ඊට පස්සේ හුගක් රෑ වෙනතුරු ඇය ඔබ සමග ඔබේ නිවසේ කතාබහ කරමින් කාලය ගත කළාද?"

"ඒ තරම් වෙලා කතාකරන්න දේවල් අපට තිබුණේ නෑ. මා ඇය හමුවෙද්දී වෙලාව රාත්‍රී අට වෙන්න ඇති......."

"එතකොට ඇය පිටවී ගියේ?"

"ඇය පිටවී යද්දී රෑ දහය වුණේ නැති බව නම් මට හොඳටම විශ්වාසයි" ආර්යාව කීවාය.

"ආර්යාවෙනි. මේ කාරණය ඉතාම වැදගත්" හෝම්ස් කීය. "ඇය කියනවා ඇය ඔබේ නිවසෙන් පිටත් වී ගියේ රෑ එකොළහට පමණ කියා. ඒ නිසා ඇයට සෙන්ට් පැන්ක්‍රාස් වලින් එකොළහට ගිය දුම්රිය අල්ලාගන්න බැරිවුණා කියල. නමුත් ඔබ කියන්නේ ඇය ගියේ දහයට කලින් කියල. ඔබට හොඳටම විශ්වාසද?"

"ඔව් මහත්මයා"

"එතකොට ඇයට පිටවී යාමට දොරවල් විවෘත කර දී, පිටවූ පසු දොරවල් වැහුවේ ඔබේ සේවිකාවන්ද?"

"නැහැ මහත්මයා. ඒ වෙලාව වෙන කොට සේවිකාවන් නිවසේ පිටුපස ඔවුන්ගේ රාත්‍රී භෝජනය ගන්නවා. මේරි තමයි දොර ඇරගෙන පිටවී ගියේ"

"එතකොට ඔබේ ස්වාමිපුරුෂයා?"

"මං මේ තැනැත්තිය සමග දිගු කතාබහක වැටී සිටි අයුරු ඔහු දකින්න ඇති. එහෙම වෙලාවට ඔහු මා ගැන බලාගෙන ඉන්නේ නැහැ. ඔහු ගියා තමන්ගේ සමාජ ශාලාවට. ඔහු ආපසු ආවේ මේරි ගිහිල්ලත් සෑහෙන වෙලාවකට පස්සේ"

"ඔහු මිතුරන් හමුවීමට යන්න ඇත්තේ මොන සමාජ ශාලාවටද?"

"ඒ බර්ක්ලි චතුරශ්‍රයේ "කාල්ටන්" සමාජ ශාලාවට. එහෙම නැත්නම් සාන්ත ජේම්ස් වීදියේ "පෝල් මෝල්" සමාජ ශාලාවට. කාඩ් ක්‍රීඩාව සඳහා නම් ඔහු යන්නේ ටැන්කර්විල් සමාජ ශාලාවට"

"ආර්යාවනි. මේ තොරතුරු මට කීම ගැන ඔබට බොහොම ස්තුතියි." හෝම්ස් කීය. "අවසන් වශයෙන් මට ඔබෙන් විමසන්න තියෙන්නේ එකම කරුණක් පමණයි. එලිසබත් හාපර් ඝාතනය වුණා. ඔබේ මතයේ හැටියට එය කරන්න ඇත්තේ කවුරුන්ද? මේරි කියන හැටියට ඇය සමග දැඩි වෛරයකින් පසුවූ ඇගේ පරණ පෙම්වතා වූ හියූ රොබින්සන් විසින් ද? නැත්නම් මේරිගෙන් පළිගන්නා බවට දිවුරු ඇඩෙලා බ්‍රවුන් විසින්ද?"

"ඔය කවුරුත් කියලා මං හිතන්නේ නැහැ මහත්මයා........"

"එතකොට ඔබේ අදහස මොකක්ද?"

"ඇයි මහත්මයා එලිසබත් ලියලම තිබුණනේ, තමාට ඒ අපරාධය කළේ කවුද කියලා?"

"ඔබට හිතෙන්නේ එහෙමද?"

"ඔව්"

"දැනට මට දැනගැනීමට උවමනා එපමණයි ආර්යාවෙනි." හෝම්ස් කීය. "තවත් යමක් දැනගන්න උවමනා වුණොත් ඔබේ නිවසට පැමිණ මට ඔබ හමුවිය හැකිද?"

"ඇත්තෙන්ම ඔව්. නමුත් කලින් විදුලි පුවතක් එවා වෙලාවක් වෙන් කරගෙන ආවොත් වඩාත් හොඳයි"

"ඔබට ස්තුතියි"

ඉන්පසු සුසාන් මොන්රෝ හෙවත් බ්ලැක්වෙල් ආර්යාව අපෙන් සමුගෙන පිටවී ගියාය.

"ඇයගේ ඒ තොරතුරුවලින් මේ ප්‍රශ්නය තව තවත් සංකීර්ණ වෙනවා වොට්සන්. මං නැවත වරක් ගෙදරින් පිටවී යායුතුයි. තවත් සොයා බැලිය යුතු කාරණා කිහිපයක්ම තියෙනවා" කී මගේ මිත්‍රයා යලිත් වරක් හැඳ පැළඳ ගැනීම සඳහා කාමරයට ගියේය. පැය භාගයකින් පමණ එළියට පැමිණියේ මගේ මිත්‍රයා නොවේ! ඔහු තම පෙනුම සම්පූර්ණයෙන්ම වෙනස් කරගෙන සිටියේය. බොරු කොණ්ඩයක් පැළඳ, මුහුණ පුරා තවරාගත් ආලේප වලින් හෝම්ස්ට තරුණ පෙනුමක් ලැබී තිබිණි. තරුණයින් පළඳින





ආකාරයේ වෛවර්ණ කමීසයක් හැඳ, ඊට උඩින් කබාය හැඳගත් ඔහු අතේ හිස්වැස්මක්ද විය.

"මගේ හිතවත් වොට්සන්. දැන් මම අවුරුදු පහළොවකින් පමණ ළාබාල තරුණයෙකු වී තිබෙනවා කියල ඔබට කියන්න පුළුවන්ද?"

"ඔව් ඔව්. නමුත් අතමිට සරුසාර තරුණයෙක් නම් නෙමෙයි. හොඳ රස්සාවක් නැති කෙනෙකුගේ පෙනුමයි ඔබට තියෙන්නෙ"

"විශිෂ්ටයි මිත්‍රයා. මට උවමනා කරන්නෙත් ඒකයි" කී හෝම්ස් නිවසෙන් එළියට බැස්සේය. කුලීරියක් කැඳවීමට ඔහු "විසිල්" කරන හඬ මට ඇසිණි.

හෝම්ස්ට ගැටලු සහගත සංකීර්ණ රහස් පරීක්ෂණයක් ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. එවැන්නක් ලැබුණු විට අතිශය සතුටට පත්වන ඔහු, ඉන්පසුව ගතකරන්නේ ඉතාම අවිවේකී ජීවිතයකි. එය විසඳීමට ඔහු තම සම්පූර්ණ කාලයම කැප කරන්නේ දිවා රෑ නොතකමිනි. ඔහු කනබොන වේලාවන් හා නිදියන වේලාවන්ද අවිනිශ්චිතය. එබැවින් රෑ බෝවෙද්දී තවදුරටත් බලා නොසිට නින්දට යෑමට මම තීරණය කළෙමි. අප නිවස ඉදිරියේ කුලීරියක් නවත්වන හඬ මට ඒ මොහොතේ ඇසිණ. මගේ මිත්‍රයා දොරෙන් ඇතුළු වූ ශබ්දයත්, ඔහු පියගැට පෙළ නැග උඩුමහලට එන අයුරුත් මීළඟට අසන්නට ලැබිණි.

"ඔබ තවමත් අවදියෙන්ද මිත්‍රයා?" හෝම්ස් විමසුවේ තම හිසේ පැළඳි බොරු කොණ්ඩය ගළවා අතට ගනිමිනි. "මං එන ගමන් සිම්සන්ගේ අවන්හලට ගොඩවැදිලා රෑ කෑම කාලයි ආවෙ"

"කොහොමද ඔබේ වැඩේ සාර්ථකද? අපරාධකාරයා අල්ල ගත්තද?"

"තවමත් ඔහු අල්ලගත්තෙ නෑ වොට්සන්. නමුත් මට විශ්වාසයි ඔහු තවත් දින දෙකක් යන්නට පෙර අල්ලාගන්න හැකිවේවි කියල"

"එහෙම වුණොත් ලොකු සැනසීමක්."

* * *

"ඊයෙ හැන්දෑවරුවම මට කාර්ය බහුල වුණා" හෝම්ස් පසුවදා උදෑසන තේ මේසයේදී මා සමග කීය.

"මට දැනගන්න උවමනා වී තිබූ තොරතුරු හොයාගන්න, තැන් කිහිපයකටම යන්න සිදුවුණා. රැකියාවක් නැති මෝඩ පහේ

මිනිහෙක් හැටියට ගියාම, ලොකු වාසියක් තියෙනවා වොට්සන්. අනික් අයගේ අවධානයට හෝ සැකයට ලක් නොවී ඔවුන් අතර ගැවසෙන්න පුළුවනි. ඒ අතරෙදි ඔවුන්ගේ කතාබහට කන්දෙන්න පුළුවනි"

"ඔබට දැනගන්න ලැබුණෙ මොනවාද? ඒ මගින් මේ අබිරහස කොයිතරම් දුරට විසඳාගන්න හැකිවුණාද යන කාරණා මං කැමතියි දැනගන්න" මම කීවෙමි.

"ඔබට ඒ සඳහා තවත් පැය දෙකක් විතර ඉවසන්න වෙනවා මිත්‍රයා" හෝම්ස් කීවේ කෝපි පෝච්චියෙන් තම කෝප්පය පුරවා ගනිමිනි. "උදේ එකොළහ වෙද්දී මේ විසිත්ත කාමරය වෙත පැමිණෙන්න කියලා මං අමුත්තන් තුන්දෙනෙකුට දැනුම් දුන්නා. ඔවුන් නොවැරදීම ඒවි කියල මං විශ්වාස කරනවා. එය සාර්ථක වුණොත් අපරාධකාරයා අල්ලා ගැනීම ඉතාම පහසුවෙනවා. අපේ ස්කොට්ලන්ඩ්යාඩ් මිත්‍රයා බ්‍රැඩ්ස්ට්‍රීට් ඉන්නෙත් හරිම නොඉවසිල්ලෙන්. මේ අමුත්තන්ගේ කතාබහට කන්දීමට එන්න කියලා මං ඔහුටත් ආරාධනා කළා"

"හරියටම උදේ දහයමාර වෙද්දී බ්‍රැඩ්ස්ට්‍රීට් පැමිණියේය.

"හෝම්ස් මහත්මයා. මං ලොකු විශ්වාසයකින් ආවේ. මේ ගැටලුව අද විසඳන බව ඔබ සහතික කරල කියල තිබුණ නේ"

"හරි හරි ටිකක් ඉවසන්න බ්‍රැඩ්ස්ට්‍රීට්. මං කවදාවත් ඔබට දුන්නු පොරොන්දු නම් කඩ කළේ නෑ. එහෙම නේද?"

පොලිස් නිලධරයා ඊට පිළිතුරු දීමට පෙර, තවත් කිසිවෙකු තරප්පු පෙළ නැග උඩුමහලට එන ශබ්දය අසන්නට ලැබිණ. දොරට තට්ටු කිරීමකින් පසු ඇතුළට ආවේ කාන්තාවකි. ඒ හාපර් නිවසේ මෙහෙකාරිය වූ ඩෝරා ඕ' වොරන් බැව් මම හඳුනාගතිමි. මිනීමැරුම සිදුවන වෙලාවේ ගෙදර නොසිටි ඇය මට සම්පූර්ණයෙන්ම වාගේ අමතක වී තිබිණ.

"ශුභ උදෑසනක් හෝම්ස් මහත්මයා" ඩෝරා කීවාය. "ඔබ එවා තිබූ මුදල් සහ ලිපිය මට ලැබුණා. බේකර් වීදියට ඇවිත් ඔබ සියලුදෙනා හමුවුණොත්, මට තවත් මුදල් ලැබෙන බවයි ඔබ කියා තිබුණේ. එහෙම නේද?"

"ඔව් ඩෝරා. අපේ මේ කතාබහට කන්දී අප අහන ප්‍රශ්න කීපයකට පිළිතුරු දීම පමණයි ඔබට කරන්න තියෙන්නේ. එතකොට ඔබට මං මුදල් ගෙවනවා. ඊට කැමතිද?"

"ඔව් මහත්මයා"





"හැබැයි එක කොන්දේසියක් උඩ. ඒක හොඳට මතක තියාගන්න" හෝම්ස් කීය. "අනික් අය කථාකරද්දී ඔබ ඒකට බාධා කරන්න එපා. නිශ්ශබ්දව අහගෙන ඉන්න. ඔබේ නම කියා මං ඔබට අවස්ථාව ලබා දෙනවා. එතකොට ඔබට පුළුවනි කථාකරන්න"

ඇය හිස සොලවා ඊට එකඟත්වය පළකළාය.

හරියටම උදෑසන එකොළහ වෙද්දී අප නිවස ඉදිරිපිට අශ්ව කරත්තයක් නවත්වන ශබ්දය ඇසිණ. ජනේලයෙන් බැලූ මා දුටුවේ කලින් දිනයේද පැමිණි බ්ලැක්වෙල් පවුලේ සුඛෝපභෝගී අශ්ව කරත්තයයි. මඳ වේලාවක් ගත වෙද්දී සර් රේමන්ඩ් බ්ලැක්වෙල් සහ බ්ලැක්වෙල් ආර්යාවද උඩුමහලට පැමිණියහ.

"මගේ ආරාධනය පිළිගෙන මෙහි පැමිණීම ගැන ඔබ දෙදෙනාට අප ස්තුතිවන්ත වෙනවා" හෝම්ස් කීවේ ප්‍රභූ අමුත්තන් යුවළට හිස නමා ආචාර කරමිනි.

"මං ඇරයුම් කළ සියලු දෙනාම දැන් මෙහි පැමිණ සිටිනවා. ඒ නිසා තවත් ප්‍රමාද නොකොට මං මේ කටයුත්ත අරඹන්නම්.

මේ අපරාධය සිදුවී තිබෙන්නේ බොහෝ දුරට රාත්‍රී 9 ත් 11.30 ත් අතර විය යුතුයි කියා පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ වෛද්‍ය විලියම් කොන්රඩ් කියනවා. ඔහු එහෙම කියන්නේ ඇයි? ඇය ගත් රාත්‍රී ආහාරය ජීර්ණය වී තිබූ ප්‍රමාණය අනුව. ඇගේ රාත්‍රී ආහාරය කුමක්ද, ඇය එය කෑමට ගත්තේ කුමන වෙලාවේද කියන ප්‍රශ්නය මීළඟට මතුවුණා.

ඒක විසඳා ගැනීම මට පහසුවුණේ, අසල්වැසි නිවසක පදිංචි කාන්තාවක දුන් තොරතුරු නිසා. ඇය තමා මා කලින් සඳහන් කළ උප තැපැල් ස්ථානාධිපති බැක්ස්ටර් මහතාගේ බිරිඳ නොයෙලීන් බැක්ස්ටර් මහත්මිය. හාපර් මහත්මිය අසල්වැසි කාන්තාවක සමග යම් තරමක හරි හිතවත් කමක් තිබුණා නම්, ඒ බැක්ස්ටර් මහත්මිය සමග බව ඩෝරා ඔබට කියාවි.

මේ ගෙවල් දෙකේම අය ඉඳහිට දවසක රාත්‍රී ආහාරය පිටතින් ඇණවුම් කළා. කෑම වේලේ වෙනසක් උවමනා වුණු නිසා හෝ තමන්ගේ පහසුව නිසා එහෙම කළා වෙන්න ඇති. ඔවුන් මේ ඇණවුම දුන්නේ ඇන්ඩසන් නිවසටයි. වැන්දඹු කාන්තාවක වන ඇන්ඩසන් මහත්මිය ජීවත්වුණේ, ග්‍රීන්වුඩ්හි නිවාසවලට මේ ආකාරයෙන් කෑම සැපයීමෙන්. එලිසබත් නෝනාට එදා රෑ කෑම උවමනා වී ඇති බවට පණිවුඩය, ඇන්ඩසන් නිවසට දුන්නේ බැක්ස්ටර් මහත්මියලු.

ඇන්ඩසන් නිවසේ දහහත් හැවිරිදි ජෝන් තරුණයා තමයි උවමනා කරන කෑම ගැන දැනගන්න හාපර් නිවසට ගිහින් තියෙන්නේ. ඒ හැන්දෑවේ හයයි කාලට පමණ. තමාට ගෝවා සමග බැදපු හරක් මස් සහ පාන් උවමනා බව එලිසබත් මහත්මිය කියා තිබෙනවා. කෑම අවශ්‍ය වෙන්නේ එක් අයෙකුට පමණක් බවත් ඈය කිව්වාලු. ආහාරය සැපයීමට නියමිත වේලාව රාත්‍රි අට. ඒ වුණත් තම ගෙදරදී සිදුවුණු ප්‍රමාදයක් නිසා, කෑම ගෙන ගියේ ඊ අටයි හතළිස් පහත් නවයත් අතරේ කියා ජෝන් කියනවා. කෑම සැපයීම ප්‍රමාද වීම නිසා තමන් බඩගින්නේ තැබීම ගැන, එලිසබත් හාපර් ජෝන්ට හොඳටම දොස් කියා තිබෙනවා. කොහොම හරි ඈය පණපිටින් සිටිනවා අන්තිමට දුටුවේ මේ ජෝන් තරුණයා. ඊ නවයට ළංවී කුසගින්නේ සිටි ඈය, ඉක්මනින්ම රාත්‍රි ආහාරය ගත් බව අපට උපකල්පනය කරන්න පුළුවනි........"

"....... හෝම්ස් මහත්මයා. මේ තොරතුරු අපට වැදගත් වෙන්නේ ඇයි කියල මට හිතාගන්න අමාරුයි" මෙසේ කීවේ නොඉවසිලිමත් බවක් පළකළ සර් රේමන්ඩ් බ්ලැක්වෙල්ය.

"මඳක් ඉවසන්න සර් රේමන්ඩ්. මං මේ තොරතුරු විස්තර සහිතව කියන්නෙ ඇයි කියල ඔබට ඉක්මනින් පැහැදිලි වේවි.

මේරි හාපර් අපට කිව්වා, ඈය එදා රාත්‍රි අටට කලින් බ්ලූම්ස්බරි හි, සිල්වට්‍රි මැන්ෂන්ස් නම් ඔබේ නිවසට ගිය බවත්; බ්ලැක්වෙල් ආර්යාව සමග කතාබහ අරඹද්දී ඊ අටට ළං වී තිබුණු බවත්. ඒක නිවැරදියි නේද ආර්යාවෙනි?"

"ඔව්"

"හොඳයි ඔබ නම් කිව්වේ ඈය ඊ අටේ සිට රාත්‍රි දහය පමණ වන තුරු ඔබේ නිවසේ සිටි බව?"

"ඔව්"

"අන්න ඒ සාක්ෂියෙන්ම මේරි හාපර් බොහොම දුරට නිදහස් වෙනවා. නමුත් තවමත් සියයට සීයක් සම්පූර්ණ නෑ" හෝම්ස් කීය. "මේරි හාපර් දිව්රා කියා සිටිනවා ඈය ඔබේ නිවසෙන් පිටවෙලා යද්දී වෙලාව ඊ එකොළහට මිනිත්තු පහයි කියලා. ඒ බව තහවුරු කරන සාක්ෂි දෙකක් මට හමුවුණා. ඈය රාත්‍රි එකොළහයි කාලට පමණ සෙන්ට් පැන්ක්‍රාස් දුම්රියපොළ දෙසට කුලී රියක ගමන් කළ බවට සාක්ෂි ලැබුණා.

ඊට අමතරව ඈය රාත්‍රි 12.25 දුම්රියෙන් ග්‍රීන්වුඩ් දෙසට ගමන් කළ බවටත්, දුම්රිය මගියෙකුගෙන් සාක්ෂි ලැබුණා. මේ රූමත් තරුණිය





ඉතාම නොඉවසිල්ලෙන් සැහෙන වෙලාවක් දුම්රියපොළේ ගත කළ බව තරුණයකු දැක තිබුණා. ඔහු පොලිස් භටයෙක්. එදිනට නියමිත රාජකාරි අවසන් කොට ඔහු තම නිවස බලා ආපසු ගිහින් තියෙන්නේ මේ දුම්රියෙන්මයි. ඔහු ගමන් කර තිබෙන්නේ හෙන්ඩන් දක්වා පමණයි. නමුත් ඈය මේ දුම්රියේ ගමන් කළ බව ස්ථිරයි. එතකොට මම කියූ මේ සාක්ෂිවලින් මේරි හාපර් මෙනෙවිය සම්පූර්ණයෙන්ම නිදහස් වෙනවා. එතකොට මතුවෙන ප්‍රශ්නය තමයි, එහෙම නම් කවුද මේ අපරාධය කළේ?"

හෝම්ස් කලින් කර තිබූ ඇණවුමක් අනුව හඩ්සන් මහත්මිය තම සේවිකාවක සමග උඩුමහලට කෝපි ගෙන ආවාය. ඒවා මහත් ගෞරවයෙන් බ්ලැක්වෙල් යුවළ වෙත පිළිගන්වන ලදී. හෝම්ස්ගේ කතාබහ යළි ඇරඹුණේ කෝපි පානයෙන් පසුවය.

"එදා ග්‍රීන්වුඩ් ගිය වෙලාවෙ මම සටහන් පොත් කීපයක් හාපර් නිවසෙන් මෙහේට අරගෙන ආවා. ඒ තමයි එලිසබත් නෝනාට අයත්ව තිබූ නිවසේ, දිනපතා වියදම් සටහන් කළ පොත සහ තවත් එවැනි පොත්.

ඇයගේ අත් අකුරු ගැන, ඉංග්‍රීසි දැනුම ගැන හොඳ වැටහීමක් ලබාගන්න, මේ පොත් හරිම ප්‍රයෝජනවත්. ඒවා සාමාන්‍යයෙන් කාන්තාවක ලියන තාලයේ, පැහැදිලි ක්‍රමානුකූල අත් අකුරු නොවෙන බව ඔබට පෙනෙනවා ඇති. අනික් කරුණ තමා මේවා වමත හුරු කෙනෙකු ලියූ අකුරු බව මට නිසැකවම කිවහැකියි. ඊට හේතුව අකුරු ලියද්දී ඇගේ අතේ තිබූ තෙතමනය හෝ ඩහදිය නිසා කඩදාසියේ රූල්වල තීන්ත පිසදැමී තිබෙන ආකාරය. බොහොම වෙලාවට ඈය මේ දේවල් ලියන්න ඇත්තෙ තම අත හොඳින් වියළාගන්නෙ නැතිව. එලිසබත් නෝනාගේ අත් අකුරු මේ තරම් නොපැහැදිලි වීමට හේතුව ඩෝරා දන්නවා. අපට ඒ කාරණය පැහැදිලි කරන්න ඩෝරා"

"එලිසබත් නෝනා මීට අවුරුදු දහයකට පමණ කලින් හදිසි අනතුරකට මුහුණ පෑවා" ඩෝරා කීවාය. "වේගයෙන් ගමන් කළ ලොකු අශ්වකරත්තයක් සතර මංසන්ධියකදී ඈය ගමන් කළ කුඩා කුලීරියේ හැපුණා. ඇගේ රිය බිමට පෙරළී ඇගේ දකුණු අත මැණික් කටුව ළඟින් කැඩුණා. ඒකට ඈයට දීර්ඝ කාලයක් ප්‍රතිකාර ගන්න සිදුවුණා. අන්තිමේ දී ඒ අස්ථි බිඳුම සුව වුණත් ඇඟිලි

හරියට වැඩ කලේ නෑ. දකුණු අතින් පෑනක් අල්ලා අකුරු ලියන්න ඇයට හැකියාවක් තිබුණෙ නෑ. මේ නිසා ඇය වම් අතින් අකුරු ලියන්න පුරුදුවුණා. ඇය ඒ පුහුණුවීම පටන්ගත්තේ, දකුණු අත ආබාධයට ලක්වුණු මුල් කාලවලදීම බවයි ඇය කිව්වෙ"

"බොහොම හොඳයි ඩෝරා. ඔබට ස්තුතියි." හෝම්ස් කීය. "මහත්වරුනි එතකොට ලොකු ප්‍රශ්නයක් මතුවෙනවා. එලිසබත් නෝනාගෙ දකුණු අතට යට වී තිබූ ලියුම් කැබැල්ල ඔබට මතක ඇති. පිහි ඇණුම් පාර කාලා, මරණාසන්නව සිටි ඇය ලියූ අන්තිම අකුරු තමා මේ" හෝම්ස් කීවේ එම ලියුම් කැබැල්ලේ විශාල කළ ඡායාරූපය අමුත්තනට පෙන්වමිනි.

"මේ අකුරු කලබලයෙන් ලියා ඇතත්, සෑහෙන්න පැහැදිලියි. නමුත් මෙතැනදි ඇතිවෙන ප්‍රශ්නය; අවුරුදු දහයක් දකුණු අතින් පෑනක් නොඇල්ලූ එලිසබත් නෝනා කොහොමද, මොකද, පිහි පාරක් කාගෙන දකුණු අතින් පැහැදිලිව යමක් ලියුවේ කියලා!"

අප විසිත්ත කාමරය තුළ ඇඩි නිහඬ බවක් ඇතිවිණි. කවුරුත් එකිනෙකාගේ මුහුණට මුහුණ බැලූහ. පොලිස් නිලධරයාගේ මුහුණේ යම් වෙනස්වීමක් මම දුටුවෙමි. තම කබා සාක්කුවට අත දැමූ ඔහු දෙසින්, ලෝහයක් ගැටෙන ශබ්දයක් ඉතාම මෘදුව ඇසිණ. ඒ කුමක්දැයි හඳුනාගැනීමට මට නොහැකි විය.

"තවත් කාලය ගත නොකර මං වහාම ඊළඟ කාරණයට යන්නම්" හෝම්ස් කීවේ තම අතේ තිබූ දල්වා නොගත් පයිප්පය ඉවතින් තබමිනි. "දැන් ඔබට පැහැදිලි ඇති, ඇගේ දකුණු අතට යටවී තිබූ ලියුම් කැබැල්ල ලියුවේ ඇය නොවන බව. එලිසබත් නෝනාට තිබූ ආබාධය ගැන මේ අපරාධකාරයා දැනගෙන ඉඳලා නැහැ; එහෙමත් නැත්නම් ඒ කරුණ දැනසිටියත් හදිසියේ අමතක වුණාද කියන්නත් බැහැ. එතකොට නිශ්චිත නිගමන දෙකකට එන්න අපට ප්‍රමාණවත් තරම් සාක්ෂි තියෙනවා. එකක් මේ අපරාධය කලේ මේරි හාපර් නොවන බව. අනික ලියුම කැබැල්ල ලියුවේ එලිසබත් හාපර් නොවෙන බව.

ඝාතනයට ලක්වුණු ඇය මුදල් තිබුණු ධනවත් තැනැත්තියක නොවන බව අප දන්නවා. එහෙම නම් මොකක් නිසාද ඇය ඝාතනය වුණේ? එක්කෝ පළිගැනීමකට. නැත්නම් ඇය සතුව තිබූ වටිනා යමක් පැහැරගන්න. එය පළිගැනීමක් නොවන බව පැහැදිලියි. එහෙම නම් ඒ ඇය සතුව තිබූ වටිනා යමක් පැහැරගැනීමට බව සිතන්න හේතු තියෙනවා. මුදල් හෝ දියමන්ති ආභරණ නොතිබූ





ඇය ළඟ තිබූ වටිනා දේ මොකක්ද? ඒ ගැන කිහිපදෙනෙකුම කියනවා අපට අහන්න ලැබුණා. ඒ තමයි බ්ලැක්වෙල් ආර්යාව ලියුවේ යයි කියන ලිපි වගයක්. ඒවා හුඟක් වටිනවා කියල එලිසබත් නෝනා විශ්වාස කළා. ඇය ඒ බව ඩෝරාටත් කියල තිබුණා. මේරි එදා හවස ආර්යාව හමුවෙන්න ඇවිත් කියුවෙත් එය නේද? ඒ නිසා අපට බොහොම පහසුවෙන් නිගමනය කරන්න පුළුවනි, බදාදා රාත්‍රියේ හාපර් නිවසට ආ අපරාධකාරයාට උවමනා වී තිබුණේ කුමක්ද කියන එක. එලිසබත් නෝනා ඝාතනය වුණේ මෙ ලියුම් සම්බන්ධයෙන් ඇතිවුණු ආරවුලකට. ඒ ගැන කිසිම සැකයක් නෑ"

"හෝම්ස් මහත්මයා" බ්ලැක්වෙල් ආර්යාව කීවේ තදින්ම කෝපයට පත්වූ හඬෙනි. "එතකොට ඔබ කියන්නේ මේ ලියුම් උදුරා ගැනීමට මං ඇයව ඝාතනය කළා කියලද?"

"කොහොමටවත් නෑ ආර්යාවෙනි. එදා රාත්‍රි එකොළහ වෙනතුරු ඔබ ලන්ඩනයේ ඔබේ නිවසේ රැඳී සිටි බවත්, මේරි සමග කතාබහේ යෙදී සිටි බවත් ඔප්පු වුණා. මිනීමැරීමේ චෝදනාවෙන් ඔබ නිදහස් වෙන්න ඒකම ප්‍රමාණවත්"

"එතකොට මේ අපරාධය කලේ කවුරු කියලද ඔබ කියන්නෙ?" සර් රේමන්ඩ් බ්ලැක්වෙල් විමසුවේය.

"ඔව් මහත්මයා." හෝම්ස් කීය. "හොඳ ප්‍රශ්නයක්. ඉතාමත් හොඳ ප්‍රශ්නයක්. මං ඒක පසුව හෙළිකරන්නයි හිටියේ. නමුත් ඔබ එය විමසූ නිසා මං වහාම පිළිතුරු දෙන්නම්. පසුගිය බදාදා රාත්‍රි ග්‍රීන්වුඩ්හි "සනි කොටේජ්" නිවසේදී එලිසබත් හාපර් මෙනෙවියට මුවහත් ආයුධයකින් ඇණ මරා දැම්මේ...... වෙනිං කවුරුවත් නොවෙයි ඔබ! සර් රේමන්ඩ් බ්ලැක්වෙල්........ ඔබ තමයි මිනීමරුවා!"

මෙම ප්‍රකාශයෙන් අපි සියලුම දෙනා ඉමහත් තිගැස්සීමකට පත්වූයෙමු. අසුනෙන් නැගී සිටි සර් රේමන්ඩ්ගේ මුහුණ එක්වරම කළු පැහැයට හැරී, ඔහුගේ යටිගිරියෙන් ශබ්දයක් නැගිණ. එක් මොහොතකින් ආර්යාව සෝපාව මතම ක්ලාන්ත වූවාය. ඇයගේ පිහිටට යන මෙන් හෝම්ස් මටත් ඩෝරාටත් සංඥා කළේය. ඇය සෝපාවේ දිගා කොට, බ්‍රැන්ඩි ඩිකැන්ටරය ගෙන ඇයගේ මුවට තැබුවෙමු. මේ කලබලය අතරතුරදී සර් රේමන්ඩ් බ්ලැක්වෙල් එතැනින් පැන දිවීමට උත්සාහ දැරුවේය.

එක් ක්ෂණයකින් හුනස්නෙන් නැගී සිටි බ්‍රැඩ්ස්ට්‍රීට්, තම

පොලිස් රිවෝල්වරය සර් රේමන්ඩ්ගේ හිසට එල්ලකොට, ඔහු යළිත් වරක් අසුන් ගැන්වීය. "බ්‍රැඩ්ස්ට්‍රීට්. බයවෙන්න එපා." හෝම්ස් කීය. "අපේ විසිත්ත කාමරයෙන් එළියට යන දොර යතුරු දමන්න කියා, මං හඩ්සන් මහත්මියට කල් ඇතුව උපදෙස් දීලයි තිබුණෙ. අපට කෝපි සංග්‍රහ කොට පිටවී යද්දී ඇය ඒ රාජකාරිය ඉටුකළ බව මට විශ්වාසයි.

සර් රේමන්ඩ් ප්‍රභුවරයාණනි. මගේ කතාව තවමත් ඉවර නැහැ. තවත් මිනිත්තු කිහිපයක් මගේ කතාවට සවන් යොමු කරන මෙන් මං ඔබෙන් ඉල්ලා හිටිනවා. ඒ මොකද මෙතැන ඉන්න අනෙක් මහත්වරුත්, කාන්තාවන් දෙදෙනාත් නොඉවසිල්ලෙන් බලා ඉන්නෙ, මා කියූ දේ සිදුවූයේ කොහොමද කියල දැනගන්න.

ඔබ හැම දෙනෙකුම දන්නවා ප්‍රභුවරුන්ට අයත් ගම්බදව තිබෙන විශාල මන්දිරවල වගේ නෙමෙයි; ලන්ඩන් නගරයේ සීමිත ඉඩකඩක ඉදිකළ තට්ටු නිවාසවල ස්වභාවය. එක් කාමරයක සිට දෙදෙනෙකු අතර කතාබහක් උස් හඬින් ඇති වුණොත්, ඒක යාබද කාමරයටත් ඇහෙනවා. සමහරවිට ඒක අල්ලපු ගෙදරටත් ඇහෙනවා. සිල්වට්‍රි නිවසේ සිදුවුණෙත් ඒ දේ ම යි. බ්ලැක්වෙල් ආර්යාව සහ මේරි අතර ඇතිවුණු බහින් බස් වීම යාබද කාමරයටත් ඇහුණා. තරුණ වයස රංගන ක්ෂේත්‍රයේ ගෙවපු කෙනෙකුගේ ප්‍රේම සබඳතා තිබීම පුදුම වෙන්න දෙයක් නෙමෙයි. ඔහු හෝ ඇය විවාහ වුණාම ඒවා සම්පූර්ණයෙන්ම අවසන් වෙනවා. නමුත් ප්‍රශ්න ඇතිවෙන්නෙ, ලාබාල වයසේදී ඔහු හෝ ඇය නොදැනුවත්කමින් ලියූ ලියුම් තිබුණොත් තමයි. මේවා අති විශාල ගණන් වලට මිලට ගන්න, පුවත්පත් සඟරා කතුවරු බොහොම ආශාවෙන් බලාගෙන ඉන්නවා. මෙහෙම දෙයක් ප්‍රසිද්ධියට පත්වුණොත් රටේ සුප්‍රසිද්ධ ප්‍රභු පරපුරක් වන බ්ලැක්වෙල් පරපුරට අත්වෙන්නෙ මහා අපකීර්තියක්. ඒ නිසා තමාගේ හා බිරිඳගේ නම එයින් මුදවා ගන්න සර් රේමන්ඩ්ට උවමනා වුණා කියලයි මට හිතෙන්නේ.'

"ඇත්තෙන්ම ඔව් මහත්මයා" සර් රේමන්ඩ් කීය. "ඇගේ නැන්දා ළඟ තිබෙන, මගේ බිරිඳ ලියූවා කියන ලියුම් සඳහා, පවුම් පන්සීයක් උවමනා බව මේරි මගේ බිරිඳට කියනවා මට ඇහුණා. ඒවා මට ගෙනැත් දෙන බව කියමින් මේරි තර්ජනය කළා. අපේ පවුලේ නම්බුව ගැන හිතුවාම පවුම් පන්සීය ඒ තරම් ලොකු මුදලක් නෙමෙයි. නමුත් ඒ මුදලට ඇය අප අතට ලියුම් කීයක් ගෙනැවිත් දේවිද? ඊළඟට තව අවුරුදු කීයක් අපව ප්‍රාණ





ඇපකරුවන් කරගනීවිද? පුළුවන් ඉක්මනට මේකෙ අවසානයක් දැකිය යුතු බව මං හිතුවා.

මං ඒ විදියෙ තීරණයකට එනකොට රෑ 9.45 යි. මං වහාම බ්‍රැඩ්ෂෝ දුම්රිය තොරතුරු කාලසටහන් පොත පරීක්ෂා කර බැලුවා. ග්‍රීන්වුඩ් බලා යාහැකි දුම්රියක් රෑ 9.57 ට සෙන්ට් පැන්ක්‍රාස් වලින් පිටත්වෙන බව එහි සඳහන් වී තිබුණා. පවුම් පන්සියයකුත් සාක්කුවේ දමාගෙන මං වහාම ගෙදරින් පිටවුණා. කුලීරියක් අල්ලාගෙන මං නියමිත වෙලාවට දුම්රියපොළට ආවා. රෑ දහයමාර වෙද්දී දුම්රිය ග්‍රීන්වුඩ්වලට ළඟාවුණා. බොහොම කාලයකට පෙර මම බිරිඳ සමග ග්‍රීන්වුඩ්හි හාපර් නිවසට ඇවිත් තිබුණා. ඒ නිසා එතැන හොයාගන්න කාගේවත් උදව් අවශ්‍ය වුණේ නැහැ. මේරි දැන් කොයි මොහොතේ හරි ආපසු එන නිසා, පුළුවන් ඉක්මනින් මේ ගෙදරින් පිටවිය යුතු බව මට සිහිවුණා.

මා ඒ නිවසේ දොරට තට්ටු කරන විටත් එලිසබත් නින්දට ගොස් සිටියේ නැහැ. නිවස තුළ පහන් දැල්වුණා.

"එලිසබත් හාපර් නෝනා. මං සර් රේමන්ඩ් බ්ලැක්වෙල්. ඔබ සමග මිනිත්තු පහක් කතාකරන්න පුළුවන්ද?" මං ඇහුවා.

මාව අඳුනාගැනීමට ඇයට අපහසු වුණේ නැහැ.

"ආ සර් රේමන්ඩ්? මොකද මේ රෑ වුණු වෙලාවෙ? කෝ ආර්යාව ආවෙ නැද්ද?"

"එලිසබත් නෝනා. මට කතා කරකර ඉන්න වෙලාවක් නෑ. මගේ බිරිඳ මා එක්ක විවාහ වෙන්න පෙර කාලයේ ලියූ, පෙම් හසුන් කීපයක් ඔබ ළඟ තිබෙන බව මට දැනගන්න ලැබුණා. ඒක ඇත්තද?"

"ඔව්. කවුද ඔබට කිව්වේ?"

"ඔබේ ලේලිය මේරි තමයි කිව්වේ. කරුණාකර ඒ ලියුම් ඔක්කොම මා අතට දෙන්න" මං කිව්වේ තර්ජනාත්මක හඬකින්.

නමුත් ඇය එයින් බියට පත්වුණේ නෑ. ඇය මහා කට්ට කෙරාටික හිත්පිත් නැති මැහැල්ලක්.

"සර් රේමන්ඩ්. මං ඉතාම දුප්පත් ගැහැනියක්. මට ජීවත්වෙන්න කිසිම ආදායමක් නෑ. රෙයා අද්මිරාල් මොන්රෝගේ, ඒ කියන්නේ ඔබේ බිරිඳගේ පියාගේ නිවසේ මං අවුරුදු ගණනාවක් සේවය කළා. ඔබේ බිරිඳ කුඩා කාලයේ ඉඳල බලා කියාගත්තෙ මම. නමුත් හදිසියේ මගේ කටින් පිටවුණු එක වචනයකට, ඔවුන් මාව එක පැයෙන් රැකියාවෙන් නෙරපා දැමුවා. ජීවිත කාලයක්

ඔවුනට සේවය කළාට, අමතර එක පැන්සයක් ලැබුණෙ නෑ. ඔබෙ බිරිඳ ඉතා සුළු දීමනාවක් ගෙවනවා. ඒත් මට අනුකම්පා කරල නෙමෙයි. මගේ ළඟ ඇගේ ලියුම් තිබෙන බව ඇය දන්නා නිසා, මාව නිශ්ශබ්ද කර තබන්න."

"හරි. ඒ ලියුම් සියල්ලම මට දෙන්න. කීයක් ද ඔබට උවමනා?" මං ඇහුවා.

"මට පවුම් දෙදහසක් දෙන්න. එතකොට මං ඔක්කොම ලියුම් දෙන්නම්" ඇය කීවා.

"මේ වෙලාවෙ මා ළඟ එච්චර මුදලක් නෑ. කරුණාකරල ඔබේ ගණන අඩු කරන්න. මං මේ මොහොතෙම පවුම් පන්සීයක් දෙන්නම්. මට ලියුම් ටික දෙන්න. ඉතිරි මුදල මං ඔබට දින දෙකකින් ගෙදරටම ගෙනැත් දෙන්නම්"

"නෑ මහත්මයා. පවුම් පන්සීයට නම් ඔබේ අතට දෙන්න පුළුවන් ලියුම් පහයි. තවත් පහක් තියෙනවා. ඔබ මුදල් අරගෙන එන්න. එතකොට මං ඒව දෙන්නම්"

"එලිසබත් නෝනා. මං ඔබට ආයාචනා කර සිටිනවා. මේ පවුම් පන්සීය අරගෙන ලියුම් ඔක්කොම මා අතට දෙන්න. ඉතිරි මුදල ඉක්මනින් ඔබ අතට දෙනවා. දිවුරා කියන්නම්"

"මං ඔබට පහසුවක් කරන්නම්. මං මගේ ගණන පවුම් දෙදහස නොවෙයි. පවුම් දහස දක්වා අඩු කරන්නම්. ඒ මුදල දැන් දෙන්න" ඇය කීවා.

ඇය ඊට වඩා නම් පැන්සයක්වත් අඩු නොකරන බව මං දැනගෙන හිටියා. මා ගෙනගියේ පවුම් පන්සීයක් පමණක් බව මං ඔබට කිව්වා.

"මොකද ඔබ කල්පනා කරන්නේ? පවුම් දහසක් ගෙවන්න කැමති නම්, මං මේ මොහොතෙම ලියුම් දහයම දෙනවා" ඇය කීවා.

මං වෙලාව පරීක්ෂා කර බැලුවා. ඒ වෙනකොට රෑ එකොළහට කිට්ටුයි. දැන් කොයි මොහොතේ හෝ මේරි ආපහු එන්න ඉඩ තිබෙන බව මට සිහිවුණා. අනික ලන්ඩන් බලා යන අවසන් දුම්රිය තිබුණේ 11.25 ට. මං කොහොම හරි ඒකෙ යායුතුව තිබුණා. කළ යුතු දෙයක් වහාම කළ යුතුයි. පවුම් පන්සියය ඇය අතට දී, ලියුම් හංගා ඇති තැනින් ඇය ඒවා ගත්තාම, ඇය භයකර ඒවා උදුරා ගත යුතු බවට මං තීරණය කළා. මං ගෙදරින් එද්දී කුඩා දඩයම් පිහියක් ගමන් කබායේ සාක්කුවේ දමාගෙන ආවා. ඒ





අවශ්‍ය වුණොත් එය පෙන්වා ඇය භය කිරීමට. නැතුව ඇය මරා දැමීමෙ අරමුණෙන් නෙමෙයි.

"හරි. කෝ මා අතට දෙන ලියුම් ටික ඉක්මනට මා අතට දෙන්න" මං ඇයට කිව්වා.

"ඔහොම ඉන්න, මං යතුර අරගෙන එනතුරු" කී ඇය නිවස තුළට ගිහිං යතුරු කැරැල්ලක් රැගෙන විසිත්ත කාමරයට ආවා. ඊළඟට ඇය ගියේ එහි මුල්ලක තිබුණු ලියන මේසයේ යතුරු දමා තිබුණු අල්මාරිය වෙත. ඒක විවෘත කරගන්න ඇය උත්සාහ කළත්, ඒ වැඩේ මුලදී හරි ගියේ නෑ. ඒ මොකද එහි යතුර හරියටම මොකක්ද කියා ඇය දැන හිටියෙ නැති නිසා. ඒකට පැය කාලක් පමණ නාස්ති කරලා, වෙනත් යතුරු කැරැල්ලක් අරගෙන එන්න කියා යළිත් නිවස තුළට ගියා.

මං හිටියේ හරිම නොඉවසිල්ලෙන්. ඒ මොකද දැන් කොයි මොහොතේ හරි, මේරි ගෙට ඇතුළුවීමට ඉඩ ඇති නිසා. මේකට මං ආ බව මගේ බිරිඳ දන්නෙත් නෑ. පිහිය පෙන්වා තර්ජනය කර ලියුම් ඔක්කොම උදුරාගෙන ගියත්, අපට ගැළවීමක් නැති බවත් මට මතක් වුණා. කළ යුත්තේ කුමක්ද කියන එක මං තීරණය කළේ හදිසියේ.

ඊළඟට ඇය ගෙනා යතුරු වලින් මේසයේ අල්මාරි කැල්ල ඉක්මනින් ඇර ගත්තා. එය කළේ මේසය ඉදිරියට තබා තිබූ පුටුවේ හිඳගෙන. මගේ සැලැස්ම හිතේ තබාගෙන මං ඇයට මෙහෙම කිව්වා.

"එලිසබත් නෝනා. මං ඔබ අතට පවුම් දහසම දෙන්නම්. නමුත් ඒ මුදල භාරගත් බවට මට රිසිට්පතක් ඕනෑ" මං එහෙම කිව්වාම ඇය ලාච්චුවේ තිබූ කඩදාසි මිටියකින් එක කඩදාසියක් ගත්තා. තීන්ත බෝතලය හා පෑන මේසය උඩ තිබුණා. ඉන්පසු අර අල්මාරියෙන් ලියුම් මිටිය එළියට ගත්තා. එය රිබන් කැල්ලකින් බැඳලා තිබුණේ.

"කෝ මගේ අතට මුදල් දෙන්න. එතකොට මං ලියල දෙන්නම්" ඇය කීවා.

"මෙතන පවුම් පන්සීයක් තියෙනවා" මං කිව්වේ ඒ මුදල මේසය මතට දමමින්.

එවිට ඇය කළේ ඒ මුදල ගණන් කිරීම. මං වහාම මා ළඟ තිබූ ආයුධය සූදානම් කර තබා ගත්තේ ඇය භයකර ලියුම් සියල්ලම උදුරා ගැනීමට.

එවිට ඇය කලේ මොකක්ද? ලියුම් මිටියෙන් ලියුම් පහක් තේරුවා. ඒකටත් මිනිත්තු පහකට වඩා ගතවෙන්න ඇති. ගතවුණු හැම තත්පරයකින්ම මා පත්වුණේ ඉතාම අවදානම් තත්ත්වයකට.

"කෝ ඉතිරි මුදල. ඒකත් මා අතට දෙන්න" ඇය කීවේ පුටුවේ හිඳගෙනම.

මං පිහිය පෙන්වා මේසය උඩින්, සම්පූර්ණ ලියුම් මිටියම මගේ අතට අර ගන්න උත්සාහ කළා. ඒ වෙලාවේ ඇයට මහ හඬින් කෑගැහුණා. මට උවමනා වුණේ ඒ කෑගැසීම නවත්වන්න. මං යක්ෂාවේශ වුණා. මං ආයුධයෙන් ඇයට ඇන්නේ වියරුවෙන් වගේ. ඊළඟට එතැන තිබුණු කඩදාසියෙන් කෑල්ලක් ඉරලා අපරාධය කලේ මේරි බවට ලිව්වා. ඊළඟට මට මතක, මං ලියුම් ටිකත් අරගෙන නිවසෙන් එළියට දුවගෙන ආ බව විතරයි. ඊළඟට පුළුවන් තරම් ඉක්මනට දුම්රියපොළට ආවා. මං ආපසු යායුතු දුම්රියේ මඳ ප්‍රමාදයක් තිබුණත් මට ඒකෙන් ආපසු ඒමට හැකිවුණා."

ඉදිරියට ආ බ්‍රැඩ්ස්ට්‍රීට් තම කබා සාක්කුවෙන් විලංගු ගෙන එය අපරාධකරුවාගේ දෑත්වලට දමද්දී ඔහු ඊට විරෝධයක් පළ නොකළේය.

රටවාසීන් අතිශය පුදුමයට පත්කළ එම අපරාධය, මගේ මිත්‍රයා විසින් විසඳන ලද්දේ ඒ අයුරිනි.

"අපරාධකාරයා සර් රේමන්ඩ් බ්ලැක්වෙල් විය යුතුයි කියල ඔබ නිශ්චය කළේ කොහොමද?" මා හෝම්ස්ගෙන් විමසුවේ එදා සැන්දෑවේය. ඒ අප රාත්‍රී ආහාරය සූදානම් වන තුරු බලා සිටියදීය.

"මා විසඳා තිබෙන අනෙක් සංකීර්ණ ගැටලු හා සසඳන කොට මේක ඉතාම බරපතළ ගැටලුවක් කියල මට හිතෙන්නෙ නෑ වොට්සන්.

මෙවැනි ව්‍යාකූල තත්ත්වයකදී රහස් පරීක්ෂකයකු මුලින්ම තමන්ගේ අවධානය යොමු කළ යුත්තේ අත්අකුරු පරීක්ෂාවට. ඒක හරිහැටි තේරුම් ගත්තොත්, ගැටලුවෙන් හතරෙන් එකක් විසඳෙනවා. ඊළඟට ඔබ දුටුවාද මං දන්නෙ නෑ, ඒ ලියුම් කෑල්ලේ තිබුණු අක්ෂර වින්‍යාසය. මෙන්න එය. මෙතැන මොකක් හරි වැරැද්දක් තියෙනවද බලන්න"

"I am dying. My murderess is My niece, Mary........."





මම එය හොඳින් පරීක්ෂා කර බැලීමි. එහෙත් මම එහි වැරදි කිසිවක් නුදුටුවෙමි.

"මට නම් මොකුත් වැරැද්දක් පෙනෙන්නෙ නෑ හෝම්ස්"

"හොඳයි මෙන්න තියෙනවා, එලිසබත් හාපර් මහත්මියගේ ගනුදෙනු පොත්වලින්, මා පිටපත් කරගත් වාක්‍ය කිහිපයක්. ඒවාත් හොඳට පරීක්ෂා කර බලන්න........"

එහි එක්තරා වචනයක අක්ෂර වින්‍යාසය සෑම තැනකම වැරදි ඇති බැව් මම නිරීක්ෂණය කළෙමි.

"හැබෑමයි හෝම්ස්. ඇය niece (ඥාති දියණිය) කියන වචනය හැමතැනකම ලියලා තියෙන්නේ වැරදි විධියට neice කියලා."

"හො හෝ ඔබට ඒ වැරැද්ද අහුවුණා එහෙනම්." හෝම්ස් කීය. "එලිසබත් නෝනා ඉහළ පෙළේ පාඨශාලාවක, ඉංග්‍රීසි භාෂාව අධ්‍යයනය කළ තැනැත්තියක් නෙමෙයි. ඒ හින්දා ඇය හැමදාමත් ඒ වචනය ලිව්වේ වැරදි විධියට. ඉතින් පිටට පිහිපාරක් වැදුණු ගමන් අක්ෂර වින්‍යාසය නිවැරදි වීම හරි පුදුමාකාර සිදුවීමක්. ඒ අනුව ලියුම් කැබැල්ල ලියුවේ වෙනත් පුද්ගලයෙකු විසින්ය කියන සැකය මගේ හිතේ ඇතිවුණා.

තවත් කාරණයක් තමයි සර් රේමන්ඩ් බ්ලැක්වෙල් යනවා කියා ආර්යාව කියූ, සමාජශාලා පිළිබඳ ප්‍රශ්නය. මං ටැන්කර්විල්, පෝල්මෝල් සහ කාල්ටන් යන සමාජශාලා තුනටම ගිහින් විමසා බැලුවා. එහි කාඩ් ක්‍රීඩාවේ යෙදෙන අය සහ තැබෑරුමට ආ අය පැමිණි හා පිටව ගිය වෙලාවන්, ඒ අංශය භාර සේවකයා පොතක සටහන් කරගන්නවා. නමුත් ඔය කියන බදාදා දවසේ සර් රේමන්ඩ් අපට කී එකම සමාජ ශාලාවකටවත් ගිහින් නැහැ; රෑවත් දවල්වත්. එතකොට එදා රෑ දහයත් දොළහත් අතර ඔහු සිටියේ කොහේද?"

* * *

එලිසබත් හාපර් ඝාතනය ගැන නඩු විභාගය ඕල්ඩ් බේලි අධිකරණයේදී විභාගයට ගැනිණ. සර් රේමන්ඩ් බ්ලැක්වෙල් සහ සුසාන් මොන්රෝ බ්ලැක්වෙල් ආර්යාව විත්තිකරුවන් ලෙස නම් කොට තිබිණි. ඔවුන් බේරාගැනීමට විත්තියේ ප්‍රධාන නීතිඥයා වූ සර් වින්ස්ටන් කනිංහැම් දැඩි උත්සාහයක යෙදුණේය. එහෙත් එය එතරම් සාර්ථක නොවිණි. බ්ලැක්වෙල් ආර්යාව නිදොස් කොට නිදහස් කරන ලදී. නමුත් සර් රේමන්ඩ් බ්ලැක්වෙල්ට මරණ දඬුවම හිමිවිණි.

# තෝන්ටන්හි ධාවන තරඟය

"ඔබ ඔය කරන වැඩේ නම් මට කොහොමට වත් අනුමත කරන්න බෑ වොට්සන්" එක් දිනක් මගේ මිත්‍රයා කීවේ අපේ විසිත්ත කාමරයේ මට පිටුපා සිටගෙන සිටියදීය.

"මොන වැඩේද?" මම ඇසීමි.

"ඔබ ඔය කරන්නෙ රේස් ඔට්ටු ඇමීමට අශ්වයින් තේරීම නේද?"

"ඔව් හරි. ඒක තමයි. ඒත් හෝම්ස් හරිහැටි මං දිහාවත් නොබලා ඔබ කොහොමද ඒක දැන ගත්තෙ? ඔබ ඉදිරියේ කැටපතක් වැනි දිලිසෙන කෝපි පෝච්චියක් වත් නොමැති බව මට පෙනෙනවා. ඉතින් කොහොමද......?"

"කෝපි පෝච්චියක් නැතත් ටිකක් ඈතින් ජනේලයක් තියෙනවානෙ. ජනේලයේ වීදුරු පියනත් සමහර වෙලාවට කැටපතක් වගේ ක්‍රියාකරනවා."

"ඒ වුණත් මං මේ යෙදෙන්නේ අශ්වයින් තේරීමක බව කොහොමද ඔබ නිශ්චිතවම දැනගත්තෙ?"

"ඒක ඉතාමත් සරලයි මගේ මිත්‍රයා. ඔබේ දකුණු දණහිස මත තිබෙනවා කුඩා සටහන් පොතක්. ඒකෙ කවරයට අමුණා තියෙනවා සුදු කඩදාසියක අඩක්. ඔබේ වම් අතේ තියෙනවා දෙකට නැමූ මෝනිං ක්‍රොනිකල් පත්‍රය. ඔබ පෙරළාගෙන ඉන්නේ එහි 12 වැනි පිටුව. අශ්වයින් හා උන්ගේ රේස් ගැන තොරතුරු මිසක් වෙන මොනවද ඒ පිටුවෙ තියෙන්නෙ? අනික මං ඔය දේ දැන් අවුරුදු ගණනාවක් තිස්සෙ දැකල තියෙන දෙයක් නේ"

"ඔබ කියූ හැම දෙයක්ම ඇත්ත. නමුත් මොකක්ද ඔබ කොහොමටවත් අනුමත කරන්නෙ නැහැ කිව්වෙ?"

"ඔය රේස් ඔට්ටු ඇමීම තමයි මං කොහොමට වත් අනුමත කරන්නෙ නෑ කිව්වෙ. වෙනිං වචනවලින් කිව්වොත් සූදු කෙළීම. වොට්සන් දැන් ඔබ දීර්ඝ කාලයක් තිස්සේ ඔට්ටු ඇම්මා නේ. මිත්‍රයා, ඔබ එයින් දිනාගත් පවුම් ලක්ෂ ගණනක් ඔබේ බැංකු ගිණුම් වල ඇතිනේ?"





"මං අන්තිම දූප්පතෙක් බව දැන දැනත්, ඇයි හෝම්ස් ඔබ ඔය වගේ කෲර වචන කියන්නේ? මං ජීවිතේටම දිනුවේ දෙපාරයි. එක් වරක් පවුම් විසි දෙකක් දිනුවා. තවත් වාරයක් පවුම් දොළහයි සිලිං අටක් දිනුවා."

"නමුත් මේ වෙනකොට ඔබ පරාජය වී තිබෙන මුදල එකතු කළොත් පවුම් අටසියයකට වැඩි ඇති?"

"ඔබ හිතුවා හරි. මං පරාජය වී ඇති මුළු මුදල පවුම් දහසකට වැඩි වුණොත් මිසක් අඩුවෙන්නෙ නෑ. ඇයි හෝම්ස් ඔබ ඔය කාරණය මතක් කරලා මගේ හිත රිදවන්නේ?"

"ඒ එකම අරමුණකින් - ඔබ ඔය දුශ්චරිතයෙන් මුදවා ගන්න" හෝම්ස් කීය. "සෑම ආගමකම ශාස්තෘවරුන් කියා තිබෙන්නේ සූදුව දුශ්චරිතයක් කියලා. ලැබෙන තරමක් තිබෙන තරමක් ධනය විනාශ කරලා, අන්තිමට ඔබ පත්වන්නේ විනාශයට"

"මං පිළිගන්නවා" මා කීවේ පරාජයට පත් හඬෙනි.

"අපේ නිරීක්ෂණවලදී පවා අපට කොයි තරමක් එහෙම අය හමුවෙලා තියෙනවද? අර ශිෂ්‍යයින් තුන් දෙනාගෙ සිද්ධියෙදි අහන්න ලැබුණු සර් ජේබ්ස් ගිල්ක්‍රිස්ට් මතකද? ඔහු සූදුවට ගිහිං මුළු සේසතම නැතිකරගත් කෙනෙක්. ඇයි දියමන්ති ඔටුන්න සිදුවීමෙ ආතර් හෝල්ඩර්? බොස්කෝම්බ් නිම්නයේ මැකාතිලත් ඊට දෙවැනි වෙන්නෙ නැහැනේ"

"මං පිළිගන්නවා මිත්‍රයා. මේ නරක පුරුද්ද මං කොහොම හරි අත්හැර දැමිය යුතුයි" මම කීවෙමි.

"ඔබේ රේස් ඔට්ටු ඇමීම ගැන මට අලුතෙන් මතක් වෙන්න එක හේතුවක් වුණේ මෙන්න මේක" හෝම්ස් කීවේ ගිනි උදුන් පඩිය මත තිබූ විදුලි පුවතක් මා අත තබමිනි.

**"මගේ ධාවකයා අතුරුදන්. වහා සොයාගත යුතුමයි. හෙට උදේ දහයට ඔබේ නිවසට එමි. කාල් මිලර්"**

"කවුද මේ පුද්ගලයා?"

"මම දන්නෙ නෑ වොට්සන්. ඔය වෘත්තීය ලෙස ධාවන තරඟවල යෙදෙන අය ගැන තොරතුරු තිබෙන කෝෂ ග්‍රන්ථයක් ඔබ ළඟ තිබුණා නේද?"

"ඔහොම ඉන්න බලන්න" කී මම එම පොත සෙවීමට පටන් ගත්තෙමි. මෙවැනි ධාවන තරඟ පවත්වන තැන්, එම තරඟ පිළිබඳ තොරතුරු, ධාවකයින් හා ඔවුන්ගේ අයිතිකරුවන්ගේ නම් එම පොතේ අඩංගු වී තිබිණ. ඉතා කුඩා අකුරින් මුද්‍රණය කර

තිබූ එය ප්‍රමාණයෙන් කුඩා අත්පොතකි. මෑත කාලයේ එතරම් ප්‍රයෝජනයට නොගත් බැවින් එය අස්ථානගතවී තිබිණ.

"මට ඒක හොයාගන්න බෑ හෝම්ස්"

"කමක් නෑ. තොරතුරු අපි ඔහුගෙන්ම අහගනිමු"

අමුත්තා නියම කර ගත් වෙලාවටම එහි පැමිණියේය. උසින් අඩි හයකට වැඩිවූ ඔහු ගේ සිරුර, කලකට පෙර ශක්තිමත් හැඩිදැඩි එකක්ව තිබෙන්නට ඇති බැව් සිතාගත හැකි විය. කෙසේ වෙතත් මේ වන විට ඔහුගේ වයස අවුරුදු හැටපහක් පමණ වී ඇතැයි මම අනුමාන කළෙමි. උස් ඍජු නැහැයක් තිබූ ඔහුගේ දුඹුරු පැහැති දෙනෙත්වල තිබුණේ ඍජු මෙන්ම මඳක් සැරපරුෂ බවකි.

"හෝම්ස් මහත්මයා. මං එවූ විදුලි පුවත ඔබට ලැබෙන්න ඇති කියල මං විශ්වාස කරනවා" ගොරෝසු කටහඬකින් ඔහු කීවේ මගේ මිත්‍රයා පෙන්වූ අසුනේ හිඳගනිමිනි. "මෙවැනි තේරුම් ගන්න අමාරු ප්‍රශ්නයක් ආවම ඔබව හමුවෙන්න කියල, දෙදෙනෙක්ම කලකට පෙර මට අවවාද කර තිබුණා. එයින් එක්කෙනෙක් බ්ලැක්පූල්හි වයලට් රොජර්ස් මෙනෙවිය. ඇගේ මාමා අබිරහස් ලෙස මියගිය වෙලාවෙ ඒ ගැටලුව නිරාකරණය කර දුන්නේ ඔබ බව ඇය කිව්වා"

"ආ ඔව්. ඒ හුග කලකට පෙර වගෙයි මට මතක. කවුද අනික් එක්කෙනා?"

"අනික් එක්කෙනා එඩ්ගා ලෙනොක්ස් මහත්මයා. ඔහුගේ සොහොයුරා අබිරහස් ලෙස අතුරුදන්වුණාලු. ඒ ගැන සොයල ඒක විසඳල දුන්නේ ඔබ බව කිව්වා"

"ආ ඔව්. මේ වොට්සන් දොස්තර මහත්මයාත් මට ඒකට උදව් වුණා. එඩ්ගා ලෙනොක්ස් මහත්මයා ළඟදී ආපසු එංගලන්තයට ඇවිත් යළිත් නවසීලන්තය බලා ගිය බව මං පුවත්පත්වල දුටුවා. මිලර් මහත්මයා. ඔබේ ප්‍රශ්නය මට කියන්න"

"හොඳයි. මහත්මයා මං බ්‍රිතාන්‍ය යුද්ධ හමුදාවේ දිගු කලක් සේවය කරලා මේජර්වරයෙකු ලෙස විශ්‍රාම ගත් කෙනෙක්. මට එතරම් ලොකු විශ්‍රාම වැටුපක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මං මගේ ගෙදරම කොටසක කුඩා අවන්හලක් පවත්වාගෙන යනවා. ඊට අමතරව මුදලක් උපයා ගැනීම සඳහා කෙටිදුර හා දිග දුර ධාවන තරඟවල යෙදෙන්නන්ට ආධාර කර ඔවුන් ඒ සඳහා ඉදිරිපත් කරනවා.





පහුගිය දවස්වල මූලික තරඟ පැවැත්වුණු තෝන්ටන් යාර 220 හා 440 තරඟ ගැන ඔබට අහන්න ලැබිලා ඇති. මේ කාලයේ මගේ ධාවකයා මං ඉදිරිපත් කරන්නේ ඒ තරඟවලටයි.

පහුගිය සඳුදා යාර 220 මූලික තරඟවලදී මගේ ක්‍රීඩකයා පර්සි හන්ට් පළමුතැනට ආවේ දෙවැන්නාට වඩා යාර විස්සක් පමණ ඉදිරියෙන්.

මහත්මයා ඔහු ගම්බද තරුණයෙක්. බොහොම ඈත පළාතකින් ඔහු මා ළඟට ආවේ කුලී වැඩට. ඔහු ඉතා කීකරු එමෙන්ම නිශ්ශබ්ද තරුණයෙක්. මං දඩයමේ යද්දී මගේ උදව්වට මං ඔහුව කැඳවාගෙන ගියා. දුවන්න පනින්න ඔහුට තිබෙනවා උපතින්ම ලැබුණු දක්ෂ කමක්. ඒ බව මං තේරුම් ගත්තේ දඩයමේ ගිය අවස්ථාවල. සුදුසු පරිදි පෝෂණය සහ හොඳ පුහුණුකරුවෙකු ලැබුණොත්, පර්සි හොඳ වෘත්තීය ධාවකයකු කළ හැකි බව මං තේරුම් ගත්තා.

මං යුද හමුදාවේ දිගු කලක් සේවය කළා. ඒ කාලයෙන් අඩක්ම ශාරීරික යෝග්‍යතා හා අභ්‍යාස පුහුණු කරුවෙකු ලෙසයි මං කටයුතු කළේ. ඒ නිසයි තරුණයා ධාවකයකු වීමට සුදුසු බව මට වැටහුණේ. අවන්හලේ වැඩ කටයුතු සොයා බලමින්, ඔහු පුහුණුකිරීමේ කටයුතු කරන්න මට විවේකයක් නැහැ. ඒ වගේම දැන් මම වයස්ගත නිසා මට දීර්ඝ වේලාවක් එළිමහනේ ගතකරන්නත් අමාරුයි. අනික් කාරණය තමයි මේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ පුහුණුව ගැන, කාලෙන් කාලට අලුත් අලුත් කාරණා එනවා. පරණ ඒවා ඉවත්වෙනවා. ඒ නිසා වෘත්තීය පුහුණුකරුවෙකු බඳවා ගන්න මං තීරණය කළා.

එමිල් ගොඩ්වින් නම් මේ වෘත්තීය පුහුණුකරු අවුරුදු තිහක පමණ කෙනෙක්. ක්‍රීඩකයන් පුහුණු කිරීම ගැන ඔහුට හොඳ දැනුමක් මෙන්ම පළපුරුද්දක් තිබෙනවා. ඔවුන් දෙදෙනා පදිංචි වී ඉන්නේ මගේ අවන්හලට යාර පනහක් පමණ දුරින් පිහිටි මට අයත් නිවසක. ක්‍රීඩකයන් පුහුණු කිරීමේ ධාවන පථය තිබෙන්නේ එයට පිටුපසින්. මේක ගල් අඟුරු කුඩු යොදා සකස්කළ ධාවන පථයක්. අපේ නිවාස, ධාවන පථය හා ව්‍යායාම පුහුණුවන පිට්ටනිය ආරක්ෂා කිරීමට, මෑතකදී සකස්කළ ආරක්ෂක වැටක් තිබෙනවා.

පහුගිය බ්‍රහස්පතින්දා දවල් දෙකට පමණ මම හිටියේ අවන්හලේ. මං මගේ ගනුදෙනුකරුවෙකු සමග කතාබහ කරමිනුයි හිටියේ. එකපාරටම මගේ පුහුණුකරු ගොඩ්වින් එතැනට කඩාවැදුණේ මහා කලබලයකින් වගේ.

"මහත්මයා! මිනිහ යන්න ගිහින්....... පර්සි පැනල ගිහින්.......!"

"මොකක්?"

"පර්සි යන්න ගිහින්. මට එයාව හොයාගන්න බෑ." ඔහු කීවේ අතේ රඳවාගත් ස්වෙටරයක් ඒ මේ අතට කරකවමින් කැලඹුණු මුහුණකින්.

"මොකක්ද ඒ කතාවෙ තේරුම?" මං ඇහුවා. "පිස්සු කතාවක් නේ. එයා කොහේ යන්නද? හොයා බලනවා ඉක්මනට. මේ වත්ත ඇතුළෙ කොහේ හරි ඇති. මෝඩයෙක් නොවී ඉවසිල්ලෙන් හොයා බලනවා. උදව්වට ඕනෙ නම් මෙහෙන් කවුරු හරි අඬගහ ගන්නවා"

"තව කොච්චර බැලුවත් කිසිම ප්‍රයෝජනයක් වෙන්නෙ නෑ මිලර් මහත්මයා" ගොඩ්වින් කිව්වා. "සෑහෙන වෙලාවක් ගතකරමින් හැමතැනකම මං ඔහුව හෙව්වා. ඒක අසාර්ථක වුණාමයි මං මේ ආවෙ."

"කොහේදිද ඔබ අන්තිමට ඔහුව දැක්කෙ?"

"ධාවන පථය මුල ඔහු ව්‍යායාම කරමින් ශරීරය උණුසුම් කරමින් හිටියේ" ගොඩ්වින් කිව්වා. "ක්‍රීඩා ඇඳුම්වලට උඩින් ඔහු ශරීරය උණුසුම්ව තබාගැනීමට අඳින, දිග කබාය ඇඳල හිටියා. හිසේ කැප් තොප්පිය දමාගෙන හිටියා. මං පිස්තෝලයක් අරගෙන එතැනට ගිහිං හිටියේ, තරඟ ආරම්භයට ඔහුව පුහුණු කරන්න. එතකොට ඔහු කිව්වා,

"එමිල්. සුළං පාර හරි සීතලයි. මං හිතන්නේ ස්වෙටරය ඇඳ ගත්තොත් හොඳයි. මගේ ස්වෙටරය ඇත්තේ මගේ කාමරයේ අල්මාරියේ. ඔබට පුළුවන්ද කරුණාකරල ඒක අරගෙන එන්න?"

"ඉතින් මං ආපහු ඇවිත් ඔහුගේ ස්වෙටරය අරගෙන ගියා" ගොඩ්වින් කිව්වා. "ගිහින් බලනකොට ඔහු අතුරුදන් වෙලා. ඔහුට මොනවා වුණාද කියල මට හිතාගන්නවත් බෑ. මං මොනවා කරන්නද? පුළුවන් හැම තැනකම හෙව්වා. ඔහු මේ විදියට පැනල ගියේ ඇයි කියල මට නම් තේරුම්ගන්න බෑ"

"ඊයෙ හවසයි හෝම්ස් මහත්මයා මේක සිද්ධවුණේ. පර්සි කොයි මොහොතක හරි ආපහු එයි කියන විශ්වාසයෙන් අපි බලාගෙන හිටියා. ඊයෙ හවසම ඔබට විදුලි පුවතක් එවන්න මං තීරණය කළා. ඒ ඔබගෙන් වෙලාවක් ලබාගන්න අපහසු වේවි කියන බය නිසා. මං අර කලින් සඳහන් කළ හිතවතුන් දෙදෙනා ඔබ ගැන මට කියල තිබුණෙ කාලෙකට පෙර"





"පර්සි හන්ට් කියා නේද ඔබ ධාවකයාගේ නම කිව්වෙ?"

"ඔව් මහත්මයා"

"තවමත් ඔහු ගැන කිසිම ආරංචියක් නැ?"

"නැහැ මහත්මයා"

"ඔහු තමන්ගේ කැමැත්තෙන් පිටවෙලා ගියා නම්, මොකක් හරි ලියුමක් ලියා තබා, නැතිනම් ඔබට කථාකර, යන්න යනවා කියා හිතන්න බැරිද?"

"ඒක තමයි හෝම්ස් මහත්මයා. පර්සි මට එක වචනයක් කීවේ නැහැ. මං ඔහුගේ කාමරය පරීක්ෂා කළා. කිසිදු ලියුම් කැබැල්ලක් හෝ සටහනක් එහි තිබුණේ නැහැ. ඔහුගේ ඇඳුම් වත් රැගෙන ගිහින් නැහැ"

"ඔහු මේ ආකාරයට ගෙදරින් පැනගියා කියා හිතන්න අමාරුයි" හෝම්ස් කීය. "කවුරුන් හෝ ඔහුව පැහැරගෙන ගියා වෙන්න බැරිද?"

"ඔබ හරි මහත්මයා! ඔබ හරි!" අමුත්තා කීය. "මගේ හිතෙත් ඇතිවුණු සැකය ඒකයි. පර්සි සමග අවසන් තරඟයට තේරී ඉන්නවා තවත් පස්දෙනෙක්. ඔවුන්ගේ අයිතිකරුවනුත් තරඟකරුවන් පුහුණුවට මුදල් විශාල වශයෙන් වියදම් කළ අය. නමුත් පසුගිය තරඟවල ප්‍රතිඵල අනුව, ඔට්ටු අල්ලන අය බොහෝ දෙනෙක් වැඩිම මුදල් ප්‍රමාණයක් ඔට්ටු අල්ලා තියෙන්නෙ පර්සිගේ ජයග්‍රහණයට. නියමිත දිනයට ඔහු තරඟයේ නොදිව්වොත් මට ඇතිවෙන පාඩුව අති විශාලයි"

"මිලර් මහත්මයා" හෝම්ස් කීය. "දැන් මං කැමතියි ඔබේ ක්‍රීඩකයා ගැන ඔබ නොකී තොරතුරු ටිකක් දැනගන්න. ඔහු ඔබ ළඟට ඇවිත් කොපමණ කල්ද?"

"අවුරුදු හතරක් පමණ වෙනවා"

"දැන් ඔහුගේ වයස?"

"විසි තුනයි"

"මේ ඔබ ඔහුව ධාවන තරඟවලට ඉදිරිපත් කරන පළමු වාරයද?"

"ඔව් මහත්මයා. ඒක තමයි මට තියෙන හිතේ අමාරුව. මං ඔහු වෙනුවෙන් කොයි තරම් ලොකු මුදලක් දැනටමත් වියදම් කරලා තියෙනවද?"

"පර්සි මේ තරඟයට නොආවොත් කාටද වාසි?"

"ඇයි මහත්මයා, මං කලින් කිව්වේ? තව තරඟකරුවන් පස් දෙනෙක් ඉන්නවා. එයින් ප්‍රධාන චාල්ස් බැරී සහ ඩික් ජෝන්ස් දෙන්නා. චාල්ස් බැරී තමයි පහුගිය අවුරුදු හතරෙම තිබූ හැම තරඟයක්ම ජයග්‍රහණය කළේ. ඔහුගේ අයිතිකරුවා සැමුවෙල් හිල් නම් ඉඩම් හිමි වැවිලිකරුවා. ඔහු විශාල ධනවතෙක් වුණේ චාල්ස් බැරී ඔට්ටු හරහා දිනාදුන් මුදල් නිසා. ඩික් ජෝන්ස් වෙනදා දෙවැනි තැනට එන ධාවකයා. මගේ පර්සි නිසා දැන් ඩික් තුන්වැනි තැනට වැටිලා. ඔහුගේ අයිතිකරුවා සර් විලියම් බ්‍රශ්. මේ රේස් ඔට්ටු තරඟ නිසා සර් විලියම් දැන් මා එක්ක අමනාපයි. පාරෙදි දැක්කත් අහක බලාගෙන යනවා."

"එතකොට චාල්ස් බැරීගෙ අයිතිකරු?"

"ඔහුගේ හිතේ යටින් නම් ඊර්ෂ්‍යාවක් ඇති. නමුත් ඒ බවක් මට කොයිම වෙලාවකවත් පෙන්නුවේ නෑ. ඔහු නොවරදවාම දෙව්මැදුරට යන ගුණ යහපත් කෙනෙක්."

"තවදුරටත් මෙහේට වෙලා ඔය ගැන සාකච්ඡා කිරීමෙන් ප්‍රයෝජනයක් නෑ මහත්මයා" හෝම්ස් කීය. "මං හිතන්නේ වහාම ඔය ස්ථානයට ගිහිං අප පරීක්ෂා කර බැලිය යුතුයි. ඒ මොකද වැදගත්ම හෝඩුවාවන් වුණත්, ඉක්මනට මැකී යන්න ඉඩ තියෙනවා. එහෙම වුණොත් ඒක අපට විශාල පාඩුවක්. තෝන්ටන් වෙත යාමට මීළඟ දුම්රිය තිබෙන්නේ කීයටද මහත්මයා?"

"තවත් මිනිත්තු හතළිහකින් පිටත්වෙන දුම්රියක් තියෙනවා" මිලර් මහතා කීවේ තම සාක්කු ඔරලෝසුව පරීක්ෂා කරමිනි. "ඒ ක්ලැප්හැම් මංසන්ධියෙන්"

* * *

වැඩි පමාවක් නොවී අපි තෝන්ටන් වෙත ළඟාවූයෙමු. මිලර්ගේ නිවස, අවන්හල, ක්‍රීඩකයාට හා පුහුණුකරුට වෙන් කළ නිවස ආදිය පිහිටා තිබුණේ, දුම්රියපොළේ සිට සැතපුමක පමණ දුරකිනි. ප්‍රමාද වී ගත් දහවල් ආහාරයෙන් පසු හෝම්ස් තම පරීක්ෂාව ඉක්මනින් ඇරඹුවේය.

ධාවන පථයේ තිබූ මඳක් ගැඹුරු සිදුරු දෙකකට ඔහුගේ අවධානය මුලින්ම යොමුවිය. තරඟයේ ආරම්භය පුහුණුවීමට යොදාගත් ස්ථානය මෙය බැව් මිලර් පැහැදිලි කළේය. එතැන සිට පථයේ ඉදිරියට අලුතින් ඇතිවුණු සලකුණු කිහිපයක්ම විය. ඒවා ජවන පාවහන්වල තියුණු උල්වලින් ඇතිවූ සලකුණු ලෙස හෝම්ස් හඳුනාගත්තේය. ක්‍රීඩා භූමිය මායිම් වූයේ උසින් වැඩි





මායිම් වැටකිනි. එය සමීපයට යාර තුන හතරක් පමණ වන තුරු තිබූ දිවීම පුහුණු වූ සලකුණු කිසිවක් එතැනින් එහාට නොවීය. එම ස්ථානයේ සිට පියවර කිහිපයක් දකුණු පසට වන්නට මායිම් වැටේ, ගේට්ටු පියනක් සහිත දොරටුවක් තිබිණ. හෝම්ස් එය විවෘත කිරීමට උත්සාහ කළේය. ගේට්ටු පියන තිබුණේ අඩවන්ව බැව් එවිට අපි දුටුවෙමු.

"මේක හැමතිස්සේම අගුළුදාලයි තියෙන්නෙ" මිලර් කීය. "ඔහු ගිහින් තියෙන්නෙ මෙතැනින්. එයාට පිටවෙලා යන්න වෙන තැනක් නෑ. ගේ ඇතුළට ඇවිත් ගේ ඉස්සරහ ප්‍රධාන ගේට්ටුවෙන් නොගියා නම්"

"ඒ වුණත් ඔහු යාර තුනක් පමණ දිග පියවරක් තබන්න පුරුදු වෙලා හිටියෙ නැහැ නේද? ඔහුගේ පාවහන්වල සලකුණු මේ හරියෙත් නෑ, දොරටුවෙන් එළියෙත් නෑ." හෝම්ස් කීය.

ගේට්ටු පියන විවෘත වූයේ පටු මාවතකටය.

"මේක බොහොම නිශ්ශබ්ද පාරක් වගේ?" හෝම්ස් කීවේ මිලර් අමතමිනි. "ගෙවල් මොකක්වත් නෑ. මේක වැටෙන්නෙ කොහේටද?"

"අර පැත්තට ගියාම තියෙන්නෙ පාච්චිය අත්හැර දැමූ හුණු පෝරණු වගයක්. මේ පැත්තට ගිහිං වංගුවක් පහු කළාම පාර සම්බන්ධ වෙන්නෙ මොරිස් පාරට. ඒක කෙළින්ම තෝන්ටන් වලට සම්බන්ධයි."

යළිත් වරක් ධාවන පථය වෙත ගිය හෝම්ස් බිම වැතිරී පොළොව වෙත තම මුහුණ ළංකොට, එහි තිබූ සලකුණු දැඩි අවධානයකින් පරීක්ෂා කළේය.

"ඔබේ ක්‍රීඩකයා ආපසු ගෙදරට නොගිය බව නම් සහතිකයි" හෝම්ස් කීය. "මේ තියෙන්නෙ දෙන්නෙක් ගෙදර ඉඳල එකටම මෙතැනට ආව පා සටහන්. මේ ගොඩ්වින්ගේ සාමාන්‍ය පාවහන්වල ලකුණු. මේ පර්සිගේ ජවන පාවහන්වලින් ඇතිවුණු ලකුණු, ඊළඟට මෙන්න තියෙනවා ගොඩ්වින් පමණක් තනියම ආපහු ගිය සලකුණු. ඒ ඔහු ස්වෙටරය අරගන්න ගිය වෙලාවෙ ඇතිවුණු ලකුණු. නමුත් පර්සි දිගටම ධාවන පථයේ රැඳී ඉඳල තියෙනවා. මේ බලන්න ඔහු ඒ පැත්තට මේ පැත්තට ඇවිදිමින් රැඳී සිටි හැටි........" කතාව අත්හිටවූ මගේ මිත්‍රයා පොළොවේ තිබූ සලකුණු දෙස නෙත් යොමුකරගෙන සිටියේ තරමක් විමතියට පත්වය.

"මෙන්න මෙක ගැන තමා අපට කිසිම දෙයක් හිතාගන්න අමාරු" හෝම්ස් කීවේ සිටි තැනම නැවතෙමිනි. "ඔබ මේ දිහා හොඳින් බැලුවොත් ඔබට තේරේවි. පර්සි අන්තිමේ දී ගමන් කරලා තියෙන්නේ එළියට යෑමට තියෙන දොරටුව දෙසට නෙමෙයි; ඔහු ගිහින් තියෙන්නේ මායිම් වැට දෙසට. ඒකත් පියවර දෙකක් හෝ තුනක් පමණයි. එතැනින් පස්සේ ඔහුගේ පා සටහන්වලට මොකක් වුණාද කියල හිතාගන්නත් බෑ. ඒ මොකද මොනම පා සටහනක්වත් නෑ. ඔහු ඉදිරියට ගිහිල්ලත් නෑ. ආපහු ඇවිල්ලත් නෑ....... මහත්මයා. ඔන්න ඔබේ ක්‍රීඩකයා පර්සිට පියාපත් තිබුණානම් මට නිගමනය කරන්න තිබුණා ඔහු කෙළින්ම උඩු ගුවනට පියාඹා ගියා කියලත්. එහෙමත් නැත්නම් පොළොවේ විවරයක් සෑදී ඔහු පොළොව ඇතුළට ගිලුණා; ඊට පස්සේ ඒ විවරය වැසී ගියා කියල. නමුත් මොකක්ද සිදු වුණේ? කිසිම සලකුණක් පොළොවේ ඉතුරු නොකර පර්සි හන්ට් අතුරුදන් වුණේ කොහොමද?"

ඊට කිසිදු පිළිතුරක් නොදුන් මිලර් මහතා බලා සිටියේ දොම්නස් මුහුණකිනි.

"හොඳයි මිලර් මහත්මයා." හෝම්ස් කීවේය. "ඒව ගැන අපි හෙමින් සැරේ හොයා බලමු. මීළඟට මම දැනගන්න කැමතියි තැන් දෙකකට යන්න පුළුවන් මාර්ග ගැන."

"තැන් දෙකකට?"

"ඔව්. එකක් සැමුවෙල් හිල් මහත්මයා ඔහුගේ ක්‍රීඩකයා පුහුණු කරන හා ඔවුන් පදිංචිව සිටිනා තැනට. අනික සර් විලියම් බ්‍රෂ්ගේ ක්‍රීඩකයා පුහුණුවීම් කරන හා පදිංචි තැනට."

"හෝම්ස් මහත්මයා. ඉස්සර කාලේ මේක ඉතා විශාල තුරඟ තරඟ පිටියක්. ඩාබිවල තුරඟ තරඟ පටන් ගත්තාම මේක අත්හැර දැමුණා. ඊට පස්සේ මෙහි අයිතිකරු ඉඩම් කොටස් වෙන්දේසියේ විකුණුවා. ධාවන තරඟවලට ක්‍රීඩකයන් ඉදිරිපත් කළ හැමදෙනෙකුම ඉඩම් කැබලි මිලට ගත්තා. ඒ නිසා අපි හැමදෙනෙකුගේම නිවාස, ක්‍රීඩා පථ ආදිය තිබෙන්නේ මේ තුරඟ තරඟ පිටිය වටේට. මේකෙ එක් පැත්තක් නම් ක්‍රිකට් ක්‍රීඩාංගනයක් බවට පත් කර තිබෙනවා. ඔබ මොරිස් පාර පැත්තට සම්බන්ධ වෙන දිශාවට ඇවිදගෙන යන්න. එතකොට ඔය ඕන තැනකට යා හැකියි. හිල්ගේ හෝ සර් විලියම්ගේ ගෙවල් කොහේද කියලා කාගෙන් හරි අහන්න."

"හොඳයි. මං කැමතියි වහාම ඒ පැත්තට යන්න." හෝම්ස් කීය. "ඈතින් වැහිවලාකුළක් මේ පැත්තට පාවී එන බව ඔබට





පෙනෙනවා ඇති. ඒ නිසා තව පැයක් එක හමාරක් යද්දී අඳුරු වැටෙන්නත් පුළුවනි. බලාගන්නා දෙයක් අප ඊට කලින් බලාගත යුතුයි. අපි වහාම පිටත් වෙමු වොට්සන්."

මගේ මිත්‍රයා මායිම් වැටේ තිබූ දොරටුවෙන් පාරට පිවිසියේ පොළොවට දැඩි අවධානයක් යොමු කරමිනි. එහි පොළොවේ විශේෂත්වයක් මම නම් නුදුටුවෙමි. මට නම් දකින්නට ලැබුණේ හරි හැටි නඩත්තු නොකළ, ගම්බද ක්‍රීඩා පිටියක ස්වභාවයයි. විවිධ වර්ගවල තණකොළ සහ වල් පැළෑටි එහි වැවී තිබිණි. ඒවා කපා මට්ටම් කරන ලද්දේ, එහි නිදහසේ තණ කෑ ගවයන් හා බැටළුවන් විසින් බැව් මම තේරුම් ගතිමි.

අප යාර දහයක් ඉදිරියට යාමටත් පෙර හෝම්ස්ට සැලකිය යුතු හෝඩුවාවක් ලැබිණ.

"හො හෝ! මේ තියෙන්නෙ මං නොහිතූ දෙයක්" ඔහු කීවේ පොළොවේ දණ ගසා ගෙන ඒවා අහුළමිනි. ඒ කවුරුන් හෝ ඉරාදැමූ සුදු පැහැති කඩදාසියක කැබලි රැසකි. කබා සාක්කුවෙන් ගත් කවරයකට ඔහු ඒ සියල්ල එකතු කර ගත්තේය.

"අපි වටේටම බලමු වොට්සන්. සමහරවිට හුළඟට ගහගෙන ගිය ලියුම් කෑලි තියෙන්න පුළුවනි"

අප ඉතා උනන්දුවෙන් සොයා බැලුවත් තවත් කැබලි කිසිවක් එතැන නොවීය.

"ජවන පාවහන්වලින් ඇවිද ගිය කෙනෙකුගේ කිසිම සලකුණක් නෑ. වාහන කිහිපයක් එහා මෙහා ගිය ලකුණු නම් තියෙනවා. ඒවා ඉතින් මේ වගේ පාරක ඕනෑ තරම් දකින්න පුළුවන් නේ. වැස්සක් ළඟ එනවා වොට්සන්. දැන් අපට කරන්න තියෙන්නේ ඉක්මනින් ආපහු යන එකයි"

අපි හැකි ඉක්මනින් මිලර් මහතාගේ අවන්හල වෙත ආපසු පැමිණියෙමු.

"හෝම්ස් මහත්මයා. ඔබට හැකිවුණාද ඔහු ගැන තොරතුරක් හොයාගන්න?" මිලර් මහතා විමසුවේ ඔහු හිඳගෙන සිටි කළමනාකාර අසුනෙන් නැගිට අප දෙසට පැමිණෙමිනි.

"ඔබේ රාජකාරි අවසන් කර එන්න" හෝම්ස් කීය.

මුදල් ගෙවීමට බලාසිටි ගනුදෙනුකරුවෙකු පිටවී ගිය පසු මිලර් මහතා අප වෙත පැමිණියේය. අවන්හලේ සේවිකාවෝ දෙදෙනා එහි මුළුතැන් ගෙය දෙසට පියනැගුහ.

"පර්සි හදිසියේම අතුරුදන් වී ඇති බව ඔබේ සේවිකාවන් දන්නවද?"

"ඔව් මහත්මයා. ගොඩ්වින් ඒ බව මට දැනුම් දුන්නෙ ඔවුන් ඉදිරිපිටදී ම නේ"

"මේ වෙලාවෙ ගොඩ්වින් කෝ?"

"ඔහු ට්වයිෆර්ඩ්ස් වෙත ගියේ අද උදේමයි" මිලර් කීය. "ඔහුගේ දෙමව්පියන් පදිංචි එහේ, මෙතැන සිට හැතැක්ම හතරක් පමණ දුරින්. ඔහු මෙහේ ඉඳලා කළ යුතු වැඩක් නොමැති නිසා මං ඔහුට යන්න අවසර දුන්නා. ඒ වුණත් හෙට උදේ ආපහු එවි"

"මිලර් මහත්මයා. මේ පරීක්ෂණය සඳහා දවසක් හෝ දෙකක් අපට මේ නගරයේ රැඳී ඉන්න වේවි. තෝන්ටන්වල සතුටුදායක තානායමක් හරි හෝටලයක් හරි තියෙනවද?"

"තෝන්ටන් තානායම තිබෙනවා. ඒක ඉතාම ඉහළ තත්ත්වයේ එකක් කියන්න අමාරුයි. නමුත් ඔබේ කෑම වේල් ගැන මට බලාගන්න පුළුවනි. අද රාත්‍රියට ඔබ දෙදෙනාට තානායමේ කාමර වෙන් කරන්න මං මගේ මුරකාරයා යවන්නද?"

"ඒක ඉතාම හොඳයි" හෝම්ස් කීය. "මෙන්න ඒ සඳහා මුදල්. ඔවුන්ගේ තිබෙන හොඳම කාමර දෙක අප වෙනුවෙන් වෙන් කරන්න කියන්න"

"හරි. රාත්‍රී ආහාරයෙන් පසු මං එතැනට ඔබ මගේ අශ්ව කරත්තයෙන් කැඳවාගෙන යන්නම්. හෙට උදේ තේ පානයට ඔබට මෙහේට එන්න මං කුලීරියක් එවන්නම්"

"ඔබට ස්තුතියි මහත්මයා. දැන් මං කැමතියි ඔබ එක්ක පැය කාලක් නිදහසේ කතා කරන්න" හෝම්ස් කීය. "ඔබේ අවන්හලේ රාජකාරිවලින් නිදහස් වෙලා කීයට ද ඔබට එන්න පුළුවන්?"

"මට දැන් වුණත් එන්න පුළුවන් මහත්මයා. මා නැති වෙලාවට වැඩ කටයුතු බලාගන්න, මං මේ සේවිකාවන් පුහුණු කරලයි තියෙන්නේ."

ඔහු තම සේවිකාවනට අවශ්‍ය උපදෙස් දී මිනිත්තු පහකින් පැමිණියේය. ඉන්පසු ඔහු තම පෞද්ගලික කාමරයට අප කැඳවාගෙන ගොස් එහි දොර වසා දැම්මේය.

"මිලර් මහත්මයා. සැලකිය යුතු හෝඩුවාවක් හැටියට මට මේ දැන් හමුවුණේ මෙන්න මේවා" හෝම්ස් කීවේ තම කවරය තුළ දමාගත් ඉරී ගිය කඩදාසි කැබලි මේසය මත තබමිනි. "මේවා





ඉතාම අලුත්. මේවා එළියට නිරාවරණය වී තිබුණු උපරිම කාලය දළ වශයෙන්, පැය 24 ත් 36 ත් අතර විය යුතුයි කියල මං නිගමනය කරනවා. ඒ මේවා වැස්සකට අසුවී නැති, තදබල හිරු රශ්මියකටත් විවෘත වී නැති නිසා......"

මිලර් මහතා කඩදාසි කැබලි පරීක්ෂා කර බැලීය. අනතුරුව ඔහු හෝම්ස් දෙස බලා සිටියේ බලාපොරොත්තු කඩවූ අයුරෙනි.

"මිලර් මහත්මයා. මෙතැන තියෙන්නේ ලිපියකින් කොටසක් පමණයි." හෝම්ස් කීය. "සම්පූර්ණ ලියුමම මෙතැන නොතිබීම ලොකු අවාසනාවක්. එහෙම තිබුණා නම් අපට මේ ගැටලුව බොහොම පහසුවෙන් විසඳාගන්න තිබුණා."



"නමුත් මේ කොළ කැලිවලින් මොනවා කරන්නද?"

"එහෙම කියන්න එපා මිලර් මහත්මයා. සමහරවිට අපට ලැබෙන හෝඩුවාව ඉතාම කුඩා එකක් වෙන්න පුළුවනි. එය ඉතාම නොවැදගත් එකක් ලෙස බැලූ බැල්මට පෙනියන්න ඉඩ තියෙනවා. නමුත් ගැටලුව විසඳන්න උත්සාහ කරද්දී, එය ඉතාම වැදගත් එකක් වෙන්නත් ඉඩ තියෙනවා. මට පළමුවෙන්ම කියන්න මේ අත් අකුරු ඔබ කලින් දැක තිබෙන අත් අකුරුද කියා......"

"නැහැ"

"මට හිතෙනවා මේවා ගැහැනියකගේ අත්අකුරු කියා." හෝම්ස් කීය. "හන්ට් තරුණයා කවුරු හරි තරුණියක ආශ්‍රය කරනවද? එහෙම කෙනෙකු සමග ප්‍රේම සම්බන්ධයක් ඇති බව ඔබට අහන්න ලැබුණද?"

"ඔහුගේ පෞද්ගලික තොරතුරු මං ඒ තරම් ගැඹුරට දන්නේ නැහැ. නමුත් කාරණා එකක් හෝ දෙකක් මට අහන්න ලැබිල තියෙනවා."

"ඒ මොනවද?"

"මේ මොරිස් පාර නගරයට වැටෙන කිට්ටුවම මත්පැන් විකුණන අවන්හලක් තියෙනවා. ඒක අයිතිකරු ජෝන් පාකර් නම් කෙනෙක්. ඔහුගේ දියණිය ලූසී නම් අවිවාහක තරුණියක්. පර්සිගේ හිතේ ඇය ගැන පැහැදීමක් ඇතිවී තිබූ බව මට අහන්න ලැබුණා. ඒ අවන්හලේදී මිතුරන් එකතු වූ විට, ලූසී ගැන කියා ඔවුන් විහිළු කරනවාලු. නමුත් එය ප්‍රේම සම්බන්ධයක් දක්වා දුරදිග ගිහින් ඇතැයි මං හිතන්නේ නැහැ. ඒකට එක හේතුවක් පර්සි තවමත් නොමේරූ තරුණයෙක්. තමන්ගේ දුව වඩාත් ඉහළ රැකියාවක යෙදෙන කෙනෙකුට විවාහ කර දෙන්න, පාකර් වුණත් කැමැති වේවි.

අනික් අතට හිල්ගේ තරඟකරුවා චාල්ස් බැරී සමගත්, ලූසීගේ හිතවත් කමක් තිබුණු බව මට අහන්න ලැබිල තියෙනවා. ඔහු මේ ගමේ කෙනෙක් නේ. නමුත් මේ සම්බන්ධකම් තවම තියෙනවද, ඒ කතා කොයි තරම් දුරට ඇත්තද කියල මම දන්නෙ නෑ."

"මේ අත් අකුරු ඔබට හඳුනාගන්නත් බැහැ?"

"බැහැ"

"දැනට මට ඔබෙන් දැනගන්න තිබෙන්නේ එපමණයි. එහෙම නම් අපි අපේ නවාතැනට යමු" හෝම්ස් කීය.

මිලර් මහතා තම අශ්ව කරත්තයෙන් අප තානායම වෙත කැඳවාගෙන ගියේය. හෝම්ස් හා මිලර් අතර තවත් අදහස් කිහිපයක් හුවමාරු කෙරුණේ ඒ අතරයි.

"මිලර් මහත්මයා. පර්සි අතුරුදන් වූ කරුණ පුළුවන් තරම් රහසක් හැටියට තබාගන්න. බොහොම දෙනෙකුට එය දැනටමත් ආරංචිවෙලා ඇති. නමුත් ඔබ ඒ ගැන නිහඬ වුණොත්, ඔවුන් ඉස්සරහට එන්නෙ නෑ ඒ කරුණ අහන්න"

"මමත් ඒ දේ කල්පනා කළා මහත්මයා. මං ගොඩ්වින්ට තදින්ම කිව්වා මේ බව කාටවත් කියන්න එපා කියල. ඔහු ඒක එලෙසම ඉටුකරාවි කියල මං විශ්වාස කරනවා." මිලර් මහතා කීවේය. "එහෙම නම් ඔබ හෙට උදෑසන ආහාරයට මගේ අවන්හලට එන්න. ඔබට උදේ කීයටද ඒක උවමනා කරන්නේ?"





"අපට කාලය හුඟක් වටිනවා. ඒ නිසා උදේ අටහමාර වෙද්දි අපි එනවා" හෝම්ස් කීවේ මිලර්ට ශුභ රාත්‍රියක් පතමිනි.

තානායම වෙත කලින් දී තිබූ ඇණවුම අනුව, විශාල නිදන කාමර දෙකක් අප සඳහා සූදානම්ව තිබිණ. ඒවා පිරිසිදු සතුටුදායක තත්ත්වයේ ඒවා බැව් දුටුවෙමු. කෙසේ වෙතත් එහි පහන්වල ආලෝකය මඳ බැව් මගේ මිත්‍රයා කීය. එබැවින් දීප්තිමත් එළියක් විහිදුවන ලාම්පුවක් ඔහු තම කාමරයට ගෙන්වා ගත්තේය.

"වොට්සන්. හැමදේකටම කලින් මං කැමතියි අර කඩදාසි කැබලි ටික පරීක්ෂා කරල බලන්න" ඔහු කීවේ ගෙන එනු ලැබූ පහන මේසය මත තබා සේවකයා පිටව ගිය පසුය.

"කිසිම සැකයක් නෑ. මේව ලියල තියෙන්නෙ ගැහැනියක්." හෝම්ස් කීවේ කඩදාසි කැබලි හොඳින් පරීක්ෂා කිරීමෙන් පසුවය.

"ලියුමෙ කැලි කීපයක් විතරක් අහකට දැම්මෙ ඇයි කියන එකයි මට තේරුම් ගන්න අමාරු" මම කීවෙමි.

"ඒක තේරුම් ගැනීම නම් එච්චර අමාරු නෑ වොට්සන්. ලියුම ඒ වෙලාවෙම ඉරලා කැලි ටික සාක්කුවකට හෝ මල්ලකට දමාගන්න ඇති. එහෙම කරද්දී ඇඟිලි අතරින් ගිලිහී වැටුණු කැබලි තමා මේ.

බලන්න මේ පළවෙනි කැබැල්ලේ තියෙන වචනය Percy-පර්සි. ඒක පැහැදිලියි. ඔහුව එළියට කැඳවා ගැනීම සඳහා තමයි මේ ලියුම් කැබැල්ල එවන්න ඇත්තේ. ඔහුව බලෙන් අරගෙන ගිහිං නැහැ. එහෙම කළා නම් ධාවන පථයේ අඟුරු කුඩු මත පොර බැදීමක සලකුණු රැඳෙනවා. තමන්ට සීතල දැනෙන බව කියල පර්සි ස්වෙටරයක් ඉල්ලුවේ ඇයි? කාටවත් නොපෙනී පිටවී යාමට අවස්ථාවක් ලබාගන්න.

අනෙක ශරීරය උණුසුම් කරගෙන සිටින ක්‍රීඩකයෙකු, ක්‍රීඩා කබාය ඉවත් කර ස්වෙටරයක් අඳිනවා නම්, ඒක කළ යුත්තේ කොහොමද? එළියේ හමන සීතල සුළඟට සිරුර විවෘත නොකර ගේ ඇතුළට ගිහින් ඒක ඇඳගෙන ආ යුතුයි. ඒ සඳහා ඔහුට යන්න තියෙන දුර යාර විස්සකට අඩුයි.

ඊළඟට බලන්න වොට්සන් දෙවැනි කැබැල්ලේ තියෙන වචන throw them out - නැත්නම් throw them over. ඒ වචන වලින් අදහස් කරන්නේ "ඔවුන් අත්හැර දමන්න" කියා විය හැකියි. ඊළඟට



"ඒක හරි. මිනිහා හරි දක්ෂයා."





තියෙනවා right away - "වහාම" ඒ දේ කරන්නලු. පර්සි වහාම ඒ දේ කළ බව පැහැදිලියි. තවත් එකක lane - "පටුමග" කියන වචනය තියනවා. අනික් කැබලිවල තිබෙන්නේ වචනවල කැඩුණු කොටස්. ඒවායින් තේරුමක් ගන්න තවමත් අමාරුයි. හෙට උදේට මිලර් හම්බවුණාම බලමු තවත් මොනවා හරි තොරතුරු දැනගන්න පුළුවන්ද කියලා"

පසුවදා අපි උදැසනින්ම මිලර්ගෙ අවන්හල වෙත ගොස් උදැසන තේ පානය කළෙමු.

"මොනවද මිලර් මහත්මයා අලුත් ආරංචි?" හෝම්ස් විමසුවේ තේ පානයෙන් පසුවය.

"එහෙම කියන්න නම් මොකුත්ම නැහැ"

ඔහු එසේ කියද්දීම කුඩා අශ්ව කරත්තයක් පැමිණ අවන්හල ඉදිරිපිට රථගාලේ නැවැත්වූ අයුරු අපි දුටුවෙමු. හෝම්ස් මගේ අතින් අල්ලා ඇද්දේ, අප එතැනින් ඉවත්ව නොපෙනෙන තැනකට වී බලා සිටිය යුතු බව හඟවමිනි.

රියෙන් බැස ආවේ තරමක් තරබාරු මිටි, රතු පැහැති මුහුණක් තිබූ අයෙකි. තියුණු කටහඬකින් කථා කළ ඔහු මිලර් සමග සුහද කතාබහක යෙදීමට උත්සාහ කළේ, තේ කෝප්පයක් පානය කරමිනි.

"මිලර්. ඉතින් මොනවද අලුත් තොරතුරු? මේ සැරේ ධාවන තරඟෙට ඔහෙත් ඉල්ලන්දාරියෙක් ඉදිරිපත් කරනවා නේද?"

"හන්ට් කියල ඉලන්දාරියෙක් ඉන්නව නම් තමයි. ඒ වුණත් මිනිහගෙ වේගය ගැන මට එච්චරම සෑහීමකට පත්වෙන්න බෑ. මං හිතන්නෙ මේ සැරෙත් අංක එකට එන්නෙ හිල්ගෙ ක්‍රීඩකයා චාල්ස් බැරී"

"ඒක හරි. මිනිහා හරි දක්ෂයා. එයත් එක්ක කරඟ කරන්න කාටවත් බෑ. රේස් ඔට්ටු වැඩි ගණනක් වැටෙන්නෙ එයාට කියලයි මට නම් පෙනෙන්නෙ. ඒ ගැන මොකද කියන්නෙ?"

"මොනව කියන්නද. දක්ෂකම තියන එක්කෙනා ජයග්‍රහණය කරාවි"

එදිනෙදා කාලගුණය ගැන යමක් කියූ ඔහු අවන්හලෙන් පිටවෙන ආකාරය අපි බලා සිටියෙමු.

"ඒ කවුද?" හෝම්ස් මිලර්ගෙන් විමසුවේ අමුත්තා නොපෙනී ගිය පසුය.

"එයා තමයි හොප්කින්ස් - රේස් ඔට්ටු භාරගන්න තැනැත්තා. හරි දක්ෂයෙක්. ඒ වගේම කපටියෙක්. මං ඕන ඔට්ටුවක් අල්ලන්නම්. මිනිහ ආවේ පර්සි අතුරුදන්වුණු බව ආරංචිවෙලා. මිනිහට උවමනා වුණා ඒ ගැන අලුත්ම තත්ත්වය මගෙන් දැනගන්න."

"එහෙම නම් අපි ටිකක් එළියෙ ඇවිදින්න ගිහිං එන්නම්"

අපි ඉක්මනින් එතැනින් පිටවී ආවෙමු.

"වොට්සන් අපි ඉස්සර වෙලාම යන්න ඕන පාකර්ගේ අවන්හලට."

විශාල නාම පුවරුවක් තිබූ එතැන සොයාගැනීම අපට අපහසු වූයේ නැත. අපි අවන්හල තුළට පිවිසියෙමු. ඒ වනවිට එහි සිටියේ අනුග්‍රාහකයන් දෙදෙනෙකු පමණි. මැදිවියේ කාන්තාවක් හා රූමත් තරුණියක් වේටර්වරියන් ලෙස සේවය කළහ. එහි අයිතිකරුවා යයි සිතිය හැකි තැනැත්තෙක් අයකැමි අසුනේ සිටියේය.

"ලූසී. අමුත්තන් දෙන්නෙක් එනවා. එයාලට උවමනා මොනවද බලන්න" අයිතිකරු කීය.

ඒ අනුව තරුණිය අප වෙත පැමිණියේ පියකරු සිනාවකින් මුව සරසාගෙනය. හෝම්ස්ගේ ඇණවුම අනුව ඇය බීර බෝතලයක් හා වීදුරු දෙකක් බන්දේසියක තබාගෙන ආවාය.

"නෝනා" හෝම්ස් කථාකළේ වයස්ගත පුද්ගලයකු කථාකරන ආකාරයෙනි. "මෙහේ ඉඳල තෝන්ටන් දුම්රියපොළට යනවා නම් යන්න ඕන කොහොමද?"

"මේ පටුමග දිගේ ඉදිරියට ගියාම ඔබට හමුවෙන්නේ මහාවීදිය. එතැනදී වමට හැරෙන්න. ඒකෙ දිගේ ටිකක් දුර ගිහින් හම්බ වෙන පළමු වැනි හන්දියෙන් දකුණට යන්න. ඒක දිගේ යාර පනහක් විතර ඉදිරියට යද්දී වම් පැත්තට තියෙනවා පටු මගක්. එතැන තියෙනවා නාම පුවරුවක්"

"මට සමාවෙන්න නෝනා" හෝම්ස් කීය. "වයසට ගිහින් නිසා මට දැන්, මේ කියපුවා මේ මතක නෑ. වමට දකුණට කියන ඒවා එකක් වත් මතක හිටින්නේ නෑ. කරුණාකරල ඔබට පුළුවන්ද මගේ මේ සටහන් පොතේ ඔය කියපුවා ලියල දෙන්න?"

"සුළු දෙයක්" කී ඇය හෝම්ස් දුන් පැන්සලෙන් ඔහුගේ සටහනේ පොතේ ඇය කලින් දුන් උපදෙස් ලියුවාය.

"මේ පටුමග දිගේ ඉදිරියට........"

"ටිකක් ලොකු අකුරෙන් ලියන්න නෝනා. මගේ ඇස් පෙනෙනවාත් අඩුයි"





"මෙන්න ඔබේ සටහන් පොත. ඔක්කොම ලිව්වා" ඇය සටහන් පොත ආපසු භාර දුන්නාය.

"ඔබට බොහොම ස්තුතියි"

අපි එතැනින් පිටත් වී ආවෙමු. අපි යාර පනහක පමණ දුරක් ඉදිරියට ගමන් කළෙමු. තම සැරයටිය අවන්හලේ අමතක වූ බව හෝම්ස්ට සිහිවූයේ එවිටයි.

"වොට්සන් ඔහොමම ඉන්න. මං ගිහින් මගේ සැරයටිය අරගෙන එන්නම්"

මඳ වේලාවකින් හෝම්ස් ආපසු පැමිණියේය. ඉන්පසු අපි මිලර් මහතාගේ අවන්හල වෙත ආපසු ගියෙමු. ඒ සඳහා යොදාගත්තේ පහසුවෙන් යා හැකිව තිබූ කෙටිපාර නොව, නගරය දෙසින් වැටුණු වටරවුම් පාරකි. හෝම්ස් එසේ කළේ ඇයිද යන්න සිතාගැනීම මට අපහසු විය.

"හෝම්ස් මහත්මයා" මිලර් කීවේ අප ආපසු පැමිණි විටය. "ගොඩ්වින් ට්වයිෆඩ්ස් ඉඳල ආපහු ආවා. ඔබට උවමනාද ඔහුව හමුවෙන්න?

"නැහැ."

"ඔහුට මිනිත්තු දහයකට එළියට යන්න උවමනා බව කිව්වා."

අපි වහා සඳළුතලයට නැඟුණෙමු.

පුහුණුකරු ගොඩ්වින් ඉක්මනින් ආපසු ආ ආකාරය අපි සැඟවී බලා සිටියෙමු. මීළඟට මිනිත්තු පහක් ගතවීමට පෙර ඔහු පිටවී ගියේය. ඔහුට මඳ දුරක් යාමට ඉඩහැර අපද ඔහු පිටුපස යායුතු බැව් මගේ මිත්‍රයා කීවේ කෙඳිරිලි හඬෙනි.

ගොඩ්වින්ට යාර අසූවක් පමණ පිටුපසින් ඔහු ගැන දැඩි අවධානයකින් අපි ඉදිරියට ගියෙමු. නගරයද පසුකර ගිය ඔහු වටපිට බලා පාර අයිනට වී මඳ වේලාවක් බලා සිටියේය. ඉන්පසු ඔහු තම කබා සාක්කුවෙන් ලියුමක් ගෙන පාර අයිනේ ක්‍රීඩා කරමින් සිටි ළමයෙකු අතට දුන්නේය. එය රැගත් කොලුවා පාර අනෙක් පැත්තේ තිබූ ගේට්ටුවක් විවෘත කරගෙන එහි ඇතුළට දිව ගියේය. එය ඉතා අලංකාර මල් උයනක් සහිතව ඉදිකර තිබූ විශාල නිවසක් විය.

"එල්. හොප්කින්ස්. නිවාස ඒජන්ත හා කොන්ත්‍රාත්කරු" යනුවෙන් නාම පුවරුවක් අපි දුටුවෙමු.

මිනිත්තු පහක් ගතවෙද්දී ගේට්ටුව විවෘත විය. උදැසන අප දුටු රතු පැහැති මුහුණක් හා තට්ට හිසක් තිබූ තැනැත්තා ඉදිරියට පැමිණියේය. ඒ වහාම එහි ගිය ගොඩ්වින් ගේට්ටුවෙන් ඇතුළු වී නොපෙනී ගියේය. පැය කාලක් ගතවෙද්දී ආපසු පැමිණි ඔහු යළිත් වරක් ආපසු හැරී මිලර්ගේ නිවස දෙසට ගමන් කළේය.

"මෙතැන මං නොහිතූ විදියෙ දේවලුත් සිදුවෙන පාටයි වොට්සන්" හෝම්ස් කීවේ පුහුණුකරුවාට යාමට ඉඩ හරිමින් පාර අයිනේ නවතා තිබූ අශ්ව රියකට මුවා වෙමිනි.

"අපි බලමු මෙතැනින් හොයාගන්න පුළුවන් තොරතුරු මොනවාද කියල" හෝම්ස් කීවේ හොප්කින්ස්ගේ නිවස දෙසට පා නගමිනි.

"හෝම්ස් ඔබ බලාපොරොත්තු වෙන්නෙ ඔහු හමුවෙලා ප්‍රශ්න කරන්නද?" මම විමසීමි.

"කොහොමටවත් නෑ වොට්සන්. මට උවමනා කරන්නෙ මෙන්න මේ කාර්යාලයට ගිහිං විමසා බලන්න."

**"එල්. හොප්කින්ස්**

**විකිණීමට හා කුලියට දීමට ඇති නිවාස ගැන මෙතැනින් විමසන්න"**

නිවසට සම්බන්ධ නොකොට වෙන්ව ඉදිකර තිබූ තට්ටු දෙකක කුඩා ගොඩනැගිල්ලක, ඉහත සඳහන් නාම පුවරුව දක්නට ලැබිණ. ගේට්ටුව තල්ලු කරගෙන ඇතුළු වූ හෝම්ස් එහි සීනුව නාද කළේය. මැදිවියේ කාන්තාවක් අප ඉදිරියට පැමිණියාය.

"ඔබේ දැන්වීමෙ තියෙනවා සාප්පු වගයක් කුලියට දෙන්න තියෙනවා කියල" මගේ මිත්‍රයා කීවේ එහි දැන්වීම් පුවරුවක අලවා තිබූ විශාල පෝස්ටරයකට ඇඟිල්ල දිගු කරමිනි. "මං කැමතියි ඒව බලන්න. යතුර දීලා කවුරු හරි එවන්න පුළුවන්ද?"

"මහත්තයා ගෙදර නැහැනෙ. ඔබට සඳුදා වෙනතුරු සාප්පු බලන්න හැටියක් නැහැ"

"ඒක හරි අපරාදයක් නෙ. සඳුදා වෙනතුරු ඉන්න නම් මට පුළුවන් කමක් නෑ. කවුරු හරි ඒ සාප්පු බලන්න සෙව්වොත්, කළ යුතු දේ හොප්කින්ස් මහත්මයා ඔබට කිව්වෙ නැද්ද?"

"ඔහු කිව්වා. එය තමා මං ඔබට කිව්වේ. කවුරු හරි ඇවිත් හෙව්වොත්, ලබන සඳුදා ඇවිත් විමසන්න සිදුවෙන බව කීවා"

"මොනවා කරන්නද. මට එහෙමවත් එන්න වෙනවා. ඔවායින් එක සාප්පුවක් තිබෙන්නේ මහා වීදියේ. එහෙම නේද?"





"නෑ මහත්මයා. සාප්පු තුනම තියෙන්නේ පෝට්ලන්ඩ් වීදියේ, අලුතෙන් ඉදිකළ ගොඩනැගිල්ලේ."

"කමක් නෑ. මං සඳුදාට එන්නම්"

"වොට්සන්. අප යායුතු තැන අන්න එතන" හෝම්ස් කීවේ අප මහමගට පිවිසෙද්දීය. "ඒ වුණත් පෝට්ලන්ඩ් වීදියට යන්නෙ කොහොමද කියලා, ඉක්මනටම කාගෙන්වත් අහන්න හොඳ නෑ"

සැහෙන දුරක් කඩවීදිය වෙත ගමන්කොට ඉන්පසු මඟ විමසුවෙමු. එය පිහිටියේ නගරයට මඳක් පිටතින් විරුද්ධ දිශාවේ බැව් අපට දැනගන්නට ලැබිණි.

නගරයේ අලුතෙන් දියුණු වූ කොටසක් වූ එය, මඩ සහිත, තාර නොදැමූ මාර්ග වලින් සමන්විත විය. පාර දෙපසම ගඩොල් හා ගල් විශාල ලෙස ගොඩ ගසා තිබිණි. එමෙන්ම මෑතකදී ඉදිකළ ගොඩනැගිලි රැසක්ද අපි දුටුවෙමු. කෙසේ වෙතත් මේ ප්‍රදේශය මහජනයා එතරම් නොපැමිණි, ව්‍යාපාර සරුසාරව නොකෙරුණු පෙදෙසක් බැව් පැහැදිලි විය. බොහෝ සාප්පුවල "කුලියට දීමට තිබේ" යන දැන්වීම් අලවා තිබිණ.

කෙසේ වෙතත් හොප්කින්ස් මහතාට අයත් සාප්පු තුන පිහිටියේ කොහිද යන්න සොයා ගැනීම දුෂ්කර කටයුත්තක් විණි. කිහිප දෙනෙකුගෙන්ම විමසීමෙන් පසු අන්තිමේදී එතැන සොයා ගැනීමට අපට හැකිවිය. සාප්පු අංක 9, 10, 11 තුනම වසා තිබූ අතර, ඊට යාබදව තිබුණේ ශෝකාකුල පෙනුමක් තිබූ බේකරියකි. එහි විදුරුවෙන් අප දුටුවේ පාන්ගෙඩි තුනක් සහ පරණ පෙනුමක් තිබූ බනිස් ගෙඩි කිහිපයක් පමණි. අපි බේකරියේ සිටි වෙළෙන්දාගෙන් විමසා බැලුවෙමු.

"ඔය කාමර බදු දෙන බව කියලා දැන්වීම් අලා හුඟක් කල්. කීප දෙනෙක්ම බලල ගියා. වෙනදාට නම් ඒවල යතුරු තියෙන්නේ මා ගාව. ඒ වුණාට දවස් කීපයකට කලින් හොප්කින්ස් මහත්තයා ඒ යතුරු මගෙන් ඉල්ලා ගත්තා, ඒක පිරිසිදු කරවන්න උවමනාය කියල. තවමත් ඒ යතුරු මට ආපහු දුන්නෙ නෑ"

"කොහොමද ඒ කාමරවල හුඟක් ඉඩකඩ තියෙනවද?" හෝම්ස් විමසුවේය.

"මේ බේකරියෙ ප්‍රමාණයේම ඉඩක් තමයි තියෙන්නේ" බේකරිකරු කීය. "ඒ වුණාට එයාල මහ විසාල කුලියක් ඉල්ලනවා.

ඒ ගණන හරි අසාධාරණයි. ඒක ඒ මුදලට වටිනවා කියල මම නම් හිතන්නෙ නෑ"

ඔහුට ස්තුතිකොට අපි එතැනින් පිටත්වී ආවෙමු. අප පැමිණියේ මිලර් මහතාගේ අවන්හල වෙතය. ඔහු අප එනතුරු මග බලාසිටි බැව් සිතාගත හැකි විය. තම පෞද්ගලික කාමරයට යන මෙන් අපට සංඥා කොට ඔහුද එහි පැමිණියේය.

"හෝම්ස් මහත්මයා. කොහොමද වැඩ කටයුතු සාර්ථකද?"

"ඔව්. තරමක් දුරට. පර්සි හන්ට් මේ වෙලාවෙ ඉන්නේ කොහේද කියලා මං හිතන්නේ මං දන්නවා"

"හැබෑට?"

"ඔව්. ඒ වුණත් ඔහු එතැන කැමැත්තෙන් රැඳී ඉන්නවා කියල මං හිතන්නේ නෑ. ඔහුව බලෙන් රඳවාගෙනයි ඉන්නේ. ඒක මට විශ්වාසයි. අපට සැහෙන මහන්සියක් දරන්න වෙනවා. එහෙම කළොත් අපට පුළුවන් පර්සිව අරගෙන එන්න"

"මට පුළුවනි ඔබ ඉල්ලන ඕනෑම සහයෝගයක් දෙන්න. පර්සි ඉන්නෙ කොහේද?"

"මේ තෝන්ටන්වලම තමා. ඒක නෙමෙයි. ඔබේ මිත්‍රයා අර හොප්කින්ස් මහත්මයා, රේස් ඔට්ටු පොළක් පවත්වාගෙන යනවාට අමතරව, තවත් දේවල් කරනවා නේද? ඒ කියන්නේ ගොඩනැගිලි ඉදිකිරීම, ඒවා බදුදීම වගේ දේවල්?"

"එයා ඒ තරම් සාර්ථක ඉදිකරන්නෙක් කියන්න බෑ. ඉඩම් ලාබෙට අහුවෙන තැන්වලින් බිම් කොටස් අරගෙන, කඩසාප්පු හදලා කුලියට දෙනවා. නොදන්නා මිනිස්සු රැවටිලා ඒව ගත්තාම, ඒ මිනිස්සුන්ව ගසා කනවා. මොකද ඔහු ගැන ඇහුවේ. ඔහුත් සම්බන්ධද මගේ වැඩේට?"

"ඔබ තදින් කේන්ති ගන්නේ නැත්නම් මං ඒ ගැන කියන්නම්. මේකට කීප දෙනෙක් සම්බන්ධයි කියලයි මං හිතන්නෙ. හොප්කින්සුත් මේකෙ ප්‍රධාන හවුල්කාරයෙක්. ඔවුනට උදව් කරන තවත් අය ඉන්නවා. නමුත් මිලර් මහත්මයා. මේක අපි බොහොම නිශ්ශබ්දව විසඳාගත යුතුයි. මං එහෙම කියන්නෙ ඇයි කියල ඔබට වැටහේවි"

"හෝම්ස් මහත්මයා. ඇයි අපි පොලීසියට යන්නෙ නැත්තෙ?"

"පොලීසිය නැතුව මේක විසඳාගන්න අපි මුලින් උත්සාහ කරල බලමු. එහෙම හරි නොගියොත් පොලීසිය කැඳවමු. මට





උවමනා කරන්නෙ, ඔවුන් කැඳවා ගත්තොත් ඇතිවිය හැකි ප්‍රමාදය වළක්වන්නයි. ධාවන තරඟය තියෙන්නෙ හෙට නේද?"

"ඔව්"

"හොඳයි. කාටවත් කිසිම දෙයක් කියන්න එපා කියල මං ඔබට කිව්ව නේද. ඒක හොඳට මතක තියාගන්න. ගොඩ්වින්ටවත් කිසිවක් කියන්න එපා. අනික මට උවමනා වෙනවා වටේ සම්පූර්ණයෙන් ආවරණය කරන්න පුළුවන් අශ්ව කරත්තයක්. එහෙම එකක් කුලියට ගන්න හැකි කොහෙන්ද?"

"එහෙම එකක් මා ළඟ තියෙනවා ඉස්තාලයේ. ඒක කුලීරියක ප්‍රමාණයේ. මුළුමනින්ම වහන්න පුළුවනි යන අය නොපෙනෙන්න"

"අනර්ඝයි. ඒක සූදානම් කරගත්තු ගමන් අපි නගරයට යමු. ඊළඟට මට කියන්න මේ පර්සි හන්ට් ඉලන්දාරියා කොයි වගේ කෙනෙක්ද? ඔහුව හිරිහැරයට ලක් කළ අය එක්ක සණ්ඩු කරලා කලබලයක් ඇති කරාවිද?"

"මං හිතන්නේ ඔහු ඒ වගේ කෙනෙකු නෙමෙයි කියලයි. ඔහු හැඩිදැඩි සිරුරක් තියෙන කෙනෙකු නොවෙයි නෙ. ඔහුගේ හිතේ ලොකු තරහක් නම් ඇතිවේවි. නමුත් කාරණා තේරුම් කරල දුන්නොත් සණ්ඩුවට යන එකක් නැහැ. මට හිතෙන්නෙ එහෙමයි"

"බොහොම හොඳයි. එහෙම නම් ඔහුට තුවාල සිදුකරල නැතුව ඇති කියල මං හිතනවා. ඔහුව ආරක්ෂා කරන්න බොහෝවිට යොදල ඇත්තෙ එක මිනිහෙක් පමණක් වෙන්නත් පුළුවනි."

"ඔබට කරත්තය උවමනා කොයි වෙලාවටද?"

"මේ දැන් වහාම ඕනෑ."

මිනිත්තු දහයක් ඇතුළත කරත්තය ලැබිණ. අපි එහි නැගී නගරයට ගමන් කළෙමු. හිස් සාප්පු තිබූ පෝට්ලන්ඩ් වීදියේ මඳ දුරක් ඉදිරියට ගියෙමු. සාප්පු සහිත ගොඩනැගිල්ලට යාර සියයක් තිබියදී රියෙන් බැස්සෙමු. අප නොමැතිව රිය ඉදිරියට ගෙන ගොස් සූදානමින් සිටින ලෙස රියැදුරාට ඇනුම් දුන්නෙමු.

"හෝම්ස්. ඔබ කොහොමද දන්නෙ පර්සි සඟවලා ඉන්නෙ මොන සාප්පුවේද කියල?" මම ඇසීමි.

"ඔහු ඇත්තේ මැද එකේ කියල මට සැහෙන විශ්වාසයක් තියෙනවා වොට්සන්. අංක 9, 10, 11 තුන නේ හිස්ව තියෙන්නෙ.

අපි හිතමු ඔහුව නවයේ හෝ එකොළහේ හැංගුවා කියල. ඔහු මොකක් හරි කලබලයක් කළොත් දෙපැත්තෙ සාප්පුවල අයට ඇහෙන්න, තේරෙන්න පුළුවනි. ඒ නිසා හිරකාරයා ඇත්තෙ මැද එකේ. අපි පිටිපස්සේ තරප්පු පෙළෙන් යමු"

ගොඩනැගිල්ලේ පිටුපස තිබූ තරප්පු පෙළ සෑම සාප්පුවකටම යාම සඳහා තිබූ පොදු එකක් විය.

"බලන්න වොට්සන්, මැද තියෙන සාප්පුවේ දොරටුව ළඟ මඩ සහිත පා සටහන් තියෙන හැටි. අනෙක් සාප්පු ළඟ නෑ. අනික් සියලුම සාප්පුවලට ඒවායේ අයිතිකාරයො යන්න එන්න ඇත්තේ ඉදිරිපස තරප්පු පෙළෙන්. අනික මේ මඩ පාරවල් තවම වියළී ගිහින් නැහැ. ඒ මොකද ඒවා අද දවසේ ඇතිවූ ඒවා නිසා. බොහොම දවසකට පස්සේ මඳ වැස්සක් තිබුණේ ඊයේ රෑ බව අපට අහන්න ලැබුණා නේ"

මේ වනවිට අඳුරු වැටීමට පටන්ගෙන තිබිණි. සෑම සාප්පුවකම පිටුපස, කුඩා බිම් කොටස බැගින් විය. ඒවා එතරම් උස් නොවූ වැටකින් මායිම් වී තිබිණ. අපි එම වැටට උඩින් පැන්නෙමු. අනතුරුව අදාළ සාප්පුවේ පිටුපස දොර වෙත ළංවූයෙමු.

"දොර ඇතුළෙන් අගුළු දමලයි තියෙන්නෙ." හෝම්ස් කීය. "ඒක එයාලට කියලම ඇරගන්න වෙනවා. බලන්න වොට්සන් හැම සාප්පුවකම පිටුපස වීදුරු ජනේලයක් තිබෙනවා. නමුත් මැද තිබෙන අංක දහයේ එකේ පමණක්, ඇතුළතින් කඩදාසියක් අලවලා. ඒ කාටවත් ඇතුළත දැකගන්න බැරි විදියට. උඩු මහලේ ජනේලයත් ඒ විදියට ආවරණය කරලා. හොඳින් අඳුරු වැටෙන තුරු අපට තව ටිකක් වෙලා බලාගෙන ඉන්න වෙනවා"

අපි මිනිත්තු දහයක් පමණ බලා සිටියෙමු. මීළඟට ඔහු කිරීමට බලාපොරොත්තු වන දේ ගැන, මගේ මිත්‍රයා උපදෙස් දුන්නේ ඒ අතරය.

"වොට්සන්. ඔබ ළඟ ආයුධයක් තියෙනවද?"

"හැමදාමත් මා ළඟ තියෙන පරණ හමුදා රිවෝල්වරය තියෙනවා. මං පුරුද්දට ඒක අරගෙන ආවා. නමුත් උණ්ඩ තියෙනවාද කියල පරීක්ෂා කරල බැලුවෙ වත් නෑ. ඔබ මට ඒ ගැන කලින් කිව්වෙ නැහැනෙ........"

"හරි හරි මිත්‍රයා. ආයුධය ගැන කල් ඇතුව කියන්න බැරිවුණු එක මගේ වැරැද්ද. මෙවැනි තත්ත්වයක් ගැන මං දැනගෙන හිටියෙත්





නැහැනෙ. උණ්ඩ නැතත් කමක් නෑ. හිස් රිවෝල්වරය වුණත් ළඟ තියෙන එක ලොකු දෙයක්. මං මිලර්ගෙන් ඉල්ලාගෙන ආවා අශ්වයින් ගැටගැසීමට ගන්නා ශක්තිමත් ලණු රෝලක්" හෝම්ස් කීවේ සාක්කුවට තට්ටු කරමිනි.

මේ අතර ජනේලයෙන් ඇතුළු පැත්තේ ශබ්දයක් ඇසිණි. ඒ සමගම මෙතෙක් අඳුරේ තිබූ කුටිය ආලෝකමත් විය. සිදුවී ඇත්තේ පහනක් දැල්වීමයි.

"වොට්සන්. අපේ වැඩ කටයුතු තවත් ප්‍රමාද කරන්න බැහැ. ඔබ මේ දොරටුවේ එක පැත්තකින් ඉන්න. මම අනෙක් පැත්තෙන් ඉන්නම්. දොර ඇරගෙන පිටවෙන එකා මොකා වුණත් යටත් කරගමු."

හෝම්ස් ශබ්දයක් නොනැගෙන ලෙස ගමන් කළේ ඒ අසල ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය ගොඩගසා තිබූ තැනක් වෙතය. එතැනින් කුඩා කළු ගල් කැබලි දෙකක් අහුලා ගත් ඔහු එල්ලය බලා ඉන් එකක් පහන් එළිය දිස්වූ උඩු මහලේ ජනේලයට එල්ල කළේය. වීදුරුව බිඳී ගියේ උස් හඬක් නංවමිනි. හෝම්ස් වහා මා සිටි තැනට පැන දොර අසල සැඟවුණේය.

ගල් පහර වැදී වීදුරුව බිඳී යාමත් සමගම අසන්නට ලැබුණේ විමතිය පළකරන, මෙන්ම කෝපයෙන් කෙරුණු කෑගැසීමකි. බිඳුණු ජනේලය ඉක්මනින්ම විවෘත විය. එහෙත් අඳුරේ කිසිවක් දැකගන්නට නොහැකිවීම නිසාදෝ ජනේලය වහාම වසා දමන ලදී. ඔහු කවුරු වුවත් දොර විවෘත කරගෙන එළියට පැමිණ විමසන්නට තීරණය කළා විය යුතුය. තරප්පු බැස පහළට එන අයෙකුගේ බර බූට් සපත්තු වල අඩි ශබ්දය ඇසිණ. මීළඟට අපට ඇසුණේ අප අසලම තිබූ දොරේ, අගුළු හා යතුරු විවෘත වන ශබ්දයයි. මගේ කබා සාක්කුවේ තිබූ රිවෝල්වරය ඉවතට ගෙන මම සූදානම් වුණෙමි.

දොර විවෘත කළ පුද්ගලයා වහා එළියට බැස්සේ කිසිදු විමසීමකින් තොරවය. ඔහුට පියවර දෙකක් ඉදිරියට තැබීමට ඉඩදුන් හෝම්ස් එක්වරම ඔහු වෙත කඩා පැන්නේ, තම සිරුරේ සම්පූර්ණ බරම යොදමිනි. ඒ සතුරා බිම පෙරළා ගැනීමේ එකම අරමුණෙනි. එය සාර්ථක විය. ඔහු කවුරු වුවත් කපා හෙළූ ගසක් මෙන් බිම ඇද වැටිණි. ඔහුගේ සිරුර මත සිටි හෝම්ස්ට ග්‍රහණය කර ගැනීමට හැකිවූයේ, සතුරාගේ කෙස් වැටිය පමණි. මම වහාම එතැනට පැන ඔහු වෙත රිවෝල්වරය එල්ල කොට කෑගැසීමි.



"ඔහේව මේ විදියට බැඳ දමන්න සිදුවීම ගැන කනගාටුයි"





"යටත්වෙනු! නැත්නම් මං වෙඩි තියනවා!"

පරාජය භාරගෙන යටත්වීම හැර වෙනත් විකල්පයක් නොමැති බැව් ඔහුට වැටහෙන්නට ඇත.

හෝම්ස් තමා ළඟ තිබූ ඝන රෙදි කැබැල්ලක් සතුරාගේ මුව වටා දමා තද කර බැන්දේ, ඔහුට කෑගැසීමක් කිරීමට නොහැකි වන අයුරෙනි. අනතුරුව ඔහුගේ දෑත් පිටිපසට කර තදින් බඳින ලදි. ඒ ඔහු වෙත මා රිවෝල්වරය එල්ලකරගෙන සිටියදීය.

එතැනින් ඉදිරියට වැඩ කටයුතු පහසු විය. සතුරා පෙරටුකරගෙන අපි උඩුමහලේ පහන් දල්වා තිබූ කාමරයට ගියෙමු. එහි සිටියේ තවත් එක් අයෙකු පමණි. ඒ දෑත් ගැටගසා සිටි තරුණයෙකි. ඔහු ලැලි පෙට්ටියක් මත හිඳගෙන සිටි අතර, දෙපයේ පාවහන් පවා නොවීය. ඔහුගේ සිරුර වැසී තිබුණේ ක්‍රීඩා කබායෙනි.

තමා ගලවා ගැනීමට කවුරුන් හෝ පැමිණ ඇති බැව් දුටු තරුණයා ප්‍රීතියෙන් ඉපිල ගියේය. ඔහු කීවේ දෑත් බැඳ තැබීම හැර ඔවුන්ගෙන් වෙනත් හිරිහැරයක් සිදු නොවූ බවයි. කෑමබීම නොඅඩුව ලැබුණු බවත්, ලෝරි නම් මේ මුරකරුවා යකඩ පොල්ලක් පෙන්වා කළ තර්ජන හැරුණු විට වෙනත් ගැහැටක් සිදු නොවූ බවත්, තරුණයා පැවසීය.

ඉදිකිරීම් කටයුතු සඳහා ගෙන ආ රැහැන් රෝල් කිහිපයක්ම කාමරය තුළ විය. මා රිවෝල්වරය එල්ල කරගෙන සිටියදී හෝම්ස් ලෝරි බැඳ දැමුවේ, ඒ සඳහා තරුණයාගේ උපකාරද ලබා ගනිමිනි.

"ඔහේව මේ විදියට බැඳ දමන්න සිදුවීම ගැන කනගාටුයි ලෝරි මහත්මයා" හෝම්ස් කීය. "ඒ වුණත් ඔබට වැඩි වෙලාවක් ඉන්න වෙන්නෙ නෑ. පොලීසිය මඟ එනවා. ඔවුන් ඔබව බේරාගෙන ඉක්මනටම නගරය වෙත කැඳවාගෙන යාවි. මං දන්නවා ඔහේට කෑගහන්නත් බෑ; මේව ලිහාගන්නත් බෑ. ඒත් පැයකට දෙකකට විතරයි"

දෙපා එකිනෙක පටලවා, ඒ සමගම දෑත් ද ගැටගසා දැමූ ඉරියව්ව ලෝරිට තරමක් වෙහෙසකාරී වුවද, ඔහුට සහනයක් සැලසීමට මේ අවස්ථාවේ ඉඩක් නොමැති බැව් මම තේරුම් ගතිමි.

අප සමග පිටවී යාමට සූදානමෙන් පර්සි තරුණයා ජවන පාවහන් යුගළ නූල්වලින් එකිනෙක ගැටගසා අතේ එල්ලා ගත්තේය. ඔහු දෙපයේ දමා ගත්තේ තුනී අඩියක් තිබූ කාන්තා සෙරෙප්පු කුට්ටමකි.

"හෝ හෝ!" හෝම්ස් සිනාසෙමින් කීවේ අප සාප්පුවෙන් පිටවෙද්දීය. "ඔය අලංකාර සෙරෙප්පු ඔබට තෑගි කළ තරුණ නෝනා කවුද කියා මං හොඳට දන්නවා"

"ඔව්" තරුණයා කීවේ ලැජ්ජාශීලී සිනහවකිනි. "උන් ඔක්කොම එකතු වෙලා බොහොම අපූරුවට මට උගුලක් ඇටෙව්වා. මගේ ස්වාමියා - මිලර් මහත්මයා නම් මේක ලේසියෙන් අත අරින්නෙ නෑ. උන්ට හොඳ පාඩමක් උගන්නාවි"

ආවරණය කළ අශ්ව කරත්තයකින් අපි පර්සි හන්ට්, මිලර් මහතාගේ නිවස වෙත ගෙන ආවෙමු. තම ක්‍රීඩකයා නිරුපද්‍රිතව ආපසු ගෙන ඒම ගැන මිලර් මහතා අතිශය සතුටට පත්විය. ඔහු නොඉවසිල්ලෙන් සිටියේ, හන්ට් තරුණයාගෙන් කරුණු විමසා සතුරනට එරෙහිව වහා පියවර ගැනීමටයි. එහෙත් සෑම දේකටම පෙර තරුණයාට ස්නානයක් සහ හොඳ කෑමවේලක් අවශ්‍ය බැව් හෝම්ස් මතක් කර දුන්නේය.

"මම කියන්නද මේ හැම දෙයක්ම පටන් ගැනුණු හැටි" මගේ මිත්‍රයා කීවේ ආහාර වේල අවසන් කළ පර්සි තරුණයාටයි.

"මුලින්ම ලූසී පාකර් මෙනෙවියගෙන් ඔබට ලියුමක් ලැබුණා. ඒකෙ ඇය කියල තිබුණා, ඔබව නොසලකා හැරිය එකට ඇයට සමාවෙන ලෙසත්; චාල්ස් බැරී සමග තිබුණු සම්බන්ධය දැන් ඉවරයි; ඔහුව අත්හැර දැම්මා. ඔබ සමග ඇතිකරගත් මිත්‍රත්වය දිගටම ගෙනයන්න කැමතියි කියල........ එහෙම නේද?"

"ඔබ මේව කියන්නේ ඒ ලියුම කියෙව්වා වගේ" තරුණයා කීවේ ලැජ්ජාවෙන් මුහුණ රතු වෙද්දීය. "ඒ වුණත් ඔබ කොහොමද මේ කාරණා දැනගත්තේ? ඇය ඒ ලියුම පසුව මගේ අතින් අරගෙන ඉරලා, කෑලි ඇගේ ගවොමේ සාක්කුවට දමාගත්තා නේ"

"ඉතින් ඔබේ කතන්දරය දිගටම කියන්න" යයි පර්සිට කීවේ නොඉවසිල්ලෙන් බලා සිටි මිලර් මහතාය.

"ඇය මට කියල තිබුණේ, මා එක්ක මිනිත්තු කිහිපයක් කතා කරන්න උවමනාය කියල. ඒකට කැමති නම් ගොඩ්වින් මග හැරල හුණු පෝරණුවට යන පාළු පාරට එන්න කියල තිබුණා"

"නමුත් ඔබේ ජවන පාවහන් දමාගෙන, හුණු පෝරණුවට යන පාරේ ඇවිද යන්න අමාරුයි. එහෙම නේද?" හෝම්ස් විමසුවේය.

"ඇය ඒ කාරණය ගැන කියලා ඔබට ලියල තිබුණා; කකුල්වලට පහසුවක් වෙන්න ඒ පාවහන් ඉවත් කරලා





සෙරෙප්පු කුට්ටමක් දමාගෙන එන්න; ඒ සඳහා අලුත්ම සෙරෙප්පු කුට්ටමක් වැටට උඩින් ඔබ වෙත විසිකරන්නම් කියලා. ඒක වැටට උඩින් විසිකළාම ඔබ ජවන පාවහන් යුගළ ගළවා අතට අරගෙන, සෙරෙප්පු දමාගෙන දොරටුවෙන් පිටවෙලා පටුමගට ගියා. එහෙම නේද?"

"හරියට හරි මහත්මයා. ඒ දේ තමයි මං කළේ"

"ඔබ ගියේ කොයි දිසාවටද කියල කාටවත් හොයා ගන්න බැරි වෙන්න, මේක ඔවුන් ඇය ලවා යෙදවූ සූක්ෂම ප්‍රයෝගයක්. ඊළඟට මොකක්ද සිද්දවුණේ?"

"මං ඇය සමග කතාබස් කරමින් පාර දිගේ පහළට ඇවිද ගෙන ගියා. පඳුරු අතරෙ හැංගිලා උන්නු දෙන්නෙක් එකපාරටම කඩා පැනල, මගේ කටට ලේන්සුවක් හිරකරල මාව බැන්දා. ඊළඟට බොහොම වේගයෙන් පහළට ආව කරත්තයක මාව දමාගෙන අරගෙන ගියා. උන් මාව ආසන දෙකක් අතරෙ බිම දමාගෙන, රෙද්දකින් මාව වහලයි අරගෙන ගියේ"

"මිලර් මහත්තයා. කෝ ඔබේ පුහුණුකරුවා එමිල් ගොඩ්වින්?"

"ඔහු දවල් ගෙදර ගියා. තවත් පැයක් ගතවෙද්දි ආපහු ඒවි."

"අපි හන්ට් තරුණයා හංගලා තියාගන්න ඕන. ඔහු බේරගන ආව බව ගොඩ්වින් දැනගන්නවාට මං කැමති නෑ"

"ඒ ඇයි?"

"මහත්මයා ගොඩ්වින් තමයි මුදලට ඔබේ ක්‍රීඩකයා සහ ඔබව පාවා දුන්නේ"

"මොනවා ගොඩ්වින්?"

"ඔව්. මේක කිහිපදෙනෙකු එකතු වී කළ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් කියා මං විශ්වාස කරනවා" හෝම්ස් කීය.

"කවුද ඒ කීපදෙනා?"

"ඒකෙ මූලිකයා රේස් ඔට්ටු පොළ අයිති හොප්කින්ස් කියා මං විශ්වාස කරනවා. චාල්ස් බැරීව තරඟයට යොදවන සැමුවෙල් හිල් තවත් එක්කෙනෙක්. බැරීගේ පෙම්වතිය ලූසී පාකර් මෙනෙවියගෙන් උදව් ගන්නත් ඔවුනට හැකිවී තිබෙන බව පැහැදිලියි. මෙතන අනෙක් පුද්ගලයා තමා ගොඩ්වින්."

"ඔබ නිවැරදියි හෝම්ස් මහත්මයා. මෙච්චර දවසක් මෝඩයෙකු වගේ මට මේ කිසිදෙයක් නොපෙනුණු හැටි"

"ඒකෙ කිසිම පුදුමයක් නෑ මිලර් මහත්මයා. මේක රේස් ඔට්ටු ක්ෂේත්‍රයේ සාමාන්‍ය දෙයක්. මුදලට තරඟ පාවා දෙන

පුහුණුකරුවන්, තරඟකරුවන් වගේම ඔවුන්ගේ අයිතිකරුවනුත් සිටිනවා. ඒ රූකඩ ටික තමන්ට උවමනා හැටියට නටවන්නේ හොප්කින්ස් වැනි රේස් ඔට්ටු භාරගන්නා බුකිකරුවන් විසින්. ඒක නෙමෙයි. ධාවන තරගය හෙට අවසන් වනතුරු ගොඩ්වින් මේ නගරයෙන් පිටකර තබන්න ඔබට විධියක් නැද්ද?"

මිලර් මහතා මඳ වේලාවක් නිහඬව කල්පනා කළේය. අනතුරුව ඔහුට අදහසක් පහළ වූ බැව් මුහුණෙන් පෙනිණ.

"මං මෙහෙම කරන්නම්." මිලර් කීය. "පර්සි හන්ට් පැන ගිය නිසා අලුත් ක්‍රීඩකයකු හොයාගත යුතු බව, මං ඔහුට කිය කියයි හිටියේ. අද රෑ දුම්රියෙන්ම ලන්ඩන් බලා යන්න කියා මං ඔහුට කියන්නම්. එතැනින් සවුත්හැම්ටන් වෙත ගිහිං, රෑ වෙන්න කලින් මගේ මිත්‍රයා වන ජේම්ස් රැට්ලර් හමුවී, අලුත් ක්‍රීඩකයා කැඳවාගෙන ආපසු එන්න කියන්නම්. ඔහු මට දෙන්න පොරොන්දු වුණු ක්‍රීඩකයා දැන් ඔහු ළඟ නොමැති බව, රැට්ලර් විදුලි පුවතකින් අද උදේ මට දන්වා තිබුණා"

"බොහොම හොඳයි. නමුත් ගොඩ්වින් මේ රෑම ලන්ඩනයට යාවිද? නැත්නම් තමන්ගේ කටයුත්තේ සාර්ථකත්වය දැනගන්න හොප්කින්ස් හමුවෙන්න යාවිද?"

"මං ඒකට මෙහෙම කරන්නම්. මගේ අශ්ව කරත්තයෙන් ඔහුව දුම්රියපොළට යවනවා, ලන්ඩන් දුම්රිය ළඟාවෙන වෙලාවට. එතකොට ඔහුට හොප්කින්ස්ල හමුවෙන්න ඉඩක් ලැබෙන්නෙ නෑ"

"අන්න හරි"

ධාවන තරගය පැවැත්වීමට නියමිතව තිබුණේ පසුවදා සවස දෙකටය. ඒ වනතුරු බලා නොසිට, පසුවදා උදෑසන තෝන්ටන් දුම්රියපොළෙන් ලන්ඩනය බලා යාමට අපි දුම්රියට නැගුණෙමු.

"හන්ට් තරුණයා පිටවෙලා ගියේ මායිම් වැටේ තිබුණු දොරටුවෙන් බව මං නිශ්චිතවම දැන ගත්තා" හෝම්ස් දුම්රියේදී කීවේ තම පයිප්පය දල්වා ගනිමිනි. "ඒ මොකද අනෙක් අයට නොපෙනී යන්න ඔහුට වෙනත් මඟක් තිබුණෙ නැහැනෙ. ගේ ඇතුළට ඇවිත් ගියා නම් අනික් අයට පෙනෙනවා. අනික් කාරණය ඒ දොරටුවේ අගුල විවෘතව තේ තිබුණෙ.

තවත් වැදගත් කාරණයක් වුණේ, ඔහුගේ ජවන පාවහන්වල උල්වලින් පොළොවේ ඇතිවුණු සලකුණු, එක්වරම නොපෙනී





ගියා. එතකොට මං දැනගත්තා ඔහු ඒ පාවහන් ගලවලා වෙනත් මොනවා හරි පාවහනක් පැළඳගත් බව. ඒ මොකද අනාරක්ෂිත දෙපයක් පොළොවේ තියන්න, බුද්ධිමත් ක්‍රීඩකයෙක් කොහොමටවත් කැමති වෙන්නේ නෑ. ඒ මොකද සියුම් ගල්පතුරක් හෝ ගහක කටුවක් කකුලේ ඇනී, කකුල තුවාල වීමේ අවදානමක් තිබෙන නිසා. එතකොටයි මං නිගමනය කළේ, පොළොවේ සලකුණක් ඉතිරි නොවෙන පාවහන් ජෝඩුවක් ඔහුට කොහෙන් හෝ ලැබුණු බව. ඒක කවුරු හරි අතින් ගෙනැත් දුන්නා; එහෙමත් නැත්නම් වැටට උඩින් විසි කළා විය යුතුයි. පසුව කී දේ තමයි සිදුවුණේ කියන එක ඔප්පු වුණා. ඇයි උල් සහිත ජවන පාවහන් සලකුණු වැටී තිබුණේ, දොරටුව දෙසට නොවෙයි, වැට දෙසට. ඒ කාරණය වඩාත් තහවුරු වුණා, අර ඉරා දැමූ ලියුමේ "throw them ov......." කියන වචන දුටුවාම.

ඔබට මතක ඇති මම ප්‍රයෝගයකින් ලූසී පාකර් මෙනෙවිය ලවා left, right සහ lane කියන වචන මගේ සටහන් පොතේ ලියවා ගත් බව. එහිදී ඇය r, f සහ l අකුරු ලියා තිබුණේ ලියුම් කැබැල්ලේ අප දුටු ඇයටම සුවිශේෂ ආකාරයේ අත් අකුරෙන්.

ඇගේ පෙම්වතා වුණු චාල්ස් බැරීට ජයග්‍රහණය ලබාදීමේ අරමුණෙන්ම, පාකර් මෙනෙවිය මේ කුමන්ත්‍රණ කාරයින්ට එකතු වුණා වෙන්නත් පුළුවනි. එහෙමත් නැත්නම් ඇය ලියුම ලියුවේ ගාස්තුවකට වෙන්නත් පුළුවන්. කොහොම වුණත් එදා මං මගේ ඇස් දෙකෙන්ම දුටුව දසුනක් ඔබට දකින්න ලැබුණෙ නෑ. ඒ තමයි එමිල් ගොඩ්වින් පුහුණුකරුවා පාකර් මෙනෙවිය සමග හොර රහසේ කතාබහක වැටී සිටි අන්දම. ඔවුන් එහෙම හිටියේ පාකර්ගේ අවන්හල පිටිපස්සෙ ගහක් යට. ඒක මට දකින්න ලැබුණෙ, මගේ සැරයටිය අවන්හලේ අමතක වෙලා ඒක අරගන්න මං ආපහු ගිය වෙලාවෙ. ඔබට නොපැහැදිලි තවත් මොනවා හරි තැනක් තියෙනවද වොට්සන්?"

දින තුනකට පසු මෝනිං ක්‍රොනිකල් පත්‍රයේ ක්‍රීඩා පිටුවේ කෙළවරක පළවූ පුවතක් වෙත අපේ අවධානය යොමුවිය.

## "තෝන්ටන් ධාවන තරග ප්‍රතිඵල"

තෝන්ටන් හි අවුරුදු පතා පැවැත්වෙන යාර 220 හා යාර 440 ධාවන තරග තෝන්ටන් ක්‍රීඩාංගනයේ අගුරු යොදා සකස් කළ ධාවන පථයේ පැවැත්විණි. තරග දෙකේම ප්‍රථම ස්ථානය



"......... පුහුණුකරුවා ඇය සමග හොර රහසේ කතාබහක වැටී සිටියා."





ලබාගත්තේ මේජර් කාල් මිලර්ගේ අනුග්‍රාහකත්වය යටතේ තරඟ කළ පර්සි හන්ට් විසිනි. යාර 220 තරඟයේදී දෙවැනි තැන දිනාගත් චාල්ස් බැරී පරාජය කිරීමට හන්ට් ට හැකිවූයේ තියුණු සටනකින් පසුවය. යාර 440 තරඟයේ අවසන් යාර 50 දී ඩික් ජෝන්ස් ඇඩි උත්සාහයක් දැරුවද පර්සි හන්ට් යාර 5 ක් ඉදිරියෙන් ජය වැඹ වෙත ළඟාවිය."

# බකිංහැම්ෂයර් අභිරහස

මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා අවුරුදු විසිතුනක පමණ කාලයක් අතිශයින්ම ක්‍රියාශීලී ලෙස රහස් පරීක්ෂණ වෘත්තියේ නියැළුණේය. එයින් අවුරුදු දහහතක පමණ කාලයක් ඔහු සමීපයේම හිඳිමින් ඔහුට සහායවීමට මට හැකිවූ බව මා පවසන්නේ සතුටෙනි. තමා ඒ කාලයේ යෙදුණු රහස් පරීක්ෂණ ගණන දහසකට ළංවූවත්, ඒ සෑම එකක්ම සාර්ථක ලෙස විසඳීමට හැකි නොවූ බැව් ඔහු විටෙක පැවසුවේය.

"සාර්ථක ලෙස මට විසඳන්න බැරිවුණු පරීක්ෂණ කිහිපයකම සටහන්, ඔබ ළඟ තියෙනවා නේද වොට්සන්?" ඔහු මගෙන් විමසුවේ වරක් දෙවරක් නොවේ.

"ඔව්" මම කීවෙමි. "ඒවාට මොනව කරන්න කියලද ඔබ කියන්නෙ?"

"ඒවා වුණත්, පාඨකයා වෙත ඉදිරිපත් කරන්න"

"ඒවා ඉදිරිපත් කළොත් මට මගේ පාඨකයන්ගෙන් හොඳටම බැණුම් අහන්නයි වෙන්නෙ" මම කීවෙමි.

"ඒ ඇයි?"

"මොකද ඔබ ඇයි කියල අහන්නෙ? ෂර්ලොක් හෝම්ස් තමා ඔවුන්ගේ වීරයා. ඔබ අසාර්ථක වුණු පරීක්ෂණ නොවෙයි; එතරම් කුතුහලයක් නොතිබුණු හෝ, ඔබේ දක්ෂතා කැපී නොපෙනුණු පරීක්ෂණ පවා, පසුගිය කාලේ මං පාඨකයින් වෙත ඉදිරිපත් කළා. ඒ ඔවුන්ගේ බලවත් ඉල්ලීම නිසා. නමුත් දැන් ඔවුන් මට දොස් කියනවා. ඔවුන් කියනවා ඒවා ෂර්ලොක් හෝම්ස් කළ රහස් පරීක්ෂණ වෙන්න බැහැලු. "ස්ට්‍රැන්ඩ්" සඟරාවෙ කර්තෘ ඒකෙන් ඉවත්වුණාට පස්සෙ, මං මේ කතන්දර යවන්නෙ "රෝයල්" සඟරාවට නේ. මේ කතන්දර මගේ නිර්මාණ කියල පාඨකයන් වඩාත් සැක කරන්නේ ඒ නිසයි"

"ඉතින්?"

"පහුගිය දවසක ලොරිංඩා ප්‍රිංගල් කියල අවුරුදු විසිතුනක තරුණියකගෙන් මට ලියුමක් ලැබුණා. සමුද්‍රේ සටන





පරීක්ෂණය රෝයල් සඟරාවෙ පළවුණාට පස්සෙ, මං පාඨකයන් වෙත ඉදිරිපත් කර ඇති කථා කියවන්න කම්මැලිලු. ඒවා කියවන්න ඇඩි ආයාසයක් දරන්න ඕනලු"

"වොට්සන්. ඔබ විවාහ වෙලා බේකර් වීදියෙන් පිටවී ගිය දිනවල මං යෙදුණු පරීක්ෂණ, හැම එකක්ම පාඨකයා වෙත ඉදිරිපත් කළේ නැද්ද?"

"ඒ ගැන තමයි මං මේ අහන්න හැදුවෙ. අර මේජර් ජෙනරාල් ජෝන් නිකල්සන් සම්බන්ධ පරීක්ෂණය දැන් පාඨකයා වෙත ඉදිරිපත් කළාට කමක් නැහැ නේද?"

"ආ ඒකෙ වරදක් නැහැ" මගේ මිත්‍රයා ඊට අවසර දුන්නේය.

මේරි මෝස්ටන් මෙනෙවිය සමඟ මගේ විවාහයත්, පෞද්ගලික ශල්‍යාගාරයක් විවෘත කොට රෝගීන් වෙනුවෙන් කාලය ගතකිරීමත්, එදා මා හෝම්ස්ගෙන් ඈත් කිරීමට සමත් වූ බව නොරහසකි. ඒ කාලයේ පෞද්ගලික වෙදකමෙන් මගේ අතමිට සරුසාර විය. මේරි සමඟ විවාහ දිවියෙන් මගේ සිත සන්තෝෂයෙන් මෙන්ම තෘප්තියෙන් පිරී ගියේය. ඒ බැවින් බේකර් වීදිය දෙසට යාමට මට අවස්ථාවක් සැලසුණා නම් ඒ ඉතා කලාතුරකිනි.

හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු, පැරණි හමුදා මිතුරෙකු මට හමුවූයේ අහම්බෙනි. එබැවින් ලෝරන්ස් මිචෙල් මගෙන් ප්‍රතිකාර පතා මගේ ශල්‍යාගාරයට පැමිණි විට මම පුදුමයට පත්වූයෙමි. මා තුවාල ලබා ඇෆ්ගනිස්ථානයෙන් පිටව එද්දී, ඔහු හමුදාවට බැඳුණු තරුණ කෙසඟ කොලුගැටයෙකු විය. දැන් අවුරුදු කිහිපයකට පසු ඔහු කඩවසම් තරුණයෙකු බවට පත්ව සිටියේය.

"වොට්සන් ඔබ හමුදා සේවය අත්ඇරල ආව එක විශාල පාඩුවක් වුණා" මිචෙල් කීවේ මා ඔහුගේ සෙම්ප්‍රතිශ්‍යාවට ප්‍රතිකාර නියම කොට අවසන් කළ පසුය.

"මයිවාන්ඩ්වල සටන බොහොම දරුණුවට ගිය බව මටත් අහන්න ලැබුණා" මම කීවෙමි. "මගේ කකුලට වැදුණු වෙඩි පහරින් ඇතිවුණු තුවාල; ඊට අමතරව මට උණසන්නිපාතයත් වැළඳුණානෙ. ඉතින් මට තවදුරටත් ඉන්දියාවෙ රැඳී ඉන්න පුළුවන් කමක් තිබුණෙ නෑ."

"හැබෑට?"

"ඇත්තමයි. ඒක වෙස් වළාගත්තු ආශීර්වාදයක් කියලයි මට හිතෙන්නෙ. ෂර්ලොක් හෝම්ස් කියල ශ්‍රේෂ්ඨ මිත්‍රයෙක් මට

හමුවුණේ එහෙම ආව නිසා. මගේ ආදරණීය බිරිඳ මේරි මට හමුවුණෙත් හෝම්ස් සමග ඇතිවුණු මිත්‍රත්වය නිසා"

"මං ඔහු ගැන අහල තියෙනවා" මිචෙල් කීය. "පත්තර සඟරාවලින් නම් කියන්නෙ, ඔහු අභිරහස් හෙළි කරගන්න අති දක්ෂයෙක් කියල. නමුත් මේව අතිශයෝක්ති කතාද කියල කවුද දන්නෙ? සමහර විට ඔහුට උවමනා වෙලා ඇත්තෙ ප්‍රසිද්ධිය වෙන්න ඇති?"

"කොහොමටවත් නෑ මිචෙල්. හෝම්ස් ප්‍රසිද්ධියට කැමතිම නෑ. ඔහු හෙළිකරගන්නා සමහර රහස්වල ගෞරවය ඔහු දෙන්නෙ පොලීසියට. ඔහු අති දක්ෂයෙක් බව නැවත නැවතත් ඔප්පු කරලා තියෙනවා. එහෙම නොවෙයි නම් රජ පවුලෙ, විදේශ රටවල රාජ්‍ය නායකයන්, ඉහළම ප්‍රභුවරුන්, තමන්ගේ පෞද්ගලික ගැටලු විසඳීම ඔහුට භාරදේවිද?"

"වොට්සන්. ඔබට ඇත්තම කියන්න, මේ දවස්වල මටත් හරි උභතෝකෝටික ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදුවෙලා තියෙනවා. නමුත් හෝම්ස් මහත්තයා වගේ රහස් පරීක්ෂකයෙකු හමුවෙන්න තරම් විශාල මුදලක් මා ළඟ නෑ."

"ඔබ ෂර්ලොක් හෝම්ස් මහත්මයා ගැන, කිසිම දෙයක් නොදන්නා බවයි මට නම් පෙනෙන්නෙ" මා කීවේ හඬ නගා සිනාසෙමිනි. "ඔහු කොහොමටවත් විශාල මුදලක් උපයා ගැනීමේ අරමුණෙන්, පරීක්ෂණවල යෙදෙන කෙනෙකු නෙමෙයි. ඔබගේ ගැටලුව ඉතා සංකීර්ණ හා අභිරහස් එකක් බව පෙනෙනවා නම්; ඔහුට අභියෝගයක් වෙන ලකුණු ඒකෙ තියෙනවා නම් ඔහු එය භාර ගනීවි. ඔහුගේ ගාස්තුව නිශ්චිත එකක් බව ඇත්තයි. නමුත් නැති බැරි කෙනෙකුගෙන් නම් ඔහු මුදල් ගන්නේ නෑ; තමන්ගේ ගාස්තුව ප්‍රතික්ෂේප කරනවා"

මගේ මිත්‍රයාගේ මුහුණෙන් පළවූයේ සැනසීමට පත් ලකුණුය. "ඒ බව අහන්නත් සන්තෝෂයි. අපි ඉල්ලා හිටියොත් මේ පරීක්ෂණ වල තොරතුරු රහසිගතව තබාගන්නවාද? නම් ගම් හෙළි නොකර ඉඳීමට ඔහුව කැමතිකරගන්න පුළුවන් වේවිද?"

"මට පුළුවනි මිචෙල් ඒ ගැන ඔබට සහතික වෙන්න."

"මගේ ප්‍රශ්නය මං ඉස්සරවෙලා ඔබට කියන්නම් වොට්සන්. ඔබ අහලා තියෙනවද ඉන්දියානු හමුදා සේවයේ යෙදුණු මේජර් ජෙනරාල් ජෝන් නිකල්සන් ගැන?"





"නම නං අහල තියෙනවා. නමුත් මං ඉන්දියාවෙ හිටිය කාලෙ කවදාවත් ඔහුව හමුවුණු බවක් මතක නෑ"

"මං කතාව මුල ඉඳලම ඔබට කියන්නම්" මිචෙල් කීවේ තම අසුනේ හරිබරි ගැසී හිඳ ගනිමිනි. "ජෝන් නිකල්සන් ඉන්දියාවෙ හමුදා සේවයට ගියේ අවුරුදු 22 ක තරුණයෙක් හැටියටලු. ඔහු ගිහින් තියෙන්නෙ මහා ඉන්දියානු කැරැල්ල ඇරඹුණු වෙලාවෙ. මුලින්ම ඔහු ගිහින් තියෙන්නෙ බ්‍රිගේඩියර් ජෙනරාල් හෙන්රි හැව්ලොක් යටතේ සේවයට කල්කටාවට. එතැනින් ඔහු ඉක්මනින්ම යැවුණාලු ලක්නව් වලට. ඔහු එහේ දීර්ඝ කාලයක් සේවය කරල, පසුව කෙටි කාලයක් ග්වාලියෝර් වලත් සේවය කරල තිබුණා. ඊළඟට ඔහු විශ්‍රාම ලබන්න කිට්ටුව, යළිත් වරක් කල්කටාවෙ බ්‍රිතාන්‍ය යුධ කඳවුරේ ප්‍රධානියා හැටියට මේජර් ජෙනරාල් තනතුරට උසස්වීම් ලබලා. 32 වැනි හයිලන්ඩර්ස් රෙජිමේන්තුවේ සේවය කළ මාව කල්කටාවට යැවුණෙත් ඔය දවස්වලමයි.

මං මගේ කථාව ඔබට කෙටියෙන් කියන්නම්. මේජර් ජෙනරාල් ජෝන් නිකල්සන්ට, කැතරින් නම් ඉතාම සුන්දර දියණියක් ඉන්නවා. ඇගේ වයස අවුරුදු විසි එකයි. ඉන්දියාවෙ ඉන්න කාලෙ අපි දෙන්නා අතර ප්‍රේම සම්බන්ධයක් ඇතිවුණා. ඒකට ඇගේ පියාගේ විරුද්ධත්වයක් තිබුණේ නෑ. මේ අතරේ කැතරින්ගේ මව හදිසියේ රෝගාතුර වුණා. එහේ වෛද්‍යවරුන්ගේ අදහස වුණේ ඇයට ශල්‍යකර්මයක් කළ යුතු බවයි. ඒ අනුව ඇය දියණිය සමග වහාම එංගලන්තයට එවනු ලැබුවා. ශල්‍යකර්මයට භාජනය වුණත් නිකල්සන් මහත්මිය වැඩි කාලයක් ජීවත්වුණේ නෑ. ඇය ඉක්මනින් මිය ගියා. මේ නිසා මේජර් ජෙනරාල් නිකල්සන් නියම කාලයටත් කලින් විශ්‍රාම අරගෙන, ආපහු එංගලන්තයේ පදිංචියට ආවා.

මං ඉන්දියාවේ රැකියාව කළත් මගේ හිත තිබුණේ කැතරින් ළඟ. මට උවමනා වෙලා තිබුණේ කොහොම හරි ආපහු එංගලන්තයට එන්නයි. මම දීර්ඝ නිවාඩුවක් ඉල්ලා හිටියත් ඒක මට ලැබුණෙ නෑ. අන්තිමට මං රැකියාවෙන් ඉල්ලා අස්වෙලා ආපහු එංගලන්තයට ආවා"

ප්‍රේමය වෙනුවෙන් තම රැකියා, තනතුරු අත්හැර ඇමූ මේ තරුණයා ගැන, මගේ මුවට සිනාවක් නැඟෙන්නට ඇත.

"මගේ හිතේ ඇය ගැන ඇඩි ආදරයක් ඇතිවුණේ ඇගේ රූපයට පමණක් නොවෙයි වොට්සන්" මිචෙල් කීය. "ඇය ඉතාම හොඳ

ගතිගුණ ඇති කාරුණික තැනැත්තියක්. ඇය තම දෙමව්පියන්ට කීකරු, චාම් ගති පැවැතුම් ඇති තැනැත්තියක්. තමන් කවුරු සමග විවාහ වුණත් තම දෙමව්පියන් මියයන තුරු ඔවුන් රැකබලා ගැනීම කළ යුතුම බව, ඇය මට ඒ කාලෙම කියා තිබුණා"

"ඔබට ෂර්ලොක් හෝම්ස් මහත්මයා හමුවෙන්න උවමනා වෙලා තියෙන්නේ ඔය ගැන වෙන්න බෑ?" මම ඇසීමි.

"ඔහොම ඉන්න වොට්සන්. ඒකට තමයි මං මීළඟට එන්නෙ.

ඔවුන් පදිංචිව සිටින්නේ බකිංහැම්ෂයර් ප්‍රාන්තයේ අයිල්ස්බරිහි. දැන් මම අවුරුද්දක පමණ ඉඳලා ඔවුන්ගේ නිවසට යනව එනවා. මං එහේට යන්නෙ මාසයකට එක්වරක් නැත්නම් දෙවරක්. එහෙම ගියාම මම පවුලේ අමුත්තෙකු හැටියට, එක් රැයක් හෝ රෑ දෙකක් එහි නැවතී ඉඳලයි එන්නේ. ඒ කාලේ ඉඳලම කැතීගේ පියා ඉතාම සාදරයෙනුයි මාව පිළිගත්තේ. ඔවුන් මට දැක්වූ ආගන්තුක සත්කාරය ඉතාම ඉහළයි. මං ඔහුගේ දියණිය සමග විවාහ වී සිටියා වුණත්, මේජර් ජෙනරාල් නිකල්සන් ඊට වඩා ඉහළින් මට සලකාවි කියා හිතන්න බෑ. මං ඔහු ඇමතුවේ "සර්" යන ආමන්ත්‍රණ පදයෙන්. තමාට මින් ඉදිරියේදී "මාමා" කියා අමතන ලෙස ඔහු මට කෙළින්ම කිව්වා.

කොහොම නමුත් මීට මාස දෙකකට පමණ පෙර සිට හැමදෙයක්ම ඉතා පුදුමාකාර ලෙස වෙනස්වීමට පටන් ගත්තා" කී මිචෙල් කථාව මඳකට නැවැත්විය. "ඔබ දන්නා හඳුනන මිත්‍රයෙකු නිසා මිසක් මට මේවා විස්තර කරන්නත් අමාරුයි.

කැතීගේ මව මීට ටික කලකට පෙර මියගිය බව මං ඔබට කිව්වා. ඒ නිසා නිවසේ සිටින්නේ කිහිප දෙනෙකු පමණයි. ඒ මේජර් ජෙනරාල් නිකල්සන්, කැතී සහ ගෙදරම පදිංචිව සිටින සේවිකාවන් තිදෙනෙකු පමණයි.

එක් දවසක් උදේ තේ පානයට කැතී තේ මේසයට ආවේ නෑ. හිසේ කැක්කුමක් නිසා ඇය කාමරයේම රැඳී සිටියා. උදේ ආහාරය ගනිමින් සිටියේ නිකල්සන් සහ මා පමණයි. අපි සුහද කතාබහක යෙදෙමින් හිටියේ. ඔහු එක්වරම තම කතාව නැවැත්තුවා. ඊළඟට ඔහු ගෙඋයන දෙසට තිබෙන ජනේලය විවෘත කළා. ඉන්පසු මේසය උඩ තිබූ සම්පූර්ණයෙන්ම තැම්බූ බිත්තරය අතට අරගෙන එය ජනේලයෙන් එළියට දමා ගැසුවා. ඊළඟට ජනේලය වසා දමලා ඔහු කතාබහ යළිත් සාමාන්‍ය විදියට ඇරඹුවා."





"හරි පුදුමයි" මට කියැවිණි. "ඔබ කියන්නේ මාස දෙකකට කලින් මෙහෙම දෙයක් සිදුවුණු බවයි. දැන් තත්ත්වය කොහොමද?"

"දැන් තත්ත්වය හුගක් අයහපත් අතට හැරිලා. මං හිතන්නේ නම් ඔහුට පිස්සු. ඔහුගේ හැසිරීම ඒ විධියයි. මට ඔබගෙන් අහන්න තිබෙන්නේ මෙහෙම ප්‍රශ්නයක් වොට්සන්. මං අහල තියෙනවා, උන්මාදය කියන එක පරම්පාවෙන් පරම්පරාවට යන රෝගයක් කියල. ඒක ඇත්තක්ද? මං කැතීට හුගක් ආදරේ බව ඇත්තයි. නමුත් ඇයත් ටික කලක් යද්දී ඇගේ පියා වගේ, උන්මාද තත්ත්වයට පත්වුණොත්? ඒ වගේ කෙනෙකු විවාහ කර ගැනීම ජීවිතය විනාශ කරගැනීමක් වගේ නේද?

හවස තේ පානයෙන් පස්සේ මං කෙළින්ම යන්නෙ නිවසේ පුස්තකාල කාමරයට. එදා හවස එහි යද්දී මට එක්තරා විශේෂිත දෙයක් දකින්න ලැබුණා. ඒ තමයි පුස්තකාලයේ නිකල්සන් මහතාට වෙන්වුණු අසුන ඉදිරිපිට තිබුණු දේ. හිස්කබලක් සහ ඇටකටු දෙකක් එහි තිබුණේ, මුහුදු කොල්ලකාරයින්ගේ කොඩියේ ලාංඡනය සිහිගන්වමින්. නිකල්සන් මහතා මුහුදු කොල්ලකාරයින් ගැන පොතක් කියවමින් හිටියා නම් මං පුදුමයකට පත්වෙන්නේ නෑ. නමුත් මේ දේවල් - හිස්කබලක් සහ ඇටකටු දුටුවාම මං විමතියට පත්වුණා. ඔහු ඒවා සොයාගත්තේ කොහෙන්ද? ඒ මොන අරමුණකින්ද? මට ඒ ප්‍රශ්නවලට පිළිතුරු හොයාගන්න බැරිවුණා.

එපමණක් නොවෙයි වොට්සන්. මීට සති තුනකට කලින් මට දකින්න ලැබුණා තවත් දේවල්. ගෙදර අය සාමාන්‍යයෙන් නින්දට යන්නේ රෑ දහයට විතර. නමුත් ඒ වෙලාවට මට නින්ද යන්නේ නෑ. මං කරන්නේ මගේ කාමරයට වෙලා නිදිමත වෙන තුරු පොත්පත් කියවීම. මගේ නිදන කාමරය තිබෙන්නේ නිවසේ වෙනම අංගනයක.

එදා රෑ දොළහ වෙන්නත් කලින් මට මගේ කාමරයෙන් පිටත අමුතු ශබ්දයක් ඇහුණා. මං වහාම එළියට ඇවිත් බැලුවා. මට දකින්න ලැබුණේ මොකක්ද කියා ඔබට හිතන්න පුළුවන්ද? මගේ කාමරය අසල දිග බරාඳයේ මේජර් ජෙනරාල් නිකල්සන් ඉදිරියට ඇවිද යමින් සිටියේ උඩ පනිමින්. ඔහු ඒ වෙලාවේ සැරසී සිටියේ ඔහුගේ රාත්‍රී ඇඳුමෙන්. දවල් වෙලාවෙ ඔහු එය කළා නම්, එළිමහනෙ කළා නම්, මං හිතන්නේ ඔහු ව්‍යායාමයක් කළා

කියලයි. නමුත් අර ළමයින් "ස්කිපිං රෝප්" එකක් අරගෙන උඩ පනිමින් කරන්නේ? ඔහු කරමින් සිටියේ අන්න එවැනි දෙයක්"

"ඔබ මෙය දකින බව ඔහු දැන සිටියාද?"

"ඇත්තෙන්ම ඔව් වොට්සන්. මේ "ක්‍රීඩාව" කරද්දී ඔහුගේ දෙනෙත් කෙළින්ම යොමු වෙලා තිබුණේ මා දිහාවට. ඒ වෙලාවේ ඔහුගේ දෙනෙත්වල තිබුණේ වියරු බැල්මක්. මගේ සිතේ ඇතිවුණේ භයක්. මට එක්වරම සිතුණේ අනතුරු අඟවා කෑගසන්න. නමුත් යළිත් මට සිතුණේ ඒ වෙලාවේ ගෙදර සිටි අනෙක් එකම පිරිමියා මා නිසා, ගෙදර කැලඹීමක් ඇතිකිරීම සුදුසු නැහැ කියලයි. ඉතින් මම ඉක්මනින් කාමරයට ගිහිං දොර වසා අගුළු දමා ගත්තා. ඊළඟට මං කාමරය ඇතුළේ බැලුවා, ආත්මාරක්ෂාවට යොදාගත හැකි යමක් තියෙනවාද කියා. ඒ වියරුව උත්සන්න වී ඔහු කාමරය ඇතුළට කඩා වැදුණොත් යන භයෙන්."

"මිචෙල්. ඔබට සිතුණේ එහෙම දෙයක් වුණත් සිදුවෙන්න ඉඩ තිබුණා කියලද?"

"ඔව්. ඒ වෙලාවෙ මට එහෙම හිතුණා. ඇගේ කාමරයේ තනියම නිදියන කැතී ගැනත් මගේ සිතේ භයක් ඇතිවුණා. කාමරයේ ගිනි උදුනේ අඟුරු ඇල්ලීමට තිබෙන ලොකු යකඩ අඬුව අරගෙන, කාමරයේ දොර අසලට වෙලා මම කන්දීගෙන හිටියා. නිකල්සන්ගේ "ක්‍රීඩාවේ" ශබ්දය ටික වේලාවක් තිබී නැවතුණා. මං කාමරයේ දොරගුළු ඇරලා එළියට ඇවිත් බැලුවා. ඔහු කොරිඩෝව දිගේ ආපසු තමන්ගේ කාමරය දෙසට යමින් හිටියා. ඒ මා ඔහු දෙස බලා සිටින බවක් නොදැන වගේ. ඊළඟට එක්වරම ඔහු නැවතුණා. මා ගැන දැනිලා වගේ ආපසු හැරී මා දිහා බැලුවා.

"හලෝ!" ඔහු කෑගැසුවේ මා අමතමින්. "තමුසෙ ඔය ආයුධයකුත් අතින් අරගෙන, මේ වෙලාවෙ ඔතන මොනවා කරනවද? මං අහන අනික් දේ මේකයි ඉලන්දාරියා. මේ මහරෑ දෙගොඩ හරි ජාමෙ නිදා ගන්නෙ නැතුව, කාමරයෙන් එළියට ඇවිත් තමුසෙ මොකක් කරනවද?"

"ඔබට තේරෙනව නේද වොට්සන්. ඒකට දිය හැකි පිළිතුරක් මා ළඟ එක්වරම තිබුණේ නෑ. නමුත් මිනිත්තුවකින් මං ගොත ගහමින් මෙහෙම කිව්වා.

"මට එළියේ ශබ්දයක් ඇහුණා. හොරුද දන්නෙ නෑ කියල හිතලයි මං එළියට ආවෙ"





"ඔහු ආපසු ඇවිත් ඉතා මිත්‍රශීලී විදියට වගේ උරහිසට තට්ටු කරලා, මට ශුභ රාත්‍රියක් පතා ආපසු ගියා. ඔය දේම තවත් රාත්‍රී දෙකක සිදුවුණු බව මට කිව හැකියි. නමුත් මං කාමරයෙන් එළියට ඇවිත් බැලුවේ නැහැ"

"එපමණද?"

"නැහැ වොට්සන්" මිචෙල් කීවේ සුසුමක් හෙළමිනි. "ඊයෙ හවස මං හිටියේ ඔහුගේ ගෙදර. ඇගේ මැහුම් ගෙතුම් කටයුතු සඳහා අවශ්‍ය යම් යම් දේ ගෙන එන්නට කැතී නගරයට ගියා. ඇගේ පෞද්ගලික සේවිකාවත් ඒ සමග ගියා. මුළුතැන්ගෙයි සේවිකාව කෑම ද්‍රව්‍ය මිලට ගන්න ගියා. අනෙක් මෙහෙකාරිය නිවාඩු. ගෙදර ඉතිරිවුණේ නිකල්සන් සහ මා පමණයි.

මට ලිවීමට තිබූ නමුත් අතපසු වූ ලියුම් කිහිපයක් ලියමින්, හවස් වරුව ගෙවන්නට මං තීරණය කළා. නිකල්සන් කිව්වේ දහවල් කෑමෙන් පසු තමන් සුපුරුදු ලෙස නින්දට යන බවයි.

ලියුම් දෙකක් ලියා අවසන් කරද්දී මට ගෙවත්ත දෙසින් ශබ්දයක් ඇසුණා. මගේ කාමරයේ ජනේලය විවෘත කළාම ඒ පැත්ත හොඳින් පෙනෙනවා. මට දකින්න ලැබුණේ මොකක්ද? මුළුතැන්ගෙය පිරිසිදු කරන කොස්ස අතට ගෙන සිටි නිකල්සන් එය කරේ තබාගෙන සිටියා. ඒ හරියට ආචාර පෙළපාළියක යන භටයෙක්, ගිනිඅවියක් කරේ තබාගෙන යන ආකාරයට. මීළඟට ඔහු ප්ලැටූනයක අණ දෙන්නෙකු හැටියට උස් හඬින් අණ නිකුත් කළා. ඊළඟට තමන්ම ඒවා පිළිපදිමින් ඉහළ පහළ ගමන් කළේ කොස්සත් කරේ තබාගෙන. ඒක දුටුවායින් පසු දැන් නම් මට කිසිම සැකයක් නෑ; මට හොඳටම විශ්වාසයි ඔහුට පිස්සු. මිනිත්තු දහයක පමණ කාලයක් ඔහු මේ අයුරින් තනිවම සරඹ සංදර්ශනයක යෙදුණා. අන්තිමේදී ඔහු කලබලයෙන් වගේ ආපසු ගෙට දුවගෙන එන ආකාරය මං දුටුවා. ඒ වහාම මට ඇසුණේ අමුත්තෙකු නිවසට පැමිණ, ඉදිරි දොරේ සීනුව නාද කළ ශබ්දය. නිකල්සන් ගේ තුළින් ගිහින් දොර විවෘත කර අමුත්තා ඇතුළට කැඳෙව්වා. මීළඟට නිකල්සන් මගේ නම කියා උස් හඬින් කෑගැසුවා. ඒ අමුත්තා සමග කතාබහට මාව කැඳවීමට."

"අමුත්තා සමග කතාබහ කිරීම නිකල්සන් ඔබට පැවරුවේ ඇයි?"

"මට ඔබට ඒ ගැන කලින් කියන්න බැරිවුණා. පැමිණ සිටියේ හර්බට් එවන්ස් මහත්මයා. ඔහු මේ පවුලේ මිත්‍රයෙක්. මේ පැත්තේ කොහේ හරි තමයි පදිංචිව සිටියේ. ඒ නිසා නිකල්සන් පවුලේ අසල්වැසියෙක්. කාලයකට පෙර නිකල්සන්ට එක්තරා මුදල් අර්බුදයක් ඇතිවුණු වෙලාවක හර්බට් එවන්ස් පිහිට වෙලා තියෙනවා. ඒ ගැන වැඩිදුර විස්තර මම දන්නෙ නෑ. නමුත් ඒ කරුණ නිසා ඇතිවුණු මිත්‍රත්වය හා බැඳීම දිගටම තිබුණු බව මට පෙනී ගියා. මේජර් ජෙනරාල් නිකල්සන් සමග පමණක් නෙමෙයි; කැති සමගත් එවන්ස්ගේ මිත්‍රත්වය තිබුණා. ඔහුගේ ස්වභාවය බොහොම දුරට ප්‍රසන්න එකක් කියන්න පුළුවනි. නමුත් සමහර වෙලාවට ඔහු හරිම අමුතුයි. කොහොම වෙතත් ඔහු නිකල්සන් නිවසට නිතර නිතර ආව ගියා. ඒ හැමවිටකම ඔහුව සාදරයෙන් පිළිගැනුණා."

"ඔහු සමග ඔබේ තිබෙන මිත්‍රත්වය සුහද බව මොන ආකාරයේ එකක්ද?" මා විමසුවේ මෙවැනි අවස්ථාවල මගේ මිත්‍ර හෝම්ස් ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරයෙනි.

"ඔහු සමග දැඩි මිත්‍රශීලී ලෙන්ගතු බවක් මගේ නැහැ. සාමාන්‍ය තත්ත්වයේ සුහද බවක් පමණයි. අමනාපයකුත් නැහැ. සමහර වෙලාවට අපි බිලියඩ් වටයක් හෝ දෙකක් ක්‍රීඩා කරනවා. ඒකට ඔහු ඉතාම දක්ෂයි. හැමවිටම වගේ මං පරදිනවා"

"ඔහුත් කැතරින් නිකල්සන්ගේ අතගැනීමේ අරමුණෙන් පැමිණෙන, ඔබ සමග තරඟ කරන කෙනෙක් කියා ඔබට හිතෙන්නේ නැද්ද?"

මගේ ඒ ප්‍රශ්නයට ලෝරන්ස් මිචෙල් නැගුවේ අප්‍රසන්න සිනාවකි.

"මගේ හිතවත් වොට්සන්. ඔබ ඒ මිනිහාව දැකල තිබුණා නම්, ඒ වගේ ප්‍රශ්නයක් මගෙන් කවදාවත් අහන එකක් නෑ. ඔහු අවුරුදු හතළිස්පහක හෝ පනහක අයෙක්. සෑම ආකාරයකින්ම වයස්ගත බව පෙනෙන කෙනෙක්. කෙට්ටු මිටි තැනැත්තෙක්. ස්වල්ප වශයෙන් කුදු ගැහිලා. හිසේ ලොකු තට්ටයකුත් තිබෙනවා. ඔහුගේ කම්මුලක - වම් කම්මුලේ විය යුතුයි. ලොකු තුවාල කැළලකුත් තියෙනවා."

"එහෙම නම් ඔබ සමග තරඟ කළ හැකි කෙනෙක් නෙමෙයි?"





"කොහොමටවත් නැහැ. අනික මගේ සිතේ කැති ගැන දැඩි ආදරයක් තිබෙනවා. ඇයගෙ සිතේත් මා ගැන ආදරයක් ඇති බව මට විශ්වාසයි. මං ඔබට කලිනුත් කිව්වා වගේ, අපේ ප්‍රේම සම්බන්ධය ඉන්දියාවේදී ඇතිවුණේ, මීට අවුරුද්දකටත් වඩා කලින්. ඒ වුණත්....... ඒ වුණත් දවස් දෙකකට කලින් මං ඇයට කිව්වා අපි විවාහ වෙමු කියලා........"

"එතකොට ඇය මොනවද කිව්වෙ?"

"තමන්ගේ මුළු හදවතින්ම මට ආදරය කරන බව කැති මා සමග කිව්වා. නමුත් ඇය කියා සිටියේ මා සමග විවාහ වීමට නොහැකි බවක්. එපමණයි"

"එතකොට මිචෙල් ඔබ හිතන්නේ මෙහෙම දෙයක්ද? ඇය සිතන්නේ ඇගේ පියා උන්මත්තකයෙකු වී ඇති බව. ඒ නිසා ඇයට උවමනා වෙලා තියෙනවා ඔබ විවාහයෙන් අධෛර්ය කිරීමට?"

"මං වෙන මොනවා හිතන්නද වොට්සන්? මේකට හේතුව මා කළ දෙයක් හෝ මගේ අඩුපාඩුවක් නිසා නොවෙන බව නම් මට හොඳටම විශ්වාසයි. ඒ වෙලාවෙවත් ඉන්පසුව වත් ඇය මා සමග අමනාප ස්වභාවයකින් පසුවුණේ නෑ."

"හොඳයි මිචෙල්. ඔබට කියන්න තියෙන....... නැත්නම් ෂර්ලොක් හෝම්ස්ට දැනුම් දිය යුතු කාරණාවල සාරාංශය මෙහෙම නේද? මේජර් ජෙනරාල් නිකල්සන් සම්පූර්ණව නැත්නම් අර්ධ වශයෙන් හෝ උමතු තත්ත්වයට පත්වෙලා. ඔහුගේ මෙම තත්ත්වය ආරෙට ඇවිත්, උමතු බවක් ඔහුගේ දූවටත් ඇතිවේවිද කියා, ඔබේ සිතේ සාධාරණ සැකයක් ඇතිවෙලා. කැති නිකල්සන් මෙනෙවියගේ ස්වභාවයෙත් ලොකු වෙනසක් වෙලා. ඊට හේතු වී තිබෙන්නේ එම කාරණයම වෙන්න පුළුවන්. ඇය ඔබ සමග විවාහ වීම ප්‍රතික්ෂේප කරනවා. ඔබේ ගැටලුව ඒකයි?"

"ඔව්. නමුත් ෂර්ලොක් හෝම්ස් මහත්මයා මගේ ගැටලුව විසඳීමට භාරගනීවිද?"

"ඒ ගැන නම් මට සහතික වෙන්න බෑ මිත්‍රයා" මම කීවෙමි. "ඔබේ ලිපිනය මට දෙන්න. හෝම්ස්ගේ පිළිතුර දින කීපයකින් මං ඔබට දැනුම දෙන්නම්"

* * *

සති කිහිපයකින් මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් හමුවීමට නොහැකි වූ බැව් මට සිහිවූයේ, ලෝරන්ස් මිචෙල්ගේ පැමිණීමත් ඔහුට ඇති වී තිබූ ගැටලුවත් සමගය. දින දෙකකින් එළඹෙන ඉරිදා දිනයේ හෝම්ස් හමුවීමට යාමට මම තීරණය කළෙමි.

කුලීරියකින් ගිය මම අපේ 221 B නිවහන අබියස රියෙන් බැස සීනුව නාද කළෙමි. දොර විවෘත කළේ හඩ්සන් මහත්මියයි.

"වොට්සන් දොස්තර මහත්මයා. ඔබ දකින්න ලැබුණේ හුඟක් කාලෙකින්" හඩ්සන් මහත්මිය කීවේ මුව පුරා සිනාසී මා සාදරයෙන් පිළිගනිමිනි. "අද නම් ඔබේ මිත්‍රයා උඩුමහලෙ ඉන්නවා. පහුගිය ටිකේම ඔහු ගෙදර හිටියෙ නෑ. මොනව හරි ලොකු පරීක්ෂණ ලැබිල වෙන්න ඇති. ගෙදර එන්නෙ හොඳටම රෑ වෙලා. ඔහු තනියම දොඩවන ශබ්දෙ මට පහළටත් ඇහෙනවා. ඔහුගේ රසායනික පර්යේෂණවලින් නැගෙන විෂදුම නම්, මේ පහළ තට්ටුවටත් එනවා. ළඟදීම මට ගිහින් ඉස්පිරිතාලෙ නවතින්නයි වෙන්නෙ"

මගේ මිත්‍රයාගේ ස්වභාවය හොඳින් දන්නා නිසා මගේ මුවගට සිනාවක් නැගිණ. ඇයට ස්තුති කොට මම උඩුමහලට නැගුණෙමි. මා දැකීමෙන්ම ඔහු අතිශය සතුටකට පත්වන බව මම දැන සිටියෙමි. එබැවින් සුපුරුදු ලෙස පියවර තබා මම උඩුමහලට නැගුණෙමි. මා දොරට තට්ටු කිරීමටවත් පෙර, අපගේ විසිත්ත කාමරයේ දොර විවෘත විය.

"මගේ හිතවත් වොට්සන්. ඇතුළට ඇවිත් වාඩිවෙන්න. මිනිත්තු දහයක් යනතුරු මා එක්ක කතාකරන්නවත් ප්‍රශ්න අහන්නවත් එපා."

මා ඇතුළුවන තුරු දොර විවෘත කරගෙන සිටි හෝම්ස් කීවේ මගේ සුපුරුදු අසුන දෙසට අත දිගුකොට හිඳගන්නා මෙන් සංඥා කරමිනි. වෙනත් කිසිවකු මා පිළිගත්තේ මේ අයුරින් නම්, එය කුරිරු අවිනීත පිළිගැනීමක් ලෙස මා සිතන්නට ඉඩ තිබිණ. එහෙත් මගේ මිත්‍රයාගේ හැටි දැන සිටි මට මේවා අමුතු දේවල් වූයේ නැත.

"මිනිත්තු දහයක් මට ඉඩ දෙන්න වොට්සන්" කී ඔහු අතේ තිබුණේ මිනිස් අස්ථි කැබලි කිහිපයකි. ඔහු ඒවායේ දිග මනිමින් සිටියේ ටේප් පටියක ආධාරයෙනි. මීට අමතරව මේසය මත විවෘත කොට තිබූ "ග්‍රේ" ලියූ "අස්ථි විද්‍යා පාඨ ග්‍රන්ථය" පොත ඔහු විමර්ශනය කරමින් සිටි බැව් මම තේරුම් ගතිමි. මිනිත්තු දහයක්





ගතවෙද්දී තම කටයුතු අවසන් කළ ඔහු සුපුරුදු හාන්සි පුටුවේ හිඳ ගත්තේය. අනතුරුව පයිප්ප දුම්කොළ තබා ගැනීමට ඔහු පාවිච්චි කළ පර්සියානු සෙරෙප්පුවෙන්, හෝම්ස් තම පයිප්පයට දුම්කොළ පිරවීමට පටන් ගත්තේය.

"කියන්නත් සන්තෝෂයි වොට්සන්. ඔබේ පෞද්ගලික ශල්‍යාගාරයේ ආදායම දැන් සරුසාර වගේම, ඔබේ විවාහ ජීවිතයත් සතුටින් ගතවෙන බව පේනවා" හෝම්ස් කීය.

"හෝම්ස්. ඔබ කොහොමද ඒ වගේ දේවල් දැනගත්තෙ?"

"මේවා හුඟක් සරල දේවල් මිත්‍රයා. ඔබේ සපත්තු, තොප්පිය, ඇඳුම් ආදී හැම දෙයක්ම ඉතා පිරිසිදුව, ක්‍රමානුකූලව පවත්වාගෙන යනවා. ඔබ මා එක්ක මෙහේ ඉඳිද්දී ඔය ඇඳුම් පැළඳුම් ඔය තරම් හොඳ තත්ත්වයෙන් තිබුණේ නෑ. මේ කටයුතුවලට වෙනම පෞද්ගලික සේවකයෙකු ගන්න තරම්, ඔබේ ආර්ථික තත්ත්වය ඉහළට ඇවිත් නෑ කියල මං දන්නවා. ඒ කියන්නේ මේ හැමදෙයක්ම ඔබේ බිරිඳ අතින් ඉටුවෙන දේ. මට ඒකෙන් තේරුම් ගන්න පුළුවනි ඔබේ විවාහ ජීවිතය සතුටින් ගතවෙන බව"

"ඔබ නිවැරදියි. නමුත් මගේ පෞද්ගලික වෙදකම සාර්ථකව සිදුකෙරෙන බව?"

"වොට්සන්. ඔබේ ඇඟිලිවල තුවාල සලකුණු නැතත් අයඩීන් වලින් සහ නයිට්‍රේට් ඔෆ් සිල්වර් වලින් ඇතිවූ පැල්ලම් තියෙනවා. ඔබේ හිස්වැස්ම එක තැනකින් පිම්බී තියෙනවා. ඒ ඔබ ස්ටෙතස්කෝපය ගෙන යන තැන. ඔබේ ඇඳුම් ඉතාම පිරිසිදුව තිබුණත්, ඔබේ කාලය ගතවෙන්නෙ ක්‍රියාශීලීව අවිවේකයෙන් බව මට කිව හැකියි."

"ඔබ කියූ කාරණා දෙකම නිවැරදියි හෝම්ස්. මේ හැම දෙයක්ම විනිවිද දැකීමට ඔබට තියෙන්නේ අසාමාන්‍ය බුද්ධියක් හා නිරීක්ෂණ ශක්තියක්" මම කීවෙමි. "අද නම් මං මේ ආවෙ මගේ මිත්‍රයෙකුට ඇතිවී තිබෙන ප්‍රශ්නයක් නිසා. ඔබ කැමතිද කන් දෙන්න?"

"බොහොම කැමතියි. ඔබට කියන්න තියෙන හැම දෙයක්ම කියන්න වොට්සන්" කී හෝම්ස් තම හාන්සි පුටුවේ දිග ඇදී දෙනෙත් පියාගත්තේය.

ලෝරන්ස් මිචෙල් මා සමග පැවසූ ඔහුගේ ගැටලුව පිළිබඳ සම්පූර්ණ විස්තරය මම හෝම්ස් සමග පැවසුවෙමි. මගේ කථාවට

ඔහු සාවධානව සවන් දුන්නේය. තම ප්‍රශ්න ඉදිරිපත් කළේ එයින් අනතුරුවය.

"මේ මේජර් ජෙනරාල්වරයා ඉන්දියාවෙදි ඔබත් සමග එකට සේවය කළ අයෙක්ද?"

"නැහැ. ඉන්දියාවෙදි මට ඔහු ගැන අහන්න ලැබී තිබුණා. නමුත් ජෝන් නිකල්සන් මට කවදාවත් හමුවෙලා නැහැ"

"මොනවද ඔබට ඔහු ගැන අහන්න ලැබුණෙ? ඔහු කොයි වගේ කෙනෙක්ද?"

"ඔහු අවුරුදු 22 ක තරුණයෙකු හැටියටයි මහා කැරැල්ල කාලෙ ඉන්දියාවට ගියේ. ඔහු තමන්ගේ හමුදා ජීවිතය සම්පූර්ණයෙන්ම වගේ ගත කළේ ඒ රටේ. මුලින්ම කල්කටාවට ගියත් ඔහු වැඩියෙන්ම හිටියෙ ලක්නව් වල බව මං ඔබට කිව්වා. ස්වදේශික ඉන්දියානුවන් අතර ඔහුට ලොකු පිළිගැනීමක් තිබුණා. ඒ නිසා හින්දු ආගමික හා සංස්කෘතික උත්සවවලට පවා ඔහුට ඇරයුම් ලැබුණු බව මං අහල තියෙනවා. ඔහු තම විවාහය සඳහා ආපසු එංගලන්තයට ඇවිත් බිරිඳත් කැඳවාගෙන, යළිත් වරක් ගියේ ලක්නව් වලට ම ලු. ඔහු ඒ පෙරදිග ජීවිතයට හරියට ඇළුම් කළාලු. ඔහුගේ බිරිඳ අකාලයේ මියගියේ නැත්නම්, නිකල්සන් තවත් කාලයක් ඉන්දියාවේ සිටින්න ඉඩ තිබුණාලු"

"ඔහුගේ දුර්වලකම් මොනවා හරි තියෙන්න ඇති. ඒ ගැන ඔබේ මිත්‍රයා ඔබට කිව්වද?"

"තමන්ගේ මව්බිමෙන් ඈත්වෙලා පිටරටවල සේවයට යන සොල්දාදුවන් කවුරුත් මුහුණ දෙන කාන්සියට ඔහුත් මුහුණ දෙන්න ඇති. ඒ නිසා නිකල්සන් මත්පැනටත් කාඩ් ක්‍රීඩාවටත් යොමුවී සිටි බව මිචෙල්ට අහන්න ලැබුණාලු."

"ඔබේ මිත්‍රයා මිචෙල් කොයි වගේ කෙනෙක්ද? ඇත්තෙන්ම මට ඔහු සමග කතාබහ කරන්න අවස්ථාවක් ලැබුණා නම් හොඳයි"

"ඔහු කැමතියි ඔබ හමුවෙන්න......."

"නමුත් ප්‍රශ්නය තියෙන්නේ........ මේ අවස්ථාවේ ඔහු වෙනුවෙන් පැය කිහිපයක් වෙන් කරන්නට මට හැකියාවක් නෑ. ඒ මොකද කාලයක් විදේශ කටයුතු පිළිබඳ ලේකම් ධුරය දැරූ බැල්මොරල් සාමිවරයා ඔබට මතකයි නේ. ඔහුගේ පවුලේ ප්‍රශ්නයක් විසඳීම මට භාරවෙලා තියෙනවා. නමුත් ඒක මොකක්ද කියන එක





මේ වෙලාවෙ ඔබටවත් හෙළිකිරීමට මට අවසර නෑ වොට්සන්. බැල්මොරල් පවුල ආර්ථික අතින් හුගක් අමාරු තත්ත්වයකට ඇද වැටිලා ඉන්නේ."

"හෝම්ස්. මගේ මිත්‍රයා මිචෙල් විමසා සිටියා, මේ ගැටලුව වෙනුවෙන් ඔබ අයකරන ගාස්තුව කොපමණ වේවිද කියලා?"

"ඒ ගැන හිතට ගන්න එපා කියලා ඔහුට කියන්න. ඔහු ඔබේ මිත්‍රයෙක් නේ. මේ වෙලාවේ ඔහුට සහනයක් සලසන්න බලමු. මේක තරමක් සංකීර්ණ ගැටලුවක් කියලයි මට නම් හිතෙන්නෙ. වොට්සන් ඔබට මා වෙනුවෙන් මෙහෙම දෙයක් කරන්න පුළුවන්ද?"

"කොහොම දෙයක්ද?"

"ඔබට හැකිවේවිද දින තුන හතරක නිවාඩුවක් අරගන්න?"

"ඒ කියන්නෙ?"

"ඔබේ ශල්‍යාගාරයේ වැඩ කටයුතු බලා ගැනීම කවුරු හරි වෛද්‍යවරයෙකුට පවරලා, අයිල්ස්බරිහි නිකල්සන්ගේ නිවසේ නවතින්න යන්න........? මට අමතක වුණා. එතකොට ඔබේ බිරිඳ?"

"ඒ ගැන නම් ප්‍රශ්නයක් වෙන්නෙ නෑ හෝම්ස්. මගේ බිරිඳ කලින් රැකියාව කළ සිසිල් ෆොරස්ටර් මහත්මියගේ ගෙදර දින කිහිපයක් නවතින්න යන්න මේරි හරි කැමතියි. මගේ රෝගීන් ගැන බැලීම දොස්තර ඇන්ස්ට්රුදර්ට භාරදෙන්න මට පුළුවනි. ඒකත් එච්චර අමාරු වෙන එකක් නෑ. ඔබත් එනවාද මා එක්ක යන්න?"

"ඒ ගැන මේ මොහොතෙ මට මොකුත්ම කියන්න බෑ වොට්සන්" හෝම්ස් කීය. "ඔබේ කටයුතු සූදානම් කරගන්න. මගේ සැලැස්ම මොකක්ද කියලා මං ඔබට පසුව දැනුම් දෙන්නම්"

* * *

මට දින කිහිපයකට බකිංහැම්ෂයර් ප්‍රාන්තයේ අයිල්ස්බරි වෙත යෑමට සිදුවන්නේ හෝම්ස් නොමැතිව බැව් මම තේරුම් ගත්තෙමි. කෙසේ වෙතත් මේ ගැන මිචෙල් දැනුවත් කළ යුතුය. ඔහු පදිංචිව සිටියේ සාන්ත මයිකල් පෙදෙසේ නේවාසිකාගාරයකය. මම මිචෙල් හමුවීමට ගියෙමි. ෂර්ලොක් හෝම්ස්ගේ සැලසුම ගැන මිචෙල් දැනුම්වත් කළෙමි.

"අපට තිබෙන පළමුවැනි ප්‍රශ්නෙ මේකයි" මම කීවෙමි. "ආරාධනයක් නොමැතිව අපි කොහොමද නිකල්සන්ගේ ගෙදරට බලෙන් කඩා වදින්නෙ?"

"එහෙම ආරාධනයක් අවශ්‍ය නෑ වොට්සන්." මිචෙල් කීය. "ඔබ කාලයක් ඉන්දියාවෙ සේවය කළ සොල්දාදුවෙක් නේ. ඔබ දැන හඳුනාගෙන ආශ්‍රය කරන්න, දින කීපයකට ඔබ ඔහුගේ නිවසේ රඳවාගන්න, නිකල්සන් බොහොම කැමති වේවි. ඔහු කොහොමටත් ආගන්තුක සත්කාරයට ලැදි කෙනෙක්"

"කොහොම වුණත් මා සමග එන බව කියලා ඔබ ඔහුට විදුලි පුවතක් යවන්න. මගේ නමින් නම් ඔහු මාව හඳුනන එකක් නැහැ. අනික ෂර්ලොක් හෝම්ස් ගැන කිසි සඳහනක් කරන්න එපා"

මිචෙල් එදිනම මේජර් ජෙනරාල් නිකල්සන් වෙත විදුලි පුවතක් යැව්වේය. පසුවදා උදෑසනම අපි බකිංහැම්ෂයර් ප්‍රාන්තය බලා පිටත්වී ගියෙමු.

අනෙක් දේ කෙසේ වෙතත්, හමුදා නිලධරයා ආගන්තුක සත්කාරයට ලැදි කෙනෙකු බවට මිචෙල් කී වදන, සත්‍යයක් බැව් මට වහාම පෙනී ගියේය. නිකල්සන් උණුසුම් අයුරින් අතට අත දී මා ගෞරවයෙන් පිළිගත්තේය. උසින් අඩි හයක් පමණ වූ ඔහු වයසින් හැටක් පමණ වූවත්, හැඩිදැඩි සිරුරකට උරුම කම් කීවේය. දිගු කලක් හමුදා සේවයේ යෙදීම නිසා හමුදා හැඩගැස්ම තවමත් ඔහු වෙතින් දක්නට ලැබිණ.

අප විසිත්ත කාමරය තුළට පිවිසෙද්දී කැතරින් නිකල්සන් මෙනෙවිය අප සාදරයෙන් පිළිගත්තාය. නිල් පැහැති දෙනෙත් හා රන්වන් පැහැති කෙස් කළඹක් තිබූ ඇය, අතිශයින්ම රූමත් තරුණියක බැව් මම දුටුවෙමි. කෙසේ වෙතත් සුහද කතාබහක යෙදීමට ඇය ඉදිරිපත් නොවූ බවද දක්නට ලැබිණ. මා එම නිවසට සම්පූර්ණයෙන්ම අමුත්තෙකු වීම එයට හේතු වන්නට ඇත.

තේපැන් සංග්‍රහයට සහභාගි වූයේ අප සිව්දෙනාය. එනම් මේජර් ජෙනරාල් නිකල්සන්, කැතරින්, මිචෙල් හා මා ය. ඉන්දියාවේ හමුදා ජීවිතය මෙන්ම, ලන්ඩනයේ පෞද්ගලික වෙදකම ප්‍රධාන කොටගත් නොයෙක් කරුණු, අපගේ කතාබහේ මාතෘකා බවට පත්විය. කෙසේ වෙතත් මගේ මිතුරු ෂර්ලොක් හෝම්ස් ගැන කිසිවක් බකිංහැම්ෂයරයේදී කිසිවෙකුට නොකිව යුතු බවට, මම ලන්ඩනයේදීම මගේ මිතුරු මිචෙල් පොරොන්දු කරවා ගත්තෙමි.





අනෙක් අතට ඔහු කී ආකාරයේ උන්මත්තක හෝ මානසික රෝගයකට ගොදුරු වූ බවක් මම නිකල්සන් වෙතින් නුදුටුවෙමි.

අපේ කතාබහ අවසන් වෙද්දී අප අසලට පැමිණි ගෘහ සේවිකාව හර්බට් එවන්ස් මහතා පැමිණ ඇති බව දැනුම් දුන්නාය. මිචෙල් ගෙන් අසන්නට ලැබුණු විස්තර නිසා එවන්ස් දැක ගැනීමට මගේ උනන්දුවක් තිබිණි. ඔහුගේ හැසිරීම දැකගැනීමට පෙර මා කළේ ඔහු පැමිණෙද්දී, කාමරයේ අනෙක් අයගේ හැඟීම් හා ප්‍රතිචාරය නිරීක්ෂණය කිරීමය. මෙය ඉතා සාර්ථක උපක්‍රමයක් බැව් හෝම්ස් මට පවසා තිබිණ.

"වොට්සන්. ඔබට මිනිහෙක් ගැන කාරණා හුගක් වටහා ගන්න පුළුවන් වෙනවා; ඔහුගේ හැසිරීම බලා ඉඳීමට වඩා ඔහු ගැන අනික් අයගේ ආකල්පය හා ප්‍රතිචාරය නිරීක්ෂණය කිරීමෙන්"

එවන්ස්ට අතට අතදී පිළිගත්තත්, ඔහුගේ පැමිණීමත් සමගම නිකල්සන්ගේ මුහුණේ නොසතුටු හැඟුම් පළ වූ බැව් මම දුටුවෙමි. එහෙත් නිකල්සන් උත්සාහයක් දරා, සිනාවක් මුහුණට නංවා ගත්තේය. ඔහුගේ දියණියට නම් මෙම අමුත්තාගේ පැමිණීම ගැටලුවක් නොවූ බැව් පෙනිණ. එහෙත් සැබෑ තත්ත්වය නම් බැලූ බැල්මට දුටු දේ නොවන බැව් මඳ වේලාවක් ගත වෙද්දී මට සිතිණ. එදා එවන්ස් ගැන කියද්දී මිචෙල් මා සමග කියූ එක් කරුණක් මගේ සිහියට නැඟිණ. එනම් කැතරින් නිකල්සන්ගේ අත පතන තමාට එවන්ස් කිසිසේත් අභියෝගයක් නොවන බවයි. කෙසේ වෙතත් මගේ මිත්‍ර මිචෙල්ගේ යටි සිතේ සැමවිටම එවන්ස් කෙරෙහි තිබූ ඊර්ෂ්‍යාව සහ ද්වේෂ සහගත බව මම තේරුම් ගත්තෙමි. මිචෙල් කියූ වචනවල හා ක්‍රියාවල එම ද්වේෂය සියුම් ලෙස සැඟවී තිබූ අයුරු මම දුටුවෙමි.

එවන්ස් කුමන අන්දමේ පුද්ගලයෙකුද යන්න නිශ්චිතව තේරුම් ගැනීමට අපහසු බැව් මට පෙනිණ. ඔහුගේ ඇඳුම් පැළඳුම්වල කිසිදු අඩුපාඩුවක් මම නුදුටුවෙමි.

ඔහුට මා හඳුන්වා දෙද්දී "වොට්සන්" යන නම කියවුණු මොහොතේ, එවන්ස්ගේ දෙනෙතේ ක්ෂණික වෙනසක් ඇතිවූවා යයි මට සිතිණ. එහෙත් ඔහු කිසිවක් කීමට උත්සාහ කළේද නැත. එයින් අනතුරුව අප අතර කතාබහ ඇතිවූයේ එකිනෙකට වෙනස් මාතෘකා ගැනයි. ට්‍රවුට් මසුන් බිලිබෑමේදී ඇතිවන දුෂ්කරතා, ටියුලිප් මල් වගා කිරීම, බකිංහැම්ෂයර් ප්‍රාන්තයේ ඇති ගොල්ෆ්

පිටි වල හොඳ නරක ආදී දේ මේ අතර විය. ගෙහිමියාගේ මෙන්ම එවන්ස්ගේද විනෝදාංශ ඉහත සඳහන් කළ ඒවා බැව් පෙනිණ. එවන්ස් අප සමග රාත්‍රී භෝජනයට සහභාගීවන බව නිකල්සන් මහතා ප්‍රකාශ කළේ මේ අතරයි. තේ පැන් සාදය ඒ සමග අවසන් විණි.

තමා වත්තේ වවා ඇති මල් පැළ නැරඹීමට යන බව මිචෙල් පැවසුවේය. ඒ සඳහා ඔහුට හවුල් වීමට කැමති බව කැති නිකල්සන් කීවාය. එවන්ස්ගේ මුහුණ එක් තත්පරයකට හෝ දෙකකට විරූපී වී ගිය අයුරු මම දුටුවෙමි. එයින් පිළිබිඹු වූයේ දැඩි ඊර්ෂ්‍යාවක් මිස අන් කිසිවක් නොවේ. ඒ සමගම ඔහු උත්සාහයක් දරා මුහුණේ හැඟීම් යටපත් කර ගත්තේය. මා දැඩි අවධානයකින් එවන්ස්ගේ මුහුණ නිරීක්ෂණය නොකෙළේ නම්, ඒ සිදුවීම මා නොදකින්නට ඉඩ තිබිණ. මිචෙල් කුමක් සිතාගත්තත් එවන්ස් යනු, කැති නිකල්සන් විවාහ කර ගැනීමේ අපේක්ෂාවෙන් සිටින මනාලයෙකි.

කෙසේ වෙතත් සිනාමුසු මුහුණින් මා දෙස බැලූ එවන්ස් බිලියඩ් ක්‍රීඩාවේ යෙදීමට මට ඇරයුම් කළේය.

"ඉන්දියාවෙ ඉඳිද්දි තමයි මං බොහොම උනන්දුවෙන් බිලියඩ් ක්‍රීඩා කළේ" මම කීවෙමි. "ආපහු එංගලන්තෙට ආවට පස්සෙ බිලියඩ් පිත්තක් ඇල්லුවෙ නැතිතරම්. ක්‍රීඩාවට මගේ තියෙන අදක්ෂකම නිසා මං හිතන්නෙ ඔබට එපා වේවි"

"නෑ නෑ ප්‍රශ්නයක් නෑ" එවන්ස් කීය. "බිලියඩ් පිත්ත අරගෙන සෙල්ලම් කරන්න පටන් ගන්නකො. එතකොට ඔබේ පරණ දක්ෂ කම් ආයෙ මතුවේවි. ඒක මට හොඳටම විශ්වාසයි"

ඉන්දියාවේදීද මම දක්ෂ බිලියඩ් ක්‍රීඩකයෙකු නොවීමි. එංගලන්තයට පැමිණි පසුද ඉඳහිට එම ක්‍රීඩාවේ මා යෙදුණේ මගේ හිතමිත්‍ර තර්ස්ටන් සමග පමණි. අප එසේ ක්‍රීඩා කළේ විනෝදය සඳහා මිස මුදල් ඔට්ටුවට නොවේ.

"අපි මොන වගේ මුදලක්ද ඔට්ටු අල්ලන්නෙ?" එවන්ස් ඇසීය. "ලකුණු සීයකට ගිනි පහක් වැනි ඔට්ටුවක් තියාගමු"

"ඒ ගණන නම් හොඳටම වැඩියි එවන්ස් මහත්මයා" මම කීවෙමි. "මුදල් ඔට්ටුවට ක්‍රීඩා කරන්න ඔබට උවමනාමද? එහෙම නම් අපි ඉතාම සුළු මුදලකට - ලකුණු සීයකට ගිනි එකක් ඔට්ටු අල්ලමු. පෞද්ගලික වෙදකමේ යෙදුණත්, මං රෝගීන්ගෙන් මුදල් අය කරන්නෙ බොහොම අඩුවෙන්. ඔවුන් රෝගයකින් සුවපත්





කිරීමෙන් මං විශාල සතුටක් ලබනවා. මහා ලොකු ගණන් අය කරමින් රෝගීන් හූරාකන වෛද්‍යවරුන්ට, ඒ සතුට කවදාවත් ලැබෙන්නේ නෑ"

"ඒකත් එහෙමද? එහෙම නම් අපි ඔබ කියූ මුදලට තරඟ කරමු. ඔබ සුප්‍රකට අපරාධ පරීක්ෂකයකු ගේ වාර්තාකාරයා නේද? ඒ මහන්සිය වෙනුවෙන් සෑහෙන ආදායමක් ඔබට ලැබෙනවා ඇති කියලයි මං අනුමාන කළේ. ඒක වැරැදීමක් නම් මට ඒ ගැන කනගාටුයි" එසේ කියමින් ඔහු තම හිස මඳක් පහත් කළේ මා දෙස නෙත් කොණින් බලමිනි. මේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ හෝම්ස් සහ මා අතර ඇති මිත්‍රත්වය ගැන, ඔහු හොඳින් වටහාගෙන ඇති බවයි.

ඔහු මේ ක්‍රීඩාවට අති දක්ෂයෙකු බැව් මම තේරුම් ගතිමි. ක්‍රීඩාවේ යෙදෙන අතර ඔහු දිගින් දිගටම මගෙන් විමසුවේ ෂර්ලොක් හෝම්ස් තම අභිරහස් හෙළිකර ගැනීමට යොදන පරීක්ෂණ විධි ගැනයි. ඒවා ගැන මා කිසිවක් නොදන්නා බව පෙන්වා එවන්ස්ගේ ප්‍රශ්නවලින් ගැළවීමට මම සමත්වීමි. ආචාරශීලී බව සහ මිතුරුකම රැක ගැනීමට අවශ්‍ය නිසා, හෝම්ස් ගැන කරුණක් දෙකක් මම එවන්ස්ට පැවසීමි. ඒ මිස අනවශ්‍ය ලෙස ඔහුට තොරතුරු සැපයීමට මගේ සූදානමක් නොවිය. මා බිලියඩ් ක්‍රීඩාවෙන් දිගින් දිගටම පරාජය වෙද්දී තරඟය නැවැත්වීමට මම යෝජනා කළෙමි. ඔහු ඊට එකඟ විය.

"ඔබට ඇතිවුණු පාඩුව ඉතා විශාල එකක් නෙමෙයි කියල මං විශ්වාස කරනවා" ඔහු කීවේ මා ගෙවිය යුතු සම්පූර්ණ මුදලම නොපැකිළව සාක්කුවේ දමා ගනිමිනි.

"ආ ඒකට කමක් නෑ" මම පිළිතුරු දුනිමි.

රාත්‍රී භෝජනය සඳහා හැඳ පැළඳගැනීමට අවශ්‍ය බැවින්, මගේ කාමරයට යන බැව් එවන්ස්ට කීවෙමි. තමා විසිත්ත කාමරය වෙත යන බැව් ඔහු කීය. ඒ නිසැකවම කැති මෙනෙවිය සමග නිදහසේ කතාබහ කිරීමට විය යුතුය. රෑ කෑමට සැරසීම සඳහා මගේ මිත්‍ර මිචෙල්ද තම කාමරයට ගියේය.

මගේ කාමරයට පිවිසුණු වහාම මම හෝම්ස් වෙත යැවීමට කෙටි වාර්තාවක් ඉක්මනින් සකස් කළෙමි. මට හමුවූ පුද්ගලයන් සහ ඔවුන් පිළිබඳ නිරීක්ෂණ එහි ඇතුළත් කළෙමි. මීළඟට එය

කවරයක බහා මුද්‍රා තබා, අමතර මුදලක්ද සමග සේවිකාවක අතට දුන්නෙමි. ඒ ලිපිය හැකි ඉක්මනින් තැපැල් කිරීමට උපදෙස් ද සමගය.

රාත්‍රී ආහාරයේ ප්‍රධාන කොටස වූයේ ඉන්දියානු ක්‍රමයට මිරිස් තුනපහ යොදා පිළියෙල කළ බැටළු මස් ව්‍යාංජනයක් සමග පාන් සහ චපාතිය. ඉන්දියාවේ කලක් ජීවත් වූ තිදෙනා වූ නිකල්සන් සහ මිචෙල් දෙදෙනා සහ මම, ඉතා කැමැත්තෙන් මේ ආහාර වේල රස වින්දෙමු. ඉන්දියාවේ හමුදා කඳවුරුවල රාත්‍රී භෝජනයට නිතර සැපයුණු මෙවැනි කෑම බීම ගැනද සතුටින් කතාබහ කළෙමු. මේ ආහාර වේල ගැන කැතී මෙනෙවියගේ එතරම් ඇගැයීමක් නොවීය. එහෙත් අප මෙන් ඉන්දියානු පළපුරුද්දක් නොතිබූ එවන්ස්ද මේ අහර ගිල දැම්මේ අපමණ සතුටකිනි.

රාත්‍රී භෝජනයෙන් පසු කෙරුණු කතාබහේද එතරම් සුහද බවක් නොවීය. ඊට හේතුව කලක් පෙරදිග ජීවත් නොවූ එකම පුද්ගලයා එවන්ස් වීම නොවේ. ඔහු වෙත මිචෙල් එළිපිටම අකමැත්තක් දැක්වීය. එයට ඊර්ෂ්‍යාවද හේතු වන්නට ඇත.

රාත්‍රී භෝජනයෙන් පසු අපි විසිත්ත කාමරයේ හිඳගෙන කතා බහකට වැටුණෙමු. ගෙහිමියා අනර්ඝ පෝට් වයින් සහ සුරුට්ටු වලින් සංග්‍රහ කළේය. කැතී මෙනෙවිය පියානෝව වාදනය කරමින් ගී කිහිපයක්ද ගායනා කළාය. අන්තිමේදී හර්බට් එවන්ස් අපෙන් සමුගත්තේ අප සැමට ශුභ රාත්‍රියක් ප්‍රාර්ථනා කරමිනි.

"තාත්තේ මමත් නිදාගන්න යන්න ඕන" කැතී මෙනෙවිය සිය අසුනෙන් නැගිටිමින් කීවාය. "ඉන්දියාවේ එක විදියේ ජීවිත ගත කළ ඔබ තිදෙනාට නම්, කතා කරන්න ඕනෑ තරම් දේවල් ඇති. ඒ වුණත් හුගක් රෑ වෙනකම් ඉන්න එපා. ඔබට ශුභ රාත්‍රියක්" කියා ඇය නින්දට යාම සඳහා පිටවී ගියාය.

අනපේක්ෂිත ලෙස ඇය එතැනින් පිටවී යාමෙන්, මිචෙල් කැලඹීමට පත්වූ බැව් මම දුටුවෙමි. ඔහු මඳ වේලාවක් කිසිදු කතාබහක් නොකොට බුම්මාගෙන සිටියේය. අනතුරුව ඔහු නොනවත්වාම වයින් බීමට පටන් ගත්තේය. මී විතින් පදම් වෙද්දී සියලු සීමා බන්ධන ඔහුට අමතක විය. අප ලන්ඩනයෙන් පිටත් වෙද්දී මා දුන් උපදේශය ඔහුට මුළුමනින්ම අමතක වී ගියේ, එතැන තත්ත්වය උඩු යටිකුරු කරමිනි.





"අපේ මේ මිත්‍රයා දොස්තර ජෝන් වොට්සන් තමයි ෂර්ලොක් හෝම්ස්ගේ වාර්තා කාරයා" මිචෙල් කීවේ තවත් වයින් වීදුරුවක් එක හුස්මට ගිල දමමිනි.

"මොන ෂර්ලොක් හෝම්ස්ගෙ ද?" නිකල්සන් විමසුවේය.

"ඇයි ඔබ අහල නැද්ද? බේකර් වීදියේ සුප්‍රකට අපරාධ පරීක්ෂණ විශේෂඥයා ෂර්ලොක් හෝම්ස්?"

මෙම ප්‍රකාශය සමගම වයෝවෘද්ධ හමුදා නිලධරයා අපමණ කැලඹීමටත් තිගැස්සීමටත් භාජනය වූයේ එක් ක්ෂණයකිනි. "දෙයියම්පා! දොස්තර වොට්සන්! මං හිතුවෙ නෑ ඔහේ පොලිස් ඔත්තුකාරයෙක් කියල? දැන් හුගක් රෑ වුණා. අනික ඔහේ හමුදාව වෙනුවෙන් සටන් කළ වෛද්‍යවරයෙක්. කාරණා ඒ විදියට තිබුණු එක ඔහේගෙ ලොකු වාසනාවක්. එහෙම නොවෙන්න ඔහේට මේ ගෙදරින් මේ මොහොතෙම එළියට බහින්න කියලා මං අණ කරන්න තිබුණා. ඒ අණ නිකුත් කරන්න මං එක මොහොතක්වත් පසුබට වෙන්නෙ නෑ"

මෙම ප්‍රකාශය ඔහු කළේ කෝපයෙන් වෙවුළමින් බැව් මම දුටුවෙමි. හෝම්ස්ගේ නම සඳහන් කළ විටම ඔහු මෙසේ කෝපයෙන් වියරු වූයේ ඇයි? එය අප දැනටමත් දන්නා පරිදි නිකල්සන් වරින් වර පීඩා විඳින උමතු බවේම ලක්ෂණයක්ද?

මම ගොත ගසමින් නිදහසට යමක් කීමට උත්සාහ කළෙමි. "මහත්මයා. මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් කොහොමටවත් පොලිස් ඔත්තුකාරයෙක් නම් නොවෙයි. සමහර අවස්ථාවලදී ඔහු පොලීසිය සමග සහයෝගයෙන් කටයුතු කර තිබෙන බව ඇත්තයි. නමුත් ඒ වෙනුවෙන් ඔහු කවදාවත් පොලීසියෙන් මුදල් ලබාගෙන නැහැ. මගේ මිත්‍රයා නීතියට ගරු කරන අවංක කෙනෙක්. ඒ මිස කාගේවත් ඔත්තුකාරයෙකු නම් නෙමෙයි"

"හ්ම්" යනුවෙන් ඔහුගෙන් පිළිතුරක් ලැබිණ. අනතුරුව සැහෙන වේලාවක් යනතුරු තිබුණේ නිහඬ බවකි. මේජර් ජෙනරාල්වරයා ගැඹුරු කල්පනාවකට වැටුණු අයුරු මම දුටුවෙමි. අන්තිමේදී ඔහු තම හැඟීම් පවසද්දී ඔහුගේ මුහුණ යථා තත්ත්වයට පත්ව තිබිණි.

"දොස්තර වොට්සන්. මං ඔබ ගැන දැනගත්තෙ බොහොම කාලයකට ඉස්සර. ඒ ඔබ ඉන්දියාවෙ හිටිය කාලෙ. මට අහන්න ලැබිල තියෙනවා ඔබ හොඳ කෙනෙක් කියල. ෂර්ලොක් හෝම්ස්

කියන්නෙ ඔත්තුකාරයෙකු නොවෙන බවට ඔබ සහතික වෙනවා. මං ඒ වචනය විශ්වාස කරනවා. තදින් කේන්ති ගැනීම ගැන මට සමාවෙන්න" ඔහු කීවේ මා දෙසට තම සුරත දිගු කරමිනි.

"මට පුළුවනි ඔබ පත්වුණු තත්ත්වය තේරුම් ගන්න" මා කීවේ ඔහුට අතට අත දෙමිනි. "තමන්ට හංගන්න කිසිවක් නැතිවුණත් එහෙම ආරංචියකින්, කෙනෙකු එක්වරම මවිතයට, තිගැස්සීමට පත්වෙන්න පුළුවනි"

"හුඟක් රෑ වුණා. අපි දැන් නිදාගන්න ගියොත් හොඳයි නේද වොට්සන්?" මිචෙල් කීවේ මගේ උරහිසට තට්ටු කරමිනි. මම ඊට එකඟ වූයෙමි.

"මම නම් දැන්ම නිදාගන්න යන්නෙ නෑ." නිකල්සන් කීය. "තරුණ කාලයෙදි තරම් නින්දක් දැන් මට අවශ්‍ය වෙන්නෙ නෑ"

ඔහුට ශුභ රාත්‍රියක් පතා අපි දෙදෙනා උඩුමහලට නැගුණෙමු.

"මට සමාවෙන්න වොට්සන්" මිචෙල් මට කීවේ පියගැට පෙළේදීය. වයින්වලින් මත්වූ ලකුණු ඔහුගේ කටහඬේ තවමත් තිබිණ. "මිනිහ ඕක ඔය තරම් බැරෑරුම්ව ගනීවි කියල මං කොහොමටවත් හිතුවෙ නෑ"

"ඒකෙන් එයාට කේන්ති ගිය ආකාරයට මටත් පුදුමයි. එහෙනම් ඔබට ශුභ රාත්‍රියක්" කියා මම මගේ කාමරයට පිවිසියෙමි.

මගේ බලාපොරොත්තුව වී තිබුණේ, සෑම කරුණක්ම විස්තර සහිතව පිළිවෙළින් ලියා තැබීමටයි. මේ සංකීර්ණ ගැටලුව විසඳීමට හෝම්ස්ට මෙහි පැමිණීමට සිදුවෙනු නිසැකය. මෙම තොරතුරු සියල්ල එවිට ඔහුට ප්‍රයෝජනවත් වෙනු ඇත. නීතිගරුක හමුදා නිලධරයකු වන නිකල්සන්, හෝම්ස් ගැන කළ සඳහනින්ම අතිශය කැලඹීමට පත්වූයේ ඇයි? හෝම්ස්ගේ නම ඇසෙද්දීම හොර තක්කඩීන් කලබල වන බැව් මම දැන සිටියෙමි.

හෝම්ස් ගැන ඇසීමෙන් තැති ගත්තේ එවන්ස් නම්, මට එය තේරුම් ගැනීමට අපහසු නොවනු ඇත. කුමක් නිසාද යත් එවන්ස්ගේ ස්වභාවය ගැන යම් හැඟීමක් ඒ වන විටත් මගේ සිතේ ගොඩනැඟී තිබූ නිසයි. නමුත් පුදුමාකාරම දේ හෝම්ස් ගැන දැනගත් විට එවන්ස් දිගින් දිගටම කළේ මගේ මිත්‍රයා ගැන විමසීමය; කෝපයට පත්වීම නොවේ.

කාමරයට පැමිණි මම ඇඳුම් මාරු කරගෙන හෝම්ස් වෙත යැවිය යුතු මගේ වාර්තාව ලිවීම ඇරඹුවෙමි. මේජර් ජෙනරාල්





නිකල්සන් මානසික රෝගියකු නොවන බැව් දැන් මට විශ්වාසය. කෙසේ වෙතත් මේ කරුණු මගේ ලිපියේ සඳහන් කරද්දීම, බරාඳය දෙසින් යම් කිසි අසාමාන්‍ය ශබ්දයක් මට අසන්නට ලැබිණි.

නිදන කාමරයේ දොර ඇරගෙන මම වහාම එළියට ආවෙමි. මට දකින්නට ලැබුණේ මගේ මිත්‍ර මිචෙල් කිහිප වාරයක්ම දැක තිබූ දසුනය. එනම් මේජර් ජනරාල් නිකල්සන් බරාඳය දිගේ එකතැන උඩ පනිමින් ඉදිරියට ගමන් කළ ආකාරයයි. මට පිටුපස හරවා සිටි ඔහු දුඹුරු පැහැති පිට කබායකින් සැරසී සිටියේය. බරාඳය කෙළවරේදී ඔහු ආපසු හැරෙන බවට සැකයක් නැත. මම බරාඳයේ ඉදිරියට පියවර කිහිපයක් තබා ඒ දෙස බලා සිටියෙමි. කෙසේ වෙතත් බරාඳයේ කෙළවරට යාර පහක් තිබියදී ඔහු එක්වරම ආපසු හැරුණේය. ඔහු සූදානම් වූයේ යළිත් වරක් තම ව්‍යායාමය පටන් ගැනීමටයි. මම ඉදිරියට ගොස් ඔහුගේ උරහිසට අත තැබීමි.

"මේජර් ජෙනරාල් තුමනි. ඔබතුමාට නින්දට යන්න වෙලාව හරි නේද?" මා ඔහු ඇමතුවේ සන්සුන් ආකාරයෙනි. ඔහුගේ මුහුණේ මෙතෙක් වේලා තිබූ රළු, දැඩි බව එක්වරම ලිහිල් විය. ඔහුගේ මුහුණේ ඉරියව් යළිත් සාමාන්‍ය තත්ත්වයට පත්විය.

"ඔබට ස්තුතියි වොට්සන්" ඔහු කීය. "මං හිතන්නෙ යළිත් වරක් මං සිහිනෙන් ඇවිදීමට ගොදුරු වෙලා. මේක මං කාලෙන් කාලෙට ගොදුරු වෙන රෝගයක්. මං දන්නෙ නෑ මොනව කරන්නද කියල"

"මං ඔබේ වෛද්‍යවරයා වුණා නම්" මම කීවෙමි. "මං ඔබට නිද්‍රාකාරක ඖෂධයක් නිර්දේශ කරනවා, නින්දට යෑමට පෙර බොන්න. නින්දට යාමට පෙර චොක්ලට් වගේ දෙයක් පානය කිරීමෙනුත් ඕක මඟහරවා ගන්න පුළුවනි. කොහොම වුණත් මිත්‍රයෙකු හැටියට මට මේ අවවාදය දෙන්න පුළුවනි. හැකිතරම් ඉක්මනින් ඔබේ පවුලේ වෛද්‍යවරයා හමුවෙන්න"

"ඔබට ස්තුතියි වොට්සන්. හැකිවුණොත් මං හෙට උදේම ඔබේ අවවාදයේ හැටියට කටයුතු කරනවා. ඔබේ නින්දට බාධාවෙන අයුරින් කටයුතු කිරීම ගැන මට කනගාටුයි. ඔබට ශුභ රාත්‍රියක්"

"ඔබටත් ශුභ රාත්‍රියක්" මා කීවේ ආපසු මගේ කාමරයට ඇතුළුවෙමිනි. ඊයේ රාත්‍රියේ මා ලියූ සටහන අගට මා මේ දේවල් එකතු කරන්නේ, හැමදෙයක්ම මගේ මතකයේ හොඳින් ලියැවී තිබෙන වෙලාවේ නිසයි.

කොහොම වුණත් තමන් "හීනෙන් භයවෙලා - හීනෙන් ඇවිදිනවා" කියන කතාව මා නම් විශ්වාස කරන්නේ නැත. ඒ වෙලාවේ ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ වුණේ හීනෙන් ඇවිදින කෙනෙකුගේ ස්වභාවය නොවෙයි. අනෙක් කාරණය; සිහිනයෙන් ඇවිදින අතරේ උඩ පනිමින් ව්‍යායාම කළ රෝගියෙකු ගැන මම කවදාවත් වෛද්‍ය පොත්පත්වල කියවා නැහැ. නිකල්සන්ගේ මේ අද්භූත හැසිරීමට හේතුව මානසික රෝගයක් නැත්නම් උමතුවක් කියන එකයි මිචෙල්ගේ මතය. නමුත් මට නම් ඒකට එකඟවෙන්නත් අමාරුයි."

මගේ සටහන් ලියා අවසන් කොට ගෑස් පහන නිවා දමා, මම නින්දට යන්න සූදානම් වුණෙමි. තවත් පැයක පමණ කාලයක් නින්දක් නොමැතිව ගත කළත් මට කිසිදු ශබ්දයක් අසන්නට ලැබුණේ නැත.

* * *

පසුවදා උදෑසන මා පිබිදුණේ වීදුරු ජනේල තුළින් දීප්තිමත් හිරු එළියක් වැටෙද්දීය. කලින්දා රාත්‍රියේ සිදුවීම් සිහිනයක් වගේ මගේ මනසේ මැවිණි.

උදෑසන ආහාරයට අපි මේසයට හිඳගත්තෙමු. නිකල්සන් මහතාත් ඔහුගේ දුවත් මගේ මිත්‍ර මිචෙලුත් තුන් දෙනාම සිටියේ ප්‍රබෝධමත් ගතියෙනි. කලින්දා රාත්‍රියේ සිදුවීම් හෝ කතාබහ කාගේවත් මතකයේ තිබුණු බවක් පෙනුණේ නැත.

උදේ තේ පානය අවසන් වෙද්දී ගෙහිමියා තමන්ගේ දුව ඇමතුවේය.

"දුව. තව ටිකකින් මං යනවා දොස්තර වෝකර් හමුවෙලා එන්න. කොහොමටත් දවල් කෑමට මං ආපහු එනවා"

"ඇයි තාත්තෙ මොකක්වත් අසනීපයක්ද?" දියණිය විමසුවේ කැලඹුණු මුහුණෙනි.

"කියන්න තරම් ලොකු අසනීපයක් නෑ දුව. ඒ වුණත් මෑතක ඉඳල මට නිදාගැනීමේ අපහසුකම් තියෙනවා. මට හිතෙනවා දොස්තර මහත්මයා මට ක්ලෝරල් වැනි නිද්‍රාකාරයක් නියම කරාවි කියල. එහෙම වුණොත් ලොකු සහනයක්" ඔහු මා දිහා බලා අනෙක් අයට නොපෙනෙන විදියට ඉඟිමැරුවේය.





"ඒක හොඳයි තාත්තේ. එහෙනම් මං දැන් කුස්සියට යනවා. දවල් කෑමට සූදානම් කරන්න ඕන මොනවද කියන එක ගැන මාග්‍රට්ට උපදෙස් දෙන්න ඕන." කී ඇය අපෙන් අවසර අරගෙන මුළුතැන්ගෙය පැත්තට ගියාය.

"දොස්තර වොට්සන්" නිකල්සන් මා ඇමතුවේය. "මෙහේට ආව එකේ ඔබ කාලය ගතකළ යුතු පිළිවෙළ මේකයි කියන්න, මං උත්සාහ කරන්නේ නෑ. නමුත් ඔබට නරඹන්න යෑමට හොඳ තැනක් ගැන මට කියන්න පුළුවනි. ඒ තමයි අපේ නිවස පිටුපසින් කන්ද උඩ අතට ගියාම හමුවෙන බැට්ල්රොක් කඳු මුදුන. ගමන ටිකක් දුෂ්කරයි. නමුත් ඒක මුදුනට නැගුණොත් ඔබට මුළු පළාතම ඉතා අලංකාරව දැකගන්න පුළුවනි. අයිල්ස්බරි නගරයත් එතැනට ඉතාම ලස්සනට දිස්වෙනවා. මේ ඉලන්දාරියා මිචෙල්ට හැකිවේවි ඔබට පාර පෙන්වන්න."

"මමත් බලාගෙන හිටියෙ ඇවිදින්න යන්න. වොට්සන් එක්ක බැට්ල්රොක් උඩට යන්න තියෙනවා නම් ඒක සතුටක්." මිචෙල් කීය.

"ඔබ ඉදිරිපත්වෙන එක කොච්චර හොඳද" නිකල්සන් කීවේය. "ඒ වුණත් මතක තියාගන්න. ඔබ දවල් කෑමට ප්‍රමාද වෙන්න එපා. අපේ මුළුතැන්ගෙයි සේවිකාව රසට උයන්න හුඟක් මහන්සි වෙනවා. ඒ වගේමයි. අපි ඇගේ කෑම කලට වෙලාවට කෑවෙ නැත්නම් ඒකටත් ඇයට තරහ යනවා"

පැය භාගයක් පමණ ගතවෙද්දී මිචෙල් සහ මා ගමන් කරමින් සිටියේ, ගේ පිටුපස ළඳු කැලෑව මැදින් වැටුණු පාරේ ය. සරත් සෘතුවේ පිපී තිබුණු මල්වලින් අපේ පාර දෙපස අලංකාර වී තිබිණි.

"වයසක මනුස්සයා ඊයේ රෑත් ශබ්ද කළා නේද?" මිචෙල් ඇසීය.

"ඒ සද්දෙට මට ඇහැරුණා"

"ඔව්. නිකල්සන් බරාඳය දිගේ මගේ කාමරය කිට්ටුවටම ආවා. මං කාමරයෙන් එළියට ඇවිත් හිටියේ. ඒ විදියට හැසිරුණු එක ගැන ඔහු නිදහසට කරුණු කිව්වා. නිකල්සන් කියනවා ඔහුට බියකරු සිහින දකින්න ලැබෙනවාලු. ඒ නිසාලු හීනෙන් ඇවිදින්නෙ. මං කිව්වා වෛද්‍යවරයෙකු හැටියට ඔය වගේ රෝගයකට මම නිද්‍රාකාරකයක් හැටියට ක්ලෝරල් නියම කරනවා කියල. මං ඔහුගෙන් ඇහුවා පවුලේ වෛද්‍යවරයා හමුවී උපදෙස් ගත්තොත් හොඳයි නේද කියලා"

"එහෙනම් ඒකයි මේ උදේම වෛද්‍යවරයා හමුවෙන්න යන බව ඔහු කිව්වෙ......... වොට්සන් ඔබට හිතෙන්නෙ ඔහුට ඇත්තටම නින්ද පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා කියලද?"

"ඒක නම් මට සැකයි. අනික ඔහුට මානසික ආබාධයක් ඇති බවක් මට නම් පෙනුණෙ නෑ"

"ඒක අහන එකත් සැනසීමට කරුණක්" මිචෙල් කිව්වේ සැනසුම් සුසුමක් හෙළමිනි. "ඒ වුණත් ඔහුගේ පුදුමාකාර හැසිරීම තේරුම් කරන්නෙ කොහොමද? ඒක නෙමෙයි වොට්සන්. ඔබේ මිත්‍රයා ෂර්ලොක් හෝම්ස් මේ ගැන සොයා බලන්න මෙහේ එන එකක් නැද්ද?"

"ඒක ගැන නම් මට මොකුත් කියන්න අමාරුයි මිචෙල්. මේ වගේ ඈත පළාතක ගැටලුවක් ලැබුණාම හෝම්ස් කරන්නෙ, දින තුන හතරක් තානායමක නවතින්න බලාගෙන ඒ පළාතට යෑම. නමුත් ඒක කිරීමට හැකි වෙන්නේ කලාතුරකින්. ඒ ලන්ඩනයේ ඔහුගේ වැඩ කටයුතු වලින් ඔහුට නිදහස් වෙලා එන්න හැකියාවක් තියෙනවා නම් පමණයි. මේ දවස්වල ඔහුගේ හිස මතට වැඩ කටයුතු රාශියක් ගොඩ ගැහිලාලු. ඉතින් ඔහුගේ පැමිණීම ගැන මට සහතික වෙන්න බෑ"

"මේ කන්දට බැට්ල්රොක් කියලා කියන්නෙ ඇයි දන්නවද?" මිචෙල් ඇසීය. "මේ රට ආක්‍රමණය කරන්න සතුරු හමුදා එද්දි අපේ අය ඔත්තු බැලුවෙ මේ කඳු මුදුනෙ ඉඳලලු. සතුරන්ට පහර දෙන්නත් ඔවුන් මෙතැන යොදාගෙන තියනවා"

"එහෙනම් අපි ආපහු යමු. දවල් කෑමට වෙලා ඇතුව ආපහු එන්න කියල නිකල්සන් විශේෂයෙන්ම කිව්වනේ."

පැය භාගයක් පමණ එතැන දර්ශනය නරඹා අපි ආපසු ඒමට පිටත් වූයෙමු. අපි ඉක්මනින්ම නිකල්සන්ගේ වත්තේ පිටුපසට ළඟාවීමු. එහි නොයෙකුත් මල් වර්ග වවා තිබූ බැවින් ඒවා නරඹමින් නිවස දෙසට ළංවීමු. එක්වරම මිචෙල් කෑගැසුවේ මා පුදුමයට පත් කරමිනි.

"ඒයි! ඔය කවුද? නවතිනවා ඔහොමම! තමුසෙ මොනවද ඔතන කරන්නෙ?"

අළු පැහැති පරණ කබායකින් සැරසුණු නාඳුනන අයෙක්, උස මල් පඳුරු අතර ගැවසෙමින් සිටියේය. උසින් වැඩි අයෙකු වූ ඔහුගේ මුහුණ පුරා රැවුලක් වැවී තිබිණ. අනවසරයෙන් මෙහි





පැමිණ ඇති මේ පුද්ගලයා, හොරෙක්ද නැතිනම් හිඟන්නෙක්ද යන්න සිතාගැනීම මට අපහසු විය. පැන දිවීමට තැත් නොකළ ඔහු අපි පහසුවෙන්ම අල්ලා ගතිමු.

"තමුසෙ කවුද? මොනවටද මෙහේට ආවෙ?" මිචෙල් විමසුවේ තරමක් උස් හඬිනි.

"සමාවෙන්න මහත්මයා. උද්‍යාන සේවකයා තමයි මට මෙහේ ඇවිත් වැඩ කරන්න කිව්වෙ. මේ බලන්න, මං මල්පැළ අතරෙ තියෙන වල් පැළෑටි ගලවනවා. එහෙම කරල කීයක් හරි හොයා ගන්නවා"

"බොහොම හොඳයි" මිචෙල් කීය. "ඒ වුණත් මතක තියා ගන්නවා. මේ වහාම මං උද්‍යාන සේවකයාගෙන් අහල බලනවා. ඒ තමුසෙ කියන්නෙ ඇත්තක්ද කියන කාරණය. බොරු එහෙම කියල තිබුණොත්........" මිචෙල් කීවේ ඔහු වෙත රළු බැල්මක් හෙළමිනි. අප නිවස දෙසට පැමිණෙද්දී එම සේවකයා යළිත් වරක් තම කටයුතු ඇරඹීය.

"මට නම් පෙනුණේ මිනිහ හරි තක්කඩියෙක් වගේ" මා කීවේ අප උද්‍යාන සේවකයා සොයමින් යන අතරය.

"මටත් පෙනුණෙ එහෙමයි වොට්සන්. ඒ වුණත් ගෙවල් අයිතිකාරයන් යොදවන සේවකයන්ගේ වැඩවලට, අපි මැදිහත් වෙන එකත් හොඳ නෑ. කොහොම වුණත් අහල බලමු. මේ ඉන්නෙ........"

"ඔබ නේද උද්‍යානයේ කටයුතු භාරව ඉන්නෙ?"

"ඔව් මහත්මයා"

"අපට මේ දැන් හම්බවුණා මීට කලින් කවදාවත් දැකල නැති මිනිහෙක්. ඔහු නිකල්සන් මෙනෙවියගේ මල්වතුවල වල් පැළෑටි ගලවනවා. ඔහු කියන්නේ මෙහේ සේවයට ඔහුව බඳවාගත්තේ ඔබ කියලා. ඒක ඇත්තද?"

"ඔව් මහත්මයා. ඒක ඇත්ත" සේවකයා පැවසීය. "ඒ මිනිහා හමුදා සේවයෙන් විශ්‍රාම ගත් පරණ සොල්දාදුවෙක්ලු. අද උදේ පාන්දර ඇවිත් මට ආයාචනා කළා; ඔහුට ජීවත් වෙන්න විදියක් නැති නිසා, වත්තේ වැඩ මොනවා හරි ගන්නලු. අරගෙන සාධාරණ මුදලක් දෙන්න කියලා. මමත් දැන් වයසක මනුස්සයෙක්නෙ. කොන්ද නමාගෙන එක දිගට වල්පැළ ගැළවීම අමාරුයි. ඉතින්

ඒ වැඩ ටික ඒ මිනිහාට බාරදුන්නා. ඒක අපි දෙන්නාටම හොඳයි. ඒකෙ වැරැද්දක් නැහැ නේද මහත්මයා?"

"ඔබ වත්තේ වැඩ නිතරම මේ විදියට පිට මිනිසුන්ට භාර දෙනවද?"

"නිතරම නම් එහෙම වෙන්නෙ නෑ. නමුත් වැඩ කටයුතු අධික වුණු කාලෙට එහෙම භාරදෙනවා. මේජර් ජෙනරාල් නිකල්සන් හරි කරුණාවන්ත කෙනෙක්. මට හොඳ වැටුපක් ගෙවනවා. ඒකෙන් ජීවත් වෙන ගමන් කොටසක් ඉතුරු කරගෙන, තවත් සේවකයෙකු වැඩට යොදවන්නත් මට පුළුවනි. ඒකෙන් මං කරන්නේ ජීවත්වෙන්න විදියක් නැති කෙනෙකුට පිහිටවීම. ඒකෙ වැරැද්දක් නැහැ නේද මහත්මයා?"

"ඒකෙ වැරැද්දක් කියන්න බෑ තමයි" මම අන්තිමේදී කිව්වෙමි.

* * *

විශ්‍රාමික හමුදා නිලධරයා දහවල් ආහාරය ගත්තේ අප සමගය. එහෙත් වෛද්‍ය උපදෙස් සඳහා වෛද්‍ය වෝකර් වෙත යැමෙන් අත්වුණු ප්‍රතිඵලය ගැන කිසිවක්, ඔහු අප සමග කීවේ නැත. දහවල් කෑමෙන් පසු තමා කන්තෝරු කාමරයට වී කෙටි නින්දක් නිදන බව නම් අපට කීය.

සවස තේ පානය සඳහා අපි සවස හතරට පමණ විසිත්ත කාමරය වෙත පැමිණියෙමු. කැතරින් නිකල්සන් මෙනෙවිය තේ පිළියෙල කළාය. එහෙත් ඇගේ පියා තේ පානය සඳහා එහි නොපැමිණීම අප කාටත් ගැටලුවක් විය.

"වොට්සන් මහත්මයා. ඔබට කරදරයක් නැත්නම් තාත්තාව කැඳවාගෙන එන්න. ඒ අතරෙ මං තේ සූදානම් කරන්නම්" කැතී මෙනෙවිය ඉල්ලා සිටියාය.

මම ගොස් කන්තෝරු කාමරයේ දොරට තට්ටු කළෙමි. එහෙත් ඇතුළතින් පිළිතුරක් නොලැබිණි. මම සැකයෙන් දොර විවෘත කර බැලීමි. මේජර් ජෙනරාල් නිකල්සන්ගේ සලකුණක්වත් කාමරය තුළ නොවීය. මේසයේ එක් පැත්තක ගනුදෙනු සටහන් කරන වර්ගයේ පොතක් තිබිණි. මේසයේ අනෙක් පැත්තේ තිබුණේ විස්කි ඩිකැන්ටරයක්, සෝඩා සයිෆනයක් සහ වීදුරු දෙකකි. වීදුරු දෙකම පාවිච්චියට ගෙන තිබූ ඒවා බැව් පෙනිණ. මම පහළ තට්ටුවේ අනෙක් කාමර වෙත අවධානය යොමු කළෙමි. එම





කාමර ද පරීක්ෂා කර බැලීමි. එහෙත් ඔහු ඒ කිසිතැනක සිටියේ නැත. විසිත්ත කාමරයට ගොස් මගේ නිශ්ඵල වූ උත්සාහය ගැන අන් අයට දැනුම් දුන්නෙමි.

"නිකල්සන් මෙනෙවිය. ගිහිං බලන්න ඔහු උඩුමහලෙ කාමරයකවත් ඉන්නවද කියල" මම කීවෙමි. "ඒ අතරෙ මිචෙල්ටයි මටයි පුළුවනි ඔහු උද්‍යානයේ ඉන්නවද කියල හොයල බලන්න"

තේ බීම ඉක්මනින් අවසන් කොට මම මිචෙල් සමග එළියට බැස්සෙමි. අප ගමන් කළේ යූ ගස්වලින් මායිම් වුණු සක්මන් මළුව දෙසටයි. එහි ඈත කෙළවරේ තිබුණේ රූස්ස ගස්වලින් සෑදුණු වනරුප්පාවකි.

"අර බලන්න වොට්සන්!" මිචෙල් කීවේ එහි තිබූ උද්‍යාන බංකුවක් අසල සිටි යමෙකු පෙන්වමිනි.

"මොනවා? ඒ අර උද්‍යාන සේවකයා වැඩට යොදවා ඉන්න රස්තියාදුකාර හිඟන්නා නේද? ඒ මිනිහා එතැන මොනවා කරනවද?"

දකින්නට ලැබුණු දර්ශනයෙන් අපි ඉමහත් පුදුමයට පත්වීමු. මේජර් ජෙනරාල්වරයා උද්‍යාන බංකුව මත ඇද වැටී සිටියේ ක්ලාන්ත වූ අයුරෙනි. මා කලින් සඳහන් කළ රස්තියාදුකාර සේවකයා නිකල්සන් දෙසට පහත් වී සිටියේය.

"ඒයි ඔහොමම ඉන්නවා" මම කෑගැසීමි. "හෙල්ලුණොත් වෙඩි තියනවා!"

රස්තියාදුකාරයා ඉවතට පැන දිවීමට තැත් කළේ නැත. නමුත් එතැනම නැගී සිටි ඔහු දෑත් ඉහළට එසෙව්වේය. ඒ තමා නිරායුධ බව පෙන්වීමටයි. මා එම ඉරියව්වෙන්ම සිටිනා අතරේ මිචෙල් ලංවූයේ උඩුබැලිව වැතිර සිටි නිකල්සන් වෙතටයි.

"මේ බලන්න ලේ ගලන හැටි" මගේ මිත්‍රයා කීවේ නිකල්සන්ගේ හිසට අත දිගු කරමිනි. "මේ තක්කඩියා මේජර් ජෙනරාල්ට පහරදීල වගෙයි මට පෙනෙන්නෙ. එතුමාගෙ මුදල් පසුම්බිය උදුරාගන්න මෙයා උත්සාහ කළාද දන්නෙ නැහැ. ඔහොම ඉන්න වොට්සන්. මං ගෙට දුවල කැතිවයි, සේවකයින්වයි කැඳවාගෙන එන්නම්"

"මට මෙතැනට හරියට පේන්නෙ නෑ" මම කීවෙමි. "ඔහු මිය ගිහින්ද?"

"නැහැ. ඔහුට බොහොම දරුණු ප්‍රහාරයක් එල්ල වෙලා. මං ගෙට දුවනවා කවුරු හරි අඬ ගහගෙන එන්න"

එක් ක්ෂණයකින් මගේ සිහියට ආවේ වෛද්‍යවරයකු ලෙස මා ඉටු කළයුතු යුතුකමය. මගේ වගකීම අපරාධකරුවකු මුරකිරීම නොවේ; මරණාසන්න රෝගියෙකු මරණයෙන් ගළවා ගැනීමය. එබැවින් මා අසල දැත් ඔසවාගෙන සිටි තක්කඩි මිනිසාට මෙසේ කීවෙමි.

"තමුසෙ හෙල්ලෙන්නෙ නැතුව ඔහොමම ඉන්නවා. පැනල දුවන්න උත්සාහ කරන්න එපා. මං වෛද්‍යවරයෙක්. මේ මහත්තයාට මොකද වෙලා තියෙන්නෙ කියල මං සෝදිසි කරල බලන්න ඕන"

එසේ කියූ මම සිහි විසඥව වැතිර සිටි නිකල්සන් දෙසට පහත් වී, ඔහුගේ ඇසිපිය විවෘත කර බැලීමට සූදානම් වුණෙමි.

"බයවෙන්න දෙයක් නෑ වොට්සන්. මං ඔබට පහර දේවි කියල හිතන්න එපා!" මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ගේ කටහඬ ඇසුණේ මා පිටුපසිනි. මම වහාම ආපසු හැරී බැලුවෙමි. තවමත් එතැන සිටගෙන සිටියේ නම් අර රස්තියාදුකාර තක්කඩියා ම ය. කළු පැහැති ඝන රැවුල අතරින් මා දුටුවේ හෝම්ස්ගේ සිනාවය. තමන් පැළඳ සිටි බොරු නාසය හා නළල මඳක් ඉහළට ඔසවා හෝම්ස් තම මුහුණ මට පෙන්විය.

"දෙයියෝ සාක්කි හෝම්ස්!" මට කෑ ගැසිණ. "කොයි වෙලාවෙ ඉඳලද ඔබ මෙහේ ඉන්නෙ? ඔබේ වෙස් මාරුකර ගැනීමට අදත් මම රැවටුණා"

"ඔබටත් ඔබේ මිත්‍රයාටත් කිව් විදියට මං අද උදේ ඉඳලම මෙහේ. මට වෙඩි තියන බවට ඔබ තර්ජනය කළ වෙලාවෙ නම් මම හුඟක් බයවුණා. පස්සෙ මට මතක් වුණා ඔබේ රිවෝල්වරය මේ මොහොතෙ ඔබ ළඟ නැති බව. ඒක ඇත්තෙ බේකර් වීදියෙ මගේ මේස ලාච්චුවෙ නේ" හෝම්ස් කීවේ සිනාවක් ද සමගය.

"හෝම්ස්. මං හිතාගෙන හිටියේ ඔබ තවමත් ලන්ඩනයේ කියල. බැල්මොරල් සාමිවරයාගේ රාජකාරිය ඉවරද? ඒක නෙමෙයි. මේජර් ජෙනරාල්ට මොකද මේ වෙලා තියෙන්නෙ? ඔබ ඔහුට පහර දුන්නා කියල මං කොහොමටවත් හිතන්නෙ නෑ?"

"මම අන්න අතනට වෙලා වල් පැළ නෙළමින් හිටියේ. නිකල්සන් ඇවිදගෙන මේ පැත්තට ආව හැටි, මං ඇත ඉඳගෙන බලාගෙනයි හිටියේ. ඔහු අධික වශයෙන් මත්පැන් පානය කරල වෙන්න ඕන.





ඒ පැත්තට මේ පැත්තට විසිවෙවී ආවෙ. අන්න අර හරියෙදි කකුල පැටලිලා ඔහු බිම ඇද වැටුණා. හිස වැදෙන්න ඇත්තේ අන්න අර ගලේ. බලන්න එතැනට වැගිරුණු ලේ තවමත් තිබෙන හැටි. මමයි ඔහුව ඔසවලා මේ උද්‍යාන බංකුව උඩින් තැබුවෙ"

"මිචෙල් ආවම මං මොනවද ඔහුට ඔබ ගැන කියන්නෙ?"

"මාව හඳුන්වා දෙන්න එපා. නිකල්සන්ට වුණු ඇබැද්දිය ඔහුට පැහැදිලි කරල දෙන්න. ඔන්න ඔවුන් ඔක්කෝම මේ පැත්තට දුවගෙන එනවා"

මේජර් ජෙනරාල්වරයා මුහුණ දී ඇති සිදුවීම පහදා දී ඔවුන් සන්සුන් කළෙමි. ඔහු නිවස වෙත ගෙන යන ලද්දේ මිචෙල් සහ "තක්කඩි" උද්‍යාන සේවකයා ගේ කරමතිනි. තම පියාගේ ස්වභාවය දුටු කැතී මෙනෙවිය හැඬීමට පටන් ගත්තාය.

"භයවෙන්න දෙයක් නෑ" මම කීවෙමි. "කකුල පැටලී ඔහු බිම ඇද වැටිලා. හිස ගලක වැදීම නිසා තමයි ලේ ගිහින් තියෙන්නෙ. හිස ගලක වැදුණු පාරට තමයි සිහි නැතිවෙන්න ඇත්තේ. අපි තුවාලෙ සුද්ධකරලා බෙහෙත් ටිකක් දමමු. ටික වෙලාවක් යද්දි සිහිය ඒවි"

හමුදා නිලධරයා රෝගීන් සඳහා වූ කාමරයේ ඇඳේ හාන්සි කොට, ඔහුගේ තුවාලය පිරිසිදු කළෙමි. එය එතරම් දරුණු තුවාලයක් නොවූවත් සෑහෙන තරම් ලේ ගැලීමක් සිදුවන්නට ඇත. මඳ වේලාවක් ගතවෙද්දී ඔහු ක්‍රමයෙන් සිහි ලැබුවේය. යළිත් වරක් මම ඔහු පරීක්ෂාකර බැලුවෙමි. ඔහු අනතුරුදායක තත්ත්වයක සිටියේ නැත. ඒ බැව් ඔහුගේ දියණියට දැනුම් දුන්නෙමි.

"භයවෙන්න දෙයක් නෑ. ඔහුට අවශ්‍ය විවේකය විතරයි. තවත් පැයක් දෙකක් ගතවෙද්දි සාමාන්‍ය තත්ත්වයට ඒවි. සිහිය ආව නිසා බොන්න යමක් දුන්නට කමක් නෑ. කොහොම වුණත් ඔහු ගැන බලාගන්න සේවිකාවක් රඳවන්න"

මීළඟට මිචෙල් සමග මම විසිත්ත කාමරය වෙත ආවෙමි. කැතී මෙනෙවියද ඉක්මනින් එහි පැමිණියාය.

"නිකල්සන් මහත්මයා අපට කිව්වේ, ඔහු කන්තෝරු කාමරයට වෙලා ටිකක් විවේක ගන්නවා කියලයි. ඒකෙ දෙදෙනෙකු මත්පැන් පානය කළ වීදුරු දෙකක් තිබුණ නේ. අද හවස කවුරු හරි අමුත්තෙක් එහෙම ආවද?" මම ඇසීමි.

"සීනුව නාද කරන ශබ්දයක් මට නම් ඇහුණෙ නෑ" කැතී මෙනෙවිය කීවාය. එහෙත් ඇය මට හරිහැටි මුහුණ නොදී අහක බලා ගත්තාය.

තවත් පැයක පමණ කාලයක් අපි පුවත්පත් කියවමින් ගත කළෙමු. තම පියාගේ තත්ත්වය බැලීමට කැතී නිකල්සන් රෝගීන්ගේ කාමරයට ගොස් ඉක්මනින් ආපසු ආ ආකාරය මම දුටුවෙමි. ඔහුගේ තත්ත්වය යහපත් අතට හැරී ඇති බවත් වචන කිහිපයක් කථා කිරීමෙන් පසු ඔහු යළිත් නින්දකට වැටුණු බවත් ඇය පැවසුවාය.

මිනිත්තු කිහිපයකට පසු නිවසේ සීනුව නාද කරන ශබ්දය අපට අසන්නට ලැබිණ. දොර විවෘත කිරීමට ගියේ සේවිකාවය.

"නෝනා. ෂර්ලොක් හෝම්ස් කියල මහත්තයෙක් ඇවිත් ඉන්නවා. ඔබතුමිය හමුවෙන්න පුළුවන්ද කියල අහනවා"

කැතී මෙනෙවියගේ මුහුණ එක්වරම යොමු වූයේ මා දෙසටයි. ඒ සමගම ඇගේ දෙකම්මුල් ක්ෂණිකව රතු වූ ආකාරය මම නිරීක්ෂණය කළෙමි. තත්පර කිහිපයකින් එය යළිත් සාමාන්‍ය තත්ත්වයට පත්වෙද්දී ඇය සේවිකාව ඇමතුවාය.

"ඔහුට එන්න කියන්න"

මගේ මිත්‍රයා විසිත්ත කාමරය තුළට කැඳවාගෙන එන ලදී. ලන්ඩනයේදී දක්නට ලැබෙන ආකාරයට ඉතා හොඳ ඇඳුම්වලින් සැරසී සිටි ඔහුගේ අතේ සැරයටියද විය.

තමා කවුරුන්දැයි හඳුන්වා දුන් ඔහු යටහත් පහත්ව ඇයට අතට අත දී, අනතුරුව රජ කුමරියකට ගෞරව කරන පරිද්දෙන් ඇගේ දකුණු අත සිපගත් අයුරු මම පුදුමයෙන් බලා සිටියෙමි.

"මගේ මිත්‍ර දොස්තර වොට්සන් හමුවෙන්නයි මං ආවෙ. ඔහු සමග මිනිත්තු කිහිපයක් ගත කරන්න අවසර දිය හැකිද?"

එයට ඉඩ ලැබිණි. ඒ අනුව අප විසිත්ත කාමරයෙන් උද්‍යානයට පිවිසියේ ප්‍රංශ ජනේල තුළිනි.

* * *

"ඔබ එවූ වාර්තාව මට අද උදේම ලැබුණා වොට්සන්. ඒක ඉතාම විශිෂ්ටයි." මගේ මිත්‍රයා කීය. "ඊට පස්සෙ සිදුවුණේ මොනවද කියල මට කියන්න."





ඔහු ඉල්ලා සිටියේ අප උද්‍යානයේ බංකුවක හිඳගත් පසුවය. ලිපිය යැවීමෙන් පසු සිදුවූ දේ මම හෝම්ස්ට පැවසුවෙමි.

"ඔබ කටයුතු කරල තියෙන ආකාරය සතුටුදායකයි මිත්‍රයා. නිගමන වලට එළඹෙන්න ඔබේ නිරීක්ෂණ මට බොහොම ප්‍රයෝජනවත් වේවි. දැන් මං මගේ කතාව කියන්නම්. ඊයේ රෑ දුම්රියෙන් ලන්ඩනයෙන් පිටත්වෙලා, මං මෙහේට ළඟාවුණේ පාන්දර. ඔබට මේ පෙනෙන ආකාරයෙන්ම හැඳ පැළඳගෙන ගිහින් නගරයේ නේවාසිකාගාරයක කාමරයක් ගත්තා. ඊට පස්සේ ඔබ දුටු උද්‍යාන සේවකයා ලෙස වෙස් මාරු කරගෙන එතැනින් පිටවුණේ, ඔවුනට නොතේරෙන ආකාරයට.

මේජර් ජෙනරාල්වරයා තමන්ගේ සේවකයෙක් හැටියට විශ්‍රාමික හමුදා භටයන් යොදා ගනීවි කියල මං විශ්වාස කළා. ඒ මතයි මම උද්‍යාන සේවකයාගෙන් කම්කරුවෙකු විදියට රැකියාවක් ඉල්ලා සිටියේ. විසිත්ත කාමරයේ ඇතුළත හොඳින් දැකගන්න පුළුවන් විදියට, මං මුලින් වත්තෙ වැඩ කළේ අන්න අර හරියේ. මේජර් ජෙනරාල් නිකල්සන් සහ ඔහුගේ අමුත්තන් දිවා භෝජනය ගන්නා හැටි, මං දිගින් දිගටම නිරීක්ෂණය කළා. ඊට පස්සෙ ඔහු තමන්ගේ කන්තෝරු කාමරයට ගියාම මාත් ගියා ඒකෙ ජනේලය හරියට. එයට හුඟක්ම ළංවෙන්න බැරිවුණත්, එහි ඇතුළත සිදුවුණු දේ දැකගන්න මට පුළුවන් වුණා. ගෙදරට ආ අමුත්තා දැකගන්න මට හැකිවුණේ ඒ නිසයි"

"මොන අමුත්තාද? කැතී මෙනෙවිය කිව්ව තේ දොරේ සීනුව නාදවෙන හඬක් සවස් වරුවේ ඇයට නොඇසුණු බව?"

"ඒක සම්පූර්ණ ඇත්ත වොට්සන්. නිකල්සන්ගේ අමුත්තා ගෙවත්තට ඇතුළු වුණේ කොතැනින්ද දන්නවද? ඒ ඔබත් ඔබේ මිත්‍රයාත් අද උදේ ඇවිදින්න ගිය ගේ පිටුපස ගේට්ටුවෙන්. ඊළඟට අප එළියට ආ ප්‍රංශ ජනේලයේ පියන ඇරලා නිකල්සන් අර අමුත්තාව ගේ ඇතුළට ගත්තා. ඔවුන් දෙදෙනා විසිත්ත කාමරයෙන්, කන්තෝරු කාමරයට ගියේ කිසිම ශබ්දයක් නොකර. මීළඟට ඒක ඇතුළට වෙලා මත්පැන් බොමින් සෑහෙන වෙලාවක් කතාබස් කළා. ඔබ කිව්වනේ විස්කි ඩිකැන්ටරයක් එහි දකින්න ලැබුණා කියල? එහි සෝඩා සයිෆනයකුත් තිබුණු බව මං ඇතට දුටුවා. ඔවුන් දෙදෙනාගේ කතාබහ කෙරුණේ යම් කිසි පොතක්

පරීක්ෂා කරමින්, එහි පිටු වරින්වර ආපසු පෙරළමින්. ඔබටත් දකින්න ලැබුණු ඒ පොත, ගනුදෙනු ලියා තබන පොතක් කියා මං විශ්වාස කරනවා. පැය භාගයකට අඩු කාලයකදී අමුත්තා පිටවෙලා ගියා......"

"......... මේ අමුත්තා මොන වගේ කෙනෙක්ද කියන එක ඔබ මට තවමත් කිව්වෙ නැහැනෙ"

"මට සමාවෙන්න වොට්සන්. මට ඒක මග හැරුණා. ඔබ මට වාර්තා කර තිබූ විස්තර අනුව මේ පුද්ගලයා නිසැකවම හර්බට් එවන්ස් විය යුතුයි. මං ඔබට කිව්ව වගේ ගෙට ඇතුළුවුණු පිළිවෙළටම ඔහු ගෙයින් පිටවී ගියා"

"ඒ වුණාට කැතී මෙනෙවිය එහි සිටියා නේ. ඔහු ගෙට ආව ගිය බව ඇය නොදැක්කා වෙන්න බෑ?"

"එවන්ස්ව දැක්කෙ නෑ කියල කැතී කිව්වද? ඇය එහෙම දෙයක් කිව්වෙ නෑ නේද වොට්සන්?"

"ඔබ කියන දේ ඇත්තයි හෝම්ස්. ඇය අපට පිළිතුරු දුන්නෙ බොහොම සූක්ෂම පිළිවෙළට. කවුරු හරි දොරේ සීනුව නාද කළ බවක් තමන්ට ඇහුණෙ නෑ කියලයි ඇය කිව්වෙ"

"හ්ම්. මේ සම්පූර්ණ සිද්ධිමම පැටළුණු අවුල් ගොඩක් විදියයි මට පෙනෙන්නෙ" හෝම්ස් කීය. "මේක ඉතාම අදක්ෂයෙක් රචනා කළ නාට්‍යයක් වගේ. චරිත හුඟක් තියෙනවා. ඒවා එකකට එකක් සම්බන්ධයි වගේ පෙනෙනවා. නමුත් සම්බන්ධ වෙන ආකාරයක් හිතාගන්නවත් බෑ. මේ අවුල ලිහන්න පටන්ගන්න ඕන කොතැනින්ද කියන එකත් පැහැදිලි නෑ"

"හෝම්ස් ඔබටත් මේක අවුල් ගොඩක්. ඉතින් මේක අපට තේරුම් ගන්න අමාරු එකේ පුදුමයක් නෑ"

"එවන්ස් කාමරයේ ගත කළ කාලය මිනිත්තු දහයක් වෙන්න ඇති" හෝම්ස් කීය. "එවන්ස් හා නිකල්සන් අතර උණුසුම් වචන හුවමාරුවක් ඇතිවුණා. නමුත් ඔවුන් කතා කළේ මොනවද කියල තේරුම් ගන්න මට පුළුවන් කමක් තිබුණේ නෑ. තවත් ටිකක් ගෙට කිට්ටු වුණා නම් අහගන්න තිබුණා. නමුත් එහෙම කළා නම් ඒක අවදානම් පියවරක් වෙනවා. ප්‍රංශ ජනෙල් වලින් එළියට බැස්ස එවන්ස් ආව පාරෙන්ම ආපහු ගියා.

නිකල්සන් කාමරය තුළ සිටි කාලයම මං නිරීක්ෂණය කරගෙනයි හිටියේ. ඔහු මේසය ළඟ හිඳගෙන, ඒ මත තමන්ගේ දෑත් තබලා,





දෑත්වලට හිස බර කරගෙන හිටියේ. මේජර් ජෙනරාල්වරයා ඉන්නේ බරපතළ ලෙස අසනීප වෙලාද? ඒ සැකය මගේ හිතේ ඇතිවුණා. මට හිතුණා මේ ගැන ගෙදර කාටහරි දැනුම් දෙන්න. එතකොටම තමයි ඔහු හිඳගෙන සිටි තැනින් නැගිට්ටෙ. ඊළඟට ඔහු කාමරයෙන් පිටවෙලා ගියේ එහා මෙහා විසිවෙවී. මට කියන්න වොට්සන්. ඔහු දවල් කෑමට පෙර හුඟක් මත්පැන් බිව්වද?"

"කොහොමටවත් නෑ" මම කීවෙමි. "දවල් කෑම වෙලාවෙ අපට බීමට තිබුණේ වතුර විතරයි. ඒ වෙලාවෙ ඔහු මත්පැන්වලට අත තිබ්බෙ නෑ කියල මට දිවුරන්න වුණත් පුළුවනි. ඉන්දියාවෙ ගතකළ කාලෙ ඔහු දැනට වඩා හුඟක් මත්පැන් බිව් බව මං අහල තියෙනවා."

"හැබෑට? මං බලාගෙන ඉද්දිදි ඔහු බිව්වෙ සෝඩා සමග එක් විස්කි වීදුරුවක් පමණයි. ඔහු කොහොමද ඒකෙන් මේ තරමට වෙරි වුණේ? ඒ ගැන අපි තවදුරටත් සොයා බැලිය යුතුයි. එතැනින් පිටවුණාට පසු මට ඔහුව අන්න අර ජනේලයෙන් දකින්න ලැබුණා. ටික වෙලාවකට පස්සෙ අන්න අර ඊළඟ ජනේලයෙන් මං ඔහුව දුටුවා. ඒ ජනේල තියෙන්නෙ මොන කාමරවලටද?"

"ගෙදර ඒ පැත්තට තිබෙන නිදන කාමර එකට සම්බන්ධ කරන බරාඳයට තමා, ඔබ කිව් පළමුවෙනි ජනේලය විවෘත වෙන්නෙ; අනික් එක නිකල්සන්ගේ පෞද්ගලික නිදන කාමරයක එක් ජනේලයක්."

"ඊළඟට ඔහු මිනිත්තු විස්සක පමණ කාලයකට නොපෙනී ගියා. ඉතින් මං ගිහිං මල් පාත්තිවල වැඩ කළා. නමුත් ඒ අතරෙත් මං ගේ ඇතුළ ගැන හොඳ සෝදිසියකින් හිටියේ. ඊළඟට යළිත් වරක් මට ඔහු දකින්න ලැබුණා. ඔහු අර පොත තිබුණු මේසය ළඟට ඇවිත් - මං කිව්වෙ අර ගනුදෙනු ලියාගත් පොතක් වෙන්න ඇති කියලා....... අන්න ඒ පොත. ඔහු ඒක පෙරළා බැලුවා. ඔහුගේ මුහුණේ මට දකින්න ලැබුණේ මහා ප්‍රශ්නයකට මුහුණ දීලා සිටි ලකුණු.

දකුණු අතින් ඔහු මුහුණේ පහත කොටස වසා ගත්තා. දැඩි කම්පාවකට පත් ලකුණු ඔහුගේ දෑසේ මං දුටුවා. ඊළඟට ඔහු තරප්පු පෙළ බැහැලා උද්‍යානයට ඇවිදගෙන ආවා. මං ඔහුට තරමක් පිටුපසින් ආවේ කිසිම ශබ්දයක් නොනැඟෙන සේ. නමුත් මං කිසිසේත් අපේක්ෂා නොකළ ආකාරයට, ඔහු කකුල් පැටළී

කපා හෙළූ ගසක් වගේ මුනින් අතට බිම ඇද වැටුණා. ඔහුට පිහිටවීමට මා එතැනට දිවගියා. ඊළඟට ඔහුව ඔසවලා උද්‍යාන බංකුව මත තැබුවා. නමුත් ඉක්මනින් එතැනට දිව ආ ඔබ සහ ඔබේ මිත්‍රයා සිතුවේ වෙනත් දෙයක්"

"අප දුටුවේ ඔබ නිකල්සන්ගේ සාක්කු සෝදිසි කරන ආකාරය. ඒකයි අපට ඔබ ගැන සැකයක් ඇතිවුණේ. ඔහුගේ සාක්කුවල තිබිලා මොනවද ඔබට හමුවුණේ?"

තම සාක්කුවට අත දැමූ හෝම්ස් නිල් පැහැති වීදුරු බෝතලයක් අතට ගත්තේය. ඔහු එය අල්ලාගෙන සිටියේ තම ලේන්සුවෙනි.

"මොනවද? විෂ වර්ගයක්ද?" මා ඇසුවේ භීතියට පත්වය.

"ඒ තරමම භයානක විෂක් කියන්නත් බෑ" හෝම්ස් කීවේ සිනාමුසු මුහුණෙනි. "මේ බෝතලය මුලින් ඔහුගේ මේසය උඩට තිබෙන ආකාරය මං දුටුවා. නමුත් ඔහු උද්‍යානයට ආවම එය මේසය උඩ තිබුණේ නෑ. ඒක ඇත්තේ ඔහුගේ සාක්කුවේ විය යුතුයි කියලා මං නිගමනය කළා. මට හිතුණා මේකෙන් මොකක් හරි හෝඩුවාවක් ලබාගන්න හැකිවේවි කියලා. බෝතලයේ පියන ඇරලා බලන්න වොට්සන්"

එහි පියන විවෘත කොට මගේ නාසයට ළංකොට පරෙස්සමෙන් එහි සුවඳ ආඝ්‍රාණය කොට බැලීමි.

"ක්ලෝරල්!" මට කියැවිණි.

"ඔබ කිව්වා වගේ තමයි. මේ බලන්න" හෝම්ස් එහි පිටත ලේබලය මා වෙත පෙන්විය. අයිල්ස්බරි නගරයේ ඖෂධවේදියකු විසින් එය නිකුත් කොට තිබුණේ, මේජර් ජෙනරාල් ජෝන් නිකල්සන් යන නාමයෙනි.

"එතකොට ඔබ නිගමනය කරන්නේ මෙහෙම දෙයක්ද?" මම මගේ මිත්‍රයාගෙන් ඇසුවෙමි. "නිකල්සන් ඔහුට වෛද්‍යවරයා නියම කළ ක්ලෝරල් ඖෂධය පානය කළා. මේ නුපුරුදු බෙහෙතෙන් ඔහුට ඇතිවුණේ නිදිමත ගතිය පමණක් නොවෙයි; විඩාපත් හෝන්දු මාන්දු ගතියකුත් දැනුණා. ඒකයි ඔහු උඩු මහලේ තමන්ගේ ඇඳට ගියේ. ඔහුගේ ඒ දුර්වල, විඩාපත් බව කැතී මෙනෙවියත් දැක තිබුණා. අන්තිමේදී ඔහු පහළ තට්ටුවට බැහැලා උද්‍යානයට පිවිසුණේ පිරිසිදු වාතය ටිකක් ආශ්වාස කරන්න. එහෙම නේද?"

"විශිෂ්ටයි වොට්සන්. ඔබේ කරුණු විශ්ලේෂණයේ ඔබට වැරදුණේ එක තැනයි"





"ඒ කොතැනද?"

"මේජර් ජෙනරාල් නිකල්සන් තමන්ගේ උවමනාවෙන්ම ක්ලෝරල් පානය කළේ නැහැ"

"පානය කළේ නැහැ? මොකක්ද ඔබ එයින් අදහස් කළේ?"

"ඒක තමයි මටත් තේරුම් ගන්න අමාරු" හෝම්ස් කීය. "ඔවුන් පාවිච්චි කළ වීදුරු දෙක කන්තෝරු කාමරයේ තවමත් එහෙමම ඇති. වැඩි කලබලයක් නොකර අපි ගිහින් බලමු"

වීදුරු දෙක බන්දේසියක් මත එලෙසම තිබිණ. ඒවා අතින් නොඅල්ලා, වීදුරුවට මගේ නාසය ළං කොට ආඝ්‍රාණය කර බැලීමි. එක් වීදුරුවක පමණක් ක්ලෝරල් සුවඳ හඳුනාගැනීමට හැකිවිය.

"මේක එවන්ස් කළ වැඩක් කියන එක මට පුළුවනි ඔප්පු කරන්න" හෝම්ස් කීය. "ඒකට ක්ලෝරල් බෝතලය සහ වීදුරු සියුම්ව පරීක්ෂාවට ලක් කළ යුතුයි. මෙහෙම දේකට සූදානම් වෙලා ආවෙ නැති නිසාත්, මේක පිට කෙනෙකුගේ තැනක් නිසාත්, ඒක මේ මොහොතෙම කරන්න අමාරුයි. කමක් නෑ. දැන් අපි යන්නේ නිවැරැදි පාරේ. ඒක මට විශ්වාසයි.

වොට්සන්. දැන් මට මෙන්න මේ දේ කියන්න. එවන්ස් කවදාවත් ඉන්දියාවෙ රැකියාව කළ කෙනෙක් නොවෙයි කියල ඔබට හොඳටම විශ්වාසද?"

"මට එහෙම සහතික වෙන්න බැහැ හෝම්ස්. ඔබට හිතෙන්නෙ කොහොමද?"

"මට හිතෙනවා ඔහු කාලයක් ඉන්දියාවෙ ගත කළ කෙනෙක් කියල"

"නමුත් එවන්ස් එහෙම දෙයක් අඟවන්නෙවත් නැහැ. අපි තුන්දෙනා ඉන්දියාවෙ අපි ගත කළ කාලෙ අත්දැකීම් ගැන කතාබහ කළා නේ. ඔහු එක වාක්‍යයකින් වත් ඒකට හවුල් වුණේ නෑ. නමුත් කෑම කනකොට........"

"ඔව්?"

"ඉන්දියානු ක්‍රමයට හුඟක් කුළුබඩු යොදා පිළියෙල කර තිබුණු මස් ව්‍යාංජනය ඔහු බොහොම ආශාවෙන් රස වින්දා"

"ඒකත් හොඳ සාක්ෂියක් වොට්සන්. නමුත් ඒකෙන් ඔහුගේ ඉන්දියානු සම්බන්ධය සියයට සීයක් තහවුරු වෙන්නෙ නෑ. ඒ මොකද අපි ඕනෑම කෙනෙක් කලත් ගත වෙද්දී, විදේශ ආහාරවල රසයට ඇබ්බැහි වෙන නිසා. නමුත් මේ කාරණය නිශ්චිත එකක්"

"මොන කාරණයද?"

"ඔහු දුම්පානය කිරීමට යොදාගත් දුම්වැටිය"

"මේජර් ජෙනරාල් නිකල්සන් දුම්පානය කළේ මොන ආකාරයටද කියා ඔබ නිරීක්ෂණය කළාද?"

"ඔව්. නිකල්සන් ඊයේ රෑ කෑමෙන් පස්සෙ බිව්වෙ පයිප්පයක්."

"එහෙම නම් මෙන්න මේ දුම්වැටිය ඉරුවේ ඔහු කියල හිතන්න අමාරුයි නේද?" ඇසූ හෝම්ස් මට පෙන්වූයේ "ලූංකා" නමින් හඳුන්වනු ලබන වෙනස් වර්ගයක ඉන්දියන් සුරුට්ටුවකි.

"මේක බොහොම සැර සුරුට්ටු වර්ගයක් නේ හෝම්ස්. ජොනතන් ස්මෝල්ගෙ කතන්දරයෙදිත් මේ වර්ගයේ සුරුට්ටු උරන කෙනෙකු අපට හමුවුණා නේද?"

"හරියට හරි. නමුත් නිකල්සන් මේක ඉරුවෙ නෑ කියල වොට්සන් නිගමනය කරන්නෙ ඇයි?"

"පළමුවැනි කාරණය, නිකල්සන්ට තියෙනවා ලොකු, දිග සම්පූර්ණ උඩු රැවුලක්. එහෙම කෙනෙකුට පුළුවන් කමක් නෑ සුරුට්ටුව මේ තරම් කෙටි වනතුරු පානය කරන්න. අනික් අතට එවන්ස් සම්පූර්ණයෙන්ම රැවුල බාපු කෙනෙක්"

"විශිෂ්ටයි වොට්සන්. මට උවමනා වුණේ නිරීක්ෂණ මගින් නිගමනයන්ට එළඹීමේ ඔබේ දක්ෂකම පරීක්ෂා කරන්න. හොඳයි මොකක්ද ඔබේ දෙවැනි කාරණය?"

"මං දුටුවා නිකල්සන් දුම්පානයට යොදා ගත්තේ බ්‍රයර් මුලෙන් සැදූ ADP - ඇල්ෆ්‍රඩ් ඩන්හිල් පයිප්පයක්. ඔහු ඒ සඳහා යොදා ගත්තේ සුපිරි වර්ගයේ ඩන්හිල් දුම්කොළ. එහෙම කෙනෙක් කොහොමටවත් ලූංකා සුරුට්ටුවක් බොන එකක් නෑ"

"ඉතාම හොඳයි. ඒ අනුව අපට නිගමනය කරන්න පුළුවනි මේක හර්බට් එවන්ස් නම් අද්භූත පුද්ගලයාට අයත් සුරුට්ටුවක් බව. කෙටියෙන් කිව්වොත් ඔහුට තියෙනවා ඉන්දියානු පසුබිමක්. එහෙම නේද?"

"එහෙමයි කියමු හෝම්ස්. නමුත් ඒ කාරණයෙන් අපට ලැබෙන ප්‍රයෝජනය මොකක්ද?"

"දැන් මං කැමතියි වහාම මේ ගෙදරින් පිටවෙලා යන්න" කී හෝම්ස් කාමරයේ මේසය මත තිබූ ගනුදෙනු ලියූ පොත අතට ගත්තේය.





"වහාම පිටවෙලා යන්න?" මම ඇසීමි. "ඔබ මේ කියන කිසිදේක අගක් මුලක් මට තේරුම් කර දුන්නෙ නෑ. ඔබ අද නේවාසිකාගාරයේ නවතිනවද?"

"නෑ මගේ හිතවත් වොට්සන්. මම ලන්ඩනයට යායුතු මයි. කළ යුතු වැඩ රාශියක් එහේ තියෙනවා. සවස 5 ට අයිල්ස්බරි දුම්රියපොළෙන් යන ශීඝ්‍රගාමී දුම්රිය මා අල්ලා ගත යුතුමයි. ඒකත් ප්‍රමාද වැඩියි. නමුත් කරන්න දෙයක් නෑ"

"එතකොට ඔබ යන බවක් නිකල්සන් මෙනෙවියට වත් මිචෙල්ටවත් දැනුම් දෙන්නෙ නැද්ද?"

"එහෙම කරන්න ගියොත් තවත් කාලය ගත වෙනවා වොට්සන්. අල්ලගන්න පුළුවන් පළමුවැනි කුලීරියේම මං දුම්රියපොළට යා යුතුයි."

"එතකොට ඔබ ආපහු එන්නෙ?"

"මං හෙට අනිවාර්යයෙන්ම එනවා. නමුත් ඊට කලින් විසඳාගත යුතු පුංචි පුංචි ගැටලු සහගත තැන් රාශියක්ම තියෙනවා. ඒ හැම එකක්ම මේ පරීක්ෂණයට අදාළ ඒවා. මුළු රාත්‍රියම නිදා නොගෙන හරි මං පුළුවන් තරමක් ඉවර කරනවා. හෙට උදේ කළ යුතු කොටස එකොළහ වෙනකොට අවසන් කළ හැකි වේවි. එහෙම වුණොත් හවස තුන වෙද්දි මට මෙහේට ආව හැකි."

"මං මේ තොරතුරු නිකල්සන් මෙනෙවියට........"

"කිසිවක් කියන්න එපා වොට්සන්. කාටවත් කියන්න එපා. මං හදිසියේ ගිය බව කියන්න. කවදා කොයි වෙලේ ඒවිද කියන්න බැහැ කියන්න. මං ඒ කාරණය අවධාරණය කරනවා.

අනික් වැදගත්ම කාරණය මතක තියාගන්න වොට්සන්. අමුත්තන් කාටවත් ගෙට ඇතුළු වීමට ඉඩ දෙන්න එපා! ඔවුන් මේජර් ජෙනරාල්ගෙන් ඈත්කර තබන්න!"

එසේ කියූ මගේ මිත්‍රයා වහා පිටවී ගියේය.

* * *

මගේ මිත්‍රයා පිටවී ගිය පසු මම විසිත්ත කාමරයට ගියෙමි.

"කෝ ඔබේ මිත්‍රයා?" මිචෙල් විමසුවේය.

උද්ගත වී ඇති තත්ත්වය මම කෙටියෙන් විස්තර කළෙමි. අමුත්තන්ට නිවස තුළට ඒමට හෝ මේජර් ජෙනරාල් නිකල්සන් හමුවීමට ඉඩ නොදෙන මෙන්, හෝම්ස් දුන් උපදෙස මම මිචෙල්ට හා කැතී මෙනෙවියට කීවෙමි.

"අපට ඒක කොහොමටවත් කරන්න බැහැනේ" කැතී මෙනෙවිය කීවාය. "මං කොහොමද කාටවත් ........" කැතී මෙනෙවිය අතින් එක්වරම තම මුව වසා ගත්තාය. ඒ තම මුවෙන් පිට නොවිය යුතු වචන පිටවීම වැළැක්වීමට මෙනි.

"ඒ ගැන පොඩ්ඩක්වත් බය වෙන්න එපා කැතී. ඒක මං බලාගන්නම්" මිචෙල් සතුටෙන් කීවේ තම අත මිට මොළොවා පෙන්වමිනි. "ඔබේ තාත්තා කොහොමටත් ඉන්නෙ අමුත්තන් හමුවෙන්න හොඳ තත්ත්වයෙන් නෙමෙයිනෙ. ඒ නිසා ඔබ තාත්තගෙ ඇඳ ළඟට වෙලා ඉන්න. මේ විසිත්ත කාමරය පැත්තෙ එන්න එපා. මේ පැත්ත මං බලාගන්නම්"

නිකල්සන් මෙනෙවිය ඊට එකඟ වූයේ ඇඩි අකමැත්තකින් බැව් මම තේරුම් ගතිමි.

"දැන් මේජර් ජෙනරාල්ගේ තත්ත්වය කොහොමද?" මම කැතී මෙනෙවියෙන් විමසුවෙමි.

"මං මෙච්චර වෙලා ඔහු ළඟ ඉඳලා මේ දැන් මෙතැනට ආවේ. තාත්තට හුඟක් සනීපයි කියලයි මට හිතෙන්නේ. කෙඳිරි ගාන්නෙත් මොකුත් නෑ. තදින්ම නින්ද ගිහින්. වොට්සන් දොස්තර මහත්මයා යළිත් වරක් ඔහුව පරීක්ෂා කර බලන්න. මං කැමතියි තාත්තාව ඔහුගේ නිදන කාමරයටම ගෙනියනවා නම්. ඒ ඔබේ විරුද්ධත්වයක් නැත්නම්"

මම නිකල්සන් මහතා පරීක්ෂා කර බැලුවෙමි. ඔහුගේ තත්ත්වය බොහෝ දුරට යහපත්ව තිබිණි. එබැවින් පහළ තට්ටුවේ රෝගී කාමරයේ සිට ඔහු උඩුමහලේ තම නිදන කාමරයට ගෙන යෑමට අවසර දුන්නෙමි. අන්තිමේදී එම කටයුත්ත සිදු කිරීම භාර වූයේද මිචෙල්ට සහ මටය. හැඩිදැඩි පුද්ගලයෙකු වූ නිකල්සන් මහතා උඩු මහලට ගෙන යාමද පහසු කටයුත්තක් නොවිණි.

අපගේ රාත්‍රී භෝජනය එතරම් සන්තෝෂදායක එකක් නොවීය. තම පියා සමඟ රැඳී සිටි කැතී නිකල්සන් මෙනෙවිය වෙත රාත්‍රී භෝජනය ගෙන යන ලද්දේ ඇගේ සේවිකාව විසිනි. මිචෙල් සහ මම නිහඬව ආහාර ගත්තෙමු.

මෙම සිදුවීමට අප මුහුණ දුන්නේ කෑමවේල අවසන් කොට විසිත්ත කාමරය වෙත ඒමට සූදානම් වෙද්දීය. ඉදිරි දොරේ සීනුව නාදවෙන ශබ්දයත්, ඒ ඉක්මනින්ම එවන්ස් උස් හඬින් යමක්





කියූ අයුරත් අපට ඇසිණ. ඒ සමගම ඇසුණේ ගෘහ සේවිකාව එවන්ස්ට පිළිතුරු දුන් හඬය. කෝපයට පත් මිචෙල් තම අසුනෙන් නැගිට්ටේ දැත් මිට මොළොවා ගෙනය. එහෙත් එවන්ස් නිවස තුළට නොපැමිණියෙන් මිචෙල් යළිත් හිඳ ගත්තේය.

"ඔය යක්ෂයා මේ ගේ වටේ කරකැවෙමින් ජනේලවලින් අප දිහා බලන්න ඉඩ තියෙනවා" මිචෙල් කීය. "ජනේලවල තිරරෙදි වහල දමන්න ඕන."

මීළඟට මට අසන්නට ලැබුණේ කාමරයට ගිය මිචෙල් එවන්ස්ට බැණවදින ආකාරයයි. මිචෙල් කෑගසමින් එවන්ස්ට කීවේ වහාම මෙම වත්තෙන් පිටවී යන ලෙසයි.

"ඔය යක්ෂයා කැතීගේ තාත්තගෙ යාළුවෙක් නොවුණා නම්, මං ඌට ගහන්නෙ අශ්වයින්ට තලන කසයෙන්"

කල් ඇතුව නින්දට යාමට තීරණය කළ අප මුලින් ගියේ ගෙහිමියාගේ සුවදුක් දැනගැනීම සඳහාය.

"තාත්තට දැන් හුඟක් හොඳයි" කැතී කීවාය. "ඇඟ හුඟක් දුර්වල වුණු නිසා වෙන්න ඇති. කතා කරනවා. ඒ වුණත් බොහොම හෙමින්. වොට්සන් දොස්තර මහත්මයා ඔබට කරදරයක් නොවෙයි නම් නින්දට යන්න පෙර තාත්තාව ටිකක් පරීක්ෂා කරල බලන්න."

ඇගේ ඒ ඉල්ලීමට මම කීකරු වූයෙමි.

"හුඟක් ලේ ගලාගිය නිසා ශරීරය ටිකක් දුර්වල වෙලා. ඒ වුණාට කියන්න තරම් ලොකු වරදක් නෑ. හෙට උදේ වෙනකොට සාමාන්‍ය තත්ත්වයට පත්වේවි.

කිසිදු අසාමාන්‍ය සිදුවීමකින් තොරව රාත්‍රිය ගතවී ගියේය. මේජර් ජෙනරාල් නිකල්සන් පසුවදා උදයේ පහළ තට්ටුවට පැමිණ සිටියේය. ඒ තේ පානය සඳහායි.

"ඔබතුමා ඊයෙ අපව සෑහෙන්න භය කළා" මම කීවෙමි. "දැන් ඔබට සනීපයි නේද? ඒ බව දකින්න ලැබීමත් සතුටක්"

"ඒකෙ ගෞරවය හිමිවෙන්නෙ ඔබටයි, මගේ දුව කැතරින්ටයි. ඔබ මගේ රෝගයට ප්‍රතිකාර කළා. ඇය මට සාත්තු සප්පායම් කළා." ඔහු කීය. "ගලක කකුල පැටළිලා මං ඇද වැටුණා. ඒ මගේම නොසැලකිල්ල නිසා."

ඔහුගේ කතාබහට කන්දෙමින් මම උදෑසන ආහාරය ගත්තෙමි. එතැනට පැමිණි මිචෙල්ද අපේ කතාබහට හවුල්විය. නිකල්සන් කථා කිරීමට වඩාත්ම ප්‍රියකළ මාතෘකාව වූයේ ඉන්දියානු මහා

කැරැල්ලය. බ්‍රිගේඩියර් ජෙනරාල් හෙන්රි හැව්ලොක් යටතේ කැරැල්ල මර්දනයට, තමා කල්කටාවේදි හවුල් වූ අයුරු නිකල්සන් විස්තර කළේය. ඔහුගේ අත්දැකීම් අපි ආශාවෙන් අසා සිටියෙමු. එම කතන්දර කීමට ඔහුට තිබුණේ අපූරු හැකියාවකි. එබැවින් කාලය ගතවී යනු නොදැනිණ.

දහවල් කෑම වෙලාව පැමිණෙන විටත් අප සිටියේ විසිත්ත කාමරයේය. නිකල්සන් මහතාගේ කතන්දර වලට සවන් දෙමින් අපි දිවා භෝජනය ගත්තෙමු. එය අවසන් වනවිට සවස දෙක පසුවන්නට ඇත. ෂර්ලොක් හෝම්ස් මහතා පැමිණ ඇති බව සේවිකාව දැනුම් දුන්නේ එම මොහොතේදීය.

"ඔහුට එන්න කියන්න ගේ ඇතුළටම" නිකල්සන් කීය. "මං කැමතියි ඔහුව දැන හඳුනාගන්න."

ඔහු තම අසුනෙන් නැගිට හෝම්ස්ට අතට අත දුන්නේ සිනාමුසු මුහුණෙනි.

"දොස්තර වොට්සන්ගේ සුප්‍රසිද්ධ මිත්‍රයා හමුවෙන්න ලැබීම සතුටක්. මහත්මයා මම නම් හිතන්නේ නෑ, ඔබ දවාලට කෑම කාල ඇති කියල. මෙහෙන් හිඳගන්න."

"ඔබට ස්තුතියි නිකල්සන් මහත්මයා. මං දවල් කෑම කාලයි ආවේ. මිනිත්තු කිහිපයකට මට මගේ මිත්‍රයාව ආපහු ඉල්ල ගන්න පුළුවන්ද? වහාම එන්න වොට්සන්. මේ වෙලාවේ ඔබට කරදර කරන්න වීම ගැන කණගාටුයි"

අප යන්නේ කොහිද, ඒ කුමක් සඳහාද යන කරුණවත් නොදැන මම හෝම්ස් සමග පිටත් වී ගියෙමි. නිකල්සන්ගේ නිවසෙන් පිටත් වී අපි එය පිටුපස තිබූ අඩි පාරකින්, යාර සියයක පමණ දුරක් පයින් ගමන් කළෙමු. එවිට අප පිවිසියේ ප්‍රමාණයෙන් විශාල, තරමක් පැරණි නිවසක් වෙතය. මෑතකදී අලුත්වැඩියා නොකළ නිසා එයට තිබුණේ දුර්වර්ණ වූ අවලක්ෂණ පෙනුමකි. වසා තිබූ ඉදිරි දොරට හෝම්ස් නොනවත්වාම තට්ටු කළේය. තරහෙන් දොර විවෘත කළ සේවිකාවගේ තිබුණේ කෝපයට පත් පෙනුමකි.

"හර්බට් එවන්ස් මහත්මයා හමුවෙන්න ෂර්ලොක් හෝම්ස් සහ දොස්තර වොට්සන් ඇවිත් ඉන්නවා කියන්න. මාව හමුවීම ඔහු ප්‍රතික්ෂේප කරාවි කියා මං හිතන්නේ නෑ." හෝම්ස් කීවේ නිර්භය උස් හඬකිනි.





"මිනිත්තුවක් ඉන්න මහත්මයා" යයි තැතිගත් හඬින් පිළිතුරු දුන් සේවිකාව නිවස තුළට නොපෙනී ගියාය. එහෙත් ඇය ඉක්මනින් ආපසු පැමිණියාය.

"එවන්ස් මහත්මයා අත්‍යවශ්‍ය කටයුත්තකට බැහැර යන්නයි සූදානම් වුණේ. ඒත් ඔබ වෙනුවෙන් මිනිත්තු කිහිපයක් ගත කරන්න ඔහු කැමතියි. ඔහු ඉන්නවා කන්තෝරු කාමරයේ ඔබ හමුවීමට. ඔහු සූදානම් වන තුරු මොහොතක් ඉන්න"

"වොට්සන්. ඔහු කවදාවත් තමන්ගේ බිරිඳ ගැන ඔබ එක්ක කිව්වෙ නැහැ නේද?"

"ඔහුගේ බිරිඳ?" මා ඇසුවේ පුදුමයට පත්වය. "මං හිතුවේ ඔහු කවදාවත් විවාහ නොවුණු කෙනෙක් කියලයි?"

එයට කිසිවක් නොකියූ හෝම්ස් ගේ මුහුණට නැගුණේ උපහාසාත්මක සිනාවකි.

අනතුරුව අප එවන්ස්ගේ කන්තෝරු කාමරය වෙත කැඳවාගෙන යන ලදී.

"ඔබගේ පැමිණීම ගෞරවයක් මහත්වරුනි" එවන්ස් කීය. "මොනවද මගෙන් කෙරෙන්න ඕනෑ?"

"මහත්මයා. මං මේ ආවෙ එවන්ස් මහත්මිය වෙනුවෙන්. ඔබ ඇය වෙනුවෙන් කටයුතු කරන ආකාරය වංචනිකයි, නින්දා සහගතයි, අපහාසාත්මකයි" හෝම්ස් කීවේ එවන්ස් දෙස තර්ජනාත්මක බැල්මක් හෙළමිනි.

හෝම්ස්ගේ ප්‍රකාශයෙන් එවන්ස් තිගැස්සුණු බැව් මම දුටුවෙමි. එහෙත් එක් මොහොතකින් ඔහු යළිත් යථා තත්ත්වයට පත්විය. ඒ සමගම ඔහුගේ මුවගට නැගුණේ අවඥා සහගත සිනාවකි.

"කොහොමද ඔය කතන්දර ඔප්පු කරන්නෙ? ඔහේට නෑ ඒ සඳහා කිසිම සාක්ෂියක්?" එවන්ස් කීය.

"සාක්ෂි නෑ කියලද හිතාගෙන ඉන්නෙ?" හෝම්ස් කීය. "ජූරි සභාවක බුද්ධිමත් මිනිසුන් දොළොස් දෙනෙකු ඒත්තු ගන්වන්න පුළුවන් තරමට, සාක්ෂි මා ළඟ තියෙනවා....... මේං මෙතැන" හෝම්ස් කීවේ දකුණතේ දබරැඟිල්ලෙන් තම නළලට තට්ටු කරමිනි.

"එතකොට අර කීර්තිමත් සෙන්පතිවරයා..... මේජර් ජෙනරාල් නිකල්සන් මැතිතුමාට අත්වෙන ඉරණම මොකක්ද? එතුමා පත්වෙන්නෙ මහත් අපකීර්තියකට නේද?" එවන්ස් ඇසුවේය.

"ඔහු දැන් ඒ හැමදේකටම මුහුණ දෙන්න සූදානම්"

"එතකොට ඔහුගේ දුව?"

"ඔහේගේ යක්ෂ ග්‍රහණයෙන් ගැලවීමට ලැබෙනවා නම්, ඕනෑම කැප කිරීමක් කරන්න ඇයත් දැන් සූදානම්" හෝම්ස් පිළිතුරු දුන්නේය.

"හැබෑට? මේ කවදා ඉඳලද?" එවන්ස් කීවේ උපහාසාත්මක අයුරින් සිනාවෙමිනි. "අනුන්ගේ පෞද්ගලික කාරණාවලට ඇඟිලි ගහන ෂර්ලොක් හෝම්ස්! නින්දා සහගත විදියට හැසිරෙන්නෙත්, අපහාසාත්මක කතා කියන්නෙත් තමුසෙ. කිසිම පදනමක් නැති බහුබූත කතා........"

දරුණු සතුරන් වැනි මොවුන් දෙදෙනාගේ වාග් සංග්‍රාමයෙන් මම අන්ද මන්ද වූයෙමි. මට කෑගැසිණි.

"හෝම්ස්! දෙවියන්ගේ නාමයෙන් කියන්න. මෙතන මොකක්ද මේ සිද්ධ වෙන්නෙ?"

"වොට්සන්. මෙන්න හමුවෙන්න කැතරින් නිකල්සන්ගේ ස්වාමිපුරුෂයා........ විවාහක නමෙන් කිව්වොත් කැතරින් එවන්ස්ගේ සැමියා....... ඒ වුණත් ඔහේට කියන්නත් කනගාටුයි. ජේකබ් ඇඩම්ස් හෙවත් හර්බට් එවන්ස් හෙවත් පර්සි ලෙෆ්රෝයි මේපල්ටන්. මගෙන් අහගන්නවා........ බොරු නමකින් කෙරෙන කසාදෙ නීතියෙන් වලංගු නෑ!"

හෝම්ස් ගේ වචන වලින් මේ පුද්ගලයා ප්‍රථම වරට සුදුමැලි වී වෙව්ළන්නට පටන් ගත්තේය. ඔහු වචන කිහිපයක් ගොත ගසමින් කියන්නට උත්සාහ දැරීය.

"....... මො........ මොනවා? තමුසෙ කවදද එහෙම ඒව හොයාගත්තෙ........ ඒ ඔක්කොම බොරු.......! පට්ටපල් බොරු! මට කරපු අපහාසෙට මං නිකං ඉන්නෙ නෑ"

"ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියටත් මටත් මේ තොරතුරු ලැබිලා බොහොම කල්. ඒ වුණත් තමුසෙ කවුද කියලා මට නිශ්චිතව හොයා ගන්න හැකි වුණේ ඊයෙ රෑ. මේ එංගලන්තයේදි තමන්ගේ අනන්‍යතාව හැංගීම ඒ තරම් පහසු නෑ. උදාහරණයක් වශයෙන් අර ඉන්දියානු කිණිස්සේ මිටේ....... J. A. අකුරු වලින් කියන්නේ ජේකබ් ඇඩම්ස් නොවෙයි නම් වෙන මොකක්ද? අනික බැංකු සමග කටයුතු කිරීමේදී ඔබ සැලකිමත් වෙනවා මදි....... මර්චන්ට්ස්





ට්‍රස්ට් බැංකුවේ සහ නැෂනල් ග්‍රින්ඩ්ලේස් බැංකුවේ ගනුදෙනු........" කී හෝම්ස් තම කබායේ ඇතුළු සාක්කුවකින් පොතක් එළියට ගත්තේය. ඒ නිකල්සන් නිවසින් හෝම්ස් රැගෙන ගිය ගනුදෙනු පොත බැව් මම හඳුනා ගතිමි.

"හො හෝ!" එවන්ස්ට කෑගැසිණි. "ඕකද තමුසෙගෙ සාක්ෂිය? ඔක අතේ තියෙන තුරුනේ තමුසෙට දොඩවන්න පුළුවන් වෙලා තියෙන්නෙ" කී එවන්ස් බිත්තියේ සවිකර තිබූ කලින් සඳහන් කළ ඉන්දියානු කිණිස්ස අතට ගත්තේය.

එය දිගු මුවහත් තලයක් තිබූ භයානක ආයුධයක් බව, මා හරිහැටි දුටුවේ ඒ මොහොතේදිය. එවන්ස්ගේ මුහුණේ මතුවූයේ මෙතරම් දිනක් මා දැක නොතිබූ රෞද්‍ර මිනීමරු පෙනුමකි.

"හෝම්ස් මහත්මයා. ඔහේ මගේ ඉතිහාසය හොඳින් දන්නා පාටයි" එවන්ස් කීවේ කුරිරු සිනාවක් දෙතොලට නගා ගනිමිනි. "ඔහේ වගේ අය ජීවතුන් අතර සිටීම මගේ ජීවිතයට තර්ජනයක්" මුවහත් ආයුධය දකුණු අතින් මිට මොළොවාගෙන අඩියක් පෙරට තැබීමට එවන්ස් සූදානම් වූවා පමණි. තම කබා සාක්කුවට අත දැමූ හෝම්ස් රිවෝල්වරයක් අතට ගෙන එය එවන්ස් දෙසට එල්ල කළේ විදුලි වේගයෙනි.

"මේකෙ කාණු හයේම උණ්ඩ පුරවලයි තියෙන්නේ. ඕක ඔතනම බිම දමනවා! දැන් ඉහළට උස්සනවා!" හෝම්ස් කීය.

ඒ සමගම අප සිටි කාමරය තුළට කිහිප දෙනෙකු කඩා වදින ශබ්දය ඇසිණි.

"ඔබට කොහොම ස්තුති කරන්නද කියලා මට තේරෙන්නෙ නෑ හෝම්ස් මහත්මයා." ඇතුළට කඩාවැදුණු අමුත්තා කීය. ඒ අන් කිසිවෙකු නොව ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් බැව් මම දුටුවෙමි. ඔහු එහි පැමිණ සිටියේ තවත් පොලිස් භටයන් දෙදෙනෙකු ද සමගය. "අපි මේ අපරාධකාරයා හොයන්නේ කොයිතරම් කාලෙක ඉඳලද. ඔහු අතුරුදන්වෙලා හිටියේ කිසිම සලකුණක් ඉතිරි නොකර" කී බ්‍රැඩ්ස්ට්‍රීට් එවන්ස්ගේ දෑත්වලට විලංගු දැමුවේය.

* * *

බකිංහැම්ෂයරයේ සිට ආපසු ලන්ඩනයට පැමිණි පසු, දින කිහිපයක්ම මා ගත කළේ මගේ බිරිඳ සමගයි. මා සමග කීමට ඇයට

බොහෝ දේ තිබිණ. එබැවින් ඇයට කන් දුන්නා මිස, රෝගීනට ප්‍රතිකාර අරඹන්නටද මට අවස්ථාවක් නොලැබිණි. මගේ මිත්‍රයා දැකීමට මා බේකර් වීදියට ගියේ එයිනුත් පසුවය.

"මේ තක්කඩි එවන්ස්, නිකල්සන්ව ප්‍රාණ ඇපකාරයෙකු කරගෙන සිටි බව ඔබ ඉතා පහසුවෙන්ම තේරුම් ගත්තාද හෝම්ස්?"

"ඒක මට නෙමෙයි; පුංචි ළමයෙකුට වුණත් තේරුම් ගන්න පුළුවන් කරුණක් කියලයි මට හිතෙන්නෙ" හෝම්ස් කීය.

"නිකල්සන් විතරක් නෙමෙයි; ඔහුගේ දියණියත් ප්‍රාණ ඇපකරුවකු කරගන්න මේ තක්කඩියා සමත් වුණා. ඔහුගේ ග්‍රහණයට අහුවෙන්න නිකල්සන් කළ අපරාධය මොකක්ද?"

"ඔබ අයිල්ස්බරිහි නිකල්සන් නිවසට යවලා, මං කළේ ඒ ගැන විමසා බැලීම. ඉන්දියාවේ රැකියාවෙන් ඉවත්වෙලා විශ්‍රාම ලබා ආව හමුදා නිලධරයන් හුගක් හිටියා. නමුත් තමන්ගේ සහෝදර නිලධරයන් ගැන තොරතුරු හෝ තමන් ඉන්දියාවේ ගතකළ සැබෑ ජීවිතය, කිසිකෙනෙකු ලේසියට හෙළි කළේ නෑ. හෙළි කරන්නේ නෑ. මං පුද්ගලයන් දහහතර දෙනෙකු හමුවෙන්න ගියා. අන්තිමේදී සාර්ථක ප්‍රතිඵල ලැබුණා.

නිකල්සන් ඉන්දියාවට ගියේ ලාබාල ගැටවරයෙකු ලෙස බව අපට අහන්න ලැබුණා. අනෙක් හැමදෙනෙකුම වගේ ඔහුත් ඉන්දියාවෙ ගතකරලා තියෙන්නෙ බොහොම විනෝදකාමී ජීවිතයක්. ඔහු කල්කටාවෙන් ලක්නව් වලට යැවුණෙත් කනිෂ්ඨ නිලධරයෙකු හැටියට. එහිදී ඔහු ඉන්දියානු තරුණියක සමග ප්‍රේම සම්බන්ධයක් ඇති කරගෙන. පුහුණුව ලබන හමුදා භටයෙකු හැටියට ඔහුට විවාහ වෙන්න අවසර තිබිලා නැහැ. එහෙම තියෙද්දී ස්වදේශික තරුණියක සමග මිත්‍ර වුණාම? එපමණක් නොවෙයි. ඔහු රහසේම ඇය සමග විවාහ වෙලා. ඒ හින්දු චාරිත්‍රවලට අනුව. ඇය හමුදා කඳවුර තුළට කැඳවාගෙන එන්න බැරි නිසා, ඇගේ දෙමාපියන්ගේ නිවසේ ඔහු ඒ පවුල් ජීවිතය ගත කරල තියෙනවා. පසුව දරුවන් දෙදෙනෙකු ලැබුණු පසු, ඔහු නිල වශයෙන් ක්‍රිස්තියානි චාරිත්‍රවලට අනුව විවාහ වීමට අයැදුම් කරාලු. නමුත් හමුදාවේ ඉහළ නිලධරයන්ගේ සැර පරුෂ කම් ඔබ හොඳින් දන්නවා නේ වොට්සන්? ඔවුන් ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළාලු"





"ඒක ඉතින් මං හොඳට දන්නවා." මම කීවෙමි. "ඔබේ ලොක්කා සුළු දේකට හරි අමනාප වෙලා නම්, ඔබව බෙල්ලෙන්ම කපල දමන්නට ඔහු කටයුතු කරන්නේ, නැති නීති හොයාගෙන. ඕනෙම හමුදාවක හැටි එහෙමයි"

"අන්න හරි. ලක්නව් වලින් ග්වාලියෝර් හමුදා කඳවුරට මාරුවීමක් ඔහු ඉල්ලලා තිබුණේ. මේ අතරේ එංගලන්තයෙන් ඔහුට කැඳවීමක් ලැබුණා. ඒ ඔහුගේ දෙමව්පියන්ගෙන්. පියා සිටියේ බරපතළ ලෙස අසනීප වෙලා. මව අංශභාග රෝගයෙන් ඔත්පල වෙලා, රෝද පුටුවේ. ඔවුන්ගේ අවසාන හා එකම ඉල්ලීම වුණේ, තමන් මිය යන්නට පෙර ඔවුන්ගේ එකම පුත්‍රයාගේ, විවාහය සිදුකළ යුතු බවයි. නිකල්සන් හිටියේ එය ප්‍රතික්ෂේප කිරීමට හෝ කල් දැමීමට පුළුවන් තත්ත්වයක නෙමෙයි. ඔවුන්ගේම දුර ඥාති ප්‍රභූ පවුලක තරුණියක විවාහ කර ගන්නට ඔහුට සිදුවුණා"

"දෙයියෝ සාක්කි! ඉතින්?"

"විවාහ වුණත් නිකල්සන් ඉන්දියාවට ආපසු ගියේ තනියම. ඔහු ලක්නව් වල හිටි තමන්ගේ ඉන්දියන් බිරිඳ හා දරු දෙදෙනා ග්වාලියෝර් වෙත රහසේ ගෙන්වා ගත්තා. ඔවුනට සැප පහසු ජීවිතයක් ගත කරන්න පහසුකම් සලස්වා දුන්නා. නමුත් ටික කලක් ගත වෙද්දී ඔහුට ඉංග්‍රීසි ජාතික තරුණ බිරිඳත් ඉන්දියාවට ගෙන්වා ගන්න සිදුවුණා. ඇය මොකක්දෝ බරපතල රෝගයකට උපතින්ම ගොදුරු වුණු කාන්තාවක්ලු. කැතරින් බිහිකිරීමෙන් පසු ඇගේ මවගේ එම රෝගී තත්ත්වය වැඩිවුණා මිස, සුව අතකට හැරුණේ නෑ. එම රෝගයෙන්මයි නිකල්සන් මහත්මිය අකාලයේ මියගියේ.

මේජර් ජෙනරාල් නිකල්සන්ට තමන්ගේ දෙමව්පියන්ගෙන් විශාල ධනයක් උරුම වුණේ නෑ. ඒ ඔවුන් පොහොසතුන් නොවුණු නිසා. ඔහුට වියදම් කිරීමට විශාල මුදලක් අවශ්‍ය වුණා. එක් පැත්තකින් ඔහුගේ බිරිඳගේ රෝගී තත්ත්වය වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන්න. තවත් පැත්තකින් අර ඉන්දියානු පවුල නඩත්තු කරන්න. ඊට අමතරව ඔහු සූදු ක්‍රීඩාවේත් යෙදුණු හුගක් මත්පැන් පානය කළ කෙනෙකු වීම නිසා අවශ්‍ය වුණු මුදල.

මේ තරම් කටයුතුවලට විශාල මුදලක් අවශ්‍ය වුණු නිකල්සන්ට, හමුදාවේ ඉහළ නිලධරයෙකු හැටියට ලැබුණු වැටුප ප්‍රමාණවත්

වුණේ නෑ. ඔහු මොකක්ද කළේ? විශාල ධනවතෙකු බව පෙනුණු කෙනෙකුගෙන් මුදල් ණයට ගැනීම. කවුද මේ ධනවතා? ඔබත් මාත් ඔහුව හඳුනන්නෙ හර්බට් එවන්ස් ලෙස. නමුත් උතුරු ඉන්දියාවේ දිල්ලියේ යුද හමුදා ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශයේ සේවය කරද්දී ඔහුගේ නම ජේකබ් ඇඩම්ස්.

අතික් අයට මුදල් ණයට දෙන්න තරම් ඇඩම්ස් ධනවතෙකු වුණේ කොහොමද කියලා කවුරුවත් දැනගෙන හිටියේ නෑ. යුද්ධ හමුදාවේ වියදම සඳහා එංගලන්තයෙන් යැවූ මුදල්, ඔහු මහා පරිමාණයෙන් වංචා කළා කියල කතාවක් තිබුණලු. නමුත් ඔහුට හොඳට සල්ලි තිබුණා. අගහිඟකම් වලට මුහුණ දී සිටි නිකල්සන් ඇඩම්ස්ගෙන් මුදල් ණයට ගත්තේ දෙන්නා ඉන්දියාවෙ ඉඳිද්දිමයි.

නිකල්සන්ගේ ඉන්දියානු පවුල ගැන රහස ඇඩම්ස් දැනගෙන හිටියා. නිකල්සන්ගේ ඉන්දියානු බිරිඳ හා දරුවන් දෙන්නා එංගලන්තයට ගෙන්වා ගැනීමට, පසුව ඔහු පියවර ගෙන තිබෙනවා. තමන්ගේ කීර්තිනාමය පරදුවට තියලා නිකල්සන් මෙවැනි තීරණයක් ගත්තාම, ඒක ඇඩම්ස් කියන තක්කඩියාට හොඳ තුරුම්පුවක් වුණා. ඔහු මේජර් ජෙනරාල්වරයාට දිගින් දිගටම ණය දුන්නා. ඒ වෙනත් අරමුණකින්. ඒ තමයි නිකල්සන් මුහුණ දී තිබෙන ණය සහ පවුලේ හුටපටය රටට හෙළි කරන බවට තර්ජනය කරලා, නිකල්සන් ප්‍රාණ ඇපකාරයෙකු කර ගැනීම. එවන්ස් හෙවත් ඇඩම්ස්ගේ තිබුණා බොහොම දුරදිග සිතා බලා කළ දීර්ඝ කාලීන සැලසුමක්. ඒ මොකක්ද කියල දැන් ඔබට පෙනේවි.

දිගින් දිගටම එවන්ස්ට ණය වී නිකල්සන් හිරවුණේ අතිශයින්ම භයානක උගුලක. ඒකෙන් ගොඩ ඒමට ඇති එකම මාර්ගය කුමක්ද? එවන්ස් ඒක පෙන්වා දුන්නා. ඒ තමයි මේජර් ජෙනරාල් නිකල්සන්ගේ තරුණ දියණිය කැතරින්, එවන්ස්ට විවාහ කරදීම. එහෙම නොකොළොත් තමන් හැම දෙයක්ම රටට හෙළි කරන බවට එවන්ස් තර්ජනය කළා. අතික ණය නොගෙවීම නිසා නිකල්සන්ට යන්න වෙන්නේ හිරේට. මේ හැම දෙයක්ම එවන්ස් කැතී මෙනෙවියට කියන්න ඇති කියා මං විශ්වාස කරනවා. තමන්ගේ පියා අපකීර්තියෙන් ගලවා ගැනීමට, කැතී මෙනෙවිය ආත්ම පූජාවක් කළා කියලයි මට හිතෙන්නේ"





"ඇය එවන්ස් සමග විවාහ වී ඇති බව ඔබ කොහොමද කල් ඇතුවම දැනගත්තේ?"

"මම ඇයව පළමුවෙන්ම හමුවුණු දවස ඔබට මතකද වොට්සන්? රජ කුමරියකට ගෞරව දක්වන විධියට, එදා මං ඇගේ අත සිපගත් බව ඔබ දකින්න ඇති. මට උවමනා වුණේ ඇගේ අතේ මුදු ඇඟිල්ලේ, මඟුල් මුද්දක් පැළඳි සලකුණු තියෙනවාද බලන්න. එවන්ස්ගේ ගෙදරදී ඔහුගේ ඉල්ලීමට ඇය මුද්ද පැළඳුවා. නමුත් තමන්ගේ පියාගේ ගෙදර ඉඳිද්දී, ඇය ඒක ගළවා තැබුවා. මඟුල් මුද්දක් පළඳින තරුණියකගේ මෘදු සමේ ඇතිවන සලකුණු, ඉතා සූක්ෂම ලෙස සම මතුපිට ඉතිරි වෙනවා. ඇගේ අත ඔබේ ඇස් ළඟටම ගත්තාම, ඒවා නිරීක්ෂණය කිරීම පුහුණු කළ දෙනෙත්වලට අමාරු නැහැ"

"කැතී ඇගේ පියාගේ නිවසෙ ජීවත්වුණු බවයි අපට පෙනුණේ?" මම ඇසීමි.

"ඔව්. ඇගේ පියාගේ අමුත්තන් පැමිණි විට; විශේෂයෙන්ම ඒ ඔබේ මිත්‍රයා මිචෙල් ඒ නිවසට පැමිණි විට. තමන් දැන් විවාහක ගැහැනියක් බවත්, ඒ නිසා තමාව අමතක කරන දමන්න කියන ඉල්ලීම මිචෙල්ට කියන්න, කැතීට ශක්තියක් තිබුණේ නෑ. මං හිතන්නේ ඇය එහෙම කළේ ඇයි කියන කරුණ අපට තේරුම් ගන්න පුළුවනි. එතකොට ඇගේ පියාණන් ගැන රහස් මිචෙල්ට හෙළිකරන්න වෙන නිසා. ඇය ඒක හිතින්ම මිචෙල් ගැන ආදරයෙන් ඉන්න ඇත්තේ. දේව බැල්මකින් හෝ එවන්ස් කියන යක්ෂයා ගෙන් නිදහස් වුණොත් මිචෙල් තරුණයා සමග අතිනත ගන්න ඇගේ යටි සිතේ බලාපොරොත්තුවක් තියෙන්න ඇති."

"එතකොට නිකල්සන් උන්මත්තකයෙකු වගේ හැසිරුණේත් ඒ නිසාමද?"

"ඔබ හිතුවා හරි වොට්සන්. මිචෙල් කියන තරුණයාට තමන්ගේ දුව විවාහ කර දෙන්න නිකල්සන් ලොකු කැමැත්තකින් හිටියෙ. නමුත් ඒක ක්‍රියාත්මක කරන්න, බැරි බව ඔහුට පෙනී ගියා. ඒ නිසා තරුණයා අධෛර්යමත් කරන්න බොරුවට ගත්තා පිස්සුවක්. මේජර් ජෙනරාල් නිකල්සන්ගේ උමතුව හැමවිටම මතුවුණේ ඔහු සහ මිචෙල් පමණක් සිටින වෙලාවලදී. එක් වතාවක් ඔබ සහ ඔහු පමණක් ඒ ගෙදර සිටියදී, ඔබට පමණක් පෙනෙන සේ පිස්සුව හැදුණා. වොට්සන් දැන් මගේ අර රාක්කයේ - "ස්ක්‍රැප්" පොත්

තබන රාක්කයේ, උඩින්ම තිබෙන පොත මට අරගෙන දෙන්න"

මම එය ඉටු කළෙමි.

"දැන් බලන්න මෙන්න මේ ප්‍රවෘත්තිය" ඔහු කීවේ දුර්වර්ණ වූ පුවත්පත් කැපුමක් පෙරළමිනි.

"මේ තියෙන්නේ '81 නොවැම්බර්' 7 වැනි දා "නිව්ස් ඔෆ් ද වර්ල්ඩ්" පුවත්පතෙන් මං කපාගෙන ආරක්ෂා කළ ප්‍රවෘත්තියක්"

**මිනීමැරීමට හා මංකොල්ල කෑමට දුම්රිය මැදිරියක් යොදාගත් දෙවන අවස්ථාව**

මෙම වසරේ ජූනි 24 වැනිදා බ්‍රයිටන් සිට ලන්ඩන් බ්‍රිජ් දුම්රියපොළට ගමන් කළ දුම්රියේ ආ මගියෙකු, ප්‍රෙස්ටන් පාක් දුම්රියපොළේදී දුම්රියෙන් බැස පිටවී යාමට සූදානම් විය. ටිකට් එකතු කරන දුම්රිය සේවකයාගේ අවධානය යොමු වූයේ මේ මගියාගේ ඇඳුම් පැළඳුම් වෙතය. ඒවායේ ලේ පැල්ලම් කිහිපයක් දක්නට ලැබිණි. ඊට අමතරව මගියාගේ බූට් සපත්තුවක උඩ කෙළවරේ රත්රන් ඔරලෝසු දම්වැලක්ද විය. අසල සිටි දුම්රිය ආරක්ෂක භටයන් විසින් මගියා අත් අඩංගුවට ගෙන පොලීසිය කැඳවන ලදී.

තම ඇඳුම්වල ලේ පැල්ලම් තිබීම ගැන මගියා කීවේ මෙයයි. දුම්රිය මර්ස්තම් උමග තුළින් එද්දී වෙඩි ශබ්දයක් ඇසුණු බවත් ඒ සමගම තම හිසට පහරක් එල්ල වී තමා සිහි විසඥ වූ බවත්ය. මීළඟට දුම්රිය උමගෙන් එළියට ආ විට, තමාට සිහිය ආ බවත්, එවිට ඒ මැදිරිය තුළ තමා සිටියේ තනිවම බවත්, පර්සි ලෙෆ්රෝයි මේපල්ටන් නම් මේ මගියා කීය. වැඩිදුර ප්‍රශ්න කිරීම හා සෝදිසි කිරීම සඳහා, ඔහු පොලිස් ස්ථානය වෙත ගෙන යන ලදී.

මේ අතර ප්‍රෙස්ටන් පාක් සමීපයේ බැල්කෝම්බ් දුම්රිය උමගේ තිබී 64 හැවිරිදි පුද්ගලයෙකුගේ මළ සිරුරක් පොලීසියට හමුවිය. ඒ අයිසැක් ගෝල්ඩ් නම් දුර්ලභ රන් කාසි අලෙවි කළ යුදෙව් ජාතිකයෙකු බවට හඳුනාගැනිණ. ඔහු මියගොස් සිටියේ බෙල්ලට සිදුවූ පිහි ඇණුමක තුවාල සහ වෙඩි පහරක ප්‍රතිඵලයක් ලෙසිනි.

කලින් කී පර්සි මේපල්ටන් සෝදිසියට ලක් කළ විට, ඔහු ඇඳුම් තුළ සඟවාගෙන සිටි දේ පොලීසියට හමුවිය. ඒ ඉතා දුර්ලභ සහ පැරණි ජර්මන් රන්කාසි කිහිපයක් සහ රත්තරනින් තැනූ සාක්කු ඔරලෝසුවකි. සියල්ල හෙළි වූ විට අපරාධකාරයා පාපෝච්චාරණයක් කළේය. මීට කලින් වාරවලදී දුම්රිය මගීන්ගෙන් කොල්ල කෑ කාසි හා ආභරණ ක්‍රොයිඩන්හි තම නිවසේ ඇතැයි ඔහු කීය.





ඒවා ලබා ගැනීම සඳහා ඔහු පොලිස් ආරක්ෂාව යටතේ ක්‍රොයිඩන් වෙත ගෙන යන ලදී. පොලිස් භටයන් ඉදිරිපස දොරටුව ළඟ බලා සිටියදී නිවසට ඇතුළු වූ පර්සි මේපල්ටන් පිටුපස දොරටුවෙන් පලා ගියේය. ඔහු අල්ලා ගැනීමට මේ දක්වාත් හැකිවී නැත"

"දෙයියෝ සාක්කි හෝම්ස්! එතකොට ඇඩම්ස් එවන්ස් ආදී නම් අරගෙන ඉන්නේ මිනීමරු මේපල්ටන්ද? ඔබ කොහොමද ඒ බව දැනගත්තේ?"

"කිසිම සැකයක් නෑ. ඒ මිනීමරු මේපල්ටන් මයි. ඔහු පොලීසියට අහු නොවී රටෙන් පැන්නා. ඒ ඉන්දියාවට භටයන් ගෙන ගිය නැවක නැගී, සැඟවීමෙන්. ජේකබ් ඇඩම්ස් යයි බොරු නමක් අරගෙන ඔහු ඉන්දියාවට ගෙන ගිය හමුදා භටයන් රාශියක් සමග මිත්‍ර වුණා. ඔහු ගිණුම් තැබීමේ ලිපිකරුවෙකු ලෙස පුහුණු වී එංගලන්තයේ රැකියාව කර සිටි අයෙක්. ඒ නිසා ඔහුට ඉන්දියාවේදී රැකියාවක් ලබා ගැනීම අපහසු වුණේ නෑ. මුලින් ක්ලිෆ්ටන් සමාගමේ තේ අපනයන අංශයේ රැකියාව කරලා, ඔහු ඊළඟට යුද්ධ හමුදාවේ ගිණුම් අංශයට බැඳුණා. එහි ලක්නව් කාර්යාලයට මාරුවී ගියාම තමා, ඔහු මේජර් ජෙනරාල් නිකල්සන් හඳුනාගෙන ආශ්‍රයට වැටී තියෙන්නේ"

"නමුත් ඔබ කොහොමද එවන්ස් කියන්නේ පර්සි මේපල්ටන් බව දැනගත්තේ?"

"මෙහෙමයි. එදා දුම්රියේ අපරාධය නිසා ඔහු පොලිස් අත් අඩංගුවට පත්වුණු බව මං ඔබට කිව්වා. එදා පොලිස් ඡායාරූප ශිල්පියා මේපල්ටන්ගේ ඡායාරූප ගණනාවක් අරගෙන තිබුණා. ස්කොට්ලන්ඩ්යාඩ් හි ලේඛනාගාරයේ මේ ඡායාරූප සහ තොරතුරු සහිත ලිපිගොනුව, මං දැකලා හුඟක් කල්. ඔහුගේ හිසේ අමුතු හැඩය සහ කන්පෙති දෙක මගේ මොළයේ තදින්ම සටහන් වී තිබුණා.

මේජර් ජෙනරාල් නිකල්සන්ගේ අතීතය ගැන තොරතුරු දැන ගැනීමට, ඔහු ඉන්දියාවේ ගත කළ ජීවිතය ගැන විස්තර දැනගන්න මට උවමනා වුණා. යුද්ධ හමුදා මූලස්ථානයේ තිබෙන ඔහුගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂා කරන්න, මං අවස්ථාවක් ලබා ගත්තේ බොහොම අමාරුවෙන්. ඒ මගේ සොහොයුරු මයික්‍රොෆ්ට්

ගේ උදව්වෙන්. ඔබ ඒවා කවදාවත් දැකල ඇති කියල මං හිතන්නෙ නෑ වොට්සන්. ඒවල තියෙනවා ඒ නිලධරයන් ළඟින්ම ආශ්‍රය කරන හෝ කළ, පිරිමින්ගේ සහ විශේෂයෙන්ම ගැහැනුන්ගේ ඡායාරූප. ඒ හැම මුහුණක්ම මං මගේ මස්තිෂ්කය තුළ "මුද්‍රණය" කර ගත්තා. එතැනින් එහාට වැඩේ බොහොම පහසු වුණා. ඊළඟට උද්‍යාන සේවකයෙකු ලෙස නිකල්සන් නිවස අසල ගැවසෙද්දී, මං අර ලිපිගොනුවේ දුටු පුද්ගලයෙකුගේ මුහුණ දුටුවාම; මේ අවුලේ ගැටගැසී තිබුණු තැන් එකක් ගණනේ ලිහී යන්න පටන් ගත්තා."

"තව මොනවද ඔබට දැනගන්න හැකිවුණේ"?

"වොට්සන්. ඔබ විශ්වාස කරනවද, මේජර් ජෙනරාල් නිකල්සන් එංගලන්තයට ඇවිත් විවාහ කරගත් බිරිඳ, බ්‍රිතාන්‍ය රජ පවුලේ ඥාතිවරියක කියා? ඇගේ පියා තමයි සර් ආචිබෝල්ඩ් කැම්බල් - සර් කොලින් කැම්බල් හෙවත් ක්ලයිඩ් සාමිවරයාගේ ඥාති සොහොයුරෙක්. කැතී මෙනෙවියගේ මව හෙවත් වර්ජිනියා කැම්බල් ඒ පවුලේ එකම දරුවා.

ඇය විශාල ධනයකට හිමිකම් කිව්වා. නමුත් තරුණ කාලයේ සිටම ඇය කුමක් හෝ බරපතල රෝගයකට ගොදුරු වී ඉඳලා තියෙනවා. ඇගේ මරණයෙන් පසු ඒ ධනස්කන්ධය උරුම වුණේ මේජර් ජෙනරාල් නිකල්සන්ට හා දියණියට. ඔහු එංගලන්තයට ආපහු එන්න ඇත්තේ සැනසිල්ලේ ජීවත්වෙන්න. නමුත් එවන්ස් හෙවත් මේපල්ටන්ගේ කට වහන්න, ඔහුට විශාල මුදල් ප්‍රමාණ කප්පම් ගෙවන්න නිකල්සන්ට සිදුවුණා. එපමණක් නොවෙයි. මේ තක්කඩියාට තම දියණිය විවාහ කර දෙන්නත් සිදුවුණා. තමන් අරගෙන තිබූ ණය පොළියත් සමග ගෙව්වාට පසුත් තවත් මුදල් දෙන්න නිකල්සන්ට සිදුවුණා"

"නිකල්සන්ට ඇත්තටම පිස්සු හැදුණා නම්, ඒකෙත් පුදුම වෙන්න දෙයක් නැහැ කියලයි දැන් මං හිතන්නේ"

"හරියට හරි වොට්සන්. තව ටික දවසක් ගියා නම් ඒ දේ ඇත්තෙන්ම සිදුවෙනවා. නමුත් ඒ ටික දවස බලාගෙන ඉන්න බැරි නිසයි එවන්ස් හෙවත් මේපල්ටන්, මේජර් ජෙනරාල්වරයාගේ විස්කිවලට ක්ලෝරල් රහසින් කලවම් කළේ"

"අපරාධකාරයා බලාපොරොත්තු වෙන්න ඇති මත්පැන් විෂවෙලා හෝ අනතුරකට ගොදුරු වෙලා, නිකල්සන් ඉක්මනින් ජීවිතක්ෂයට පත්වේවි කියලා"





"වොට්සන්. ඔබත් මාත් එදා බකිංහැම්ෂයරයේ නොසිටින්න එදා ඒ දේ සිදුවෙනවා. එහෙම වුණා නම් කැතී මෙනෙවිය සහ ඇයට මවගෙන් උරුමවුණු මහා ධනස්කන්ධය මේපල්ටන් කියන අපරාධකාරයාට ඉතාම පහසුවෙන් උරුමවෙන්න තිබුණා"

හර්බට් එවන්ස් හෙවත් ජේකබ් ඇඩම්ස් හෙවත් පර්සි ලෙෆ්රෝයි මේපල්ටන් විසින් කරන ලද අපරාධය, එනම් අයිසැක් ගෝල්ඩ් කෘෘර ලෙස ඝාතනය කළ අයුරු, පුවත්පත්වලින් ප්‍රසිද්ධ කෙරිණි. කෙටි නඩු විභාගයකින් පසු ඔහු එල්ලුම් ගසට නියම විය.

ව්‍යාජ නමකින් සිදු කෙරුණු විවාහයක් නීතියෙන් වලංගු නොවන නිසා, තරුණ පෙම්වතුන් යුවළට අතිනත ගැනීමට නීතියෙන් කිසිදු බාධාවක් නොවීය. කැතරින් නිකල්සන් මෙනෙවිය හා ලෝරන්ස් මිචෙල් අතර විවාහය අයිල්ස්බරිහි ශාන්ත මොනිකා දෙව් මැඳුරේදී සිදුවිය. දකුණු අප්‍රිකාවේ පෝට් එලිසබත්හි වරායේ ආරක්ෂක තනතුරක් ලැබූ මිචෙල් තම බිරිඳ සමග එම රටට සංක්‍රමණය විය.

මෙම කථාවේ මතු වූ තවත් රිදී ඉරක් ගැන අපට පසුව දැන ගන්නට ලැබිණි. එය නම් මේජර් ජෙනරාල් ජෝන් නිකල්සන්ගේ ඉන්දියානු බිරිඳ සහ දරුවන් දෙදෙනා, බකිංහැම්ෂයරයේ කැම්බල් මැඳුරේ පදිංචියට යාමය. නිකල්සන්ගේ මෙම විවාහය ක්‍රිස්තියානි ආගමානුකූලව හා බ්‍රිතාන්‍ය නීතියට අනුව ලියාපදිංචි කරන ලදී.

# හදිසි අනතුර

සසෙක්ස්හි වැම්පයර් භීෂණය කථාන්තරය ආරම්භයේදී මා මෙවැන්නක් සඳහන් කර ඇති බැව් ඔබට පෙනී යනු ඇත.

"....... ෂර්ලොක් හෝම්ස්ගේ පරීක්ෂණ අඩංගු පොත් අකාරාදි අනුපිළිවෙළින් ගබඩා කොට තිබූ රාක්කයෙන් ඔහුට අවශ්‍ය ග්‍රන්ථය ලබා දුනිමි. ජීවිත කාලයක් තුළ ඔහු පැවැත්වූ පරීක්ෂණ සමහරක් ගැන පිටු ඔහු පෙරළා බැලුවේ ඉතා ආශාවෙනි.

"....... වොට්සන් මගේ පරීක්ෂණ සූචියේ V අකුර යටතේ තියෙන්නෙ........ වික්ටර් ලින්ච් ගෙ පරීක්ෂණය, විෂ සහිත කටුස්සාගේ සිද්ධිය, විටෝරියා නම් නළඟනගේ කථාව......."

මෙහි අන්තිමට සඳහන් කළ විටෝරියා නම් නළඟන ගේ කථාව මෙවර ඔබට ඉදිරිපත් කළ යුතු යයි මම සිතුවෙමි.

1895 වසරේ දෙසැම්බරයේ නත්තල් සමය ළංවෙද්දී, මුළු එංගලන්තයම උත්සවශ්‍රීයෙන් ඇළලී ගියේය. ලන්ඩන් නගරය පුරා විවිධ ස්ථානවල සැණකෙළි, ප්‍රදර්ශන, සංගීත ප්‍රසංග, හා සර්කස් ඉතා විශාල සංඛ්‍යාවක් විය. මේවා නැරඹීමට ඉතා විශාල සෙනගක් පිට පළාත් වලින් ලන්ඩන් නගරය වෙත ඇදී ආහ. වෙනදා දක්නට ලැබෙන අධික වර්ෂාව, මීදුම හෝ දැඩි ශීතල මෙවර ලන්ඩනයේ නොතිබීම, මහජනයාට දේව ආශීර්වාදයක් වැනි විය. කවුරුත් මෙලෙස සතුටින් කාලය ගත කරද්දී එක් රාත්‍රියක ඛේදජනක අනතුරක් සිදුවූයේ අනපේක්ෂිත අයුරෙනි.

සර්කස් කණ්ඩායම් අතර අතිශයින්ම ජනප්‍රිය කණ්ඩායම වූයේ ජුපිටර් සර්කස් කණ්ඩායමය. ඔවුන්ගේ රංගන භූමිය සහ යෝධ කූඩාරම පිහිටා තිබුණේ සුප්‍රසිද්ධ කිව් උද්‍යානය ඉදිරිපිට ඇලෙක්සැන්ඩ්‍රා ක්‍රීඩාංගනයේය. අනෙක් සෑම කණ්ඩායමක්ම මහජනයා වෙත ඉදිරිපත් කරන සිංහයන්, ව්‍යාඝ්‍රයන්, වලසුන් වැනි රෞද්‍ර සතුන් යොදාගෙන කරන ක්‍රීඩා, ගිනිකෙළි සංදර්ශන, ඉන්ද්‍රජාලික ඉසව් ආදිය මොවුන්ගේ වැඩ සටහනට ද ඇතුළත් විය. එහෙත් මොවුන්ගේ ජනප්‍රියම අංගය වූයේ ලොමු දැහැගන්වන





සරඹ ක්‍රීඩා හා ගුවන් කරණම් සංදර්ශනයයි. මේවා රාශියක් තිබුණද අපගේ කථාවට අදාළ වන්නේ ඉන් එකක් පමණක් නිසා මම එය විස්තර කරමි.

මෙම බිහිසුණු කරණම් වල යෙදුණේ ඇන්ජෙලා සහ නීනා නම් අවුරුදු දහසයක්, දහහතක් වයසැති තරුණියන් දෙදෙනාය. මොවුන් දෙදෙනාම ඉතාලි සම්භවය ඇති, එකිනෙකාට ඥාති සම්බන්ධයක් ද ඇති පවුල්වල අය බැව් පැවසේ.

යෝධ කූඩාරමේ වහලේ ගැටගසා ඇති කඹයක් දිගේ නීනා ඉහළට නඟින අයුරු, ප්‍රේක්ෂකයනට මුලින්ම දැක ගන්නට ලැබේ. වහල මට්ටමේදී හරහට සවිකර ඇති යකඩ පයිප්පයක් මතට නැග, එය දිගේ ඇය ඉදිරියට ගමන් කරන්නේ ඉහළින් ගැටගසා ඇති කම්බියක් අල්ලාගෙනය. මෙසේ යන ඇය මීළඟට පිවිසෙන්නේ ඔංචිල්ලාවකටය. දිගු කඹ දෙකකින් කූඩාරමේ වහලට ගැටගසා ඇති මෙහි වාඩිවීමට ඇත්තේ, ඇළුමිනියම් ලෝහයෙන් තැනූ හරස් ලීයකි. එහි හිඳගන්නා ඇය ඔංචිල්ලාව පදින්නට පටන් ගන්නේ නරඹන්නන්ගේ ප්‍රීති ඝෝෂා මධ්‍යයේය. මෙසේ මිනිත්තු දෙකක් ඔංචිලි පදින ඇය මීළඟට එය සිදු කරන්නේ අනතුරුදායක ආකාරයකටයි. එනම් තම දෙපා දණහිස් ළඟින් නමා ගන්නා ඇය ඒවා ඔංචිල්ලාවේ ඇළුමිනියම් ලීය වටේ දමාගෙන, දෙකකුල් එහි පටළවාගෙන, ඔළුව පහළට සිටින සේ ඔංචිලි පැදීම අරඹයි. හිස පහළට පමණක් නොව දෑත්ද පහළට දිගු කරගෙන, නීනා මේ ආකාරයෙන් ඔංචිලි පදින්නේ ඉතා වේගයෙනි.

එවිට මෙහි දෙවැනි කොටස අරඹන්නේ ඇන්ජෙලා නම් නළඟනය. අපට නොපෙනෙන සේ කඹයක එල්ලී කූඩාරමේ ඉහළට නැග ඇති ඇය ද, පෙර කී ආකාරයේ ඔංචිල්ලාවක නැගී එය ඉදිරියට හා පිටිපසට පදින්නේ, සාමාන්‍යයෙන් ඔංචිලි පදින ඉරියව්වෙනි. කෙසේ වෙතත් ඇන්ජෙලා ඔංචිල්ලාව පදින්නේ ඇළුමිනියම් ලීය මත දෙපයින් සිටගෙන, එය වහලට සවිකර ඇති කඹ දෙක දෑත් වලින් අල්ලා ගෙනය.

මේ දෙදෙනාගේ ඔංචිලි පැදීම වේගවත් වෙද්දී කූඩාරමේ විවිධ පැතිවලින් ඔවුන් දෙසට ප්‍රබල ආලෝකධාරා එල්ල වේ. කූඩාරමේ උතුරු දෙසින් ඇති ඔංචිල්ලාවක නීනා හිස පහළට සිටින සේ ඔංචිලි පදිද්දී, දකුණු දෙසින් ඇති ඔංචිල්ලාවේ සිටින ඇන්ජි එය







පදින්නේ එහි දෙපයින් සිටගෙන හිස ඉහළට තබාගෙනය. මෙම දර්ශනයෙන් කුල්මත්ව සිටින නරඹන්නන් ප්‍රීති ඝෝෂා නගද්දී, අත්පොළසන් හඬ වැඩිවෙද්දී ඔංචිලි පැදීම වේගවත් වේ.

මෙම ක්‍රීඩාවේ භයානකම කොටස එළඹෙන්නේ මීළඟටය. ඇන්ජිගේ ඔංචිල්ලාව කොපමණ ඉදිරියට එනම් උතුරු දෙසට දෝලනය වුවත්, එම වේලාවේම නීනාගේ ඔංචිල්ලාව දකුණට සම්පූර්ණයෙන්ම දෝලනය වුවත්, දෙදෙනා අතර ඇති දුර ප්‍රමාණය අඩි දහයක් දොළහක් පමණ වේ. දැන් ඔවුන් ඔංචිල්ලා පැදීම කරන්නේ එකම රිද්මයකටය. එනම් හිස ඉහළට තබාගෙන ඔංචිල්ලාවේ නැගිට පදින ඇන්ජි ඉදිරියට එන වෙලාවටම නීනාද ඉදිරියට එයි. නීනා ඔංචිල්ලාවේ එල්ලී එය ග්‍රහණය කරගෙන සිටින්නේ දණහිස් ළඟින් නැමූ දෙපයින් බවත්, ඇගේ ඔළුව සහ දෑත් තිබෙන්නේ පහළට දිගුවී බවත්, මම ඔබට කලින් සඳහන් කළෙමි. මෙම භයානක ඔංචිලි පැදීම සිදුවන්නේ පොළොවට අඩි තිහක් හෝ හතළිහක් පමණ ඉහළිනි. එනම් තට්ටු තුනක ගෙඩනැඟිල්ලක මුදුනේ සිවිලිම මට්ටමේය. එබැවින් මෙය මොන තරම් භයානක, අනතුරුදායක ක්‍රීඩාවක් දැයි තේරුම් ගැනීම අපහසු නැත. වෙනත් සර්කස් සංදර්ශනවල මෙවැනි ක්‍රීඩිකාවන්ගේ ආරක්ෂාව සඳහා පහළින් විශාල දැලක් සවිකර ඇති බැව් අපි දැක ඇත්තෙමු. එවිට යම් හෙයකින් ක්‍රීඩිකාවකට ඔංචිල්ලාව අත හැරුණොත්, එවිට ඔවුන් වැටෙන්නේ දැල මතටය. ඒ මගින් ඔවුන්ගේ ජීවිත ආරක්ෂා වේ. නමුත් මෙම සර්කස් දර්ශන තලය තුළ පහළින් දැලක් සවිකර නොමැත. ඔංචිල්ලාවක් අත්හැරුණොත් දෙවියන්ගේ පිහිටය.

පසුබිමෙන් නැගෙන සංගීත නාදය, නරඹන්නන්ගේ ප්‍රීති ඝෝෂා හා අත්පොළසන් නාද මධ්‍යයේ මොවුන් පෙර ලෙස ඔංචිලි පැදීමේ යෙදෙන්නේ, සිත්වල කිසිදු චකිතයකින් තොරවය. සංගීත රාවය ක්‍රමයෙන් වේගවත් වී තීව්‍රවේ. එක්වරම සිදුවන්නේ කුමක්ද? දකුණු ඔංචිල්ලාව වේගයෙන් පැද ඉදිරියට එන ඇන්ජි එය එක් ක්ෂණයකින් අත්හැර, ගුවනට කරණමක් ගසන්නේ, උතුරු ඔංචිල්ලාව පැද එන නීනාගේ දෑත් දෙසටයි. ඔවුන් දෙදෙනා අතර දුර අඩි දොළොසක් පමණ බව මම මුලින් සඳහන් කළෙමි. ඔංචිල්ලාව පැද ආ වේගයටම ගුවනේ කරණමක් ගසා

විදුලි වේගයෙන් ඒ දුර තරණය කරන ඇන්ජි, එක් ක්ෂණයකින් නීනා දිගු කරගෙන සිටින දෑත් දෙසට ළං වන්නීය. ඒ තම දෑත්ද ඉහළට දිගු කරගෙනය. නීනා එක් මොහොතකින් ඇන්ජිගේ දෑත් තරයේ අල්ලා ගනී. ඒ සමගම ඔවුන් දෙදෙනා තවත් මිනිත්තු කිහිපයක් ඉදිරියට හා පසුපසට දෝලනය වී, පසුව කඹය ළංකළ විට බිමට බසිති. ඒ හුස්ම තදකර ගෙන, භයෙන් භ්‍රාන්තව, නිහඬව බලාසිටි ප්‍රේක්ෂකයන්ගේ ප්‍රීති ඝෝෂා මධ්‍යයේ බැව් අමුතුවෙන් කීම අනවශ්‍යය. සර්කස් සංදර්ශනවලදී අපට දක්නට ලැබෙන ඉතාමත් අලංකාර, එමෙන්ම භයානක ගුවන් කරණම් ක්‍රීඩාව එයයි. ඔබද එය නොයෙක් වර දැක ඇතුවා නිසැකය.

නමුත් එදා සිදුවූයේ කුමක්ද? එය නම් කාගේත් සිත් කම්පාවට හා භීතියට පත්කරන භයානක සිදුවීමකි. සංගීත වාදනය තීව්‍ර වෙද්දී වේගයෙන් ඉදිරියට දෝලනය වූ ඇන්ජි, ගුවන් කරණමක් ගසා විදුලි වේගයෙන් නීනාගේ දෑත් දෙසට පැන්නාය. අවාසනාවක මහත! ඇන්ජිගේ දෑත් නීනාගේ දෑත් වලට හසු නොවිණි. ඇන්ජි එක අතකින් වත් අල්ලා ගැනීමට නීනාට නොහැකි විය. ඇන්ජි අඩි හතළිහක් පහළ මහ පොළොවට ඇද වැටුණාය! මුළු සංදර්ශන ශාලාවේම ජනයා මොහොතකට නිහඬ වූයේ කම්පනයෙනි; දුටු දර්ශනය අදහා ගැනීමට නොහැකිව භීතියෙනි.

මහ හඬක් නංවමින් නළඟන බිම ඇද වැටුණු තැන ලේ විලක් මතු විය. ඉන් අනතුරුව සිව් දෙසින් ඇසුණේ විලාප හඬකි; ඒ සමගම ශෝකයට හා භීතියට පත් ජනයා, මර ළතෝනි නැගීමට හා කෑකෝ ගැසීමට පටන් ගත්හ. කණ්ඩායමේ සේවකයෝ වහා ක්‍රියාත්මක වී ඇය ලෑල්ලක් මත තබා, වේගයෙන් ආරෝග්‍ය ශාලාව වෙත ගෙන ගියහ. එහෙත්........ හිසට සිදුවූ බරපතළ තුවාල වලින් ඇය ඒ වනවිටත් ජීවිතක්ෂයට පත්ව සිටියාය.

පුවත්පත් වලින් අපට දැනගන්නට ලැබුණු තොරතුර එයයි. මියගිය තරුණිය වෙනුවෙන් ශෝකය පළ කිරීම සඳහා, එක් දිනයක ශෝක කාලයක් පැවැත්වෙන බැව් නිවේදනය කෙරිණි. සියලුම සංදර්ශන හා සංගීත ප්‍රසංග එම දිනයේ නොපැවැත්විණි. අනතුර සිදුවූ කිව් ප්‍රදේශයේ පමණක් නොව අනෙක් ප්‍රදේශවල ද, කළු කොඩි ඔසවා තිබෙනු දක්නට ලැබිණ.

ඇන්ජි හෙවත් ඇන්ජෙලා ඩැනියෙල් මෙනෙවියගේ ඛේදජනක මරණය ගැන තොරතුරු දින කිහිපයක් යනතුරු පුවත්පත්වල





පළවිණි. එහෙත් අප මවිතයට පත්කළ පුවතක් මුලින්ම දක්නට ලැබුණේ. "ඩේලි මේල්" පුවත්පතේය.

**"සර්කස් නළඟනගේ ඛේදජනක මරණය සම්බන්ධයෙන් නීනා විටෝරියා හිරභාරයට!**

**ජුපිටර් සර්කස් කණ්ඩායමේ නළඟනක වූ ඇන්ජෙලා ඩැනියෙල් හදිසි අනතුරකින් ජීවිතක්ෂයට පත්වූයේ මීට දින කිහිපයකට පෙරය. බැලූ බැල්මට පෙනුණේ මෙය හදිසි අතපසුවීමක් නැතහොත් එක් මොහොතක ප්‍රමාදයක් නිසා සිදුවූ අනතුරක් ලෙසය. කෙසේ වෙතත් ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක ජී. ලෙස්ට්‍රේඩ් මහතා මේ ගැන දිගින් දිගටම පරීක්ෂණවල යෙදුණේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පරීක්ෂණය සම්පූර්ණයෙන්ම වෙනස් මඟකට හැරී ඇති බැව් අසන්නට ලැබේ. මහේස්ත්‍රාත්වරයකු මාර්ගයෙන් ලබාගත් විශේෂ නියෝගයකින්, අනෙක් නළඟන වූ නීනා විටෝරියා සිරභාරයට ගන්නා ලද්දේ මීට මිනිත්තු කිහිපයකට පෙරය. ඒ පිළිබඳ තොරතුරු කිසිවක් හෙළි කිරීම පොලීසිය ප්‍රතික්ෂේප කළේය. මෙම අභිරහස ගැන සියලු තොරතුරු අද හෙටම ඔබ වෙත ගෙන ඒමට "ඩේලි මේල්" පුවත්පත අපේක්ෂා කරයි."**

"මොකක්ද වොට්සන් මේකෙන් ඔබ තේරුම් ගත්තෙ?" හෝම්ස් විමසුවේ එදින උදෑසන අප පුවත්පත් කියවමින් සිටින අතරතුරය.

"මට නම් හිතුණේ මෙහෙමයි හෝම්ස්" මම කීවෙමි. "ඇන්ජෙලා තමන්ගේ ඔංචිල්ලාව අත් හැරලා ඒකෙන් අහසට පනිනවා. ගුවනේ කරණමකුත් ගහනවා. ඊළඟට අනෙක් ඔංචිල්ලාවේ ඔළුව පහළට ඉන්න නීනා ඇගේ අත් දෙකෙන් ඇන්ජෙලාගේ දෑත් අල්ලා ගන්නවා. මේ දෙක අතර තියෙන්නේ එක් තත්පරයක හෝ දෙකක කාලයක්. දෙන්නාම වේගයෙන් චලනය වෙමින් ඉන්නේ. එක්කෙනෙකුට අනෙකාගේ දෑත් හරිහැටි ග්‍රහණය කරගන්න බැරිවීමට ඇති ප්‍රවණතාවය හොඳටම වැඩියි. එහෙම වුණාම අනතුරක් සිදුවීමේ පුදුමයක් නෑ."

"ඔබේ මතයට මාත් එකඟ වෙනවා වොට්සන්. නමුත් විටෝරියාට එරෙහිව මොනවා හරි පිළිගත හැකි සාක්ෂි ඇති. එහෙම නොවී

ලෙස්ට්‍රේඩ් මේ වගේ පියවරක් ගන්න එකක් නෑ. උදේ දහයමාර වෙන්න කලින් ඔහු මා සොයාගෙන එන්න ඉඩ තියෙනවා. එහෙම ආවෙ නැතොත් අපි ඔහුව හොයාගෙන යමු"

මගේ මිත්‍රයා අනුමාන කළ අයුරින්ම තවත් පැයක් ගතවීමට පෙර ලෙස්ට්‍රේඩ් බේකර් වීදියේ අපේ නිවහනට පැමිණියේය.

"ලෙස්ට්‍රේඩ්. ඔබ මෙහේ එන්න ඉඩ තියෙනවා කියල මං දොස්තර මහත්මයාට කිය කියා හිටියෙ. මොකක්ද ඔබට මේ සැරේ ඇතිවුණු ප්‍රශ්නය?"

"හෝම්ස් මහත්මයා. ඔබ මට හැමදාමත් කියනව වගේ ප්‍රශ්නයේ මතුපිට ගැන නොබලා මං ඇතුළට හොයා බැලුවා. මොනම ආකාරයකින්වත් නොහිතු විදියෙ දේවල් තමයි මට දකින්න ලැබුණේ. ඒ නිසා ගැටලුව විසඳන්න පටන්ගන්න ඕන කොතැනින්ද කියලත් මට හිතාගන්න අමාරුයි."

"එතකොට ඔබ මගෙන් ඉල්ලා හිටින්නෙ මොන වගේ උපකාරයක්ද?"

"මේ ගැටලුව විසඳීමේ ගෞරවයක් මට උවමනා නැහැ හෝම්ස් මහත්මයා. මං ඔබට කියන්නේ මේ අවුල ලිහීම ඔබම භාරගන්න කියලයි. මිනීමැරීමේ චෝදනාව උඩ විටෝරියා දැන් ඉන්නේ රක්ෂිත බන්ධනාගාරයේ. ඇයගේ කතන්දරයට කන්දීලා සුදුසු පියවරක් ගන්න කියල මං ඔබෙන් ඉල්ලා හිටිනවා"

මිනීමැරීමේ චෝදනාව මත රක්ෂිත බන්ධනාගාරගතව සිටි නීනා විටෝරියා කිසිවෙකු හමුවීම ප්‍රතික්ෂේප කර තිබිණි. තමා අපරාධයක් කර ඇත්නම්, උසාවිය ඒ සඳහා දෙන දඬුවම පිළිගැනීමට තමා සූදානම් බැව් ඇය පවසා ඇත. නීතිඥයෙකු ගේ පිළිසරණ පැතීමට ද ඇයට උවමනාවක් නොවීය. කෙසේ වෙතත් දුප්පතුන් සඳහා වුවද නීතිඥ සහය ලබාදීම රජයේ පිළිවෙත බැවින්, තරුණ නීතිඥයෙකු ඇය වෙත අනුයුක්ත කෙරෙන බැව් අපට අසන්නට ලැබිණ.

"ඇගේ මරණය වෙනුවෙන් මං වගකිව යුතුයි කියලද ඔහේල කියන්නෙ?" ඇය විමසුවේ අප ඇයගෙන් කරුණු විමසීමට සූදානම් බව ඇයට අසන්නට ලැබුණු විටයි. "එහෙම නම් මට දෙන දඬුවමක් මං භාරගන්නම්. ඕක ගැන තවදුරටත් කතා කිරීමෙන් වැඩක් නෑ. දැන් ඔතන බලාගෙන ඉඳීමෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද? කරුණාකරල මට නිදහසේ ඉන්න ඉඩදීල යන්න"





එතැනින් පිටව ඒම හැර අපට වෙනත් විකල්පයක් නොතිබිණි. ඇය වෙනුවෙන් අනුයුක්ත කොට තිබූ නීතිඥයා එතැනට පැමිණීමට නියමිතව තිබුණේ එදා අපර භාගයේදීය. එවිටවත් ඇගේ දරදඬු පිළිවෙත වෙනස් වෙතැයි අපි බලාපොරොත්තු වූයෙමු.

විශ්වාස කටයුතු මාර්ගවලින් ලෙස්ට්‍රේඩ්ට යම් යම් ආරංචි දැනගන්නට ලැබී තිබිණි. ඔහු සූදානම් වූයේ ඒවා අප සමග පැවසීමටයි. එහෙත් ඒවාට සවන්දීම හෝම්ස් ප්‍රතික්ෂේප කරද්දී මම අතිශයින්ම පුදුමයට පත්වීමි. ඔහු කීවේ සියල්ල ඇගේ මුවින්ම අසා ගැනීමට තමාට අවශ්‍ය බවයි. ලෙස්ට්‍රේඩ්ට කීමට ඇති දේට තමා ඉන්පසු කන්දෙන බැව් මගේ මිත්‍රයා කීය.

"මට උවමනා කරන්නේ මේ සම්බන්ධයෙන් මගේ මනස විවෘතව තබාගන්න" හෝම්ස් කීය. "ලෙස්ට්‍රේඩ්ට අහන්න ලැබිල තියෙන සමහර දේවල් බොරු ඕපාදූප වෙන්න පුළුවනි. තවත් සමහර දේවල් කවුරුන් හෝ ගෙතූ ප්‍රබන්ධ වෙන්න පුළුවනි. මගේ මනස දැන් ඉතාම පිරිසිදු ජලය ඇති විලක් වගේ. මේකට මඩවතුර ගලා ආවොත්, මුළු විලම අපවිත්‍ර වෙනවා. කිසිම කාරණයක් පැහැදිලිව තෝරා බේරාගන්න හැකිවෙන්නෙ නෑ. තවත් දවස් කීපයක් ගතවුණාට කමක් නෑ. තමන්ගේ හිතේ තියෙන කම්පාව හා කැලඹිලි ගතිය නැතිවෙද්දී, ඇගේ ස්වභාවය වෙනස් වෙන්න පුළුවනි. ඒ නිසා මං කැමතියි මං කවුද කියන එක, ඇගේ නීතිඥයා මාර්ගයෙන් විටෝරියාට දැනුම් දෙන්න. අපරාධ කාරයෙකුට දඬුවම් පැමිණවීම වගේම අහිංසකයෙකු බේරාගැනීමත් මගේ වගකීමක්."

විටෝරියා මෙනෙවිය වෙනුවෙන් රජයෙන් අනුයුක්ත කොට තිබුණේ ජේම්ස් එල්ස්බරි නම් තරුණ නීතිඥවරයෙකි. ඔහු හමුවීමට ගිය හෝම්ස්, තම අරමුණ ගැන ඇය දැනුම්වත් කරන මෙන් නීතිඥයාගෙන් ඉල්ලා සිටියේය.

එදා රාත්‍රියේ නීතිඥ එල්ස්බරි අප හමුවීමට පැමිණියේ ඇයගේ පණිවුඩයක්ද රැගෙනය.

"හෝම්ස් මහත්මයා" එල්ස්බරි කීය. "ඔබ ගැන කිසිම දෙයක් ඇය දැන හිටියෙ නෑ. ඇය හිතාගෙන හිටියේ ඔබත් ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ නියෝජිතයෙකු කියලයි. මේ ගැන අපක්ෂපාතීව ඇයට කන්දෙන්න ඔබ කැමතියි කියල මං ඇයට කිව්වා. ඇයට කියන්න තියෙන හැම දෙයක්ම හෙට උදේ ඔබට කියන්නම් කිව්වා."

දැන් මා ඔබ ඉදිරියේ තබන්නේ ඇයගෙන් අපට අසන්නට ලැබුණු කථාන්තරයයි.

"මගේ නම නීනා විටෝරියා. අපි ඉතාලියට අයත් සිසිලි දූපතේ පිරැන්ඩෙලෝ පරපුරෙන් පැවත එන අය. ක්‍රයිමියන් යුද්ධයේ අවසන් කාලයේ මගේ දෙමව්පියන් ඉතාලියේ සිට එංගලන්තයට සංක්‍රමණය වෙලා මෙහේ පදිංචි වුණා. අපේ නෑදැයින් හුඟ දෙනෙකුත් ඒ වෙනකොට මෙහේ පදිංචියට ඇවිත්. මං උපන්නෙත් එංගලන්තයේදි.

අවුරුදු අට නවය කාලෙදිම දෙමව්පියන් මාව සර්කස් කණ්ඩායමකට බාරදුන්නා. ඒකට හේතුව හරි රක්ෂාවක් නොතිබුණු මගේ පියාට ළමයි දහදෙනෙකුට කන්න දෙන්න හැකියාවක් නොතිබීම. මගේ පියාගේ ඥාතීන්ගේ ළමයින් අවුරුදු හත-අට වයසෙදී සර්කස් හා නැටුම් කණ්ඩායම් වලට භාරදීල තිබුණා.

සර්කස් නළඟනක විදියට ඉහළට එන්න මට හුඟක් දුක්විඳින්න සිදුවුණා. අප යෙදුණු ක්‍රීඩාවල හැටියට අපි බොහොම සිහින්ව නිරෝගීව ඉන්න සිදුවුණා. ඒ නිසා ආශාව තිබුණත් අපට කැමති කැමති කෑම වර්ග කන්න අවසර ලැබුණේ නෑ.

උඩු ගුවනේ කරණම් ගසමින් ඔංචිල්ලාවේ පිම් පනින ක්‍රීඩාව සඳහා මාව තෝරා ගැනුණේ, මීට අවුරුදු තුනකට විතර කලින්. මගේ උනන්දුවත් කැපවීමත් නිසා ඉක්මනින්ම ගුවන් කරණම් කණ්ඩායමේ මාව ස්ථිර වුණා. ඔය අතරෙදි තමයි මා එක්ක හවුලේ කරණම් කළ මාග්‍රට් නම් තරුණිය අපේ කණ්ඩායමෙන් අස්වෙලා ගියේ. ඒ වෙනුවට කෙනෙකු සොයාගත යුතුව තිබුණා.

මේ අතරේ එක් කාරණයක් ඔබට කියන්න මට අමතක වුණා. ඒ තමයි මේ සර්කස් කණ්ඩායමේම කෙනෙකු සමග මගේ ඇතිවුණු ප්‍රේම සම්බන්ධය. ඔහු තමයි ගුවන් කරණම් පුහුණුකරුවා වුණු හැරී නෙල්සන්. ඉතා කඩවසම් පුද්ගලයකු වුණු හැරී අවුරුදු 27 ක තරුණයෙක්. ඔහුගේ සිත ගියේ මට. මගේ සිත ගියේ ඔහුට. මේ ගැන මගේ දෙමව්පියන්ටත් මං කිව්වා. හැරීගේ ප්‍රිය මනාප බව ගැනත් ආචාරශීලී බව ගැනත් මගේ දෙමව්පියන් පැහැදුණා. අපේ විවාහයට මගේ දෙමව්පියන්ගේ අනුමැතියත් ලැබුණා. සර්කස් කණ්ඩායම් වල කෙල්ලන්ගේ ජීවිත බොහොම නිදහස් කියලා ඔබට හිතෙනවා ඇති. නමුත් ඇත්ත එය නොවෙයි. ඉතාලියෙන් සංක්‍රමණය වුණු පවුල්වල දිගටම, ඉතාලි සංස්කෘතිය ක්‍රියාත්මක





වුණා. විවාහ කටයුතුවලට දෙමව්පියන්ගේ අනුමැතිය ලබාගත යුතුව තිබුණා. නමුත් මගේ ලොකු අක්කා සොෆියා විවාහ වුණේ ඇගේ තනි කැමැත්තට. ඒ ඇයට අවුරුදු 16 ක් වෙද්දී. ඇගේ සැමියා වුණේ ලන්ඩන් වරායේ සේවය කළ ජෙරෙමි නම් සැර පරුෂ කෙනෙක්. ඔහුගේ ඒ ස්වභාවය නිසාම මගේ අක්කා අප්‍රමාණ විදියට දුක් වින්දා. කුඩා දරුවන් දෙදෙනෙකු ලැබුණාට පසු ඇයට අකාලයේ මියයන්න සිදුවුණෙත් ඇගේ සැමියා ජෙරෙමිගේ නපුරු ස්වභාවය නිසාමයි. ඊට පස්සේ ඒ ළමයි දෙන්නා හදා වඩා ගැනීමත් භාරවුණේ මගේ දෙමව්පියන්ටයි.

මං ඔබට කලින් කියමින් සිටියේ අපේ කණ්ඩායමේ ක්‍රීඩිකාවක වුණු මාග්‍රට් ඉවත්ව යෑම ගැන. මෙහෙම වෙලාවට සර්කස් ක්‍රීඩිකාවක ලෙස වැඩි පඩියට බඳවා ගන්නේ, තවත් සර්කස් කණ්ඩායමක මෙම ගුවන් ඔංචිල්ලාවම කරන ක්‍රීඩිකාවක්. එහෙම කෙනෙකු ගැන මං දන්නවාද කියලා අපේ සර්කස් කණ්ඩායමේ කළමනාකරු මගෙන් ඇහුවා. මගේ පියාගේ ඥාති සොහොයුරියකගේ දියණියක වන ඇන්ජලා (ඇන්ජි) ඩැනියෙල් අපේ සර්කස් කණ්ඩායමට බැඳුණේ එහෙමයි. ඇය කලින් රැකියාව කළේ මිනර්වා සර්කස් කණ්ඩායමේ.

මට වඩා අවුරුද්දකින් වයසින් බාල ඇයට තිබුණේ මං වගේම පෙනුමක්. ඇත්තෙන්ම ඇය මට වඩා ලස්සනයි. මං වගේ ලැජ්ජාශීලී කෙනෙකු නෙමෙයි. ඉස්සරහට ගිහින් කතාබහ කරලා ඕනම කෙනෙකු එක්ක යාළුවෙනවා. අනුන්ගේ හිත් ඇදගන්නා විදියට කතා කරන්න දක්ෂයි. ඇවිත් ටික දවසකින් මුළු සර්කස් කණ්ඩායමේම අය අතර, ඇය ජනප්‍රියම චරිතයක් බවට පත්වුණා. සර්කස් සංදර්ශනවලදී වැඩිපුරම ප්‍රීති ඝෝෂා හා අත් පොළසන් නාදය හිමිවුණේ ඇයට. මෙම භයානක ක්‍රීඩාව අවසන් කොට බිමට බැස්ස වහාම, සෙනඟ ඇවිත් අපව වට කරගන්නවා. ඔවුන් ගෙන එන නොයෙක් තෑගි බෝග, මුදල් අපට දෙනවා. ඔවුන්ගේ ආදරය ප්‍රකාශ කර තරුණයන් අපට දෙන ලියුම් අප්‍රමාණයි. සංදර්ශනය අවසන් වී ගියත් ඔවුන් එවන කෑමබීම, රසකැවිලි පාර්සල්, අපේ නම් ලියා කාර්යාලයට එවනවා.

මේ හැම දෙයක්ම ඉස්සර එක සමානව ලැබුණේ මට සහ මාග්‍රට්ටයි. ඇය තමයි අස්වෙලා ගියේ. ඒ දවස්වල එක් ඔංචිල්ලාවකින් අනෙකට පනිමින් ගුවන් කරණම ගැහීමේ භයානක

කටයුත්ත, මා සහ මාග්‍රට් කළේ මාරුවෙන් මාරුවට. ඒ නිසා අප දෙදෙනාට තිබුණේ එක සමාජ ජනප්‍රියත්වයක්. ඇගැයීම්, තෑගිබෝග ප්‍රේක්ෂක ඔල්වරසන්, හැමදෙයක්ම අපට ලැබුණේ එක සමානව.

නමුත් ඇන්ජීගේ පැමිණීමත් එක්ක මේ හැම දෙයක්ම ඉතාමත් ඉක්මනින් වෙනස්වුණා. මේ හැම දෙයක්ම ඇය දිනාගත්ත එකට, මගේ හිතේ ලොකු ඊර්ෂ්‍යාවක් තරහක් ඇතිවෙන්න ඇති කියල ඔබ හිතාවි. නැහැ මහත්වරුනි. වෙලාවකට මගේ හිතේ පුංචි දුකක් ඇතිවුණත්, ඒ දේවල් අහිමිවීම මට ලොකු ප්‍රශ්නයක් වුණේ නෑ. නමුත් ජීවිතයේ මට තිබූ ලොකුම දේත් ඇය පැහැර ගත්තාම මං කොහොමද ඉවසන්නේ?"

මොහොතකට කථාව නැවැත්වූ නීනා වරක් දෙවරක් ඉකිබිඳ දෙනෙත් වලින් කඩා හැළුණු කඳුළු පිස දැම්මාය. ඇය කථාව යළිත් ඇරඹුවේ මිනිත්තු කිහිපයකට පසුවය.

"මං හැරී සමග විවාහ ගිවිසගෙන සිටි බව ඇයට අහන්න ලැබෙන්නත් ඇති. මගේ හදවතේ ඔහු කෙරෙහි තිබුණු ආදරය මගේ හැසිරීම් වලින් ඇය තේරුම් ගන්න ඇති. නමුත් ඇන්ජී ඒ ගැන තැකීමක් කළේ නෑ. ඔහු අයිති මට බව මං ඇයට කියන්න උත්සාහ කළේ නෑ. ඇය ඔහු සමග විහිළු කළේ කිසිම ගණනකට නැතුව. ප්‍රේක්ෂකයන්ගෙන් ඇයට ලැබුණු ප්‍රතිචාර ගැන ඇය ඔහු සමග කතාබස් කළේ, මහ හඬින් සිනාවෙමින් මා ඉදිරියේම.

මීළඟට ඔහුගේ ස්වභාවයත් ක්‍රම ක්‍රමයෙන් වෙනස් වී ගෙන යන බව මට පෙනුණා. ඉතින් මං තීරණයක් ගත්තා. ඒ මේ දෙදෙනාම අත්හැර සර්කස් කණ්ඩායමෙන් ඉවත් වෙන්න. ගුවන් කරණම් කරන ක්‍රීඩිකාවන්ට සර්කස් කණ්ඩායම් වලින් ලොකු ඉල්ලුමක් තිබුණා. ඒ නිසා මට තවත් තැනක රැකියාවක් ලබා ගැනීම අපහසු නොවෙන බව මං දැන හිටියා.

තව සතියකින් වසර අවසානයේ, සර්කස් සංදර්ශන වල මේ වටය අවසන් වීමට නියමිතව තිබුණා. එහෙම වුණාම අපට සති දෙකක නිවාඩුවක් ලැබෙනවා. අසනීපයක් නොවුණොත් ඒ නිවාඩුව අවසන් වුණාම කවුරුත් රැකියාවට එනවා. නමුත් මං මගේ තීරණය අරගෙන අවසන්. ඇංජීටවත් හැරීටවත් කිසි දෙයක් නොකියා මෙතැන රැකියාවෙන් ඉවත්වී යාමයි කළ යුත්තේ කියල මං කල්පනා කළා. මගේ අස්වීම ගැන මං අපේ කළමනාකරුට දැනුම් දුන්නා. එයින් ඔහු පත්වුණේ අප්‍රමාණ කැලඹීමකට. මාග්‍රට්





අස්වී ගිහින් ගතවුණේ කෙටි කාලයයි. මගේ වැටුප් වැඩිකරන බවට ඔහු සහතික වුණා. නමුත් මං මේ රැකියාවෙන් ඉවත් වී යන්නේ මට වැටුප් මදිවීම නිසා නොවෙන බව මං කළමනාකරුට කිව්වා. මං අස්වීමට හේතුව ඔහු අනුමාන කරන්න ඇති. මං හැරී සමග විවාහ ගිවිසගෙන සිටි බව රහසක් නෙමෙයි. ඒක කවුරුත් දැන හිටියා. දැන් අලුතෙන් කාරණා සිද්ධ වෙන ආකාරයත් ඔවුනට ආරංචි ඇති. හැමදෙයක්ම ඔවුනට දකින්න ලැබෙන්න ඇති. ඒ නිසා මගේ අස්වීමට හේතුව කළමනාකරු වටහා ගන්න ඇති.

උත්සව සතිය නිසා දිනකට පැවැත්වෙන දර්ශන වාර ගණන වැඩියි. වෙනදා එක දවසකටම පැවැත්වෙන්නේ දර්ශන වාර දෙකයි. ඒ සවස 2 ට සහ හැන්දෑවේ 7 ට. නමුත් මේ කාලයේ උදේ 9 ටත් අමතර දර්ශනයක් පැවැත්වුණා. එහෙම වුණාම අපට තදබල මහන්සියක් දැනෙනවා. හැන්දෑවේ හය පමණ වන විට ලොකු බඩගින්නක් දැනෙනවා. නමුත් බර ආහාරයක් ගැනීම අපට තහනම්. ඒ මොකද එයින් නිදිමතක් ඇතිවීමට තිබෙන ඉඩකඩ වැඩි නිසා. ඒ නීතිරීති වැඩියෙන්ම බලපාන්නේ ගුවන් කරණම් හා ඊට සමාන අවදානම් ක්‍රීඩාවල යෙදෙන අයට. ලොකු බඩගින්නක් තියාගෙන මේ ක්‍රීඩාවල යෙදෙන එකත් අවදානම් කටයුත්තක්. ඒ නිසා අපි ගන්නේ කෙටි ආහාර සහ පැණිරස කේක්, චොකලට් වැනි දේ පමණයි. මත්වීමට ඉඩ ඇති නිසා බීර වැනි පානයක එක උගුරක්වත් බොන්නේ නෑ.

එක දවසට සංදර්ශන වාර තුනක් පැවැත්වෙන විට අපි අධික විඩාවකට පත්වෙන බව කළමනාකාරිත්වය හොඳින් දන්නවා. ඒ නිසා ඔවුන් අපේ ආරක්ෂාවට තවත් පියවරක් ගෙන තිබුණා. ඒ තමයි මේ විදියට හුඟක් මහන්සි වෙන දවස් පිට පිටම දින තුනකට වඩා නොපැවැත්වීම. එවිට හතර වැනි දවසේ සර්කස් පවත්වන්නේ එක් දර්ශන වාරයක් පමණයි. ඉතිරි කොටස අප විවේක ගත යුතුයි. නමුත් මේ කියන හතරවැනි දවසේත් දර්ශන වාර තුනක් පවත්වන්න අපට සිදුවුණා. ඒකට හේතු වුණේ යුද්ධ හමුදාවේ කර්නල් හොලන්ඩ් කළ විශේෂ ඉල්ලීමක්. ඈත පෙරදිග සහ දකුණු අප්‍රිකාවේ සටන්වල යෙදීමට නියමිත බ්‍රිතාන්‍ය හමුදා අනුබණ්ඩ දෙකක් රටෙන් පිටත්වී යාමට නියමිතව තිබුණා. ඒ නිසයි ඔවුන් වෙනුවෙන් අමතර දර්ශන වාර දෙක පැවැත්වුණේ.

එදා හැන්දෑවේ හය වෙද්දී මං ආහාර ගන්න තීරණය කළා. ඒ අපට සපයන කෙටි ආහාර කිහිපයක් සහ රස කැවිලි. මට සහ ඇන්ජීට ප්‍රේක්ෂකයන් එවා තිබූ කේක් සහ රසකැවිලි වගයක්, අපේ විවේක කාමරයේ තබා තිබුණා. සිතේ තිබුණු නොසතුට නිසා මං කෙටි ආහාර ස්වල්පයක් ගත්තත්, රසකැවිලි වලින් කෑවේ කේක් කෑල්ලක් පමණයි. ඉන්පසු මං ගියේ අපව හැඩගන්වන අංශයට. මං එහි ඇතුළු වෙද්දී ඇන්ජී එතැනින් පිටවුණා. ඒ වෙනකොට ඇයව හැඩගන්වා අවසන්. මට "හලෝ" කියූ ඇය ගියේ කෑම ගැනීමට බව මං දැනගෙන හිටියා.

අපේ ක්‍රීඩා ඉසව් පටන්ගන්නේ, වනසතුන් සමග කරන ක්‍රීඩා සහ අශ්වරෝහක ක්‍රීඩා අවසන් වීමෙන් පසු. නමුත් අපි දිගටම ශරීරය උණුසුම් කරන ව්‍යායාම් වල යෙදිය යුතුයි. මං ව්‍යායාම් කරන අතරේ ඇන්ජීත් එතැනට ආවා. ඇය ආවේ කෝපි කෝප්පයක් අතින් ගෙන එය පානය කරමින්.

"නීනා මොහොතක් ඉන්න" ඇය කිව්වා.

"ඇයි?"

"මේ කාරණය ඔයාට කියන්න ඕන කියල මං හුඟක් දවස් ඉඳන් හිතාගෙන හිටියේ" ඇන්ජී කිව්වා. "ඒත් මට ඒකට වෙලාවක් නැතිවුණා. අපේ හැරී නෙල්සන් ගැන ඔයාගේ කැමැත්තක් තිබුණු බව මට අහන්න ලැබුණා. ඔහුගේ ආදරය ඔයාට නොලැබුණු එක ගැන මට කනගාටුයි. හැරීගේ ආදරය මට හිමිවුණා. එයා මාව බඳින්න කැමැත්ත පළකළා. අපට ලැබෙන සති දෙකේ නිවාඩුවෙදි අපි දෙන්නා විවාහ වෙනවා"

මෙහෙම කියූ ඇය මා දිහා බලාගෙන හිටියේ, එයට මා දෙන පිළිතුර මොකක්ද කියා වෙන්න ඇති. නමුත් මා මොනවා කියන්නද? එහෙම දෙයක් ළඟදීම සිදුවීමට ඉඩ ඇති බව මට දැනිලයි තිබුණේ. මා මෙතැනට කැඳවාගෙන ආ මගේ ඥාති සොහොයුරිය නිසා, අන්තිමට මං සම්පූර්ණයෙන්ම අනාථ වුණා. මගේ සිහින ලෝකය කැඩී ඉහිරී ගියා. තත්ත්වය එහෙම වුණත් නව පැය කාලකින් අපි දෙන්නා මහජනයා ඉදිරියට යා යුතු බව මට මතක් වුණා. මෙදින මට ගුවන් කරණම් සංදර්ශනයේ යෙදීමට සිදුවුණේ මගේ අනාගතය විනාශ කළ හැතිරිය සමග.

මගේ ශරීරය උණුසුම් කිරීමේ ව්‍යායාම් අවසන් කරලා, මා සිටිය යුතු තැනට මං නියම වෙලාවට ගියා. නමුත් ඇය ඒ නියම වෙලාවට





ආවේ නෑ. මං හිතන්නේ ඇය මිනිත්තු දෙකක් පමණ ප්‍රමාද වුණා. මං මගේ කඹය දිගේ ඉහළ නැගලා, මගේ ඔංචිල්ලාවේ හරස් ලීය මත වාඩිවී එය පදිද්දී තමා ඇය, ඇයගේ කඹයෙන් ඉහළට නැඟුණේ. ඉන්පසු ඇන්ජී ඇයගේ ඔංචිල්ලාවට නැගලා පදින්න පටන් ගත්තේ, මා දෙසට සිනාවක් පාලා. මෙතෙක් වෙලා මගේ සිතේ ඇය ගැන ඇතිවුණු ද්වේෂය මං මොහොතකට අමතක කළා. ඒ ගුවන් කරණම් ඇරඹීමට සූදානමෙන්.

මගේ ඔන්චිල්ලාව ඇන්ජී දෙසටත් ඇයගේ ඔංචිල්ලාව මගේ දෙසටත් හුඟක් ළංවෙන්නේ, අපි සම්පූර්ණ ශක්තිය යොදා එය දෝලනය කළොත් විතරයි. ඒක අපි හොඳින් දන්නා කරුණක්. නමුත් මේ කියන දවසේ ඇන්ජී ඇගේ ඔංචිල්ලාව හොඳට දෝලනය කළේ නැහැ කියලයි මට හිතුණේ: ඒ මට පෙනුණු හැටිද කියන්න මං දන්නෙ නෑ. කොහොම වුණත් ඇය ගුවනට කරණම් ගසන මොහොත ළංවුණා. ඒ සඳහා ඇය කළ සංඥාවත් මා දුටුවා.

ඊළඟට ඉදිරියට දෝලනය වූ ඇය, ඔංචිල්ලාව අත හැර ගුවන් කරණම ගැසුවා. නමුත් ඇය වෙනදා තරම් උඩ ගියේ නැහැ කියලයි මට ඒ වෙලාවේ හිතුණේ. ඒ නිසාම ඇයගේ දෑත් අල්ලා ගැනීමට මට තිබුණු කාලයත් අඩුවුණා. අනික ඇය මා දෙසට ගුවනේ පාවී ආවත්, ඇගේ දෑත් තිබුණේ වෙනදාට වඩා අඟල් ගණනක් ඈතින්.

මහත්වරුනි. ඇගේ දෑත් මට අහුවුණේ නැහැ. සත්‍යය එයයි. ඇය මරණයට පත්වුණේ ඒ නිසයි. එහෙම නැතුව සමහරු හිතන විදියට, සමහරු කියන විදියට, මං ඕනෑකමින්ම ඇය අල්ලා නොගත්තා නෙමෙයි. ඇයට එවැනි භයානක දඬුවමක් දෙන්න තරම් දරුණු හිතක් මට නෑ. මං මේ කියන්නේ ඇත්තක් බව දන්නේ දෙවියන් වහන්සේ විතරයි. මං මේ කාරණය කොයි තරම් කිව්වත්, අපේ කළමනාකරු මෙය විශ්වාස කරන්නේ නැහැ. සර්කස් කණ්ඩායමේ අනික් අයත් එහෙම වෙන්න ඇති. ඒ නිසයි ඔවුන් කවුරු හරි පොලීසියට පැමිණිලි කරලා තියෙන්නේ. "සිතා මතාම ඇය අල්ලා නොගෙන, ඇය මරණය කරා යන්නට ඉඩ හැරියා නේද?" මාව අත් අඩංගුවට ගත් ඉහළ පොලිස් නිලධරයා මගෙන් ඇහුවේ එහෙමයි. ඔහු හිතන්නෙත් ඒ විදියට. ඒ කියන්නේ මට කිසිම ගැලවීමක් නෑ. මං ඉන්නේ එල්ලුම් ගසට යන්න හිත හදාගෙන" කියූ නීනා විටෝරියා තම කථාව අවසන් කළාය.

"විටෝරියා මෙනෙවිය" හෝම්ස් කීය. "මේ දේවල් යළිත් කථා කිරීම ඔබේ සිතට වේදනාවක් බව මං දන්නවා. නමුත් මේ කරුණු මං හරිහැටි දැනගත යුතුයි. ඇය ඔබේ ග්‍රහණයට අසුනොවී අත්හැරුණා නේ. ඉන්පසුව ඔබ දුටු සිදුවීම් ටිකත් මට පිළිවෙළින් කියන්න"

"ඇගේ සිරුර සුළඟ කපාගෙන පොළොව දෙසට ගිය ශබ්දය මට ඇහුණා. ඒ සමගම එය පොළොවේ වැදෙද්දී නැඟුණු බියකරු හඬ සහ ඇගේ මුවින් නැඟුණු මර ළතෝනියත් මට ඇසුණා. ඒ වහාම රැස්ව සිටි ජනතාවගේ මුවෙන් නැඟුණු විලාප හඬ, සෝෂාව ඇසුණේ, කන් බිහිරි කරවන හඬින්. මට හිතුණේ මාව ක්ලාන්ත වුණා කියලයි. ඊළඟ මොහොතේ මං බිමට ඇද වැටුණේ නැතුව බේරුණේ අනූ නවයෙන්. මගේ මුළු සිරුරම වෙව්ලමින් තිබුණා. ඊළඟට බොහොම අමාරුවෙන් හරස් පයිප්පය දිගේ ඇවිද ගිහින් කඹයේ එල්ලී මං බිමට බැස්සා. සෙනඟ අතරේ සිටි මහත්මයෙක් හෝ දෙදෙනෙක් වහාම ඇය වෙත දුව ආ හැටි මං දුටුවා. ඒ වෛද්‍යවරුන් වෙන්න ඇති. ඊළඟට මම දෑත්වලින් මුහුණ වසා ගත්තා. ක්ලාන්ත ගතියෙන් මා එතනම බිම ඇද වැටෙන්න තිබුණා. නමුත් රොඩ්නි පැමිණ මා අපේ විවේකාගාරයට කැඳවාගෙන ගියා."

"රොඩ්නි කියන්නේ ඔබ සමග එකට සර්කස් වල යෙදෙන්නෙක්ද?"

"නැහැ මහත්මයා. ඔහු සර්කස් සංදර්ශන පවත්වාගෙන යෑමට සහය වන කෙනෙක්. ඔහු කළමනාකරුගේ සහකාරයෙක්."

සියල්ල සිදුවූ ආකාරය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ඇගේ කථාවෙන් මැවිණි. මෙතැන හෝම්ස්ට මැදිහත්වීමට කිසිදු අවකාශයක් ඇතිදැයි මම කල්පනා කළෙමි. මගේ මිත්‍රයාට ද එය අවබෝධ වන්නට ඇතැයි මට සිතුණේ ඔහු නිහඬව සිටි ආකාරය නිසයි.

"හොඳයි විටෝරියා මෙනෙවිය. මා ගැන විශ්වාසය තබා ඔබට කියන්න තිබූ හැම දෙයක්ම මට කීම ගැන මං ඔබට ස්තුතිවන්ත වෙනවා. මේ ගැන කළ යුතු විමසීම් වහාම ඇරඹීමට මං බලාපොරොත්තු වෙනවා. වැඩිදුර තොරතුරු විමසීමක් අවශ්‍ය වුණොත් මං එන්නම් ඔබ හමුවෙන්න"

ඇයගෙන් සමුගෙන අපි එතැනින් පිටවී ආවෙමු. බේකර් වීදිය බලා ඒමට කුලීරියකට නැඟුණත්, මගේ මිත්‍රයාගේ තිබුණේ දැඩි





නිශ්ශබ්දතාවයකි. බේකර් වීදියේ අපේ නිවහනට පැමිණ, තම කාමරයට ගොස් ඇඳුම් මාරු කරගත්තද, හෝම්ස්ගේ නිහඬ කල්පනාකාරී බව එලෙසම පැවතිණ. අඩ සිහියෙන් මෙන් තම පයිප්පය දල්වාගත් ඔහු කල්පනාවට වැටුණේ, මා හා එක් වචනයක් වත් කථා කිරීමට ප්‍රමාද නොවෙමිනි.

මගේ මිත්‍රයා එදා හවස් වරුව ගත කළේද මෙම ගැටලුව විසඳීමට උත්සාහ දරමිනි. මා සමග කතාබහ කිරීමටද ඔහු නැඹුරුවන අයුරක් මම නුදුටුවෙමි. එබැවින් හැන්දෑවේ ඇවිදින්නට යාමට මම තීරණය කළෙමි. මා ගමන් කළේ රීජන්ට් උද්‍යානය දෙසටය.

සැන්දෑවේ මා ආපසු ඒමට සූදානම් වනවිට පොද වැස්සක් ඇද හැළෙන්නට පටන් ගත්තේය. කුලීරියකින් ආපසු ඒමට මම තීරණය කළෙමි. මගේ මිත්‍රයා තවමත් මේ ගැටලුව තුළ එරී ඇද්දැයි මම යළිත් කල්පනා කිරීමට පටන් ගත්තෙමි.

"ආ වොට්සන් ඔබ ආවද?" හෝම්ස් විමසුවේ විසිත්ත කාමරයේ දොර විවෘත කරමිනි.

"මේ නළඟනගේ ගැටලුව විසඳගන්න ඔබට හැකිවුණාද?"

"ඒක විසඳීම අපි හිතන තරම් ලේසි වෙන්නෙ නෑ වොට්සන්." හෝම්ස් කීවේ යළිත් වරක් තම පයිප්පය දල්වා ගනිමිනි.

"හෝම්ස් ඔබ හිතන්නේ ඇයට විරුද්ධව තිබෙන චෝදනාවෙන් විටෝරියා නිර්දෝෂයි කියලද?"

"මෙහෙමයි. ඔවුන් කියන්නේ ඇන්ජෙලාට මියයෑමට සිදුවුණේ විටෝරියා සිතා මතා ඇන්ජෙලාව අල්ලාගත්තෙ නැති නිසා කියලනෙ"

"ඉතින්?"

"සිතා මතා අල්ලාගත්තෙ නැද්ද, එහෙමත් නැත්නං විටෝරියා කියන විදියට, ඇගේ දෑත් ළඟට ඇන්ජෙලා ආවෙ නැද්ද කියන කරුණ, හරියටම දන්නෙ දෙවියන් විතරයි."

"ඉතින් ඔබ මොකක්ද තීරණය කළේ?"

"ගැටලුව ලිහීමට උත්සාහ කිරීම අනෙක් කෙළවරෙන් පටන් ගන්නයි මම හිතුවෙ"

"ඒ කියන්නෙ?"

"ඇන්ජෙලාගෙ මරණය පැත්තෙන්. මං හෙට උදේ ස්කොට්ලන්ඩ්යාඩ් එකට යනවා, තව මොනවද කරන්න පුළුවන් කියල හොයල බලන්න"

අපේ සංවාදය එතැනින් අවසන් විය. හෝම්ස් තම කාලය මේ අයුරින් නාස්ති කරන්නේ නිෂ්ඵල කටයුත්තක් සඳහා යයි මට සිතිණ. මෙම මරණය සිදුවූයේ දහස් ගණනක සෙනගක් ඉදිරිපිටය. සර්කස් කණ්ඩායමේ කළමනාකරු සහ එහි කාර්ය මණ්ඩලයේ අයද, වෛද්‍යවරුන්, පොලිස් නිලධරයන් ආදී සියලු දෙනාද, ඇන්ජෙලාගේ පෙම්වතා වූ හැරී නෙල්සන් ද සාක්ෂි දී අවසන්ය. ඇන්ජෙලාගේ මරණයට හේතුව, හිස්කබල පුපුරා යාමෙන් මොළ යට සිදුවූ ලේ ගැලීමත්, ඉළ ඇට බිඳී යාමෙන් හෘදය වස්තුවට හා පෙණහැල්ලට සිදුවූ බරපතළ තුවාලත් බව, පොලිස් ශල්‍ය වෛද්‍යවරයා තම වාර්තාවෙන් පවසා තිබිණ. මගේ මිත්‍රයාට තවත් කිරීමට ඉතිරිව ඇත්තේ කුමක්ද?

උදේ දහයමාර වෙද්දී ඔහු ආපසු නිවසට පැමිණියේ කලබලයෙනි.

"ඇන්ජෙලා ඩැනියෙල්ගේ මෘත ශරීරය යළිත් ගොඩ ගන්න මම තීරණය කළා වොට්සන්"

"යළි ගොඩගන්න?"

"ඔව්. පශ්චාත් මරණ පරීක්ෂණය අසම්පූර්ණයි කියලයි මට හිතෙන්නෙ. මේ කටයුත්තට අධිකරණයෙන් විශේෂ අවසරයක් ලබාගත යුතුයිනේ. ස්කොට්ලන්ඩ්යාඩ් එක මාර්ගයෙන් ඒ අයැදීම කළා. අපට දහවල් දෙකට පමණ පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන්න හැකිවේවි"

පශ්චාත් මරණ පරීක්ෂණය දෙවැනි වරට පවත්වන ලද්දේ, සාන්ත බාතොලමිව් රෝහලේ මහාචාර්යවරයෙකුගේ ප්‍රධානත්වයෙනි. ඒ ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය තෝමස් ස්ටීවන්ස්ය. මීට අවුරුදු හත අටකට පෙර හෝම්ස් යෙදුණු තවත් පරීක්ෂණයකටද ස්ටීවන්ස්ගේ සහාය ලැබුණු බැව් මට සිහිවිණි. විෂ ද්‍රව්‍ය පිළිබඳ විශේෂඥයකු වූ ඔහු, එකල රජයේ විෂ විශ්ලේෂක ලෙස සේවය කළේය.

හෝම්ස් හා ස්ටීවන්ස් ඔවුන්ගේ අවධානය යොමු කළේ මරණයට හේතුව සොයා ගැනීමට නොවේ. ඔවුහු මෘත ශරීරයේ අක්මාව, වකුගඩු, කැටි ගැසී තිබූ රුධිරය හා පිත ඉවත් කරගත්හ.

"හෝම්ස් ඔබ හිතන්නේ කවුරු හරි ඇයට විෂ දුන්නා කියලද?" මම ඇසීමි.





"මට ඒ ගැන මොකුත්ම කියන්න බැ මිත්‍රයා" හෝම්ස් කීය. "මේක මගේ හිතේ ඇතිවුණු එක් සැකසහිත කාරණයක් පමණයි. ස්ටීවන්ස් මහත්මයා මේ ඓන්ද්‍රිය ද්‍රව්‍ය විශ්ලේෂණය කරාවි. අපි බලමු ඔහුට ලැබෙන ප්‍රතිඵල"

පසුවදා උදේ දහය පමණ වෙද්දී මහාචාර්ය ස්ටීවන්ස් බේකර් වීදියේ අපේ නිවහනට පැමිණියේය.

"හෝම්ස් මහත්මයා. ඔබ හිතුවා හරි. ඇගේ ශරීරයේ තිබී මට ස්වල්ප ප්‍රමාණවලින් විෂ හමුවුණා. අක්මාවේ හා වකුගඩු වල තිබී පොටෑසියම් ඇන්ටිමොනයිල් ටාටරේට් ග්‍රේන්ස් 2.8 ක් හමුවුණා. කෙනෙකුගේ මරණය සිදු කරන්න වුණත් මෙය ප්‍රමාණවත් බව ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැනෙ"

"ඔබට ස්තූතියි මහාචාර්යතුමා." හෝම්ස් කීය. "බොහොම සූක්ෂම විධියට ඇයව මරා දමන්න, මීට කලිනුත් කවුරු හරි උත්සාහ කරල තියෙනවා. බොහොම වෙලාවට ඒ පුද්ගලයා පාවිච්චි කරන්න ඇත්තේ ටාටා එමටික් වෙන්න ඇති. ඒකනේ පහසුවෙන්ම ලබාගන්න පුළුවන් ඇන්ටිමනි අන්තර්ගත විෂ. දැන් ඉතින් මේ පරීක්ෂණය හැරෙන්නේ අප නොහිතූ පැත්තකට"

මහාචාර්ය ස්ටීවන්ස් අපෙන් සමුගෙන පිටවී ගියේය.

"දැන් ඔබට තේරුම් ගන්න පුළුවන් ඇති වොට්සන්, විටෝරියා මෙනෙවිය කියූ කාරණය මෙතැනට වැදගත් වෙන හැටි"

"මොන කාරණයද?"

"ඇන්ජෙලා තමන් පදිමින් සිටි ඔංචිල්ලාව අත් ඇරලා, ගුවන් කරණමක් ගසා විටෝරියා දෙසට ආවත්, ඇන්ජෙලාගේ දෑත් තමන් වෙත ළංවුණේ නැහැ කියූ කරුණ. ඇන්ජෙලාගේ ශරීරයට ඇතුළු වී තිබූ විෂ වර්ගයේ බලපෑමෙන්, ඇගේ ශරීරය දුර්වල වෙන්න ඇති. මත් ගතියක් ඇතිවුණා වෙන්නත් පුළුවනි. එහෙමත් නැත්නම් මාංශ පේශිවල ක්ෂණික සංකෝචනයක් සිදුවුණාද කියන්නත් බැහැ"

"ඔබ කියන කාරණා මට පිළිගත හැකියි හෝම්ස්" මම කීවෙමි. "නමුත් මෙතැනදී පැන නගින ප්‍රශ්නය මෙකයි. විෂක් යොදා ඇන්ජෙලාව ඝාතනය කරන්න උවමනා වුණේ කාටද? විටෝරියාටද? නැත්නම් වෙනත් කාට හරිද?"

"අන්න ඒක තමයි අපි හොයල බලන්න ඕන. අපි වහාම යමු ඇය හමුවීමට. ගිහින් ප්‍රශ්න කරල බලමු"

* * *

"හෝම්ස් මහත්මයා. මා ඔබට කලිනුත් කියූ දෙය නැවතත් කියනවා." විටෝරියා කීවාය. "ඇන්ජි සමග අමනාප කිසිකෙනෙක් අපේ සර්කස් කණ්ඩායමේ නැහැ. ඇය සැමදෙනෙකු අතරම ජනප්‍රියයි. ඇය සමග හිත යටින් තරහක් තිබුණු එකම පුද්ගලයා මා විය යුතුයි. ඒක නිසා නේ දැන් කාගේත් සැකයට මං භාජනය වෙලා ඉන්නේ"

"තමන් ආමාශයේ නොයෙක් ලෙඩ රෝගවලට ගොදුරු වෙන බවක්, ඇන්ජෙලා ඔබට කොයි වෙලාවක හරි කිව්වද?" හෝම්ස් විමසීය.

නීනා විටෝරියා මඳ වේලාවක් නිහඬව කල්පනා කළාය. ඇයගෙන් යළිත් වචනයක් කියැවුණේ මිනිත්තු කිහිපයකට පසුවය.

"ඔව් හෝම්ස් මහත්මයා. ඔබ මේ ප්‍රශ්නය ඇසූ නිසා දැන් මට මතක් වෙනවා. මේ මෑතකදී තමන්ට වමනය සහ පාචනය ඇතිවූ බවත්, ඒකට බෙහෙත් ගැනීමට සිදුවුණු බවත්, ඇය කළමනාකරුට පැමිණිලි කරනවා මං අහගෙනයි. අපට සර්කස් කණ්ඩායම වෙනුවෙන් කූඩාරමේ පිළියෙල කරන ආහාර පමණක් ගතයුතු යයි නීතියක් තියෙනවා. ආහාර වේල් සඳහා අවන්හල් වලට යෑම තහනම්. නමුත් රසකැවිලි වැනි දේ ගැන එවැනි සීමාකිරීම් නෑ. කොහොම වුණත්, ඇන්ජෙලාගේ පැමිණිල්ල ගැන කළමනාකරු අරක්කැමියාට දැනුම් දුන්නා."

"අනෙක් සර්කස් කණ්ඩායම් වුණත් කෑම සම්බන්ධයෙන් මේ නීතිම අනුගමනය කරනවාද?"

"ඔව්. ඔව්. ඒ ගැන කිසිම සැකයක් නෑ. මං කලින් සේවය කළ "ඇට්ලස්" සර්කස් කණ්ඩායමෙත් මේ නීති ඒ විදියමයි."

"ඇන්ජෙලා මෙහේට එන්න කලින් රැකියාව කළේ මොන කණ්ඩායමේ කියලද ඔබ කිව්වෙ?"

"ඇය සිටියේ "මිනර්වා" සර්කස් කණ්ඩායමේ. ඔවුන් රඟ දක්වන්නේ ලඩ්ගේට් හිල්හි ක්වීන්ස් පාක් ක්‍රීඩාංගනයේ"

"හොඳයි. දැනට එපමණයි." හෝම්ස් කීය. "මේ පරීක්ෂණයේ අප යම් ප්‍රගතියක් ලබා ඇති බව ඔබට පෙනෙනවා ඇති. තව දින කිහිපයක් යද්දී මේක සම්පූර්ණයෙන්ම විසඳගන්න හැකිවේවි කියා මං විශ්වාස කරනවා"





දහවල් ආහාර වේල සඳහා අප ආපසු බේකර් වීදියට පැමිණෙද්දී සවස දෙක පසුවී තිබිණ. දවල් කෑමෙන් පසු මගේ මිත්‍රයා යළිත් වරක් කල්පනාවට වැටුණේය. ඒ ඔහුට සුපුරුදු හාන්සි පුටුවේ වැතිරී දෙනෙත් පියාගනිමිනි. මා විසිත්ත කාමරයේ රැඳී සිටීම ඔහුගේ භාවනාවට බාධාවක් බැව් මම දැන සිටියෙමි. එබැවින් පුවත්පත් කිහිපයක්ද රැගෙන මම මගේ නිදන කාමරයට ගියෙමි.

සවස පහට පමණ මා අවදිවන විට, ඇඳිරි වැටෙන්නට ළංවී තිබිණ. මගේ මිත්‍රයා නිවසේ සිටියේ නැත. හෝම්ස් ආපසු එනවිට රෑ නවය පමණ වී තිබිණි. ඔහු ගියේ කොතැනකටද ඒ කුමක් සඳහාද යන්න මට පැවසුවේ නැත. යථා කාලයේදී ඒ සියල්ල මට දැනගන්නට ලැබෙන නිසා මම විමසීමක්ද නොකෙළෙමි.

පසුවදා උදෑසන මා අවදිවන විටත් මගේ මිත්‍රයා අවදිවී, හැඳ පැළඳගෙන අවසන්ය. ඔහු තේ පානයට සූදානමෙන් මේසයට හිඳගෙන සිටියේය.

"සුභ උදෑසනක් මගේ හිතවත් වොට්සන්. අද අපට වැඩ කටයුතු අධික දවසක්." හෝම්ස් කීය. "ඔබ ඉක්මනින් මුහුණ සෝදාගෙන ආවොත්, කෙළින්ම උදෑසන ආහාරයටම වාඩිවෙන්න පුළුවනි. මං එය ඇණවුම් කරලයි තියෙන්නේ"

"තවම උදේ අට වුණෙත් නැහැ නේද?" මම ඇසීමි.

"මගේ හිතවත් මිත්‍රයා. මගේ අමුත්තන් දෙදෙනෙක් පැමිණීමට නියමිතයි. එක්කෙනෙක් උදේ නවයට. අනෙකා උදේ නවයහමාරට. සමහරවිට ඔහු ඊට කලින් එන්නත් ඉඩ තියෙනවා"

"හෝම්ස්. ඔබ එක දිගට දවස් කිහිපයක් මහන්සි වුණා. ලැබුණු ප්‍රතිඵල සාර්ථකද කියල මට කිව්වෙත් නෑ. අද නම් ඔබ බොහොම සන්තෝෂයෙන් ඉන්නේ. වැඩ සාර්ථක වෙලා වගෙයි?"

"ඒව සාර්ථකද නැද්ද කියන එක, මට තවමත් කියන්න අමාරුයි වොට්සන්. ඒක තව පැය දෙකක් තුනක් යද්දී හරියට දැනගන්න පුළුවනි. අප හමුවීමට එන දෙන්නාගෙන් එක් කෙනෙක් අමුත්තෙක්. ඔහු පිළිගන්න අපි සම්පූර්ණ යුරෝපීය ඇඳුමෙන් සැරසී ඉන්න ඕන. ඔබ ළඟ අලුත් ටයිපටියක් තියෙනවද? නැත්නම් මං එකක් දෙන්නම්?"

"මා ළඟ තියෙනවා. එහෙනම් ඔක්කොටම ඉස්සර වෙලා කාල බීල ඉඳිමු"

මා කීවේ තේ පානය කරන අතරතුර විස්තර ඔහුගෙන් අසා ගැනීමේ අරමුණෙනි. එහෙත් මා ඇසූ ප්‍රශ්න මග හැරී ඔහු, වෙනත් මාතෘකා වලට පිවිසියේය. ඔහු පිරිසිදු අලුත් කබායක් හැඳ, ටයි පටියක් පැළඳගත්තේ විශේෂ අමුත්තෙකු හමුවීමට සූදානම් වන අයුරෙනි. අද ඔහු රඟ දැක්වීමට සූදානම් වන්නේ කුමන අන්දමේ නාටකයක් දැයි සිතා ගැනීමට මට නොහැකි විය.

හරියටම උදේ නවය වෙද්දී කුලීරියක් අපේ නිවහන අසලට ළඟාවෙන ශබ්දය ඇසිණි. පියගැට පෙළ අසලට ගිය මම, පහළින් ඇසුණු කතාබහට සවන් යොමු කළෙමි. ඔහු හඩ්සන් මහත්මිය සමග කළ කතාබහෙන්, ඒ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක ලෙස්ට්‍රේඩ් බැව් මට හඳුනාගත හැකිවිය.

"සුභ උදෑසනක් වොට්සන් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීවේ අපේ විසිත්ත කාමරයට පා තබමිනි. "කෝ හෝම්ස් මහත්තයා? ඔහු මට කිව්වේ මංගල උත්සවයකට සුදුසු විධියට හැඳ පැළඳ ගෙන එන්න කියල. ඔන්න මං ඒ විදියට ආවා"

"ඒක බොහොම හොඳයි ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීවේ විසිත්ත කාමරය වෙත පැමිණෙමිනි. "අපිත් සූදානම්. ඔබ කැමතිද ඔක්කොටම කලින් කෝපි කෝප්පයක් බීල ඉන්න"

"ඔබට ස්තුතියි" කී ලෙස්ට්‍රේඩ් හෝම්ස් දුන් කෝපි කෝප්පය අතට ගත්තේය.

උදෑසන නවයයි තිහ වීමටත් පෙර කිසිවෙකු අප නිවසේ දොරට තට්ටු කරන හඬ අපට අසන්නට ලැබිණ. හඩ්සන් මහත්මිය දොර විවෘත කොට අමුත්තා ඇතුළට කැඳවූ ආකාරයටත්, ඔහු උඩුමහලට නැඟුණු ශබ්දයටත්, අපි සවන් දුන්නෙමු. කිසිදු පැකිළීමකින් තොරව පියගැට පෙළ නැඟ ආ ඔහු, අපගේ විසිත්ත කාමරයේ දොරට තට්ටු කළේය. මම දොර විවෘත කළෙමි.

"සමාවෙන්න!" අමුත්තා කීය. "වොට්සන් සහ හඩ්සන් රැකියා ඒජන්ත සමාගමද?"

තිගැස්සුණු මා යමක් කියන්නට පෙර හෝම්ස් නැගිට ආවේ අමුත්තා පිළිගනිමිනි.

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. මේ වොට්සන් සහ හඩ්සන් සමාගම තමයි. රැකීරක්ෂා නියෝජිතවරු. ඔබ ආවෙ කුමන රැකියාවක් සම්බන්ධයෙන්ද?"





"ඊයේ දහවල් ඔබ මිනර්වා සර්කස් කණ්ඩායමේ කාර්යාලයට ඇවිත් තිබුණා. ඔබ එහි ලියුමක් තබා තිබුණා මා නමට. මං සිල්වියෝ රොමානි"

"ආ සිල්වියෝ රොමානි මහත්මයද?" හෝම්ස් විමසුවේ තම සුරත දිගු කරමිනි. "ඔබ හඳුනාගන්න ලැබීම ගැන බොහොම සන්තෝෂයි. මෙහෙන් හිඳගන්න. මේ මහත්වරු දෙන්නා තමයි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අනෙක් සාමාජික මහත්වරු.

මං ඔබට යොමු කළ ලිපියේ සඳහන් කළා වගේ, ඇමරිකානු සර්කස් කණ්ඩායමකට ඔවුන් ක්‍රීඩකයන් හොයනවා. අංශ කිහිපයකටම ක්‍රීඩකයන් සොයා ගැනීමට අපට හැකිවුණා. මගේ මතකය නිවැරදි නම් ඔබ යෙදෙන්නේ අශ්වාරෝහක ක්‍රීඩාවල. එහෙම නේද?"

"ඔව්"

"මං මේ තොරතුරු ලියා ගත යුතුයි." කී හෝම්ස් කඩදාසි සහිත ලිපිගොනුවක් ළං කරගෙන කරුණු සටහන් කර ගැනීමට පටන් ගත්තේය.

"ඔබගේ නම?"

"සිල්වියෝ රොමානි"

"වයස?"

"විසි හතයි"

"ඔබ යෙදෙන්නේ කුමන අශ්වාරෝහක ක්‍රීඩා වලද?"

"සර්කස් සඳහා අවශ්‍ය වන සියලුම ක්‍රීඩාවල යෙදෙනවා. ඉතාලි ජාතික අශ්වාරෝහක තරගාවලියේදී මං රන් පදක්කම් දෙකක් සහ රිදී පදක්කම් කිහිපයක් දිනාගෙන තියෙනවා. යුරෝපා අශ්වාරෝහක තරගාවලියේදී මං ඉතාලිය නියෝජනය කළා. එහිදී රිදී පදක්කම් දෙකක් දිනාගත්තා."

"එතකොට සර්කස් අංශයේ ඔබේ පළපුරුද්ද?"

"පසුගිය අවුරුදු දෙකහමාරක පමණ කාලයක් මං සේවය කරන්නේ "මිනර්වා" සර්කස් කණ්ඩායම වෙනුවෙන්. ඊට කලින් රෝමයේ සහ නාපොලියේ සර්කස් කණ්ඩායම්වල අවුරුදු දෙකක් රැකියාව කළා"

"බොහොම හොඳයි. ඔබ අපේක්ෂා කරන්නේ මොන වගේ වැටුපක්ද?" හෝම්ස් ඇසීය.

"මහත්මයා. ඒක කියන්න කලින් මං දැනගත යුතුයි, සතියකට මා මේ ක්‍රීඩාවල යෙදිය යුතු පැය ගණන. මං කැමතියි ඒ ගැන කෙලින්ම සර්කස් කණ්ඩායමේ කළමනාකරු සමග කතා කරන්න"

"ඔව්. ඒක සාධාරණ පිළිතුරක්. අපි සර්කස් ශිල්පීන් බඳවාගන්නෙ ෆිලඩෙල්ෆියා සර්කස් සමාගමට. ඔබේ ඉල්ලුම් පත්‍රය මං සකස් කළා. එහි කළමනාකරු ජෝන් හූස්ටන් මහත්මයා අද හෝ හෙට ලන්ඩනයට පැමිණීමට නියමිතයි. ඔබේ ඉල්ලුම් පත්‍රය මං ඔහුට භාරදෙන්නම්. මහත්මයා, කරුණාකරල මෙතැනට ඇවිත් මේක අත්සන් කරන්න. ජෝජ් මහත්මයා. එහෙනම් ඔබත් මෙතැනට ඇවිත් සාක්ෂියට අත්සන් කරන්න" හෝම්ස් කීවේ ලෙස්ට්‍රේඩ් අමතමිනි.

අමුත්තා හෝම්ස් සිටි මේසය අසලට පැමිණ කඩදාසිය වෙත ළං වෙද්දී, ලෙස්ට්‍රේඩ් ඒ පිටුපසින් සිට ගත්තේය. ඔවුන් මේ සූදානම් වන්නේ කුමකටදැයි මට අනුමාන කළ හැකි විය. මම ද වහාම ඔවුන් අසලට ගියෙමි.

තීන්ත කුප්පියේ බහා හෝම්ස් දුන් පෑන අතට ගත් අමුත්තා එක්වරම ලිපිය අත්සන් නොකොට, එය කියවා බැලීමට මොහොතක් ගත කළේය. එක් ක්ෂණයකින් ක්‍රියාත්මක වූ හෝම්ස් ලෙස්ට්‍රේඩ්ගේ උදව්වෙන්, අමුත්තාගේ දෑත් වලට විලංගු දැම්මේය. සිදුවූයේ කුමක්දැයි සිතා ගැනීමට නොහැකිව තුෂ්නිම්භූත වූ අමුත්තා, ඊළඟ මොහොතේ හැසිරුණේ යක්ෂාවේශවූවෙකු පරිද්දෙනි. දැත් විලංගුවට හිරවී තිබුණද ඔහු හෝම්ස් වෙත කඩා පැන්නේ, ඔහු බිමට පෙරළා ගැනීමටයි. එහෙත් ඒ සමගම ලෙස්ට්‍රේඩ් සහ මම ක්‍රියාත්මක වූයෙමු. මෙවැනි දරුණු පුද්ගලයන් මෙල්ල කළ යුතු ආකාරය ගැන ලෙස්ට්‍රේඩ්ට හොඳ වැටහීමක් තිබිණි. ඔහු කකුල් මාට්ටුවක් දමා සිරකරුවා බිම පෙරළා ගත්තේය. අනතුරුව ඔහුගේ දෙපා බැඳ දැමීමට යමක් ලෙස්ට්‍රේඩ් ඉල්ලා සිටියේය. එවැන්නක් කිට්ටුවක නොමැති බව දත් හෝම්ස් තම කරේ තිබූ අනර්ඝ ටයිපටිය ගළවා, එයින් සිරකරුවාගේ දෙපා තදින් ගැටගැසුවේ මගේ සහයද ලබා ගනිමිනි.

අපට පරිභව කරමින් සිරකරුවා කෑකෝ ගසද්දී, හෝම්ස් ඔහු සන්සුන් කළේ ඔහුට විරුද්ධව ඇති චෝදනාව සඳහන් කරමිනි.





"සිල්වියෝ රොමානි මහත්මයා. ඔබ පොලිස් අත්අඩංගුවට ගැනීමට සිදුවුණේ ඇයි කියන කාරණය, ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේදී ඔබට විස්තර සහිතව දැනගන්න ලැබේවි. මං එය කෙටියෙන් කියන්නම්. ඒ තමයි කලක් ඔබගේ පෙම්වතියව සිටි ඇන්ජෙලා ඩැනියෙල් මෙනෙවිය, විෂ යොදා ඝාතනය කිරීමට තැත්කිරීම. ඇය ජීවිතක්ෂයට පත්වුණේ හදිසි අනතුරකින්. නමුත් ඊට ඔබේ දායකත්වය ගැන පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා වල කියවෙනවා......."

තවමත් කෝපයෙන් වියරුව සිටි සිරකරුවා නොනවත්වාම අප සැමට ශාප කරද්දී, හෝම්ස් තම කථාව නැවැත්විය. තරමක වේලාවක් ගතවූ පසු සිරකරු සන්සුන් විය. ලෙස්ට්‍රේඩ් කලින් දී තිබූ උපදෙස් අනුව රෝද හතරේ ලොකු අශ්ව කරත්තයක් අපේ නිවහන අසලට ළඟාවී තිබිණ. එහි රියැදුරා උඩුමහලට පැමිණ අපට ඒ ගැන දැනුම් දුන්නේය. ඒ අනුව සිරකරුවා ස්කොට්ලන්ඩ්යාඩ් වෙත ගෙන යාමට අපි ලෙස්ට්‍රේඩ්ට සහය වීමු. තමාට ගැළවීමට මගක් නොමැති බව තේරුම්ගත් සිරකරු අන්තිමේදී පාපෝච්චාරණය කළේය.

"මහත්වරුනි. මගේ නම සිල්වියෝ රොමානි බව මං ඔබට කලින් කිව්වා. මගේ දෙමව්පියන් අහිංසක ගම්බද මිනිස්සු. මගේ පියා රෝගී වුණු අශ්වයිනට ප්‍රතිකාර කළ පශු වෛද්‍යවරයෙක්. මං හැදුණෙ වැඩුණේ අශ්වයින් සමග. ඒ නිසාම අශ්වාරෝහක ක්‍රීඩා වලට මගේ හිත ගියා. පාසලේ ඉගෙනීම අතපසු වුණත් අශ්වාරෝහක ක්‍රීඩා වලින් මට ජයග්‍රහණ හිමිවුණා. පදක්කම් පමණක් නොව මුදල්ද ලැබුණා. ඒ නිසයි මගේ රැකියාව ලෙස සර්කස් කණ්ඩායමකට බැඳෙන්න මං තීරණය කළේ.

ඉතාලියේ අවුරුදු දෙකක් රැකියාව කරලා මං එංගලන්තයට ආවා. ඒ මගේ රටේදී මට සතුටුදායක වැටුපක් නොලැබුණු නිසා. මං රැකියාවට බැඳුණු "මිනර්වා" සර්කස් කණ්ඩායම අති විශිෂ්ට තැනක්. ඒ බව ඔබට අමුතුවෙන් කීම අනවශ්‍ය ඇති. එතැන අපට හොඳ කෑම බීම, හොඳ වැටුප් වගේම අනෙක් පහසුකම් ලැබුණා. ඒ ඔක්කොටම වඩා මං සන්තෝෂ වුණේ මට පෙම්වතියක් ලැබුණු නිසා. හරියට දෙවියන් වහන්සේ මා වෙනුවෙන් මැව්වා වගේ, ඇය ඉතාලි සම්භවය ඇති, ඉතාලි සංස්කෘතිය අනුව හැඩගැසුණු

රුමත් තරුණියක්. ඇන්ජෙලා ඇගේ නමටම ගැළපෙන අයුරින් සුරංගනාවියක් බවයි කවුරුත් කිව්වේ. නමුත් ඇගේ ආදරය හිමිවුණේ මටයි. අපි බොහොම සන්තෝෂයෙන් කාලය ගත කළා. අපේ බලාපොරොත්තුව තිබුණේ ඉක්මනින්ම විවාහ වෙන්නයි.

නමුත් අවාසනාව අප හොයා එන්නේ අප නොහිතන විදියට, නොහිතන මොහොතක. "ජුපිටර්" සර්කස් කණ්ඩායමේ ගුවන් කරණම් සර්කස් කාරියකට ඇබෑර්තුවක් ඇතිවුණා. ඒ ගැන ඇන්ජීට දැනගන්න ලැබී තිබුණේ එතැන රැකියාව කළ ඇගේ ඥාතිවරියක වුණු නීනාගෙන්. දිගු කලක් එහි රැකියාව කර තිබූ නීනාට හොඳ වැටුපක් සහ පහසුකම් ලැබුණා. ඒවා ගැන ඇහුවාම ඇන්ජෙලාට ඉවසන්න බැරිවුණා. ගුවන් කරණම් කරන ශිල්පීනට ඔවුන් ගෙවන වැටුප, "මිනර්වා" එකේ වැටුපට වඩා හුගක් වැඩියි. ඒ නිසා තමන් නීනා රැකියාව කළ ඒ කණ්ඩායමට බැඳෙන්න තීරණය කළ බව ඇන්ජෙලා කිව්වා. මං ඒකට විරුද්ධ වුණා. නමුත් මගේ විරුද්ධත්වය ඇය ගණන් ගත්තේ නැහැ.

ඇය ගිය කණ්ඩායමට මටත් බැඳෙන්න තිබුණා. නමුත් අශ්වාරෝහක ක්‍රීඩකයන් සඳහා ඔවුන් ළඟ ඇබෑර්තු තිබුණේ නැහැ. එකම තැන රැකියාව කරද්දී වගේ නෙමෙයි. ඇය අලුත් තැනකට ගියාට පස්සේ, මට කලින් වගේ නිදහසේ හමුවෙන්න අවස්ථාවක් ලැබුණේ නැහැ.

"ජුපිටර්" කණ්ඩායමට බැඳුණු පසු ඇගේ ජනප්‍රියත්වය තවත් ඉහළ ගිහින් තිබුණා. ඇය තම ජීවිතය ගැන අබමල් රේණුවක තැකීමක් නොකර ක්‍රීඩාකරන තැනැත්තියක්. ඒ නිසාමයි කරණම් ශිල්පීන්ගේ ආරක්ෂාව සඳහා පහළින් සවිකරන දැල පවා ඇය ඉවත් කරගෙන තිබුණේ.

ඇන්ජෙලා මා වෙත තිබූ ආදරය මාස කීපයක් යද්දී අඩුවීගෙන යන බව මට තේරුණා. ඒකට හේතුව මට ඉක්මනින්ම දැන ගන්න පුළුවන් වුණා. ඒ ඇය එතැන හැරී නෙල්සන් නම් තරුණයෙකු සමග ප්‍රේම සම්බන්ධයක් ඇතිකර ගැනීම නිසයි.

මේ ගැන මගේ විරුද්ධත්වය මං ඇයට ප්‍රකාශ කළා. නමුත් ඇය ඒක ගණන් ගත්තේ නෑ. ඇගේ ආදරය හිමිවී තිබුණු හැරී නෙල්සන් මට වඩා කඩවසම් තරුණයෙක්. ඒ වගේම දක්ෂයෙක්. ඇන්ජෙලා ඔහු වෙත පුදකර ඇති ආදරය අත් හැරියේ නැත්නම්





මං ඇයව මරා දමන බවට තර්ජනය කළා. ඇය ඊට අවඥාවෙන් මට හිනාවුණා. මහත්වරුනි. මට ඇය අමතක කරන්න හැකියාවක් තිබුණේ නැහැ. මං මගේ අවසන් තීරණය ගත්තා.

ඉතාලිය, සිසිලිය ආදී රටවල මිනිසුන්ගේ හිත් බොහොම දරුණු බව ඔබ අහල ඇති. මේ වගේ ප්‍රශ්නයක් ඇති වුණාම අපි ඒක විසඳන්නේ පිහියෙන්. නමුත් ඒකට වෙනත් මගක් ගැනීමට මං තීරණය කළා. අතිශයින්ම භයානක සර්කස් වල යෙදෙන අයට, ක්‍රීඩා ලෝලීන්ගෙන් තෑගිබෝග හැටියට, නොයෙක් රසකැවිලිත් ලැබෙන බව ඔබ අහල ඇති. ඇන්ජී මෙයින් වඩාත්ම ආශාවක් දැක්වූයේ ස්විට්සර්ලන්තයේ සාදන චොකලට් වලට. ඇයව විනාශ කරන්න මෙයම යොදාගත හැකි බව මට තේරුණා. අශ්වයිනට වෙදකම් කළ මගේ පියා, ඒ කාලයේ යොදාගත් ටාටා එමටික් ගැන මං දැන හිටියා. ඒක ප්‍රබල විෂ වර්ගයක් නිසා එය පාවිච්චි කළ යුත්තේ ඉතා පරෙස්සමෙන්. මං අශ්වාරෝහක ක්‍රීඩාවලට යොදාගන්නා අශ්වයින්ටත්, සමහර අවස්ථාවල මෙම ඖෂධය අවශ්‍ය වුණා. ඒ නිසා එය අප ළඟ හැමවිටම තබාගත් ද්‍රව්‍යයක්.

ඇගේ ක්‍රීඩා වලින් අමන්දානන්දයට පත් රසිකයකු යවන හැටියට, ටාටා එමටික් යෙදූ චොකලට් ඇය වෙත යැවීම මට අපහසු කරුණක් වුණේ නැහැ. නමුත් එයින් ප්‍රතිඵල ලැබුණේ මං හිතූ ආකාරයට නෙමෙයි. නමුත් අවසන් ප්‍රතිඵලය එකමයි. මං ඔබට පැවසුවේ සම්පූර්ණ සත්‍යයයි. ඇගේ ඥාතිවරිය වූ නීනා මීට පැටළීම ගැන මට කනගාටුයි. මේ සිද්ධියට නීනා මොනම ආකාරයකින්වත් සම්බන්ධ නැති බව මම සහතික කර කියන්නම්" සිල්වියෝ රොමානි තම පාපෝච්චාරණය අවසන් කළේය.

එංගලන්තය පුරා මහත් ආන්දෝලනයක් ඇති කළ "සර්කස් නළඟනගේ අභිරහස" නමින් පුවත්පත්වල පළ වූ සිදුවීම අවසන් වූයේ එලෙසිනි.

"විටෝරියා කියූ කතාව කිසි කෙනෙක් විශ්වාස කළේ නෑ" හෝම්ස් කීවේ තමා එම අභිරහස විසඳූ ආකාරය පහදමිනි. "ඇන්ජෙලාගෙ දැත් විටෝරියා හිතාමතාම අත්හැරියා කියලමයි කාටත් හිතුණේ. ප්‍රශ්නයකට එක කෙළවරකින් විසඳුමක් නැතිවුණාම, අනික් කෙළවරෙන් විසඳීමට පුළුවන්ද කියල උත්සාහ කරල බලන්න ඕන. ඒ නිසයි ඇන්ජෙලාගෙ මෘත ශරීරය තවත්

පශ්චාත් මරණ පරීක්ෂණයකට භාජනය කරන්න මං හිතාගත්තේ. මං හිතූ විදියටම ප්‍රතිඵල ලැබුණා. ඔබට මතක ඇති වොට්සන් මීට අවුරුදු ගණනාවකට කලිනුත්, ටාටා එමටික් යොදා මිනීමැරූ අපරාධකාරයෙකු අප අල්ලා ගත්තා."

"හෝම්ස් මට තවමත් තේරුම් ගන්න අමාරු එක තැනක් තියෙනවා"

"ඒ මොකක්ද?"

"මේ අපරාධයට වගකිව යුත්තා සිල්වියෝ රොමානි බව ඔබ නිශ්චිතව හඳුනාගත්තෙ කොහොමද?"

"හොඳ ප්‍රශ්නයක් වොට්සන්. දකින්නට ලැබුණු කාරණා හා මා කළ සොයාගැනීම් මං දිගටම විශ්ලේෂණය කරල බැලුවා. එතකොට මේ පැත්තෙන් බැලුවාම, ඒ කියන්නේ "ජුපිටර්" සර්කස් කණ්ඩායම පැත්තෙන්, ඇන්ජෙලා සමග වෛරයක් තිබුණා කියල නිගමනය කරන්න පුළුවන් අය හිටියේ එකම එක්කෙනයි. ඒ තීනා විටෝරියා මෙනෙවිය.

ඊළඟට මං මගේ අවධානය යොමු කළේ "මිනර්වා" සර්කස් කණ්ඩායමට බව ඔබ දන්නවානේ. ඒ මොකද තර්කානුකූලව බැලුවොත් ඇය සමග අමනාප කෙනෙකු සිටිය හැක්කේ, ඇය කලින් රැකියාව කළ ස්ථානයේ මිස වෙන කොහේද? මං ඉතා සියුම් ලෙස එතැන සුළු සේවකයෙකු ගෙන් විමසා බැලුවා. ඇන්ජෙලා ඇඩී ප්‍රේම සම්බන්ධයක් පවත්වාගෙන ගියේ කවුරුන් සමගද කියන එක කාටවත් රහසක් නොවෙයි. ඊළඟට ඔවුන් දෙදෙනා විවාහ වීමට සූදානමින් සිටි බවත් ප්‍රකට කරුණක් වුණාලු. එතකොට ඇය ඒ ගිවිසුම බිඳ දැමීම නිසා, ඇගේ පරම සතුරා වුණේ සිල්වියෝ රොමානි බව පැහැදිලිවම පෙනෙන කරුණක්. නමුත් ඔහු කොහොමද ඇයට වස දුන්නේ? ඒ කරුණත් මා නිශ්චිතව දැනගත යුතුව තිබුණා.

මං ගියානේ මුලින්ම "ජුපිටර්" කණ්ඩායමේ කළමනාකරු ක්ලයින් හමුවෙන්න. ඔහු බොහෝම කාරුණික පුද්ගලයෙක්. මගේ පරීක්ෂණ කටයුතුවලට ඔහුගෙන් හොඳ සහයෝගයක් ලැබුණා. කණ්ඩායමේ ශිල්පීන්ගේ පෞද්ගලික දේවල් තබාගන්න, ඔවුනට ලාච්චු සහිත කුඩා කැබිනෙට්ටු දීල තියෙනවා. ශිල්පීන් නමට තෑගිබෝග ලැබුණාම ඒවා අදාළ අයගේ ලාච්චුවලට ගෙනිහින්





දමනවාලු. ඇන්ජෙලාගේ කැබිනෙට්ටුව මං පරීක්ෂා කර බැලුවා. ඒකෙ තිබී මට හමුවුණා, එකම අත් අකුරෙන් කවරයක පිටත ලියූ පාර්සල් තුනක්. එයින් දෙකක් හිස්වෙලා. එකක තිබුණා ස්විස් චොක්ලට් එකක්. ඒ තුනේම අත් අකුරු එකයි. පිරිමියෙකුගේ රළු අත් අකුරු. මං ඒ අත් අකුරු සහිත පාර්සල් දවටනය ඉවත් කරගෙන ආවා"

"ඔබ කියන්නේ ඒ විෂ සහිත පාර්සලය එවූ තැනැත්තාගේ අත් අකුරු කියාද?"

"ඔව්. මගේ හිතේ ඇතිවූ සැකය එයයි"

"නමුත් ඇන්ජෙලා මේ අත් අකුරු හඳුනාගන්න ඇතිනේ." මම කීවෙමි.

"රොමානි මේ ආකාරයෙන් තමාට අනර්ථයක් කරාවි කියල, ඇන්ජෙලා සැක කරන්න නැහැ. අන්න එතැනයි ඇයට වැරදුණේ"

"ඊළඟට ඔබ මොකද කළේ?"

"අනෙක් චොක්ලට් පාර්සලයේ විෂ තිබෙනවාද කියා බලන්න මම ඒක විශ්ලේෂණය සඳහා ස්ටීවන්ස්ට යැව්වා. මම ඒ දවටන සාක්කුවේ දමාගෙන ගියානේ "මිනර්වා" සර්කස් එකට.

එතැන කළමනාකරු කැස්පර්ස් නම් ප්‍රංශ ජාතිකයෙක්. ඔහු මහ රෙකුලාසිකාරයෙක්. මාත් එක්ක සහයෝගයෙන් වැඩ කරන්න කැමැත්තක් තිබුණෙම නැහැ. ඇන්ජෙලා ඩැනියෙල්ස් මෙනෙවියගෙ මරණය ගැන පරීක්ෂණය භාරවෙලා තියෙන්නෙ මට බව මං ඔහුට කිව්වා. ඇය ඔවුන්ගේ ආයතනය සමග ඇති කරගත් රැකියා ගිවිසුම පරීක්ෂා කරන්න මට අවශ්‍ය බව මං ඔහුට කිව්වා. මං එහෙම ඉල්ලීමක් කළේ බොහොම ඈත ඉඳගෙන විදින ඊතලයක් වගේ, සාර්ථක ප්‍රතිඵල ලැබෙයි කියන විශ්වාසයකින් නෙමෙයි. නමුත් මට සතුටුදායක ප්‍රතිඵල ලැබුණා. ඒ කොහොමද? සර්කස් ශිල්පීන් සමග ගිවිසුම් ඇතිකර ගැනීමේදී, සමාගමේ කොන්දේසි වලට ඔවුන්ගේ එකඟතාවය, තමන්ගේ අත් අකුරෙන් ලියවිල්ලක් හැටියට ලියලා අත්සන් කරන්න ඕන. ඒ සඳහා ඔවුන්ගේ පොතක් තියෙනවා. ඒ පොතේ ඇන්ජෙලාගෙ අත් අකුරෙන් කළ ප්‍රකාශය මං කියවා බැලුවා. මං ඒක දිහාම බලාගෙන මිනිත්තු කිහිපයක් ඉඳිද්දී, කළමනාකරුට සිදුවුණා

ඔහුගේ අසුනෙන් නැගිටින්න. ඒ මිනිත්තු කිහිපය තුළ මං පෙරළා බැලුවා ඒ පොතේ තවත් පිටු කිහිපයක්. සිල්වියෝ රොමානි ගිවිසුම ලියා තිබූ අකුරු, අර චොකලට් පාර්සලය එතූ දවටනයේ අත් අකුරු වලට සියයට සීයක් සමානයි. එතැනින් හැම දෙයක්ම සම්පූර්ණ වුණා."

කෙටි නඩු විභාගයකින් පසු සිල්වියෝ රොමානි පෝරකයට නියම විය. ඇයට විරුද්ධව තිබූ චෝදනා වලින් නිදහස් වූ නිනා විටෝරියා සර්කස් ක්ෂේත්‍රයෙන් ඉවත් වී වෙනත් රටකට සංක්‍රමණය වූ බැව් අපට අසන්නට ලැබිණි.



# සූපවේදියාගේ ගැටලුව

මෙම කථාන්තරය මෙපමණ කලක් පාඨකයා වෙත ඉදිරිපත් කිරීමෙන් මා වැළකී සිටියේ මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතාගේ ඉල්ලීම නිසයි. එයට හේතුව පරීක්ෂණය ආරම්භයේදී ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය මගින් එවනු ලැබූ පොලිස් පරීක්ෂකවරයා මගේ මිත්‍රයා සමග ඇති කරගත් ගැටුම ය.

ෂර්ලොක් හෝම්ස් යනු සාමාන්‍යයෙන් සාමකාමී පුද්ගලයන් සහ පොලිස් නිලධරයන් සමග, ගැටුම් ඇතිකර ගන්නෙකු නොවේ. එහෙත් හර්බට් ඩච්බිගින් නම් මෙම පොලිස් නිලධරයා පරීක්ෂණය ආරම්භයේදී දිගින් දිගටම හෝම්ස්ට අපහාස වන අයුරින් කටයුතු කළේය. හෝම්ස් නොපැකිළව ඒ බැව් ඔහුට පෙන්වා දුන්නේය. එහෙත් රදළ ඥාතීන් සිටි ඩච්බිගින් තරුණයා පළපුරුදු හෝම්ස්ගේ කටයුතු හෙළා දුටුවේ අවඥාවෙනි. අපරාධ පරීක්ෂණ ගැන කිසිදු පළපුරුද්දක් නොතිබූ හර්බට් ඩච්බිගින්, ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක තනතුරකට ආවේ කෙලෙසදැයි පුවත්පත් මගින් ප්‍රශ්න කර තිබිණි. බ්‍රිතාන්‍ය සාමි මන්ත්‍රී මණ්ඩලයේ නියෝජිතයකු වූ වින්ස්ටන් කොල්චෙස්ටර් සාමිගේ බලපෑම මත, ඔහුගේ ඥාති පුත්‍රයකු වූ ඩච්බිගින්ට මෙම පත්වීම ලැබී තිබූ බැව් පසුව හෙළිවිය.

ඒ දිනවල ඔහුට යෙදීමට කිසිදු පරීක්ෂණයක් නොතිබූ නිසා හෝම්ස් සිටියේ තරමක කලකිරීමකිනි. ඔහු සතු වයලීන කිහිපයෙන් එකක් අතට ගත් හෝම්ස් එය හඬවමින් සිටියේ කිසිම ආකාරයක මිහිරි හඬක් නංවමින් නොවේ. ඇමරිකාවේ පදිංචිව සිටි මගේ සොහොයුරු රොඩ්නි, මේ කාලයේ ස්නායු සම්බන්ධ රෝගයකට ගොදුරුව සිටියේය. පාකින්සන් නම් විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් මුලින්ම සොයාගත් නිසා මේ රෝගය එකල හැඳින්වුණේ පාකින්සන්ගේ රෝගය යනුවෙනි. සිතේ අපමණ කැලඹීමකින් මෙන්ම කලකිරීමකින් සිටි මම, එම රෝගය ගැන අලුත්ම තොරතුරු සෙව්වෙමි. එයට ප්‍රතිකාර විධි ඇනගැනීමට නොනවත්වාම වෛද්‍ය

සඟරා පරිශීලනය කරමින් සිටියෙමි. මගේ එම කටයුත්තට විශාල බාධාවක් වූයේ, මගේ මිත්‍රයාට යෙදෙන්නට වැඩක් නොමැති වීමයි.

"අදත් කම්මැලිකමින් නිකම්ම ගතවෙලා යන දවසක් වගේ වොට්සන්" හෝම්ස් කීය. "පුවත්පත්වලත් අපරාධ කිසිම එකක තොරතුරක් නෑ. ඒවායේ පෞද්ගලික දැන්වීම් තීරවලත් කිසිම අභිරහස් දෙයක් හෝ කුතුහලයක් ඇති කරන යමක් නෑ. ඔබ විශ්වාස කරාවිද මං දන්නෙ නෑ වොට්සන්; ඉඳහිට එන මේ වගේ දවසක මට හිතෙනවා, මං මේ වෘත්තිය තෝරා ගැනීමෙන් කළේ නුවණට හුරු වැඩක්ද කියලා. මගේ පියාණන්ට උවමනා වෙලා තිබුණේ මාව නීතිඥයකු කරන්න. නමුත් මම වෛද්‍ය විද්‍යාව හා රසායන විද්‍යාව විශ්වවිද්‍යාලයේ දී අධ්‍යයනය කළා. ඒ කිසිම නිශ්චිත ඉලක්කයක් ඇතුව නෙමෙයි. ඒ නිසා වෛද්‍යවරයෙකු වුණෙත් නෑ; රසායන විද්‍යාඥයෙකු වුණෙත් නෑ"

"කොහොම වුණත් ඔබ අතින් සමාජයට විශාල සේවයක් සිද්ධවෙනව නේ. ඒක වෙන කාටවත් සිද්ධකරන්න බැරි විදියේ එකක්......."

මගේ කථාවට බාධා වූයේ කිසිවෙකු වේගයෙන් උඩුමහලට පැමිණ අපගේ විසිත්ත කාමරයේ දොරට තට්ටු කළ ශබ්දයෙනි. දොරෙන් ඇතුළු වූයේ හඩ්සන් මහත්මියයි.

"සමාවෙන්න මහත්මයා" ඇය කීවාය. "විදේශික ස්වභාවයක් තිබෙන කෙනෙකු ඇවිත් ඉන්නවා ඔබ හමුවෙන්න"

"විශිෂ්ටයි" හෝම්ස් කීවේ අපමණ සතුටකිනි. "වහාම ඔහුව උඩට එවන්න හඩ්සන් මහත්මිය. මං එච්චරම අවාසනාවන්ත නෑ වගෙයි වොට්සන්. ඇවිත් ඉන්නේ විදේශික මහත්මයෙක් නම්, අද අපව වෙනත්ම මාර්ගයකට යොමු වෙන්නත් ඉඩ තියෙනවා"

විසිත්ත කාමරයට ඇතුළු වූයේ අඩි හයක් පමණ උස හැඩි දැඩි දේහයක් තිබූ පුද්ගලයෙකි. ඔහුගේ තිබූ කැපී පෙනෙනම ලක්ෂණය ලෙස මා දුටුවේ, ඔහුගේ මුහුණේ තිබූ උඩු රැවුළ ය. සුදු උඩුරැවුළ දෙකන් දෙසට ළං වන තරම් දිගට වැවී තිබුණේ බයිසිකලයක හැඬලය සිහිගන්වන අයුරින්, දෙකෙළවර උඩු අතට වක්‍ර වෙමිනි. ප්‍රමාණයෙන් විශාල වූ නාසයේ ලේ නහර මතුවී තිබිණ. දුඹුරු පැහැති දෙනෙත්වල සජීවී බවක් තිබුණත්, ඒවායෙන් ප්‍රකාශ වූයේ හාස්‍යය යයි මට සිතිණි. ඔහු තම හිස් වැස්ම අතට





ගත්තේ අප වෙත මඳ සිනාවක් පාමිනි. බොහෝ දුරට තට්ටය පෑදුණු හිසේ ඉතිරිව තිබූ කෙස් සියල්ල ද සම්පූර්ණයෙන්ම පැසී සුදුපැහැ වී තිබූ බැව් එවිට මම දුටුවෙමි. හෝම්ස්ගේ සංඥාව අනුව ඔහු අසුන්ගත්තේ කථාව ඇරඹීමට නොඉවසිල්ලෙනි.

"මහත්මයා. මගේ නම ජෝසෆ් ගිලිමෝ" ඔහු කීවේ පැහැදිලි ලෙසම ප්‍රංශ උච්චාරණයකිනි. "ඔබ වෙන්න ඇති ෂර්ලොක් හෝම්ස් මහත්මයා? මේ මහත්මයා වෙන්න ඇති දොස්තර වොට්සන්?" ඔහු කීවේ අසුනෙන් මඳක් එසවී අප දෙදෙනාට හිස නමා ආචාර කරමිනි.

"ඔබට ලොකු ප්‍රශ්නයක් ඇතිවෙලා?" හෝම්ස් ඇසීය.

"ඔව් මහත්මයා ඔව්" ඔහු කියද්දී දෑත් මිට මෙළවී සිතේ ඇතිවූ ආවේගය ප්‍රකාශ විය. "මගේ නිර්මාණ හොරකම් කරලා!"

"ඒක හරි බැරෑරුම් ප්‍රශ්නයක් කියලයි මට හිතෙන්නෙ" හෝම්ස් කීය. "ඔබේ නිර්මාණ මොනවාද, ඒවා සොරකම් කළේ කොහෙන්ද කියා වැඩි විස්තර අපට කියන්න"

"මං කවුද කියන එකත් මගේ රැකියාව මොකක්ද කියන එකත් මං මුලින් කියන්න ඕන" ගිලිමෝ කීය. "මං දන්නෙ නෑ ඔබ මා ගැන අහල තියෙනවද කියල. නමුත් මං ඔබට සහතික වෙන්නම්. මගේ වෘත්තියෙන් ලන්ඩනයේ ඉන්න ඉහළම පුද්ගලයා මමයි. මම තමයි කොස්මොපොලිටන් හෝටලයේ ප්‍රධානම සූපවේදියා....... සූප විශේෂඥයා. ලන්ඩනයට එන්න කලින් මම පැරිසියේ රිවෝලි මාවතේ පිහිටි ලූවර් ග්‍රෑන්ඩ් හෝටලයේ සේවය කළා. ඊට පසු මං සේවය කළේ ලියොන්ස් හි ඩූලොං සහ ඉතාලියේ මයිකල් ආන්ජෙලෝ හෝටල්වල. මේ ක්ෂේත්‍රයේ මා දැක්වූ දක්ෂතා ගැන මට ජාත්‍යන්තර වශයෙන් විශාල කීර්තිනාමයක් ලැබිල තියෙනවා."

"ඔබ කියූ ඔය හෝටල් වලින් අප දෙදෙනාත් විවිධ අවස්ථාවල ආහාර ගෙන තියෙනවා. ඒවා ඉතා රසවත් වුණු බව මං කිව යුතුයි"

"ඔබට ස්තුතියි මහත්මයා" අමුත්තා කීය. "ඔබගෙන් වගේම අනෙක් ඉහළම අනුග්‍රාහකයන් ගෙනුත් කෑමවල රසවත් බව ගැන මට ඉහළම සහතික ලැබෙන බව ඇත්තයි. ඒ වුණත් ප්‍රධාන සූපවේදියා හැටියට මා අතින් ඉටුවිය යුතු එක්තරා රාජකාරියක් තියෙනවා. ඒක නොපිරිහෙළා ඉටු කරන්න මං සම්පූර්ණ උත්සාහය යොදනවා. ඒ මොකක්ද කිව්වොත් ඔබ සමහරවිට පුදුම වේවි. ඒ තමයි නගරයේ

අනෙක් ඉහළම හෝටල්වලට ගිහිං, ඔවුන්ගේ විශේෂතම භෝජන රසවිඳ බැලීම. අප නොදන්නා නොයෙක් අලුත් දේවල් ඒ ක්‍රමයෙන් අපට ඉගෙන ගන්න පුළුවනි. ඒ හෝටල්වල සූපවේදීනුත් ඒ විදියට අපේ හෝටලයට ඒම සිරිතක්. අපි එකිනෙකාව හොඳින් අඳුනනවා. ඔවුනොවුන්ගේ තැන්වලට ගියාම, එකිනෙකා බොහොම සාදරයෙන් පිළිගැනෙනවා.

ඉතින් පසුගිය බදාදා මම මේ විදියට ආහාර රස බලන්න නොදම්බලන්ඩ් හෝටලයට ගියා. එහි ප්‍රධාන සූපවේදියා ෂෝන් ක්ලෝඩ් ට්‍රේසි මගේ මිත්‍රයෙක්. ඔහුත් මං වගේම ප්‍රංශ ජාතිකයෙක්. මම සුපුරුදු ලෙස මෙනු පත අරගෙන කෑම ලැයිස්තුව කියවා බැලුවා. මගේ සිතේ ඇතිවූ පුදුමය ඔබට හිතාගන්න පුළුවන්ද මහත්මයා. එහි සඳහන්ව තිබුණා ෆ්‍රිකසේ දි පූලේ ලමෝද් රූස් (FRICASSEE DE POULET - LA MODE RUSSE)* නම් භෝජනය. වෙනත් වචනවලින් කියනවා නම් රුසියානු පිළිවෙළට පිසූ කුකුළුමස්, තක්කාලි සහ හතු ඉස්ටුව. මේ ඉස්ටුව පමණක් ගත්තාම ඒක කුකුළුමස් හෝ කළුකුං මස් යොදාගෙන ප්‍රංශයේ පිළියෙල කරන සම්ප්‍රදායික කෑමක්. නමුත් ඒක රුසියානු ක්‍රමයට පිළියෙල කිරීම මගේ නිෂ්පාදනයක්. මං ඒකට බීට්රූට්, රතු හා කළු කැවියාර් යොදා ගත්තා. ප්‍රංශයේදී අප යොදන කැල්වඩෝ නම් ඇපල් බ්‍රැන්ඩි වෙනුවට මම යෙදුවේ රුසියානු වොඩ්කා."

"ඔබ ඒ කරන විස්තරයටත් කටට කෙළ උනනවා. එය අතිශයින්ම රසවත් බවට සැක නෑ" මම කීවෙමි.

"මගේ ඒ නිර්මාණය අතිශයින්ම සාර්ථක වුණා මහත්මයා. ඒකෙ රසවත් බව ගැන මට ලැබුණු සහතික නිමක් නෑ. එහෙම කියූ සමහර දෙනෙක්, විවිධ කෑම රස බලමින් ලොව පුරා සංචාරය කරන රාජ්‍ය නායකයන්.

මං මෙය නිර්මාණය කළේ එක්තරා විශේෂ අවස්ථාවකට. ඒ තමයි රුසියාවේ සාර් රජතුමා සහ සරීනා රැජින එංගලන්තයට සම්ප්‍රාප්ත වූ අවස්ථාව. ඒ මීට අවුරුදු කිහිපයකට කලින්. එහි සුවිශේෂත්වය නිසාම මං එය නිතර පිළියෙල කළේ නෑ. එන අමුත්තෙකුට ඕනෑම වෙලාවක ඇණවුම් කරන්න හැකි විදියට

* මෙම සූප වට්ටෝරු පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.





මෙනු කාඩ්පතේ එය සඳහන්ව තිබුණෙත් නෑ. මීට මාස දහයකට පමණ කලිනුත් මම විශේෂ ඇණවුමකටත් එය පිළියෙල කළා. ඒ ඕලන්දයේ බියට්‍රිස් රජ කුමරියගේ විසිඑක් වැනි උපන්දින උත්සවය වෙනුවෙන් පැවැත්වූ රාත්‍රී-භෝජන සංග්‍රහයට......."

".......... ඉතින් නොදම්බලන්ඩ් හෝටලයේ මෙනු පතේ මෙය දුටුවාම ඔබ පුදුමයට පත් වුණාද?" හෝම්ස් ඇසීය.

"පුදුමය කියන්නේ මහත්මයා; මං එක්වරම තිගැස්සුණා. සාමාන්‍ය තත්ත්වයට එන්න මට මිනිත්තු කිහිපයක් යන්න ඇති. මී ළඟට ඒ බවක් නොපෙන්වමින් මම මේ භෝජනය ඇණවුම් කළා. කියන්නත් කනගාටුයි මහත්වරුනි. මොවුන්ගේ බොජුනෙත් මා පිළියෙල කළ බොජුනෙත් රසයේ කිසිම වෙනසක් තිබුණේ නෑ. සෑම විදියකින්ම ඒ රසම යි!"

"එතකොට ඔබ කියන්නේ කවුරු හරි ඔබේ සූප වට්ටෝරුව හොරකම් කරල කියලද?"

"ඔව්. සහතිකෙන්ම ඔව්"

"නමුත් මෙහෙම වෙන්න බැරිද ගිලිමෝ මහත්මයා? ඔබේ කෑම රස බැලූ දක්ෂයෙක් ඒක ඒ විදියටම අලුතෙන් නිර්මාණය කරනවා?"

"තර්කානුකූලව ඒක එහෙමයි කියන්න පුළුවනි" ගිලිමෝ කීය. "නමුත් හැම විශේෂඥ සූප වේදියාටම ඔවුන්ගේ පුංචි පුංචි රහසිගත ක්‍රම හා විධි තියෙනවා. තවත් සූපවේදියකු මොන තරම් දක්ෂ වුණත්, අර රහස් ක්‍රම හා විධි කිසිම විධියකට හිතාගන්නවත් බෑ. පිළියෙල කරන භෝජනය අතිශයින්ම සුවිශේෂ එකක් කරන්න, අප එකතු කරන විවිධ දේවල් තියෙනවා. උදාහරණයක් වශයෙන් එය ස්පාඤ්ඤ ෂෙරි විශේෂයක ස්වල්පයක්, ඉතාලි ඔරිගානෝ, චීන සරසපාරිලා හෝ පෘතුගාල ඉඟුරු ටිකක් විය හැකියි; එය ඉන්දියාවෙන් ගෙනෙන සාදික්කා හෝ කුරුඳු කුඩු වෙන්නත් පුළුවනි; ඒක ඉන්දු චීනයෙන් හෝ ආජන්ටිනාවෙන් ගෙනෙන, යුරෝපයේ නැති දුර්ලභ ශාකයක කුඩා ඉති කැබැල්ලක් වෙන්නත් පුළුවනි. ඒක අපි කවදාවත් කාටවත් හෙළි කරන්නේ නෑ.

මේ මං කියන රස කාරකය භෝජනයේ නොතිබුණොත්, ඒක මට ඒ මොහොතෙම වැටහෙනවා. නමුත් මේ අවස්ථාවේ මං රස බැලුවේ, මගේ නිර්මාණය හොරකම් කරගෙන, මට හොරා

වෙනත් මුළුතැන්ගෙයක, අන්තිම අකුරටම නිවැරදිව පිළියෙල කළ ව්‍යාංජනයක්."

"නමුත් මෙහෙම වෙන්න බැරිද?" හෝම්ස් ඇසීය. "ඔබ යටතේ සේවය කරන සූපවේදියකු ඔබ ආහාරය පිළියෙල කරන විධිය බලාගෙන ඉඳලා, එය ලියාගෙන නොදම්බලන්ඩ් හෝටලයේ ප්‍රධාන සූපවේදියාට හොර රහසේ විකුණනවා. එහෙමත් නැත්නම් ඔබේ ආයතනයේ සේවය කළ අයෙකු ඔබේ තැනින් ඉවත් වී එහේ රැකියාවට ගිහින්?"

"ඔව්. එහෙම වෙන්න බැරි කමකුත් නෑ. නමුත් නොදම්බලන්ඩ් හෝටලයේ ප්‍රධාන සූපවේදියා– මං ඔබට කියූ ට්‍රේසි මහත්මයා වෘත්තීය සදාචාරාත්මක බවට ගරු කරන කෙනෙක්. මගේ සේවයෙන් ඉවත් වී ගිය කෙනෙකු ට්‍රේසි ඔහුගේ සේවයට බඳවා ගත්තත්, මගේ සූපවේදී රහස් වට්ටෝරු ඔහුගෙන් අසා ගනීවි කියල මං හිතන්නේ නෑ. හෝම්ස් මහත්මයා. අපිත් එක්තරා ආකාරයක කලා ශිල්පීන් කියල කෙනෙකුට හඳුන්වන්න පුළුවනි. අපෙත් තියෙනවා ගර්වයක්, සාඩම්බර බවක්. මං නිර්මාණය කරන කෑම ජාති මගේමයි. සමහර සුවිශේෂ කෑම පිළියෙල කරද්දී එක්තරා විශේෂ අවස්ථාවකදී මං එය කරන්නේ ඉතාම රහසිගතව."

"එහෙම නම් ඔබට කරන්න තිබුණේ එකම දෙයයි. ඇයි ඔබ ට්‍රේසි මහත්මයා හමුවෙලා ඇහුවේ නැත්තේ මේ පුදුමාකාර සිදුවීම ගැන?"

"විශ්වාස කරන්න හෝම්ස් මහත්මයා. ඒක කරන්න තමයි මං සූදානම් වුණේ. ඒ මොකද හෝටලයේ මෙනුපත මං තව දුරටත් පරීක්ෂා කර බැලුවා. එහි තිබූ තවත් කෑම ජාති තුනක් හෝ හතරක් මගෙන් සොරකම් කරගත් ඒවා කියා මට විශ්වාසයි. ඉතාලියේදී ජ්‍යෙෂ්ඨ සූපවේදියෙකුගෙන් මා උගත්, පීට්සා නපොලිතානා (PIZZA NAPOLETANA) නම් පීට්සා වර්ගය ඉන් එකක්. එය බොලොඤ්ඤාවේ මොසරෙල්ලා චීස් හා ඇන්චෝවි දමා පිළියෙල කරන එකක්. තවත් එකක් බොදිනෝ දි රිකොත්තා (BODINO DI RICOTTA) නම් අතුරුපසක්. එය, රම්, රිකොත්තා චීස්. ආමන්ඩ් හා කෝන් සිරප් දමා පිළියෙල කරන ඉතාම ප්‍රණීත එකක්........."

මෙවර කෙළ ගිළුණේ මගේ මිත්‍ර හෝම්ස්ට බැව් මම දුටුවෙමි.





"ගිලිමෝ මහත්මයා" හෝම්ස් කීවේ සතුටු සිනාවක් මුව'ගට නැගෙද්දීය. "ඔබ මේවා විස්තර කරද්දී අපේ අවධානය ප්‍රධාන කාරණයෙන් ඉවතට ඇදී යනවා. ඔබ කළ විමසීමට ට්‍රේසි මහත්මයා දුන්නේ මොන වගේ පිළිතුරක්ද?"

"මට කිසිසේත් තේරුම් ගැනීමට බැරි ගැටලුවකට මං මුහුණ දුන්නා හෝම්ස් මහත්මයා. නොදම්බලන්ඩ් හෝටලයට යන ගමනට මං අනිවාර්යයෙන්ම යොදා ගන්නේ, මටත් නිවාඩු බදාදා දවස. ඒ මොකද එදිනට ට්‍රේසිත් එම හෝටලයේ නොවරදවාම සිටිනා නිසා. කෑම වේල අවසන් කළ පසු අපි දෙන්නා එකට වාඩිවෙලා කොඤ්ඤැක් වීදුරුවක් හෝ දෙකක් තොල ගානවා. ඉතින් එදා කෑම වේල අවසන් කළ පසු මං සේවකයාට කිව්වා ට්‍රේසි මහත්මයා හමුවීමට කැමති බව. එවිට ඔහු දුන් පිළිතුරෙන් මා විමතියට පත්වුණා. ට්‍රේසි එදා පමණක් නෙමෙයි; ඊට දින තුනක් හතරක් කලින් ඉඳලා හෝටලයේ රාජකාරි සඳහා පැමිණ නැහැ. ඒ විතරක් නෙමෙයි. ඔහු නොපැමිණෙන බවක් කිසිවෙකුට දැනුම් දීලත් නැහැ."

"ඔහු ගැන සොයා බලන්න හෝටලයේ අය උත්සාහ කරලා නැද්ද?"

"ඔවුන් උත්සාහ කර තිබුණා. ඔහු පදිංචි වී සිටි නවාතැනට ගොස් ඔහුගේ දොරට තට්ටු කළත් කිසිම පිළිතුරක් ලැබිලා නැහැ."

"එතකොට ඔබ සඳහන් කළ සුවිශේෂ ආහාර වේල මෙනුපතට ආවේ කොහොමද කියා ඔබ විමසුවේ නැද්ද?"

"ඒ ගැන මං විමසුවා මහත්මයා" ගිලිමෝ කීය. "නමුත් යම් තරමක් හෝ තොරතුරක් දැන හිටියේ තවත් සූපවේදියකු වූ චාල්ස් පියරි නම් තැනැත්තා පමණයි. ඉරිදා උදේම හෝටලයට ආ ට්‍රේසි හුගක් වෙහෙස මහන්සි වෙමින්, ඒරිකසේ දි පූලේ ව්‍යාංජනය පිළියෙල කළාලු. පීට්සාව සහ අතුරුපස ඊළඟ දවසේ පිළියෙල කරන්න ද්‍රව්‍ය සැකසුවාලු. ඔවුන් මේ විදියට සූදානම් වුණේ විශේෂ රාජකීය අමුත්තෙකුට සංග්‍රහ කරන්නලු. ප්‍රධාන ව්‍යාංජනය රස බැලීමට උවමනා නිසා, එය වහාම මෙනුපතට දමා තිබෙනවා"

"ගිලිමෝ මහත්මයා. මට එතරම් පැහැදිලි වුණේ නැති මෙන්න මේ කාරණය ගැන යළිත් වරක් ඔබෙන් අහන්නම්." හෝම්ස් කීය. "ඔබ කියන ඔය කෑම වර්ගය පිළියෙල කරන්නේ ඉතා කලාතුරකින්

නේ. එහෙම දෙයක් කරන්න නම් ඊට පුරුදු පුහුණු වූ සේවකයන් හෝටලයේ සිටිය යුතුය නේද?"

"එහෙමමත් නැහැ මහත්මයා." ගිලිමෝ කීය. "හෝටලයක ප්‍රධාන සූපවේදියා එහි ස්ථිර සේවකයකු වගේ, දීර්ඝ කාලයක් එහි රැඳෙන කෙනෙක්. නමුත් අනික් සේවකයින් හැම දෙනෙකුම එහෙම නැහැ. ඔවුන් බොහෝ දෙනෙකු ආහාරයක් පිළියෙල කරන්නේ ඔවුනට ලියා දී ඇති හෝ කටින් කියන උපදෙස් අනුවයි. නමුත් මෙහෙම දේකුත් වෙන්න පුළුවනි. මගේ ඉහළ සේවකයෙකුට පුළුවනි, ආහාරය සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය වට්ටෝරුව හා ක්‍රමය ගැන මං දෙන උපදෙස් අහගෙන ඉඳලා, ඒව ලියාගෙන ගිහිං නොදම්බලන්ඩ් හෝටලයට හොරෙන්ම විකුණන්න. නමුත් එහෙම වුණා නම්, මං ඔබට කියූ, මටම සුවිශේෂ, මං රහසිගතව ව්‍යංජනයට එකතු කරන දේවල් ඔවුන් දන්නේ නෑ."

"ඔබේ ඒ රහසිගත තොරතුරු ආදිය, සූප වට්ටෝරු, ඔබ පොතක ලියා තබනවා ඇති. ඔබ ඒ පොත තබා තිබෙන්නේ කොහිද? එයට ප්‍රමාණවත් තරම් ආරක්ෂාවක් ලැබෙනවාද?"

"මහත්මයා. මං ඒක ඉතාම උනන්දුවෙන් පරෙස්සම් කර ගන්නවා. ඒක තියෙන්නේ මගේ කාර්යාල කාමරයේ ලාච්චුවක යතුරු දමලා. මං හෝටලයේ නොමැති වෙලාවට එම කාර්යාලය මං යතුරු දමා වසනවා. මගේ අනුදැනුම නැතිව කාටවත් බෑ මේ ලාච්චුවට ළං වෙන්න. එහෙම දෙයක් සිදුවූ බවට සලකුණක්වත් මං දුටුවේ නෑ"

"හොඳයි. මේ ගැන සොයා බැලීම මං භාර ගන්නම්. මුලින්ම හෝටලයේ මේ කියන කාර්යාල කාමරය මං පරීක්ෂා කරන්න ඕන. ඒ සඳහා මං කීයට ආවොත්ද ඔබට පහසු?"

"සවස හතරට ඔබට ආ හැකිනම් පහසුයි මහත්මයා"

"හොඳයි. එහෙනම් අද හවස හතරට අපි කොස්මොපොලිටන් හෝටලයේදී ඔබ හමුවෙනවා. සුභ දවසක්"

අපෙන් සමුගැනීමට පෙර අමුත්තා තවත් එක් ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය.

"මහත්මයා. ඔබ මේ සඳහා අය කරන ගාස්තු ගැන මට කිසිවක් කීවේ නැහැ?"

"එය ඔබට ගෙවීමට පහසු මුදලක් වේවි. එය ප්‍රශ්නයක් කරගන්න එපා"





"ඔබට ස්තුතියි හෝම්ස් මහත්මයා"

* * *

"නොයෙක් වෘත්තීන් වල යෙදෙන අය විවිධ ගැටලු අරගෙන මා ළඟට ඇවිත් තියෙනවා" හෝම්ස් කීය. "ඒත් සූපවේදියෙක් මා ළඟට ආවෙ මේ පළමුවැනි වතාවට. ඒකත් මිනීමැරුමක් හෝ මංකොල්ලයක් ගැන පැමිණිලි කරන්න නෙමෙයි; ඔහුගේ ආහාර පිළියෙල කිරීමේ වට්ටෝරු සොරු අරගෙන තිබෙන බව පැමිණිලි කරන්න. ඔබට මොනවද වොට්සන් ඒ ගැන හිතෙන්නෙ?"

මා එයට පිළිතුරක් දීමට සූදානම් වූවා පමණි. වේගයෙන් පැමිණි අශ්ව කරත්තයක් අපේ නිවහන ඉදිරියේ නැවැත්වූයේ මහත් හඬක් නංවමිනි. එයින් බට කිසිවෙක් තියුණු හඬක් නංවමින් අපේ උඩු මහලට දිව ආවේය. ඔහු අපේ විසිත්ත කාමරය ඇතුළට කඩා වැදුණේ දොරට තට්ටු කිරීමකටවත් පමා නොවෙමිනි.

මොහු කවුදැයි එක්වරම මට හඳුනාගැනීමට නොහැකි විය. තදින් හති දමමින් සිටි ඔහුගේ මුහුණ රතු වී තිබිණ. එයින් නොනවත්වාම ඩහදිය වැගිරිණි. විමතියට පත් හෝම්ස් තම අසුනෙන් නැගිට්ටේය. ඔහු තත්පර කිහිපයකින් අමුත්තා කවුදැයි හඳුනා ගත්තේය.

"ආ මෙ ඩව්බිගින් නේ" හෝම්ස් කීය. "මං බැලුවා කවුද මේ ගෙදරට කඩා වැදුණේ කියල. මොකද අප්‍රිකානු සිංහයෙකු වත් ලන්ඩන් සත්ත්වෝද්‍යානයේ කූඩුවකින් එළියට පැනලද? ඔබේ හැටි දුටුවාම මට හිතෙන්නේ, ඩව්බිගින් පිටිපස්සෙන් සිංහයෙකු එළවාගෙන එන්න ඇති කියලයි!" එසේ කී හෝම්ස්ගේ මුවට නැඟුණේ උපහාසාත්මක සිනාවකි.

හර්බට් ඩව්බිගින් නම් මේ පොලිස් පරීක්ෂකවරයා, අපරාධ පරීක්ෂණ දෙකක් හෝ තුනක් විමසීමේදී, මීට පෙර අපට හමුවී තිබිණ. උද්ධච්ච පුද්ගලයකු වූ ඔහු සැමවිටම සිතා සිටියේ, තමා සියල්ල දත් ප්‍රාඥයෙකු ලෙසයි. එබැවින් ඔහු සමග කටයුතු කිරීමට හෝම්ස් කැමැත්තක් නොදැක්වීය.

"හෝම්ස් මහත්තයා! හෝම්ස් මහත්තයා!" ඩව්බිගින් කීවේ හති දමමිනි. "මහා භයානක අපරාධයක්. මට තේරෙන්නෙ නෑ මොනව කරන්නද කියල. ඒක දැක්කම පිස්සු හැදෙනවා"

"මෙහෙන් වාඩිවෙන්න ඩව්බිගින්" හෝම්ස් කීවේ කාරුණික ස්වරයකිනි. "වාඩිවෙලා ටිකක් ගිමන් හරින්න. ඊළඟට හොඳට

හුස්ම ඉහළ පහළ ගැනීමට මිනිත්තු දෙකක් ගත කරන්න. ඔබ කැමතිද මොනවා හරි බොන්න? බ්‍රැන්ඩි ස්වල්පයක්? නැත්නම් වතුර ටිකක්? මොනවද ඔබට ඕනෑ?....... කමක් නෑ මනුස්සයෝ. රාජකාරි වෙලාවෙ වුණාට කමක් නෑ. ඔබේ ප්‍රධානීන් මේ වෙලාවෙ මේ පැත්තෙ එන එකක් නෑ. ආවත් මං ඔබව බේරාගන්නම්කෝ. වොට්සන් වතුර වීදුරු බාගයකට බ්‍රැන්ඩි ටිකක් කලවම් කරලා දෙන්න. මෙයාගෙ හිතේ ලොකු කැලඹීමක් තියෙන්නේ. ඒක සන්සුන් කරගෙන ඉන්න එපාය, කියන්න තිබෙන කාරණා එළියට දමන්න."

මා දුන් බ්‍රැන්ඩි මිශ්‍ර කළ වතුර වීදුරුව, ඔහු එක හුස්මට බී අවසන් කළේය. ඒ රෝගී බවට පත් අයෙකු ක්ෂණිකව එයින් මිදීමට ඖෂධයක් ගිල දමන ආකාරයෙනි. තම සිහි එලවා ගැනීමට මෙන් මිනිත්තුවක් පමණ නිහඬව සිටි ඔහු කථාව ඇරඹුවේ ඉන්පසුවය.

"හෝම්ස් මහත්මයා. මේක මිනීමැරුමක්! එහෙම එකක් මං ජීවිතේටම දැකල නෑ. මං දෙවියන්ට. කියන්නේ ආයෙමත් එහෙම එකක් මට දකින්න සලස්වන්නත් එපා කියලයි.

මියගිය පුද්ගලයාගේ අසල්වැසියෙකුගෙන් පොලීසියට කැඳවීමක් ලැබුණා. ඔහුගේ පැමිණිල්ල වුණේ ඒ පැත්තෙන් දුර්ගන්ධයක් හමන බව. මුලින් එතැනට ගියේ පොලිස් භටයන් දෙදෙනෙක්. ඔවුන් දොරට නොනවත්වාම තට්ටු කළාලු. එහෙම කළත් පිළිතුරක් නො ලැබුණු නිසා ඔවුන් දොර කැඩුවා. මාව කැඳෙව්වේ ඊට පස්සේ.

මහත්මයා. ඒක සත්ත්ව ඝාතකාගාරයක් වගේ. ඊටත් අන්තයි. කාමරය පිරෙන්න ලේ සහ නිලමැස්සෝ. එතැන දුර්ගන්ධය නම් මනුස්සයෙකුට උහුලන්න බෑ. මිනිසෙකුගේ ශරීරය කෑලි කෑලි වලට කපා දමලා. ඒකට පාවිච්චි කරන්න ඇත්තේ පොරවක් වැනි මොකක් හරි ආයුධයක් වෙන්න ඇති. මේ දවස්වල තිබෙන උණුසුම් කාලගුණය නිසා වෙන්න ඇති. කෘමි සතුන් උන්ගේ වැඩ පටන්ගෙන. දොර කැඩූ පොලිස් භටයන්ගෙන් එක් අයෙක් එම දර්ශනය දැකලා ක්ලාන්ත වුණා. ඔබ බීමට යමක් නොදෙන්න, තව ටිකෙන් මටත් ඒ දේ සිදු වෙන්න තිබුණා."

"ඩව්බිගින්. ඔබට විශ්වාසද පොලීසියේ කවුරු හරි එතැන දේවල් එහා මෙහා කළේ නැහැ කියල? එතැන හෝඩුවාවන් මැකී යන විදියේ දෙයක් කා අතින් හෝ සිදුවුණොත්..........?





"මොනවා කතා කරනවාද හෝම්ස් මහත්තයා? එහෙම දෙයක් සිදුවෙන්න හැටියක් කොහොමටවත් නෑ. ඕකට අත ගහල ඒව එහා මෙහා කරන්න, පොලීසියේ මිනිහෙක් කැමැත්තෙන් නම් ඉදිරිපත් වෙන්නෙ නෑ. කළ යුත්තේ මොකක්ද කියල එක්වරම මට හිතාගන්න බැරිවුණා. ඔබ මීට කලින් පොලීසියට උදව් කරල තියෙන බව අන්තිමට මට මතක්වුණා. ඒකයි ඔබව හොයාගෙන ආවෙ"

"බොහොම හොඳයි. ඔබ ස්කොට්ලන්ඩ්යාඩ් එකටත් මේ ගැන දන්වා යැව්වද?" හෝම්ස් ඇසීය. "මං හිතන්නේ පශ්චාත් මරණ පරීක්ෂණයත් ඉක්මනින් සිදු කරන්න වේවි. පොලිස් ශල්‍ය වෛද්‍යවරයා නම් ඒවි. මෙහෙම වෙලාවට ව්‍යවහාරික වෛද්‍ය විශේෂඥයෙකුගේ අදහසත් ලබාගෙන තිබීම හුඟක් ප්‍රයෝජනවත්. ඒ නිසා මහාචාර්ය කීත් ෆින්ස්බරිට ඇනුම් දීමට කටයුතු කරන්න.

කොහොම වුණත් මෙතැනින් පිටවී යන්න කලින් මං කැමතියි තවත් තොරතුරු ටිකක් දැන ගන්න. කවුද මේ මියගිය තැනැත්තා? කොහේටද අප යා යුත්තේ?"

"අප යා යුත්තේ වයිට් චැපල්හි ඩීක් වීදියේ නිවසකට." ඩව්බිගින් කීය. "මියගිය පුද්ගලයා ප්‍රංශ ජාතිකයෙක්. ගෙවල් අයිතිකාරයා කියන හැටියට මේ ප්‍රංශ ජාතිකයා රැකියාව කරල තියෙන්නේ නොදම්බලන්ඩ් හෝටලයේ. ඔහු එහි ප්‍රධාන සූපවේදියා කියලයි පවසා තිබුණේ."

"එහෙම නම් මියගිහින් ඉන්නේ ෂෝන් ක්ලෝඩ් ට්‍රේසි මහත්මයා වෙන්න ඇති?"

තම සටහන් පොත දිග හැරගෙන අපට කරුණු හෙළි කරමින් සිටි පොලිස් නිලධරයාගේ කට බාගෙට ඇරිණි. අතේ තිබූ සටහන් පොත අතෙන් ගිලිහී බිම වැටිණි.

"මො....... මොනවා? හෝම්ස් මහත්මයා...... ඔබ කිව්වා හරි. ඔබ කොහොමද ඒ කාරණාව දැනගෙන හිටියේ? මේව දැනගත හැකි අද්භූත බලයක් ඔබට තියෙනවාද?"

"කොහොමටවත් නෑ ඩව්බිගින්. මෙතැනට ඇවිත් හිටියා මගේ අනුග්‍රාහකයෙක්. ඔහු මෙතැනින් පිටවෙලා ගියේ මීට මිනිත්තු කිහිපයකට කලින්. ඔය සූපවේදී ට්‍රේසි ගැන මගේ අනුග්‍රාහකයා තමයි මට කිව්වේ"

"මොනවද ඔහු කිව්වේ?"

"තමන් රැකියාව කළ නොදම්බලන්ඩ් හෝටලයට ෂෝන් ක්ලෝඩ් ට්‍රේසි දින ගණනාවකින් ඇවිත් නැහැ. ඔහු කොහේ ගියාද ඔහුට කුමක් වුණාද කියල කිසිවෙක් දැන හිටියෙ නැහැලු"

"ඒ මිනිහා මැරුම් කාල තියෙන්නේ දින කිහිපයකට කලින්" ඩව්බිගින් කීය. "එහෙම නම් දැන් ඔබේ ගැටලුව විසඳෙනවා"

"කොහොමටවත් නෑ" හෝම්ස් කීය. "මට පෙනෙන්නේ ගැටලුව වඩාත් සංකීර්ණ එකක් වෙන බවයි. අපි යමු අපරාධය සිදුවූ ස්ථානයට"

* * *

යුද්ධ හමුදාවේ ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස මම දිගු කලක් සේවය කර ඇත්තෙමි. බෝම්බවලින් මිනිස් සිරුරු කැබලි කැබලි වලට කැඩී, ලේ ගංගා ගලාගිය තැන් මම අප්‍රමාණව දැක ඇත්තෙමි. එබැවින් එවැනි දසුන් දැන් මගේ සිතේ කැලඹීමක්, භීතියක් හෝ පිළිකුලක් ඇති නොකරයි. එහෙත් එදා වයිට් චැපල්හි ඩීක් වීදියේ නිවස තුළ මා දුටු දර්ශනයෙන් කැලඹීම, භීතිය හා පිළිකුල ආදී සියල්ල මගේ සිතේ ඇති විය.

වෙන්වී තිබූ හිසේ දෙනෙත් තවමත් විවෘතව තිබිණි. ඔහුගේ කළු පැහැති හිසකෙස් කොටට කපා තිබූ අතර උඩු තොලේ සිහින් උඩු රැවුලක් ද නිකටේ කළු එළු රැවුලක් ද තිබුණේ, දහහත් වැනි සියවසේ මෝස්තර සිහි ගන්වමිනි. මියගිය පුද්ගලයා වයසින් අවුරුදු හතළිහක පමණ වූ අයෙකු වන්නට ඇතැයි මම නිශ්චය කළෙමි. ඔහුගේ සිරුර මඳක් තරබාරු එකක් විය. සිරුරේ ගාත්‍රා එකින් එක වෙන්කොට තිබිණි.

"ගාත්‍රා සිරුරෙන් වෙන්කර ඇති ආකාරය ගැන මං ඔබට යමක් කියන්නද?" හෝම්ස් විමසුවේ පොලිස් නිලධරයාගෙනි.

"ඔබේ නිරීක්ෂණ වලින් මට ඇති වැඩක් නෑ" ඩව්බිගින් කීවේ ඉතා අවිනීත අයුරෙනි.

"වොට්සන් ඒ ගැන ඔබේ අදහස මොකක්ද?"

"මේව වෙන් කරල තියෙන්නෙ, අපි සාන්ත බාතොලමියු රෝහලේදී, ඉගෙනීම සඳහා මළසිරුරු විච්ඡේදනය කළ ආකාරයට නම් නෙමෙයි." මම කීවෙමි. "මේක ශල්‍ය වෛද්‍ය විද්‍යාව ගැන දැනුමක් ඇති කෙනෙකුගේ වැඩකුත් නෙමෙයි; බොහෝ විට මස්කඩ කාරයෙකුගේ වැඩක්. ඊට යොදා ගෙන තිබෙන්නෙත් හරක්





ගාතවල කොටස් වෙන් කිරීමට යොදා ගන්නා ලොකු පිහියක් නැත්නම් පොරවක් කියලයි මට හිතෙන්නේ"

"විශිෂ්ටයි වොට්සන්. මටත් හිතෙනවා ඔබ කියූ දේ නිවැරදියි කියා. දැනටමත් අපට ලැබී තිබෙන දත්ත වලටත් ඒක හොඳින් ගැලපෙනවා"

"ඒ කොහොමද?" ඩව්බිගින් ඇසීය.

"මියගිය පුද්ගලයා හෝටලයක සූපවේදියකු බව ඔබ කිව්වානේ"

"එතකොට ඔබ කියන්නේ අපරාධය සිදුකළ පුද්ගලයාත් ඉවුම් පිහුම් ක්ෂේත්‍රයේම කෙනෙකු කියලද?"

"එහෙම වෙන්න බොහොම දුරට ඉඩ තියෙනවා" හෝම්ස් කීය.

"හෝම්ස් මහත්මයා" ඩව්බිගින් කීය. "ඔබ කිව්වානේ මේ පුද්ගලයා ගැන තොරතුරු, ඔබේ අනුග්‍රාහකයෙකුගෙන් අහන්න ලැබුණා කියල. මොනවද ඔබට අහන්න ලැබුණේ?"

"මේ පුද්ගලයා - එනම් ෂෝන් ක්ලෝඩ් ට්‍රේසි, නොදම්බලන්ඩ් හෝටලයේ ප්‍රධාන සූපවේදියා බව ඇත්තයි. නමුත් ඔහු අතින් විශාල අකටයුත්තක්, වංචාවක් සිදු වී තිබෙනවා"

"ඒ මොකක්ද?"

"මගේ අනුග්‍රාහකයා වන ගිලිමෝ මහත්මයා නිර්මාණය කළ භෝජනයක, ඉතාම රහසිගත ලෙස ආරක්ෂා කළ ආහාර පිළියෙල කිරීමේ වට්ටෝරුවක්, කවුරුන් හෝ හොරකම් කරලා. ඒ වට්ටෝරුවටම පිළියෙල කළ එම සුවිශේෂ කෑම වර්ගය, මේ ට්‍රේසි සේවය කළ නොදම්බලන්ඩ් හෝටලයේ තිබී ගිලිමෝටම හමුවෙලා තියෙනවා"

"හෝ හෝ! එහෙනම් හැම දෙයක්ම මට හරිම පැහැදිලියි" ඩව්බිගින් කීය. "ඔබේ අනුග්‍රාහකයාගේ වටිනා යමක් ට්‍රේසි, එනම් මොහු සොරකම් කරල තියෙනවා. ඒකට මොහුට දඬුවම ලැබිලා. එහෙම නේද?"

"ඔය තරම් පහසුවෙන් ඒ වගේ නිගමනයකට ඒම විශාල වැරැද්දක් ඩව්බිගින්" හෝම්ස් කීය. "ප්‍රමාණවත් තරම් සාක්ෂි නැතුව එහෙම දෙයක් නිශ්චිතව නිගමනය කරන්නේ කොහොමද?"

කබා සාක්කුවෙන් තම කාචය අතට ගත් හෝම්ස් පළමුව මෘත ශරීරයේ කොටස් පරීක්ෂා කර බැලීය. අනතුරු ඒවා එහා-

මෙහා කරමින් එම ස්ථානයේ පොළොවට හා ගෘහ භාණ්ඩ වලටද අවධානය යොමු කළේය. මේ අතර කුඩා මේසයක ලාච්චුවක තිබී, හෝම්ස්ට කළු පැහැති කවරයක් තිබූ ගනුදෙනු සටහන් පොතක් හමුවිය.

"අහා!" ඔහුට කියැවිණි. "කුතුහලයක් ඇති නොවන සිතක් තිබෙන ඔබටත්, මේක ගැන නම් ආශාවක් ඇති වේවි. එහෙම නේද ඩව්බිගින්" හෝම්ස් කීවේ සටහන් පොත දිගු කරමිනි.

එය අතට ගත් පොලිස් නිලධරයා පොත පෙරළා පිටු කිහිපයක් පරීක්ෂා කළේය.

"මේකෙ ඔක්කොම ලියල තියෙන්නේ ප්‍රංශ භාෂාවෙන් නේ" ඔහු කීය.

"ට්‍රේසි ප්‍රංශ ජාතිකයෙක් නේ. ඔහු තමන්ගේ භාෂාවෙන් නොලියා වෙන මොකකින් සටහන් තබා ගන්නද?" හෝම්ස් කීය.

"බලන්න මේකෙ සඳහන් දේ. මේසයක් සහ පුටු. අල්මාරියක්, ආදී තවත් ලී බඩු රාශියක් ගැන සඳහන්. මේ කාමරයේ අපට පේන්න මේස සහ පුටු ඇත්තේ නැහැ. අර කෙළවරේ තියෙන්නේ ඔහු කියන අල්මාරිය කියල හිතමු. නමුත් මේකෙ සඳහන් වෙන්නේ, අල්මාරිය සඳහා පවුම් තිහක් ගෙව්වා කියලයි."

"ඒ අල්මාරිය නම් හුගක් බාල එකක්. ඔය තරම් ලොකු මුදලක් ඒකට ගෙව්වා කියල හිතන්න අමාරුයි නේද?" මම ඇසීමි.

"ඔව්. ඒක නම් සම්පූර්ණ ඇත්ත." හෝම්ස් කීය. "විවිධ හේතූන් නිසා එහෙම දෙයක් වෙන්න පුළුවනි. එයින් පළමුවැනි එක මේ පොතේ අයිතිකාරයා ට්‍රේසි නොවෙන්නත් පුළුවනි. ඔහුගේ අත් අකුරු සාම්පලයක් සමග සසඳා බැලීමෙන්, ඒක පහසුවෙන්ම නිගමනය කරන්න හැකි වේවි. තවත් එකක් තමයි මෙහි සඳහන් ලී බඩු, අපට මේ කාමරයේ දකින්න ලැබෙන ඒවා නොවෙන්නත් ඉඩ තියෙනවා."

"ඒක හරිහැටි දැනගන්නෙ කොහොමද?"

"ඇයි ලී බඩු වෙළඳුන්ගේ ලේඛනයක් මේ පොතේම සටහන් වෙලා තියෙන්නෙ. අපට පුළුවනි ඔවුන්ගෙන්ම විමසා බලන්න. සමහරවිට ඔහු එංගලන්තයේ නිෂ්පාදනය කළ පරණ ලී බඩු ප්‍රංශයට අපනයන කිරීමේ ව්‍යාපාරයක් කළා වෙන්නත් පුළුවනි. මං දන්නවා





එවැනි ව්‍යාපාර කරන ආයතන ගැන. අවසාන වශයෙන් මෙහෙම දෙයක් වීමටත් ඉඩ තියෙනවා. පොතේ ලියාගෙන තියෙන්නේ අල්මාරිය කියල වුණාට, ඒකෙන් ඇඟවෙන්නේ සම්පූර්ණයෙන්ම වෙනස් දෙයක් වෙන්නත් පුළුවනි. ඔබට මතකද වොට්සන් අර ග්‍රොව්නර් හෝටලයේ මිනීමැරුම පරීක්ෂණයේදී, මැතිව් ජේජ් අපට කියූ කථාව? ඔහු අවි ආයුධ වෙළෙන්දෙකුගේ සේවකයා වෙලා හිටි අවස්ථාවෙ ගිණුම් පොත්වල ලියා ගත් හැටි: පතරොම් වලට ගම්මිරිස් කියල, වෙඩි බෙහෙත් වලට දුඹුරු සීනි කියල, පිස්තෝල උණ්ඩවලට රටකජු කියල ලියාගත්තා කිව්වෙ. මේකත් එහෙම දෙයක් විය හැකියි."

මීළඟට හෝම්ස් අපගේ අවධානය යොමු කළේ කාමරයේ මුල්ලකටය. එතැන ලී කුඩු සැහෙන ප්‍රමාණයක් විය. ඒ අසලම වූයේ වඩුවන් ලී විදීම සඳහා යොදා ගන්නා බුරුමයක් සහ එයට සවි කරන ඉස්කුරුප්පු සහිත කටු කිහිපයකි. සමහර කටු කැඩී ගොස් තිබිණ.

"හරිම අපූරුයි" හෝම්ස් කීවේ තම කාචය අතට ගෙන, එහි ආධාරයෙන් ලී කුඩු පරීක්ෂා කරමිනි. අනතුරුව ඔහු එයින් ස්වල්පය බැගින් තම අත්ලේ මැද තබා නැහැයට ළංකොට ආඝ්‍රාණය කර බැලීය.

"මේ නිසැකවම ඕක් දැවය හා චෙරිවුඩ් දැවය විදීමෙන් සෑදුණු ලී කුඩු. නමුත් පුදුමය කියන්නේ, ඒ දැව වර්ග දෙකෙන් එකකින්වත් සෑදුණු ලී බඩු දැනට මේ කාමරයේ නැහැ."

"හෝම්ස් මහත්මයා. ඔබ කියන්නේ ලී කුඩු පරීක්ෂාවෙන් එය අයත් දැවය කුමක්ද කියා ඔබට නිශ්චය කරන්න පුළුවන් කියලද?" ඩව්බිගින් කීවේ උපහාසාත්මක සිනාවක්ද සමග ය. "මම නම් ඒක විශ්වාස කරන්නේ නෑ"

"මේ අහන්න ඩව්බිගින්." හෝම්ස් කීය. "මේ ප්‍රබල කාචය අතට අරගෙන ලී කුඩු ඔබත් පරීක්ෂා කරල බලන්න. එතකොට ඔබට පෙනේවි මෙතැන තියෙන්නේ සිහින් ලී කුඩු පමණක් නෙමෙයි කියල. ආවුද වලින් දැවයක යම් කටයුත්තක් කරද්දී ලී කුඩු වලට අමතරව, දැවයෙන් සිහින් පතුරු කැබලිත් කැඩී යනවා. ලීය හඳුනාගැනීමට අන්න ඒවා තමයි වඩාත්ම ප්‍රයෝජනවත් වෙන්නේ. ඒ වගේමයි; ඒ දැවවල සුවඳ ඒවාට සුවිශේෂයි"

"එතකොට අප මේ පරීක්ෂණයේ මීළගට ඉදිරියට යා යුත්තේ කොහොමද?"

"ඒක හොඳ ප්‍රශ්නයක් ඩව්බිගින්. මෙතැනදී අපට හමුවුණා ලී බඩු වෙළඳුන්ගේ නම් සහ, ඔවුන් අලෙවි කළ ලී බඩු ගැන සඳහන් පොතක්. ඊට අමතරව වඩුවෙකුගේ ආවුද සහ ලී කුඩු. නමුත් ඊට අදාළ ලී බඩුත් මෙතැන නෑ. ඒ නිසා අප ඉදිරියට යා යුතු ආකාරය පැහැදිලියි. මෙහි සඳහන් ලී බඩු වෙළඳුන් හමු වී වහාම විමසා බැලිය යුතුයි"

"හෝම්ස් මහත්මයා" ඩව්බිගින් කීය. "ඔබට ඕනෑ එකක් කරන්න. නමුත් මං වැඩ කරන්නේ ඊට වඩා බුද්ධිමත් ආකාරයට. අපරාධකාරයා පැන යන කං ඉඳලා, ඊට පස්සේ කනගාටුවෙන් හූල්ලන්න මට බෑ. මං කරන්නේ මියගිය පුද්ගලයා ගැන දැන සිටි ඔබේ අනුග්‍රාහකයා හිරබාරයට ගන්න එකයි. ඔහුගේ නම සහ ලිපිනය ඔබ මට හෙළි කළ යුතුයි"

"මගේ අනුග්‍රාහකයා ප්‍රමාණවත් තරම් සාක්ෂි නොමැතිව හිරබාරයට ගැනීම අනුවණ ක්‍රියාවක්"

"ඒ හරිය මං බලාගන්නම්." පොලිස් නිලධරයා කීවේ තම තනතුර ගැන අනතුරු අඟවන හඬකිනි. "හෝම්ස් මහත්මයා. මං ඔබට මතක් කරන්න කැමතියි; මං ඉල්ලන තොරතුරු හෙළි කිරීම ඔබ ප්‍රතික්ෂේප කළොත්, ඔබ මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරන්න මට බලය තිබෙනවා. එතකොට ඔබට ඔබේ අනුග්‍රාහකයාගේ නම හෙළිකරන්න වෙන්නේ අධිකරණය ඉදිරියේ"

"හොඳයි. ඔහුගේ නම සහ ලිපිනය මං ඔබට දෙන්නම්" හෝම්ස් මඳ වේලාවකට පසු කීවේ තරමක අකමැත්තකිනි. "නමුත් මං ඔබෙන් එක ඉල්ලීමක් කරනවා. ඒ පුද්ගලයා අත් අඩංගුවට ගැනීම අඩුම වශයෙන් හෙට උදේ වන තුරු වත් ප්‍රමාද කරන්න."

"ඒක මගේ වැඩක්" ඩව්බිගින් පිළිතුරු දුන්නේ සාඩම්බර අයුරෙන් සිනාසෙමිනි.

"එතකොට ඔබට මේ සටහන් පොත උවමනා වෙන්නෙ නැද්ද?" හෝම්ස් විමසුවේ කාමරයේ තිබී හමු වූ සටහන් පොත පොලිස්කාරයාට පෙන්වමිනි.

"මට එපා. ඒකට කැමැති දෙයක් කරන්න ඔබට පුළුවනි. කොහොම වුණත් අපරාධකාරයා මගේ අතටම අල්ලා දීම ගැන ඔබට ස්තුතියි" කී ඩව්බිගින් සූපවේදී ගිලිමෝගේ නම සහ ලිපිනය තම පොතේ ලියා ගත්තේය.





ඉන්පසු අපි දෙදෙනා එතැනින් පිටවී ආවෙමු.

"ඩව්බිගින් කියන මෝඩයා මීට කලිනුත් මගෙන් උදව් ඉල්ලගෙන ඇවිත් තිබුණා" හෝම්ස් කීවේ අප ආපසු එන අතරය. "එහෙම වෙලත් මට බැරි උණානෙ පාඩමක් ඉගෙන ගන්න. තවත් සැරයක් ඔහුට උදව් කරන්න ගිය මමයි මෝඩයා"

"එතකොට හෝම්ස් ඔබට හිතෙන්නේ ජෝසෆ් ගිලිමෝ, කිසිම ආකාරයකින් අපරාධකාරයා නෙමෙයි කියලද?" මම ඇසීමි.

"කාරණා කිහිපයක් නිසා මට එහෙම හිතෙනවා වොට්සන්. එයින් පළමුවැනි එක මෙයයි. මියගිය පුද්ගලයාගේ අත්-පා කපා දමා තිබෙන්නේ වමත්කාරයෙකු විසින්. කැපුම් තුවාල හොඳින් පරීක්ෂා කළ නිසා, මට ඒක විශ්වාසෙට කියන්න පුළුවනි. නමුත් ගිලිමෝ දකුණු අත හුරු කෙනෙක්. ඒක අපට දකින්න ලැබුණා.

ඊළගට මේක හිතන්න. තමන් නිර්මාණය කළ සුවිශේෂ භෝජනයක වට්ටෝරුව කෙනෙකු සොරකම් කළා කියල, සූපවේදියකු තවත් මනුස්සයෙකු මරා දමාවිද? මට ඒක හිතන්නත් අමාරුයි. නමුත් මෙවැනි ඝාතනයක් කරන්න තරම් ඉතාමත් බරපතළ වෙනත් හේතුවක් තිබුණාද කියල අපට කියන්න බෑ. ගිලිමෝ ඒ හරිය අපට නොකිව්වා වෙන්න පුළුවනි.

අනික තමයි දින වකවානු. ගිලිමෝ නොදම්බලන්ඩ් හෝටලයේ කෑමට ගියේ බදාදා. ට්‍රේසි රැකියාවට නොපැමිණ, ආගිය අතක් නැතුව, ඒ වෙන කොටත් දින තුන හතරක්ලු. මට නම් මේ දිනවල ගැලපීම හිතට මදි.

තවත් වැදගත්ම කාරණයක් තමයි, මියගිය පුද්ගලයා හැඳ සිටි ඇඳුම් කෝ? අපට ලාච්චුවල තිබී ඉතාමත් පිරිසිදු ඇඳුම් ගොඩක් හමුවුණා. ඒවා සූපවේදීන් අඳින ආකාරයේ පිරිසිදු සුදුම සුදු ඇඳුම්. ලාච්චුවල එවැනි ඇඳුම් රාශියක් තිබුණා. නමුත් ඒ පුද්ගලයා මිය යද්දී හැඳ සිටි ඇඳුම්වලට මොකද වුණේ?"

"ඒ කාරණාව මගේ මොළේට ආවෙ නෑ" මම කීවෙමි.

"ඒක ඔබේ මොළේට ආවෙ නැති එක පුදුමයක් නොවෙයි. ඒ මොකද ඔබ ඒ වෙලාවෙ මළ සිරුරේ කැබලි පරීක්ෂා කරමින් සිටි නිසා. නමුත් ඒ වෙලාවෙ එතැනින් සොයාගත හැකි සාක්ෂි ගැන හොයා බලමින් හිටියේ කවුද? ඩව්බිගින්. ඒ ඇඳුම්වලට මොකද වුණේ කියන කාරණය ඔහුගේ මොළයට එන්න තිබුණා"

"ඔබේ අදහස මොකක්ද හෝම්ස්?"

"අපරාධකාරයා ඉක්මනින්ම මළ සිරුරේ ඇඳුම් ඉවත් කරගෙන ඒවා විනාශ කරන්න ඇති. නැත්නම් කොහේ හරි සඟවන්න ඇති කියලයි මං උපකල්පනය කරන්නේ. ඒ මොකද, මළ සිරුර හඳුනාගැනීම ඒ මගින් වළක්වාගන්න.

ඔහු මළසිරුර වෙත ඇවිත් එහි කොටස් වෙන් කරන්න ඇත්තෙ ඊට පස්සේ. නමුත් කුමක් හෝ හේතුවක් නිසා, යළිත් වරක් එතැනට ඒම ඔහුට දුෂ්කර කටයුත්තක් වුණා. ඒ නිසා තමන්ගේ කටයුත්ත ඔහු සම්පූර්ණයෙන්ම අත්හැර දැම්මා"

"ඔව්. එය සිදුවෙන්න ඇත්තේ ඒ ආකාරයට වෙන්න පුළුවනි. මීළඟට අපි කොහේටද යන්නෙ?"

"අපි යමු පොතේ සඳහන් පළමුවැනි ලී බඩු සාප්පුවට - මැකාති පාරේ පැට්‍රික් ඕ කීෆ් හමුවෙන්න"

අප ගිය කුලීරිය වෙළඳසල ඉදිරිපිටම නවත්වන ලදී. පැට්‍රික් ඕ කීෆ් මහතා තමාගේ වෙළෙඳ ව්‍යාපාරය ගැන කතාබහ කිරීමට කැමැති ප්‍රියමනාප පුද්ගලයෙකු විය. පැරණි ගෘහ භාණ්ඩ අලෙවි කිරීම ඔහුගේ විශේෂතම ක්ෂේත්‍රය බැවි, වෙළෙඳසලේ නාම පුවරුවේම සඳහන්ව තිබිණි.

"මෙකෙ සටහන් කරල තියෙන්නේ නම් ප්‍රංශ භාෂාවෙන්" හෝම්ස් කීවේ සටහන් පොතේ පිටුවක් පෙරළමිනි. "පහුගිය සැප්තැම්බර් මාසයේ ගිනි 13 කට විකුණූ ගෘහ භාණ්ඩ කට්ටලයක් ගැන ඔබට මතකද? බිලියඩ් මේස මෝස්තරයේ කකුල් සහිත, අඩි හතේ කෑම මේසයක් සහ පිටුපස බීරළු සහිත පුටු හයක්?"

"මට හොඳට මතකයි මහත්මයා" වෙළෙන්දා කීය. "මං ඒ ලී බඩු වලට ඊට වඩා සෑහෙන මුදලක් බලාපොරොත්තු වුණා. නමුත් මැකන්සි මහත්මයාගෙන් බේරෙන්න බැරි වුණා. ඔහු දිගින් දිගටම ඔහුගේ ගණනේ එල්ලී හිටියා. එක පැන්සයක්වත් වැඩිපුර ගෙවන්න ඔහු එකඟ වුණේ නෑ"

"මැකන්සි මහත්මයා?" හෝම්ස් විමසීය. "ඔහු නිතර ලී බඩු මිලදී ගන්න කෙනෙක්ද?"

"ඇත්තෙන්ම ඔව්. ඔහු සාමාන්‍යයෙන් ගන්නේ මීටත් වඩා පරණ ලී බඩු; ඈන් රැජින හෝ පළමුවැනි ජෝජ් ඒවා. ඔහුට හොඳ රසඥතාවයක් තියෙනවා"





"ඊළඟට මෙන්න මේ මේසය" හෝම්ස් කීය. "ගිය නොවැම්බරයේ අරගෙන තියෙනවා ඕවාල හැඩයේ වෙරිවුඩ් මේසයක්"

"ඒක ඉතාම අලංකාර මේසයක් මහත්මයා. අපරාදෙ කියන්න බෑ. මැකන්සි මහත්මයා ඒකට නම් සාධාරණ මුදලක් ගෙව්වා."

"ඔහු මේ ලී බඩුවලට මොකද කරන්නේ? ඒ ගැන ඔබට කියල තියෙනවද?"

"ඔහු මේවා ප්‍රංශයට අපනයනය කරන බවයි මට අහන්න ලැබුණේ. අපේ පෞරාණික ලී බඩුවලට, එහේ හොඳ වෙළෙඳපොළක් තියෙනවාලු. නැතුව මේවාට මේ තරම් මහන්සි වෙන එකේ තේරුම මොකක්ද?"

"ඔව් ඒක හරි" හෝම්ස් එකඟ විය. "ඔය මැකන්සි මහත්මයාගේ පෙනුම මොන වගේද කියල ඔබට කියන්න පුළුවන්ද?"

වෙළෙන්දා මඳ වේලාවක් තම නළල රැළි කරගෙන කල්පනා කළේය. ඔහුගෙන් පිළිතුරක් ලැබුණේ ඉන් අනතුරුවය.

"වයසක මහත්මයෙක්. මං හිතන්නේ වයස හැටක් විතර ඇති. කෙට්ටුයි. ඔබට වඩා අඟලක් හෝ දෙකක් උසින් අඩු ඇති. කොණ්ඩෙ සුදු පාටයි. හැබැයි බොහොම දුරට තට්ටෙ පෑදිලා. ඔළුවෙ පිටුපසට වෙන්න කොණ්ඩෙ ටිකක් දිගයි."

"නම මැකන්සි වුණත් ඔහු ප්‍රංශ ජාතිකයෙක් බව ඔබට විශ්වාසද?"

"ඒ ගැන කිසිම සැකයක් නෑ මහත්මයා. ප්‍රංශ උච්චාරණය අකුරටම තියෙනවා. සමහර තැන්වලදී ඉංග්‍රීසි වචනය වෙනුවට ඔහුට කියවෙන්නේ ප්‍රංශ වචනය"

"උඩු රැවුලක් හෝ යටි රැවුලක් එහෙම තියෙනවද?"

"එහෙම මොකුත් නෑ මහත්මයා. ඔහු සම්පූර්ණයෙන්ම රැවුල මුඩුකළ කෙනෙක්"

"ඕ කීෆ් මහත්මයා" හෝම්ස් කීය. "හොඳට මතක් කරලා මට මෙන්න මේ කාරණය කියන්න. ඔහු වමත හුරු කෙනෙක්ද දකුණත හුරු කෙනෙක්ද?"

වෙළෙන්දා මඳ වේලාවක් කල්පනා කළත් ඔහුගේ මුහුණට නැගුණේ හිස් බැල්මකි.

"එහෙම දෙයක් දකින්න මට අවස්ථාවක් ලැබුණෙ නෑ කියලයි මං හිතන්නෙ........"

"ඒ වුණත් ඔහු ඔබේ ලිපිලේඛන වලට අත්සන් තබන්න ඇති. එතකොට ඔහු අත්සන් කළේ........."

"හරි හරි! මට මතකයි! වමතින් තේන්නං අත්සන් කළේ. ඔබ කිව්වාමයි මතක් වුණේ. අපේ ඇණවුම් පොත මෙන්න මේ මේසය උඩ තියාගෙන, පැත්තකට ඇද කරලා, වමතින් තේන්නං අත්සන් කළේ. ඒක මට අමතක වුණු හැටි"

"ඔ කීෆ් මහත්මයා ඔබට ස්තූතියි" හෝම්ස් කීවේ අසුනෙන් නැගිටිමිනි. "ආයෙත් උවමනා වුණොත් අපි එනවා ඔබ හමුවෙන්න"

"ඕන දවසක එන්න මහත්මයා"

අපි ඔහුගෙන් සමුගෙන පිටවී ආවෙමු.

"ඉතින් වොට්සන්....... දැන් මොකක්ද ඔබේ අදහස?"

"ඒ කතන්දරයෙන් මං පත්වුණේ හරිම පුදුමයකට"

"ඔ කීෆ් කියූ දෙයින් මාත් පුදුමයට පත්වුණු බව ඇත්තයි" හෝම්ස් කීය. "එයින් අපට නිශ්චය කරන්න පුළුවන් මෙහෙම දෙයක් නේද වොට්සන්. ලී බඩු වෙළෙන්දා කියනවා නේ මැකන්සි කෙනෙකු ගැන. ඒ මැකන්සි තමයි නොදම්බලන්ඩ් හෝටලයේ ප්‍රධාන සූපවේදියා - ෂෝන් ක්ලෝඩ් ට්‍රේසි. ඒක එහෙම නම් අර කෑලි වලට කපලා මරා දමල හිටපු මිනිහා ට්‍රේසි වෙන්න බෑ. ඔහු තවත් කවුරු හරි කෙනෙක්. ඔහු ගැන අපට තවම අහන්න ලැබිල නෑ. ඔහු කවුරු වුණත් ඔහු දකුණත් කාරයෙක්; ඒ වගේම වෘත්තියෙන් සූපවේදියෙක් - අඩුම වශයෙන් හෝටලයක කුස්සියක උදව්කාරයෙකු විය යුතුයි කියලයි මං හිතන්නෙ"

"ඔබ කොහොමද හෝම්ස් එහෙම නිගමනයකට ආවෙ?"

"මනුස්සයින්ගෙ අත්වල තිබෙන සලකුණු වලින්, ඔවුන් යෙදී තිබෙන වෘත්තිය ගැන, මං ගැඹුරටම අධ්‍යයනය කරල තියෙන බව ඔබ දන්නවා. මං හිතන්නේ ඒ ගැන මං ලියූ පොත් පිංච ඔබ කියෙව්වා.

නිතරම කතුර හා දැළි පිහිය භාවිත කරන කරණවෑමියෙකුගේ ඇඟිලි හා අත්ල, නිතර රෙදි කපන ටේලර් කෙනෙකුගේ අත්ලට වඩා වෙනස්. යකඩ තලන කම්මල්කරුවෙකුගේ අත, ටෙනිස් ක්‍රීඩකයෙකුගේ හෝ දන්ත වෛද්‍යවරයෙකුගේ අතින් වෙන් කර හඳුනාගන්න පුළුවනි. හෝටලයක නිතර එළවළු කපන, මස් කපන සේවකයෙකුගේ අතෙත් - විශේෂයෙන්ම ඇඟිලිවල ඔවුනටම





සුවිශේෂ ලක්ෂණ තිබෙනවා. එයින් ප්‍රධානම ඒවා තමා ඇඟිලිවල ඇති වූ කැපීම් හා ඒවා සුව වූ සලකුණු. මොහුගේ එම ලකුණු සියයට අනූවක්ම තිබෙන්නේ වම් අතේ ඇඟිලිවල. එයින් කියන්න පුළුවනි මොහු දකුණු අත හුරු අයෙකු බව."

"ඉතින් ඔබ නිගමනයකට ආවාද?"

"තවමත් නෑ. ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව නිගමනයකට ඒම විශාල වැරැද්දක් බව මං හැම විටම කියන දෙයක් නේ"

"ඊළඟට අපි මොනවද කරන්නෙ?"

"අපි යමු අර පොතේ දෙවැනියට සඳහන් නම තියෙන ලී බඩු සාප්පුව හොයාගෙන. ඒ තමයි ස්කිනර් වීදියේ මොරිස් විල්කින්ස් සහ සමාගම"

අපි නොපමාව එම ලී බඩු වෙළෙඳසලට ද ගියෙමු. තමාගෙන් පෞරාණික ලී බඩු මිලට ගත් මැකන්සි මහතා ගැන ඔහු ද විස්තරයක් කළේය. එය කලින් ඕ කීෆ් නම් වෙළෙන්දා කළ විස්තරයට සෑම අතින්ම සමාන විය.

"වොට්සන්. දැන් අපට තියෙන්නෙ ජෝසෆ් ගිලිමෝ හමුවෙන්න කොස්මොපොලිටන් හෝටලයට යන්න. ගිහින් ඔහු එනතුරු බලා ඉඳිමු"

* * *

ලන්ඩන් නගර මධ්‍යයේ පිහිටා තිබූ කොස්මොපොලිටන් හෝටලය, ප්‍රමාණයෙන් විශාල එමෙන්ම අලංකාර ස්ථානයක් විය. අමුත්තන්ගෙන් ඉහළ ගාස්තු අය කළ මෙහි නවාතැන් ගැනීමට පැමිණියේ, සමාජයේ ඉහළම ප්‍රභූවරුන් හා කෝටිපති ව්‍යාපාරිකයන් පමණි. මෝකා ආර්යාව සතුව තිබූ ඉන්ද්‍රනීල මාණික්‍යය සොරුන් අතට පත් වූයේ මෙම හෝටලයේදී බවත්, එය සොයා දීමට ඉදිරිපත් වූයේ ෂර්ලොක් හෝම්ස් බවත්, මගේ පාඨකයනට මතක ඇතුවා නිසැකය.

සවස හතරට මිනිත්තු දෙකක් තිබියදී අපි එහි පිළිගැනීමේ නිලධරයා හමුවුණෙමු.

"අපට උවමනායි ඔබේ ප්‍රධාන සූපවේදී ජෝසෆ් ගිලිමෝ මහත්මයා හමුවෙන්න"

"මිනිත්තුවකට හිඳගන්න මහත්මයා. ඔහුට මම පණිවුඩයක් යවන්නම්"

මිනිත්තු කිහිපයක් ගතවෙද්දී ගිලිමෝ ගෙන් පණිවුඩයක් රැගත් සේවකයෙකු අප වෙත පැමිණියේය. ඒ අනුව ගිලිමෝ හමුවීම සඳහා අපි ඔහුගේ කාර්යාලය වෙත ගියෙමු.

"ඔබේ පැමිණීම ගැන ස්තුතියි මහත්වරුනි. කරුණාකර හිඳගන්න. මොනවද අලුත් ආරංචි?"

"ඔබ වෙත අරගෙන එන්න වෙලා තියෙන්නෙ අසුභ ආරංචියක් ගිලිමෝ මහත්මයා" හෝම්ස් කීය. "හෙට උදේ වෙන කොට සමහරවිට........ පොලීසිය මගින් ඔබව අත් අඩංගුවට ගන්න ඉඩ තියෙනවා!"

"දෙයියෝ සාක්කි! ඒ මොන වරදකටද?"

ගිලිමෝ තම අත පපුවට තද කරගත්තේය. ඒ සමගම ඔහුගේ තිගැස්සීම මම ඔහුගේ මුහුණේ දුටුවෙමි.

"ඔබේ මිත්‍ර ට්‍රෙසි මහත්මයා මරා දැමීම ගැන" හෝම්ස් කීය.

"මගේ මිත්‍රයා? ඔහු මරා දමලද?" ගිලිමෝගේ මුහුණෙන් පළ වූයේ ඔහු භීතියට පත් සලකුණුය.

"මගේ නම් විශ්වාසය ට්‍රෙසි මියගිහින් නැහැ කියලයි" හෝම්ස් කීය. "මළසිරුරක කොටස් පොලීසියට හමුවෙලා. පොලීසිය හිතන්නේ මියගිහින් ඉන්න තැනැත්තා ට්‍රෙසි කියලයි. ඊට අමතරව ඒ ඝාතනයට වගකිව යුත්තා ඔබ වියයුතු බව ඔවුන් නිගමනය කරලා"

"මං දෙවියන්ගෙ නාමයෙන් දිවුරන්නම් හෝම්ස් මහත්මයා. මං ට්‍රෙසි මැරුවෙත් නැහැ. වෙන කෙනෙකු මැරුවෙත් නැහැ. මේක හරි අපරාධයක්නෙ. ඇයි ඔවුන් මාව අල්ල ගන්න හදන්නෙ?"

"ඔබ කියන දේ මං විශ්වාස කරනවා ගිලිමෝ මහත්මයා." හෝම්ස් කීය. "වයිට්චැපල් හි ඩික් වීදියේ ඔහු පදිංචි නිවසේ සිදු වූ මරණයක් ගැන ඔබට අහන්න ලැබුණේ නැද්ද?"

"වයිට්චැපල් හි ඩික් වීදියේ නිවසේ?" ගිලිමෝ ඇසීය. "ඔබ අදහස් කළේ පිකැඩලියේ මෙල්බර්න් වීදිය ගැනද? එහි ඔහු නේවාසිකව ඉන්නේ පොත් වෙළෙඳසලකට යාබදව පිහිටි නිවසක. මං දෙතුන් වරක් එතැනට ගිහිං තියෙනවා."

"ඩික් වීදියේ ඔහුගේ නවාතැන ගැන ඔබ දන්නේ නැද්ද? පොලීසියට එතැන තිබී මළසිරුරක් හමුවුණා. ඔවුන් හිතන්නේ එය ට්‍රෙසිගේ මළසිරුර කියලයි."





"ඔය කියන තැනක් ගැන මං දන්නේ නෑ මහත්මයා. මං දන්න තරමින් ඔහු පදිංචිව සිටි තැන අංක 10 මෙල්බර්න් වීදිය."

"ඔබ කියන දේ මං විශ්වාස කරනවා" කී හෝම්ස් තම සාක්කුවෙන් සටහන් පොත එළියට ගත්තේ වැදගත් කරුණු ලියාගැනීමේ සූදානමෙනි. "ට්‍රෙසිගේ පෙනුම මොන වගේද කියලා මට මුලින් කියන්න. ඒ එක්කම කියන්න ඔහු සමග ඔබේ තිබුණු සම්බන්ධය ආශ්‍රය මොන වගේද කියලා"

"මං හැමදෙයක්ම කියන්නම්. ට්‍රෙසි උස මිනිහෙක්. ඔබ තරමටම උසයි. ඒ වගේම කෙට්ටුයි. ඔහුත් මගේ වයසෙමයි. ඒ කියන්නෙ අවුරුදු හැටක පමණ කෙනෙක්. කොණ්ඩය සුදුයි. මුහුණේ රැවුළ මොකුත් නෑ. මුහුණ ටිකක් දිගටියි කියන්න පුළුවනි. ඔහු ඇවිදින්නේ හරි වේගයෙන්"

"ඔබ ඔහුව හඳුනාගෙන කොයිතරම් කාලයක් වෙනවද?"

"මට ඔහුව මුලින්ම හමුවුණේ මීට අවුරුදු විස්සකට පමණ කලින්. අපි දෙදෙනා පැරිසියේ ලොකු අවන්හලක එකට පුහුණුව ලැබුවා. ඊළඟට එකට රැකියාව කළා. එතකොට තමයි අපේ යාළුකම ඇතිවුණේ. ඊට පස්සේ අපේ මිත්‍රත්වය දිගටම පැවතුණා. මගේ රැකියාව සඳහා මම ඉතාලියට ගියත්, ඔහු දිගටම හිටියේ ප්‍රංශයේ. ඊට පසු මම ලන්ඩනයට ආවා. ඔහුත් ආවා. නමුත් මිත්‍රත්වය දිගටම තිබුණා. හැකි අවස්ථාවල අපි එකිනෙකා හමුවුණා. කාර්ය බහුලත්වය නිසා මෑත කාලයේ නම් අපට හමුවීමට එච්චර ඉඩක් ලැබුණේ නෑ"

"ගිලිමෝ මහත්මයා. ඔබ මට කලින් හමුවුණු වෙලාවේ කිව්වා ඔබේම නිර්මාණයක් ඔහුගේ හෝටලයේ මෙනු පතේ තිබුණු බව. වටිනා කෑම වර්ග පිළියෙල කරන වට්ටෝරුවල රහස්‍ය තොරතුරු, ඔබ දෙදෙනා හුවමාරු කර ගැනීමේ පුරුද්දක් තිබුණද?"

"කවදාවත් නැහැ මහත්මයා. කිසි විටෙකවත් එහෙම දෙයක් සිදුවුණේ නෑ. ඒ රහස් එකිනෙකාට ඊර්ෂ්‍යාවෙන් වගේ අපි ආරක්ෂා කළා. අනෙක් අතට ඔහු මගේ වට්ටෝරු හොරකම් කළා කියල මං හිතන්නේ නෑ. වෙන කෙනෙකු ලවාවත් එහෙම දෙයක් ඔහු කරන්න ඇති කියල මං හිතන්නේ නෑ"

"ඔබ ඔය කියන රහස්‍ය වට්ටෝරු ඔබ කොහේද තබා ගන්නවා කිව්වෙ?"

"කලිනුත් ඔබට කිව්වා වගේ, මෙහේ. මේ කාර්යාලයේම. ඒවා පොතක ලියා තියෙන්නේ විස්තර සහිතව. ඒ නිසා මගේ මෙන්න මේ මේසයේ ලාච්චුවක දමා යතුරු දමා ආරක්ෂා කරනවා. ඔබ කැමතිද එය දකින්න?"

"ඇත්තෙන්ම ඔව්"

ගිලිමෝ තම කලිසම් සාක්කුවෙන් කුඩා යතුරු කැරැල්ලක් එළියට ගත්තේය. එයින් එක් යතුරක් තෝරාගත් ඔහු ලාච්චුවක් විවෘත කිරීමට සූදානම් විය.

"ඔය ලාච්චුව විවෘත කරන්න පුළුවන් යතුරු තිබෙන්නේ මේක විතරද?" හෝම්ස් විමසීය.

"නැහැ. තවත් එකක් තිබෙනවා. ඒක තියෙන්නේ හෝටලයේ කළමනාකරු මුදල් ආරක්ෂාවට තබන යකඩ සේප්පුවේ"

ජයග්‍රාහී ලීලාවෙන් යතුර කරකැවූ සූපවේදියා ඒ තුළට එබී බැලුවේය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" ඔහුට කෑගැසිණි. ඔහුගේ මුහුණ සුදුමැලි විය. ඔහු එක්වරම ක්ලාන්ත වීමට ඉඩ ඇතැයි මම සිතුවෙමි. ඊට පෙර ඔහු එතැනම බිම හිඳ ගත්තේ දෑතින්ම මුහුණ බදා ගනිමිනි.

"පොත හොරු අරගෙන ගිහිං! බලන්න මහත්වරුනි. ජීවිතේටම මට මෙහෙම දෙයක් වෙලා නෑ. මගේ පණ වගේ මං මේ පොත ආරක්ෂා කළේ......."

"........ සමහර විට ඔබ ඒ පොත ඉවතට අරගෙන ආපහු ලාච්චුවට දාන්න අමතක වුණාද දන්නෙ නැහැ. එහෙමත් නැත්නම් වෙනත් ලාච්චුවකට........"

"කොහොමටවත් නෑ මහත්මයා." ගිලිමෝ කීවේ අතිශය කම්පාව පත් හඬෙනි. "මේ පොත මට කොයිතරම් වටිනවාද කියල ඔබට තේරුම් ගන්න අමාරුයි. ජීවිත කාලයක් මං කළ නිර්මාණවල සම්පූර්ණ තොරතුරු අඩංගු මේ පොතේ. මේ මගේ වෘත්තියේ උච්ජතම අවස්ථාව. මේක නැතිවුණොත් නම්........"

ඔහු හඬා වැලපීමට ආසන්න යයි මට සිතිණ.

"ගිලිමෝ මහත්මයා" හෝම්ස් කීය. "එකපාරටම කලබල නොවී අපි මේ ගැන හොයා බලමු. ඔය පොත මේක ඇතුළෙ තිබෙන බව ඔබ අන්තිමට දැක්කෙ කවදා කොයි වෙලාවෙද?"

"ඔහොම ඉන්න මං කල්පනා කරල කියන්න........ ආ........ ඔව්. සති දෙකක් ගතවෙන්න ඇති. මාසයක් ගතවුණේ නම් නෑ.





මොනැකෝවේ රජකුමරිය එංගලන්තයට පැමිණීම වෙනුවෙන් කේම්බ්‍රිජ් ආදිපාදවරයා භෝජන සංග්‍රහයක් පැවැත්තුවා. ඒකට මං පිළියෙල කළා සූකොත්තෝ (zuccoto) නම් චෙරි, චොකලට් හා ආමන්ඩ් මිශ්‍ර අතුරුපසක්. ඒකට දැමිය යුත්තේ කුරුඳු ද සාදික්කා ද කියා මට අමතක වෙලයි තිබුණේ. එය පරීක්ෂා කර බලන්න මං ලාච්චුව විවෘත කළා. ඊට පසු පොත බලලා ලාච්චුවට දමා එය යතුරු දමා වැසූ බව මට හොඳට මතකයි."

"ඒ පොත තිබෙන්නේ මේ ලාච්චුවේ බව දන්නේ වෙන කවුද?"

"මගේ ප්‍රධාන සහායකයා. ජාක් රෙමී. ඔහු දන්නවා. ඊට අමතරව මේ හෝටලයේ කළමනාකරු දන්නවා. එපමණයි. මෙහෙම පොතක් තිබෙන බවට අනික් අය සැක කරන්න ඇති. ඒ මොකද හැම සූපවේදියකුටම තමන්ටම පෞද්ගලික වට්ටෝරු පොතක් තියෙනවා"

"ඔබ කියන රෙමී මහත්මයා ඔබ ළඟ සේවයට පැමිණ කොපමණ කල්ද?"

"අවුරුදු හතකට වැඩියි"

"ඔහුත් ප්‍රංශ ජාතිකයෙක්ද?"

"ඔව්"

"මේ විදියේ පොතක් තියෙන බව ට්‍රේසි මහත්මයා සැක කරන්න ඇතිද?"

"කිසිම සැකයක් නෑ. ඔහු දැනගෙන ඉන්න ඇති. මේ ආකාරයෙන් තමන් අමුත්තන්ට සපයන ආහාර ද්‍රව්‍ය ගැන, සම්පූර්ණ වාර්තාවක් ළඟ තබා ගැනීම සූපවේදියෙකුගේ වගකීමක්."

"මට උවමනායි ඔබේ මේස ලාච්චුවේ අගුළ පරීක්ෂා කරන්න. ඒකට කමක් නැද්ද?"

"ඕනෑම තැනක් පරීක්ෂා කරන්න හෝම්ස් මහත්මයා."

හෝම්ස් තම කාචයෙන් ලාච්චුවේ අගුළ පරීක්ෂා කළේ මිනිත්තු දෙකක් පමණි.

"අගුළ කඩන උපකරණයක් නැත්නම් හොර යතුරක් යොදා තිබෙන බව පැහැදිලියි. ඔබ කියන්නේ ඔබ මෙහෙන් පිටවී යද්දී මේ කාර්යාල කාමරයත් යතුරු දමා වසන බවයි?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. ඒ මොකද එදිනෙදා වියදම් සඳහා අවශ්‍ය වන නිසා මම ලොකු මුදලක් හැමවිටම මේස ලාච්චුවේ තබා ගන්නවා"

"නමුත් කවදාවත් මුදල් අඩුවීමක් සිදුවුණේ නෑ?"

"කවදාවත් නෑ"

දොරේ අගුළ හා එහි යතුරු-කට පරීක්ෂා කළ හෝම්ස් කිවේ හොර යතුරක් යොදාගෙන එයද විවෘත කර ඇති බවයි.

"ඔබට නොපෙනෙන්න, නොදැනෙන්න කවුරු හරි එහෙම දෙයක් කළේ කොහොමද?"

"මේ බරාඳයේ එච්චර සෙනගක් ගැවසෙන්නේ නැහැ. සමහරවිට මම එක දිගට පැය දෙකක් තුනක් මුළුතැන්ගෙයි ඉවුම් පිහුම් කරනවා."

මීළඟට හෝම්ස් කල්පනා කිරීමට පටන් ගත්තේය. ඒ ඔහුට විමසීමට වෙනත් කිසිවක් නොමැති යයි හැඟෙන අයුරිනි. මේසය මත දෑත් තබාගත් ගිලිමෝ ඔහුගේ හිස ඒ මතට බර කළේය. ඔහුගේ සියලු බලාපොරොත්තු කඩවී ගිය අයුරු එයින් පැහැදිලි විය. හෝම්ස් යළිත් වරක් ප්‍රශ්න ඇසීම ඇරඹුවේ නින්දකින් අවදි වූ විලසිනි.

"මට තියෙනවා ට්‍රේසි ගැන තවත් කරුණු කිහිපයක් දැනගන්න. ඔහු දකුණු අත හුරු කෙනෙක්ද? වමත හුරු කෙනෙක්ද?"

"කිසි සැකයක් නෑ ඔහු වමත් කාරයෙක්" ගිලිමෝ කීය. "ඒ කාලයේ ප්‍රංශයේ අපි වැඩ කළේ එකම මුළුතැන්ගෙයක. ඒ වුණත් මස් අඹරන යන්ත්‍රය, එළවළු කපන යන්ත්‍රය ආදී දේ වමත් - දකුණත් ආදී දෙවර්ගයෙන්ම මිලට ගන්න හෝටලයට සිදුවුණා."

"පැරණි දැව භාණ්ඩ ගැන ඔහුගේ තිබුණේ මොන වගේ කැමැත්තක්ද?"

"මෙල්බර්න් වීදියේ ඔහු පදිංචි නිවසට ගිය වෙලේ ඔබ කියන විදියේ දැව භාණ්ඩ ඔහු ළඟ තිබුණු බව මං දුටුවා. නමුත් කවදාවත් මං ඒ ගැන ඔහුගෙන් විමසුවේ නැහැ"

"මෙන්න මේ ආකාරයේ හැඩහුරුකමක් තිබෙන කෙනෙකු ගැන ඔබ දන්නවද?" යයි ඇසූ හෝම්ස් අප දුටු මළසිරුර හිමි පුද්ගලයාගේ ස්වරූපය විස්තර කළේය. ගිලිමෝ එයට සාවධානව කන්දුන්නේ ගැඹුරු කල්පනාවකට වැටෙමිනි.

".......... කොණ්ඩය කොටට කපලා....... උඩු තොලේ, සිහින් උඩු රැවුලක්. නිකටේ කළු පාට එළු රැවුලක්"

"ඔබ ඔය කියන විස්තරවලට ගැළපෙන මිනිහෙක් කලින් මේ හෝටලයේ වැඩ කළා" ගිලිමෝ කීය. "ඔහු වැඩ කළේ අතුරුපස





සාදන සූපවේදියා හැටියට. අවුරුදු හතළිහක පමණ කෙනෙක්. කොණ්ඩය ඉතාම කෙටි වනසේ කැපූ, මිටි තරබාරු කෙනෙක්"

"අන්න හරි. ඔහුගේ පච්ච කෙටූ සලකුණක් එහෙම තිබුණද?" හෝම්ස් ඇසුවේය.

"ආ........ ඔව් ඔව්. දකුණු අතේ මැණික් කටුවේ ඇතුළ පැත්තේ රාජාලියකුගේ ලකුණ කොටා තිබුණා"

"හරියට හරි. අපට දකින්න ලැබුණේ ඔහුගේ මළ සිරුර විය යුතුයි. ඔහුගේ නම මොකක්ද? ඊයෙ පෙරේදා වෙනතුරුත් මෙහේ රැකියාව කළාද?"

"ඔහුගේ නම මාකස් ඩූලි. තදින්ම කේන්ති යන පුද්ගලයෙක්. මාත් එක්ක ප්‍රශ්න ඇති කරගෙන මේ හෝටලයෙන් මාස හයකට පෙර අස්වෙලා ගියා. ඔහු වයින් පානයට අධික ලෙස ඇබ්බැහි වී සිටි කෙනෙක්. වෙලාවට වැඩට ආවෙ නෑ. ප්‍රශ්න වලට මුල්වුණේ එයයි. ඔහු නොදම්බලන්ඩ් හෝටලයේ සේවයට බැඳුණු බව මට පසුව අහන්න ලැබුණා. නමුත් මට කවදාවත් ඊට පසු දකින්න ලැබුණේ නෑ."

"මොකක් නිසාද ඔහු ඔබ සමඟ ප්‍රශ්න ඇති කර ගත්තේ?"

"අතුරුපස පිළියෙල කිරීම සඳහා අවශ්‍ය වෙන නමුත්, නරක් වීමට ඉඩ ඇති නට් වර්ග තිබෙනවා. අපි ඒවා හෝටලයේ විශාල වශයෙන් ගබඩා කර ගන්නේ නැහැ මහත්මයා. ඒ තමයි ආමන්ඩ්, චෙස්ට්නට්, වොල්නට්, හේසල්නට් වගේ දේ. අවශ්‍ය වුණු වෙලාවට ඒවා වෙළෙඳ පොළෙන් මිලට ගන්නවා. ඒ සඳහා යන්නේ ඔහු. මං මුදල් දෙන්නේ ඔහු අතට. නමුත් ඔහු ගුණාත්මක බවින් අඩු දේවල් මිලට ගෙන, මුදලෙන් කොටසක් වංචා කරන බව මට කිහිප වාරයක්ම පෙනී ගියා. එවිට හෝටලයේ කළමනාකරුට දැනුම් දී මාකස් ඩූලි ව රැකියාවෙන් ඉවත් කිරීමට මට සිදුවුණා."

"විශිෂ්ටයි" හෝම්ස් කීය. "ඔන්න දැන් අපි ටික ටික ඉදිරියට යනවා. පොලීසිය අල්ලගෙන ඉන්නේ දිරච්ච ලණුවක් බව දැන් පැහැදිලියි. හරිම අපූරුයි"

"මොන අපූරුවක්ද හෝම්ස් මහත්මයා. හෙට උදේ ඔවුන් මාව අත් අඩංගුවට ගනිවි නේද?"

"ඔව්"

"එහෙනම් මට කරන්න තියෙන්නේ රටින් පැනල යන එකයි. එහෙම නේද?"

"එපා එපා. ඒක මහා මෝඩ වැඩක්" හෝම්ස් කීය. "රටින් පැන යාම තමා ඔබට කළ හැකි නරකම දේ. ඔබ අපරාධකාරයෙක් කියන පොලීසියේ මතය, එවිට ඔවුන් තහවුරු කර ගන්නවා. මං දෙන උපදෙස් අනුව වැඩ කරන්න."

"ඔව් හෝම්ස් මහත්මයා. මට ඔබ ගැන විශ්වාසයි. ඔබ කියන දෙයක් කරන්නම්"

"බොහොම හොඳයි. ඔබ හිරභාරයට ගැනීමට එන පොලිස් නිලධරයා බොහොම විට ඩව්බිගින් වෙන්න පුළුවනි. ඔහු නොම්මර එකේ තකතීරුවෙක්. ඔබ කියන කිසි දෙයක් ඔහු කනකට ගන්න එකක් නෑ. ඔහු කියන කිසිම දේකට විරුද්ධව තර්ක කරන්න යන්නත් එපා. ඒ වගේමයි, ඔහුගේ චෝදනා කිසිවක් පිළිගන්න එපා. නිශ්ශබ්දව ඉඳීමයි කළ යුත්තේ. මං අදහස් කරන දේ ඔබට පැහැදිලිද?"

"ඔව් මහත්මයා"

"ඔබට ඉන්නවද නීතිඥයෙක්?"

"නැහැ"

"හොඳයි. ඔබ වෙනුවෙන් පෙනී ඉඳීම සඳහා නීතිඥයෙක් මම ඔබ වෙත එවන්නම්. පොලීසිය සම්බන්ධ කටයුතු වලදී ඔබව ආරක්ෂා කරන්න ඔහුට හැකිවේවි. ඔබට ඔහු හමුවිය හැක්කේ කොහේදිද?"

"මෙහේදි - මේ හෝලටයේදි පුළුවනි. මට මෙහේ කාමරයක් තියෙනවා."

"හරි. හෙට උදේ පාන්දරින්ම ඔහු ඔබ වෙත එවන්නම්"

"සමාවෙන්න හෝම්ස් මහත්මයා. මේ වෙන කරදරය වෙනුවෙන් ඔබගේත් නීතිඥයාගේත් ගාස්තු මං ගෙවන්නේ කොහොමද කියලයි......."

"නැහැ. ගිලිමෝ මහත්මයා. ඒ ගැන දැනට අමතක කරන්න. සත්‍යය පාගා දමා අහිංසකයකු හිරභාරයට ගැනීමට, මං පොලීසියට කොහොමටවත් ඉඩ දෙන්නේ නෑ. තමන්ට භාරවෙන බරපතළ ලෙස රෝගීවුණු අයගෙන් මුදල් නොගන්නා, තමන්ගේ ගාස්තු ප්‍රතික්ෂේප කරන කාරුණික වෛද්‍යවරු මේ ලෝකයේ හරියට ඉන්නවා. එවැනි රෝගීන්ගේ රෝහල් ගාස්තුව තමන් ගෙවලා ඖෂධ ටිකත් තමන්ගේ වියදමෙන් ලබා දෙන වෛද්‍යවරුන් ඉතා





කලාතුරකින් හෝ ඉන්නවා. භය වෙන්න එපා ගිලිමෝ මහත්මයා. ඔබ මේ ප්‍රශ්නයෙන් ගොඩ එනවා. ඒ ඔබේ කීර්ති නාමයට එක දශමයක හානියක් නොවී"

"ඒක අහන එකත් මට සැනසීමක් හෝම්ස් මහත්මයා"

* * *

"අපි මුලින්ම යමු නීතිඥයා හමුවෙන්න" හෝම්ස් කීවේ අප එතැනින් පිටවෙද්දීය. චාන්සරි පටුමගේ හෙස්කෙත් සහ පිලිප්ස් නීතිඥ සමාගමට ගිය අපි එහි විලියම් හෙස්කෙත් මහතා හමුවීමු. සියලු ගාස්තු තමා ගෙවන බවට පැවසූ හෝම්ස්, පසුවදා උදයේම ගිලිමෝ මහතා හමුවන මෙන් නීතිඥයාට උපදෙස් දුන්නේය.

"දැන් අපි යමු තවත් සැරයක් මැකාති පාරට, ඔී කීෆ් ලී බඩු වෙළෙන්දා හමුවෙන්න" හෝම්ස් කීය.

"ඔව් ඔව්" ඔී කීෆ් කීය. "මැකන්සි මහත්මයා මිලට ගත් වටිනා ලී බඩු හැම එකක්ම යැව්වේ මෙල්බර්න් වීදියේ ඔහුගේ නිවසට තමා" ඔී කීෆ් කීය.

"අද දවසේ අප කළ යුතු වෙනත් වැඩක් නැහැ වොට්සන්" හෝම්ස් කීවේ අප ආපසු බේකර් වීදිය වෙත යන අතරේදීය. "අර මෝඩයා ඩව්බිගින් දැන් ඉතින් අහිංසක මිනිහෙකුව හිරබාරයට ගනීවි නොකළ වරදකට"

"එතකොට ඔබ කියන්නේ, මැකන්සි කියන වෙනත් නමකින් පෙනී ඉන්නේ ෂෝන් ක්ලෝඩ් ට්‍රේසි බවයි. අනික මියගිය තැනැත්තා ට්‍රේසි නොවෙයි?"

"හරියට හරි. දැන් අපි අපෙන්ම ප්‍රශ්න කරන්න ඕන; ඇයි මේ එකම තැනැත්තෙක් නම් දෙකකින් පෙනී ඉන්නේ කියලා. එපමණක් නොවෙයි; ඔහු නම් දෙකකින් එකිනෙකට වෙනස් විදියේ කටයුතු දෙකකත් යෙදෙනවා. ට්‍රේසි නමින් හෝටලයේ සූපවේදී රාජකාරියේ යෙදෙනවා; මැකන්සි නමින් ලී බඩු මිලට ගෙන අපනයනය කිරීමේ ව්‍යාපාරයක් කරනවා. එකම නමින් මේ ව්‍යාපාර දෙකම කරන්න නීතියෙන් බාධාවක් නැහැ. ඉතින් ඇයි මේ?

ඔහුගේ සැබෑ නම ට්‍රේසි බව අපට පිළිගන්න පුළුවනි. ඒ මොකද අවුරුදු විස්සකට කලින් ඉඳන් ඒ නමින් ගිලිමෝ ඔහුව හඳුනන නිසා. එතකොට බොරු නම මැකන්සි. ඔහු මේ ව්‍යාපාර වගේම

පදිංචිය සඳහා මෙල්බර්න් වීදියේ සහ ඩික් වීදියේ කාර්යාල හෝ නිවාස දෙකකුත් පවත්වාගෙන යනවා. එංගලන්තයේ පරණ ලී බඩු ප්‍රංශයට යැව්වා කියල, ඔය තරම් අති විශාල ලාභයක් උපයාගන්න පුළුවන්ද වොට්සන්? මට නම් එහෙම දෙයක් හිතන්න අමාරුයි. කොහොම වුණත් අපි ඒ ගැන ලී බඩු විශේෂඥයෙකුගෙන්ම විමසා බලමු. මට නම් හිතෙන්නේ ඔහුගේ මේ ව්‍යාපාරයේ මොකක් හරි සැඟවුණු රහසක් තිබෙනවා කියලයි"

එදා රාත්‍රී ආහාරයෙන් පසු මම සුපුරුදු ලෙස වෛද්‍ය සඟරා කියවීමට පටන් ගත්තෙමි. මගේ මිත්‍රයා ඔහුගේ හාන්සි පුටුවේ වැතිරුණේ පයිප්පය ද කටේ ගසාගෙනය. තම පිගන්මැටි පයිප්පයට දුම්කොළ පුරවාගත් ඔහු කල්පනාවට වැටුණේය. රාත්‍රී දහයමාර වෙද්දී තද නිදිමතක් දැනුණෙන් මම නින්දට යාමට තීරණය කළෙමි.

"අර ගැටලුව මං විසඳුවා මගේ හිතවත් වොට්සන්" හෝම්ස් කීවේ අප උදෑසන කෝපි කෝප්පය පානය කරද්දීය.

"මොන ගැටලුවද?"

"ට්‍රේසි ලී බඩු අපනයනය කිරීමේ ව්‍යාපාරයක් කරන්නේ ඇයි කියන එක?"

"මොකක්ද ඔබේ විසඳුම?"

"ඔබට මතකද පහුගිය මාස හත අටක කාලය තුළ එංගලන්තය පුරා වටිනා මුතුමැණික්, දියමන්ති හා රත්තරන් සොරකම් කරනු ලැබුවා? නමුත් ඒ එකක්වත් එංගලන්තයේදී හොයාගන්න පොලිසියට හැකිවුණේ නෑ. නමුත් එයින් සමහරක් ප්‍රංශයේදී සුරෙට් පොලිසියට හමුවී තිබුණා. දෙකක් හෝ තුනක් ඕලන්දයේදී හා බෙල්ජියමේ දී හමුවුණා. මේවා එංගලන්තයේ පිටවුණේ කොහොමද? ඒ කොහොමද කියලා කවුරුවත් දැනගෙන හිටියේ නැහැ. මට හොඳටම විශ්වාසයි ඒව පිටුපස ඉන්නේ මැකන්සි හෙවත් ට්‍රේසි කියලා"

"ඔහු එය සිදුකළ ආකාරය?"

"ඇයි වොට්සන්? අපට දකින්න ලැබුණේ දැව විදීම සඳහා වඩුවන් යොදා ගන්නා බුරුමයක්. ඒ වගේම අප දුටුවා ලී කුඩු. ඊළඟට මෙන්න මේ පොතත් මට හුඟක් ප්‍රයෝජනවත් වුණා" හෝම්ස් කීවේ මේසය මත තිබූ දුර්වර්ණ වූ පොතක් අතට ගනිමිනි.





"ක්වීන් ඈන් හා පළමුවන ජෝජ් යුගයේ බ්‍රිතාන්‍යයේ ගෘහ භාණ්ඩ" මේ පොත පෙරළා බලන්න වොට්සන්. කෑම මේස සහ පුටු කියන කොටස්වල ඔබට දකින්න ලැබේවි ඉතාම අලංකාර භාණ්ඩ. ඒ හැම එකකම කකුල් අර බිලියඩ් මේස කකුල් වගේ පිම්බුණ දැව කොට. ඒවා ගලවා ගත්තාම බුරුමයකින් විදලා මුතු මැණික් ආදිය තැන්පත් කරලා වසා දැමීම පහසු කටයුත්තක්. එවැනි දෙයක් කරන්න වඩුවෙක් වෙන්න උවමනා නැහැ."

"නමුත් ධූලි ඝාතනය සහ කෑම වට්ටෝරු පොත සොරකම් කිරීම, මේකට සම්බන්ධ වෙන්නේ කොහොමද?"

"ඒව සම්බන්ධ වෙන්නේ කොහොමද කියල අපට තවමත් හිතාගන්න අමාරුයි" හෝම්ස් කීය. "පැටළී තිබෙන තැන් එකින් එක ලිහෙද්දී, ඒව හෙළි වේවි කියා මං විශ්වාස කරනවා. අපි අද මෙල්බර්න් වීදියට ගිහින් බලමු. ට්‍රේසි නොහිටියත් ඔහුගේ අසල්වාසීන්ගෙන් යමක් හොයාගන්න අපට බැරිවෙන එකක් නෑ.........."

ඔහුගේ කතා බහට බාධා කරමින් කිසිවෙකු අපේ විසිත්ත කාමරයේ දොරට තට්ටු කළේය. මම දොර විවෘත කළෙමි. ඇතුළට ආවේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ පරීක්ෂක ලෙස්ට්‍රේඩ්ය.

"මගේ හිතවත් ලෙස්ට්‍රේඩ් සුභ උදෑසනක්!" හෝම්ස් කීවේ මවිතයට පත් ආකාරයෙනි. "මං දකින්න බලාපොරොත්තු වුණේ ඔබේ සගයා ඩව්බිගින්. කෝ ඔහුට මොකද වුණේ?"

"හෝම්ස් මහත්මයා. ස්කොට්ලන්ඩ්යාඩ් එකේ අපි හැමදාමත් ඔබෙන් ලැබෙන උදව් ගැන ඔබට කෘතඥ වුණා. ඉදිරියටත් එහෙමමයි. අපරාධකාරයන් අල්ලා ගැනීමට ඔබ එදා ඉඳන්ම අපට ලොකු සහයෝගයක් දුන්නා. ඒත් එයින් ලැබෙන ගෞරවය භාරගන්නවත් ඔබ උනන්දු වුණේ නෑ. නමුත් අද කාලේ තරුණයන් ඒව දන්නේ නෑ. දේශපාලන පත්වීම් ලබා එන ඩව්බිගින් වගේ අයට ඔබ සමග සහයෝගයෙන් වැඩ කරන්න තේරෙන්නෙ නෑ"

"හෝ හෝ!" හෝම්ස් සිනාසුණේය. "ඔබ මේ ආවෙ ඔහු වෙනුවෙනුයි එහෙනම්? ඒ මෝඩ මිනිහ මොනවද කියන්නෙ?"

"ඔහු කියනවා ට්‍රේසි ඝාතනයේ අපරාධකාරයා අත්අඩංගුවට ගන්න, ඔබෙන් කිසිම සහයෝගයක් ලැබෙන්නෙ නැහැලු. පොලිසියේ රාජකාරිවලට අවහිර කිරීම ගැන මුලින්ම සිරභාරයට ගන්න ඕන ඔබලු"

"නාසයේ කෙළවර ඉඳලා යාරයකට වැඩිදුරක් නොපෙනෙන ඒ මෝඩයා කියන දේට මම කිපෙන්නේ නෑ" හෝම්ස් කීය. "දැන් තත්ත්වය මෙකයි. ට්‍රේසි කියන්නේ හොර තක්කඩියෙක්. ඔහු මියගිහින් නැහැ. ඔහු ඉන්නේ හැංගිලා. මියගිය පුද්ගලයා මාකස් ඩූලි බවයි මගේ විශ්වාසය. ඒ අපරාධය කළේ ට්‍රේසි වෙන්නත් පුළුවනි. එය ඔප්පු කිරීමට ප්‍රමාණවත් තරම් සාක්ෂි මා ළඟ තවමත් නෑ. කොහොම වුණත් ඔබේ මිත්‍රයා ඩව්බිගින් කරන්න හදන්නේ මෝඩ වැඩක්. ඔහු අත්අඩංගුට ගන්න හදනා ජෝසෆ් ගිලිමෝ අහිංසකයෙක්"

මීළඟට හෝම්ස් ලෙස්ට්‍රේඩ්ට විස්තර කළේ එංගලන්තයෙන් හොරකම් කළ මැණික් හා ආභරණ ප්‍රංශයෙන් මතු වූ ආකාරය ගැනයි. එය තමාගේ උපකල්පනයක් පමණක් වුවත්, එය සත්‍යයක් වන සාක්ෂි තිබීමට ඉඩ ඇති බැව් මගේ මිත්‍රයා කීය.

"හෝම්ස් මහත්මයා. මට සමාවෙන්න. මේ ගැටලුව ලිහන්න ඔබ මොන තරමක් කාරණා සොයාගෙනද කියන එක, මට දැන් තේරුම් ගත හැකියි. ඩව්බිගින් මේකෙන් වහාම ඉවත්කරන්න කියා මං පොලිස් කොමසාරිස්තුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබ කැමති හැටියකට කටයුතු කරන්න. ඔබට උවමනා ඕනෑම සහයෝගයක් මං ලබා දෙන්නම්" කී ලෙස්ට්‍රේඩ් අපෙන් සමුගෙන පිටවී ගියේය.

හඩ්සන් මහත්මිය උදෑසන ආහාරය මේසය වෙත එවන අතරේ අප සිටියේ උදෑසන පුවත්පත් කියවමිනි. දැඩි අවධානයකින් "ඩේලි ටෙලිග්‍රාෆ්" පත්‍රය කියවමින් සිටි හෝම්ස් ගේ මුවෙන් පිටවූයේ චකිතයකට පත් හඬකි.

"වොට්සන්! ඔබ දුටුවද මේ දැන්වීම? ඔහොම ඉන්න. මං එය ඔබට ඇහෙන්න කියවන්නම්;

"Mirror of the dressing table ready. Now safe to move from 10 MS. 1.30 p.m. today. M"

"කණ්ණාඩි මේසයේ කණ්ණාඩිය දැන් සූදානම්. අද දහවල් 1.30 ට එය 10 MS වෙතින් ගෙන යෑම සුදුසුයි. M"

මොනවද වොට්සන් ඔබට ඒකෙන් වටහා ගන්න පුළුවන්?"

"මට හිතෙනවා 'M' යන්නෙන් ඔබ අදහස් කරන්නේ මැකන්සි හෙවත් ට්‍රේසි වෙන්න ඇති. එතකොට 10 MS කියන්නේ මොකක්ද?"





"අංක 10 මෙල්බර්න් වීදිය - (Melbourne Street). මොනව හරි දෙයක් එතැනින් දහවල් 1.30 ට ගෙනියන්න කියලා කාට හරි රහස් පණිවුඩයක්. එහෙම වෙන්න බැරිද?"

"ඔබ කියන දේ නිවැරදි විය යුතුයි." මම එකඟ වීමි. "නමුත් මොකක්ද මේකෙන් අදහස් වෙන්නේ?"

"වයිට්චැපල්හි හමුවුණු මළසිරුර ගැන පුවත්පත්වල පළවීම අපි නැවැත්තුවා නේ. ට්‍රේසි හිතන්නේ මේක තවමත් හොයාගෙන නැහැ කියලයි. මොකක් හරි පියවරක් ගන්නයි ඔහු හෝ ඔවුන් සූදානම් වෙන්නේ. පසුගිය දින කිහිපයේ මේ පත්තරයේ "පෞද්ගලික" ලුහුඬු දැන්වීම් තීරය පරීක්ෂා කර බලමු."

ඔහු පරණ පුවත්පත් තබා තිබූ තැනින් "ඩේලි ටෙලිග්‍රාෆ්" පුවත්පතේ සතියක පමණ කාලයක පිටපත් සෝදිසියට ලක් කළේය.

"ආ මේ තියෙන්නේ. මේ අපරාධය සිදු වූ දිනට පසු දින විය යුතුයි."

"කණ්ණාඩි මේසය මේ වෙලාවේ ගෙන යාමට නොහැකියි. මීළඟ පණිවුඩ සඳහා මේ තීරය බලන්න - එම්"

"මීට කලින් පත්තරවල තව තවත් පණිවුඩ තිබෙන්න පුළුවනි" මම කීවෙමි.

"ඔව්. ඒ වුණත් ඒවා පරීක්ෂා කරමින් අපට පමාවෙන්න බෑ. ඒ මොකද, ලෙස්ට්‍රේඩ්ට මං කාරණා තේරුම් කරල දුන්නත්, පොලීසිය කොයි ආකාරයට වැඩ කරාවිද කියන්න බෑ. ඔවුන් ගිලිමෝව අත් අඩංගුවට ගන්න ඉඩ තියෙනවා. මං ගිහින් ඒ ගැන හොයා බලන්න ඕන. ඒ අවදානම පහවෙළා ගිහින් නම්, මං හෙස්කෙත් නීතිඥයාවත් දැනුම්වත් කළ යුතුයි. ඒ අතරෙ ඔබටත් තියෙනවා වැඩක්"

"ඒ මොකක්ද?"

" 'ඩේලි ටෙලිග්‍රාෆ්' කාර්යාලයට යන්න වොට්සන්. පහුගිය මාස කිහිපයේම පුවත්පත් වල 'පෞද්ගලික' තීරය පරීක්ෂා කරල බලන්න. ඔන්න උදේ කෑමත් ආවා. අපි ඉක්මන් කරමු. සෙල්ලම පටන් අරගෙන!"

* * *

ෂර්ලොක් හෝම්ස්ගේ නම සඳහන් කිරීමත් සමගම "ඩේලි ටෙලි ග්‍රාෆ්" කාර්යාලයේ මගේ කටයුතු පහසු විය. මට අවශ්‍යව තිබූ පසුගිය පුවත්පත්වල පිටපත්, ඔවුහු මට නොපැකිළව ලබා දුන්හ. අපගේ පරීක්ෂණයට අදාළ දැන්වීම් හතක් මට හමුවිණි. මම ඒවා පිටපත් කර ගැනීමට පටන් ගත්තෙමි. එය අවසන් කොට මිනිත්තු දහයක් ගතවීමටත් පෙර මගේ මිත්‍රයා මා සිටි තැනට පැමිණියේය.

"ඔබේ වැඩ ටික සම්පූර්ණද වොට්සන්?"

"ඔව්. මෙන්න ඒ තොරතුරු"

"විශිෂ්ටයි. දැන් ඉතින් අපි ස්කොට්ලන්ඩ්යාඩ් එකට යමු"

"ඇයි මෙල්බර්න් වීදියට නෙමෙයිද?"

"නැහැ. ඒකට අපි පහුවෙලා ලෙස්ට්‍රේඩ්වත් කැඳවාගෙන යමු"

අප ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය වෙත යද්දී ලෙස්ට්‍රේඩ් අප එනතුරු එහි බලා සිටියේය.

"ලෙස්ට්‍රේඩ්. මේ තියෙන්නේ මගේ හිතවත් දොස්තර වොට්සන් යෙදුණු පරීක්ෂණයක ප්‍රතිඵල. හොර තක්කඩියා කවුරු වුණත් ඔහු තමන්ගේ සහචරයන්ට පණිවුඩ යවලා තියෙන්නේ පුවත්පතේ දැන්වීම මගින්."

"හෝම්ස් මහත්මයා. මේවායින් මට මොනවා කරන්න කියලද ඔබ කියන්නේ?"

"ඇයි ලෙස්ට්‍රේඩ්. මැණික් හා ස්වර්ණාභරණ හොරකම් කළ දිනයන් ඔබට වාර්තා වෙලා ඇති නේ. ඒ දවස් සහ මෙම දැන්වීම් පළ වූ දවස් එකිනෙකට අනුරූප ද කියල බලන එකයි ඔබ කළ යුත්තේ. එහෙම නේද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. මං ඒකට කටයුතු කරන්නම්" කී ලෙස්ට්‍රේඩ් දත්ත අංශයේ ලිපිකරුවෙකු කැඳවා එම කටයුත්ත භාර දුන්නේය.

"හෝම්ස් මහත්මයා. ඔබ හිතන්නේ මේ කියන 'කණ්ණාඩි මේසය' මෙල්බර්න් වීදියෙ ගෙදරින් අද පිටත්කර යවාවි කියලද?"

"මට හිතෙන්නේ එහෙමයි"

"එහෙම නම් යවන එක්කෙනයි ගෙනියන එක්කෙනයි දෙදෙනාම, අපට හිරබාරයට ගන්න හැකිවේවි නේද, එක සැරේම?"

"එච්චර ඉක්මන් වෙන්න එපා ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය. "ඔබේ මිනිස්සු මුලින්ම කළ යුත්තේ මෙයයි. 'කණ්ණාඩි මේසය' අරගෙන





යන තැනැත්තා පසුපස යා යුතුයි. එහෙම ගිහින් ඔහු සහ ඔහු ට්‍රේසි වෙත එවූ පුද්ගලයයි දෙදෙනාම අල්ලා ගන්න ඕන. දින කිහිපයක් ට්‍රේසිට ඔය විදියටම ඉන්න අරින එක වඩාත් සුදුසුයි. ඔහු දැන් නොදම්බලන්ඩ් හෝටලයේ රැකියාවෙනුත් ඉවත්වෙලා වගෙයි පෙනෙන්නෙ. ඒ හින්දා ඔහු මෙල්බර්න් වීදියේ ගෙදරටම වෙලා ඉදීවි"

"ඔහු ගැන සෝදිසියෙන් ඉදීමට මං සිවිල් ඇඳුමෙන් සැරසුණු පොලිස් භටයන් කීප දෙනෙකු යොදවන්නම්"

"අන්න හොඳයි. නමුත් මතක තියාගන්න. අපි කටයුතු කරන්නේ අපරාධ ක්ෂේත්‍රයේ ඉහළම මොළකාරයෙක් එක්ක. ඒ නිසා සෝදිසියෙන් ඉදීමට වුණත් ඔබේ දක්ෂම මිනිස්සු යොදවන්න. දැන් මමයි දොස්තර වොට්සනුයි යනවා මෙල්බර්න් වීදියට. ඔබේ මිනිස්සු එහේ එන්න කලින්, කාරණා කීපයක් රහසිගතව සොයා බලන්න මං කැමතියි"

මෙල්බර්න් වීදියේ අංක 10 නිවස අප සිතා සිටියාට වඩා ප්‍රමාණයෙන් විශාල නිවසක් විය. ඇත්තෙන්ම එය ද්විත්ව නිවසක් බැව් අපි දුටුවෙමු. පොත් වෙළෙඳසල තිබුණේ එහි එක් භාගයකය. පදිංචිකරුවෙකු සඳහා වෙන් වූ කොටස වූයේ අනික් භාගයයි. අපි මුලින්ම පොත් වෙළෙඳසලට පිවිසුණෙමු. හෝම්ස් කරුණු විමසුවේ එහි සේවකයෙකු ගෙනි.

"ජෝන් බානිකෝට් කියන මහත්මයද ඔබේ අල්ලපු ගෙදර ඉන්නෙ?"

"නැහැ මහත්මයා. ඔබට වැරදීමක් වෙලා. ඒකෙ ඉන්නේ බානිකෝට් කෙනෙකු නෙමෙයි. ඔබ කියූ නම තියෙන අය ඉන්නෙ මේ පැත්තෙ වෙන්න බෑ. එහෙම නමක් මං අහලවත් නෑ"

"එහෙම නම් මට වුණු වැරදීමක් වෙන්න ඇති" හෝම්ස් කීවේය. "ඔහු කෝන්වෝල් වල කෙනෙක්. පොත්පත් උවමනා කරන ඈත පළාත්වල අයට, ඔහු තැපැල් මගින් පොත් සපයනවාලු. ඔහු මිටි මහත කෙනෙක්. මුහුණ පුරා වැවුණු කළු රැවුලක් තියෙනවා"

"අපේ අසල්වැසියා ලූක් මැකන්සි කියල මහත්මයෙක්. ඔහු කෙට්ටු උස කෙනෙක්. තොණ්ඩෙ සුදුයි. උඩු හෝ යටි රැවුල් මොකුත් නෑ. ඔහු සම්බන්ධ වෙලා ඉන්න පරණ ලී බඩු විකිණීමේ ව්‍යාපාරයකට කියලයි මං හිතන්නෙ. ඇයි මහත්මයා

කෙන්සිංටන්වලත් තියෙනවා නේ මෙල්බර්න් වීදියක්. ඔබ හොයන තැනැත්තා නොවැරදීම ඇත්තෙ ඒකෙ"

"ඔබ කිව්වා හරි" හෝම්ස් පිළිතුරු දුන්නේ හිස නමා ආචාර කරමිනි. "මට වරදින්න ඇත්තේ එතැන තමා." එසේ කියා පොත් වෙළෙඳසලෙන් පිට වූ හෝම්ස් ඇත් පිරිමැද්දේ සතුටෙනි.

"ලූක් මැකන්සි මහත්මයා ඉන්නවා අපට උවමනා කරන තැන. හොඳට හිතල බලල ඔහුට උගුලක් අටවන්න දැන් අපට පුළුවනි. මේකෙදි එකම පුද්ගලයා නම් දෙකක් සහ නිවාස දෙකක් පාවිච්චි කරන නිසා මටත් පැටලෙනවා"

"කවුද හෝම්ස්, ජෝන් බානිකෝට් කියන්නේ?"

"ඒ මං හිතෙන් මවාගත් චරිතයක් විතරයි. ඒ ගෙදර ඉන්නේ මැකන්සි ද කියල මං ඇහුවා නම් මොකද වෙන්නේ? පොත් සාප්පුකාරයා ඔහුගේ මිත්‍රයෙකු නොවුණත්, මැකන්සි මහත්මයා ගැන කෙනෙකු විමසූ බව ට්‍රේසිගේ කනට යන්න ඉඩ තිබුණා. ඒ හින්දයි මම ට්‍රේසිගේ පෙනුමට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් ශරීර පෙනුමක් ඇති කෙනෙකුව විස්තර කළේ. ලෙස්ට්‍රේඩ්ගේ මිනිසුන්ට හැංගිලා ඉන්න හොඳ තැන් තියෙනවද කියල දැන් අපි බලමු" හෝම්ස් කීවේ විශාල නිවසක තාප්පය අසල තිබූ විශාල මල් පඳුරක සෙවණේ නවතිමිනි.

"කෙනෙකුට හැංගිලා බලාගෙන ඉන්න සුදුසු තැනක් මේ කිට්ටුවක නෑ" මගේ මිත්‍රයා කීවේ පොත් වෙළෙඳසල පිහිටි දිසාවට නෙත් යොමු කරමිනි.

"වොට්සන්!" හෝම්ස් එක්වරම කෙඳිරිලි හඬින් කීවේ මගේ කබා අතෙන් අල්ලා ක්ෂණිකව සොලවමිනි. "වොට්සන්. හෙමින් හෙමින් ආපහු හැරිලා බලන්න. ඔය එන්නේ අපට ඕන කරන මිනිහා!"

මගේ සපත්තු නූල ගැට ගැසීමට මෙන් පහත් වී, දෙනෙත් ඒ පැත්ත වෙත යොමු කළෙමි. පොත් වෙළෙඳසල තිබූ ගොඩනැඟිල්ලේ කොහෙන් හෝ ඔහු එළියට ආවා පමණි. ඉතාම හොඳ වර්ගයේ රෙදිවලින්, අලංකාරව මැසූ ඇඳුම් කට්ටලයකින්, ඔහු සැරසී සිටියේය. ඔහුගේ පෙනුම අපට කලින් අසන්නට ලැබුණ විස්තරවලට සෑම අයුරකින්ම සමාන විය. ඔහුගේ එක් අතක හැකිළූ කුඩයක් තිබිණි. ඔහු ගමන් කළේ හයිඩ්පාක් උද්‍යානය දෙසටයි.





"අනර්ඝයි" හෝම්ස් කෙඳිරිලි හඬින් කීය. "ලූක් මැකන්සි කියන්නෙත් ෂෝන්-ක්ලෝඩ් ට්‍රේසි කියන්නෙත් එකම පුද්ගලයෙක්; ඔහු පදිංචි වෙලා ඉන්නේ මෙල්බර්න් වීදියේ අංක 10 නිවසේ බව දැන් අපි සහසුද්දෙන්ම දන්නවා."

"හෝම්ස් මහත්මයා. ඔබ ලබාදුන් තොරතුරු ඉතාම ප්‍රයෝජනවත්" ලෙස්ට්‍රේඩ් පැවසුවේ අප යළිත් ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය වෙත ගිය පසුය. "වොට්සන් මහත්මයා ලබා දුන් වාර්තාව විශිෂ්ට එකක්. ඒකෙ සඳහන් දින වකවානු ළඟම මැණික් මංකොල්ල සිදුවෙලා තිබෙනවා. මේ හැම එකකටම ගොදුරු වෙලා තියෙන්නේ, සමාජයේ ඉහළම ප්‍රභූ පවුල්වල අය. ඒ හැම හොරකමක්ම සිදුවෙලා තියෙන්නේ පවුලේ අය ගෙදර නොහිටි වෙලාවල."

"ලෙස්ට්‍රේඩ්. ඒකෙන් තේරෙන්නෙ පවුලෙ අය ගෙදර නැති බව හොරා නිශ්චිතව දැනගෙන ඉඳපු බව නේද?"

"ඒක මටත් හිතුණා හෝම්ස් මහත්තයා."

"එහෙම නම් අපි බලන්න ඕන මේ හැම හොරකමකටම පොදු සාධකය මොකක්ද කියලා. මංකොල්ල කල්ලියට ඔත්තුව ලබා දුන්නේ කවුද කියල හොයල බලමු. සමහරවිට ඒ එක ගෙදරකින් අනෙක් ගෙදරකට මාරුවෙවී ගිය සේවකයෙකු වෙන්න පුළුවනි"

"මට මෙහෙම තොරතුරක් ලැබිලා නෙමෙයි" ලෙස්ට්‍රේඩ් කීය. "සිරිත් පරිදි කරන විමසීම්වල කොටසක් හැටියට මං ඒ ගැනත් විමසා බැලුවා. හැම නිවසකම වගේ හිටියේ, ඔවුන්ගේ සුපුරුදු පරණ සේවක කණ්ඩායමමයි. අනික් අතට මැණික් සොරකම සිදුවුණු වහාම කිසිම සේවකයෙක්, ඒ ගෙදර රැකියාවෙන් අස්වෙලා ගිහින් නෑ."

"මේ හොර කල්ලිය ගෙවල්වලට ඇතුළුවුණේ කොහොමද?"

"ගේ ඇතුලේ කවුරු හරි දොරක් හෝ ජනේලයක් ඇර දුන්න කියල හිතන්න සාක්ෂි, කොහෙත්වත් හමුවුණේ නෑ. හැමතැනකදීම ඔවුන් ඇතුළුවෙලා තිබුණේ පිටතින් යෙදූ උපක්‍රමයකින්. ඒ කියන්නේ ජනේලයක වීදුරුව කඩා, අත දමා අගුළ ඇරගැනීමෙන්; ලීවරයක් දමා දොරේ අගුළ පන්නා ගැනීමෙන්; වහලෙන්, ආදී ක්‍රම වලින්."

"ෂුඃ ෂුඃ මේ තරම් පැහැදිලිව දැකිය යුතු දෙයක් මට නොපෙනී ගිය හැටි" හෝම්ස් කීවේ දකුණු අත්ල නළලේ තබා ගනිමිනි. "මං

ඕන ඔට්ටුවක් අල්ලන්නම්. මේ හොරකම් සිදුවෙන වෙලාවෙ මේ මිනිස්සු ඉන්න ඇත්තෙ නොදම්බලන්ඩ් හෝටලයේ රාත්‍රී භෝජන සංග්‍රහයකට සහභාගි වෙලා. එම හෝටලයේ ප්‍රධාන සූපවේදියා හැටියට, රාත්‍රී භෝජන ගැන වේ‍රසිට දැනගන්න ලැබෙන්නේ දින ගණනකට කලින්. හැම දෙයක්ම හොඳින් සැලසුම් කරගන්න ඔහුට ඕනෑ තරම් කාලවේලා තියෙන්න ඇති."

"හෝම්ස් මහත්මයා. මං හිතන්නේ ඔබට අහුවුණා නියම පොට."

"එතැනට එනතුරු මේක මට පැහැදිලියි. නමුත් මියගිය පුද්ගලයා - මාකස් ඩූලි මේකට සම්බන්ධ වෙන්නෙ කොහොමද? ඒක අපි තවදුරටත් හොයා බලන්න වෙන ගැටලුවක්. නමුත් මට හිතෙනවා ඒක සම්බන්ධ වෙන්නෙ ජෝසෆ් ගිලිමෝ මහත්මයාගෙ කෑම වට්ටෝරු පොත හොරා ගැනීමේ කටයුත්තට විය යුතුයි"

* * *

කණ්ණාඩි මේසය, එය ප්‍රවාහණය කළ තැනැත්තා සහ භාණ්ඩ නැව් ගත කරන්නා හිරබාරයට ගත් පුවත අපට ලැබෙන විට දෙපැයක් ගතවී තිබිණ. අපට යාමට සිදුවූයේ සොහෝ පෙදෙසටයි.

ප්‍රවාහණකරුවා එදින කටයුත්ත සඳහා කුලියට ගත් අයෙකු බව පැහැදිලි වූ පසු, ඔහු නිදහස් කර හරින මෙන් හෝම්ස් ලෙස්ට්‍රේඩ්ට උපදෙස් දුන්නේය.

එහෙත් බඩු භාරගෙන ඒවා නැව් ගත කළ සිම්කොක්ස් නැමැත්තාගෙන් හෝම්ස් දිගින් දිගටම ප්‍රශ්න කළේය.

"ඔහේලා මේ අහන්නෙ මොනව ගැනද කියල මට තේරෙන්නෙ නෑ" සිම්කොක්ස් කීවේ තරහෙන් පුපුරමිනි. "මැකන්සි මහත්තයා මෙහේට ලී බඩු එවන බව ඇත්තයි. මං ගාස්තු අය කරලා ඒව ගබඩා කරල පස්සෙ නැවට පටවනවා. මගේ වගකීම ඒවා නැවට පටවන තුරු විතරයි"

"සිම්කොක්ස්. මට නම් හොඳටම විශ්වාසයි ඔහේ වංචනික ව්‍යාපාරයකට හවුල්" හෝම්ස් කීවේ උගුඩුවෙකු මෙන් කෛරාටික බැල්මක් හෙළමින් සැකයෙන් වටපිට බැලූ සිම්කොක්ස්ටය.

"හවුල්? මොකකටද? මං මේ අපහාසය ලේසියෙන් අරින්නෙ නෑ, ඔහේල රොත්තම උසාවි ගෙනිහිං මිසක්"





"අන්න ඒ කතාව නම් ඇත්ත සිම්කොක්ස්" හෝම්ස් කීය. "අපි දෙගොල්ලො මීළඟට හමුවෙන්නෙ උසාවියෙදි. හැබැයි එතකොට ඔහේ ඉඳීවි විත්ති කූඩුවෙ. අපි ඉඳීවි ඔහේට විරුද්ධව සාක්ෂි දෙමින් සාක්කි කූඩුවෙ"

"දැන් මොනවද හෝම්ස් මහත්මයා අපි කරන්නෙ?" ලෙස්ට්‍රේඩ් විමසුවේය.

"මං ගේන්න කිව් ඉස්කුරුප්පු නියන් කට්ටලය ඔබ ගෙනාවද?" හෝම්ස් විමසුවේය.

"ඔව්. ඒක අර පොලිස් භටයා ස්මිත් ළඟ. මං ඔහුව මෙතැනට කැඳවන්නම්"

මේසය කොටසට කණ්ණාඩිය සවිකර තිබුණේ කණ්ණාඩියේ රාමුවේ පහළ කොටස දෙපසට වැද්දූ 2″ × 2″ ප්‍රමාණයේ ඕක් ලී කැබලි දෙකක් ආධාරයෙනි.

"මේ ලී කැබලි දෙකේ උඩින් හා පහළින් ඉස්කුරුප්පු ඇණ දෙක බැගින් තිබෙනවා. ඒ ඇණ ගළවන්න ස්මිත්. කණ්ණාඩිය බිමට නොවැටෙන්න මං එය අල්ලා ගන්නම්" හෝම්ස් කීය.

"හරි. දැන් ඔබට පෙනෙනවාද ඔය ඕක් ලී කැබැල්ලක උඩට ළංවෙන්න තිබෙන දුඹුරු පාට පැල්ලම?"

"මේ ඇතුළු පැත්තේ තිබෙන එක ද මහත්මයා?"

"හරියට හරි. ඒක ඝනකම් වාර්නිෂ් තට්ටුවක් පිටතින් යෙදූ ඉටිවලින් වැසූ කුහරයක් බව මට විශ්වාසයි. ඔබේ ඉස්කුරුප්පු නියනෙන් එතැන හාරන්න"

ස්මිත් තමාට නියම වූ රාජකාරිය කළේය. පැරෆින් හෝ මී ඉටි කුඩු බිමට වැටිණි. තව දුරටත් එම ඉටි ඉවත් කිරීමේදී සිහින් වානේ කම්බියක් හමු විය.

"ඉතිරි ඉටි ටිකත් ඉවත් කරන්න. ඊට පස්සෙ කම්බිය නොකැඩෙන විදියට අල්ලාගෙන පරෙස්සමෙන් ඉහළට ඇදල ගන්න" හෝම්ස් උපදෙස් දුන්නේය.

කම්බියේ පහත කෙළවරේ තිබුණේ "ෂමවා" සමෙන් මැසූ කුඩා මල්ලකි.

"මෙන්න මේක ඇරල බලන්න ලෙස්ට්‍රේඩ්. මේක නම් පොලීසියට හොයා ගන්න බැරිවුණු මැණික් බවට මට සහතිකයි"

"දෙයියම්පා. ඔබ කිව්වා හරි හෝම්ස් මහත්තයා!" ලෙස්ට්‍රේඩ්ට කෑගැසුණේ එය විවෘත කර බැලූ විටයි. "බලන්න මේ ඔක්කොම

දියමන්ති. යෝක්ෂයර්හි ආදිපාදවරියගෙන් හොරකම් කළ දියමන්ති මාලයේ ඒවා බවට සැක නෑ"

"රිච්මන්ඩ් හි ඇගේ මාලිගයෙන් මේවා සොරකම් කළේ මීට සති දෙකකට පමණ කලින් නේද?"

"හරියට හරි හෝම්ස් මහත්මයා."

සිම්කොක්ස් වහා සිරභාරයට ගැනුණු අතර ඔහුගේ ගබඩාවට සීල් තබන ලදී.

"මහේස්ත්‍රාත්වරයෙකුගෙන් වරෙන්තුවක් ලබා ගත් වහාම අපට පුළුවනි මැකන්සි හෙවත් ට්‍රේසිවත් හිරභාරයට ගන්න" ලෙස්ට්‍රේඩ් කීය. "නමුත් ඒකට හෙට උදේ වනතුරු අපට බලාගෙන ඉන්න වෙනවා"

"ඒ අතරේ ඔහුට සැකයක් ඇතිවුණොත් ට්‍රේසි පැනල යන්න ඉඩ තියෙනවා" හෝම්ස් කීය. "ඒ හින්දා ඔහු ගැන පරීක්ෂාවෙන් ඉඳීමට ඔබේ හොඳම පොලිස් භටයන් දමන්න"

* * *

පසුවදා උදයේ නවයට පෙර අපි මෙල්බර්න් වීදියේ අංක 10 නිවස අසලට ළඟාවීමු. ඒ කලින්දා රාත්‍රියේ ලෙස්ට්‍රේඩ් අප වෙත එවා තිබූ විදුලි පුවත අනුවය. කලින් නියම කරගත් තැන්වල අපි බලා සිටියෙමු. ඒ ට්‍රේසි නිවසෙන් එළියට බසිතැයි අපේක්ෂාවෙනි. අහස කළු වලාකුළු වලින් බරවී තිබිණි. කොයි මොහොතේ හෝ වැස්සක් කඩා වැටීම ඉඩ ඇති බවට සලකුණු මතු විය. සීතල සුළඟක් හමා ආවේ අපගේ සැකය තවදුරටත් තහවුරු කරමිනි.

"මේ මිනිහා ඉක්මනට එළියට බැස්සොත් අපි හැමෝටම ලේසියි." හෝම්ස් කීවේ නොඉවසිල්ලෙනි. මා ඊට යමක් කීමට සූදානම් වූවා පමණි. පොත් වෙළෙඳසල අයිනේ දොරක් විවෘත විය. කලින් දිනයේ මෙන් ඉතා හොඳින් හැඳ පැළඳ ගත් ට්‍රේසි එළියට බැස්සේ "බෝලර්" වර්ගයේ තොප්පියක් ද අතැතිවය. එහෙත් පියවර තුන හතරක් ඉදිරියට ඇවිද ආ ඔහු එක්වරම මඟ නැවතුණේය. අහස දෙස කිහිප විටක්ම බලමින් එසේ නැවතුණේ කුඩයක් රැගෙන ඒමටද? ඔහු ආපසු හැරුණේ ඒ අදහසින් විය යුතුය. එහෙත් ඔහුට එක් පියවරකට වඩා ඉදිරියට තැබීමට නොලැබිණි. ලෙස්ට්‍රේඩ් වේගයෙන් එතැනට ගියේ අපටද සංඥා කරමිනි. ට්‍රේසිගේ උරහිසට අතක් තැබූ ලෙස්ට්‍රේඩ් විමතියට පත් ට්‍රේසි ඇමතුවේය.





"ෂෝන්-ක්ලෝඩ් ට්‍රේසි හෙවත් ලූක් මැකන්සි මහත්මයා? මාකස් ඩූලි ඝාතනයට සහ මැණික් හොරකම් රාශියකට මං ඔබව සිරභාරයට ගන්නවා!"

පොලිස් භටයන් රැසක් ඔහු වටකර ගනිද්දී ට්‍රේසිගේ මුහුණෙන් පිළිබිඹු වූයේ අතිශයින්ම පුදුමයට පත් ලකුණු ය.

* * *

ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ ලෙස්ට්‍රේඩ්ගේ කාමරය තුළදී ප්‍රංශ ජාතිකයා පාපෝච්චාරණයට සූදානම් විය. පොලිස් භටයෙකු එය ලඝු ලේඛනයෙන් සටහන් කර ගනිද්දී ලෙස්ට්‍රේඩ්, හෝම්ස් සහ මම එයට සවන් දුන්නෙමු.

"මහත්වරුනි මේක දිග කතාවක්. ඒ වගේම කනගාටුදායක එකක්. මං ප්‍රංශයේ ආබොවා ගමේ උපත ලැබුවේ දුප්පත් වඩු කාර්මිකයෙකුගේ පුත්‍රයකු ලෙසයි. අපේ පවුලේ පිරිමි ළමයින් ම හය දෙනෙක්. මං තමයි බාලයා. මගේ පියා බොහොම කැපවීමෙන් මහන්සියෙන් වැඩ කළ කෙනෙක්. ළමයින්ට හොඳට උගන්වලා හොඳ මිනිසුන් කරන්න ඔහුට උවමනාව තිබුණා. ඒ වගේමයි. තමන්ගේ ව්‍යාපාරය දියුණු කරලා අපේ අනාගතය සැපවත් කරන්න මවටත් පියාටත් උවමනා වුණා. අධික මුදලක් ගෙවීමට සිදුවුණු පැරිසියේ පාස්චර් උසස් පාසලට අප යැව්වේ ඒ නිසා. මගේ වැඩිමහල් සහෝදරයන් පස් දෙනාම හොඳට ඉගෙන ගත්තා. වෛද්‍යවරුන්, විද්‍යාඥයන්, නීතිඥයන් වෙන්න ඔවුනට හැකිවුණා. නමුත් පාසලෙන් කට්ටි පැනලා නරක මිතුරන් ආශ්‍රය කළ මං සූදු කෙළියට වැටුණා.

මේ වෙනකොට මගේ පියා ගේ ව්‍යාපාරය සෑහෙන තරම් දියුණු වෙලා. ගෙදරට වෙලා වඩු කර්මාන්තය පුහුණු වෙන්නට ඔහු මට නියෝග කළා. මම මාස කිහිපයක් ඒ වැඩ ඉගෙන ගත්තා. නමුත් දිගටම ඒ අංශයේ ඉන්න මගේ ආශාවක් තිබුණේ නෑ. ඒ නිසා මගේ පියා ඔහු අඳුනන කෙනෙකු මාර්ගයෙන් මාව පැරිසියේ හෝටලයකට දැම්මා. ඒ සූපවේදය පුහුණුවෙන්න. ඒ අංශයට නම් මගේ හිතේ ආශාවක් ඇති වුණා.

ජෝසෆ් ගිලිමෝ මට මුලින්ම හමුවුණේ ඔන්න ඔය කාලෙදි. රිවෝලි මාවතේ ලූවර් ග්‍රෑන්ඩ් හෝටලයේ අපි දෙන්නා පුහුණුව ලැබුවේ එකට. ඊළඟට විශේෂිත පුහුණුව සඳහා ස්විට්සර්ලන්තයේ

හොටෙල් නැෂනල් වෙත යවනු ලැබුවා. අප දෙදෙනා අතර තිබුණේ දැඩි මිත්‍රත්වයක්. ඔහොම ඉඳිද්දී අපි අපේ අවසන් පරීක්ෂණයට සූදානම් වුණා.

සම්පූර්ණයෙන්ම අප විසින්ම නිර්මාණය කරන ලද භෝජන තුනක් අප විභාගයට ඉදිරිපත් කළ යුතුව තිබුණා. අපි ඒවා හදලා පුහුණු වුණේ එකිනෙකාට හොර රහසේ. නමුත් ජෝසෆ් ගිලිමෝ මට අන්ත ද්‍රෝහි කමක් කර ඇති බව මං දැනගත්තේ අන්තිම මොහොතේ. මං විභාගය සඳහාම නිර්මාණය කර තිබුණා ඉතාලි වයින් යොදා සාදන පොලා කැසියටෝරා නමින් විශේෂ කුකුළු මස් ව්‍යාංජනයක්. ඒ සමගම ලේඩි බැල්ටිමෝ පීච් මෙල්බා නමින් අතුරුපසක්. මගේ ඒ සූප වට්ටෝරු දෙක හොරකම් කරගෙන ඔහු ඒවා හොඳට පුහුණු වෙලා. මට මේක දැනගන්න ලැබුණේ අන්තිම මොහොතේ. ඒ මුළුතැන්ගෙයි පුහුණුව ලැබීමට පැමිණ සිටි තරුණියකගෙන්. ඔහුව මරන්න තරම් මට කේන්තියක් ආවා. නමුත් මං ඉවසාගෙන සිටියා.

ඔහුගේ ඒ තක්කඩිකම නිසා මට විභාගයට ඉදිරිපත් කිරීමට සිදුවුණේ මගේ, එතරම් විශිෂ්ට නොවුණු භෝජන දෙකක්. මගේ වට්ටෝරුව හොරකම් කළ ඔහුට පළමුවැනි පංතියේ සාමර්ථයක් ලැබෙද්දී මට ලැබුණේ සාමාන්‍ය පංතියේ සාමර්ථයක්. ඔහු මට කළ මේ ද්‍රෝහිකම ජීවිතේ කිසිදාක ඔහුට සමාව දිය හැකි එකක් නෙමෙයි. නමුත් අවස්ථාවක් ලැබුණොත් එයට එකට එක කරන්න හිතලා ඒ සිද්ධිය මං තාවකාලිකව අමතක කළා.

ඉන්පසු ඔහු ඉතාලියේ හෝටලයක තනතුරක් ලැබී ගියා. මං ගියේ ස්පාඤ්ඤයේ එස්කියුරියල් හෝටලයට. කාලයක් එහි ගත කරලා මං යළිත් ප්‍රංශයට ආවා. ඒ අතරෙදි තමයි ගිලිමෝ මෙහේ කොස්මොපොලිටන් හෝටලයට ඇවිත් තිබුණේ. ප්‍රංශයෙන් පිටවී එන්න උත්සාහ දරමින් සිටි මට, නොදම්බලන්ඩ් හෝටලයේ ප්‍රධාන සූපවේදී තනතුරේ ඇබෑර්තුවක් ඇතිබව දැනගන්න ලැබුණා. ඒක ලබා ගන්න උදව් කළෙත් මේ ජෝසෆ් ගිලිමෝ ම තමයි.

මං ඉගෙන ගන්නා කාලයේ නරක මිතුරන් ආශ්‍රයට වැටුණු බව මං ඔබට කිව්වා. ඔවුන් කළ එකම නරක ක්‍රියාව තමයි සූදු කෙළිය. නමුත් මිනිහෙක් විනාශ කරන්න ඒක හොඳටම ප්‍රමාණවත්. සූදුවට ඇබ්බැහි වෙන මිනිහාගේ ජීවිතය, මත්පැනට ඇබ්බැහි වෙන බේබද්දාගේ ජීවිතයටත් අන්තයි. බේබද්දා සුරාවෙන් තමන්ගේ





ජීවිතය විනාශ කරගෙන මියගියාම ඒ කතාව එතැනින් ඉවරයි. නමුත් සූදුකාරයා කියන්නේ තමන්ගේ පමණක් නෙමෙයි; මුළු පරම්පරාවේම මුදලය විනාශ කරන කෙනෙක්.

ඉහළ පෙළේ හෝටල් කියන්නේ ඉහළ පෙළේ සංචාරකයන්ට සූදු කෙළීමට පහසුකම් ඇති තැන් බව, ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැ. ලූවර් ග්‍රෑන්ඩ් හෝටලයේදී මං ඉපයූ සම්පූර්ණ මුදලම විනාශ වී ගියේ ඒ හෝටලයේ කැසිනෝවට. මට මුදල් නැතිවෙද්දී මං කළේ මගේ ගම - ආබොවාවට ගිහින් මගේ පියාගෙන් මුදල් ඉල්ලා සිටීම. පියා වයෝවෘද්ධ වීම නිසා ඒ දිනවල ලී බඩු ව්‍යාපාරය කළේ මගේ සොයුරන් දෙදෙනෙකු විසින්. ඔවුන් වරින් වර දුන් මුදල් ප්‍රමාණ මට මදිවුණා. අන්තිමේදී මට අයිති කොටස ලෙස විශාල මුදලක් දෙන මෙන් මං ඔවුනට තර්ජනය කළා. මගෙන් බේරීමට බැරිම තැන, මගේ පියා ඔහුට අයිතිව තිබූ ඉඩමක් විකුණා මට මුදල් දුන්නා. ඒ මගේ සොහොයුරන්ගේ විරුද්ධත්වය නොතකා. මගේ මව මියගියේ මගේ මේ පිළිවෙළ නිසා ඇතිවුණු සිත් වේදනාවෙන් ම යි.

එහෙම සොයාගත් මුදල් සියල්ලමත් වියදම් වී මං බොහොම අසරණ තත්ත්වයට වැටුණා. ඊළඟට මං හතර අතට ණය වුණා. ඒ වෙලාවේ මගේ පිහිටට ආවේ බට්ලර් නම් ඉංග්‍රීසි ජාතික සොහොයුරන් දෙදෙනෙක්. එඩී හා ජොනී නම් වූ මේ දෙන්නා ධනවතුන්ගේ නිවාසවලට පැන, රන් රිදී මුතු මැණික් සොරකම් කර විකිණුවා. ධනවතුන් භෝජන සංග්‍රහ පවත්වන දින ගැන දැනුම් දීමක් කළාම ඔවුන් මට ලොකු මුදලක් ගෙව්වා. මේක සාර්ථක ලෙස කරගෙන ලූවර් ග්‍රෑන්ඩ් හෝටලයේ සැහෙන කලක් රැකියාව කරන්න මට හැකිවුණා. නමුත් ප්‍රංශයේ සුරෙට් පොලිස් සේවයට, හොරකම් වලට අපේ හෝටලයේ ඇති සම්බන්ධකම් ගැන ඉවක් වැටුණා. එතකොටයි මං එහෙන් ඉවත්වෙලා ස්පාඤ්ඤයට ගියේ. නමුත් ඒ රටේ ආර්ථික ප්‍රශ්න නිසා වැටුප මදිවෙද්දී මං ආපහු ආවා. එඩී හා ජොනී බට්ලර් දෙදෙනා සුරෙට්යට අහුවුණේ නෑ. නමුත් ධනවතුන්ගේ ගෙවල් බිඳීම ඔවුන් නවත්වලා දැම්මා. ඒ වෙනුවට අනුන් හොරකම් කරන මුතු මැණික් දියමන්ති මිලට ගෙන, ඕලන්දයට හා බෙල්ජියමට ගෙනගොස් විකිණීම පටන් ගත්තා. ඔවුන්ගෙන් ලැබුණු උපදෙස් අනුව මං කළෙත් ඒ දේ මයි. මගෙන් ඔත්තු ලබාගෙන ගෙවල් බින්ද හොරුන් ලබාගත් දේ මට

විකිණුවා. මං ඒවා ලී බඩු තුළ සඟවා ප්‍රංශයේ බට්ලර් සොයුරන්ට යැව්වා. වඩු කර්මාන්තය දැන සිටි නිසා දියමන්ති, මැණික් ආදිය ලී බඩු තුළ සැඟවීම මට අපහසු වුණේ නැහැ.

මට කළ ද්‍රෝහී කම නිසා ගිලිමෝගෙන් පළිගැනීමේ අදහස, මා අත් නොහළ බව මං ඔබට කිව්වා. ඒකට මට උදව්වට ගත හැකි කෙනෙකු මීට ටික කලකට පෙර මට හමුවුණා. ඒ තමයි ගිලිමෝ යටතේ සේවය කළ අතුරුපස කෝකියකු වූ මාකස් ඩූලි.

විවිධ අතුරුපස සෑදීමට ඔහු අති දක්ෂයෙක්. අයිරිෂ් සම්භවයක් තිබූ ඔහු, සුළු දෙයින් පවා අධික වශයෙන් කෝපයට පත් වූ කෙනෙක්. ඔහු කොස්මොපොලිටන් හෝටලයේ රැකියාවට ගිහින් තිබුණේ, ගිලිමෝ එහි යන්නටත් පෙර. නමුත් සුදුසුකම් අනුව ගිලිමෝට වැඩි වැටුපක් ලැබුණා. ඒ නිසා ඩූලි සිටියේ ඒ ගැන තදබල වෛරයකින්. තමාට හිමිවීමට තිබූ ප්‍රධාන සූපවේදී තනතුර ගිලිමෝ වංචාවෙන් ලබාගත් බවයි ඩූලිගෙ අදහස වුණේ. මොකක් හරි සුළු දේකට ඔවුන් අතර එක දවසක් බහින් බස් වීමක් ඇතිවුණු බවයි ඩූලි මට කිව්වේ. ඔහු රැකියාව දමල ගහලා නොදම්බලන්ඩ් හෝටලයට ආවා. වහාම ඔහු රැකියාවට බඳවා ගන්නා මෙන් මං හෝටලයේ ප්‍රධානීන්ට ආයාචනා කළා.

මගේ ඒ තීරණය නිවැරදි එකක් බව තේරුම් ගන්න වැඩි දවසක් ගතවුණේ නෑ. මගේ හෘදයාංගම මිත්‍රයෙකු බවට පත්වුණු ඩූලි මට වැදගත් රහසක් හෙළි කළා. ඒ තමයි ගිලිමෝගේ කාර්යාලයට සහ ඔහුගේ රහස් සඟවා ඇති ලාච්චුවට ඩූලි ළඟ හොර යතුරු ඇති බව. ඒ කාලේම ඔහු හොර යතුරු සාදවා ගෙන තිබුණේ ගිලිමෝ සමග තිබූ වෛරය නිසාමයි; ඒ අවස්ථාවක් ලැබුණොත් ඔහුගේ වටිනා සූප වට්ටෝරු සටහන් පොත සොරකම් කර විනාශ කර දැමීමේ අරමුණෙන්.

මහත්වරුනි, මේ කරුණ දැනගත්තාම මගේ හිතේ මලක් පිපුණා වගෙයි. ගිලිමෝට එකට එක කිරීමට ඩූලි උදව් කරගත හැකි බව මං තේරුම් ගත්තා. මට අවශ්‍ය වුණු වෙලාවක එම වට්ටෝරු පොත මා වෙත ගෙනැත් දුන්නොත්, ඩූලිට පවුම් දෙසීයක මුදලක් දෙන්න මං කැමැත්ත පළ කළා. ඔහු ඊට එකඟවුණේ එක පයින්.

ඔහොම ඉන්න අතරේ හදිසියේම එක් පුදුමාකාර අවස්ථාවක් එළඹුණේ මං නොහිතූ විදියට.





ක්‍රයිමියා යුද්ධයෙන් ප්‍රශ්නය සමථයකට පත්වුණත් එංගලන්තය හා රුසියාව අතර තිබුණේ හොඳ හිතක් නෙමෙයි. මේ නිසා ආරක්ෂක අංශයේ යම් කරුණක් ගැන සාකච්ඡාවකට ජනරාල් අන්ද්‍රේ මිකොයාන් රුසියාවෙන් එංගලන්තයට ආ අවස්ථාව ඔබට මතක ඇති. රුසියානු තානාපතිවරයාට උවමනා වුණා මිකොයාන් වෙනුවෙන් අති විශේෂ භෝජන සංග්‍රහයක් පවත්වන්න. තානාපතිවරයා මාව ඔහුගේ කාර්යාලයට කැඳෙව්වා. රුසියානු ක්‍රමයකට සකස් කළ අති විශේෂ භෝජන රැසක් ඔහුට උවමනා බව කිව්වා. මං ඒකට එකඟ වුණා.

ගිලිමෝ මගේ බොදුන් වට්ටෝරුව එදා හොරකම් කළා. ඒකට සුදුසු ම දඬුවම ඔහුගේ අග්‍ර භෝජනය සොරකම් කිරීමයි. ඔහුගේ ඒ අග්‍ර භෝජනය ගැන ඔහුට ලැබුණු වර්ණනා මා එක්ක කීවේ වරක් දෙවරක් නොවෙයි. දැන් තමයි අවස්ථාව. හැකි ඉක්මනින් ගිලිමෝගේ වට්ටෝරු පොත මට අවශ්‍ය බව මං ඩූලිට කිව්වා.

"ට්‍රේසි මහත්මයා. මේක හරි බැරෑරුම් වැඩක්" ඩූලි කිව්වා. "ගිලිමෝ ඔහුගේ කාර්යාලයේ නැති, මුළුතැන්ගෙය අසල බරාඳයේත් කවුරුවත් නොගැවසෙන වෙලාවක තමයි මේ වැඩේ කරන්න ඕන. මං කොස්මොපොලිටන් හෝටලයෙන් අස්වෙලා ආව කෙනෙක් නේ. ඉතින් ඒකෙ මාව ඉන්නවා කාට හරි දකින්න ලැබුණොත් ප්‍රශ්නයක් වෙනවා. බදාදා තමයි ගිලිමෝගේ නිවාඩු දවස. හවස 3 සිට 5 දක්වා තමයි මුළුතැන් ගෙයි වැඩක් සිදු නොවෙන වෙලාව. එක්කො ඒ වෙලාවට කරන්න ඕන. නැත්නම් රෑ 12 සිට පාන්දර 4 අතරේ එය කළ යුතුයි."

"ඕක කරන්න පුළුවන් තමුසෙට විතරයි ඩූලි. මට තව සති දෙකයි තියෙන්නේ. දින දහයකට කලින් මට ඒක ගෙනැත් දෙන්න" මං ඩූලිට කිව්වා.

මං තැන් දෙකක නේවාසිකව සිටි බව ඔබ දන්නවා. ඒ මෙල්බර්න් වීදියේ අංක 10 සහ ඩික් වීදියේ. මං මිලට ගන්නා ලී බඩු බොහොමයක් ප්‍රවාහණය කළේ මෙල්බර්න් වීදියට. නමුත් ලීය විදලා ඒ තුළ මැණික් සැඟවීමේ කටයුතු කළේ ඩික් වීදියේ නිවසේ. ඒ සඳහා ලී ගෘහ භාණ්ඩ වල කකුලක් හෝ එවැනි කොටසක් ගළවාගෙන මං ඩික් වීදියට ගෙන ගියා. වඩුවැඩ වලදී තරමක ශබ්දයක් පිටවෙනවා. කාගේවත් අවධානයකට යොමු නොවී ඒ කටයුතු

එතරම් සෙනගක් නැති, ඩීක් විදියේ ගෙදර කිරීම ආරක්ෂිත බවයි මට හිතුණේ.

සූප වට්ටෝරු පොත මට ගෙනැත් දෙන බවට ඩූලි පොරොන්දු වුණා. නමුත් සතියක් ගත වී ගියත් එය ලැබෙන ලකුණක් තිබුණේ නැහැ. මං ඒ ගැන ඔහුගෙන් ඇහුවා.

"ඩූලි. අර බඩුව ගෙන්වාගන්න මං තමුසෙට දුන්නේ දින දහයක කාලයක්. දැන් සතියක් ගතවුණා. කෝ තවමත් ඒක ලැබුණෙ නැහැනෙ"

"ඒක එච්චර පහසු වැඩක් නෙමෙයි මහත්මයා. මං දැන් දවස් තුනක් වෙස්මාරු කරගෙන ගිහිං ඒ හෝටලයේ ගැවසුණා. ගිලිමෝ නැතත් කවුරුන් හෝ කෙනෙක් ඒ වෙලාවේ එහා මෙහා ගියා. ඉතින් වැඩේ හරි ගියේ නෑ"

"තමුසෙ මොකක් කරන්නද හිතාගෙන ඉන්නේ?" මං ඇහුවේ තරහෙන්. "මං ඒ විශේෂ භෝජනය දෙන බවට තානාපතිතුමාට පොරොන්දු වුණානේ. දැන් ඉතින් ලොකු අමාරුවක තමයි මාව වැටෙන්නේ"

"අද බැරිවුණොත් හෙට රෑට, මං හොර රහසේම හෝටලයට ඇතුළු වෙනවා. හෝටලයට ඇතුළුවෙන තැනත්, මුළුතැන්ගෙයට පිවිසෙන දොරටුව ළඟත්, ආරක්ෂක නිලධරයන් ඉන්නා බව ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැනෙ. උන්ට අනිවාර්යයෙන්ම පගාව දෙන්න වෙනවා. ඒ හින්දා අර පොරොන්දු වුණු ගණනට ඔබේ වැඩේ කරන්න අමාරුයි. පවුම් 400 ක් වත් නැතුව මට ඔය වැඩේට අත ගහන්න බෑ. මේක පොඩ්ඩක් එහා මෙහා වුණොත් බෙල්ල ගහල යන වැඩක්"

"ඒ ගණන හුගක් අසාධාරණයි ඩූලි"

"කිසිම අසාධාරණයක් නෑ. ඔබට අසාධාරණයක් කළ මිනිහා ගිලිමෝ. ඒ විස්තර ඔබ මට කිව්වානේ. ඒ හින්දා දැනට මට පවුම් දෙසීයක් දෙන්න. පොත අරගෙන ආවට පස්සේ ඉතිරි මුදල දෙන්න" ඩූලි කිව්වේ කිසිම පැකිළීමක් නැතුව.

මට වෙන විකල්පයක් තිබුණෙ නෑ මහත්වරුනි. මං ඒ මුදල ඔහුට දුන්නා. මං මේ ළංකර ගත්තේ භයානක ව්‍යාසනයෙක් ද කියලා මගේ හිතේ සැකයකුත් ඇතිවුණා.

ප්‍රංශයට යැවිය යුතු මගේ ලී බඩු නැව් ගත කිරීම කළේ සිම්කොක්ස් නම් පුද්ගලයා. ඔහු හොඳ මනුස්සයෙක්. මෙතන





මොකක් හරි වංචනික වැඩක් කෙරෙන බවට ඔහුට සැක හිතෙන්න ඇති. නමුත් කවදාවත් ඔහු ඒ ගැන ඇහුවෙත් නෑ. අමතර මුදලක් ඉල්ලුවෙත් නෑ. මට තිබුණේ ලී බඩු සූදානම් වුණාම පත්තරයේ දැන්වීමක් පළකිරීම පමණයි.

ඔබට දකින්න ලැබුණු කණ්ණාඩි මේසය මං ඕ කීෆ්ලාගෙන් මිලට ගත්තේ මාස කිහිපයකට කලින්. පදම් කළ ඕක් අරටුවකින් සැදූ ලීය විද ගැනීම, එදා මට හුගක් අමාරු වුණා. ඩීක් වීදියේ මගේ කාමරය සම්පූර්ණයෙන්ම අව්වට නිරාවරණය වෙන තැනක්. මේ දිනවල තිබෙන අධික උෂ්ණය නිසා, එතැන මං වැඩ කරමින් සිටියේ ඩහදිය පෙරමින්. එළියට නොපෙනෙන විදියට ලීය ඇතුළට වද්දා තිබූ වානේ කම්බියක් නිසා, මගේ විදින කටු දෙකක්ම කැඩී ගියා. ඊළඟට අමාරුවෙන් සිදුරක් සාදාගෙන, එයට දැමිය යුතු දියමන්ති, මාලයෙන් වෙන් කළේ මේසය උඩ තබාගෙන.

සිදුවුණේ මොකක්ද? මං නොහිතූ විදියට මාකස් ඩූලි එක්වරම කාමරය ඇතුළට කඩා වැදුණා. මට දියමන්ති ටික සැඟවීමට වෙලාවක් තිබුණේ නෑ. දොරේ අගුළු දමාගන්න මට අමතක වුණු හැටි!

"ට්‍රේසි මහත්මයා. ඔබ කොයි ලෝකෙක ගියාද?" ඔහු කෑගැහුවේ තරහෙන්. "මං අපේ හෝටලයට ගියා. ඔබ එහි ආවෙ නැති බව ඔවුන් කිව්වා. මොන තරම් රාජකාරි තිබුණත් ඔබ සැලකිල්ලෙන් ඒවා කරන්නේ නෑ කියලා අන්න කළමනාකාරයා බණිනවා. ඊළඟට මං ගියා මෙල්බර්න් විදියේ ගෙදරට. එතැන මං පැයකට වඩා බලාගෙන හිටියා"

"ඇයි තමුසෙ මෙතැනට ආවෙ නැත්තෙ?"

"ඔබේ වැඩපොළ තිබෙන තැන මෙතැන බව මට එක්වරම අමතක වුණා." ඩූලි කිව්වා. "අනික හෝටලයේ අය කිව්වේ ඔබ අත්‍යවශ්‍ය කෑම ද්‍රව්‍ය වගයක් මිලට ගන්න කවෙන්ට් උද්‍යානයට ගියා කියලයි. ඊළඟට හදිසියේ මතක් වෙලා තමා මෙතැනට ආවේ"

"කෝ උවමනා කරන බඩුව හම්බ වුණාද?"

"ඔව්. මේ තියෙන්නේ" ඔහු කිව්වේ පොත බෑගයකින් අරගෙන මගේ අතට දෙමින්. "මේක ගන්න මං කරදර වුණු තරම ඔබට හිතාගන්නවත් බෑ"

මේ පොත මීට පෙර මං කවදාවත් දැක තිබුණේ නෑ. මගේ ළඟත් වට්ටෝරු පොතක් තියෙනවා. නමුත් ගිලිමෝගේ පොත මගේ එකට වඩා අලංකාරයි, පිරිසිදුයි, විස්තර සහිතයි, ක්‍රමානුකූලයි. මගෙන් වට්ටෝරු හොරකම් කරලා අන්තිමේදී ඔහු මෙවැනි තත්ත්වයකට ඒම ගැන, මගේ හිතේ ඇතිවුණේ ඊර්ෂ්‍යාවක් වගේම ක්‍රෝධයක්.

මෙපමණ වෙලා කෝපයෙන් කෑ ගැසූ ඩූලි නිශ්ශබ්ද මොකද කියලා මං බැලුවා. ඔහුගේ දෙනෙත් යොමු වී තිබුණේ වෙනත් පැත්තකට. ඒ මං මෙතෙක් දවස් හංගාගෙන සිටි දෙයක් වෙත. ඒ තමයි මං අර ලීය තුළට හැරූ සිදුරට දමන්න, මාලයෙන් ගැලවූ දියමන්ති ටික. ඔහු ඒවා අතට ගෙන පරීක්ෂා කරමින් හිටියේ ලොකු කුතුහලයකින්.

"ට්‍රේසි මහත්මයා. මේ මොනවද? ඔබට කොහෙන්ද මේව ලැබුණේ?"

"මේක මගේ අම්මට අයිතිව තිබුණු මාලයක කොටස්." මං කිව්වා. "ඒක ආපහු ඇයට යවන්නයි මං හදන්නේ. රේගුවෙන් ප්‍රශ්න කෙරෙන නිසා, මේ ලීය ඇතුළට බස්සලා යවන්නයි මං කල්පනා කළේ"

"මේක ඔබේ අම්මට අයිතිව තිබුණු එකක් කියලා මං හිතන්නේ නෑ" ඔහු කීවේ උපහාසාත්මක ආකාරයට හිනාවෙමින්. "බැලූ බැල්මටම පෙනෙනවා. මේවල තියෙන්නෙ අලුත්ම පෙනුමක්. අනික මේ ගල් දියමන්ති නේද? එහෙම නම් මේක වටිනවා ඇති රන් පවුම් මිලියන ගණනක්. ඔබ කියන්නේ නැහැ කියලද?"

ඔහු ඇසූ ප්‍රශ්න වලට මට උත්තර නැතිවුණා.

"ට්‍රේසි මහත්මයා. මොකද ඔබ බයවෙලා වගේ බලාගෙන ඉන්නෙ?" ඔහු ඇසුවේ සාවඥ ආකාරයට හිනාවෙමින්. "පහුගිය දවස්වල අපේ හෝටලයේ රාත්‍රී භෝජන සංග්‍රහයකට ආව වෙලාවෙ, කවුද ආර්යාවකගේ වටිනා මාලයක් නැතිවුණා කියල මහ හුටපටයක් ඇතිවුණා නේ. මේ ඒ මාලෙ වත්ද?"

"තමුසෙට පිස්සුද? අපේ හෝටලයට ආව කාගෙවත් කිසිදෙයක් නැතිවුණේ නෑ" මං කිව්වා.

"හරි හරි. ඒකෙන් කමක් නෑ. දැන් අපේ වැඩේ ගැන කතා කරමු. කොස්මොපොලිටන් හෝටලයේ දැන් ඉස්සරටත් වැඩිය ආරක්ෂාව





දාලා. අර කවුද ආර්යාවකගේ නිල්පාට මැණිකක් නැතිවුණාලු නේ පහුගිය කාලෙ. ඉතින් දැන් අලුතින් ඇවිත් ඉන්නවා ආරක්ෂක නිලධරයන් කීප දෙනෙක්ම. මං මොකටද මුළුතැන්ගෙට යන බරාඳයට ගියේ කියල උන් එකෙක් ප්‍රශ්න කළා. අන්තිමට ඌටත් ගණනක් මිට මොළවලා තමයි එතැනින් මාරුවෙලා ආවෙ. මේ පොත දාගෙන තිබුණෙ මගේ කමිසෙ අස්සෙ. ඌ මගේ ඇඟ අතගාල බැලුව නම් මාව බෙල්ලෙන්ම අහුවෙනවා"

"තමුසෙ හරි දක්ෂයෙක් බව මං දන්නවානෙ" මං කිව්වා.

"එහෙම කියල බේරෙන්න බෑ ට්‍රේසි මහත්තයා. මේ වැඩේට මට පවුම් දාහක්වත් ඕන." ඔහු කිව්වේ මේසය උඩ තිබුණු දියමන්ති මාලයට ළංවෙලා ඒකට මුහුණ කිට්ටු කරමින්. "මේව නම් මිලියන ගණනක් වටිනවා ඇති. ආයෙ දෙකක් නෑ"

"ඒකෙන් කමක් නෑ" මං කිව්වේ ඔහුව ඉක්මනින් පිටකර යවන්න උවමනාවෙන්. "තමුසෙ කලින් කිව් ගණන දෙසීයයි. ඊට පස්සෙ ඒක හාරසීයට වැඩිකළා. මං ඒකෙන් බාගයක් දීල ඇති. මෙන්න ඉතුරු දෙසීය. මේකත් අරං යනවා"

"තවත් දෙසීයක් නම් මට හොඳටම මදි ලොක්කා" ඔහු කිව්වේ මෙතෙක් වේලා පාවිච්චි කළ මහත්මයා කෑල්ලත් අත අරිමින්. "මට තවත් අටසීයක් දෙන්න"

"තමුසෙට පිස්සුද? මා ළඟ වෙන කීයක්වත් නෑ. මගේ මොළේ අවුල් නොකර මේකත් අරගෙන යනවා." මං කිව්වේ ඔහුව දොර දෙසට තල්ලු කරමින්.

"මට තවත් අට සීයක් දෙන්න ඔබේ ළඟ නැහැ කියලද කියන්නෙ?"

"ඒක තමයි මං කලින් කිව්වෙ"

"එහෙම නම් මං මෙයින් එකක් ගන්නම්" ඔහු කිව්වෙ මේසය ළඟට වෙලා, මාලයෙන් වෙන් කර තිබූ දියමන්ති වලින් එකක් අතට ගනිමින්.

"ඔක තිබුණු තැනම දාලා වහාම මෙතැනින් පිටවෙයන්!" මං කිව්වේ මට හොඳටම තරහ ගිහින්.

ඔහු ඒක ආපහු දමන පාටක් තිබුණෙ නෑ. මං ගිහින් ඔහුගේ අතින් ඒක උදුරා ගන්න උත්සාහ කළා. ලීය හැරීමට මා ගෙනත් තිබූ, දිගු තලයක් සහිත නියනක් එතැන තිබුණා. ඔහු ඒක අතට අරගෙන මට තර්ජනය කළා.

"උඹෙන් මට තව කීයක් වත් උවමනා නෑ." ඔහු කිව්වා. "ඔන්න උඹේ මැණික. ඒකත් මට එපා. නැතිවුණු මාලෙ ගැන ඔත්තුවක් දෙන කෙනෙකුට පවුම් දාහක් දෙනව කියල පත්තරවල තිබුණා. ඒක මට මතක් වුණේ දැන්. වයිට්චැපල් පොලීසියට එච්චර දුරක් නෑ. මං උඹේ නියන පොලීසියෙ තියල යනවා. එතැනට ගිහිං ගනිං"

ඔහු සූදානම් වුණේ එතැනින් පිටවෙලා යන්න. එහෙම වුණොත් ඒක මගේ අවසානය බව මං දැනගත්තා. ඔහුගේ අතින් නියන උදුරා ගැනීම මට ටිකක් අමාරු වුණා. ඒ මොකද ඔහු ඒකෙන් මට ඇනීමට තැත් කළ නිසා. අන්තිමට ඔහු ජීවිතක්ෂයට පත්වුණෙත් ඒ නියනෙන්මයි. මට වෙන විකල්පයක් තිබුණෙ නෑ.

මහත්වරුනි. එතැනින් එහාට හැම දෙයක්ම ඔබ දන්නවා. ඔහු හැඳ සිටි ඇඳුම් සියල්ල ඉවත් කරන්න මට සිදුවුණා. ඒ අපේ හෝටලයේ නම ඒවායේ මසා තිබුණු නිසා. යකඩ බඩු කඩයකින් මං ලොකු පිහියක් මිලට ගත්තා. ඒ මිසක් යළිත් හෝටලයට ගියේ නෑ. ඔහුව කොටස් වලට වෙන් කළේ, කොටස් වශයෙන් තේම්ස් ගඟට ගෙනිහින් දමන්න බලාගෙන. ඔහුගේ ඇඳුම් හා පිහිය එදාම මං පටිනි පාලම උඩින් ගඟට විසි කළා.

ඊට පස්සේ මම මෙල්බර්න් වීදියේ මගේ නිවසට ගියා. ඒ දියමන්ති සහිත මල්ල මගේ සාක්කුවට දමාගෙන. සිදුරක් විද්ද ඕක් ලී රාමුවත් මං ගිය කුලීරියෙන් ගෙන ගියා. ඩූලි ගෙන ආ ගිලිමෝගේ කෑම වට්ටෝරු පොතත් අරගෙන ගිහිං මට අවශ්‍ය කොටස පිටපත් කර ගත්තා.

එහෙම කරගෙන ගිහිං ඔහුගේ ෆ්‍රිකාසී ඩි පූලේ විශිෂ්ට භෝජනය නොදම්බලන්ඩ් හෝටලයේදී මං පිළියෙල කළා. ඒ වහාම ඒක මෙනුපතටත් ඇතුළත් කළා. ඒ අපේ අනුග්‍රාහකයන්ගේ ප්‍රතිචාර දැන ගැනීම සඳහා. බදාදා දවල් කෑමට ගිලිමෝ අපේ හෝටලයට එන බව, මගේ මතකයෙන් සම්පූර්ණයෙන්ම ගිලිහිලයි තිබුණේ. ඒකට හේතු වෙන්න ඇත්තේ මට මුහුණ දීමට වුණු බිහිසුණු සිදුවීම වෙන්න ඇති.

ඩූලිගේ කොටස් එතැනින් ඉවත් කිරීමට මා ඩික් වීදියට යා යුතුව තිබුණා. නමුත් එහි යාමට හිත හදාගන්න මට පුළුවන් කමක් තිබුණේ නෑ. මා ඩික් වීදියට ගෙන ගිය ආවුද මල්ල, එදාම ආපහු





ගෙන ආ බව ඔබට කියන්න මට අමතක වුණා. මා හැම විටම ආවුද මල්ලේ තබාගත් කුඩා සටහන් පොතක් තිබුණා. ලී බඩු ගැන විස්තර තිබුණේ ඒකෙ. එදා අන්තිම මොහොතේ මට ඒක හොයාගන්න බැරිවුණා."

"මේ ඔබ කියන සටහන් පොතද?" හෝම්ස් විමසුවේ කළු පැහැති කුඩාපොත පෙන්වමිනි.

"ඔව් මහත්මයා. ඕක තමයි. මං හිතුවේ ඩූලිගේ ඇඳුම් සමඟ ඕක ගඟට වැටෙන්න ඇති කියලයි. මගේ මේ විනාශයට මුල් වුණේ නරක මිතුරන් ආශ්‍රයෙන් මං සූදුවට යොමු වීමයි. ඒ නිසා මට වියදමට අවශ්‍ය වුණු මුදල් ප්‍රමාණයේ සීමාවක් තිබුණෙ නෑ." කී ෂෝන්-ක්ලෝඩ් ට්‍රේසි තම පාපෝච්චාරණය අවසන් කළේය.

මාකස් ඩූලි ඝාතනය ගැන නඩු විභාගය දෙමසකට කිට්ටු කාලයක් ඕල්ඩ් බේලි අධිකරණයේදී විභාගයට ගන්නා ලදී. ට්‍රේසි පොලීසියට කළ පාපෝච්චාරණයට අමතරව වඩාත් විස්තර උසාවියේදී හෙළි විණි. අන්තිමේදී ඔහු පෝරකයට නියම විය.

"මෙතැනදී මට මතක් වෙනවා වොට්සන් මං මුලදී ගිලිමෝට කියූ එක් කාරණයක් වැරදුණු බව"

"ඒ මොකක්ද?"

"ඔහු හමුවීමට හෝටලයට අප ගිය දවසේ මං කිව්වා, ගිලිමෝගේ කීර්ති නාමයට එක දශමයක හෝ හානියක් නොවෙන්න මං මේ ප්‍රශ්නය විසඳන බව. එහෙම නේද?"

"ඔව්. නමුත් ඔහු ට්‍රේසිට කර තිබූ ද්‍රෝහිකම් නඩුවෙදි හෙළිවුණාම ලැජ්ජාවට පත්වෙන්න ගිලිමෝට සිදුවුණා" මම කීවෙමි.

"අන්න හරි"

ඔහුගේ සුවිශේෂ භෝජන ගැන අප දැක්වූ උනන්දුව ගිලිමෝට හොඳින් මතක තිබිණ. ඔහු අපට යළිත් ඒ ගැන පැවසුවේ හෝම්ස්ගේ ගාස්තුව ගෙවීමට බේකර් වීදියට පැමිණි විටදීය.

"හෝම්ස් මහත්මයා. ඔබ කළ උදව්ව මට කවදාවත් අමතක වෙන්නේ නෑ" ගිලිමෝ කීය. "ට්‍රේසි කළ අපරාධයට තව ටිකෙන් එල්ලුම් ගස් යන්න වෙන්නෙ මට. ඔහු හෙමින්ම ප්‍රංශයට පැන යන්න ඉඩ තිබුණා. ඔබගේ ගාස්තුව වශයෙන් ඔබ කියූ මුදල මෙන් දෙගුණයක මුදලක් මෙතැන තියෙනවා. කරුණාකර ඒක භාර ගන්න. මගේ ජීවිතය බේරුවාට ඒකත් මදි........ ඒක නෙමෙයි

මහත්වරුනි. රජවරුන් සඳහා මා විශේෂයෙන් පිළියෙල කළ ඒ බොජුන් රස විඳින්න ඔබ දෙදෙනා කැමතිද?"

"ඇත්තෙන්ම ඔව්"

"එහෙම නම් ලබන ඉරිදා රාත්‍රි භෝජනය සඳහා කොස්මොපොලිටන් හෝටලයට එන්න. මගේ සුවිශේෂතම භෝජන මං එදාට ඔබ දෙදෙනා වෙනුවෙන් පිළියෙල කරනවා"

ඔහුගේ ෆ්‍රිකසේ දි පූලේ, පීට්සා නපොලිතානා, බොදිනෝ දි රිකොත්තා සහ සුකොත්තෝ ඇතුළු කෑම වර්ග රැසකින් ගිලිමෝ එදා අපට සංග්‍රහ කළේය. ඒවා අති විශිෂ්ට ගණයේ රජ බොජුන් බැව් ඔබට අමුතුවෙන් කිව යුතු නැත. එම ආහාර පිළියෙල කළ යුතු ආකාරය සඳහන් වට්ටෝරු පවා ඔහු අප වෙත ලබා දුන්නේය. ඒ මගේ බිරිඳ හෝ හඩ්සන් මහත්මිය ලවා ඒවා පහසුවෙන් පිළියෙල කර ගැනීමට හැකි බැව් පවසමිනි. අප දෙදෙනා මෙන් ප්‍රංශ හා ඉතාලි කෑම ප්‍රිය කරන පාඨකයන්ගේ යහපත සඳහා එම සූප වට්ටෝරු ඔබ වෙත ලබාදීමට මම තීරණය කළෙමි.